# වාර්ෂික වාර්තාව

# 2020

**සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

**උතුරු මැද පළාත් සභාව**

**අනුරාධපුර**

**+94252222238/+94252225295/ncp.planning@yahoo.com**



**සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

**උතුරු මැද පළාත**


දුරකථන - +94252222695/+94252225295
ෆැක්ස් - +94252224941/ +94252225295
විද්‍යුත් තැපැල - ncp.planning@yahoo.com

# වාර්ෂික වාර්තාව - 2020

## උතුරු මැද පළාත

## 2020

**මග පෙන්වීම**

ප්‍රධාන ලේකම් - එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර මයා

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - පී.බී.දයාරත්න මයා

**නිර්මාණය සැකසීම හා අධීක්ෂණය**

නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්‍රමසම්පාදන) - කේ.ඒ.නොයෙල් මයා

**සහාය**

අභ්‍යාසලාභි උපාධිධාරි - වී.එච්.සුකුමාරන් මිය

# උතුරු මැද පළාත පිළිබඳව සැකෙවින්....

රජරට නුවරකලාවිය නොහොත් වැව් බැඳි රාජධානිය ලෙස විරුදාවලිය ලද උතුරු මැද පළාත, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ ද්විතීය රාජධානි ඇතුළත් වූ අතිශයින්ම පුණ්‍යවන්ත වූ ස්වර්ණ භූමියකි.



අනුරාධපුර සහ පොළොන්නරුව ලෙස වර්තමානයේදී භාවිතාවන පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත උතුරු මැද පළාත එයටම ආවේණික, අනන්‍ය,අද්විතීය අගයන්ගෙන් හා ශ්‍රී විභූතීන්ගෙන් සමන්විතය. අග්‍රගණ්‍ය සහ අසමසම අගයන් හා ජාතික උරුමයන් රැසක් දැයට දායාද කරමින් එම පෞඩත්වය මිහිදන්ව සහ ඇතැම්විට ඉස්මතු වී පෙනෙමින් ශ්‍රේෂ්ඨ ජාතියක විශ්මයජනක ගමන්මඟ යළි යළිත් සුජාතවන පරපුරට නිහඬව කියා දෙයි. සිංහල රාජ්‍ය වංශකතාව, ශිෂ්ටාචාරය හා සංස්කෘතියේ ප්‍රභවය හා විකාශනය මෙන්ම සිදු වූ ප්‍රවණතා පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීමේදී ඒ සඳහා අවශ්‍යවන ඓතිහාසික ශක්තිමත් අඩිතාලම රජරටින් සපයයි.




ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය, ජල ශිෂ්ටාචාරය, රාජ්‍ය වංශ කතාව, දේශපාලනය, කළමනාකරණය හා පරිපාලනය, බෞද්ධ දර්ශනය,පුරාවිද්‍යාව-වාස්තු විද්‍යාව, මූර්ති හා කැටයම් කලාව, භාෂාව හා සාහිත්‍ය ආදී සංස්කෘතිකාංග මෙන්ම ඒ මත ගොඩනැගුණු ශිෂ්ටාචාරයන් හා සභ්‍යත්වයන් ලොවට කියාපාන්නේ රජරට පුණ්‍ය භූමියෙන් ය. නවතම ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රමෝපායන් සහ තාක්ෂණය සොයා අප යා යුතු වන්නේ රජරට පැවති ශ්‍රී විභූතිය වෙතට ගමන් කිරීමෙනි.




ක්‍රි.පූ.543 දී පමණ එනම් සම්බුද්ධ පරිනිර්වාණ දිනයේදීම සිදු වූ විජයාවතරණයෙන් පසු අනුරාධ නම් සෙනෙවියෙකු අනුරාධ නැකතින් මල්වතු ඔය අසල අනුරාධපුර ජනාවාසය ආරම්භ කරන ලදී. ක්‍රි.පූ.4 දී පමණ ජෝතිය නැමැති ජෛන බමුණකුගේ සැලසුමකට අනුව පණ්ඩුකාභය රජතුමා විසින් අනුරාධපුර නගරය නිර්මාණය කර ඇත. එම නගර නිර්මාණය වර්තමානයේදී අගනගර නිර්මාණයේදී අනුගමනය කරනු ලබන අංගෝපාංග බහුතරයකගෙන් සමන්විත වී තිබීම විශ්මයජනකය.

පොළොන්නරුව මුලින්ම අගනුවර කරගත්තේ චෝල ආක්‍රමණිකයන් විසින්ය. ක්‍රි.ව 1070 පමණ චෝල ආක්‍රමණිකයන් පළවාහැර පළමුවන විජයබාහු රජු විසින් අගනුවර ලෙස පොළොන්නරුව තෝරා ගෙන ඇත. චෝල පාලන සමයේදී ජනනාතමංගලම් ලෙස හැඳින් වූ පොළොන්නරු යුගය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන වකවානුවකි.

අනුරාධපුර මෙන්ම ජල ශිෂ්ටාචාරය මත පදනම් වූ මෙම යුගය විශ්මිත කලා නිර්මාණ හා භාෂා සාහිත්‍ය අතින්ද ස්වර්ණමය යුගයකි. එම කාලයේදී මෙරටින් පිට රටට පවා සහල් යැවූ බව පැරණි පොත පතෙහි සඳහන් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට සමගාමීව 1987 අංක 42 දරණ පළාත් සභා පනතින් සැලසුණු අවකාශයට අනුව ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත විය. මේ අනුව යහපාලන සංකල්පයට අනුගත වීම රජයේ ප්‍රධාන අරමුණක් වන අතර ඊට අනුව යමින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා පරිපාලන ව්‍යුහය තුළ පළාත් සභා ක්‍රමය හැරවුම් ලක්ෂයක් වන අතර පළාත් සභා ක්‍රමය තුළින් බලය බෙදා හැරීම සහ ප්‍රාදේශියව පවත්නා සමාජ ආර්ථික සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා මූලික දායකත්වයක් පළාත තුළින් සපයා ඇත.



මධ්‍යම රජයට අමතරව මධ්‍යම රජයේ නියාමනයට අනුව පළාතේ සංවර්ධන පරිපාලන සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ මෙන්ම පුනරුත්ථාපන හා ප්‍රතිසංවර්ධන කටයුතු වලදී ද ප්‍රධානම කළමනාකරණ කේන්ද්‍රස්ථානය වන්නේ පළාත් සභාවයි. පළාතක ජන ජීවිතයේ යහපැවැත්ම, සමෘද්ධිමත් බව, සුභසිද්ධිය, තිරසාර බවට බාධා පමුණුවන පීඩාවන්, ප්‍රබල අභියෝග හා ගැටළු හඳුනාගෙන ඒ සඳහා තිරසාර, කඩිනම්, විධිමත් සහ ඉලක්කගත පිළියම් යෙදීමට පළාත් සභා ක්‍රමය යොදාගෙන ඇත.



පළාතේ සම්පූර්ණ ජනගහනය 1,509,946ක් වන අතර මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 10,472ක් පමණ වේ. එය ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසිනවයකින් ද [29], මහනගර සභා දෙකකින් ද [02], ප්‍රාදේශීය සභා විසිපහකින් ද [25], ග්‍රාම නිලධාරී වසම් නමසිය අසූ අටකින් ද [988] සමන්විත වේ.



උතුරු මැද පළාතේ ජනගහනය ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 6.2%ක පමණ ප්‍රතිශතයකි. පළාතේ මුළු පවුල් සංඛ්‍යාව 444,230ක් පමණ වේ. දළ දේශීය නිෂ්පාදිතයට පළාතෙන් කරනු ලබන දායකත්වය 5.4%ක ප්‍රතිශතයකි.

ජනඝනත්වය දෙස බැලීමේදී වර්ග කිලෝ මීටර එකක පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව 162 කි. මෙහිදී විශේෂත්වය වන්නේ ජනඝනත්වය අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට වඩා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනඝනත්වය ඉහළ අගයක් ගැනීමයි. පළාතේ භූමි ප්‍රමාණයෙන් විවිධ ප්‍රමාණයේ ජලාශයන්ගෙන් වර්ග කිලෝමීටර 1,031ක් පමණ ආවරණය වී ඇත. සමස්ත ජනගහනයෙන් 5%ක් පමණ නාගරිකව ජීවත් වේ. පළාතේ පවතින විවිධ සම්පත් සහ විභව ශක්තීන් අතර මානව සම්පත, සරුසාර පස, ජලය, වනාන්තර, දැව, පොස්පේට්, රෝස තිරුවානා, සත්ව හා මිරිදිය ධීවර සම්පත, පරිසර පද්ධතිය සහ විශේෂයෙන්ම එල්ලංගා වාරි පද්ධතිය සහ 250,000 ද ඉක්මවා ඇති පළාතේ ගව සම්පත විශේෂිත වේ.

උතුරු මැද පළාතේ වැදගත් සමාජ ආර්ථික තොරතුරු

## 01. භූමි ප්‍රමාණය හා විශාලත්වය - 2020

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය (ව.කි.මී) | | |
|---|---|---|---|
| | ගොඩ බිම් | අභ්‍යන්තර ජලාශ | මුළු භූමි ප්‍රමාණය |
| අනුරාධපුර | 6,479 | 700 | 7,179 |
| පොළොන්නරුව | 2,962 | 331 | 3,293 |
| උතුරු මැද පළාත | 9,441 | 1,031 | 10,472 |

**මූලාශ්‍රය: ජාතික භූමි පරිහරණ සමීක්ෂණය, භූමි පරිහරණ කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, උමැප**

## 02. ජනගහනය හා ජන ඝනත්වය

| විස්තරය | 2012* | 2016** | 2017** | 2018** | 2019** |
|---|---|---|---|---|---|
| මුළු ජනගහනය | 1,266,700 | 1,401,561 | 1,476,265 | 1,492,485 | 1,509,946 |
| නාගරික ජනගහනය (5.9%) | 50,600 | 55,866 | 87,100 | 88,057 | 89,087 |
| ග්‍රාමීය ජනගහනය (94.1%) | 1,216,100 | 1,345,695 | 1,389,165 | 1,404,428 | 1,420,859 |
| ජන ඝනත්වය | 128 | 142 | 156 | 158 | 162 |

**මූලාශ්‍රය:** * 2012 ජන හා නිවාස සංගණනය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
** සංඛ්‍යාලේඛන හා භූගෝලීය තොරතුරු ඒකකය මගින් රැස්කරන ලද දත්ත

## 03. ජාතික දළ දේශීය නිෂ්පාදිතයට පළාතේ දායකත්වය

| වර්ෂය | උ.මැ.ප (රු.මි.) | ජාතික (රු.මි.) | පළාතේ දායකත්වය (%) | පළාත් අතර ස්ථානය |
|---|---|---|---|---|
| 2012 | 379,243 | 7,578,554 | 5 | 7 |
| 2013 | 489,622 | 9,592,125 | 5.1 | 7 |
| 2014 | 561,261 | 10,361,151 | 5.4 | 8 |
| 2015 | 644,667 | 10,950,621 | 5.9 | 6 |
| 2016 | 696,804 | 11,996,083 | 5.8 | 6 |
| 2017 | 748,798 | 13,328,103 | 5.6 | 7 |
| 2018 | 809,019 | 14,290,907 | 5.7 | 6 |
| 2019 | 815,743 | 15,012,953 | 5.4 | 7 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2020**

## 04. පළාතේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික බෙදී යාම (%)

| කර්මාන්ත ප්‍රභවය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 12.35 | 12.77 | 12.76 | 11.4 | 13.0 | 14.6 | 13.5 |
| කර්මාන්ත | 21.24 | 18.62 | 18.92 | 22.0 | 17.8 | 16.3 | 17.8 |
| සේවා | 59.60 | 61.81 | 61.12 | 66.6 | 69.2 | 69.1 | 68.7 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2020**

## 05. පළාත් සෞභාග්‍යතා දර්ශකය (2018) - 0.256

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 06. දිස්ත්‍රික්ක අනුව දරිද්‍රතා දර්ශකය

| දිස්ත්‍රික්කය | දරිද්‍රතා දර්ශකය (%) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 1995/96 | 2002 | 2006/07 | 2009/10 | 2012/13 | 2016 |
| අනුරාධපුර | 27 | 20.4 | 14.9 | 5.7 | 7.6 | 3.8 |
| පොළොන්නරුව | 20.1 | 23.7 | 12.7 | 5.8 | 6.7 | 2.2 |
| උ.මැ.ප | 24.7 | 21.5 | 14.2 | 5.7 | 7.3 | 3.3 |
| ශ්‍රී ලංකාව | 28.8 | 22.7 | 15.2 | 8.9 | 6.7 | 4.1 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2020, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2016 දත්ත පමණක් ඇත)**

## 07. දිළිඳු ගෘහ ඒකක සහ දරිද්‍රතා පරතරය

| දිස්ත්‍රික්කය | දිළිඳු ගෘහ ඒකක (%) | | | දරිද්‍රතා පරතරය (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2009/10 | 2012/13 | 2016 | 2009/10 | 2012/13 | 2016 |
| අනුරාධපුර | 4.6 | 6.3 | 2.7 | 1.0 | 1.1 | 0.5 |
| පොළොන්නරුව | 4.5 | 5.6 | 1.7 | 1.0 | 0.9 | 0.5 |
| උ.මැ.ප | 4.6 | 6.1 | 2.4 | 1.0 | 1.0 | 0.5 |
| ශ්‍රී ලංකාව | 7.0 | 5.3 | 3.1 | 1.7 | 1.2 | 0.6 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 08. සේවා වියුක්ති අනුපාතය සහ සේවා නියුක්තියේ ප්‍රතිශත ව්‍යාප්තිය 2017-2018

| | | සාක්ෂරතාවය | ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය | විරැකියා අනුපාතය | සේවා නියුක්තියේ ව්‍යාප්තිය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වැටුප් සහිත සේවා නියුක්තිකා | සේවා යෝජක | තමාගේම රැකියාවක් කරන | පවුලේ රැකියා සඳහා දායකවන |
| 2017 | අ/පුර | 92.8 | 61.3 | 4.6 | 38.3 | 1.2 | 41.6 | 18.9 |
| | පො/නරුව | 89.1 | 50.0 | 3.6 | 46.4 | 2.3 | 42.4 | 8.9 |
| 2018 | අ/පුර | 93.3 | 57.3 | 4.6 | 40.8 | 0.8 | 43.8 | 14.6 |
| | පො/නරුව | 90.1 | 49.8 | 4.2 | 44.0 | 0.9 | 46.6 | 8.6 |

මූලාශ්‍රය: ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 09. තරුණ විරැකියා ප්‍රතිශතය

| වර්ෂය | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
|---|---|---|
| 2013 | 15.2 | 19.2 |
| 2014 | 13.6 | 20.3 |
| 2015 | 16.3 | 20.8 |
| 2016 | 19.7 | 21.6 |
| 2017 | 17.3 | 18.5 |
| 2018 | 24.5 | 21.4 |

මූලාශ්‍රය: ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 10. අධ්‍යාපන

| විස්තරය | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 811 | 814 | 815 | 817 | 817 |
| ගුරුවරුන් සංඛ්‍යාව | 16,264 | 16,674 | 16,905 | 16,238 | 16,353 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 280,963 | 289,971 | 297,845 | 298,869 | 297,850 |
| ගුරු සිසු අනුපාතය | 1:17 | 1:17 | 1:18 | 1:18 | 1:18 |
| පරිගණක සාක්ෂරතාව [%] | 21.6 | 20.9 | 22.1 | 21.7 | 22.5 |

මූලාශ්‍රය: පාසල් නාමාවලිය හා අධ්‍යාපනික දත්ත 2021 , උතුරු මැද පළාත

## 11. ජාතික විභාග ප්‍රතිඵල

| 2017 | | | 2018 | | | 2019 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය |
| අ.පො.ස.(සා.පෙළ) සමත් ප්‍රතිශතය (උ.පෙළ. සඳහා සුදුසුකම් ලැබූ) | | | | | | | | | | | |
| 70.03 | 73.05 | 6 | 72.78 | 75.0 | 5 | 71.78 | 73.84 | 5 | - | - | - |
| අ.පො.ස (උ.පෙළ.) සමත් ප්‍රතිශතය (විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් ලැබූ) | | | | | | | | | | | |
| 63.01 | 66.02 | 8 | 62.23 | 64.7 | 7 | 63.81 | 65.76 | 7 | 65.98 | 63.3 | 8 |

මූලාශ්‍රය:- අ.පො.ස. (සා.පෙළ) සහ (උ.පෙළ) විභාග - අපේක්ෂකයින්ගේ කාර්ය සාධනය, විභාග දෙපාර්තමේන්තුව

## 12. උතුරු මැද පළාතෙන් විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් වීම.

| පළාත් සහ දිස්ත්‍රික්ක | 2011/12 | 2012/13 | 2013/14 | 2014/15 | 2015/16 | 2016/17 | 2017/18 | 2018/19 |
|---|---|---|---|---|---|---|---|---|
| උ.මැ.ප | 1,374 | 1,186 | 1,294 | 1,327 | 1,472 | 1,554 | 1,672 | 1,783 |
| අනුරාධපුර | 972 | 830 | 935 | 966 | 1,054 | 1,097 | 1,185 | 1,296 |
| පොළොන්නරු | 402 | 356 | 359 | 361 | 418 | 457 | 487 | 487 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන දත්ත 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 13. සෞඛ්‍ය තොරතුරු

| විස්තරය | 2018 | | | | 2019 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික |
| දළ උපත් අනුපාතිකය | 16.7 | 17.3 | 16.2 | 15.1 | 15.9 | 16.5 | 15.3 | 14.6 | 15.0 | 15.5 | 14.5 | 13.8 |
| දළ මරණ අනුපාතිකය | 6.0 | 7.3 | 4.8 | 6.4 | 6.1 | 7.3 | 5.0 | 6.7 | 5.6 | 6.6 | 4.7 | 6.0 |

**මූලාශ්‍රය: දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 14. අනෙකුත් සෞඛ්‍ය අංශය හා සම්බන්ධ තොරතුරු

| විස්තරය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| ශික්ෂණ රෝහල් සංඛ්‍යාව | 1 | 1 | 1 |
| මහ රෝහල් සංඛ්‍යාව | 1 | 1 | 1 |
| මූලික රෝහල් සංඛ්‍යාව | 5 | 8 | 9 |
| ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව | 48 | 41 | 40 |
| ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ඒකක සංඛ්‍යාව | 35 | 37 | 37 |

**මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

| විස්තරය | ප්‍රමාණය (2018) |
|---|---|
| රජයේ රෝහල් ගණන | 90 |
| ඇඳවල් ගණන | 6042 |
| රජයේ සෞඛ්‍ය නිලධාරීන් ගණන | 959 |
| රජයේ හෙද නිලධාරීන් ගණන | 2699 |

**මූලාශ්‍රය:** සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## 15 .සත්ත්ව නිෂ්පාදනය

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| පශු සම්පත් ගොවිපලවල් | 14,035 |
| කිරි එකතු කරන මධ්‍යස්ථාන | 604 |

**මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 16. වී නිෂ්පාදනය -යල හා මහ කන්නය -2020

| යෝජනා ක්‍රමය | | 2019/20 මහ | | | | 2020 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනු/පුර | පොළො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අනු/පුර | පොළො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| බීජ වැපුරූ ප්‍රමාණය (හෙක්.) | මහ වාරි | 54,056 | 56,959 | 111,015 | 349,774 | 28,235 | 56,805 | 85,040 | 286,666 |
| | සුළු වාරි | 52,287 | 7,431 | 59,718 | 200,204 | 10,721 | 5,568 | 16,289 | 102,553 |
| | වර්ෂා ජලය | 12,559 | 2,626 | 15,185 | 202,300 | 378 | 0 | 378 | 66,987 |
| | **එකතුව** | **118,902** | **67,016** | **185,918** | **752,248** | **39,334** | **62,373** | **101,707** | **456,206** |
| අස්වැන්න නෙලා ගත් භූමි ප්‍රමාණය (හෙක්.) | මහ වාරිමාර්ගය | 53,756 | 56,734 | 110,490 | 342,069 | 28,198 | 56,805 | 85,003 | 285,659 |
| | සුළු වාරිමාර්ග | 52,058 | 7,326 | 59,384 | 198,247 | 10,685 | 5,342 | 16,027 | 100,114 |
| | වර්ෂා ජලය | 12,514 | 2,534 | 15,048 | 199,595 | 375 | 0 | 375 | 64,970 |
| | **එකතුව** | **118,328** | **66,594** | **184,922** | **739,911** | **39,258** | **62,147** | **101,405** | **450,743** |
| දළ නිෂ්පාදිතය (MT) | | **530,356** | **318,352** | **848,708** | **3,196,752** | **155,805** | **288,314** | **444,119** | **1,924,172** |

**මූලාශ්‍රය: සංඛ්‍යා නිබන්ධන 2020, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 17. අතිරේක බෝග නිෂ්පාදනය (මෙ.ටො.) - යල හා මහ කන්නය

| | 2019/20 | | | | 2020 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අ/පුර | පොා/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අ/පුර | පොා/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| කුරක්කන් | 796 | 77 | 873 | 4,381 | 127.7 | 12.4 | 140.1 | 18,66.3 |
| බඩ ඉරිඟු | 88,794 | 862 | 89,656 | 267,767 | 15,152.8 | 1,405.1 | 16,557.9 | 45,753.5 |
| ඉදල් ඉරිඟු | 30 | 0 | 30 | 163 | 5.2 | 1.7 | 6.9 | 172.0 |
| මෙනේරි | 0 | 0 | 0 | 29 | 0 | 0.3 | 0.3 | 78.3 |
| මුං ඇට | 367 | 163 | 530 | 5,058 | 401.4 | 808.1 | 1,209.5 | 8,439.1 |
| කව්පි | 521 | 141 | 662 | 5,765 | 791.7 | 273.3 | 1,065 | 7,450.8 |
| රටකජු | 828 | 661 | 1,489 | 18,704 | 1,277.7 | 1,180.1 | 2,457.8 | 17,671.5 |
| මඤ්ඤොක්කා | 5,001 | 5,388 | 10,389 | 167,692 | 4,393.7 | 3,228.5 | 7,622.2 | 147,154.2 |
| බතල | 744 | 1,592 | 2,323 | 23,354 | 649.2 | 806.4 | 1,455.6 | 21,225.5 |
| අර්තාපල් | 0 | 0 | 0 | 34,970 | 0 | 0 | 0 | 30,115.3 |
| රතු ළූණු | 178 | 28 | 206 | 34,212 | 672.7 | 11.8 | 684.5 | 31,662.1 |
| ලොකු ළූණු | 120 | 3 | 123 | 597 | 13,358.6 | 2,224.5 | 15,583.1 | 42,421.3 |
| අමු මිරිස් | 8,184 | 678 | 8,862 | 40,814 | 3,263.2 | 512.9 | 3,776.1 | 38,510.5 |
| අබ | 26 | 0 | 26 | 44 | 2.0 | 0.2 | 2.2 | 18.9 |
| අමු ඉඟුරු | 137 | 168 | 305 | 19,736 | 147.3 | 144.3 | 291.6 | 22,283.2 |
| අමු කහ | 44 | 124 | 168 | 26,106 | 33.7 | 113.8 | 147.5 | 13,619.7 |

මූලාශ්‍රය: කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

| විස්තරය | ප්‍රමාණය (මිලියන) |
|---|---|
| පොල් | **269** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2018

## 18. මධ්‍යනය මාසික ආදායම

| අංශය | 2003/04 | | 2016 | |
|---|---|---|---|---|
| | උ.මැ.ප | ශ්‍රී ලංකාව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| ඒක පුද්ගල ආදායම (රු.) | 3,814 | 3,968 | 16,567 | 16,377 |
| කුටුම්භ ආදායම (රු.) | 15,624 | 17,109 | 60,298 | 62,237 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2020

## 19. පළාතේ මාර්ග හා ප්‍රවාහනය

| මාර්ග වර්ගය | ප්‍රමාණය (2018) |
|---|---|
| C වර්ගයේ මාර්ග | 1250 |
| D වර්ගයේ මාර්ග | 750 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව

| විස්තරය | ප්‍රමාණය (2018) |
|---|---|
| රාජ්‍ය අංශයේ බස්රථ | 426 |
| පෞද්ගලික අංශයේ බස්රථ | 759 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව

## 20. පළාතේ මානව ප්‍රාග්ධන දර්ශකය (2016/17) – 57

මූලාශ්‍රය: ලෝක බැංකුව

## දැක්ම

**සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ප්‍රජාවක්.**

## මෙහෙවර

**සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත් හා විභවතාවන් ප්‍රශස්ත අයුරින් උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට ඍජු හා අඛණ්ඩ ලෙස දායක වීම.**

## පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන්

- නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- පළාත් සභා පරිපාලනය.
- මූල්‍ය කළමනාකරණය.
- මානව සම්පත් කළමනාකරණය.
- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය.
- වාරිමාර්ග සංවර්ධනය.
- කෘෂිකර්ම සංවර්ධනය.
- පශු සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත සංවර්ධනය.
- ප්‍රාදේශීය සංවර්ධනය.
- සමූපකාර සංවර්ධනය.
- ප්‍රජා සංවර්ධනය.
- රෝහල් සේවාවන් සංවර්ධනය හා පවත්වාගෙන යාම.
- මහජන සෞඛ්‍ය සේවාවන් සංවර්ධනය.
- පොදු සෞඛ්‍ය සේවාවන් සහ පෝෂණ කටයුතු.
- දේශීය වෛද්‍ය සේවාවන්.
- පර්යේෂණ හා සංවර්ධන.
- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය.
- අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම.
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා.
- ක්‍රීඩා සංවර්ධනය.
- සංස්කෘතික සංවර්ධනය.
- සමාජ ආරක්ෂණය හා සමාජ සුභසාධනය.
- සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් සැකසීම හා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම ඇතුලත් සමස්ත සැලසුම්කරණ ක්‍රියාවලිය මෙහෙයවීම.
- මාර්ග සංවර්ධනය.
- තොරතුරු තාක්ෂණය.
- මාර්ගස්ථ මගී ප්‍රවාහනය.
- ග්‍රාම සංවර්ධනය.
- ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා.
- නිවාස සංවර්ධනය.
- පළාතේ විගණන හා විමර්ශන කටයුතු.
- පළාත් ආදායම් කටයුතු.
- පළාත් පාලන කටයුතු.
- සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය හරහා ඉංජිනේරුමය, ආරක්ෂක සේවා හා මුද්‍රණ කටයුතු සිදු කිරීම.
- සංස්කෘතික හා කලා කටයුතු සංවර්ධනය.
- මුල් ළමාවිය සංවර්ධනය.
- පරිවාස හා ළමාරක්ෂක සේවා සැපයීම.
- මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන කටයුතු.

# පළාත් ගීතය

දිලේ රන්වැලි සෑ හිසින් හිරු
රන් කිරණ ගෙන සිළුමිණේ
සැලේ මහ බෝ ළදළු පවනින්
සිසිල පතුරා බුදු ගුණේ

සයුරු පරදන වැව් තලා මත
සිය දහස් සියපත් පිපේ
අතවනා සිරිකතට හිනැහෙයි
රන් කරල් පුලතිසි කෙතේ

සව් සිරින් ගැදි පැදි කුසුම් මී
පන්හිඳෙන් උතුරා හැලේ
රළු පරළු සෙල් කුළු මෙලෙක් වී
රූ රටා විස්කම් මැවේ

සියකමින් නොව යුතුකමින් සිත්
පහන්කළ විරු පරපුරේ
ගැමුණු පැරකුම් රජුන් විකුමන්
දිසෙයි යළි රජරට බිමේ

පද රචනය - පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි

සංගීතය - විශාරද කරුණාරත්න විජේවර්ධන

**පළාත් පුෂ්පය (ඇහැල මල)**



**පළාත් ධජය**





උතුරු මැද පළාත - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ
වවුනියා දිස්ත්‍රික්කය
මන්නාරම දිස්ත්‍රික්කය
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
පුත්තලම දිස්ත්‍රික්කය
කුරුණෑගල දිස්ත්‍රික්කය
මාතලේ දිස්ත්‍රික්කය
මඩකලපුව දිස්ත්‍රික්කය
අම්පාර දිස්ත්‍රික්කය
අනුරාධපුර දිස්ත්‍රික්කය
1. ගලෙන්බිඳුණුවැව
2. ගල්නෑව
3. හොරොව්පොතාන
4. ඉපලෝගම
5. කහටගස්දිගිලිය
6. කැබිතිගොල්ලෑව
7. කැකිරාව
8. මහවිලච්චිය
9. මැදවච්චිය
10. මිහින්තලේ
11. නාච්චාදූව
12. නොච්චියාගම
13. මධ්‍යම නුවරගම් පළාත
14. නැගෙනහිර නුවරගම් පළාත
15. පදවිය
පොළොන්නරුව දිස්ත්‍රික්කය
1. දිඹුලාගල
2. ඇලහැර
3. හිඟුරක්ගොඩ
4. ලංකාපුර
5. මැදිරිගිරිය
6. තමන්කඩුව
7. වැලිකන්ද

උතුරු මැද පළාත් සභාවේ සංවිධාන ව්‍යුහය



# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ආණ්ඩුකාරවර කාර්යාලය | 1-8 |
| 02. | පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලය | 9-10 |
| 03. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 11-20 |
| 04. | පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | 21-23 |
| **05.** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** | **24-39** |
| 5.1. | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 40-54 |
| 5.2. | පළාත් භාණ්ඩාගාරය | 55-66 |
| 5.3. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 67-77 |
| 5.4. | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 78-82 |
| 5.5. | පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 83-88 |
| 5.6. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 89-93 |
| **06.** | **පළාත් ප්‍රධාන අමාත්‍යාංශය** | **94-124** |
| 6.1. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 125-153 |
| 6.2. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 154-186 |
| 6.3. | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 187-195 |
| 6.4. | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 196-200 |
| 6.5. | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 201-206 |
| 6.6. | පුස්තකාල සේවා මණ්ඩලය | 207-211 |
| **07.** | **පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු අමාත්‍යාංශය** | **212-220** |
| 7.1. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 221-236 |
| 7.2. | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 237-254 |
| **08.** | **පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය** | **255-260** |
| 8.1. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 261-272 |
| 8.2. | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 273-282 |
| 8.3. | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 283-301 |
| 8.4. | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 302-318 |

**09.** **පළාත් ප්‍රවාහන, ක්‍රීඩා සහ යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය** **319-326**

9.1. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 327-334

9.2. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 335-341

9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය 342-345

9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය 346-358

9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව 359-367

**10.** **පළාත්, ඉඩම්, වාරිමාර්ග,මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය** **368-376**

10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව 377-388

10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 389-400

10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව 401-416

10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය 417-426

**ඇමුණුම්**

ඇමුණුම් 01 - පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2020 428-434

ඇමුණුම් 02 - උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය- 2020.12.31 දිනට 435-438

# උතුරු මැද පළාත් සංවර්ධන වැඩසටහන පිළිබඳ විශ්ලේෂණය - 2020

# OVERVIEW OF NORTH CENTRAL PROVINCIAL DEVELOPMENT PROGRAMME - 2020

**2020** වර්ෂයේ උතුරු මැද පළාත් සභාව වගකීමෙන් බැඳෙන ප්‍රධාන කාර්යයන් 39ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමට අපේක්ෂා කළ ද කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් මුදල් කොමිෂන් සභාව මගින් පළාතේ සියළු අංශයන්ගේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා ප්‍රාග්ධන වැය ලෙස නිර්දේශිත ප්‍රතිපාදනය වූයේ රු.මි. 10,260ක් පමණි.

2020 වර්ෂයේ ප්‍රාග්ධනය සඳහා නිර්දේශිත ප්‍රතිපාදන ලෙස රු.මි.10, 260ක ආයෝජනයක් කර ඇත

පළාත් අධ්‍යාපන අංශයේ සංවර්ධනය උදෙසා සියළු මූල්‍ය ප්‍රභවයන්ගෙන් කරන ලද සංවර්ධන ආයෝජනය හා දායකත්වය අතිමහත් ය. පළාතේ දුවාදරුවන්ගේ අධ්‍යාපනය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉහළ මට්ටමකට ගෙන ඒමට කරන ලද ආයෝජනය තුළින් පාසැල් පද්ධතියේ අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතුව පැවති පංති කාමර ගොඩනැගිලි, විද්‍යාගාර හා අනෙකුත් අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කරන ලද ආයෝජනය කැපී පෙනේ. මේ සඳහා රු.මි.36.75ක මුදලක් ආයෝජනය කරන ලදී. එපමණක්ද නොව අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම මගින් පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ප්‍රතිඵල ලබා ගෙන ඇති ප්‍රගතිය සැලකිය යුතු මට්ටමක පවතී.

පළාතේ සෞඛ්‍ය සේවා නගා සිටුවීම සඳහා බටහිර ප්‍රතිකාරක සේවා හා රෝග නිවාරණ සේවා සඳහා සුවිශාල දායකත්වයක් වර්ෂය තුළදී සැපයිය හැකි විය. ඒ සඳහා රු.මි.411.93ක ආයෝජනයක් සිදුකර ඇත. ඉන් වැඩිම ආයෝජනයක් සිදුකර ඇත්තේ කොවිඩ්-19 ගෝලීය වසංගතය මැඩලීම හා පාලනය සම්බන්ධ කටයුතු සඳහාය. එසේම පාරම්පරික මෙන්ම උතුරු මැද පළාත තුළ දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා 2020 වර්ෂයේදී රු.මි.72.22ක ආයෝජනයක් සිදුකර ඇත.

2030 වර්ෂයේදී සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක 01 සියළු තන්හී සෑම ආකාරයෙන්ම පවතින දුගී බව තුරන් කිරීම, අංක 02 සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය සහිත තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, අංක 12 තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් සහතික කිරීම යන අරමුණු කරා පළාතේ දායකත්වය සැලකිය යුතු මට්ටමකින් සැපයීම සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයේ සහ රේඛීය අමාත්‍යාංශවල සහය සහිතව ඒකාබද්ධව සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලදී.

ඒ සඳහා රු.මි. 58.64ක් ආයෝජනය කර ඇත. එසේම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළාතේ පශු සම්පත් සංවර්ධනය මෙන්ම පශු සම්පත් අංශයේ නියැලී ගොවීන්ගේ ආදායම් තත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපාදන ආයෝජනය කරන ලදී. ඒ යටතේ රු.මි.22.52ක් ආයෝජනය කර ඇත. ඒ අනුව කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය උදෙසා රු.මි.81.16 ක් ආයෝජනය කර ඇත.

පළාත් වාරි පද්ධතියේ සංවර්ධනය උදෙසා මෙන්ම ප්‍රශස්ත වාරි කළමනාකරණයක් තුළින් සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා 2020 වර්ෂයේදී රු.මි. 563.33ක ආයෝජනයක් කර ඇත. ඒ යටතේ වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම, නිරන්තර නඩත්තුව, වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් එකතු කිරීම, ගොවි සංවිධාන බලගන්වමින් ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම, ජල ගැලීම් හා හානී කළමනාකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ කමිටු සක්‍රියව පවත්වාගෙන යාම, පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම, තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාමට අදාල ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී. එසේම කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා මෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය අංශයේ සංවර්ධනය උදෙසා මෙම ආයෝජනය ඉවහල්වන බව කිව යුතුය.

පළාතේ සමාජ ආරක්ෂණය උදෙසා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ඒ ඒ විෂය පථයන්ගේ සංවර්ධනය උදෙසා 2020 වර්ෂයේදී කැපී පෙනෙන ආයෝජනයක් සිදුකර ඇත. ඒ යටතේ ළමා නිවාස හා රැඳවුම් නිවාස සංවර්ධනය කිරීම, ළමා රැකවරණය හා සුභසාධනය නගා සිටුවීම, ළමා අයිතිවාසිකම් සුරැකීම හා ළමා අපයෝජන හා අපචාර අවම කිරීම, උපදේශන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රු.මි.6.06ක් ආයෝජනය කර ඇත. එසේම පළාතේ වැඩිහිටි නිවාස, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ රැකවරණ මධ්‍යස්ථාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය මෙන්ම විවිධ මහජන ආධාර සපයමින් සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ සඳහා පළාත් ආයෝජනය රු.මි. 0.48කි. ඒ අනුව අංශයේ සංවර්ධනය උදෙසා සමස්ත ආයෝජනය රු.මි.6.54කි.

පළාතේ පළාත් පාලන විෂය යටතේ පවතින සේවා සංවර්ධනය උදෙසා 2020 වර්ෂයේ දායකත්වය කැපී පෙනේ. ඒ යටතේ පළාත් පාලන ආයතන බලප්‍රදේශවල ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම, වෙළෙඳ පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රජා ජල පහසුකම් වැඩිදියුණු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා තිරසර යාන්ත්‍රණයක් සැකසීම, පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදුයුණු කිරීම, ග්‍රාමීය පුස්තකාල, පෙරපාසල්, ළමා උද්‍යාන, සුසාන භූමි සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු විය. ප්‍රධාන අමාත්‍යාංශය, රේඛීය අමාත්‍යාංශයන්හී මූල්‍ය සහය සහිතව මෙම ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී. පළාත් සභාව සතු මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මාර්ගවල යටිතල පහසුකම් එනම් පාලම්, බෝක්කු හා නිර්මිතයන් සංවර්ධනය කිරීම, මාර්ග සංඥා සහ සලකුණු ස්ථාපිත කිරීම, දෛනික කාලීන හා හදිසි අවස්ථා සහිත ක්‍රමානුකූල නඩත්තුව සඳහා පළාත් සංවර්ධන ආයෝජනයන් සිදු කරන ලදී. මේ සඳහා රු.මි.262.12ක මුදලක් ආයෝජනය කර ඇත.

උතුරු මැද පළාතේ සමුපාකාර අංශයේ සංවර්ධනය උදෙසාත් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහාත් සමුපකාර අමාත්‍යාංශය හා කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබූ අතර ඒ සඳහා රු.මි. 6.18ක මුදලක් ආයෝජනය කරන ලදී. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් රු.මි.334.64ක ආයෝජනයක් සිදු කරන ලදී.

ක්‍රීඩා අංශය මගින් පළාත තුළ ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා රු.මි.15.34ක මුදලක් 2020 වර්ෂය තුළදී ආයෝජනය කරන ලදී. 2020 වර්ෂයේ ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් අංශයන්හී පවතින අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා රු.මි. 8.87ක මූල්‍ය ආයෝජනයක් සිදු කරන ලදී.

ඉතාමත් වැදගත් මෙන්ම ශක්තිමත් කළ යුතු අංශයක් වන ග්‍රාම සංවර්ධන අංශය යටතේ පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා සමිති ශක්තිමත් කිරීම, ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවා පවත්වාගෙන යාම, කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන හා ලිය සවිය මධ්‍යස්ථාන මගින් මැහුම් පාඨමාලා පවත්වාගෙන යාම, දැහැමි නිවහන හා ශ්‍රමාභිමානී වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක සඳහා රු.මි.9.69ක මුදලක් ආයෝජනය කෙරිණි. සංචාරක අංශයේ සංවර්ධනය උදෙසා පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන අමාත්‍යාංශය මගින් රු. මි. 89.01ක් ආයෝජනය කර ඇත.

ආණ්ඩුකාරවර කාර්යාලය මඟින් 2020 වර්ෂයේදී රු.මි.24.48 ක මුදලක් ආයෝජනය කරන ලදි. ඒ යටතේ නිල නිවස අළුත් වැඩියා කිරීම, පෞද්ගලික කාර්ය මණ්ඩලය භාවිත කරන පළාත් සභා ලේකම් කාර්යාලයේ පවතින කාර්යාලය කොටස් වලට බෙදා වෙන් කිරීම, පොළොන්නරුව උප කාර්යාලයේ කොටස් බෙදා වෙන් කිරීම හා පොළොන්නරුව නිල නිවස සඳහා විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම හා සම්බන්ධ කටයුතු සිදු කර ඇත.

එසේම ප්‍රධාන ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා රු.මි.84.04ක් වැයකර ඇත. 2020 වර්ෂයේදී උතුරු මැද පළාතේ අනුමත සේවක සංඛ්‍යාව 9308ක් වුවද වර්ෂය තුළදී සේවයේ නියුතු සංඛ්‍යාව 6934කි. විශේෂයෙන්ම පළාත් සෞඛ්‍ය අංශයේ සේවාවන් ජනතාව වෙත සමීප කරලීම සඳහා සේවයේ නියුතු වූ සේවකයින් සංඛ්‍යාව 3945කි. එසේම පළාතේ අධ්‍යාපන අංශය සැලකූ විට 2020 වර්ෂයේදී 297850ක් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ගුරුවරුන් 16353කගේ මෙන්ම ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් 787ක් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ ද දායකත්වය සපයන ලදී.

ඒ සියල්ල සමග 2020 වර්ෂයේ ප්‍රාග්ධනය සඳහා නිර්දේශිත ප්‍රතිපාදන ලෙස රු.මි.10,260ක ආයෝජනයක් කර ඇත.

# තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ සැලකිළිමත් බව.

# Concern of the North Central Province towards achieving global sustainable development goals and objectives.

උතුරු මැද පළාත් දැක්ම කරා ළඟාවීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන තිස් හතක් (37) මගින් වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබයි. එසේම වාර්ෂිකව එකිනෙක අංශයන් මගින් අපේක්ෂිත සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීම ප්‍රමුඛ කොට සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි.




තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ සාධනය කරගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් සංවර්ධන සැලැස්ම සකස් කරන ලදී. මෙම කාර්යයේදී ජාතික මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ කරා ළඟා වීමට පළාතේ දායකත්වය සැපයිය හැකි අයුරින් පළාතට උචිත මෙන්ම ගැළපෙන අයුරින් සකස් කරගන්නා ලද දර්ශක හා ඉලක්ක කෙරෙහි වාර්ෂිකව ආයෝජනයන් සිදුකරයි. පළාත් මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි සාධනීය පෙළඹීමක් සහිත ගමනක පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන නිරතවීම උතුරු මැද පළාත 2020 වර්ෂයේ ලද ජයග්‍රහණයකි.

එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන තම ආයතනයට අනන්‍ය වූ තිරසර සංවර්ධන අරමුණු සාධනය කරගැනීම කෙරෙහි සෘජුව දායක වන අතර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන ඒකාබද්ධ (INTEGRATED) ලෙස ද තිරසර සංවර්ධන අරමුණු සාධනය කරගැනීම කෙරෙහි දායකත්වය සපයයි.

2020 වර්ෂය තුළදී ගෝලීය තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සම්බන්ධයෙන් රටක් ලෙස ශ්‍රී ලංකාවේ දායකත්වය අපේක්ෂිත මට්ටම කරා ළඟා වීමට පළාතේ දායකත්වය ප්‍රශස්ත අයුරින් ලබා දීමටත් සැලකිය යුතු මට්ටමකින් දායක වීමටත් අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තුවට අයත් විෂයපථය තුළ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

උතුරු මැද පළාත් සභාවට අයත් සියළු ආයතන 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු ව්‍යාපෘති හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි අවධානය යොමු කරමින් මෙහෙයවන ලද අතර ඒ සඳහා රු.මි.10,260ක පමණ ප්‍රාග්ධනය සඳහා නිර්දේශිත ප්‍රතිපාදන මුදලක් ආයෝජනය කරන ලදී.

# 01. ආණ්ඩුකාරවර කාර්යාලය

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය

### ජාතික විධායකයේ පළාත් නියෝජනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ (1) අනු ව්‍යවස්ථාව අනුව සෑම පළාත් සභාවකම ආණ්ඩුකාර ධූරයක් පවතී. 154 ආ (2) අනුව ව්‍යවස්ථාවප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාගේ අත්සන යටතේ වූ අධිකාරී පත්‍රයකින් පත් කෙරෙන ආණ්ඩුකාර ධූරය පළාත් සභාවක ජනාධිපතිතුමාගේ නියෝජිතයා ලෙස වූ කාර්යභාරයක් ද ඉටු කරනු ලබයි.
ජනාධිපතිතුමාගේ විධානය මත ආණ්ඩුකාරතුමා විසින් ගනු ලබන තීරණ අවසානාත්මක වන අතර, එය අධිකරණයක දී ප්‍රශ්න කළ නොහැකි බලයකි.

### ආණ්ඩුකාර ධූරය සතු බලතල

- විධායක බලතල
- මූල්‍ය බලතල
- පරිපාලන බලතල

### 01. විධායක බලතල

13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවක විෂය ක්ෂේත්‍රය පිළිබඳ ආණ්ඩුකාරවර ධූරය සතු විධායක බලතල 154 හා (ඇ) 154 (ඊ) ව්‍යවස්ථා පරිදි සෘජුව හෝ අමාත්‍ය මණ්ඩලය මගින් හෝ නිළධාරීන් මගින් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

### පළාත් සභා කටයුතු පිළිබඳ බලතල

- 154 අ (8) (අ) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයා නිශ්චය කරන අවස්ථාවකදී නියම කරනු ලබන වේලාවක සභාව කැඳවීම.
- 154 අ (8) ( ආ) වගන්තිය අනුව සභාව වාර අවසාන කිරීම.

### අමාත්‍ය මණ්ඩලය පිළිබඳ බලතල

- 154 ඊ (4) වගන්තිය අනුව ප්‍රධාන අමාත්‍යවරයා පත් කිරීම.
- 154 ඊ (5) වගන්තිය අනුව අමාත්‍යවරුන් 4 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.
- අමාත්‍යවරු අතර විෂයන් බෙදීම.
- 154 අ (11) (අ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලු යෝජනා දැන ගැනීම.
- 154 අ (11) (ආ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනා පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- 154 අ (11) (ඇ) වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොමැති එහෙත් අමාත්‍යවරයෙකු විසින් ගන්නා ලැබූ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවරයාට නියම කළ හැකිය.

- 154 අ (10) (අ) වගන්තිය අනුව සභාව ඇමතීම හා ඒ සඳහා මන්ත්‍රීවරුන් කැඳවීමට නියමයන් කිරීම.
- 154 අ (8) (ඇ) වගන්තිය අනුව සභාව විසුරුවා හැරීම.

## 02. මූල්‍ය බලතල

- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 (5) වගන්තිය අනුව පළාත් සභා අරමුදල් භාරය, අරමුදලට මුදල් ගෙවීම ආදී සියලු රීති මගින් විධිමත් කිරීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (1) වගන්තිය අනුව පළාතේ හදිසි අවස්ථා අරමුදල පිළිබඳ භාරය දැරීම හා පාලනය සඳහා රීති සෑදීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 (2) වගන්තිය අනුව පළාත් සභා අරමුදලේ ගිණුම් සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව පළාත් සභාවට ඉදිරිපත් කිරීම.
- 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 27 (4) වගන්තිය අනුව පළාත් සභාව විසුරුවා හැර හෝ කටයුතු කිරීම නතර කර ඇති අවස්ථාවක පළාතේ පරිපාලන කටයුතු සඳහා අරමුදලෙන් වියදම් කිරීමට අනුමැතිය දීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව බදු පැනවීම, අහෝසි කිරීම, අඩු කිරීම, වෙනස් කිරීම, විධිමත් කිරීම, ඊට අදාල නීති සංශෝධනය , පළාත් සභා අරමුදල් විසර්ජනය කිරීම, පළාත් සභා අරමුදලට මුදල් භාර ගැනීම සහ වියදම් දැරීම සඳහා වූ ප්‍රඥප්ති නිර්දේශ කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය ඇතුළු ක්‍රියාත්මක වන ප්‍රඥප්ති සහ නව ප්‍රඥප්ති අනුමැතියට පෙර සලකා බලන ලෙස සභාවට දැන්වීම.
- 154 (ඌ) වගන්තිය අනුව පළාත් සභාවෙන් අනුමත කළ වියදම් සඳහා බලය දීම.
- 154 (ඌ) වගන්තිය අනුව පරිපූරක ප්‍රදානයන් සඳහා අනුමැතිය ලබා දීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 28 (2) වගන්තිය අනුව ප්‍රදාන කිරීමට නිර්දේශ කිරීම.
- 154 (ඌ) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය අනුමත කිරීම.

## 03. පරිපාලන බලතල

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ විනය පාලන කටයුතු කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2) වගන්තිය අනුව බලතල පැවරීම, නියෝග නිකුත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (8) වගන්තිය අනුව විනය අභියාචනා පිළිබඳ අවසන් තීරණ ගැනීම.

1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුව උතුරු මැද පළාත් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධ සියලු බලතල ආණ්ඩුකාර ධූරයට හිමිව ඇත. එම බලතල අවස්ථානුකූලව අදාළ නිලධාරීන් වෙත පවරා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ, පළාතේ මූල්‍ය පාලනයේ හා පළාත සංවර්ධනයේ සියලු කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා මග පෙන්වීම සඳහා පහත කාර්යයන් සිදු කෙරේ.

- පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති නිර්දේශ කර ඉදිරිපත් කිරීම, පරිපූරක ඇස්තමේන්තු නිර්දේශ කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති අනුමත කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීම / ස්ථාන මාරු කිරීම/ නිදහස් කිරීම.
- විශ්‍රාමික නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම, පත් කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම.
- විධිමත් විදේශ ගමන් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරට යාමට අනුමැතිය දීම.
- සියලු නව බඳවා ගැනීම්, පත් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
- දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම.
- බඳවා ගැනීමේ පටිපාටි සහ ව්‍යවස්ථා සංග්‍රහ අනුමත කිරීම / සංශෝධන සඳහා අනුමැතිය ලබා දීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරීම.
- ආණ්ඩුකාරවර අරමුදලින් ලබා දෙන ආධාර හා පරිත්‍යාග පිළිබඳව කටයුතු කිරීම.
- පළාත් සභා රාජ්‍ය සේවයට අදාල නිලධාරීන්ගේ ආයතන කටයුතු සඳහා ආයතන අධ්‍යක්ෂ ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දීම.
- මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාල කිරීම.
- උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය නියෝගවලට එරෙහිව අභියාචනා පිළිබඳ තීරණ ලබා දීම.
- උතුරු මැද පළාත් සභා නිලධාරීන්ගෙන්, අමාත්‍යාංශවලින්, ආයතනවලින් ලැබෙන ලිපි පෙත්සම් පිළිබඳ කටයුතු කිරීම.
- පළාත් සභාවේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ අභියාචනා දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වෘත්තීය සමිති ඉල්ලීම් අනුව සාකච්ඡා කැඳවීම, රැස්වීම් පැවැත්වීම, වාර්තා නිකුත් කිරීම.

## දැක්ම

"අභිමානවත් ජනතාවක් සහිත සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"ව්‍යවස්ථාපිත කටයුතු, ආයතනික කටයුතු, මූල්‍ය නියාමනය, සමාජ සංවර්ධන කටයුතු සහ යහපාලන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වය ඇතිව ජාතික ප්‍රතිපත්තියට අනුගතව හා විනිවිදභාවයෙන් යුතුව සාධාරණ ක්‍රමවේදයක් මඟින් අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් ගොඩනැගීම සඳහා අඛණ්ඩව දායකවීම".

## අරමුණු

- ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.
- විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.
- පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- මහජන ගැටලු විසඳීම සඳහා මග පෙන්වීම.
- සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ඵලදායිතාවය වැඩිදියුණු කරලීම සඳහා පංචවිධ සංකල්පය යොදා ගැනීම, ඵලදායිතාවය මඟින් සේවක පිරිස් අභිප්‍රේරණය කරලීම, පළාත් රාජ්‍ය සේවයේ අක්‍රමිකතා අඩුකරලීම හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ, පුහුණු වැඩමුළු, සාකච්ඡා, සම්මන්ත්‍රණ සංවිධානය හා පසු විපරම් කාර්යය ක්‍රියාත්මක කරලීම. (අහඹු පරීක්ෂා කිරීම් හා සමීක්ෂණ මඟින්)
- වාර්ෂික මුදල් ප්‍රකාශයට අනුව ඇස්තමේන්තු කරන ලද කාර්යයන් අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කරවීම. (පළාත් භාණ්ඩාගාරය මඟින් සිදුකරන දැනුවත් කිරීම් සඳහා මග පෙන්වීම, උපදෙස් හා අනුමැතීන් ලබාදීම, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කරවීම හා පසු විපරම් ක්‍රියාවලියක් ඇති කරවීම,සිදුකරන ලද විමර්ශන වාර්තා අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදාල බලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම.)
- සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ සංවර්ධනයට අත්වැලක් සැපයීම, ආගමික හා සිවිල් සමාජ සංවිධාන හරහා අධ්‍යාපනික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අඩු පහසුකම් සහිත විහාරස්ථාන සංවර්ධනය හා සාමණේර වහන්සේලා සඳහා අධ්‍යාපන උපකාර කිරීම හා දහම් පාසල් සංවර්ධනය කිරීම හා රණවිරු පවුල් සුභසාධනයට මග පෙන්වීම.

## ප්‍රධාන කාර්යයන්

### ප්‍රධාන උපාය මාර්ගයන්

පළාතේ පරිපාලන හා මූල්‍ය යාන්ත්‍රණය ක්‍රියා කරවීමේ ප්‍රධානම ආයතනය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක කරවීම.




එසේම ජනතා සුභසාධනය හා සමාජ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය ජාතික හා පළාත් සැලසුම් නිර්දේශයන් අනුව ක්‍රියාත්මක වෙමින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පළාත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




රටවල් තුළ හා රටවල් අතර පවතින අසමානතා අවම කිරීම

තිරසර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය, යුක්තිය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සඵලදායි, වගවීම් සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම

තිරසර සංවර්ධනය සඳහා වන්නා වු සහයෝගිතා ක්‍රියාදාමය සවිමත් කිරීම හා පුනර්ජීවය

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

ජාතික ප්‍රතිපත්තියට අනුගතව වසර 2030 වන විට පළාත් සංවර්ධනයට අදාල තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් හා මගපෙන්වීම අනුව පළාතේ සියලුම අමාත්‍යංශ දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාල අරමුණු ක්‍රියාවට නැංවීම මගින් පළාතේ තිරසර සංවර්ධනය ඇති කිරීම මුලික අරමුණ වේ.

## කාර්ය සාධන ඉලක්ක - 2020

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක |
|---|---|---|
| ❖ ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.<br>❖ විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.<br>❖ පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.<br>❖ මහජන ගැටලු විසඳීම සඳහා මග පෙන්වීම.<br>❖ සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ ප්‍රධාන ලේකම් කාර්යාලය/ අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍යාංශවල නිර්දේශ සහිතව ඉදිරිපත් කරන සියළු පත් කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම්, චක්‍රලේඛ ප්‍රඥප්ති හා උපදෙස් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා නිරීක්ෂණ හා නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලැබුණු පසු නැවත ඒවා අදාල ආයතන වෙත යොමු කිරීම | ඉදිරිපත් වන සියළු නිර්දේශ ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමුකර අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම, නිර්දේශයන්ට අදාල තීරණයන් ලබා දී අවසන් කිරීම |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

### 1. නිවාස ආධාර හා නිවාස සඳහා විදුලි ආධාර ලබා දීම.



රඹෑව, ගලෙන්බිදුණු වැව, ගල්නෑව, මැදිරිගිරිය, මධ්‍යම නුවරගම් පළාත, කැකිරාව, මැදිරිගිරිය, ඉපලෝගම යන ප්‍රාදේශීය සභා ආවරණය වන පරිදි රු. මි. 0.80 ක් වැය කරමින් නිවාස ආධාර හා නිවාස සඳහා විදුලි ආධාර ලබා දීම කටයුතු කර ඇත.

### 2. ලේ දන් දීමේ වැඩසටහන.



අනුරාධපුර මධ්‍ය විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය හා සම්බන්ධව පුද්ගලයන් 240 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2020.11.14 වන දින ලේ දන් දීමේ වැඩසටහනක් සිදු කරන ලදි.

## 3. වෘත්තීය පුහුණු සඳහා සිසුන් යොමු කිරීමේ වැඩසටහන.

වෘත්තීය පුහුණු ආයතන පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ පුවරු 02ක් රු. මි. 0.04ක් වැය කරමින් සකස් කර නව බස් නැවතුම්පල හා මාර්කට් පෙදෙස ඒවා ප්‍රදර්ශනය කරන ලදි.

## 4. ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන හා වගා කටයුතු නිරීක්ෂණය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.09.29 යන දිනය තුල නෑගම්පහ, බුල්නෑව, පලාගල, ආඩියාගල, මඩාටුගම ගොවිජන සේවා මධ්‍යස්ථාන ද 2020.09.15 යන දිනයේ දි තලාව, එප්පාවල, ශ්‍රාවස්තිපුර ගොවිජන සේවා මධ්‍යස්ථාන ද 2020.09.28 හොරොව්පතාන, කපුගොල්ලෑව, පරංගියාවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථාන මෙන්ම වගා කටයුතු ද නිරීක්ෂණයට ලක් කරන ලදි.

## 5.ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.



ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2020.12.16 වන දින ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත.

## 6. පාසල් සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම.

මෙම ව්‍යාපෘතිය යටතේ රු. මි. 0.03ක් වැය කරමින් අත් පන්දු හා රබර් දැල් ලබා දෙන ලදී.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියළුම ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් මහජන දින වැඩසටහන් සෑම සතියකම බදාදා දින පළාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබන අතර එහිදී පළාතේ ජනතාවගේ ගැටළුවලට විසඳුම් ලබා දීමක් සිදු කරනු ඇත.

01. ප්‍රඥප්ති සකස් කිරීමට ප්‍රධාන ලේකම් වෙත අනුමැතිය ලබා දීම.

02. 2021 වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කිරීම.

03. පරිපූරක අනුමත කිරීම.

04. බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම් හා සංශෝධනය කිරීම් අනුමත කිරීම.

05. ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරන අභියාචනා සඳහා කටයුතු කිරීම.

06. පළාත් පාලන ආයතනවලට අදාල උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු නිදහස් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.

07. පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.

08. විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.

09. දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම,පත් කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම.

10. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීම.

11. දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම.

12. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාදන වාර්තා අනුමත කිරීම.

13. මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාල කිරීම.

Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී නිශ්චිත ඉලක්කගත කාලය තුළ ව්‍යාපෘති නිම කිරිමට බාධා ඇති වුවද වර්ෂ අවසානය වන විට පළාත් අණ්ඩුකාරවර කාර්යාලය සතු විෂය පථය මැනවින් ඉටුකරමින් වර්ෂය තුළ කාර්ය සාධනය යහපත් ලෙස සාධනය කරගත හැකි වූ වසරක් ලෙස සඳහන් කළ හැකිය.

# 02. පළාත් සභා ලේකම් කාර්යාලය

**පළාත් සභා ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය**
**පළාත් සභා ඉතිහාසය**
**ආයතනයේ කටයුතුවලට බලාධිකාරිය ලැබී ඇති ආකාරය**

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (සංශෝධනය)
- පනත් -- 1987 අංක 42 දරණ පළාත් සභා පනත
- ආඥා පනත්
- ප්‍රඥප්ති -- 1990 අංක 14 දරණ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය
- චක්‍රලේඛ හා වෙනත්

**ආයතනය ආරම්භ කරන ලද දිනය හා ඊට අදාළ මූලික තොරතුරු**

- දිනය - 1988 මැයි මස
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 17.1, 17.2 වගන්ති ප්‍රකාර පිහිටුවන ලද පළාත් සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා සභා ලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

**ආයතනය මේ දක්වා පැමිණි අතීත ගමන් මග**

1988 මැයි මස ආරම්භ කරන ලද පළාත් සභා ලේකම් කාර්යාලයට ස්ථිර වශයෙන් ගොඩනැගිල්ලක් නොතිබූ අතර මහලේකම් කාර්යාලයේ ලබාගත් කුඩා කාමරයක කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. පළාත් සභා රැස්වීම් පැවැත්වීම සඳහා නිසි ස්ථානයක් නොතිබුණි. අනුරාධපුර පණ්ඩුලගම ගම් උදා භූමියේ ඇති ගොඩනැගිල්ලක 1988.05.12 වෙනි දින ප්‍රථම සභා රැස්වීම් පවත්වා ඇත. පසුව අනුරාධපුර විවේකානන්ද විද්‍යාලයේ සන්ථාගාර ශාලාව ද මාස කිහිපයක් ප්‍රයෝජනයට ගත් අතර, නැවත අනුරාධපුර මහලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලේ කුඩා රැස්වීම් ශාලාවක් ස්ථාපිත කර 2004 සැප්තැම්බර් දක්වා එහි සභා රැස්වීම් කටයුතු පවත්වාගෙන ගොස් ඇත.

**දැක්ම**

“මනා ක්‍රියාකාරිත්වයෙන් යුත් ජනතාවාදි පළාත් සභාවක්, සමෘද්ධිමත් පළාතක්”.

**මෙහෙවර**

“උතුරු මැද පළාතේ සමස්ත පළාත් සභා කටයුතුවල සංවර්ධනය උදෙසා සැසි හා රැස්වීම් කටයුතු සහ කාරක සභා කටයුතු අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව බල ගැන්වීම”

**දිගුකාලීන අරමුණු**

පළාත් ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවමින් පොදුවේ පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට දායක වීම.

**කෙටි කාලීන අරමුණු**

- පළාත් සභාවට පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා පිහිටුවා ඇති ආයතන (පළාත් සභාව සහ කමිටු) විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගෙන යෑම තුළින් ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටළු නිරාකරණය කිරීම
- ගරු පළාත් අමාත්‍යවරුන්ට මන්ත්‍රී වරප්‍රසාද යටතේ හා ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු විපක්ෂනායකතුමා, ගරු සභානායකතුමා, ගරු ආණ්ඩු පක්ෂයේ හා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන්ට ජන ජීවිතය ඉහළ

නැංවීම සඳහා වරප්‍රසාද හා අවශ්‍ය පහසුකම් සැලසීම.

- ඉහත I හා II කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම.




## ප්‍රධාන කාර්යයන්

## ප්‍රධාන උපාය මාර්ගයන්

ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 22ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 25 කි. පුරප්පාඩු සංඛ්‍යාව 2 කි.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිම ගමන් මග

උතුරු මැද පළාත් සභාවෙන් නිකුත් කර ඇති ප්‍රඥප්ති එක් කර පළාත් සභා ලේකම් කාර්යාලයේ පුස්තකාලය සකස් කිරීම

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන්

උතුරු මැද පළාත් සභාව විසුරුවා හැර අවුරුදු 03කට ආසන්න කාලයක් ගත වී ඇති අතර මෙම වසරේදී පළාත් සභා මැතිවරණය පවත්වා නව පළාත් සභාවක් ආරම්භ වුවහොත් යන අපේක්ෂාවෙන් සභා ගර්භයේ වහළ හා ඒ ඇතුළත නඩත්තු කටයුතු සිදු කර යථා පරිදි සකස් කිරීම හා යටිතල පහසුකම් යටතේ ඇමතුම් උපකරණ පද්ධතිය වසර 03ක ආසන්න කාලයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අලුත්වැඩියා කටයුතු සිදු කර මනා ක්‍රියාකාරීත්වයෙන් යුත් ජනතාවාදී පළාත් සභාවක් හා සමෘද්ධිමත් පළාතක් බිහි කිරීමමේ අපේක්ෂාවෙන් මෙම යෝජනා 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

තිරසාර සංවර්ධනය මගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධානම ආයතනය වන මෙම පළාත් සභාව එහි ගෞරවය හා අභිමානය සුරැකෙන ආකාරයෙන් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සියල්ලක්ම පාහේ සපුරා ගැනීමට මේ වන විට සමත්ව ඇත. ගොඩනැගිලි පහසුකම්, ප්‍රවාහන පහසුකම් අවශ්‍ය මට්ටමට සපුරාගෙන ඇති අතර කාර්යාලයේ ගිණුම් කටයුතු හා අනෙකුත් රාජකාරි කටයුතු යාවත්කාලීනව පවත්වා ගෙන යමින් අපේක්ෂිත සේවාවන් උපරිම තලයකට ගෙන ඒමට කටයුතු කර ඇත. එමෙන්ම සභාවේ අභිමානය රැකෙන අයුරින් සභාවේ ගොඩනැගිලි හා ඉදිකිරීම් නවීකරණය කරන ලදී. තවද උතුරු මැද පළාත් සභාවෙන් නිකුත් කර ඇති ප්‍රඥප්ති එක් කර පළාත් සභා ලේකම් කාර්යාලයේ පුස්තකාලය සකස් කරන ලදී.

# 03. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පැවරෙන ආකාරය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අනුව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

1987 අංක 42, 1989 අංක 12 දරණ පළාත් සභා අනුශාංගික විධිවිධාන පනත හා 1990 අංක 28 දරණ පළාත් සභා සංශෝධිත පනත අනුව, ගරු ආණ්ඩුකාරතුමා සතු පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධ කටයුතු සිදු කිරීමේ බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරේ.

උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කරන ලද දින සිට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වන අතර පළාත් සභා පනතේ හා සංශෝධිත වගන්ති අනුව සහ ගරු ආණ්ඩුකාරතුමා විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල අනුව කටයුතු කරනු ලබයි.

## දැක්ම

"ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක්"

## මෙහෙවර

"පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල කළමනාකරණය සියළු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව විධිමත්ව ඉටුකරමින් ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව දායක වීම."

## දිගුකාලීන අරමුණු

- තෘප්තිමත් රාජ්‍ය සේවයක් ගොඩනැංවීම පිණිස පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කිරීම, කාලීනව සුදුසු තීරණ ගැනීම හා ක්‍රියා කිරීම.
- පළාත් රාජ්‍ය සේවය තුළ විනය පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම.
- ප්‍රශස්ත රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව මැදිහත්වීම.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ආයතනික කටයුතු විධිමත් කිරීම.
- වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.
- විනය නියෝගවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීම.
- නිසිකලට කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තුගත පරීක්ෂණ පැවැත්වීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- කාර්ය මණ්ඩල තොරතුරු හඳුනා ගැනිම හා යාවත්කාලීන කිරීම.
- බඳවා ගැනීමේ පරිපාටි විධිමත්ව අනුමත කරගැනීම හා කාලීන අවශ්‍යතා අනුව අදාල සංශෝධන කිරීම.
- පත් කිරීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරීම.
- විනය පාලනයට අදාල අභියාචනා පිළිබඳව සමාලෝචනය හා තීරණ ගැනීම.
- පත් කිරීම හා ස්ථානමාරු පිළිබඳව මධ්‍යම රජය හා අනෙකුත් පළාත් සභා සමග කටයුතු කිරීම.
- බඳවා ගැනීමේ හා උසස්වීම් සඳහා වූ වාර්ෂික විභාග සැලැස්ම විධිමත්ව සකස් කිරීම හා සැලසුම්සහගතව ක්‍රියාත්මක කිරීම.
- විනය කටයුතු හා කාර්ය මණ්ඩල නියාමනය සඳහාවන උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම.
- අවශ්‍යතා පරිදි නිසි කල්හී පුරප්පාඩු පිරවීම, උසස්වීම්, ස්ථිර කිරීම් ලබා දීම හා විනය ක්‍රියාමාර්ග ගැනීම.

## අංශ නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

තිරසාර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම, සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම සඳහා රාජ්‍ය සේවයට බඳවා ගැනීම්, මාරු කිරීම්, උසස් කිරීම් ආදි කටයුතුවලදී රාජ්‍ය ක්‍රමවේදයන්ට අනුව සාධාරණව හා යුක්තිගරුකව කටයුතු කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 29ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 26 කි. පුරප්පාඩු සංඛ්‍යාව 3 කි.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය 2020 |
|---|---|---|---|
| උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ආයතනික කටයුතු විධිමත් කිරීම | බඳවා ගැනීම | බඳවා ගැනීම් ප්‍රමාණය | 83 |
| | සේවය ස්ථිර කිරීම | සේවය ස්ථිර කිරීම් ප්‍රමාණය | 261 |
| | උසස්වීම | උසස්වීම් ප්‍රමාණය | 424 |
| | විශ්‍රාම ගැන්වීම | විශ්‍රාම ගැන්වීම් ප්‍රමාණය | 68 |
| වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය නිසිලෙස ක්‍රියාත්මක කිරීම | සංවර්ධන නිලධාරී | ප්‍රමාණය | 88 |
| | කළමනාකාර සහකාර | | 178 |
| | කාර්යාල කාර්ය සහායක | | 26 |
| | රියදුරු | | 43 |
| විනය නියෝගවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීම | පළමු අභියාචනා බලධරයා වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග | ක්‍රියාමාර්ග සංඛ්‍යාව | 03 |
| නිසි කලට කාර්යක්ෂමතා කඩයිම් විභාග හා දෙපාර්තමේන්තුගත පරීක්ෂණ පැවැත්වීම | කාර්යක්ෂමතා කඩයිම් ප්‍රමාණය | කාර්යක්ෂමතා කඩයිම් ප්‍රමාණය | 25 |

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය 2020 |
|---|---|---|---|
| තෘප්තිමත් රාජ්‍ය සේවයක් ගොඩනැංවීම පිණිස පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කිරීම, කාලීනව සුදුසු තීරණ ගැනීම හා ක්‍රියා කිරීම | ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | - |
| පළාත් රාජ්‍ය සේවය තුළ විනය පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම | විනය සංචිත පිහිටුවීම | විනය සංචිත ගණන | 01 |
| ප්‍රශස්ත රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව මැදිහත්වීම | බඳවා ගැනීම් පරිපාටි සකස්කර අනුමත කර ගැනීම | අනුමත කළ බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | 01 |
| | ස්ථාන මාරු පරිපාටි සකස් කර අනුමත කර ගැනීම | අනුමත කළ බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | 01 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

### 01. 2020 වර්ෂය තුළ බඳවා ගැනීම් හා පත් කිරීම්

| අ.අං | තනතුරු නාමය | ආයතනය | ලබාදී ඇති පත්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා ගුරු සේවය 3- 1 ( අ ) ශ්‍රේණියට හා 3 පන්තියේ ස(ඇ) ශ්‍රේණියට පත් කිරීම | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 55 |
| 2 | උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් පත් කිරීම | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 03 |
| 3 | උතුරු මැද පලාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගැනීම | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 08 |
| 4 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට උපස්ථායක/ උපස්ථායිකා බඳවා ගැනීම | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 17 |
| එකතුව | | | 83 |

**02.** **2020 වර්ෂයේදී පවත්වන ලද බඳවා ගැනීමේ විභාග**

මැතිවරණ චක්‍රලේඛ අනුව බඳවා ගැනීම් සිදු කිරීම සඳහා විභාග පැවැත්වීම සිදු නොකරන ලදි.

**03.2020 වර්ෂයේදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග**

| අනු අංක | විභාගය පවත්වන ලද දිනය | විභාගය | ප්‍රශ්න පත්‍රයේ නම | අයදුම්කරුවන් ගණන | | විභාගය සඳහා පැමිණි අයදුම්කරුවන් ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල | දෙමළ | සිංහල | දෙමළ |
| 1 | 2020.09.05 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - පරිවාස නිලධාරී - 11 ශ්‍රේණිය | 01. දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග | 02 | | 02 | |
| | | | | | 01 | | 01 |
| | | | 02. ආඥා පනත් | 02 | | 02 | |
| | | | | | 01 | | 01 |
| 2 | 2020.09.05 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව - මැහුම් උපදේශිකා - 111 ශ්‍රේණිය | 01.ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | 03 | - | 01 | - |
| | | | 02. මුදල් රෙගුලාසි | 09 | - | 07 | - |
| 3 | 2020.09.05 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - වැඩ පරිපාලක / සෞඛ්‍ය පරිපාලක / පොදු වෙළඳසැල් පරිපාලක - 11 ශ්‍රේණිය | 01. කාර්යාල ක්‍රම | 01 | - | 01 | - |
| | | | 02. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 01 | - | 01 | - |
| 4 | 2020.09.05 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - වැඩ පරිපාලක / සෞඛ්‍ය පරිපාලක / පොදු වෙළඳසැල් පරිපාලක - 111 ශ්‍රේණිය | 01. ආයතන රෙගුලාසි | 03 | - | 01 | - |
| | | | 02. පළාත් පාලන ආයතන වල මූල්‍ය රීති | 04 | - | 02 | - |
| 5 | 2020.09.05 | රියදුරු සේවය - 11 ශ්‍රේණිය | 01. කාර්ය පටිපාටික රීති ඇතුළත් ලිඛිත පරීක්ෂණය | 05 | - | 05 | - |
| | 2020.12.16 | | වාචික | 04 | - | 04 | - |
| 6 | 2020.09.05 | රියදුරු සේවය - 111 ශ්‍රේණිය | 01.මහාමාර්ග නීති, මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම මැනීම | 11 | - | 10 | - |
| | | | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ දැනුම මැන බැලීම | | - | | - |
| | 2020.12.16 | | වාචික | 08 | - | 08 | - |

2020 වර්ෂයේදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග............

| අනු අංක | විභාගය පවත්වන ලද දිනය | විභාගය | ප්‍රශ්න පත්‍රයේ නම | අයදුම්කරුවන් ගණන | | විභාගය සඳහා පැමිණි අයදුම්කරුවන් ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල | දෙමළ | සිංහල | දෙමළ |
| 7 | 2020.09.05 | පළාත් පාලන දෙපාර්තමින්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ - 1 ශ්‍රේණිය | අ. කාර්යාල ක්‍රම පිළිබඳ මූලික කරුණු | 01 | - | 01 | - |
| | | | ආ. ආයතන සංග්‍රහය | 01 | - | 01 | - |
| 8 | 2020.09.05 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) - 111 ශ්‍රේණිය | 01.රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සහ කාර්යාල පරිපාලන ආතන සංග්‍රහය | 04 | | 03 | |
| | | | | | 01 | | 01 |
| | | | 02.මුදල් රෙගුලාසි | 10 | | 09 | |
| | | | | | 01 | | 01 |
| 9 | 2020.09.05 | සෞඛ්‍ය සේවා දෙපාර්තමින්තුව - ප්‍රාථමික ශිල්පීය නොවන - සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) / සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) - 11 ශ්‍රේණිය | 01. ආයතන සංග්‍රහය, උතුරු මැද පළාත් විනය කාර්ය සංග්‍රහය හා උතුරු මැද පළාත් මූල්‍ය රීති | 05 | - | 04 | - |
| 10 | 2020.09.05 | සෞඛ්‍ය සේවා දෙපාර්තමින්තුව - ප්‍රාථමික ශිල්පීය නොවන - සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) - 111 ශ්‍රේණිය | 01. සාමාන්‍ය පරිපාලනය | 40 | - | 40 | - |
| | | මුරකරු - 111 ශ්‍රේණිය | | 07 | - | 07 | - |
| 11 | 2020.09.05 | තාක්ෂණ සහායක - 111 ශ්‍රේණිය | 01. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | 03 | - | 02 | - |
| | | | 02. මුදල් රෙගුලාසි | 05 | - | 04 | - |

| අනු අංක | විභාගය පවත්වන ලද දිනය | විභාගය | ප්‍රශ්න පත්‍රයේ නම | අයදුම්කරුවන් ගණන | | විභාගය සඳහා පැමිණි අයදුම්කරුවන් ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල | දෙමළ | සිංහල | දෙමළ |
| 12 | 2020.09.05 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ආදායම් පරීක්ෂක - 11 ශ්‍රේණිය | 02. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 03 | - | 01 | - |
| 13 | 2020.09.05 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ආදායම් පරීක්ෂක - 111 ශ්‍රේණිය | 01. ආයතන රෙගුලාසි | 13 | | 12 | |
| | | | | | 01 | | 01 |
| | | | 02. පළාත් පාලන ආයතන වල මූල්‍ය නීතිරීති | 12 | | 10 | |
| | | | | | 01 | | 01 |
| 14 | 2020.09.05 | සමාජ සේවා දෙපාර්තමේන්තුව - සමාජ සේවා නිලධාරී - 11 ශ්‍රේණිය | 01. ආයතන සංග්‍රහය | 13 | - | 12 | - |
| | | | 02. මුදල් රෙගුලාසි හා පළාත් සභා මූල්‍ය රීති | 10 | - | 09 | - |
| 15 | 2020.09.05 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - පෙර පාසල් ගුරු - 111 ශ්‍රේණිය | 01. පෙර පාසල් ව්‍යවස්ථා රෙගුලාසි | 01 | - | 01 | - |
| | | | 02. විෂය නිර්දේශිත දැනුම | 01 | - | 01 | - |
| 16 | 2020.09.05 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - උප වෝර්ඩන් - 11 ශ්‍රේණිය (11 කාර්.) | 01. සමාජ ප්‍රත්‍යයක වැඩ හා රැඳවුම් නිවාසයට අදාළ ස්ථාවර නියෝග පිළිබඳඅවබෝධ | 01 | - | 01 | - |
| 17 | 2020.09.05 | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව - අභ්‍යන්තර විගණන හා විමර්ශන නිලධාරී - 1 ශ්‍රේණිය | 01. රජයේ මූල්‍ය ක්‍රියා පටිපාටිය | 01 | - | 01 | - |
| | | | 02. ආයතන රෙගුලාසි | 02 | - | 02 | - |
| 18 | 2020.09.05 | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව අභ්‍යන්තර විගණන නිලධාරී - 111 ශ්‍රේණිය | 01. මූල්‍ය ක්‍රම | 01 | - | 01 | - |
| 19 | 2020.09.21 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව රසායනාගාර සහකාර - 111 ශ්‍රේණිය | වාචික | 04 | - | 03 | - |

| අනු අංක | විභාගය පවත්වන ලද දිනය | විභාගය | ප්‍රශ්න පත්‍රයේ නම | අයදුම්කරුවන් ගණන | | විභාගය සඳහා පැමිණි අයදුම්කරුවන් ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල | දෙමළ | සිංහල | දෙමළ |
| 20 | 2020.10.29 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - 11 ශ්‍රේණිය | වාචික | 03 | - | 02 | - |
| 21 | 2020.10.29 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - 111 ශ්‍රේණිය | වාචික | 01 | - | - | - |
| 22 | 2020.12.14 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ප්‍රාථමික ශිල්පීය සේවා ගණය - 111 ශ්‍රේණිය | වාචික | 04 | - | 03 | - |
| 23 | 2020.12.15 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - 111 ශ්‍රේණිය | වාචික | 13 | - | 13 | - |
| 24 | 2020.12.16 | රියදුරු සේවය - 1 ශ්‍රේණිය | වාචික | 02 | | 02 | |
| 25 | 2020.12.18 / 19 | භාෂා පරිවර්තක - 11 ශ්‍රේණිය | 01. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට සහ දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට<br>02.කාර්යාල ක්‍රම, ආයතන රෙගුලාසි<br>03.මුදල් රෙගුලාසි | | 01 | | 01 |

**04.** 2020.12.31 දිනට කොමිෂන් සභා වාර්ෂික ප්‍රගති වාර්තාව

| අ.අ. | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම | 63 |
| 02 | i. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (මුදා හැරීම) | 79 |
| | ii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (සුහද) | 08 |
| | iii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 02 |
| | iv. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (පැමිණීම) | 56 |
| 03 | i. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (මුදා හැරීම්) | 56 |
| | ii. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (සුහද) | 12 |
| | iii. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 02 |
| | iv. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (පැමිණීම්) | 28 |
| 04 | i. අභ්‍යන්තර ස්ථාන මාරු (මුදා හැරීම්/ පැමිණීම්) | 12 |
| | ii. අභ්‍යන්තර ස්ථාන මාරු (සුහද) | 03 |
| 05 | විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම. | 159 |
| 06 | පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම. | 261 |
| 07 | උසස්වීම්. | 424 |
| 08 | විශ්‍රාම ගැන්වීම් | |
| | i. ශ්‍රී ලංකා විදුහල්පති සේවය | 39 |
| | ii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 04 |
| | iii. පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු | 25 |
| 09 | වෙනත් තීරණ - i. කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද තීරණ | 499 |
| | ii.කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තීරණ | 191 |
| | iii.කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යොමු කළ ලිපි | 08 |
| | iv.උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අදාළව කොමිෂන් සභාව විසින් ගන්නා ලද වෙනත් තීරණ | 16 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි සමස්ත ප්‍රගතිය

2020 වර්ෂය තුළදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු විෂය පථය තුළ පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සඳහා බඳවා ගැනීමේ විභාග පැවැත්වීම හා ඒ අනුව පත්කිරීම් සිදු කිරීම ද, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා උසස්වීම ලබා දීමද සිදු විය. එසේම සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම් මෙන්ම වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම ද විනය නීතිවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ද සිදු විය.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

මෙම කාර්යාලය මගින් ඉදි කිරීම් හා මහජන සේවාලාභී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරයි. පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා නියාමනය කිරීමට දායක වීම තුලින් ප්‍රශස්ත රාජ්‍ය සේවයක් ඇතිකරලීම අපේක්ෂාව වේ.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සමාලෝචිත වර්ෂයේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 03 ක් වූ අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 27 ක් විය. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව යමින් අනුමත රාජ්‍ය ප්‍රතිපත්ති වලට හා විධිමත් කාර්ය පටිපාටිවලට අනුකූලව 2020 වර්ෂය තුළදී ක්‍රියාකර ඇත.

2020 වර්ෂය තුලදී 602 වැය ශීර්ෂය යටතේ පෞද්ගලික පඩිනඩි වශයෙන් රු. 17,936,260.37 ක මුදලක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් රු. 3,447,296,06 ක මුදලක් වියදම් දරා ඇත. 2020 වර්ෂයේදී මූලධන වියදම් යටතේ මෙම ආයතනයට වාර්ෂික ඇස්තමේන්තු අනුව රු. 425,000.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. එයින් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු.425,000.00 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර රු. 425,000.00 ක මුදලක් වැය කර කාර්ය මණ්ඩලයේ හා පරිපාලනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවන පරිදි යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සපයා ගන්නා ලදි. මෙම කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් අංක 60201 සඳහා වාර්ෂික ඇස්තමේන්තු යටතේ රු. 1,800,000.00 ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඒ යටතේ රු. 1,446,283.80 ක මුදලක් කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් වශයෙන් ගෙවීමට හා ණය ශේෂ පියවීමට කටයුතු කර ඇත. එසේම වාර්ෂික ඇස්තමේන්තු යටතේ අවම බැර සීමාව රු. 1,050,000.00 ක් වූ අතර තත්‍ය බැරකිරීම් ප්‍රමාණය රු. 1,304,655.80 ක් විය.

කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් තම රාජකාරිය මැනවින් ඉටු කර ඇත. එමෙන්ම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා කටයුතු නියාමනය කිරීමට අදාළ රාජ්‍ය සේවකයින්ගේ සියලුම කටයුතු මෙම ආයතනයට ලැබෙන පරිදි ඉටු කිරීම සිදු කර ඇත.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේ සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2020 වර්ෂයේදී මුහුණ පෑමට සිදු වූ Covid 19 ගෝලීය වසංගතය හේතුවෙන් මෙම ආයතනයේ දෛනික කටයුතු අඩපන වීම වර්ෂය මැද භාගය තෙක් සිදු වූ නමුත් අත්‍යවශ්‍ය කඩිනම් කටයුතු කාර්යාලීය වාහන යොදාගෙන නිලධාරීන් ගෙන්වාගෙන ඉටු කරන ලදි. පසුව 50% සේවක මණ්ඩලයක් යොදාගෙන රාජකාරී කටයුතු සිදු කරන ලදි. නිලධාරීන් කිහිප දෙනෙකු නිරෝධායනයට ලක් කල බැවින් අතපසු වූ දෛනික රාජකාරී කටයුතුද 2020.12.31 වන දින විට අවසන් කරන ලදි.

පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත දිනට පැවැත්වීමට නොහැකි වුවද පසුව සැලසුම් කල ආකාරයට සියළුම විභාග වෙනත් දිනයන් වලදී පවත්වන ලදි. පවතින වසංගතය හේතුවෙන් ආයතනයේ නිලධාරීන් ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

# 04. පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

## දැක්ම

"තෘප්තිමත් සමුපකාර කාර්යය මණ්ඩලයක්, උසස් මට්ටමේ සේවාවක්".

## මෙහෙවර

"සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු හා සේව්‍ය සේවක ගැටුම් නිරාකරණය සහ ආයතනික ධාරිතාව වර්ධනය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යහපාලනය පවත්වා ගනිමින් තෘප්තිමත් කාර්යය මණ්ඩලයක් බිහිකොට සමුපකාර සේවාව උසස් මට්ටමකට ගෙන ඒමට අඛණ්ඩව දායක වීම".

## දිගුකාලීන අරමුණු

- ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක්.
- යහපත් සේව්‍ය සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේව්‍ය සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක්.
- සංහිදියාවෙන් යුත් ආයතනයක්.

## කෙටිකාලීන අරමුණු

- සමුපකාර සේවක පත් කිරීම්, උසස් කිරීම්, සේවා ස්ථිරත්වය ලබා දීම.
- සමුපකාර සේවක පුහුණු පැවැත්වීම.
- සේවක අභියාචනා සලකා බැලීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු නිරාකරණය.
- සේව්‍ය සේවක ගැටුම් නිරාකරණය.
- යෝජිත නව වැටුප් සංශෝධනයක් ක්‍රියාත්මක කිරීම තුළින් සේවක මානසිකත්වය වර්ධනය ඇති කිරීම.
- ආයතනය තුළ යහපාලනය හා සම්බන්ධ මූලධර්ම ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කෙරෙහි මැදිහත්වීම.

- නව චක්‍රලේඛ නිකුත් කිරීම හා නිකුත් කර ඇති චක්‍රලේඛ කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය
- ක්ෂේත්‍ර පරීක්ෂාව
- සමුපකාර සේවක කොමිෂන් සභාව, සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල සමග සාකච්ඡා කිරීම.
- අන්තර් පුද්ගල හා අන්තර් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

- සමුපකාර සේවක පත්වීම්, ස්ථිර කිරීම්, උසස් වීම් ලබාදීම මගින් විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීම.
- සමුපකාර සේවක පුහුණු වැඩමුළුව පැවැත්වීම මගින් සේවකයින්ගේ දැනුම වර්ධනය වීම, සමිතිවල උසස් මට්ටමේ සේවාවක් පවත්වාගෙන යාමට හැකි වීම, මහජන සේවාවන් උසස් මට්ටමින් ලබා දීමට හැකි විම.
- සමුපකාර සේවක අභියාචනා පිළිබඳව නිවැරදි තීරණ ගැනීම, සමුපකාර සේවක අභිප්‍රේරණය වැඩි දියුණු වීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 08ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 07 කි. පුරප්පාඩු සංඛ්‍යාව 01 ක් වන අතර 01 ක් අයකු පුහුණුවේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන්මග

- සමුපකාර ක්ෂේත්‍රයේ සමුපකාර සේවකයින්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු කිරීම් සිදු කිරීම හා විනය ක්‍රියාමාර්ග සම්බන්ධව ඉදිරිපත්වන අභියාචනා සම්බන්ධයෙන් සාධාරණ විසඳුමක් ලබා දීම.
- ඒ තුළින් සමුපකාර ක්ෂේත්‍රය කෙරෙහි සමුපකාර සේවකයින් අභිප්‍රේරණය කිරීම හා ඔවුන් ක්ෂේත්‍රය තුළ රඳවා ගැනීමට කටයුතු කිරීම.
- ඉහත 1 හා 2 අනුව කටයුතු කර සමුපකාර සේවයේ සමුපකාර ව්‍යාපාර සංවර්ධනය සඳහා නැඹුරු කිරීම හා නියාමනය.

## ආයතනයේ අනාගත අපේක්ෂාවන්

| අංශයේ සංවර්ධනය උදෙසා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන් මග | |
|---|---|---|
| පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීම | කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා | තොරතුරු ගබඩාකර ගැනීම |
| කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ | කාර්යාලීය කටයුතු පහසුකර ගැනීම | ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2020 වර්ෂයේදී සැලසුම් කළ ආකාරයට සංවර්ධන කටයුතු මෙහෙයවීමට හැකියාව ලැබුණි. ඒ යටතේ සමුපකාර සේවකයින්ගේ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගනිමින් ඒ සඳහා සමුපකාර සේවක පුහුණු පැවැත්වීමට හැකි විය. තවද විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කරමින් සමුපකාර සේවක පත්කිරිම්, උසස්විම් හා ස්ථිර කිරිම් වඩාත් ඵලදායිව මෙන්ම කාර්යක්ෂමව කිරිමට හැකි විය. 2020 වර්ෂය සඳහා වෙන් වු ප්‍රතිපාදන යොදවා සමුපකාර ක්ෂේත්‍රයේ නව්‍යතාවයන් ඇති කිරීමට හැකියාව ලැබීම හා සමුපකාර සමිතිවල සේවකයින් පුහුණු කිරීම මගින් සේවාවන් උසස් මට්ටමකට රැගෙන ඒමට හැකි විය. මෙහිදී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස සමිතිවලට බඳවාගෙන ඇති සේවකයින්ගේ පත්වීම්, ස්ථිර කිරීම හා විධිමත් කිරීමට අවශ්‍ය තොරතුරු නිවැරදිව ඉදිරිපත් නොවීම ආදිය දැක්විය හැකිය.

ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අදහස් හා යෝජනා ලෙස උතුරු මැද පළාත තුළ පිහිටුවා ඇති විවිධ සේවා සමුපකාර සමිතිවල ලාභදායි තත්වය ඉහළ නැංවීමත්, සේවකයින්ට දැනට ගෙවනු ලබන වැටුප් පරිමාණයන් ද පවත්නා වැටුප් පරිමාණවලින් ඉහළ නැංවීමට කටයුතු කිරීම හා සේවක අභියාචනා විසඳීමෙන් සේවක ප්‍රශ්න අවම කිරීමට කටයුතු සැලසීමට හැකිවිය.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදි සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

Covid 19 ගෝලීය වසංගතය හේතුවෙන් සමුපකාර සේවකයින් සඳහා පැවැත්වීමට නියමිතව තිබු පුහුණු කිරීම් කටයුතු සිදුකර ගැනීමට නොහැකි විය. ඊට පිලියමක් ලෙස 2021 වර්ෂයේ දි පුහුණු කිරීම් වැඩසටහන් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

# 05.ප්‍රධාන ලේකම් කාර්යාලය

ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංයුතිය ආයතන 07කින් සමන්විත වේ.




## දැක්ම

“කාර්යක්ෂම, ඵලදායි හා ජනතාවාදී පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක්”

## මෙහෙවර

“පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු, මානව සම්පත්, මුල්‍ය, සැලසුම්, ඉංජිනේරු කටයුතු හා මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය, විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයීම, ආපදා කළමනාකරණය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම. ”

## දිගුකාලීන අරමුණු

- මහජනතාව අමන්දානන්දනයට පත් කල හැකි කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දීමේ හැකියාව ඇති ස්වයංඅභිප්‍රේරිත, දැනුම හා කුසලතාවයෙන් පෝෂිත පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය නිළධාරී හා සේවක මණ්ඩලයක් බිහි කිරීම
- වර්තමාන නෛතික හා පරිපාලන ව්‍යුහයට අනුගත වෙමින් අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල සංවර්ධන, සැලසුම් හා පරිපාලන යන ත්‍රිත්ව කාර්යයන්හී සම්බන්ධීකරණය හා නියාමන කටයුතු සඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකර දීම.
- පළාත තුල මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය හා සංවර්ධන කාර්යයන් පිළිබඳ පළාතේ විධායකය හා ව්‍යවස්ථාදායකය විසින් ගනු ලබන තීරණ හා තීන්දු, ක්‍රමවත් සන්නිවේදනයක් හා සම්බන්ධීකරණයක් තුලින් විධිමත්ව ක්‍රියාත්මක කිරීම හා විනිවිදභාවයෙන් යුතු වැඩ නියාමන ක්‍රමවේදයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ කාර්යය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය.
- ❖ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබා දීම සඳහා ආයතනික පරිසරය සකස් කිරීම.
- ❖ මහජනතාවට ඵලදායි දීර්ඝකාලීනව ප්‍රතිලාභ ලැබිය හැකි සමාජයීය හා ආර්ථික සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම, තක්සේරුකරණය සහ ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාරී යන ආයතන මගින් ඉටුකරන, විශේෂ සමාජ -ආර්ථික වැඩසටහන් හා ව්‍යාපෘති, ආපදා කළමනාකරණ වැඩසටහන්, රට හදන සෞභාග්‍යයේ දැක්ම යටතේ සිදුකරන සංවර්ධනය වැඩසටහන් ආදී කාර්යයන් නිසිපරිදි ඉටුවන බව අධීක්ෂණය හා නියාමනය කිරීම.
- පළාතේ විධායකය හා ව්‍යවස්ථාදායකය විසින් ගනු ලබන තීරණ හා තීන්දු සම්බන්ධව සියළුම අමාත්‍යාංශවලට දැන්වීම, සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම මෙන්ම අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- මූල්‍ය හා භෞතික සම්පත් සංවර්ධනය සහ මානව සම්පත් කලමනාකරණය කිරීම, පුහුණු කිරීම හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ආයතනගත පරිපාලන කටයුතු සිදු කිරීම.
- පළාත් සභා මට්ටමින් බාහිරව ජනාධිපති ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරය, මුදල් කොමිෂන් සභාව, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හා රේඛීය අමාත්‍යාංශ වලින් පළාත් සභා වෙත ලබාදෙනු ලබන උපදෙස් හා කාර්යයන් සම්බන්ධීකරණය.

## ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

- ♦ විශේෂ සමාජ, ආර්ථික වැඩසටහන් හා ව්‍යාපෘති, ආපදා කළමනාකරණ වැඩසටහන්, යහපාලන කටයුතු සංවර්ධනය, මත්ද්‍රව්‍ය නිවාරණය ආදී කාර්යයන් නිසි පරිදි ඉටුවන බව අධීක්ෂණය සඳහා විවිධ සාකච්ඡා, රැස්වීම් හා වැඩසටහන් පැවැත්වීම.
- ♦ විවිධ තීන්දු තිරණ අදාළ ආයතන වෙත දැනුම් දීම සඳහා විවිධ චක්‍රලේඛ නිකුත් කිරීම හා රැස්වීම් පැවැත්වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ගිවිසුම්ගත වීම් සිදු කිරීම.
- ♦ පළාත් රාජ්‍ය ආයතනවල නීතිමය ගැටළු සඳහා සහය ලබා දීම.
- ♦ පළාත තුළ පවත්වන ආගමික, සංස්කෘතික හා වෙනත් උත්සව පැවැත්වීම හා සංවිධානය සඳහා අවශ්‍ය පූර්ණ සහය ලබාදීම.
- ♦ මානව සම්පත් සංවර්ධනය උදෙසා දෙස්-විදෙස් පුහුණු අවස්ථා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම්, නිලධාරීන්ගේ වරප්‍රසාද හා සුභසාධක කටයුතු වෙනුවෙන් වන විධිමත් ඉල්ලීම් සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා දීම.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 85ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 67 කි. පුරප්පාඩු සංඛ්‍යාව 18 ක් වන අතර අනියම් 04 දෙනෙකු කොන්ත්‍රාත් 02 දෙනෙකු හා පුහුණු 03 දෙනෙකු දැනට සේවයේ යෙදී සිටී.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

- ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් යන රජයේ ප්‍රතිපත්තියට අනුකූලව උතුරු මැද පළාත තුළ මානව සම්පත් සංවර්ධනය තුලින් දැනුමෙන් පරිපූර්ණ සමාජයක් බිහි කිරීම උදෙසා උතුරු මැද පළාත තුළ අධ්‍යාපනය, සෞඛ්‍ය නගා සිටුවීම උදෙසා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ජනාතා කේන්ද්‍රීය අර්ථිකයක් යන රජයේ ප්‍රතිපත්තියට අනුකූලව උතුරු මැද පළාත තුළ කෘෂිකර්මාන්තය, සංචාරක කර්මාන්තය හා කුඩා හා මධ්‍යපරිමාණ කර්මාන්ත නගා සිටුවීම උදෙසා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

## අංශය තුළින් ඉටුකර ගැනිමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 16

**තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරිම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දිම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.**

16.6. සියළුම මට්ටම්වලදී ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.

16.7. සියළුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියළු දෙනා අන්තර්ගත වූ සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම.

## අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු/ ඉලක්ක හා නිමවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක |
|---|---|
| සුරක්ෂිත වැඩ පරිසරයක් තුළින් තෘප්තිමත් නිලධාරීන් හා සේවක මණ්ඩලයක් බිහි කිරීම උදෙසා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය නිළධාරීන්ගේ සේවා හා සුභ සාධක අවශ්‍යතා සපුරාලීම ක්‍රමවත්ව සිදු වන බවට තහවුරු කිරීම. | (තිරසාර සංවර්ධන ඉලක්ක අංක 08)<br>දැනුමෙන් හා හැකියාවෙන් පරිපූර්ණ කාර්යක්ෂම රාජ්‍ය නිලධාරීන් පිරිසක් බිහිවීම |
| යුක්තිය හා සාධාරණය සඳහා වගවීමක් සහිතව මනා විනිවිදභාවයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | (තිරසාර සංවර්ධන ඉලක්ක අංක 16)<br>ක්‍රමානුකූල නීති රාමුවක් තුළ සේවා සැපයීමේ අවස්ථාව හිමි වීම<br>නව නීති සම්පාදනය කිරීම |
| යහපත් සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, ගුණාත්මක අධ්‍යාපනය සහ සුරක්ෂිත පරිසරයක් බිහි කිරීම උදෙසා කැපවූ ආයතන පද්ධතියක් ඇති කිරීම වෙනුවෙන් ක්‍රමවත් අධීක්ෂණය හා නියාමනය ක්‍රමවේදයක් ඇති බවට තහවුරු කිරීම. | (තිරසාර අරමුණු අංක 03, අංක 04, අංක 06, අංක 15 )<br>පළාත තුළ සෞඛ්‍යය, අධ්‍යාපනය හා පරිසර ආරක්ෂාව පිළිබඳ ධනාත්මක දර්ශකවල අගය ඉහළ යාම |

## අංශයේ සංවර්ධනය මැනීම සඳහා තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සලකා බලමින් ගොඩනගාගත් පළාත් නිමැවුම් දර්ශක හා ඉලක්ක

1. තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම සඳහා අප යටතේ ක්‍රියාත්මක වන ආයතන මෙහෙයවීම සහ එම ආයතනයන්හී කටයුතු අධීක්ෂණය කිරීම.
2. ප්‍රධාන ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති, තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම සඳහා හඳුනාගත් ඉලක්කයන් හා දර්ශක ඔස්සේ මෙහෙයවීම සහ එම කටයුතු අධිකෂණය කිරීම.
3. තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම සඳහා පළාත තුළ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති මෙහෙයවීම සඳහා හඳුනාගත් ඉලක්කයන් හා දර්ශක ලගා කර ගැනීම සම්බන්ධයෙන් අධික්ෂණය කිරීම.

### තිරසාර අරමුණු අංක 01. සියලු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **1.5**<br>2030 වන විට දරිද්‍රතාවයෙන් පෙලෙන්නන්ගේ සහ අවධානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණ තත්වයන්ගෙන් ඇති වන්නා වූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇති වන්නා වූ හානී සහ ආපදා වලට නිරාවරණය වීම ද අඩු කිරීම | 1.5.2. ලෝක දළ දේශිය නිෂ්පාදනයට සාපේක්ෂව ස්වාභාවික ආපදා හේතුවෙන් සිදු වන සෘජු ආර්ථික හානිය | 1. ඔවුන් වෙත ලබා දෙන ලද පහසුකම් පිළිබද සංඛ්‍යාත්මක තොරතුරු | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හදුනා ගැනීම සහ ගිවිසුම්ගත විදේශාධාර ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළගා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. විදේශාධාර ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 02. සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය **(Outcome Indicator)** | නිමැවුම් දර්ශකය **(Output Indicator)** |
| **2.1**<br>2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට පත් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම. | 2.1.2. ආහාර අනාරක්ෂිතතා අත්විඳීම් දර්ශකය පදනම් කර ගනිමින් ජනගහනය තුළ මධ්‍යස්ථ හෝ තිව්‍ර ආහාර අනාරක්ෂිත භාවයේ ව්‍යාප්තිය | 1. ආහාර භෝග නිෂ්පාදන කිරීමේදී සහ ගබඩා කිරීමේදී යොදා ගන්නා ලද රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය<br>2. ආහාර නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා ලද රසකාරක ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත විදේශාධාර ව්‍යාපෘති ගණන<br>2. පළාතේ දේශීයව සහ ආවේණික ආහාර බෝග ව්‍යාප්තියේ වැඩිවීම සංඛ්‍යාත්මකව<br>3. දේශීය ආහාර ද්‍රව්‍ය පරිභෝජනය කරන පාරිභෝගිකයින් ගණන<br>4. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>5. මෙම ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **2.3** 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශීය ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මඟින් දෙගුණ කිරීම | 1.3.1. ගොවි/ගව පාලන/ වනාන්තර ආශ්‍රිත කර්මාන්තය පන්තීන්හී විශාලත්වය අනුව, ග්‍රාම ඒකකයක් සඳහා වන නිෂ්පාදන පරිමාව<br>1.3.2. ස්ත්‍රීපුරුෂභාවය සහ ස්වදේශ මට්ටම් අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන් ගේ සාමාන්‍ය ආදායම | 1. ඒකකයක් සඳහා වන නිෂ්පාදන පරිමාව<br>2. සුළු පරිමාණ ආහාර නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය වන සැපයුම් ප්‍රමාණය සහ සාමාන්‍ය ආදායම | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. කෘෂිකර්මික නිෂ්පාදන ඵලදායිතාවය සහ දේශීය නිෂ්පාදකයින් සඳහා වෙළඳපොළ විවෘත කිරීම් සහ ආදායම් ප්‍රමාණය<br>3. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>4. ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |
| **2.4** 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම කහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානි කර කාලගුණ තත්වයන්, නියග, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම | 2.4.1 ඵලදායි සහ තිරසාර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය | 1. වගා කටයුතු සඳහා යොදා ගන්නා ලද භූමි ප්‍රමාණය<br>2. ලබා දෙන ලද භාණ්ඩා හා සේවා ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 03. නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධන ප්‍රවර්ධනය කිරීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **3.4**<br>2030 වන විට බෝ නොවන රෝග නිසා සිදු වන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | 3.5.1.<br>මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හට ගන්නා ආබාධ තත්වය සඳහා ප්‍රතිකාරමය පහසුකම් (ඖෂධමය, මනෝ විද්‍යාත්මක, පුනරුත්ථාපනමය සහ රැකබලා ගැනීමේ සේවා) ව්‍යාප්තිය | 1. දෛනිකව හඳුනා ගන්නා රෝගීන් ගනන<br>2. දෛනිකව මනෝ විද්‍යාත්මක උපදෙස් ලබා ගැනීම සඳහා පැමිණෙන ප්‍රමාණය<br>3. දෛනිකව පුනරුත්තාපනය සඳහා යොමු කරන ගණන<br>4. මාසිකව/ කාර්තු ලෙස සහ වාර්ෂිකව මධ්‍යසාර භාවිතා කරන පිරිසගේ විචලනය<br>5. මාසිකව/ කාර්තු ලෙස සහ වාර්ෂිකව මධ්‍යසාර භාවිතා කරන ප්‍රමාණය (ලීටර/ ග්රෑම් ලෙස) | 4. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>5. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>6. පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් ප්‍රමාණය<br>7. පවත්වනු ලබන වෛද්‍ය සායන ප්‍රමාණය<br>8. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |
| 3.9<br>2030 වන විට රාසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත්, අපිරිසිදු වීමත් නිසා ඇති වන මරණය සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | 3.9.2 ආනාරක්ෂිත ජලය , අනාරක්ෂිත සනීපාරක්ෂක තත්වයන් සහ පවිත්‍රතාවය අවම වීම (සියළු සේවාවන් සඳහා අනාරක්ෂිත ජලය, සනීපාර්කෂණය සහ පවිත්‍රතාවයෙන් තොරවීම - Wash) | 6. බෙදා දෙන ලද ජලපෙරණ ප්‍රමාණය<br>7. ඉදි කරන ලද වැසිකිළි ප්‍රමාණය<br>8. ඉදි කරන ලද ජල ටැංකි ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. පවත්වනු ලබන වෛද්‍ය සායන ප්‍රමාණය<br>4. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 04. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | **ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator)** | **නිමැවුම් දර්ශකය (Output Indicator)** |
| **4.අ** ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, වැඩිදියුණු කිරීම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙන් තොර, සියලුදෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයෙන් තහවුරු කර දීම | 4.අ.1(අ). විදුලිය; (ආ) ඉගැන්වීම් පහසුකම් පිණිස අනුතර්ජාලය භාවිතය; (ඇ) ඉගැන්වීමේ පහසුකම් පිණිස පරිගණක භාවිතය, (ඈ) ආබාධ සහිත දරුවන් සඳහා විශේෂිත වූ යටිතල පහසුකම් සහ උපකරණ, (ඉ) මූලික පානීය ජල පහසුකම්, (ඊ) ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව වෙන් කරන ලද ස්වස්ථා පහසුකම්, (උ) මූලික අත්සේදීමේ පහසුකම් (WASH දර්ශකයේ නිර්වචන අනුව) යන ප්‍රවේශයන් සහිත පාසල් ප්‍රමාණය. | 1.ඉදි කරන ලද නව ගොඩනැගිලි ප්‍රමාණය<br><br>2.බෙදා දෙන ලද පරිගණක ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br><br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br><br>3. මෙම කටයුතු සඳහා පාසල් මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 06. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | **ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator)** | **නිමැවුම් දර්ශකය (Output Indicator)** |
| **6.1**<br>2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම. | 6.1.1.<br>සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන පානීය ජල සැපයුම් සේවා භාවිතය | 1. ඉදි කරන ලද නව ජල පෙරන ප්‍රමාණය<br>2. ලබා දී ඇති ජල සැපයුම් ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |
| **6.3**<br>2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිත කිරීම. | 6.3.2.<br>ගුණාත්මක භාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය | 1. ප්‍රතිසංස්කරණය කරන ලද වැව් ප්‍රමාණය<br>2. ස්වාභාවික ජල උල්පත් මඟින් පානිය ජල සැපයුම් ලබා දීමේ ප්‍රමාණය. | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **9.අ**<br>අප්‍රිකානු රටවලට, අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට, අනෙකුත් රටවලින් වට වූ රටවලට සහ සංවර්ධණය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍ය වලට මූල්‍යමය, තාක්ෂණවේදී සහ තාක්ෂණික සහයෝගය ලබා දීම මඟින් සංවර්ධණය වෙමින් පවත්නා රටවලට ඔරෝතතු දෙන ආකාරයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම | 9.අ.1. යටිතල පහසුකම් සඳහා වන සමස්ත නිළ ජාත්‍යන්තර සහාය (නිළ සංවර්ධන ආධාර සහ වෙනත් නිළ වශයෙන් ලැබෙන සැපයුම්) | 1. ඉදි කරන ලද පාළම් ප්‍රමාණය<br>2. ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග ප්‍රමාණය<br>3. අලුතින් ඉදි කරන ලද මාර්ග ප්‍රමාණය<br>4. ඉදි කරන ලද ගොඩනැගිලි ප්‍රමාණය<br>5. ප්‍රතිසංස්කරණය කරන ලද ගොඩනැගිලි ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසර සංවර්ධන අරමුණු ලඟාකරගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය**

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනික සැළැස්ම | අදාළ අමුණ මුදුන් පමුණුවා ගැනීම උදෙසා ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතියේ නම |
|---|---|---|
| සියලු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම (තිරසාර අරමුණු අංක 01) | 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙලෙන්නන්ගේ සහ අවධානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරෝත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණ තත්වයන්ගෙන් ඇති වන්නා වූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇති වන්නා වූ හානි සහ ආපදා වලට නිරාවරණය වීම ද අඩු කිරීම. | • Local Development Support Project (LGSP)<br>• North and East Local Services Improvement Project (NELSIP)<br>• The Project for Formulating Cascade System Development Plan Under North Central Province |

තිරසර සංවර්ධන අරමුණු ලඟාකරගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය ඉතිරි කොටස.......

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනික සැළැස්ම | අදාළ අමුණ මුදුන් පමුණුවා ගැනීම උදෙසා ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතියේ නම |
|---|---|---|
| සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පොෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම (තිරසාර අරමුණු අංක 02) | • 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට පත් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා බව ගැනීමට හැකි බව තහවුරු කිරීම.<br>• 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශීය ජනයාගේ, ගොවි පවුල් සහ ධිවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ විමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා , වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගෙවිපළ නොවන රැකිවා සඳහා අවස්ථාවන් ලබා දීම මඟින් දෙගුණ කිරීම<br>• 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානි කර කාලගුණ තත්වයන්, නියග, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරෝත්තු දිය හැකි කෘෂිකාරුමික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | • Climate Smart Irrigated Agriculture Project (CSIAP)<br>• Agriculture Sector Modernization Project<br>• Climate Resilient Integrated Water Management Project (වැව් ගම් පුබුදුව)<br>• Mahaweli Water Security Investment Program<br>• Enhancing Biodiversity Conservation and Sustenance of Ecosystem Service in Environmentally Sensitive Areas |
| නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධන ප්‍රවර්ධණය කිරීම (තිරසාර අරමුණු අංක 03) | • 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදු වන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම<br>• 2030 වන විට රාසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත්, අපිරිසිදු වීමත් නිසා ඇති වන මරණය සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම | • Local Development Support Project (LGSP)<br>• Second Health Sector Development Project |
| පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම (තිරසාර අරමුණු අංක 04) | • ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, වැඩිදියුණු කිරීම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙව් තොර, සියලුදෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයෙන් තහවුරු කර දීම | • General Education Modernization (GEM) Project |

තිරසර සංවර්ධන අරමුණු ලගාකරගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය ඉතිරි කොටස.......

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනික සැළැස්ම | අදාළ අමුණ මුදුන් පමුණවා ගැනීම උදෙසා ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතියේ නම |
|---|---|---|
| සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම (තිරසාර අරමුණු අංක 06) | • 2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම<br>• 2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, බානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිත කිරීම | • Local Government Enhancement Sector Project – PURA NEGUMA<br>• Rural Infrastructure Development Project in Emerging Regions (RIDEP) |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම (තිරසාර අරමුණු අංක 09) | • තාක්ෂණවේදී සහ තාක්ෂණික සහයෝගය ලබා දීම මගින් ප්‍රදේශයට ඔරෝත්තු දෙන ආකාරයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම | • Transport Connectivity and Asset Management Project / Provincial Road Development Project<br>• Rural Bridge Project |

## ප්‍රධාන ලේකම් කාර්යාලයේ දායකත්වය

ප්‍රධාන ලේකම් කාර්යාලය ආයතන අංශය, ගිණුම් අංශය, තොරතුරු තාක්ෂණික ඒකකය, නීති අංශය, භාෂා පරිවර්තක ඒකකය, මත්ද්‍රව්‍ය නිවාරණන ඒකකය යන අංශවලින් සමන්විත වේ.

## 01. මානව සම්පත් සංවර්ධනය

**2020 වසර තුළ මානව සම්පත් සංවර්ධනය යටතේ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් අලුතින් අනුමත කළ තනතුරු**

| තනතුර | ප්‍රමාණය |
|---|---|
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | |
| කාර්මික නිලධාරී (යාන්ත්‍රික) **MA 2-2** | 01 |
| ප්‍රමාණ සමීක්ෂක **MA2-2** | 01 |

- අනුග්‍රහ පදනම යටතේ 2020 වසර තුලදී අනුමත කරන ලද වාහන ආනයන බලපත්‍ර සංඛ්‍යාව 106 කි.
- විදේශ පුහුණු පාඨමාලා ශාස්තු සඳහා කරන ලද ඉල්ලීම් අතරින් අනුමත කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව 01 කි.

- විදේශ නිවාඩු / ශිෂ්‍යත්ව සඳහා අනුමැතිය ලබාදීම යටතේ අනුමත කරන ලද විදේශ නිවාඩු (රාජකාරි) ඉල්ලීම් සංඛ්‍යාව 05 කි.
- විදේශ නිවාඩු (පෞද්ගලික) සඳහා අනුමැතිය ලබාදීම යටතේ අනුමත කරන ලද විදේශ නිවාඩු (පෞද්ගලික) ඉල්ලීම් සංඛ්‍යාව 22 කි.
- 2020 වර්ෂයේදී පවත්වන ලද ලේකම් කමිටු සංඛ්‍යාව 01කි.
- 2020 වර්ෂයේදී ප්‍රායෝගික පුහුණුව සඳහා අවස්ථාව ලබාදුන් සිසුන් සංඛ්‍යාව 206 කි.

## 02.පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සමස්ත කටයුතු අධීක්ෂණය හා නියාමනය.

උතුරු මැද පළාත් සභාව යටතේ ක්‍රියාත්මකවන අමාත්‍යාංශ 05ක් ඇති අතර ඒ ඒ අමාත්‍යාංශ යටතේ සහ ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ ඇති දෙපාර්තමේන්තු 18ක සියළුම පරිපාලන කටයුතු සම්බන්ධ ප්‍රමුඛ විධායක නිලධාරියාගේ කාර්ය භාරය උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබයි.

ඒ අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කටයුතු නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු මට්ටමින් විවිධ සාකච්ඡා සහ රැස්වීම් විශාල සංඛ්‍යාවක් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබීය.

ඒ අතර පරිපාලනමය හා මූල්‍ය ගැටළු සඳහා විසඳුම් ලබා දීම, ආයතනික අරමුණු හා ඉලක්ක වෙත ළඟා වීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම සිදු කිරීම ප්‍රධාන වශයෙන් සිදු කර ඇත.

## 01. නීතිමය අංශය සවිබල ගැන්වීම සඳහා 2020 වසරේ සෘජු දායකත්වය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ නීති ඒකකයක් පිහිටුවා ඇති අතර මෙම ඒකකය හරහා උතුරු මැද පළාත් සභාවට අයත් ආයතනයන්හී සියළුම නෛතික කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්වලදී නීති සහය ලබාදීම සිදු කරනු ලැබේ. 2020 වසරට අදාලව ලැයිස්තු ගත වු නඩු සංඛ්‍යාව 28ක් වු අතර 2020 වසරේ අවසන් වු නඩු සංඛ්‍යාව 06 කි.

## 2020 වර්ෂය තුළ සකස් කරන ලද ගිවිසුම්

| අ.අ | ගිවිසුම | ආයතනය |
|---|---|---|
| 01 | නිල නිවාස | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| 02 | පිදුරු බේලරය | කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව |
| 03 | පිබිදෙමු පොළොන්නරුව නව පරිපාලන සංකීර්ණය | ප්‍රධාන අමාත්‍යාංශය |
| 04 | නව බස්නැවතුම්පොල කඩකාමර බදු දීම | මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය |

## 2020 වර්ෂය තුළ උපදෙස් හා නිරීක්ෂණ ලබා දීම

| අ/අ | කාරණය | ආයතනය |
|---|---|---|
| 1 | එන්තරවාසි එවීම- එච්.එම්.බී.සමීර බණ්ඩාර, එච්.එම්.නාලක චන්දන | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 2 | අනුරාධපුර කඩ 50 විස්කම් පියස අලෙවි සංකීර්ණයේ අලෙවි කුටි සඳහා හිඟ කඩකුලී ගෙවීම | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 3 | විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා උපදෙස් ලබා ගැනීම- පී.එස්.ආර්.ප්‍රේමලාල් මයා. | ප්‍රධාන අමාත්‍යාංශය |
| 4 | 2020 වර්ෂය සඳහා මුදල් ප්‍රකාශය පිළියෙල කිරීම පිළිබඳව නෛතික මතය ලබා ගැනීම | |
| 5 | නැවත සේවයේ පිහිටුවීම - ආයුර්වේද වෛද්‍ය එම්.එස්.කේ.වික්‍රමසිංහ මහතා. | |
| 6 | අංක 08/2014 දරණ නඩුකරය සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගැනීම | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 7 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය පරීක්ෂා කර ගැනිම | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 8 | වාණිජ කටයුත්තක් සඳහා රජයේ ඉඩම් කොටසක් බදු දීමේදි බදුකරු වෙනුවට බදුකරුගේ බලයලත් නියෝජිතයෙකු විසින් බදු කෙටුම්පත්වල අත්සන් කිරිම පිලිබඳ නීතිමය උපදෙස් ලබා ගැනීම | පළාත් ඉඩම් කොමසාරිස් |
| 9 | ග්‍රාම සංවර්ධන අරමුදල රීති කෙටුම්පත අනුමැතියට ඉදිරිපත් කිරීම | පළාත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය |
| 10 | NC-100 රිසිට් පොත් ගණනය මහේස්ත්‍රාත් අධිකරණය (උතුරු මැද පළාත) | පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |

## භාෂා පරිවර්තක සේවය ලබා දීම

උතුරු මැද පළාත් සභා වෙබ් පිටු, විගණන වාර්තා, පළාත් පාලන ආයතනික කාර්ය පටිපාටික රීති සංග්‍රහයන්, එක් එක් ආයතනවල ඉල්ලීම පරිදි කැඳවීම් ලිපි, අයදුම්පත් හා පත්වීම් ලිපි ඉංග්‍රිසි හා දෙමල භාෂාවන්ට පරිවර්තනය කිරීම සිදු කරන ලදී. ප්‍රධාන ලේකම් කාර්යාලීය භාෂා පරිවර්තන ඒකකය මගින් ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය යටතේ පළාත් රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයට අනුකූලව විවිධ නිවේදන හා වාර්තා, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ට යුහුසුළුව පරිවර්තනය කරදීම සිදු කරන ලදී.

## පරිවර්තන සේවා ලබාදුන් අවස්ථා

**සිංහල දෙමළ භාෂා පරිවර්ථන සේවාවවන්**

| අ/අ | සේවාව පිළිබඳව විස්තරය | සේවාව ලබාදුන් ආයතනය |
|---|---|---|
| 01 | රෙගුලාසි ( ප්‍රාදේශීය සභා, නගර සභා, මහනගර සභා) | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 02 | ලිපිය | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 03 | විගණන වාර්තා | ක්‍රීඩා දෙපාර්තමේන්තුව |
| 04 | රෙගුලාසි | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 05 | ගැසට් නිවේදනය | රාජාංගණය ප්‍රාදේශිය සභාව |
| 06 | අයදුම්පත් ආකෘතිය | පළාත් අදායම් දෙපාර්තමේන්තුව |
| 07 | අපතය | පුහුණු ඒකකය |

| | | |
|---|---|---|
| 08 | ගැසට් | ම.නු.ප. ප්‍රාදේශීය සභාව |
| 09 | ගැසට් | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 10 | සහතික | සෞඛ්‍ය අමාත්‍යංශය |
| 11 | පාරිසරික ආචාරධර්ම | පුහුණු ඒකකය |
| 12 | වසංගතය | සෞඛ්‍ය අමාත්‍යංශය |
| 13 | ගැසට් නිවේදනය | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 14 | විභාග නිවේදනය | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

**සිංහල ඉංග්‍රීසි භාෂා පරිවර්ථන සේවාවවන්**

| අ/අ | සේවාව පිළිබඳව විස්තරය | සේවාව ලබාදුන් ආයතනය |
|---|---|---|
| 01 | ප්‍රාදේශිය සභා රීති, නගර සභා නියෝග.<br>මහ නගර සභා නියෝග. | පළාත් පාලන කොමසාරිස් කාර්යාලය |
| 02 | කාර්ය පටිපාටික රීති | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 03 | සමරු එලකය | පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය |
| 04 | එලදායිතා සංකල්ප | පුහුණු ඒකකය |
| 05 | දැක්ම,මෙහෙවර හා වෙනත් ලේඛන | පළාත් ග්‍රාම සංවර්ධනදෙපාර්තමේන්තුව |
| 05 | කාර්යාලීය ලේඛනයක් | පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 07 | පොලොන්නරුව මහ නගර සභාවේ ගැසට් නිවේදනය | පළාත් පාලන ආයතනය |
| 08 | මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය | පළාත් භාණ්ඩාගාරය |
| 09 | රැස්වීම් වාර්තාව | ප්‍රධාන අමාත්‍යංශය |
| 10 | කැකිරාව ප්‍රාදේශීය සභා ගැසට් නිවේදනය | පළාත් පාලන ආයතනය |
| 11 | සැපයුම්කරුවන් ලියාපදිංචිය පුවත්පත් නිවේදනය 2021 | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 12 | පාරිසරික ප්‍රතිපත්තිය | පළාත් පුහුණු ඒකකය |
| 13 | 2021 බදු ගැසට් නිවේදනය | මධ්‍යම නුවරගම් පළාත,<br>ගලෙන්බිඳුනුවැව, කැකිරාව, නුවරගම්<br>පළාත හා මිහින්තලේ ප්‍රාදේශීය සභාව |
| 14 | ගැසට් නිවේදනය | පළාත් පාලන දෙපාර්තමේන්තුව |

2020 වර්ෂයේදී දෙවන භාෂා දිරි දීමනා - [ඉංග්‍රීසි, දෙමළ] ඉල්ලීම් අතරින් අනුමත කරන ලද භාෂා දීමනා ඉල්ලීම් සංඛ්‍යාව 19 කි. 2020 වර්ෂයේදී රාජකාරියේ යෙදී සිටියදී සිදුවූ අනතුරු සම්බන්ධ උතුරු මැද පළාත් වන්දි කමිටු තිරණය අනුව වන්දි ගෙවීම දෙකක් සිදු කරනු ලැබූ අතර ගෙවීම් කරන ලද මුළු වන්දි මුදල් වටිනාකමරු 699,075.00 කි.

තොරතුරු පනතට අදාළව තොරතුරු ඉල්ලීම් 33 ක් සඳහා පිලිතුරු යොමු කර ඇත.

## තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය මගින් ඉටුකරන ලද කාර්යයන්

- උතුරු මැද පළාත් රාජ්‍ය අයතනයන්හි විශේෂයෙන් පළාත් සභා සංකිර්ණයේ පිහිටි ආයතනවල පරිගණක දත්ත ජාලා පද්ධතිය කළමනාකරණය හා නඩත්තු කටයුතු සිදු කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව Desktop පරිසණක 414 ක් සඳහා ජාලගත සම්බන්ධතා හා නඩත්තු සේවා සැපයීම.




- පළාත් සභා සංකීර්ණයේ පිහිටි ආයතනවල ජාලගත දුරකථන පද්ධතිය නඩත්තු සේවා සැපයීම සිදු කරනු ලබයි. ඒ අනුව සෘජු දුරකථන ජාල සම්බන්ධතා 48ක් හා අභ්‍යන්තර දුරකථන ජාල සම්බන්ධතා 600 ක් සඳහා ජාලගත සම්බන්ධතා හා නඩත්තු සේවා සැපයීම.
- පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත ඇමතුම් පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය සැපයීම.
- ඇඟිලි සළකුණු යන්ත්‍ර හා අදාළ පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම හා නඩත්තු සේවා සැපයීම. ( ඇඟිලි සළකුණු යන්ත්‍ර 22ක් පවතී)
- පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත ආරක්ෂිත කැමරා පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම, නඩත්තු කිරීම හා අවශ්‍ය Backup ලබා ගැනීම.
- පළාත් ආයතනයන්හි (අමාත්‍යාංශ 05, දෙපාර්තමේන්තු 05 හා වෙනත් ආයතන 15ක වෙබ් අඩවි) ත්‍රෛභාෂිත වෙබ් අඩවි යාවත්කාලීන කිරීම්, වැඩි දියුණු කිරීම් හා ක්‍රමවත්ව පවත්වා ගැනීම සිදු කිරිමේ සේවා සැපයීම.
- 2019 වර්ෂයේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය මගින් හඳුන්වාදුන් මෘදුකාංග පද්ධතීන් හි වැඩිදියුණු කිරීම් හා භාවිතා කරන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2020 වර්ෂයේදී පවත්වන ලදි.
- 2020 වර්ශයේදී උතුරු මැද පළාතේ නීතිය හා සාමය ආරක්ෂා කර ගැනීම උදෙසා පළාත තුළ ආරක්ෂිත කැමරා සවිකිරීම සම්බන්ධ තාක්ෂණික සහය ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙත සැපයීම සිදු කිරීම.

| ස්ථානය | ප්‍රමාණය | ස්ථාපනය කරන ලද කැමරා ප්‍රමාණය |
|---|---|---|
| අනුරාධපුර පොලිසිය | 13 | 46 |
| හබරණ පොලිස් ස්ථානය | 3 | 8 |
| පොළොන්නරුව පොලිස් ස්ථානය | 14 | 48 |

- පළාත් සභා සංකීර්ණයේ ස්ථාපනය කරන ලද සූර්ය බල පද්ධතියේ ක්‍රියාකාරීත්වය මත 2019 වර්ෂයේදී දළ වශයෙන් ලක්ෂ 12-13 සීමාවේ තිබූ පළාත් සභා ගොඩනැගිල්ලේ විදුලි බිල්පත 2020 වර්ෂයේදී මාසිකව ලක්ෂ 6-7 සීමාව දක්වා අඩුකර ගැනීමට හැකිවී ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2020 වර්ෂයේ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් වාර්ෂික කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා සැලසුම්ගත ක්‍රියාවලියක නිරත විය. පළාතේ සංවර්ධනය උදෙසා විවිධ විෂයන් සඳහා ගිවිසුම් සකස් කිරීම, උපදෙස් හා නිරීක්ෂණ ලබා දෙමින් මග පෙන්වීම, උතුරු මැද පළාත සෞඛ්‍ය ආරක්ෂිත ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ගැනීම, අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම, පළාත් තුල ක්‍රියාත්මක විවිධ රාජ්‍ය උත්සව සඳහා නිරෝධායන නීති රීති යටතේ සහයෝගය ලබාදීම වැනි කාර්යයන් ඒ අතර ප්‍රමුඛ වේ. තවද ගෝලීය වශයෙන් මුහුණ දුන් කොරෝනා වසංගතය හමුවේ පළාත් සභාවේ සේවය කරන රාජ්‍ය නිලධාරීන් මෙන්ම උතුරු මැද පළාත තුල ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේදී සෘජු හා කාර්යක්ශම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට ප්‍රධාන ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය යුහුසුළුව ක්‍රියාත්මක වන ලදි.

# 5.1.පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

1988.05.12 දින උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කිරීමත් සමඟම ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ඒකකයක් වශයෙන් මෙම ආයතනය ආරම්භ කරන ලදී. පසුව මෙම ආයතනය පළාත් සභා කැබිනට් තීරණයක් මඟින් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදී. මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

## දැක්ම

“ඵලදායි පළාත් සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්.”

## මෙහෙවර

“පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරණය , ප්‍රගති පාලනය හා ඇගයීම , අංගසම්පූර්ණ දත්ත පද්ධතිය , අධ්‍යයන හා පර්යේෂණ , විදේශ ව්‍යාපෘති අධීක්ෂණය , පළාතේ සංවර්ධන සැලසුම් අංශ මනාව මෙහෙයවීම, ප්‍රතිපත්ති, කාර්ය සාධනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් , විනිවිදභාවයෙන් හා සමතාවයෙන් ක්‍රියාවට නංවමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අඛණ්ඩව දායකවීම”



## ප්‍රධාන කාර්යයන්

01. පළාත සඳහා දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම් පිළියෙල කිරීම.
02. වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුමක් පිළියෙලකර එය ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය ඇගයීම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම.
03. සංවර්ධන සැලසුම් සඳහා දත්ත රැස් කිරීම, පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම.
04. සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම.
05. පළාත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ප්‍රගතිය ඇගයීම හා ඉලක්කයන් කරා ළඟා වීම.
06. නව ව්‍යාපෘති හඳුනා ගැනීම, ඇගයීම හා තක්සේරුව.
07. විදේශාධාර හා ණය ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
08. ආංශික සැලසුම් හා ආයතනික සැලසුම් පිළියෙල කිරීම හා ඒ සඳහා ආයතනවලට සහාය වීම.
09. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සැලසුම් ඒකක මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
10. ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් රැස්කර ගැනීම හා පළාත් සැලසුම් සඳහා අදාලකර ගැනීම.
11. රජයේ ආයතන සමඟ සැලසුම් කටයුතු සම්බන්ධීකරණය.
12. අනෙකුත් පළාත් සභාවල සැලසුම් දෙපාර්තමේන්තු සමඟ කටයුතු කිරීම.
13. සැලසුම්වලට අදාල මුදල් කොමිෂම, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම.
14. ප්‍රධාන අමාත්‍යවරයාට, අමාත්‍යවරුන්ට හා ප්‍රධාන ලේකම්වරයාට සැලසුම්කරණයට සහය වීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

1. දිගුකාලීන,මධ්‍යකාලීන හා කෙටිකාලීන සංවර්ධන සැලසුම් සැකසීම.
2. වාර්ෂික ක්‍රියාකාරි සැලසුම සැකසීම, ක්‍රියාත්මක කිරිම හා ප්‍රගතිය මැනීම.
3. සංවර්ධන සැලසුම්කරණය සඳහා යාවත්කාලීන කරන ලද දත්ත භාවිතය.
4. නව ව්‍යාපෘති අවස්ථා හඳුනා ගැනිම හා ක්‍රියාත්මක කිරිම.
5. අන්තර් ආයතන සම්බන්ධීකරණය.
6. විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 55ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 40 කි. එසේම පුරප්පාඩු සංඛ්‍යාව 15 ක් වන අතර 04 දෙනෙකු පුහුණුවේ.

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු

පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමේ භාරදූර වගකීම ඉටු කරන ආයතනයක් ලෙස කටයුතු කරමින් 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට පළාත් අමාත්‍යාංශ හා



දෙපාර්තමේන්තු මෙහෙයවීම සිදු කරන ලදී. ඒ යටතේ පළාත් හා මධ්‍යම රජයේ රාජ්‍ය නිලධාරීන් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී. එපමණක් ද නොව පළාතේ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරවීමටත්, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් මට්ටමෙන් ජාතික මට්ටමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමටත් හැකිවන පරිදි තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

## 01. පළාත් සංවර්ධන සැලැස්ම සැකසීම හා මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචනය කිරීම.

2020 වර්ෂයේ උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා අදාල ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ප්‍රමුඛ කාර්යය විය. මේ යටතේ විවිධ මට්ටම්වලදී කාර්තුමය හා මාසිකව සහ විශේෂයෙන් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් අදාල ව්‍යාපෘති ඉලක්ක කරා රැගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ අනුව පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද පසුවිපරම් ඇගයුම්, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට 2020 වසරේදීද කටයුතු කරන ලදී. ඒ අනුව 2020 වර්ෂයේදී පහත සඳහන් පරිදි සංවර්ධන වැඩසටහන විවිධ මට්ටම්වලදී ප්‍රගතිය සවිස්තරාත්මකව සමාලෝචනය කරන ලදී.

## පළාත් සංවර්ධන සැලසුම් මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය

පළාත් සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ක්‍රමානුකූල ක්‍රමවේදයක් තුළ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. එහිදී ප්‍රධාන අවස්ථා කිහිපයකදී ප්‍රගතිය සමාලෝචනය කරමින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. ඒ අනුව උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින් 2020 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, සංවර්ධන ව්‍යාපෘති මෙහෙයුම්කරණ මෘදුකාංග පද්ධතිය (DPMS) යාවත්කාලීන කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම, ප්‍රතිඵල පාදක මධ්‍යකාලින සංවර්ධන සැලසුම සකස් කිරිම සඳහා විවිධ පාර්ෂවකරුවන් සමග දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා සංවර්ධන නිලධාරින් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදු කරන ලදී.

01
- 2020 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින්) 03

02
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම අනුරාධපුර 01, පොළොන්නරුව 01

03
- ප්‍රතිඵල පාදක මධ්‍යකාලින සංවර්ධන සැලසුම සකස් කිරිම සඳහා විවිධ පාර්ශවකරුවන් සමග දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් පැවැත්විම

04
- සංවර්ධන නිලධාරින් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් 02ක් පැවැත්විම

## 02. උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති සාරාංශය

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතනය | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|---|---|---|
| දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project) | කෘෂිකාර්මික සහ වාරි පද්ධති පුනරුත්ථාපනය | World Bank (ලෝක බැංකුව) | කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව. | 2024.00 | 2018-2024 |
| | | | කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පාදනය. | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව. | | |
| | | | ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම | කෘෂිකර්ම අමාත්‍යාංශය | | |
| නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | යටිතල පහසුකම් සංවර්ධනය | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය(JICA - ජයිකා) | ග්‍රාමීය ජල ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඉදි කිරීම. | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය. | 3200.00 | 2018 - 2023 |
| | | | ග්‍රාමීය මාර්ග සැලසුම් කිරීම හා ඉදි කිරීම. | | | |
| | | | වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම. | | | |
| | | | පරිපාලන වියදම් | | | |
| පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය ( පුරනැගුම) | ජල සම්පාදනය | ADB<br>ශ්‍රී ලංකා රජය | ජල සැපයුම් ලබා දීම | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 2300.00 | 2017-2021 |
| ප්‍රාථමික සෞඛ්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Primary Healthcare Strengthening In) | - | ආසියානු සංවර්ධන බැංකුව | - | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 180.00 | - |

**උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති සාරාංශය ඉතිරි කොටස...**

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතනය | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|---|---|
| පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (ESA) | බහුමාර්ග පුනරුත්ථාපනය | UNDP (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන) | - | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 435,729,669.82 | 2018-2024 |
| | කෘෂිකාර්මික | GEF/UNDP | 1. කාබනික ගොවිතැන සහ ඒකාබද්ධ පළිබෝධ කළමණාකරනය ඇතුළත් පාරම්පරික ගොවිතැන ප්‍රචලිත කිරීම | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6,592,500.00 | 2017 - 2020 |
| | | | 2. ගෙවතු තුළ බහුකාර්ය ශාක වර්ග වැඩි දියුණු කිරීම. | | | |
| | | | 3. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා නව වගා ආදර්ශණ සඳහා අනුගත වීම. | | 2,962,620.00 | 2018 - 2019 |
| ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන අයි මාර්ග ව්‍යාපෘතිය (i- Roads) | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩි දියුණු කිරීම | ADB | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග 04ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග 03ක් ප්‍රතිසංස්කරණය කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය | 10154.00 | 2016.08.01 - 2021.07.31 (වැඩිදියුණු කිරීම - අ.වු 02ක් සහ නඩත්තු කිරීම - අ.වු.03) |
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය | යටිතල පහසුකම් සංවර්ධනය | ලෝක බැංකුව<br>ශ්‍රී ලංකා රජය | පළාත් පාලන ආයතන ක්‍රමෝපායන් ශක්තිමත් කිරීම | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 1583.00 | 2019-2022 |
| | | | සේවාවන් වැඩිදියුණු කිරීම හා ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය | | | |
| | | | ආයතනික සංවර්ධනය | | | |

**උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති සාරාංශය ඉතිරි කොටස...**

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ප්‍රතිපාදන ලබා දෙන රට/ආයතනය | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | නාගරික හා ප්‍රවාහන සංවර්ධනය | | වැසි ජල කළමනාකරණය හා කාණු පද්ධතිය නවීකරණය කිරීම | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) (උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන/මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය) | 10125.00 (ඇ.ඩො.මි.) | 2016 - 2021 |
| | | | පොදු ප්‍රවාහනය හා ප්‍රවාහන කළමනාකරණය | | | |
| | | | පොදු ස්ථාන සහ නාගරික පහසුකම් වැඩිදියුණු කිරීම | | | |
| | | | උරුම කළමනාකරණය | | | |
| | | | හැකියාවන් වර්ධනය සහ තාක්ෂණික සහය | | | |
| | | | අප ජල කළමනාකරණ සැලැස්ම සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම | | | |
| වැවගම් පුබුදුව (CRIWMP) | කෘෂිකාර්මික | GEF(හරිත දේශගුණ අරමුදල) | i. කුඩා වැව් 101ක් හා අමුණු 9ක් ප්‍රතිසංස්කරණය | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 1872.00<br>ඇ.ඩො.මි. 52.04 (රු.මි.9400) | 2017 - 2024 |
| | | | ii.දේශගුණික සංවේදි කෘෂිකර්මය | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| | | | iii.ප්‍රජා ජල සම්පාදන පද්ධති 02ක් ඉදිකිරීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | |
| | | | iv.පෙරහන් පද්ධති ලබාදීම. (කුඩා 10, විශාල 7) | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | |
| | | | v.වැසි ජල ටැංකි 245ක් ලබාදීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | |
| | | | Vi.ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම | | | |
| කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) | කෘෂිකාර්මික | World Bank (ලෝක බැංකුව) | නවීන කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන පිහිටුවීම. (නියමු ව්‍යාපෘතින්) | පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. | 1710.00 | 2016 - 2021 |
| | | | නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය (වැව් පුනරුත්ථාපනය, ඇළමාර්ග නවීකරණය, කෘෂි මාර්ග නවීකරණය) | පළාත් සහ රේඛීය වාරි මාර්ග දෙපාර්තමේන්තු, පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව. | | |
| | | | ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම | | | |

උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති සාරාංශය ඉතිරි කොටස...

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ආධාර ලබා දෙන රට/ආයතනය | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|---|---|
| සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | සෞඛ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය<br>ප්‍රාථමික රෝග නිවාරණ සේවය සංවර්ධනය<br>ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ නවෝත්පාදන අරමුදල. | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | - | ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය | 2260.43 | - |
| ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය | වාරි මාර්ග ඉදිකිරීම් | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | මොරගහ කන්ද ජලාශයේ සිට අනුරාධපුරය දක්වා නව ඇළ මාර්ගයක් ඉදිකිරීම. | මහවැලි අමාත්‍යාංශය | 65,000 | වසර 06 2025 දක්වා |
| ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | එක්සත් රාජධානය (I,II) නෙදර්ලන්තය (III) | ග්‍රාමීය පාලම් ඉදි කිරීම (174) | ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය | 5427.30 | 2013 සිට මේ දක්වා |
| සහළ ලේවතු ඔය ජලාශ ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භක අවස්ථාවේ පවතින බවත්, විදේශ ආධාර අයදුම් කර ඇති නමුත් මෙතෙක් ලැබී නොමැති බව දන්වා ඇත. | | | | | |
| මාර්ග සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | මාර්ග | ලෝක බැංකුව | මාර්ග සංවර්ධනය කිරීම<br>1.නොච්චියාගම/ ගාලදිවුල්වැව<br>2.ඔයාමඩුව- පේමඩුව<br>3.ඩී 2 ප්‍රධාන ඇල<br>4.කොතලාවල මාර්ගය<br>5.මැදිරිගිරිය - නවනගරය මාර්ගය<br>6.අසේලපුර- කුරුළු බැද්ද මාර්ගය | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 1483.00 | 2019-2023 |

## 2.1 සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය වෙනුවෙන් දැක්වූ දායකත්වය.

### දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project)-world Bank

මේ යටතේ කෘෂිකාර්මික සහ වාරි පද්ධති පුනරුත්ථාපනය සිදු කරයි. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය, කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පාදනය, ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි140කි. ව්‍යාපෘති කාල සීමාව 2018-2024 වේ.

### නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයJICA

මේ යටතේ ග්‍රාමීය ජල ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඉදිකිරීම, ග්‍රාමීය මාර්ග සැලසුම් කිරීම හා ඉදිකිරීම, වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සිදු කරයි. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය මගින් මෙය ක්‍රියාත්මක කරන අතර මුළු පිරිවැය රු.මි.32,000ක් වන අතර ව්‍යාපෘති කාලසීමාව 2018 – 2021 දක්වා වේ.

### පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය - (පුරනැගුම)

ජල සැපයුම් ලබා දීම මේ යටතේ සිදු කරනු ලබන අතර අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. මුළු පිරිවැය රු.මි.2,630 ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2017-2020 දක්වා වේ.

### ප්‍රාථමික සෞඛ්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Primary Healthcare Strengthening In)

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත මෙම ව්‍යාපෘතිය උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි 180කි.

### පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (ESA)- UNDP

වාරිමාර්ග පුනරුත්ථාපනය හා කෘෂිකාර්මික අංශය ඉලක්කකර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. කාබනික ගොවිතැන සහ ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය ඇතුළත් පාරම්පරික ගොවිතැන ප්‍රචලිත කිරීම, ගෙවතු තුළ බහුකාර්ය ශාක වර්ග වැඩි දියුණු කිරීම හා ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා නව වගා ආදර්ශණ සඳහා අනුගත වීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවයි. වාරිමාර්ග පුනරුත්ථාපනය සඳහා රු.මි.435.72ක මුදලක් 2018-2024 කාල සීමාව සඳහා ද කෘෂිකාර්මික අංශය සඳහා රු.මි. 9.55ක මුදලක් ද ව්‍යාපෘතියේ මුළු පිරිවැය ලෙස දරනු ලබයි.

### අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිතායතනය හා ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මෙහෙයවීමෙන් සිදු කරන මෙම ව්‍යාපෘතිය සඳහා අනුරාධපුර නගරය ආශ්‍රිත කලාපය පහත අංග 4 යටතේ සංවර්ධනය කරයි.

- ජල කළමනාකරණය.
- ගමනාගමන පහසුකම් සංවර්ධනය.
- නගර අලංකරණය හා පහසුකම් සංවර්ධනය.
- නගර සංවර්ධනයට හා උරුම කළමනාකරණයට සම්බන්ධ ආයතනවල ධාරිතා සංවර්ධනය.

**අනුරාධපුර** නගරයට මෙතෙක් වෙන්වූ විශාලම මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 57.5ක මුදලක් මේ සඳහා ආයෝජනය කිරිමට නියමිත අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම සම්බන්ධීකාරක ලෙස පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ද පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. 2013- 2024 දක්වා උතුරු මැද පළාතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබයි.

### වැව්ගම් පුබුදුව (CRIWMP) -GEF(හරිත දේශගුණ අරමුදල)

කුඩා වැව් 52 ප්‍රතිසංස්කරණය, දේශගුණික සංවේදී කෘෂිකර්මය, ප්‍රජා ජල සම්පාදන පද්ධති ඉදිකිරීම, පෙරහන් පද්ධති ලබාදීම හා වැසි ජල ටැංකි ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි.52.04 (රු.මි.9400)ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2017-2024 වේ.

### කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) - World Bank

කෘෂිකාර්මික අංශය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. නවීන කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන පිහිටුවීම, (නියමු ව්‍යාපෘතීන්), නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය (වැව් පුනරුත්තාපනය, ඇලමාර්ග නවීකරණය, කෘෂි මාර්ග නවීකරණය) හා ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි.58.63ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2016-2021 වේ.

### සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- (ADB)

සෞඛ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා ප්‍රාථමික රෝග නිවාරණ සේවය සංවර්ධනය මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි.2260.44කි.

### ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය - (ADB)

වාරිමාර්ග ඉදිකිරීම් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වේ. මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ මොරගහ කන්ද ජලාශයේ සිට අනුරාධපුරය දක්වා නව ඇළ මාර්ගයක් ඉදිකිරීමයි. මහවැලි අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මුළු පිරිවැය රු.මි.65,000ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව වසර 06 කි.

**පළාත තුළ විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියාමනයේදී උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා වශයෙන් පළාතේ සියළු විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති ප්‍රගතිය අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රගති සමාලෝචනය කරනු ලබයි. එහිදී අවශ්‍ය තීන්දු තීරණ ගැනීම හා නියාමන කටයුතු පළාත් මට්ටමින්, ජාතික මට්ටමින් පිහිටුවා ඇති කමිටු නියෝජනය කරමින් අපේක්ෂිත අරමුණු කරා ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් ලෙස අවශ්‍ය මැදිහත්වීම් 2020 වර්ෂය තුළ දී සිදුකර ඇත.**

### 03.පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් සියළුම සංවර්ධන අංශ ආවරණය වන පරිදි ඉදිරි වසර සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරිම.

ඉදිරි වසරෙහි පළාතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ව්‍යාපෘති හඳුනා ගනිමින් එම ව්‍යාපෘති සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල පිළිබඳව ගණනය කිරීම හා එය මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරිම මෙහිදී සිදු කරන ලදි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති

ආකෘතිප්‍රකාරව උතුරු මැද පළාත් සභාවට අයත් සියළුම ආයතන වෙත යොමුකර නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරනු ලබන අතර සංවර්ධන යෝජනාවන්හී යෝග්‍යතාවය පිළිබඳ සාකච්ඡා සිදු කරනු ලබයි. මෙහිදී වඩාත් ඵලදායි යෝජනා ලබාගත් පසු උතුරු මැද පළාත වෙනුවෙන් ඉදිරි වසර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවය තක්සේරුකර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

## 04.වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරිම.

ඉදිරිපත් කරනු ලැබූ ප්‍රාග්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ එක් එක් විෂයට අදාලව ලබා දිය හැකි ප්‍රතිපාදන ප්‍රමාණය මුදල් කොමිෂන් සභාව මගින් දැනුම් දීමෙන් පසු සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබයි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘති ප්‍රකාරව අදාල වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස්කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි. 2020 වර්ෂයේදී වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සම්බන්ධයෙන් වැඩමුළු 06ක් පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහභාගී විය.

## 05. උතුරු මැද පළාත් වාර්ෂික වාර්තාව සකස් කිරීම.




උතුරු මැද පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් තම දැක්ම හා මෙහෙවර අනුව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇතුළත් කරමින් උතුරු මැද පළාත් වාර්ෂික වාර්තාව සකස් කරන ලදී.

## 06. පළාත් සංවර්ධනය උදෙසා තොරතුරු තාක්ෂණය භාවිතය.

## 6.1 වෙබ් අඩවි යාවත්කාලීන කිරීම.






උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මානව හා භෞතික සම්පත් වඩාත් ඵලදායීව හා කර්යක්ෂමව පළාතේ සමස්ත සංවර්ධනය සඳහා යොමු කිරීමේදී ලොව වේගවත්ම තාක්ෂණය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් එය වඩාත් සාර්ථකව ඉටු කිරීමේ අවශ්‍යතාවය මත ස්ථාපනය කර ඇති උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණ ඒකකය මගින් 2020 වර්ෂය තුළදී පළාතේ පවතින රාජ්‍ය ආයතන සඳහා වන වෙබ් අඩවි යාවත්කාලීනව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත.

ඒ අනුව වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වැඩමුළු එකක් (01) මෙම වර්ෂයේදී සිදු කරන ලදී. පළාත් රාජ්‍ය සේවයේ සිටින නව්‍යකරණ නිලධාරින් එකම ස්ථානයකට කැඳවා වෙබ් අඩවිවල තිබෙන අඩුපාඩු සහ දෝෂ නිරකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම මෙමගින් සිදු කරන ලදි.

තොරතුරු තාක්ෂණ ඒකකයේ සහාය අවශ්‍ය වූ ආයතන සඳහා පරිගණක පුහුණු අභ්‍යාසලාභීන් යොදවා එම ආයතනවල වෙබ් අඩවි යාවත්කාලින කිරීම දිගින් දිගටම සිදු කරන ලදි. සෑම මසකම වෙබ් අඩවි පරික්ෂා කර බලා අඩුපාඩු ඇති ආයතන වෙත දැනුවත් කිරීම් කර ඒවා යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා කටයුතු කරන ලදි.

## 6.2. පරිගණක පුහුණු වැඩසටහන් පැවැත්වීම.

පළාත් රාජ්‍ය සේවයේ පවතින පරිගණක පුහුණු අවශ්‍යතාවයන් අනුව අනිකුත් ආයතනවලින් සිදු කරන ලද පුහුණු වැඩසටහන් සඳහා තොරතුරු තාක්ෂණ සම්පත් දායකත්වය ලබා දීම සිදු කරන ලදි.

## 6.3.තොරතුරු තාක්ෂණය හා බැඳුණු උපකරණවල දෝෂ නිරාකරණය කිරීම.

උතුරු මැද පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුළ ඇති සියළුම පරිගණක හා උපාංගවල හා පරිගණක හරහා අන්තර්ජාල පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ගැටළු නිරාකරණය කිරීමත් පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ ඇති අන්තර්ජාලය හා දුරකථන පද්ධතිය සම්බන්ධ Server Room එක සහ Switching Rooms පහක ක්‍රියාකාරීත්වය රැකගැනීමත් සිදු කරන ලදි. පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ට බාධාවකින් තොරව තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම හා සහාය ලබා දීම ඇතුළු පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් පළාත් තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යභාරය ඉටු කරමින් අදාල කාර්යසාධනය වෙත ළඟාවී ඇත.

<u>පළාත් රාජ්‍ය සේවයේ සියළුම ආයතනවල පරිගණක ජාලගත කිරීම</u>

පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ ජාලගත කරන ලද 450 කට අධික පරිගණකවල ක්‍රියාකාරිත්වය යාවත්කාලීනව පවත්වා ගැනීම.

- අභ්‍යන්තර ඇමතුම් ඇතුලු සියලුම දුරකථන ඇමතුම් පද්ධති යාවත්කාලීනව පවත්වා ගැනීම.
- ජාලගත කිරීම මඟින් පරිගණක සඳහා Share folder පහසුකම එක් එක් ආයතනය සඳහා වෙන වෙනම සපයා දී ඇත.
- එමෙන්ම අඩු පිරිවැයක් යටතේ වැඩි කාර්යක්ෂමතාවයකින් මුද්‍රණ පිටපත් ලබා ගැනීමට ගොඩනැඟිල්ලේ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා තෝරාගත් මුද්‍රණ පිටපත් යන්ත්‍ර 18ක් සැකසුම් වෙනස්කර ජාලගත කොට ඇත.

<u>තොරතුරු තාක්ෂණය හා බැඳුණු උපකරණවල දෝෂ නිරාකරණය කිරීම.</u>

උතුරු මැද පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ ජාල ගතකොට ඇති 450 කට අධික පරිගණක හා අභ්‍යන්තර ඇමතුම් දුරකථන හා 70කට අධික බාහිර ඇමතුම් දුරකථන ජාලයේ දෝෂ පැන නැගුනහොත් එම පරිගණක සියල්ලේම නඩත්තු කටයුතු (දෘඩාංග හා ජාලගත ප්‍රශ්න) සියල්ලක්ම තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් නිරාකරණය කර දෙමින් පරිගණකය භාවිතා කරන්නාට සෑම අයුරකින්ම සහාය වේ. ඒ අනුව පසුගිය වර්ෂයේදී පහත සේවාවන් සපයන ලදී.

- පළාත් සභා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයේ ඇති කාර්යාලවල පරිගණක සම්බන්ධයෙන් විටින් විට පැන නගින පරිගණක දෘඩාංග හා මෘදුකාංග දෝෂ නිරාකරණය කරන ලදී.
- පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ නව මුද්‍රණ යන්ත්‍ර දෙකක් වෙත ජාලගත කිරීම.
- පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ බාහිර හා අභ්‍යන්තර දුරකථන ජාලයේ පැන නගින දෝෂ නිරාකරණය කිරීම.
- පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ කාර්යාලවල පරිගණකවල විටින් විට ජාලගත අවහිරතා පැවති අතර එම අවහිරතා ඉවත් කරමින් දෝෂ නිරාකරණය කරන ලදි.
- පරිගණක භාවිතාකරන්නන්ට අවශ්‍ය මෘදුකාංග පරිගණකයට සපයා දෙමින් ඔවුන්ට සහය වීම. (Ms office, Internet Browsers, Photoshop, etc..)
- පරිගණක මෙහෙයුම් පද්ධති ගැටළු පැන නගින විට අළුතින් මෙහෙයුම් පද්ධතිය සකසා දීම.

<u>**CCTV කැමරා පද්ධතිය සම්බන්ධ දෝෂ නිරාකරණය කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යාම.**</u>

පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ පැය 24 පුරාම ක්‍රියාකාරිත්වයෙන් යුත් කැමරා 16 ක් පවතින අතර ගොඩනැගිල්ලේ සෑම පිවිසුමකටම හා ගොඩනැගිල්ලේ ආයතන පවතින ස්ථාන එමඟින් ආවරණය වී ඇති එම කැමරා 16 හිම පිරිසිදුතාවය රැකගත යුතු අතර මෙම ඒකකය මඟින් එම කාර්යන් සිදු කරනු නිසියාකාරව සිදු කරන ලදි.

- ✓ අවස්ථා කිහිපයකදී භාණ්ඩ අස්ථානගත වීම් හා අනෙකුත් ක්‍රියාකාරකම්වලට අදාල වීඩියෝ අවශ්‍ය පාර්ශව වෙත ලබා දී ඇත.

<u>**ඇඟිලි සලකුණු යන්ත්‍ර මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වා ගැනීම හා මාස් පතා ඇඟිලි සලකුණු වාර්තා ලබාදීම**</u>.

ඇඟිළි සලකුණු කරන නිලධාරීන්ගේ ඇඟිලි සටහන් නොවීමේ දෝෂය පැන නැගුණු අවස්ථාවල එම දෝෂ නිරාකරණය කිරීම සිදු කරන ලදී.

- පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුල ඇගිලි සලකුණු යන්ත්‍ර 22 ක් පවතින අතර එම යන්ත්‍ර 22 ම එක් එක් ආයතන සඳහා වෙන්කර ඇත.
- එම යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය මනාව පවත්වාගෙන යන අතර යම් දෝෂයක් පැන නැගුනහොත් එය සොයා බලා නිරාකරණය කරන ලදි.
- සෑම මසකම පළමුවන දින පසුගිය මාසයේ ඇගිලි සලකුණු වාර්තාව එක් එක් ආයතන සඳහා ලබාදීම සිදු කිරීම.
- ස්ථාන මාරුවී / නව පත්වීම් ලබා පැමිණෙන නිලධාරීන්ගේ ඇඟිළි සලකුණු ලබාගෙන එම ආයතනවලින් ස්ථාන මාරු යන/ විශ්‍රාම යන/ ඉවත් වන නිලධාරීන්ගේ ඇඟිලි සලකුණු ඉවත් කර මෘදුකාංගය යාවත්කාලීනව පවත්වා ගැනීම.

**<u>පරිපාලන ගොඩනැගිල්ල අභ්‍යන්තරය පමණක් අවරණය වන පරිදි ස්ථාපිත පොදු අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය ( Public Address System) සම්බන්ධ කටයුතු.</u>**

- ❖ පරිපාලන ගොඩනැගිල්ලේ සියලු කාර්යය මණ්ඩලය සඳහා නිවේදන ලබා දීමට එම පද්ධතිය මෙහෙයවා ඇත.
- ❖ එම පද්ධතිය සම්බන්ධව පැන නගින සෑම දෝෂයක්ම නිරාකරණය කර දෙමින් නිවැරදි තොරතුරු ශ්‍රවණයට සහය වීම.

## 6.4. මෘදුකාංග පද්ධති නිර්මාණය කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම

මේ වනවිට උතුරු මැද පළාතේ රාජ්‍ය ආයතනවල දත්ත ගබඩා පවත්වාගෙන යාම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී සංවර්ධන සැලසුම් සඳහා තීරණ ගැනීම සඳහා හා තොරතුරු දැන ගැනීම සඳහා අවශ්‍ය වන අත්‍යාවශ්‍ය දත්ත පවත්වාගෙන යාම සඳහා මෘදුකාංග පද්ධති හයක් නිර්මාණය කර යාවත්කාලීනව පවත්වාගෙන යාම.

ඒ අනුව,

01. පළාත් පුහුණු ඒකකය සඳහා Training Management System
02. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සඳහා Revenue Management System
03. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා Examination Results Release Information System
04. පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා Development Plan Monitoring System
05. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා Agriculture Plan Monitoring System
06. ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා Carder information Management System

වශයෙන් දත්ත පද්ධති හයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික දැණුම ලබා දීම හා ඒවායේ දෝෂ නිරාකරණය කිරීම සිදු කරන ලදී.

එමෙන්ම පළාත් රාජ්‍ය සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ නිවැරදි තොරතුරු ඉක්මනින් ලබා ගැනීමට හැකි වන පරිදි මෙම වසරේදී ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා කාර්යමණ්ඩල තොරතුරු කළමනාකරන පද්ධතිය ස්ථාපනය කරන ලදි. ඒ මගින් පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත.

## 7. පළාත් සංවර්ධනය උදෙසා GIS භාවිතය .

උතුරු මැද පළාත අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකින් සමන්විත වේ. කෘෂිකාර්මික ආර්ථිකය ප්‍රධාන ආදායම් මාර්ගය වන මෙම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක් මහ නගර සභා දෙකක් ඇතුළු පළාත් පාලන ආයතන 27 ක් ඇත. එමෙන්ම ග්‍රාම නිලධාරී තුලාන 988 ක් ඇත. පළාතේ වර්තමාන ජනගහනය 1,366,000 ක් වන අතර ජනගහන ඝනත්වය 282 ක් පමණ වේ. පළාතේ පාසල් 817 ක් ඇත. එමෙන්ම වැව්, වන ගහනය, මාර්ග පද්ධතිය, ආදායම් බල ප්‍රදේශ, රෝහල්, ආයුර්වේද මධ්‍යස්ථාන, සංචාරක ආකර්ශණ ස්ථාන, ආගමික සිද්ධස්ථාන,

ඓතිහාසික ස්ථාන ඇතුළු බොහෝ දෑ පිළිබඳ භූගෝලීය තොරතුරු සිතියම්ගත කිරීම සියළු සංවර්ධන කටයුතු කෙරෙහි මහත් සේ ප්‍රයෝජනවත් වේ.

මෙම ඒකකය මගින් පළාතේ සියළු සංඛ්‍යාලේඛන තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම තුළින් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු නිවැරදිව සහ කඩිනම්ව ලබා ගැනීමට අවස්ථාව සැලසී ඇත. මෙම සියළු කරුණු පිළිබඳ පැහැදිළිව හඳුනා ගැනීම සඳහා සිතියම් ලබා දීමට භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් හැකි විය. GIS සමඟ අප බැඳී සිටිමින් මහජනතාවට හිතකර පරිසරයක් ඇති කිරීම හා අපගේ පළාත සඳහා තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා අදාළ කළමණාකරණ තීරණ ගැනීම සඳහා විශ්වාසනීය සහ යාවත්කාලීන දත්ත සහ තොරතුරු ලබා ගැනීම සඳහා කළමනාකරුවන්ට ප්‍රයෝජනවත් වන දත්ත හා තොරතුරු ලබා දීම සිදු කරන ලදි. අදහස් අර්ථ නිරූපණය කිරීම සඳහා සිතියම් වඩා නිවැරදිව භාවිත කිරීම මෙහිදී සිදු කරන ලදි.

භූගෝලීය තොතුරු පද්ධතිය සකස් කිරීම සඳහා 2020 වර්ෂයේදී සකස් කරන ලද සිතියම් සහ පළාත් රාජ්‍ය සේවයේ ආනෙකුත් නිලධාරීන් සඳහා ලබා දුන් පුහුණු අවස්ථාවන් සම්බන්ධව කරුණු පහත පරිදි දැක්විය හැකිය.

## භූගෝලීය තොරතුරු පද්ධතිය මගින් සකස් කරන ලද සිතියම්

- උතුරු මැද පළාතේ වාරිමාර්ග පද්ධතිය සිතියම සකස් කිරීම.
- උතුරු මැද පළාතේ ජනගහන සිතියම සකස් කිරීම.
- උතුරු මැද පළාතේ මාර්ග පද්ධතිය සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාතේ ඇස්තමේන්තු ජනගහන දරිද්‍රතා දර්ශකය සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතනවල වරිපනම් බල ප්‍රදේශ සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාතේ ආයුර්වේද රෝහල් සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාතේ වී වගා ප්‍රදේශ සිතියම්ගත කිරිම.
- උතුරු මැද පළාතේ රෝහල් සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාතේ ග්‍රාම නිලධාරී තුලාන් සිතියම්ගත කිරීම.
- පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් නිලධාරීන්ට සිතියම් සකස් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.
- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමග උතුරු මැද පළාතේ පාසල් සිතියම්ගත කිරීම.

## භූගෝලීය තොරතුරු පද්ධති හා සංඛ්‍යාලේඛන අංශය මගින් සිදු කරන ලද වෙනත් සේවාවන්

- පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් නිලදාරීන්ට සිතියම් සකස් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.
- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමග උතුරු මැද පළාතේ පාසල් සිතියම්ගත කිරීම.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

ජාතික ප්‍රතිපත්තීන්ට සහ නියාමනයන්ට සමගාමීව ජාතික සංවර්ධනයට ඍජුවම දායක වෙමින් පළාතේ ජනතාවගේ අභිවෘද්ධිය සහ යහපැවැත්ම සඳහා 2020 වර්ෂයේදීද පළාත් සභා සංවර්ධන කටයුතුවලදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සුවිශාල වගකීමක් සහ කාර්යභාරයක් ඉටුකරන ලදී.

මෙහිදි පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද ක්‍රමානුකූල වැඩපිළිවෙලක් තුළ ක්‍රියාත්මක වු මෙහෙයුම් සහ ඇගයුම් ක්‍රියාවලිය තුළින් පළාතේ සංවර්ධන කාර්යය වඩාත් ක්‍රමික එකක් කිරිම සඳහා දායකත්වය සපයන ලදී. 2020 වර්ෂයේදී සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

පළාතේ සංවර්ධන, පරිපාලන, සමාජ සුභසාධන, සමාජ ආරක්ෂණ, ආදායම් උත්පාදන, ව්‍යවසායකත්ව සහ ජීවනෝපාය සංවර්ධන ආදී ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙහිදී විනිවිදභාවය, ඵලදායිතාව සහ ආයෝජනයන්ට සාපේක්ෂ ප්‍රතිලාභ ඉලක්කගත පුද්ගලයන්ට ලැබීම පිළිබඳවද සංවර්ධන ව්‍යාපෘතිවල ගුණාත්මක අගය සහ යෙදවුම් පිළිබඳවද විවිධ මෙහෙයුම් කටයුතු සිදු කෙරිණි.

ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ අනුව ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති 100% නිරීක්ෂණ පදනම මත පරීක්ෂා කිරීමටත් එහි ප්‍රගතිය මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ඉදිරිපත් කිරීමටත් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඒ අනුව 2020 වර්ෂයේදී ද ප්‍රතිලාභ රැසක් පළාතේ ජනතාවට ලබා දීම සඳහා පළාත් සභා යාන්ත්‍රණය වෙත ඍජු සහ සක්‍රිය දායකත්වයක් ලබා දීමට හැකි විය.

2020 වර්ෂය තුළදි පළාත් සංවර්ධන සැලසුම ක්‍රියාවට නංවමින් පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය වු අතර විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පළාතේ අත්‍යාවශ්‍ය අවශ්‍යතා සැලකිය යුතු ප්‍රමාණයකින් සම්පුර්ණ කිරීමටත් හැකි විය. එසේම ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කළ අතර පළාත තුළ විදේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති නියාමනය කිරීම ද සිදු විය.

# 5.2. පළාත් භාණ්ඩාගාරය

**ආයතනය පිළිබඳ හැඳින්වීම**

ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක් යන දැක්ම කරා ළඟා වීම උදෙසා රාජ්‍ය මූල්‍ය පිළිබඳ තීරණ ගැනීම පිණිස මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන පළාත් සභා ආදායම්, වියදම්, අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් ඇතුළු මූල්‍ය කටයුතු වාර්තා කිරීමේ මධ්‍යගත ආයතනය වශයෙන් "පළාත් භාණ්ඩාගාරය" ක්‍රියාත්මක වේ.

අමාත්‍යංශයක් යටතට නොවැටෙන දෙපාර්තමේන්තුවක් වන මෙම ආයතනයේ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා පළාත් භාණ්ඩාගාරයේ ද ලේකම්වරයා වන අතර, මෙහෙයුම් කටයුතු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) මගින් සිදුවේ. පළාත් භාණ්ඩාගාරය යටතේ පහත සඳහන් දෙපාර්තමේන්තු හා අංශ ක්‍රියාත්මක වේ. අයවැය දෙපාර්තමේන්තුව, මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව, ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව සහ පරිපාලන හා ගිණුම් අංශය වශයෙනි.

**අයවැය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනයේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ පළාත් සභාවලට පැවරී ඇති විෂයයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමේ අරමුණින් අයවැය ඇස්තමේන්තු පිළියෙල කරන ලදි.

එසේම තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය අනුව පළාත් සංවර්ධනයට අදාළ තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි හඳුනාගෙන ඇති අතර එම අරමුණු වසර 2030 වනවිට ළඟා කර ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී අවධානය යොමු කර ඇත.

| | | |
|---|---|---|
| SDG 01 | - | සියළුම ආකාරයේ දරිද්‍රතාව තුරන් කිරීම. |
| SDG 02 | - | සියළුම ආකාරයේ කුසගින්න හා මන්දපෝෂණය තුරන් කිරීම. |
| SDG 03 | - | ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය, මැලේරියාව හා අනෙකුත් වසංගත රෝග තුරන්කරමින් සෞඛ්‍ය හා යහපැවැත්ම සහතික කිරීම. |
| SDG 04 | - | සියළුම ගැහැණු හා පිරිමි ළමුන් නිදහස්, ප්‍රාථමික හා ද්වීතියික පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කරන බවට තහවුරු කිරීම. |
| SDG 06 | - | සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අදාළ විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම. |
| SDG 07 | - | දැරිය හැකි විදුලිය සඳහා විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම. |
| SDG 08 | - | අවම ආදායම් කාණ්ඩවලට අයත් ආදායම් උපයන්නන් බලගැන්වීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය හා ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය වැනි කරුණු නොසලකා සමාජයේ සියළු දෙනාම ඇතුළත් වන පරිදි ආදායම් ප්‍රවර්ධනය සහතික කරලීම. |
| SDG 15 | - | වනාන්තර, තෙත් බිම්, වියළි ඉඩම් සහ කඳු යන භෞමික පරිසර පද්ධතීන් කඩිනමින් සංරක්ෂණය හා ස්ථාපනය කිරීම. |
| SDG 16 | - | සියල්ලන් සඳහා යුක්තිය හිමිකර ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම. |

## මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව

පළාත් සභා මූල්‍ය රීති අධ්‍යනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතනවල මූල්‍ය කටයුතු විධිමත් කිරීමට ප්‍රඥප්ති සකස් කිරීම හා භාණ්ඩාගාර චක්‍රලේඛ නිකුත් කිරීම වැනි කාර්යන් ප්‍රමුඛ කරගත් මුදල් දෙපාර්තමේන්තුව ද ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිශෝධනය, ආදායම් ගිණුම් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම වැනි කාර්යයන් ප්‍රධාන කරගත් ආදායම් දෙපාර්තමේන්තුව ද මේ යටතේ ක්‍රියාත්මක වේ.

## ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තියට අනුව පිහිටුවා ඇති පළාත් සභා අරමුදලට, පළාත් සභාව වෙත බලය පැවරි ඇති ප්‍රභවයන්ගෙන් එකතුවන සියලුම ආදායම්, මධ්‍යම රජය විසින් එකතුකර ප්‍රේෂණය කරනු ලබන බදු ආදායම් ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පළාත් සභාවට ලබා දෙන ලද සියලුම ප්‍රදාන, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් පළාත් සභාවට දෙන ලද සියලුම ණය මුදල් සහ පළාත් සභාවට ලැබෙන සියලු ලැබීම් සහ පළාත් සභා ආයතන වෙත අක්මුදල් නිකුත් කිරීම් සහ වෙනත් ගෙවීම් කළමනාකරණය කිරීම සිදු කරයි.

එමෙන්ම, පළාත් සභා අරමුදල සම්බන්ධව අවශ්‍ය නියමිත ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම, පළාත තුළ විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියන් පවත්වාගෙන යාමට අවශ්‍ය මග පෙන්වීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත වරින් වර චක්‍රලේඛ නිකුත් කිරීම, උපදෙස් හා නියෝග නිකුත් කිරීම, වියදම් හා ආදායම් පිළිබඳ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම ආදී ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබයි.

## දැක්ම

"ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්"

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහි කිරීම සඳහා පළාතේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශනය, පළාතේ ගිණුම් පවත්වාගෙන යාම සහ ප්‍රසිද්ධ කිරීම, මූල්‍ය කළමනාකරණ තොරතුරු සැපයීම හා සියළු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් යුක්තව ගිණුම් ක්‍රම සංවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු

- දීර්ඝකාලීන සංවර්ධන සැලසුම් හා ව්‍යාපෘති යෝජනා පදනම් කරගෙන සම්පත් වෙන් කිරීම.
- ගිණුම්කරණ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන යෙදවුම් භාවිතය ඉහළ නැංවීම.
- මූල්‍ය කළමනාකරණය සඳහා වගවීම හා විනිවිදභාවය තහවුරු කිරීම තුලින් මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම.
- පළාත් සභා හා පළාත් පාලන ගිණුම් ඒකකවල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරිම.
- කාලීන හා ගුණාත්මක තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- මනා සම්බන්ධීකරණයක් තුළින් පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් කරනු ලබන ආයෝජනයන්හීදී එකම කාර්යය සඳහා දෙඅංශයෙන්ම සිදුවන ආයෝජන වැළැක්වීම.
- ගුණාත්මක හා යාවත්කාලීන වාර්තාකරණ ක්‍රමයක් ඇති කිරීම.
- වියදම් ප්‍රමුඛතා හා අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධ අඛණ්ඩ අවධානය.
- නිමැවුම් පදනම් කරගත් ඇගයීමේ ක්‍රමයක් පිහිටුවීම.
- ගිණුම් ඒකකවල පරිගණකගත ගිණුම්කරණ මෘදුකාංග පද්ධති සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය දීම.
- අයවැය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය දීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් ආදායම් අයවැය ප්‍රතිපත්ති සහ ගිණුම් ප්‍රතිපත්ති සම්පාදනය හා සංවර්ධනය.
- පළාත් අරමුදල, අවිනිශ්චිත අවස්ථා අරමුදල සහ වෙනත් අරමුදල් පවත්වාගෙන යාම සහ සංවර්ධනය.
- මධ්‍යගත මූල්‍ය පාලනය, මූල්‍ය උපදෙස් ලබා දීම සහ මූල්‍ය කළමනාකරණ තොරතුරු ලබා දීම.
- පළාත් ආදායම් රැස් කිරීමේ කටයුතු නියාමනය සහ සංවර්ධනය.
- පළාතේ ක්‍රමවත් ගිණුම් ක්‍රමයක් පවත්වා ගැනීම සහ පළාතේ ගිණුම් ප්‍රසිද්ධ කිරීම.
- ගිණුම් ක්‍රම සංවර්ධනය.
- ප්‍රසම්පාදන කටයුතු නියාමනය හා සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය.

## 1.අයවැය දෙපාර්තමේන්තුව

- වාර්ෂික මුදල් ප්‍රකාශය පිළියෙල කිරීම
- විසර්ජන ප්‍රඥප්තිය පිළියෙල කිරීම
- පරිපූරක ඇස්තමේන්තු පිලිබඳ කටයුතු
- අයවැය කළමනාකරණය සහ පාලනය
- ප්‍රතිපාදන මාරු කිරීම
- සේවක සංඛ්‍යා තොරතුරු තබා ගැනීම හා පාලනය
- අයවැය දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය
- ඇස්තමේන්තු ලබා ගැනීම හා පරික්ෂාව
- අයවැය හා සැලසුම් කමිටු
- පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් තීරණය කිරීම හා ප්‍රතිපාදන සැලසීම
- අයවැය සාකච්ඡා
- වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම
- අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කිරීම
- ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතා හා සැලසුම් තොරතුරු තබා ගැනීම
- පළාත් සභා සැලසුම්, අරමුණු, ඉලක්ක හා කාර්ය සාධන ලබා ගැනීම හා පවත්වා ගැනීම
- අතිරික්ත වියදම් හා අත්තිකාරම් ගිණුම් වල සීමා ඉක්මවීම් ද අවම සීමා වලට ලඟා නොවීම පිලිබඳ කටයුතු
- අයවැය සීමා ඉක්මවීම් හා සීමාවලට ලඟා නොවීම් සඳහා අනාවැකි ලබා ගැනීම

## 2. මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව

- ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම
- ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය
- ආදායම් ප්‍රගති කටයුතු
- ආදායම් වාර්තා පිළියෙල කිරීම
- ආදායම් දත්ත තබා ගැනීම හා විශ්ලේෂණය

- ආදායම් එකතු කිරීම
- ආදායම් ගිණුම් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම
- හිඟ ආදායම් ගිණුම්
- මූල්‍ය රීති පැනවීම හා සංශෝධනය
- මූල්‍ය අධීක්ෂණය
- පළාත් සභා දේපල පරිපාලනය
- විගණන විමසුම් ලේඛන පවත්වා ගැනීම හා ප්‍රගතිය
- විගණකාධිපතිගේ විගණන වාර්තා හා කෙටුම්පත් වාර්තා පිළිබඳ කටයුතු
- පළාත් ගිණුම් කාරක සභා කටයුතු
- පළාත් ගිණුම් කාරක සභා වාර්තා පිළිබඳ කටයුතු
- පළාත් සභාවෙන් බැහැර අරමුදල් පාලනය
- පළාත් සභා නිලධාරින්ගේ ඇප
- මූල්‍ය කටයුතු වල කාර්ය සාධනය හා කාර්යඵල ඇගයීම
- පළාත් සභා ආකෘතිපත්‍ර පාලනය හා නව ආකෘතිපත්‍ර හඳුන්වා දීම
- දීමනා පිළිබඳ කටයුතු
- විදේශාධාර හා ණය ප්‍රතිපාදන කටයුතු
- ණය ලබා ගැනීම හා ආපසු ගෙවීම
- බලය පැවරීම
- සමීක්ෂණ මණ්ඩල හා කපා හැරීම
- අලාභ, අත්හැරීම්, කපා හැරීම් හා වන්දි ගෙවීම
- දේපල අලෙවිය හා බැහැර කිරීම
- ගිණුම් ක්‍රම සංවර්ධනය
- විගණන විමසුම් පිළිබඳ කටයුතු සඳහා වූ විගණන විමසුම් ලේඛන පවත්වා ගැනීම
- අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කටයුතු

## 3.ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව

- පළාත් අරමුදලේ ගිණුම් තැබීම හා නියමිත හා අදාළ පොත් හා ගිණුම් පවත්වා ගැනීම.
- අග්‍රිම නිකුත් කිරීම හා පාලනය
- මාසික භාණ්ඩාගාර ගිණුම් වාර්තා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කිරීම හා පාලන කටයුතු
- සෙප්පුවල අනු යතුරු තබා ගැනීම
- පළාත් සභාවේ සියලුම ගිණුම් පරිපාලනය සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරිම.
- පළාත් සභා අරමුදල් කළමනාකරණය හා අධීක්ෂණය
- විදේශාධාර ගිණුම්
- අග්‍රිම සීමා නියම කිරීම
- ගිණුම් ප්‍රසිද්ධ කිරීම
- ගිණුම් වාර්තා පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරීම
- පළාත් හදිසි අවස්ථා අරමුදලේ කටයුතු
- ගිණුම් ඒකාබද්ධ කිරීම
- පළාත් සභා අරමුදලේ මුදල් පරිපාලනය
- අතිරික්ත මුදල් ආයෝජනය
- පළාත් සභාවේ සියළුම බැංකු ගිණුම් පාලනය හා අධීක්ෂණය
- ආදායමින් ආපසු ගෙවීම
- ප්‍රදාන ලබා ගැනීම
- සියලුම පොදු තැන්පතු ගිණුම් පාලනය හා අධීක්ෂණය
- සියලුම අත්තිකාරම් ගිණුම් පාලනය හා පරීක්ෂාව

## 4.පරිපාලන හා ගිණුම් අංශය

- දෛනික තැපැල බෙදීම හා බෙදා හැරීම
- පළාත් භාණ්ඩාගාරයේ සත්‍ය කාර්ය මණ්ඩලයේ ආයතනික හා පරිපාලන කටයුතු.
- පළාතේ සිටින ගණකාධිකාරීවරුන්ගේ ස්ථාන මාරුවීම් සඳහා නිර්දේශ සහ නවක නිලධාරීන් සඳහා නිර්දේශ ලබාදීම.
- පළාත් සභා අරමුදලට බැර විය යුතු ආදායම් ගිණුම්ගත කිරීම.
- ක්ෂය සංචිත අරමුදල පවත්වාගෙන යාම.
- වාහන පරිපාලන හා නඩත්තු කටයුතු.
- අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම
- පළාත් භාණ්ඩාගාරයේ සියලුම ගෙවීම් කටයුතු

- බැංකු සැසඳුම් පිළියෙල කිරීම
- ලෙජර් පොත් තුලනය සහ සැසදීම
- තොග පොත් තුලනය හා සැසදිම
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කමිටු පත්කිරීම
- භාණ්ඩ සමීක්ෂණ කටයුතු
- අවශ්‍ය වාර්තා ලබාගෙන භාණ්ඩ අපහරණය කිරීම
- රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සකස් කිරීම
- ගිණුම් සැසදීම
- මූල්‍ය ප්‍රකාශන, අත්තිකාරම් ගිණුම සකස් කිරිම හා ඉදිරිපත් කිරිම
- විගණන විමසුම් වලට පිළිතුරු යැවීම
- පළාත් භාණ්ඩාගාරයේ ප්‍රසම්පාදන කටයුතු
- වැටුප් සකස් කිරිම/ වැටුප් ලෙජර නඩත්තුව/ වැටුප් ගෙවීම

## ප්‍රධාන උපාය මාර්ගයන්

01. මූල්‍ය කළමනාකරණය
02. වියදම් පාලනය
03. වත්කම් කළමනාකරණය.
04. තොරතුරු සන්නිවේදනය භාවිතයෙන් ගිණුම්කරණ කටයුතු වැඩිදියුණු කිරීම

## අපගේ සාරධර්ම

| | | |
|---|---|---|
| **නායකත්වය** | - | සමාජීය හා වෘත්තීය වගකීම් සපුරාලමින් පළාත තුළ මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමේ නායකයා ලෙස කටයුතු කිරීම. |
| **යහපාලනය** | - | තීරණ ගැනීමේදී අරමුණුගතභාවය, වගවීම, විනිවිදභාවය, සාධාරණ සැලකිල්ල හා ප්‍රමුඛ පාලනය පිළිබිමු කිරීම. |
| **ගුණාත්මකභාවය** | - | කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම තුළින් ගුණාත්මක සේවාවන් සැපයීම. |
| **විශේෂඥතාව** | - | පරිචයට අදාල ශිල්ප ක්‍රම, මූල්‍ය න්‍යායන් හා නවීන ගිණුම්කරණ ක්‍රමවේදයන් භාවිතය පිළිබඳ විශේෂ දැනුම. |

## තිරසර සංවර්ධන අරමුණු

- සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.
- සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.
- තිරසාර පාරිභෝජනය හා නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 32ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 26 කි. පුරප්පාඩු සංඛ්‍යාව 06 ක් වන අතර 05 දෙනෙකු පුහුණුවේ.

## පළාතේ සංවර්ධන කාර්යය සාර්ථක කර ගැනීම සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් සැපයෙන විවිධ මැදිහත්වීම්

- උතුරු මැද පළාත "ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්" යන දැක්ම කරා ගමන් කිරීමේදී, දායකත්වය දක්වන මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් කටයුතු කිරීමට වාර්ෂිකව අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කරමින්, රාජ්‍ය භාණ්ඩාගාරයෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.
- ලබා ගන්නා මූල්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනුබද්ධිත ආයතන වෙත නිදහස් කිරීම තුළින් එකිනෙක අමාත්‍යාංශ වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.
- පළාතේ සංවර්ධනය උදෙසා විදේශයන්ගෙන් ලැබෙන ණය හා ආධාර උපයෝගී කරගනිමින් ඉටු කරනු ලබන විදේශ ව්‍යාපෘති ඉටුකිරීමේදී මැදිහත්කරුවෙකු වශයෙන් දායකත්වය ලබා දී ප්‍රශස්ත මූල්‍ය පාලනයක් සහ පසු විපරම් කිරීම මඟින් සංවර්ධයට දායකත්වයක් ලබා දීම.
- සංවර්ධන කටයුතු ක්‍රමවත්ව විනිවිදභාවයකින් යුක්තව ඉටු කිරීම උදෙසා අයවැය ප්‍රතිපත්ති සකස් කිරීම, නව ගිණුම් පාලන ක්‍රම හඳුන්වා දීම, ඒ වෙනුවෙන් කලින් කලට චක්‍රලේඛ නිකුත් කිරීම. මෙම කාර්යයන් කරගෙන යාමේදී මූල්‍ය පාලනය හා විනය ඇති කිරීම උදෙසා චක්‍රලේඛ අණපනත් නිකුත් කිරීම, විවිධ රැස්වීම් පවත්වමින් උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම හා අදාළ ක්ෂේත්‍රවල කටයුතු කරන නිලධාරීන් සඳහා පුහුණුවීම් හා වැඩමුළු පැවැත්වීම සිදු කරයි.
- වත්කම් කළමනාකරණ මෘදුකාංගය හඳුන්වා දෙමින්, පළාත පුරා විසිරී ඇති පළාත් රාජ්‍ය සේවයට අනුබද්ධිත ආයතනවල ඇති සියළුම ස්ථාවර වත්කම්, ඉඩම් හා ගොඩනැඟිලි, මහා මාර්ග, වැව් ආදී තොරතුරු එක් ස්ථානයකින් ලබා ගැනීමට හැකි වන පරිදි සකස් කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව හා කඩිනමව ඉටු කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම.
- උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනුබද්ධිත ආයතන කාර්යයන් ඉටු කිරීමේදී සිදු වන දෝෂයන් සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවෙන් පෙන්වා දෙන වැරදි සහ අඩුපාඩු නිවැරදි හා අවම කර ගැනීමට උපදෙස් ලබා දීම.
- විවිධ අරමුදල් පවත්වාගෙන යමින් අවශ්‍ය අවස්ථා වලදී ඒවා නිකුත් කිරීම.

## කාර්ය සාධන දර්ශක ළඟා කර ගැනීමේ ප්‍රගතිය - 2020

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ළඟා කර ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| | | අයවැය දෙපාර්තමේන්තුව | |
| 01 | පළාත තුල සියලුම ආයතනයන්හි ක්‍රමවත් අයවැය පාලනයක් සඳහා සහය වීම. | 10% කින් ප්‍රතිපාදන මාරු කිරීම් අවම කිරීම, ප්‍රශස්ථ ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇති කිරීම. | 80 % කින් පමණ අඩුකර ගැනීමට හැකි වී ඇත |
| 02 | සියලු ආයතන සම්බන්ධීකරණයක් ඇති කිරීම. | 100% නිවැරදි කාර්ය මණ්ඩල දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම. | 100% නිවැරදි කර ගැනීමට හැකි වී ඇත |
| | | ආදායම් හා මුදල් දෙපාර්තමේන්තුව | |
| 03 | මනා මූල්‍ය පාලනයක් තුළින් මුදල් ප්‍රකාශය මඟින් වෙන් කරනු ලබන මුදල් උපරිම මැද පළාතේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා යෙදෙවෙන බවට තහවුරු කිරීම. | ආයතන වලට යොමුවන විගණන විමසුම් ප්‍රමාණය 20% කින් අවම කිරි | 5% කින් පමණ අයකර ගැනීමට හැකි වී ඇත |
| | | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අභියාචනා දුක්ගැනිවිලි 40% කින් අවම කිරීම. | 90% ක් අඩු කිරීමට හැකි වී ඇත. |
| | | පළාත් සභා සතු සියලු වත්කම් ලේඛන ගත කිරීම. | 60% ක් පමණ වත්කම් ලේඛණගත කර ඇත. |
| | | පළාත් සභාව යටතේ ඇති ආයතන වලින් 80% ඊලඟ වර්ෂයේ මාර්තු 31 වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කිරීම. | 50%ක් පමණ අවසන් වී ඇත. |

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ලඟා කර ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| 04 | පළාත් සභාවට ලැබිය යුතු ආදායම් පිළිබඳ මනා පාලනයක් තබා ගනිමින් සභාවට ලැබිය යුතු සියලු ආදායම් නිසි ලෙස එක් රැස් කර ගැනිම. | සියලු ආදායම් ශීර්ෂවල ඇස්තමේන්තුගත ආදායමෙන් 80%ක මට්ටමක්වත් අවම ලෙස එකතු කර ගැනීම. | 70% ක් පමණ මට්ටමකට ආදායම් එකතු කර ගැනීමට හැකි වී ඇත. |
| | | ආදායම් ගිණුම් හා සම්බන්ධ විගණන විමසුම් 20% කින් අඩු කර ගැනීම. | 20% ක් පමණ අයකර ගැනීමට හැකි වී ඇත |
| | | පළාත් සභාව වෙතින් ප්‍රාදේශිය සභා වෙත ප්‍රේශණය වන ආදායම් ඉල්ලීම් ලැබී මසක් ඇතුලත ඔවුන් වෙත ලබා දීම. | නියමිත දිනට ලබා දී ඇත. |
| **ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව** | | | |
| 05 | උතුරු මැද පළාත් සභාව සඳහා තීරණ ගැනීමට අවශ්‍ය පාර්ශවයන් වෙත නිවැරදි සහ සත්‍ය තොරතුරු ලබා දීම. | පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික ගිණුම් සියල්ල නියමිත දිනට පෙර ඉදිරිපත් කිරිම. | 100% නියමිත දිනට ලබා දී ඇත. |
| | | ගිණුම්වල නොසැසදීම්, ගිණුම් දෝෂ 10% දක්වා අවම කිරිම. | 90% ක මට්ටමකට අවම කරගෙන ඇත |
| **පරිපාලන හා ගිණුම් අංශය** | | | |
| 06 | පළාත් භාණ්ඩාගාරයේ මූල්‍ය හා ආයතනික කටයුතු මනා කළමනාකාරිත්වයකින් යුක්තව පවත්වාගෙන යාම. | විගණන විමසුම් 30%කින් අඩු කිරිම. | 25% කින් පමණ විගණන විමසුම් අඩු කරගෙන ඇත. |
| | | අයවැය ඇස්තමේන්තු කලට වේලාවට පිළියෙල කිරිම. | නියමිත දිනට පිළියෙල කර ඉදිරිපත් කරන ලදී |
| | | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරිම. | නියමිත දිනට පිළියෙල කර ඉදිරිපත් කරන ලදී |

## ආයතනයේ දැක්ම කරා ලඟා වීමේ හා ප්‍රධාන අරමුණු ලඟා කර ගැනීමේ ප්‍රගතිය

උතුරු මැද පළාත සංවර්ධිත පළාතක් කිරීම උදෙසා පළාත් භාණ්ඩාගාරය විසින් මූල්‍ය ප්‍රතිපාදන සකසා ගත යුතුව ඇත. එහි දී රාජ්‍ය භාණ්ඩාගාරයෙන් සෘජුව ප්‍රතිපාදන ලබා ගැනීමට මැදිහත් වන්නාසේම විදේශීය අරමුදල්, විදේශීය ණය ආධාර සහ වෙනත් රේඛීය අමාත්‍යාංශ වෙතින් ලබාදෙන ප්‍රතිපාදනවල අතරමැදි වශයෙන් කටයුතු කිරීම පළාත් භාණ්ඩාගාරයේ කාර්යය භාරයයි.

## 2020 වර්ෂයේ පළාතේ සංවර්ධනය වෙනුවෙන් අවශය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම හා ඒ වෙනුවෙන් වැයවන වියදම් වෙනුවෙන් සකසන ලද අයවැය ඇස්තමේන්තුවේ සාරාංශය

| | ලැබීම් | මුදල |
|---|---|---|
| 1 | රජයෙන් ලැබුණු ප්‍රදාන | |
| | I සාමූහික ප්‍රදාන | 19,169.00 |
| | II පළාත් සභා සංවර්ධන ප්‍රදාන | 179.29 |
| | III පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1161.19 |
| | IV විදේශ සහයෝගිතා ව්‍යාපෘති | |
| | පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | 45.00 |
| | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය | 230.00 |
| | උතුරු පත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘති | 50.00 |
| | දේශගුණ සුහුරු කෘෂිකර්ම ව්‍යාපෘති | 41.80 |
| | ප්‍රාදේශීය සහය සංවර්ධන ව්‍යාපෘතිය | 24.31 |
| | V රේඛීය අමාත්‍යාංශ ලැබීම් හා වෙනත් ලැබීම් | 952.52 |
| 2 | ආදායම ලැබීම | |
| | I.මධ්‍යම රජය විසින් මාරු කිරීමට අපේක්ෂිත ආදායම | 725.00 |
| | II.පළාත තුළින් රැස් කරනු ලබන ආදායම් | 1242.17 |
| | III.පළාත් පාලන ආයතන වෙත මාරු කිරිම | 420.00 |
| 3 | විවිධ අත්තිකාරම් ගිණුම් යටතේ අපේක්ෂිත ලැබීම් | 470.00 |
| | එකතුව | 24710.36 |
| | **වියදම්** | |
| 1 | පුනරාවර්තන වියදම් | 21820.47 |
| 2 | මූලධන වියදම් | 2703.60 |
| 3 | අත්තිකාරම් ගිණුම් යටතේ වියදම් | 633.16 |
| | **එකතුව** | **25187.23** |

## 2020 වර්ෂයේ උතුරු මැද පළාතේ මූල්‍ය විශ්ලේෂණය - 2020 වර්ෂයේ මුදල් ලැබීම් මූලාශ්‍ර







## අරමුණ කරා යාමේදී ඇතිවන ගැටළු හා අභියෝග විනය හා මූල්‍ය පාලනය උදෙසා 2020 වර්ෂයේදී නිකුත් කරන ලද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ නාමාවලිය

| අනු අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ විස්තරය |
|---|---|---|---|
| 1 | 2020.01.01 | 2020/01 | වියදම් සඳහා බාලාධිකාරය පැවරීම සහ රාජයේ වියදම් කළමණාකරණය 2020 ජනවාරි 01 සිට අප්‍රේල් 30 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වූ අතුරු සම්මත ගිණුම |
| 2 | 2020.01.02 | 2020/02 | 2020 වර්ෂය තුල දී වැටුප් සහ වැටුප් අත්තිකාරම් ගෙවීම |
| 3 | 2020.01.17 | 2020/03 | අග්‍රිම නිදහස් කිරීම හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම - 2020 |
| 4 | 2020.02.18 | 2020/04 | පළාත් සභාවේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම |
| 5 | 2020.02.19 | 2019/18 (1) | මූල්‍ය ප්‍රකාශන - 2019 |
| 6 | 2020.02.27 | 2019/(19)(i) | ගිණුම් ආරම්භ කිරීම සහ වියදම් ගිණුම්ගත කිරීම - 2020 |
| 7 | 2020.03.04 | 2020/05 | උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය රීති අංක 261.2.5 සංශෝධනය |
| 8 | 2020.03.18 | 2020/06 | ආදායම් සහ වියදම් ඇස්තමේන්තු - 2021 |
| 9 | 2020.04.30 | 2020/07 | වියදම් සඳහා බාලාධිකාරය පැවරීම සහ රාජ්‍ය වියදම් කළමණාකරණය |
| 10 | 2020.09.02 | 2020/08 | වියදම් සඳහා බාලාධිකාරය පැවරීම සහ රාජ්‍ය වියදම් කළමණාකරණය - 2020 |
| 11 | 2020.11.12 | 2020/09 | භාණ්ඩ සමීක්ෂණය - 2020 |
| 12 | 2020.11.24 | 2020/10 | දේශීය කර්මාන්ත දිරි ගැන්වීමේ ප්‍රතිපත්ති |
| 13 | 2020.11.25 | 2020/11 | 2020 වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම |
| 14 | 2020.12.07 | 2020/12 | වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2020 |
| 15 | 2020.12.10 | 2020/13 | පළාත් මූල්‍ය රීති නීති සංග්‍රහය 423.5 යටතේ ප්‍රසම්පාදන |
| 16 | 2020.12.14 | 2020/14 | තරගකාරී ලංසු ක්‍රමවේදය යටතේ ලංසු ඉදිරිපත් කරන රාජ්‍ය ව්‍යපාර සඳහා විශේෂ ප්‍රමුඛත්වය |
| 17 | 2020.12.31 | 2020/15 | මූල්‍ය ප්‍රකාශන - 2020 |
| 18 | 2020.12.31 | 2020/16 | අත්තිකාරම් ගිණුම් - 2020 |
| 19 | 2020.12.31 | 2020/17 | පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම - 2020 |
| 20 | 2020.12.31 | 2020/18 | අරමුදල් ගිණුම් වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම - 2020 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරුමැද පළාත සංවර්ධිත පළාතක් කිරීම උදෙසා පළාත් භාණ්ඩාගාරය විසින් මූල්‍ය ප්‍රතිපාදන සකසා ගත යුතුව ඇත. එහි දී රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ඍජුව ප්‍රතිපාදන ලබා ගැනීමට මැදිහත් වන්නාසේම විදේශීය අරමුදල්, විදේශීය ණය ආධාර සහ වෙනත් රේඛීය අමාත්‍යාංශ වෙතින් ලබාදෙන ප්‍රතිපාදනවල අතරමැදි වශයෙන් කටයුතු කිරීම පළාත් භාණ්ඩාගාරයේ කාර්යය භාරයයි.

ආයතය විසින් හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්.

- වත්කම් කළමනාකරණ මෘදුකාංගය (AMS) යාවත්කාලීනව පවත්වාගෙන යාමට මෙම වසර තුල ද කටයුතු කළ අතර ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් විවිධ වැඩසටහන් හරහා ලබා දෙන ලදී. උතුරු මැද පළාත් සභාව සතු වත්කම් ලේඛන ගත කිරීම හා ගිණුම් තැබීම පහසු කිරීම සඳහා මෙම මෘදුකාංගය හඳුන්වා දුන් අතර ආයතන විසින් අත්පත් කර ගන්නා වත්කම් ලේඛන ගත කිරීමත්, එසේ අත්පත් කර ගත් වත්කම් විවිධ අංශ අතර බෙදා හැරීමටත්, වත්කම් අපහරණය කිරීමේදීත් අවශ්‍ය වාර්තා ලබා ගැනීමටත් මෙම වැඩසටහන තුලින් පහසුකම් සැලසී ඇත. මෙමඟින් වත්කම් වාර්තාකරණය කාර්යක්ෂම හා විධිමත් කිරීම, වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම, නිෂ්ක්‍රිය හා අභාවිත වත්කම් හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණු වේ.
- 2020 වර්ෂය සඳහා ද අඛණ්ඩව නව සිගාස් (6.0) වැඩසටහන් සහ වැටුප් සැකසීමේ වැඩසටහන් සංවිධානය කරමින් පළාත තුල අවශ්‍ය දැනුම ලබා දෙන ලදී. 2020 වර්ෂය තුලදී මුල් මාස අට සඳහා අතුරු සම්මත ගිණුම් මගින් ප්‍රතිපාදන ලබාදීම ද ඉතිරි මාස සඳහා විසර්ජන ප්‍රඥප්තිය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම ද සිදු කරන ලද අතර පැවති COVID 19 වසංගත තත්වය හමුවේ විවිධ වූ ක්‍රමෝපායන් භාවිතා කරමින් පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත අයතනවල නිලධාරින් දැනුවත් කිරීම සිදු කරන ලදී.

නව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක කිරීම





2020 වර්ෂයට අදාල විසර්ජන නියෝගය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කිරීම

2020 මුදල් ප්‍රකාශය ගරු ආණ්ඩුකාරතුමා වෙත පිලිගැන්වීම



- තවද 2020 වර්ෂය තුල දී පහත සඳහන් අංශ සඳහා පුහුණු අවස්ථා ලබා දීම තුලින් කාර්යාක්ෂම හා ඵලදායී මානව සම්පත් ලඟා කර ගැනීමට පියවර ගෙන ඇත.
  - ✓ වැටුප් සැකසීම (GPS), CIGAS, විශ්‍රාම වැටුප් සැකසීම.
  - ✓ මූල්‍ය වාර්තා සකස් කිරීම.
  - ✓ විගණන විමසුම් පිලිබඳව පුහුණු වැඩසටහන.
  - ✓ පරිගණක හා තොරතුරු තාක්ෂණ හැකියා ප්‍රවර්ධනය.
  - ✓ නව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

සමස්තයක් වශයෙන් ගත්විට ගෝලීය වසංගත තත්වයක් හමුවේ වුවද 2020 වර්ෂය වෙනුවෙන් අයවැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී, මූල්‍ය වාර්තාකරණයේ දී හා මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ දී පවතින සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව ප්‍රශස්ථ ආකාරයට උපයෝජනය කිරීම මඟින් සාර්ථක ප්‍රතිඵල ලඟා කර ගැනිමට හැකිවිය.

## COVID 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් කාර්ය සාධනය කරා ළඟාවීමේ දී මුහුණ දුන් අභියෝග හා ගැටළු

- 2020 වර්ෂය තුලදී රට පුරා පැතිරි ගිය COVID 19 වසංගත තත්වය හේතුවෙන් ආයතනික කටයුතු පවත්වාගෙන යාමේදී පහත සඳහන් ගැටලු හා අභියෝග වලට මුහුණ දීමට සිදු විය.
  - නිලධාරීන් චක්‍රීය පදනමින් සේවය සඳහා පැමිණීම.
  - නිවසේ සිට රාජකාරී කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
  - ශ්‍රී ලංකාව තුළ කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ක්‍රියාකාරීව මැදිහත් වීමට උතුර මැද පළාත වශයෙන් දායකත්වය දැක්වීම.
  - පළාත තුල අර්ථික හා සමාජීය යහපැවැත්ම උදෙසා සක්‍රීයව දායකත්වය ලබා දීම.
- COVID 19 ව්‍යාප්තිය සමග අපේක්ෂිත ආදායම් ලැබීමේ අඩුවීම.
- නියමිත කාලවකවානු වලදී, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මට්ටමින් භාණ්ඩාගාරයට එවිය යුතු වාර්තා නියමිත දිනට නොලැබිම.
- සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය අපේක්ෂිත පරිදි නොලැබීම.
- පුනරාවර්තන වියදම් දැරීම අත්‍යාවශ්‍ය කාර්යන්ට පමණක් සීමා වීම.
- 2020 වර්ෂයේ අග භාගයේ දී ද COVID 19 ව්‍යාප්තිය හේතුවෙන් ගිණුම් පියවීමට අදාල නිලධාරීන් ස්වයං නිරෝධායනයට යොමු කිරීම හා කාර්යාල පරිශ්‍ර විවෘත නොකිරීම වැනි අභියෝග හමුවේ 2020 වර්ෂය සඳහා වූ ගිණුම් පියවීමේ කටයුතු සිදු කිරීම.

# 5.3. පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් ආවරණය කරනු ලබන ප්‍රදේශයන්.




## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාතේ සියලු අමාත්‍යාංශ හා අනෙකුත් ආයතන වලට අයත් ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු වලට අදාල ඉංජිනේරුමය කාර්යයන් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි. ගුණාත්මක හා ජනහිතකාමී ඉංජිනේරුමය ක්‍රියාවලියක් සහතික කරලනු වස් 1999 ජනවාරි මස 01 වන දින ආරම්භ කළ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ව්‍යුහයන්ගෙන් සමන්විත වේ.

1999 ජනවාරි මස 01 වන දින ආරම්භ කළ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ව්‍යුහයන්ගෙන් සමන්විත වේ.

01. ප්‍රධාන කාර්යාලය
02. අධ්‍යක්ෂ කාර්යාලය
03. තත්ව පාලන ඒකකය
04. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- අනුරාධපුර
05. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- මැදවච්චිය
06. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- මහඉලුප්පල්ලම
07. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- කැකිරාව
08. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- මින්නේරිය
09. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- පොළොන්නරුව

## ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

| අනු අංකය | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
|---|---|---|
| 01 | අනුරාධපුර | නැගෙනහිර නුවර ගම් පළාත |
| | | මධ්‍යම නුවර ගම් පළාත |
| | | තලාව |
| | | විලච්චිය |
| | | නොච්චියාගම |
| 02 | මැදවච්චිය | පදවිය |
| | | කැබිතිගොල්ලෑව |
| | | මැදවච්චිය |
| | | රඹෑව |
| | | හොරොව්පතාන |
| | | කහටගස්දිගිලිය |
| | | මිහින්තලේ |
| 03 | කැකිරාව | කැකිරාව |
| | | තිරප්පනේ |
| | | ගලෙන්බිඳුණුවැව |
| | | පළුගස්වැව |
| 04 | මහඉළුප්පල්ලම | රාජාංගනය |
| | | තඹුත්තේගම |
| | | ඉපලෝගම |
| | | ගල්නෑව |
| | | පලාගල |
| 05 | මින්නේරිය | මැදිරිගිරිය |
| | | හිඟුරක්ගොඩ |
| | | ඇළහැර |
| 06 | පොළොන්නරුව | තමන්කඩුව |
| | | ලංකාපුර |
| | | දිඹුලාගල |

### දැක්ම

"ගුණාත්මක හා ජනහිතකාමී ඉංජිනේරු ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්"

### මෙහෙවර

"ඉංජිනේරු කටයුතු, ප්‍රජා සහභාගීත්වය, ඉංජිනේරු කටයුතුවලදී නවීන තාක්ෂණය භාවිතය, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම "

### දිගුකාලීන අරමුණු

01. කාලීන තිරසාර පැවැත්මක් ඇති ඉදි කිරීම් පද්ධතියක් ඇති කිරීම උදෙසා තාක්ෂණ කාර්ය මණ්ඩල ශක්තිමත් කිරීම

02. දීර්ඝ කාලීන ප්‍රශස්ත ප්‍රමිතියක් ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණ පරිගණක ශක්‍යතාව ලබා ගැනීම හා ක්‍රමයෙන් දියුණු කිරීම.

### කෙටිකාලීන අරමුණු

ඉදිකිරීම් ඇස්තමේන්තු ප්‍රසම්පාදන සැලසුමට අනුව ඉදිරිපත් කිරීම, විධිමත් තත්ත්ව පාලන ක්‍රියාවලියක් පවත්වා ගැනීම හා කාලීන අවශ්‍යතාවය වෙනුවෙන් පුහුණුවීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යයන්

1. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මූලික ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම.
2. නව ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
3. නව ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල ව්‍යුහගත සැලසුම්, විදුලි සැලසුම් හා ගොඩනැගිලි සේවා සැලසුම් සකස් කිරීම.
4. අලුත්වැඩියා, නවීකරණ හා නව ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල ඇස්තමේන්තු සකස් කිරීම.
5. ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම.
6. ඉදිකිරීම් අධීක්ෂනය හා කොන්ත්‍රාත් කළමනාකරණය.
7. ඉදිකිරීම්වල තත්ත්ව පාලනය හා තත්වය සහතික කිරීම.
8. ඉංජිනේරුමය උපදේශාත්මක සේවාවන් ලබාදීම.

9. උතුරු මැද පළාතේ ගොඩනැගිලි වාරිමාර්ග හා තත්ත්ව පාලන කටයුතුවලට අදාල මිල ගණන් සකස් කිරීම.
10. ඉංජිනේරු, තාක්ෂණ ශිල්පි, ප්‍රමාණ සමීක්ෂණ, සැලසුම් ශිල්පි හා වැඩ පරිපාලක, ක්ෂේත්‍රවල ආධුනිකයන් සඳහා පුහුණුව ලබාදීම.

**නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දෙපාර්තමේන්තු ව්‍යුහයේ එක් එක් අංශ වෙත ඉහත ඉංජිනේරුමය ක්‍රියාවලියට අයත් කටයුතු විමධ්‍යගතකර ඇත.**

## 1. පළාත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කාර්යාලය

### සැලසුම් අංශය

උතුරු මැද පළාත්, පළාත තුළ ඉදිවන භෞතික ඉදිකිරිම් ගුණාත්මක හා ජනහිතකාමි ලෙස නවීන තාක්ෂණය භාවිතයෙන් ප්‍රශස්ත ලෙස සැලසුම් කිරිම හා ඉදිකිරිම් අධීක්ෂණය කිරිම පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශයේ මූලික අරමුණු වේ.

පළාත් සභාව තුල පිහිටා ඇති සියලුම දෙපාර්තමේන්තුවල ඉදිකිරිම් අවශ්‍යතාවය පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධානී, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත ලැබීමෙන් පසු අපගේ කාර්යභාරය ආරම්භ වේ. සේවාදායකයාගේ අවශ්‍යතාවය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින්, අධ්‍යක්ෂ (සැලසුම්) වෙත ලබාදීමෙන් පසු අදාල වාස්තු විද්‍යාඥයා වෙත යොමු කෙරේ.

මිනින්දෝරු සැලැස්ම සහ ඉල්ලීම් ලැයිස්තුව ලබාගැනීමෙන් අනතුරුව, වාස්තු විද්‍යාඥ ඉන් අනතුරුව සේවා දායකයාගේ ඉල්ලීම් ලැයිස්තුව අධ්‍යයනය කොට වාස්තු විද්‍යාත්මක අවකාශ ලැයිස්තුවක් නිර්මාණය කරන අතර, එය සැලසුම්කරණයේ මූලික අඩිතාලම වේ. පසුව අනුමත කරන ලද අවකාශ ලැයිස්තුව උපයෝගී කරගෙන යෝජිත බිමෙහි නිර්මිත පරිසරයක් බිහිකිරිම වාස්තු විද්‍යාඥයා මගින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ එකක් හෝ කීහිපයක් මගින් සිදු කරයි. සංකල්පමය රූප තාත්වීකරණය කරමින් වාස්තු විද්‍යාඥයා විසින් සිදුකරනු ලබන මූලික සැලසුම් ඉනික්බිති සේවාදායකයාගේ අනුමැතිය සඳහා යොමුකරන අතර වාර කිහිපයක් කරන ලද සංශෝධන මගින් සේවාදායකයා තෘප්තිමත් වනතුරු සැලසුම් සංවර්ධනය කර අවසානයේ දී අනුමත වූ සැලසුම සබැඳි අනෙකුත් අංශ වන ව්‍යුහගත සැලසුම්/ විදුලි සැලසුම් හා ගොඩනැගිලි සේවා සැලසුම් වෙත යොමු කෙරේ.

වාස්තු විද්‍යාත්මක සැලසුම් නිමකිරීමෙන් අනතුරුව ගොඩනැගිල්ලක ව්‍යුහගත සැලසුම් සිදුකිරීම ආරම්භ වේ. මෙහිදී, ගොඩනැගිල්ලේ එක් එක් කොටසේ භාවිතය හා වාස්තු විද්‍යාත්මක අවකාශ පිළිබද විශේෂ අවධානය යොමු කරමින් මූලික ව්‍යුහගත සැලසුම් සකස් කරදීම ප්‍රථමයෙන්ම සිදු කෙරේ.

මීට සමගාමීව ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිත භූමිය පරීක්ෂා කර බලා, ගොඩනැගිල්ලේ විශාලත්වය හා මහල් ගණන අනුව සුදුසු පාංශු පරීක්ෂාවක් සිදු කරගනු ලැබේ. මෙමගින් අදාල ගොඩනැගිල්ලට වඩාත්ම සුදුසු අත්තිවාරම් වර්ගයක් භූමියට ගැලපෙන අයුරින් යොදා ගැනීමේ අවකාශ සැලසේ. අනතුරුව, ගොඩනැගිල්ල මත යෙදෙන සියලුම බලයන් සැලකිල්ලට ගනිමින්, එහි ව්‍යුහයේ ක්‍රියාකාරිත්වය පරිගණක මෘදුකාංගයක් මගින් අධ්‍යයනය කරනු ලබන අතර, පසුව එක් එක් ව්‍යුහගත අංගයන් ගණනය කිරීම මගින් සැලසුම් කර නිමකරනු ලැබේ. මෙම ක්‍රියාවලිය ජාත්‍යන්තර සැලසුම් නිර්ණායන් වලට අනුකූලව ඉතාමත් ආරක්ෂිත, ස්ථායි හා ප්‍රශස්ත ලෙස සිදුකිරීම ව්‍යුහගත සැලසුම් අංශය මගින් සිදු කරයි.

වාස්තු විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරන ලද සැලසුම්වලට අනුකූලව දළ විදුලි සැලසුම් සකස් කිරීම විදුලි ඉංජිනේරු විසින් ඉටුකරනු ලබයි. දළ විදුලි සැලසුම් හා ගොඩනැගිලි සේවා ඉංජිනේරු වෙතින් ලබාගන්නා ලද වායු සමීකරණ අවශ්‍යතාවය සලකා බලා ගණනය කිරීම් සිදුකොට ගොඩනැගිල්ලේ අවශ්‍යතාවයන් ප්‍රශස්ත ලෙස ඉටුකර ගැනීමට අදාල විදුලි පරිපථ සැලසුම් ඇඳීම විදුලි ඉංජිනේරුගේ කාර්යභාර්යන් අතර මුල් තැන ගනී. මෙහි දී විදුලි අනතුරු සිදු නොවන ලෙස හා සේවාදායකයා තෘප්තිමත් වන ලෙස සැලසුම් ඉදිරිපත් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයකි. ඉදිකිරීම් කටයුතු අතරතුර නිරික්ෂණ කටයුතු සිදුකිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරනු ලැබේ. පරිපථ ඇඳීම සිදුකිරීමෙන් අනතුරුව පරිපථ සක්‍රීය කර නිවැරදි ලෙස හා අදාල සම්මතයන්ට අනුකූලව රැහැන් ඇදීමේ කර්තව්‍යය ඉටුකොට ඇතිදැයි පරික්ෂා කිරීම සිදුකරනු ලැබේ.

**ඉදිකිරීම් අංශය**

ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම, කොන්ත්‍රාත් පරිපාලනය වාර්ෂික මිල ලේඛනය සකස් කිරීම ඉදිකිරීම් අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

සැලසුම් අංශය මඟින් සකස් කරනු ලබන වාස්තු විද්‍යාත්මක අනුමත ව්‍යුහගත සැලසුම්වලට අනුකූලව, එම සැලසුම් අවසාන නිමවුමක් බවට පත්කිරීමට අවශ්‍ය සියලු අයිතමයන් හඳුනාගෙන එක් එක් අයිතමයන් සඳහා ප්‍රමාණ ගණනය කරනු ලැබේ. එම සියලු අයිතමයන් ඇතුලත්කර ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. ව්‍යාපෘති ඇස්තමේන්තු මිල ගණන් අනුව නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් ප්‍රසම්පාදන ලේඛන සකස් කරනු ලැබේ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම මඟින් සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සිදුකරනු ලබයි. ඉදිකිරීම් ව්‍යාපෘතියකට අදාලව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතවීමෙන් අනතුරුව ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු ඉටුකර ගැනීමට අදාල කොන්ත්‍රාත් පරිපාලනය අධීක්ෂනය කිරීම ප්‍රගතිය යාවත්කාලීන කිරීම හා අවශ්‍ය ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම ඉදිකිරීම් අංශය මඟින් ඉටුකරනු ලබයි.

උතුරු මැද පළාත තුල සියලු ඉදිකිරීම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කරනු ලබන වාර්ෂික මිල ලේඛනය සකස් කිරීම ඉදිකිරීම් අංශයේ ප්‍රධාන කාර්යයකි. අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික් මිල කමිටු වාර්තා පදනම් කරගනිමින් මූලික ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා වන මිල ගණන් තීරණය කරනු ලබයි. ඉදිකිරීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා පළාත තුල පිහිටි වෙළෙඳ හා නිෂ්පාදන ආයතන මෙන්ම දිවයිනේ අනෙකුත් නිෂ්පාදන ආයතන මෙහිදී මිල ගණන් කැඳවා සුදුසු මිල ගණන් තිරණය කරනු ලැබේ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු, සිවිල් ඉංජිනේරුවරුන්, විදුලි ඉංජිනේරුවරුන්, ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥවරුන්, ප්‍රමාණ සමික්ෂණවරුන්, තාක්ෂණ නිළධාරින්, සැලසුම් ශිල්පීන්ගේ සමන්විත කමිටුවක් මඟින් ඉහත මිල ගණන් සකස් කිරීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබයි.

## 2.ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය ප්‍රාදේශීය මට්ටමේදී ඉටුකරනු ලබන්නේ ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ මූලිකත්වයෙන් යුතු ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගිනි. ඇස්තමේන්තු සකස් කිරීම, ඉදිකිරීම් අධීක්ෂනය හා කොන්ත්‍රාත් පරිපාලනය ඉංජිනේරු නියෝජිත ලෙස ඉටුකරනු ලබන්නේ ප්‍රාදේශීය කාර්යාල මගිනි.

## 3.තත්ත්ව පාලන අංශය

උතුරු මැද පළාත තුල සිදුකරන ඉංජිනේරුමය කාර්යයන් වල ගුනාත්මකභාවය තහවුරු කිරීමේ අරමුණින් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කැකිරාව ඉදිකිරීම් ද්‍රව්‍ය පරික්ෂණාගාරය පිහිටුවා ඇත. මෙමගින් ඉදිකිරීම් කර්මාන්තයේදී භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයන්හි (පස්, වැලි, ගල්, සිමෙන්ති, යකඩ, ඇලුමිනියම්......) තත්වය පරික්ෂා කරන අතර, ඉදිකිරීම් කරගෙන යාමේදී හා ඉදිකිරීමෙන් පසු ඒවායේ තත්වය පරික්ෂා කිරීමද, මෙම ඒකකය විසින් සිදුකරනු ලබයි. වර්තමානය වන විට විවිධ ප්‍රමිතීන්ට අනුකූලව පහත සඳහන් පරික්ෂණ අප ආයතනයට සිදුකිරීමේ හැකියාව පවතී.

## 4.යාන්ත්‍රික ඉංජිනේරු අංශය

උතුරු මැද පළාත් සභාව යාන්ත්‍රික ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ සේවය මේ වන විට සක්‍රියව ලබා ගනු ලබයි.මින් එක් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුබද්ධිතවත්, අනෙක් යාන්ත්‍රික ඉංජිනේරුවරයා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අනුබද්ධිතවත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි.

මෙම යාන්ත්‍රික ඉංජිනේරු කටයුතු යටතේ විශාල කාර්යභාර්යන් ප්‍රමාණයක් වාර්ෂිකව ඉටු කරනු ලබන බව පෙන්වා දෙන අතර, උතුරු මැද පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් මනාව අධික්ෂණය කිරිමටත්, එම කාර්යයන් ගුණාත්මකභාවයෙන් යුක්තව සිදු කර ගැනීමටත් මෙම ඉංජිනේරුමය අධික්ෂණය මනා පිටිවහලක් වේ. මෙම යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් විශාල පරාසයක් තුල පැතිරී පවතී.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 191ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 146 කි. පුරප්පාඩු සංඛ්‍යාව 45 ක් ද තාවකාලිකව 04 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනමින් 16 දෙනෙකු සේවයේ යෙදේ.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 09*

**සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරි ගැන්වීම.**




**9.4. 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම, කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගි කර ගැනීම.**

**9.5. විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කිරීම.**

### පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සපයන සේවාවන්.

01. වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
02. ව්‍යුහගත සැලසුම් සකස් කිරීම.
03. ඇස්තමේන්තු සකස් කිරීම.
04. ප්‍රසම්පාදන කටයුතු.
05. කොන්ත්‍රාත් කළමනාකරණය.
06. තත්ත්ව සහතික ලබා දීම.
07. තාක්ෂණික නිලධාරීන් හා කොන්ත්‍රාත්කරුවන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

### පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ සේවාදායක ආයතන

01. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
02. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
03. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

04. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
05. පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව
06. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
07. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
08. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
09. ප්‍රධාන ලේකම් කාර්යාලය
10. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
11. මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය
12. මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු
13. මණ්ඩල සහ සංස්ථා

## පළාතේ සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් වන ඉදි කිරීම්වල ගුණාත්වය ආරක්ෂා කිරිම සඳහා තත්ත්ව පාලන ඒකකයේ දායකත්වය

තත්ත්ව පාලන ඒකකය මගින් පාංශු පරීක්ෂා, කොන්ක්‍රීට් පරීක්ෂා, සමස්ත (Aggregate) පරීක්ෂා, ඇළුමිණියම් පරීක්ෂාවන් හා අනෙකුත් පරීක්ෂණ සිදු කරනු ලබයි. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යංශය, පෞද්ගලික ආයතන හා උතුරු හා මධ්‍යම පළාතට අයත් ආයතන තත්ත්ව පාලන සේවා ලබා ගන්නා ආයතන අතර වේ. උතුරු මැද පළාත තුල සිදුකරන ඉංජිනේරුමය කාර්යයන් වල ගුණාත්මකභාවය තහවුරු කිරීමේ අරමුණින් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කැකිරාව ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරය පිහිටුවා ඇත. මෙමගින් ඉදිකිරීම් කර්මාන්තයේදී භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයන්හි (පස්, වැලි, ගල්, සිමෙන්ති, යකඩ, ඇලුමිනියම්......) තත්වය පරීක්ෂා කරන අතර, ඉදිකිරීම් කරගෙන යාමේදී හා ඉදිකිරීමෙන් පසු ඒවායේ තත්වය පරීක්ෂා කිරීමද, මෙම ඒකකය විසින් සිදුකරනු ලබයි. වර්තමානය වන විට විවිධ ප්‍රමිතීන්ට අනුකූලව පහත සඳහන් පරීක්ෂණ අප ආයතනයට සිදුකිරීමේ හැකියාව පවතී.

සිදු කරනු ලබන විවිධ පරීක්ෂණ වර්ග වන්නේ Partical size distribution (Earth) , Partical size distribution (Metal, Sand, ABC),Field density test ,Consistency limits (LL,PL) ,Standard proctor compaction test ,Modified proctor compaction test ,California Bearing Ratio test, Compressive strength of interlock blocks ,Concrete cube test (Casted by laboratory staff), Concrete cube test (Casted by Consultant or Contractor),Compressive strength of cement blocks-without cappin ,Rebound hammer test(NDT)(for 0.09m2 area) ,Measurement of pipes & steel bars (per sample) ,Aggregate impact value ,Aggregate crushing value,Los Angeles Abrasion value ,Flakiness index (Including sieve analysis test) ,Elongation index (Including sieve analysis test) ,Compressive strength of bricks , Dimension & water absorption of bricks, Detailed Sectional Thickness of Zink Aluminum Sheet යනාදියයි.

කැකිරාව ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරය සැමවිටම සේවාලාභීන්ට පහසු, කාර්යක්ෂම, විශ්වාසනීය හා නිවැරදි වූ සේවාවක් ලබාදීමට ඇප කැප වූ ආයතනයකි. අප ආයතනයට පැමිණෙන සේවාලාභීන්ගේ ගෙවීම් කටයුතු පහසුව සඳහා ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවීම් සිදුකර අදාළ ලදුපත අප ආයතනය වෙත Viber ,Whatsapp හෝ E-mail මගින් යොමුකර ආයතනයට නොපැමිණ ගෙවීම් කිරීමේ පහසුව සලසා ඇත. එබැවින් ඉදිකිරීම් පරීක්ෂණාගාරය පළාත තුළ මෙන්ම පළාතින් පිටත ආයතන ද ආකර්ෂණය කරගැනීමේ හැකියාව ලැබී ඇත.

2020 වර්ෂයේදී පළාත් තත්ත්ව පාලන ඒකකය මගින් විවිධාකාර පරීක්ෂාවන් පහළොස්දහස් හාරසිය අනු තුනක් (15,493) ක් සිදුකර ඇති අතර ඒ තුළින් රු.මි 16.5ක ශුද්ධ ආදායමක් උපයන ලදී.

## තත්ත්ව පාලන ඒකකය මගින් සිදු කරන ලද කාර්යභාරය

| පරීක්ෂා වර්ගය | ප්‍රාදේශීය සභා | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සංවිධාන | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | පෞද්ගලික ආයතන | මහවැලි සංවර්ධන අධිකාරිය | වැවගම සමුදාව ව්‍යාපෘතිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| අමුද්‍රව්‍ය පරීක්ෂාව (Meterial Testing) | 193 | 28 | 135 | 189 | 03 | - | 548 |
| ක්ෂේත්‍ර පරීක්ෂාව (Field Testing) | 2249 | 32 | 1750 | 98 | 47 | - | 4176 |
| කොන්ක්‍රිට් පරීක්ෂාව (Concrete Testing) | 1049 | 260 | 1946 | 1525 | 18 | 18 | 4816 |
| අන්තර් සම්බන්ධිත කුට්ටිගල් (Inter Lock) | 2042 | 12 | 3246 | 26 | 09 | - | 5515 |
| සිමෙන්ති ගල් (Cement Block) | 131 | - | 108 | 03 | - | - | 242 |
| Mix Design | - | - | - | 36 | - | - | 36 |
| පරික්ෂාව (Protector) | 49 | 04 | 49 | 39 | 02 | - | 143 |
| ගඩොල් (Bricks) | - | - | - | 17 | - | - | 17 |
| **මුළු එකතුව** | **5713** | **336** | **7414** | **1933** | **79** | **18** | **15493** |




## උතුරු මැද පළාත් ඒකක මිල ගණන් සකස් කිරීම
## SCHEDULE OF RATES FOR BUILDING,IRRIGATION & MARERIAL TESTING IN NORTH CENTRAL PROVINCE 2020

සෑම වසරකටම අදාල උතුරු මැද පළාත තුළ භාවිත කිරීම සඳහා ඒකක මිල ගණන් සකස් කිරීම පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. එය සකස් කිරීමේදී මූලිකවම අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් මිල කමිටු රැස්වීමේදී අනුමත කරන ලද භාණ්ඩවල මිල උපයෝගී කර ගනී. ඊට අමතරව අවශ්‍ය කරන ඉදි කිරීම් ද්‍රව්‍යවල මිල ගණන් උතුරු මැද පළාතෙන් මිල ගණන් කැඳවා යොදා ගනු ලබයි.

මෙම මිල පොත උපයෝගී කරගෙන සෑම වසරකම පළාත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සියල්ලට අදාල නව ඉදිකිරීම්, නවීකරණ, අළුත්වැඩියාවන්ට අදාල ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. එසේම මෙම ඒකක මිල ගණන් මධ්‍යම රජයට අයත් ආයතනවල ඉදි කිරීම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහාද භාවිතා කරනු ලබයි. මෙය සකස් කිරීමේදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), විධායක ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයින්, කාර්මික නිලධාරීන්, සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කමිටුවක් දායකත්වය ලබා දෙන ලදී.

## අමාත්‍යාංශ 05ට අදාල ඉදි කිරීම්වල ප්‍රගතිය - 2020

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.මි) | ගිවිසුම්ගත මුදල (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 12 | 12 | 153.26 | 81.35 | 6.6 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 12 | 12 | 37.7 | 3.9 | 2.2 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 268 | 213 | 934.9 | 127.7 | 67.15 |
| සමුපකාර අමාත්‍යාංශය | 56 | 49 | 70.6 | 4.8 | 4.8 |
| වාරිමාර්ග අමාත්‍යාංශය | 12 | 11 | 14.1 | 5.05 | 4.71 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 18 | 18 | 13.7 | 4.4 | 3.1 |
| ආණ්ඩුකාර කාර්යාලය | 7 | 7 | 20.5 | 3.7 | 3.7 |
| මධ්‍යම රජය | 43 | 43 | 283.7 | 153.29 | 6.00 |
| **එකතුව** | **428** | **365** | **1528.46** | **384.19** | **98.26** |

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ක්‍රියාකාරිත්වය

උතුරු මැද පළාත් සභාව යාන්ත්‍රික ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ සේවය මේ වන විට සක්‍රියව ලබා ගනු ලබයි. මින් එක් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුබද්ධිතවත් අනෙක් යාන්ත්‍රික ඉංජිනේරුවරයා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අනුබද්ධිතවත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි.

මෙම යාන්ත්‍රික ඉංජිනේරු කටයුතු යටතේ විශාල කාර්යභාර්යන් ප්‍රමාණයක් වාර්ෂිකව ඉටු කරනු ලබන බව පෙන්වා දෙන අතර උතුරු මැද පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් මනාව අධික්ෂණය කිරිමටත්, එම කාර්යයන් ගුණාත්මකභාවයෙන් යුක්තව සිදු කර ගැනීමටත් මෙම ඉංජිනේරුමය අධික්ෂණය මනා පිටුවහලකි. මෙම යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් විශාල පරාසයක් තුල පැතිරී පවතින අතර, එම කාර්යයන් සංක්ෂිප්තයක් ලෙස පහත පරිදි ඉදිරිපත් කල හැක.

**යාන්ත්‍රික ඉංජිනේරු රාජකාරී පරාසය**

1. පළාත් සභාව සතු සියලුම වාහන වල සිදු කරනු ලබන අලුත්වැඩියාවන්, සේවා සිදුකිරීම්, ටයර් හා බැටරි අලුතින් යෙදීම සඳහා තාක්ෂණික නිර්දේශයන් ලබාදීම.
2. ඉහත සඳහන් කරන ලද නිර්දේශයන්ට අනුව එම කාර්යයන් නිසි ලෙස සිදුවනවා ද යන්න පිළිබඳව නිසි අධික්ෂණය කිරිමත්, මිල ගණන් කැඳවීමෙන් අනතුරුව එම මිල ගණන් පිළිබද නිර්දේශ ලබාදීම හා නිර්දේශිත කාර්යයන් අවසන් වූ පසු පරික්ෂා කර වාර්තා සැපයීම සිදු කිරීම.

3. යාන්ත්‍රික ඉංජිනේරු විෂය පථයට අයත් මිලදී ගැනීම්, වැඩි දියුණුකිරීම් හා නව ඉදිකිරීම් වලට අදාලව පිරිවිතර ලබාදීම, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබාදීම හා සාම්පල් පරීක්ෂාව සිදුකිරිම.
4. වාහන වල සිදුවන අනතුරු සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණ සිදුකිරීම, ඇස්තමේන්තු සකස් කිරීම හා අනතුරු පරීක්ෂණ වාර්තා ලබාදීම.
5. වායු සමීකරණ යන්ත්‍ර, ජෙනරේටර් යන්ත්‍ර, වතුර පොම්ප, ශිතකරණ සහ අනෙකුත් යාන්ත්‍රික උපකරණ සේවාවන් සිදුකිරීම සහ නඩත්තු කටයුතු වෙනුවෙන් නිර්දේශ ලබාදීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
6. උපදේශන සේවාවන් ද අවශ්‍යතාව මත සිදුකිරීම.

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ප්‍රධාන කාර්යයන්

| අ.අ | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් | දර්ශක |
|---|---|---|---|
| 01 | පළාත් සභාවේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ කාර්යාලවලට අදාල වාහන හා යන්ත්‍ර උපකරණවල සිදු කරනු ලබන අළුත්වැඩියාවන්, සේවාවන් අධීක්ෂණය කිරිම හා නිර්දේශ ලබා දීම | ප්‍රධාන අළුත්වැඩියාවන්, සුළු අළුත්වැඩියාවන්, සේවාවන් (මුල් පරීක්ෂාව, විසන්ධි කළ පසු පරීක්ෂාව, අමතර කොටස් පරීක්ෂාව, පසු පරීක්ෂාව, මිල ගණන්පත් ඇගයීම හා වෙනත්) | වාර්තා ගණන |
| 02 | මිලදී ගැනීම්වලට අදාල පිරිවිතර සකස් කිරීම, තාක්ෂණ කමිටු වාර්තා සැකසීම | පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් වාර්තා සකස් කිරීම, පසු වාර්තා සකස් කිරීම | වාර්තා ගණන |
| 03 | වාහන හා යන්ත්‍ර උපකරණ අපහරණ කටයුතුවලට අදාල වාර්තා සැකසීම | පරීක්ෂාවන්, වෙළෙඳපොළ මිල සැසඳීම, තක්සේරු කිරිම | වාර්තා ගණන |
| 04 | අනතුරු විශ්ලේශණය, ඇස්තමේන්තු වාර්තා සැකසීම | පරීක්ෂාවන්, ඇස්තමේන්තු වාර්තා සකස් කිරීම | වාර්තා ගණන |
| 05 | ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම ඉලෙක්ට්‍රොනික උපකරණ සේවා අළුත්වැඩියා සඳහා නිර්දේශ ලබා දීම | අධීක්ෂණය, මිල සැසඳීම, නිර්දේශ ලබා දීම | වාර්තා ගණන |
| 06 | පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ නඩත්තු ඒකකයට අදාල උපකාරක සේවා ඒකකය සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම | ක්ෂේත්‍ර පරීක්ෂාව, ගැටළු සාකච්ඡා කිරීම, අවශ්‍ය උපදේශන ලබා දීම, වාර්තා සැකසීම | වාර්තා ගණන, වාචික උපදේශනය |
| 07 | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් සිදු කිරීම | නඩත්තු, අළුත්වැඩියා, මිලදී ගැනීම්, වෙනත් | වාර්තා ගණන, වාචික උපදේශනය, බහු මාධ්‍ය ඉදිරිපත් කිරිම් ගණන |
| 08 | අනෙකුත් යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සකස් කිරීම | තත්ත්ව වාර්තා, තාක්ෂණික වාර්තා, භාණ්ඩ අපහරණය, භාණ්ඩ සමීක්ෂණ, අනෙකුත් | වාර්තා ගණන |
| 09 | ගොඩනැගිලි සේවා ඉංජිනේරු සැලසුම් සැකසීම සහ අවශ්‍ය උපදේශන සේවාවන් සැපයීම | වායු සමීකරණ සැලසුම, උපකාරක සේවා සැලසුම, විදුලි සැලසුම | සැලසුම් වාර්තා, පරීක්ෂණ වාර්තා, පැවරීමේ පසු වාර්තා ගණන |
| 10 | ප්‍රසම්පාදන කමිටු රැස්වීම, සම්මුඛ පරීක්ෂණ, වෙනත් කමිටු/ රැස්වීම | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන්වලට අදාලව උපදෙස් ලබා දීම | රැස්වීම් ගණන |

## යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සැකසීම හා සේවාවන් ලබා දීම

2020 වර්ෂය තුළ මෙම අංශය මගින් නිකුත් කරන ලද මුළු වාර්තා සංඛ්‍යාව 421කි.

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ සේවය ලබා ගන්නා සේවාලාභීන් /ආයතන

යාන්ත්‍රික ඉංජිනේරු අංශය මගින් උතුරු මැද පළාත් සභාවේ සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල යාන්ත්‍රික ඉංජිනේරුමය අවශ්‍යතාවයන් ඉටු කිරීම සිදු විය.

| මාසය | නිකුත් කරන ලද වාර්තා සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 20 |
| පෙබරවාරි | 15 |
| මාර්තු | 13 |
| අප්‍රේල් | 01 |
| මැයි | 31 |
| ජූනි | 44 |
| ජූලි | 46 |
| අගෝස්තු | 47 |
| සැප්තැම්බර් | 50 |
| ඔක්තෝබර් | 53 |
| නොවැම්බර් | 44 |
| දෙසැම්බර් | 57 |
| **එකතුව** | **421** |




ඒ යටතේ ප්‍රධාන අළුත්වැඩියාවන්, සුළු අළුත්වැඩියාවන්, සේවාවන් (මුල් පරීක්ෂාව, විසන්ධි කළ පසු පරීක්ෂාව, අමතර කොටස් පරීක්ෂාව, පසු පරීක්ෂාව, මිල ගණන්පත් ඇගයීම හා වෙනත්) පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් වාර්තා සකස් කිරීම, පසු වාර්තා සකස් කිරීම, පරීක්ෂාවන්, වෙළෙඳපොළ මිල සැසඳීම, තක්සේරු කිරීම, ඇස්තමේන්තු වාර්තා සකස් කිරීම, අධීක්ෂණය, මිල සැසඳීම, නිර්දේශ ලබා දීම ක්ෂේත්‍ර පරීක්ෂාව, ගැටළු සාකච්ඡා කිරීම, අවශ්‍ය උපදේශන ලබා දීම, වාර්තා සැකසීම, නඩත්තු, අළුත්වැඩියා, මිලදී ගැනීම්, වෙනත් තත්ත්ව වාර්තා, තාක්ෂණික වාර්තා, භාණ්ඩ අපහරණය, භාණ්ඩ සමීක්ෂණ, අනෙකුත් වායු සමීකරණ සැලසුම, උපකාරක සේවා සැලසුම, විදුලි සැලසුම හා යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන්වලට අදාලව උපදෙස් ලබා දීම වැනි සේවාවන් සපයන ලදී.

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් | වාර්ෂික නිමවුම |
|---|---|---|---|
| 01 | දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ කාර්යාලවලට අදාල වාහන හා යන්ත්‍ර උපකරණවල සිදු කරනු ලබන අළුත්වැඩියාවන්, සේවාවන් අධීක්ෂණය කිරීම සහ නිර්දේශ ලබා දීම. | ප්‍රධාන අළුත්වැඩියාවන්, | 53 |
| | | සුළු අළුත්වැඩියාවන් | 177 |
| | | සේවාවන් | 16 |

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් | වාර්ෂික නිමවුම |
|---|---|---|---|
| 02 | මිල දී ගැනීම්වලට අදාල පිරිවිතර සකස් කිරීම, තාක්ෂණ කමිටු වාර්තා සැකසීම | පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් වාර්තා සැකසීම, පසු වාර්තා සැකසීම | 81 |
| 03 | වාහන හා යන්ත්‍ර උපකරණ අපහරණ කටයුතු වලට අදාල වාර්තා සැකසීම | පරීක්ෂාවන්, වෙළඳපොල මිල සැසදීම්, තක්සේරු කිරීම් | 10 |
| 04 | අනතුරු විශ්ලේෂණය, ඇස්තමේන්තු වාර්තා සැකසීම | පරීක්ෂාවන්, ඇස්තමේන්තු සැකසීම | 06 |
| 05 | ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම ඉලෙක්ට්‍රොනික උපකරණ සේවා අළුත්වැඩියා සඳහා නිර්දේශ ලබා දීම | අධීක්ෂණය, මිල සැසදීම, නිර්දේශ ලබා දීම | 23 |
| 06 | පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ නඩත්තු ඒකකයට අදාල උපකාරක සේවා ඒකකය සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම. | ක්ෂේත්‍ර පරීක්ෂාව, ගැටළු සාකච්ඡා කිරීම, අවශ්‍ය උපදේශණ ලබා දීම, වාර්තා සැකසීම | 13 |
| 07 | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන් සඳහා අවශ්‍ය උපදේශණ සේවාවන් සිදු කිරීම. | නඩත්තු, අළුත්වැඩියා, මිල දී ගැනීම්, වෙනත් | 04 |
| 08 | අනෙකුත් යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සැකසීම. | තත්ත්ව වාර්තා, තාක්ෂණික වාර්තා, භාණ්ඩ අපහරණය, භාණ්ඩ සමීක්ෂණ, අනෙකුත් | 08 |
| 09 | ගොඩනැගිලි සේවා ඉංජිනේරු සැලසුම් සැකසීම සහ අවශ්‍ය උපදේශණ සේවාවන් සැපයීම. (Design & Consulting) | වායු සමීකරණ සැලසුම් | 09 |
| | | උපකාරක සේවා සැලසුම් | 05 |
| | | විදුලි සැලසුම් | 07 |
| 10 | ප්‍රසම්පාදන කමිටු රැස්වීම්, සම්මුඛ පරීක්ෂණ, වෙනත් කමිටු /රැස්වීම් | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන්වලට අදාලව උපදෙස් ලබා දීම. | 09 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව පළාත් සභාවේ සියළු ආයතන මගින් ඉංජිනේරු සේවා සපයා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් අවශ්‍ය කරන වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු සේවා සපයා දීම සිදු කරනු ලබන අතර 2020 වර්ෂය තුළ දී ඉල්ලා සිටි සියළුම ඉල්ලීම් ඉටු කිරීමට හැකි වී ඇත. 2020 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධනය සඳහා උතුරු මැද පළාත් සභාව වෙත ලැබුණු විශේෂ ප්‍රතිපාදන වඩා කාර්යක්ෂමව හා ඵලදායිව භාවිතා කිරීම සඳහා අවශ්‍ය සැලසුම්, ඇස්තමේන්තු හා අනෙකුත් අත්‍යාවශ්‍ය සියළු තාක්ෂණික කාරණා ඉටු කිරීම කෙරෙහි කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම තුළ ඉතා සාර්ථක ප්‍රතිඵල කරා ළඟා විය හැකි විය. එපමණක් ද නොව ඉදිකිරීම් ආරම්භයේ දී, ක්‍රියාත්මක වන අතරතුර හා එකී ව්‍යාපෘති සාර්ථකව නිමකර ජනතා අයිතියට පත් කරන තුරු නිරන්තර ක්ෂේත්‍ර මට්ටමේ අධීක්ෂණ කටයුතු කරමින් හා වැඩ බිම් රැස්වීම් පවත්වමින් ව්‍යාපෘතිය හා සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන්ද මනාව සම්බන්ධීකරණය කරමින් ක්‍රියාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක සහගත ක්‍රියාවලියක් ඉටු කිරීමට 2020 වර්ෂයේදී හැකි විය.

# 5.4. පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් යටතේ අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආයතන 898 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආයතන 375ක් වශයෙන් මුළු පළාත් සභා ආයතන 1273ක විගණන කටයුතු සිදු කරනු ලබයි.

## දැක්ම

"ඉහළම කාර්ය සාධනයකින් හා වගවීමකින් යුත් පළාත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතු කරන විශිෂ්ටතම අභ්‍යන්තර විගණන කොටස්කරු බවට පත් වීම."

## මෙහෙවර

"පළාත් සේවයේ සංවිධානවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම හා අවධානම අවම කිරීම මගින් අපේක්ෂිත කාර්ය සාධනය සාක්ෂාත් කරගැනීම සඳහා පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව ලෙස සහය සහ මාර්ගෝපදේශය සැපයීම."

## අරමුණු

- සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා උපකාර විම.
- පළාත් රාජ්‍ය සේවයේ ඵලදායිත්වය ඉහල නැංවීම සඳහා අභ්‍යන්තර විගණනයෙහි දායකත්වය ලබා දීම.
- විගණන කළමනාකරණ කමිටු මගින් ඉහල කළමනාකාරිත්වයෙහි අරමුණු ඉටුකරලීම සඳහා අවශ්‍ය සහය ලබා දීම.
- සංවර්ධන ව්‍යාපෘතීන්හි කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- විශේෂ විමර්ශන කටයුතු තුළින් පළාත් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්වයන් හා සිදුවීම් වළක්වා ගැනීමට නිර්දේශයන් හා නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම උදෙසා එම ආයතනවල පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම වේදය පරීක්ෂාකර එහි පවතින දුර්වලතාවයන් මගහරවාලීමට අවශ්‍ය උපදේශන හා මාර්ගෝපදේශන සේවා ලබා දීම.
- පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම නියෝජනය කිරීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.
- පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.
- පලාත් රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීම්වලට සහභාගිවීම හා අවශ්‍ය සහය ලබා දීම.
- පළාත් අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.
- පළාත් රාජ්‍ය ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සොයා බැලීම හා කළමනාකරණය වෙත අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම.
- විශේෂ විමර්ශන හා පරීක්ෂා කටයුතු සිදු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සභාවට අයත් සියලු ආයතන වලට ගොස් (වාර්ෂික සැලැස්මට අනුව) ස්ථානීය පරික්ෂාවන් කිරිම.
- ක්ෂේත්‍රයට ගොස් විමසුම් කිරිම.
- පුද්ගලයින් හා එක්වී ක්‍රියා කිරිම, සාකච්ඡා කිරිම, ප්‍රකාශ ලබා ගැනිම.
- ලැබෙන නියෝජන/ නියෝග අනුව ක්‍රියා කිරිම.
- සමූහ ක්‍රියාකාරකම්වලට සහභාගි වීම ( විදුහල්පති රැස්වීම්වලට සහ සහභාගි වීම සහ පළාත් ගිණුම්කාරක සභාවට සහභාගි වීම).
- විගණන වාර්තා නිකුත් කිරිම.
- විනය කටයුතු සඳහා චෝදනා පත්‍ර කෙටුම්පත්කර අදාළ ආයතන වෙත ලබා දීම.
- විනය පරික්ෂණ/ නිතීමය කටයුතු වලට ඉදිරිපත් වීම.
  (අධිකරණ කටයුතු වලට සහය වීම).

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

උතුරු මැද පළාත තුළ පිහිටුවා ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/සංස්ථා සහ පළාත් සභාවට අයත් අනෙකුත් ආයතනවල කටයුතු තිරසර සංවර්ධන ඉලක්ක 17ට අනුව හා එහි අන්තර්ගත දර්ශනයන්ට අනුව ළඟා කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව අවධානය යොමු කරමින් එම අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාතේ සියළුම ආයතනවලට අවශ්‍ය සහය ලබා දීම සිදු කරනු ලබයි.




**විශේෂයෙන්ම 12-vii ඉලක්කයට ළඟා වීම සඳහා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව පූර්ණ අවධානය යොමු කරමින් එම අරමුණු කරා ළඟා වීමට පළාතේ සියළුම ආයතන මෙහෙයවීම සිදු කරයි.**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 38ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 32 කි. පුරප්පාඩු සංඛ්‍යාව 06 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

සෑම ආයතනයකම යම් නිශ්චිත කාලයකදී කරන ලද ආයතනික කටයුතු මෙන්ම ගිනුම් ක්‍රියාවලියද ඇතුළත්ව සමස්ත කළමනාකරණ කාර්යයන් පිරික්සීම මෙම දෙපාර්තමේන්තුවට නියම වී ඇත. එම අරමුණු උදෙසා විශාල කැපවීමකින් යුක්තව ක්‍රියා කිරීම තුළින් මහජන ප්‍රසාදයට ලක්ව ඇත. මහජන මුදල් වැය කිරීමේදී වංචා දූෂණ හෙලිවීම් මාධ්‍ය මගින්ද හෙලිදරව් කිරීම නිසා සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය තුළ මහජනයා විසින් විවිධ පෙත්සම් හා ලිපි එවීමද සිදුවිණි. සියළු රාජකාරිවල විනිවිදභාවය මෙන්ම නීත්‍යානුකූල හා නිවැරදිභාවය ඇති කිරීමට ක්‍රියා කිරීම හේතුවෙන් එම ප්‍රතිඵල ඉදිරිකාලයේදී ලැබෙනු ඇත. ඒ තුළින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා ඵලදායි බව වැඩි කිරීමට දායක වීමට හැකි විය.

## තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

උතුරු මැද පළාත තුළ පිහිටා ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ සංස්ථා සහ පළාත් සභාවට අයත් අනෙකුත් ආයතනවල කටයුතු තිරසර සංවර්දන ඉලක්ක 17ට අනුව හා එහි අන්තර්ගත දර්ශනයන්ට අනුව ළඟාකර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව අවධානය යොමු කරමින් එම අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාතේ සියළුම ආයතන වලට අවශ්‍ය සහය ලබා දීම සිදුකරනු ලබයි. විශේෂයෙන්ම 12-7 ඉලක්කයට ළඟා වීම සඳහා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව පූර්ණ අවධානය යොමු කරමින් එම අරමුණු කරා ළඟා වීමට පළාතේ සියළුම ආයතන මෙහෙයවීම සිදු කරනු ලබයි.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා විම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්ක 2020 |
|---|---|---|---|
| පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හී සියළුම පරිපාලන ඒකක පරීක්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම | වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා නිකුත් කිරීම | නිකුත් කළ විගණන වාර්තා සංඛ්‍යාව | 258 |
| පළාත් සභාවේ අමාත්‍යාංශ 5 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් නියෝජනය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | 18 |

## ආයතනයේ දැක්ම කරා ළගා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන්

පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අනුමත කාර්ය මණ්ඩලය 07ක් වන අතර දැනට සේවයේ යෙදී සිටින්නේ දෙදෙනෙකු පමණි. එබැවින් මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබන අතර 2021 වර්ෂයේදී එම කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. එම නිසා කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා නව නිලධාරීන් අවම වශයෙන් දෙදෙනෙකුවත් ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. එසේම මෙම දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරීන් 25 දෙනෙකු සේවයේ යෙදී සිටින අතර එම නිලධාරීන් යටතේ පළාත් සභාවේ අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකෙහි පළාත් රාජ්‍ය ආයතනයන්හී විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

## විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු - 2020

සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මගපෙන්වීම හා උපකාර විමත් පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නීත්‍යානුකූලව සිදු වේ දැයි විපරම් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරිමත් අරමුණු කොට වඩාත් ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා 2020 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම සිදුවිය. 2020 වර්ෂය තුළ වාර්ෂික විගණන සැලැස්ම අනුව විගණන හා විමර්ශන වාර්තා 247ක් නිකුත්කර ඇත. එසේම ගරු ආණ්ඩුකාරතුමාගේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත හා මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පෙත්සම් මත විශේෂිත විමර්ශන කටයුතු 11ක් සිදු කරන ලදී. මේ අතර 2020 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම තුළින් උතුරු මැද පළාතේ අමාත්‍යාංශ තුළ මූල්‍ය කළමනාකරණයේදී ඇති ගැටළු හඳුනා ගැනීම හා එම ගැටළු සාකච්ඡා කර විසඳුම් ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

## අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය 2020 - 2021

උතුරු මැද පළාතේ ආයතන තුළ වඩාත් විනිවිදභාවයකින් යුක්තව මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබා දීමත් කාර්ය මණ්ඩලවල ධාරිතාවය ඉහළ නැංවීම තුළින් ඵලදායක සේවාවක් ලබා දීමත් යන ප්‍රතිඵල අපේක්ෂාවෙන් 2021 හා 2022 වර්ෂවලදී වඩාත් ඉලක්ක සහගත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2021 | 2022 | කෙටිකාලීන | දිගු කාලීන |
| 01.සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයකින් යුක්තව සහ අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා සහාය දැක්වීම මගින් ප්‍රතිඵල ළඟාකර ගැනීම හා ප්‍රගතිය සොයා බැලීම.<br><br>02.පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නියමානුකූලව සිදුවේදැයි විපරම් කර ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කිරීම. | 01.පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.<br><br>02.පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.<br><br>03. පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම | 01.පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.<br><br>02.පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම<br><br>03. පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම | ඉහළම කාර්ය සාධනයකින් හා වගවීමකින් යුත් පළාත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතු කරන විශිෂ්ටතම අභ්‍යන්තර විගණන කොටස්කරු බවට පත් වීම. | පළාත් සේවයේ සංවිධානවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම හා අවධානම අවම කිරීම මගින් අපේක්ෂිත කාර්ය සාධනය සාක්ෂාත්කර ගැනීම සඳහා පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව ලෙස සහාය සහ මාර්ගෝපදේශ සැපයීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

"ඵලදායී මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක්, විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් " යන දැක්ම කරා ළඟා විමට ඵලදායි මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක් මගින් විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් බිහිකරනු වස් විගණන කාර්යයන් හා විමර්ශන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ විධිමත් සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව අඛණ්ඩව හා කාලානුරූපිව ශක්තිමත් කිරිම පිණිස සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිදභාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන

ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මගපෙන්වීම හා උපකාර විමත් පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නීත්‍යානුකූලව සිදු වේ දැයි විපරම් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරිමත් අරමුණුකොට වඩාත් ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා 2020 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම සිදුවිය. 2020 වර්ෂය තුළ විගණන හා විමර්ශන වාර්තා 247ක් නිකුත්කර ඇත. එක් එක් අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අධිකාරී තුළ ඇති වූ ගැටළු හඳුනා ගැනිම සහ ඒ සඳහා සාධාරණ විසඳුම් යෝජනා කර විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම තුළින් කාර්යක්ෂමතාවය හා ඵලදායී රාජ්‍ය සේවයේ නිර්මාණය කිරීම සඳහා සක්‍රිය දායකත්වයක් සැපයීමට හැකිවූ ඉලක්ක සහගතව හා සුභවාදිව ගමන් කිරිමට හැකිවූ වර්ෂයක් ලෙස 2020 වර්ෂය විග්‍රහ කළ හැක.

සෑම ආයතනයකම යම් නිශ්චිත කාලයකදි කරන ලද ආයතනික කටයුතු මෙන්ම ගිණුම් ක්‍රියාවලියද ඇතුළත්ව සමස්ත කළමනාකරණ කාර්යයන් පිරික්සීම මෙම දෙපාර්තමේන්තුවට නියම් වී ඇත. එම නිසා කුඩා කණ්ඩායමක් ලෙස විශාල කැපවීමකින් යුක්තව ක්‍රියා කිරිම තුළින් මහජන ප්‍රසාදයට ලක්ව ඇත. මහජන මුදල් වැය කිරීමේදී වංචා දූෂණ හෙළිවීම මාධ්‍ය මගින්ද හෙළිදරව් කිරීම නිසා සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය තුළ මහජනයා විසින් විවිධ පෙත්සම් හා ලිපි එවීමද සිදු විණි. සියළු රාජකාරිවල විනිවිදභාවය මෙන්ම නීත්‍යානුකූල හා නිවැරදිභාවය ඇති කිරීමට ක්‍රියා කිරීම සහ මේවායේ ප්‍රතිඵල ඉදිරි කාලයේදී ලැබෙනු ඇත. ඒ තුළින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා ඵලදායි බව වැඩි කිරීමට හැකි විය.

## කාර්ය සාධනය ළගා කර ගැනීමේ දි මුහුණ දුන් අභියෝග හා ගැටළු

මෙම වර්ෂය තුළ ඇති වූ Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් වාර්ෂික සැලස්මේ ඉලක්කයන් 100%ක් සම්පූර්ණ කර ගැනීම දුෂ්කර කටයුත්තක්ව පැවති නමුත් අභ්‍යන්තර විගණන නිලධාරීන් 25 ද සමගින් මෙම වර්ෂය අවසන් කාර්තුව තුළ පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරි විධිමත් හා ක්‍රමානුකූලව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් මත සිදුවේදැයි විපරම්කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීමට හැකි විය.

එසේම මෙම නිලධාරීන් සමග 2021 වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හී සියළුම පරිපාලන ඒකක 1273 පරීක්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශනයන් සිදු කිරිමට අපේකෂා කරයි.

# 5.5. පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ පවතින ආයතනයක් වේ. පළාතේ මානව සම්පත් සංවර්ධනය සඳහා කටයුතු කරනු ලබන ප්‍රධානතම ආයතනය වේ. එමගින් පළාත් රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සිදුකරනු ලැබේ. පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය හා පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය යන ප්‍රධාන අංශ වලින් සමන්විතවේ. කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින මානව සම්පත්, මූල්‍ය සම්පත් හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරමින් වාර්ෂික පුහුණු සැලැස්ම හා බාහිර ආයතනවල ඉල්ලීම් අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

### දැක්ම

“පරිපූර්ණ මහජන සේවකයෙක්, ගුණාත්මක රාජ්‍ය සේවයක්”

### මෙහෙවර

“ජාතික ප්‍රතිපත්තියට අනුගතව පළාතේ රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා ඉහළ නැංවීම, පුහුණු අවශ්‍යතා තක්සේරුව, කාර්ය සාධන නියාමනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවිධානය කරමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් බිහි කිරීමට අඛණ්ඩව දායකවීම.”

### දිගුකාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම.

### කෙටිකාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය
- පුහුණු අවශ්‍යතා තක්සේරුව
- කාර්ය සාධන නියාමනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ජාතික වැඩපිළිවෙල අනුව මානව සම්පත් සංවර්ධනය.

### ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සභාවේ විවිධ අංශයන්හි වගකීම් දරන විධායක නිලධාරීන් මගින් පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
- සුදුසුකම්ලත් ප්‍රවීණ දේශක මණ්ඩලයකගේ සම්පත්දායකත්වය ලබා ගැනීම.
- නවීන තාක්ෂණික ක්‍රමවේදයන් ද භාවිතා කරමින් පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා හැකි උපරිම අයුරින් නවීන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 37ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 23 කි. පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් වන අතර 01 ක් අයකු අනියම් පදනමින් සේවයේ යෙදේ.

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජන (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | උක්ත කාර්ය භාරය ඉටුකිරිම සඳහා පරිපූර්ණ රාජ්‍ය සේවයක් බිහි කිරිමට රාජ්‍ය නිලධාරින්ගේ ධාරිතා සංවර්ධන | සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම | 3.70 | 3.62 |

## කාර්ය සාධක ඉලක්ක - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුලාභීන් සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 56 | 120 | 140 | 150 | 3.70 | 4.75 | 8 | 9 |
| | | | පුහුණුලාභීන් සංඛ්‍යාව 2075 | | | | | | | |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය (Outcome index) | ඉලක්කය කරා ළඟා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 01 | පරිගණක සාක්ෂරතාවය ඇති පළාත් රාජ්‍ය නිළධාරින් සංඛ්‍යාව | 93 | 4% |
| 02 | නිවැරදිව වැටුප් සකස් කල හැකි නිළධාරින් සංඛ්‍යාව | 57 | 2.5% |
| 03 | ඵලදායිතා මුලධර්ම අනුව ආයතන පද්ධතිය සකස් කළ හැකි නිළධාරින් සංඛ්‍යාව | 57 | 2.5% |

**ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය**

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන් මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| 01සේවාලාභී තෘප්තිය උපරිම කළ හැකි කුසලතා පූර්ණ ධනාත්මකචින්තනයෙන් යුත් කාර්ය මණ්ඩලයනක් බිහි කිරීම. | 1.ආයතනයේ සමස්ථ ක්‍රියාකාරීත්වය පිළිබඳ නිරන්තරයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. (අවම වශයෙන් මසකට 01 ක්)<br>2.මොඩියුල සකස් කිරීම හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.<br>3.දේශණ ශාලා සහ නේවාසිකාගාරය දෛනිකව පවත්වාගෙනයාම හා නඩත්තු කිරීම.<br>4.ජෙනරේටරය, වායුසමීකරණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව<br>5.ආගන්තුක සත්කාරය හා ආහාර පිළිගැන්වීම. | ආයතනයේ සමස්ථ කාර්ය භාරයේ සෑම පියවරක් පිළිබඳවම මනා අවබෝධයක් ඇති, කාර්යක්ෂම, කැපවූ කාර්ය මණ්ඩලයක් බිහි කිරීම |
| | 1.පුහුණුලාභීන්ගේ මානසික සුවතාවය සඳහා පොකුණු 02ක් නිර්මාණය කිරීම<br><br>2.පුහුණුලාභීන්ට විවේක සුවයෙන් ගත කිරීම සඳහා පහසුකම් ඇති කිරීම | 2 මනා පුහුණු පරිසරයක් තහවුරු කිරීම සඳහා නිර්මාණාත්මක සහ ආදර්ශමත් උද්‍යාන පරිසරයක් සකස් කිරීම |
| 02 ඉහළම පරිපූර්ණ ගුණාත්මක පුහුණුවක් ලබා දීම | වාර්ෂිකව යාවත්කාලීන කරමින් ප්‍රවීණ සම්පත්දායක මණ්ඩලයක් පවත්වාගෙන යාම | පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවීණ සම්පත්දායක මණ්ඩලයක් යොදවා ගැනීම |
| 03 පළාත් රාජ්‍ය සේවයේ නියුතු සෑම සේවා ගණයකම වෘත්තීය කුසලතාවය ඔප් නැංවීම. | 1.එක් එක් සේවා ගණයන්ට අවශ්‍ය වෘත්තීය පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>2.පොදු පුහුණු වැඩසටහන් දුෂ්කර ප්‍රදේශ වල පිහිටි ආයතනයන් වෙත ව්‍යාප්ත කිරීම | පලාත් රාජ්‍ය සේවයේ නියුතු සියලු සේවා ගණයන්ට අයත් නිලධාරීන්ගෙන් අපේක්ෂිත කාර්ය සාධන මට්ටම ළඟා කර ගැනීමට අවශ්‍ය පුහුණුව ලබා දීම |
| 04 2023වන විට ජාතික ඵලදායිතා තරඟයේ ස්වර්ණ සම්මානයේන් පිදුම් ලැබීම. | ඵලදායිතා සංකල්ප පිළිබඳ මූලික දැනුම කාර්ය මණ්ඩලය වෙත ලබාදීම හා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය | උතුරුමැද පළාත් සභාවේ සියලුම රාජ්‍ය ආයතන ජාතික ඵලදායිතා තරඟයට ඉදිරිපත් කිරීම |
| 05 ජාතික මට්ටමේ හොඳම සේවා සපයන්නෙකු බවට පත් කිරීම. | NVQ මට්ටමේ පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම හා ජාතික වෘත්තීය පුහුණු අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම | ශ්‍රවණාගාර ආදායම් මගින් හා පෞද්ගලික නිපුණතා පුහුණු වැඩසටහන් මගින් පලාත් සභා රාජ්‍ය ආදායමේ ඉහලම කොටස්කරුවා බවට පත්වීම |

## 2020 වර්ෂයේදී පවත්වන ලද වෙනත් පුහුණු වැඩසටහන්

| වැඩසටහන | දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව | මුළු වියදම ( රු.මි) |
|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | 1 | 18 | 0.02 |
| මූලික දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 6 | 504 | 0.27 |
| වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම - 2020 | 1 | 61 | 0.03 |
| නව කළමනාකරණ සහකාර නිලධාරින් සඳහා වන ප්‍රාරම්භක පුහුණුව | 3 | 156 | 0.1 |
| CIGAS | 3 | 99 | 0.07 |
| අන්තර්ජාලගත පුහුණු කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණුව | 2 | 156 | 0.08 |
| නවක අභ්‍යාසලාභී උපාධිධාරි නිලධාරින් සඳහා ප්‍රාරම්භක පුහුණුව - 2 අදියර | 3 | 132 | 0.09 |
| නවක අභ්‍යාසලාභී උපාධිධාරි නිලධාරින් සඳහා ප්‍රාරම්භක පුහුණුව - 3 අදියර | 3 | 132 | 0.08 |
| සාමාන්‍ය විනය හා හැසිරීම | 2 | 52 | 0.04 |
| ඵලදායිතා වැඩසටහන | 2 | 46 | 0.04 |
| පැමිණිල්ල මෙහෙයවන නිලධාරින් පුහුණු කිරීම | 3 | 99 | 0.07 |
| Basic Computer Studies | 5 | 95 | 0.07 |
| කාර්ය මණ්ඩල තොරතුරු කළමනාකරණ පද්ධති පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | 40 | 0.03 |
| පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ දැනුවත් කිරීම | 2 | 74 | 0.04 |
| පළාත් පාලන ආයතන වල වැටුප් පරිවර්ථනය | 2 | 84 | 0.05 |
| අල්ලස හා දූෂණය | 1 | 33 | 0.04 |
| තොරතුරු දැනගැනීමේ පනත | 1 | 33 | 0.03 |
| ආයතනික කාර්ය සාධන සැලසුම්කරණය | 1 | 61 | 0.03 |
| ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 2 | 54 | 0.03 |
| උපාධිධාරි අභ්‍යාසලාභී ප්‍රාරම්භක පුහුණුව- අවසන් අදියර | 2 | 92 | 0.06 |
| කාර්ය මණ්ඩල තොරතුරු පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 56 | 0.04 |
| Primavera P6 | 5 | 105 | 0.16 |
| ඵලදායිතාව | 2 | 48 | 0.04 |
| අවශ්‍යතා තක්සේරුව හා අයවැය ලේඛණ සැකසීම | 1 | 74 | 0.04 |
| උසස් පරිගණක පුහුණු වැඩමුළුව | 3 | 90 | 0.06 |
| රියදුරු මහතුන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණුව | 2 | 74 | 0.05 |
| වාහන හා වාහන ලිපිගොනු නඩත්තුව | 2 | 120 | 0.07 |
| මහඉලුප්පල්පම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ සේවකයින් සඳහා ආකල්ප වර්ධනය හා කාර්යක්ෂමතාවය වර්ධනය | 3 | 180 | 0.1 |
| කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරින් සඳහා කාර්යාල කළමනාකරණය | 2 | 48 | 0.04 |

| වැඩසටහන | දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව | මුළු වියදම ( රු.මි) |
|---|---|---|---|
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරින් නිලධාරින් සඳහා මෘදු කුසලතා සංවර්ධනය | 2 | 150 | 0.1 |
| ආයතන නිලධාරින් සඳහා ඵලදායිතාවය පිළිබඳ දැනුවත් කිරිමේ පුහුණුව | 2 | 30 | 0.02 |
| Payroll | 6 | 144 | 0.13 |
| දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 6 | 354 | 0.2 |
| පළාත් පාලන ආයතන සඳහා වන අවසන් ගිණුම් සැකසීම | 5 | 140 | 0.1 |
| ඉදිකිරීම් තාක්ෂණය හා වැඩබිම්වල තත්ත්ව පාලනය | 2 | 46 | 0.04 |
| මහජන සම්බන්ධතාවය හා සන්නිවේදනය | 2 | 38 | 0.03 |
| පළාත් පාලන ආයතන සඳහා ඇස්තමේන්තු හා බිල්පත් සැකසීම | 2 | 84 | 0.05 |
| පැමිණිල්ල මෙහෙයවීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 1 | 19 | 0.03 |
| පළාත් පාලන ආයතනවල ආදායම් සම්බන්ධ පුහුණු වැඩසටහන | 2 | 154 | 0.12 |
| වැටුප් පරිවර්තනය | 3 | 117 | 0.07 |
| සමූපකාර ව්‍යාපෘතියේ ඉදිරි දැක්ම වැඩමුළුව | 1 | 50 | 0.11 |
| ඉදිකිරීම් තාක්ෂණය හා වැඩබිම්වල තත්ත්ව පාලනය | 2 | 46 | |
| අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල | 2 | 54 | 0.04 |
| විගණන විමසුම් | 2 | 90 | 0.06 |
| GPS/GIS | 2 | 62 | 0.05 |
| පළාත් පාලන ආයතන සඳහා ලිපිගොණුකරණය හා කර්මාන්ත ලේඛණ සැකසීම | 2 | 98 | 0.06 |
| පළාත් පාලන ආයතනවල ප්‍රමාද වී ඇති උසස්වීම් ලබා දීම අනුරාධපුර | 2 | 86 | 0.05 |
| පළාත් පාලන ආයතනවල ප්‍රමාද වී ඇති උසස්වීම් ලබා දීම පොලොන්නරුව | 2 | 76 | 0.05 |
| අත්තිකාරම් බී ගිණුම | 1 | 23 | 0.02 |
| Revit Architecture | 5 | 85 | 0.13 |
| පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන වැඩසටහන | 3 | 117 | 0.07 |
| ඵලදායිතාවය හා අරපිරිමැස්ම පිළිබඳ සිතුවම් නිර්මාණය | 10 | 100 | 0.07 |
| මූලික පරිගණක පුහුණුව | 2 | 34 | 0.03 |
| කොරකහවැව නව පුහුණු මධ්‍යස්ථානය විවෘත කිරීම | 2 | 0 | 0.04 |
| CIMS | 1 | 29 | 0.02 |
| CIMS | 1 | 25 | 0.02 |
| පළාත් සභා කටයුතු හා කාර්යාල ක්‍රම | 2 | 40 | 0.03 |
| **එකතුව** | **141** | **5061** | **3.62** |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2020 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩසටහන් 56ක් පවත්වන ලදි. ඒ අනුව 2020 වර්ෂයේදී පළාත් රාජ්‍ය සේවයේ නියුතු විවිධ කාර්ය මණ්ඩල නිලධාරීන් 2075 ක් සඳහා පුහුණුව ලබා දී ඇත.

## COVID 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදි සංවර්ධන ඉලක්ක සාධනයේ දි මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2020 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව පළාත් රාජ්‍ය සේවයේ නිළධාරින්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරිමේ අරමුණින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ වැඩ සටහන් 120 පැවැත්විමට සැලසුම් කරන ලදි.නමුත් COVID 19 ගෝලීය වසංගතය රට පුරා ව්‍යාප්තවීම හේතුවෙන් සැලසුම් කල ක්ෂේත්‍රගත පුහුණු වැඩසටහන් පැවැත්විමට නොහැකිවිය. සෞඛ්‍ය අංශ වලින් ලබාදි ඇති උපදෙස් වලට අනුව වැඩසටහන් වලට සහභාගී වන ප්‍රමාණය අවම කරමින් පුහුණු වැඩසටහන් 56ක් තුළින් පුහුණුලාභීන් 2075 ක් පුහුණු කිරිමට හැකිවිය.

# 5.6. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු.

1991 වර්ෂයේ ජනවාරි මස දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත වූ උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ආරම්භක පළාත් ආදායම් කොමසාරිස් වූයේ ඒ.ඩී.ජයවර්ධන මහතාය. පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිස් වූයේ එච්.බී.ඒ.සෙනෙවිරත්න මහතාය. ආරම්භයේ දී පළාත් ආදායම් කොමසාරිස්, නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරුන්ට අමතරව තක්සේරුකරු, බදු නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ද ඇතුළුව නිලධාරි මණ්ඩලය 08 දෙනෙකුගෙන් සමන්විත විය. ක්‍රමානුකූලව වර්ධනය වූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 1992 වර්ෂයේ ආයතන හා ගිණුම් අංශ පිහිටුවන ලදි. 2003 වර්ෂයේ දී පොළොන්නරුව නියෝජ්‍ය පළාත් ආදායම් කාර්යාලයක් පිහිටුවා ඒ සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලදි.

පළාතේ ප්‍රශස්ත බදු රැස් කරන්නා වශයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව නවතම පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කරමින් හා නිලධාරීන් පුහුණු කිරීම මඟින් බදු රැස්කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කර පළාතේ සංවර්ධනයට විශාල මෙහෙයක් ඉටු කරයි. වර්තමානයේ ඒ සඳහා නිලධාරින් හතළිස් දෙදෙනෙකුගේ( 42) සහය ලැබේ.

## දැක්ම

"ප්‍රශස්ත බදු රැස්කිරීමේ ක්‍රියාවලියක්, සංවර්ධිත පළාතක්."

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහිකිරීම සඳහා බදු හා ගාස්තු රැස් කිරීම, බදු හා ගාස්තු ගෙවන්නන්ගේ ආකල්ප සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය, අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගු කාලීන අරමුණු

- සියළු බදු හා ගාස්තු ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම.
- ස්වේච්ඡා බදු අනුකූලතාව වර්ධනය.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාව විසින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත, වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම්, හැකි උපරිමයෙන් රැස් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- බදු හා ගාස්තු පැනවීම හා අයකිරීම.
- රැස් කරනු ලබන ආදායම මාසිකව වාර්තාකර පළාත් භාණ්ඩාගාරය වෙත මාරු කිරීම.
- අධිකරණ දඩ හා මුද්දර ගාස්තු වශයෙන් රැස්කරන ආදායම පළාත් පාලන ආයතනවලට බෙදාහැරීම සඳහා නිර්දේශ ලබාදීම.
- උකස් ගන්නන්ගේ ව්‍යාපාර නියාමනය කිරීම හා ගාස්තු අය කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- බදු හා ගාස්තු ගෙවන්නන්ගෙන් හා විවිධ ආයතන වලින් තොරතුරු කැඳවීම.
- බදු හා ගාස්තු ගෙවන්නන් කැඳවා සම්මුඛ සාකච්ඡා තුළින් පෙර බදු හා ගාස්තු අය කිරීම.
- බදු/ ගාස්තු ගෙවන්නන් හා නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- හිඟ බදු හා ඌණ මුද්දර ගාස්තු අය කිරීම.
  I. චංචල හා නිශ්චල දේපළ තහනම් කිරීම.
  II.බැංකු ගිණුම් තහනම් කිරීම.
  III.නඩුපැවරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 52ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 39 කි. පුරප්පාඩු සංඛ්‍යාව 39 ක් වේ.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු හා සම්බන්ධ ක්‍රියාකාරකම්*

**01.**සියළු බදු හා ගාස්තු රැස් කිරීම, ඉහළ නැංවීම මඟින් පළාතේ සංවර්ධනය.

**02.**නොතාරිස්වරුන් දැනුවත් කිරීම තුළින් නිසි කලට රජයේ බදු ආදායම් රැස්කර දීම.

**03.**බදු පැනවීමේ හා රැස් කිරීමේ සියළු ක්‍රියාවලින් පරිගණක පද්ධතියක් තුළින් විධිමත් කිරීම මඟින්, වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව බදු රැස්කර ආදායම් ඉහළ නැංවීම.

04.ඉඩම් ඔප්පුවල වටිනාකම් පිළිබඳව මතය ලබා ගැනීමේ ක්‍රියාදාමය වර්ධනය කිරීම තුළින්, කාර්යක්ෂමව, විධිමත්ව, බදු ආදායම් කඩිනමින් රැස් කර දීම.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති අනුව යමින් මහජනතාවට හිරිහැරයක් නොවන පරිදි බදු හා ගාස්තු අය කිරීම සඳහා කාර්ය මණ්ඩලය පෙළඹවීම.
2. ප්‍රශස්ත ආදායම් රැස් කිරීමේ ක්‍රියාවලියේ දී නව ක්‍රමෝපායන් තුළින් ආදායම වර්ධනය කිරීම.
3. ආදායම් එකතු කිරීම, පරිපාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති පරිගණක ක්‍රමවේදය යටතේ නිළධාරීන්ට වැඩිදුරටත් පුහුණුව ලබා දීම.
4. බදු ආදායම් රැස් කිරීම විනිවිධභාවයෙන් යුක්තව හා මහජනතාව දැනුවත් කිරීම මඟින් ඉටු කිරීම සඳහා දේපළ පැවරීම මත මුද්දර ගාස්තු අය කිරීමේ දී **මතය ලබා ගැනීමේ** ක්‍රමවේදය සඳහා මහජනතාව පෙළඹවීම.
5. දැනට ස්ථාපිත කර ඇති පරිගණක වැඩසටහන තව දුරටත් වැඩිදියුණු කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය.

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | ආයෝජනය (රු.මි.) (සත්‍ය ආදායම) | |
|---|---|---|---|---|---|
| | | | | ඉලක්ක | ප්‍රගතිය |
| බදු හා ගාස්තු රැස් කිරීම සංවර්ධනය | වාර්ෂිකව රැස්කරන ලද බදු හා ගාස්තු ප්‍රමාණය | පළාත් සභාවේ ආදායමෙන් රැස් කරන ලද බදු හා ගාස්තු ප්‍රමාණය | නිළධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් හා GIS පුහුණු පාඨමාලා පැවැත්වීම | 496.3 | 614.5 |
| අනෙකුත් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය සංවර්ධනය | වාර්ෂිකව රැස්කරනු ලබන තොරතුරු ප්‍රමාණය | 2020.12.31 දක්වා රැස් කළ තොරතුරු වලින් ඉපැයූ ආදායම් ප්‍රමාණය | | | |
| පළාත් සභා අරමුදලට දක්වන දායකත්වය වර්ධනය කිරීම | වාර්ෂිකව පළාත් සභා අරමුදලට බැර කළ මුදල් ප්‍රමාණය. | පළාත් සභාවේ අය වැය කරන ලද දායකත්වය | | | |

## ඉලක්ක හා ප්‍රගතිය ළඟා කර ගැනීම

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය 2020 | ඉලක්කය 2021 |
|---|---|---|---|---|
| සියළු බදු හා ගාස්තු ආදායම රැස් කිරීම, ඉහල නැංවීම | වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම් හැකි උපරිමයෙන් රැස් කිරීම. | පළාත් සභාවේ ආදායමෙන් රැස් කරන ලද බදු හා ගාස්තු ප්‍රමාණය | 496.3 | 587.5 |
| ස්වෙච්ඡා බදු අනුකූලතා වර්ධනය | මතය ලබා ගැනීමේ ප්‍රතිශතය ඉහල නංවා ගැනීම. | 2020 වර්ෂයේ ලියන ලද ඔප්පු වලින් මතය ලබා ගත් ප්‍රමාණය | | |
| ආදායම එකතු කිරීම, පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | සියළු ආදායම් ප්‍රභවයන් සඳහා පරිගණක ක්‍රමවේදය ව්‍යාප්ත කිරීම. | වාර්ෂික ආදායම් ඉලක්ක රැස් කළ ප්‍රමාණය | | |

## කාර්ය සාධන ඉලක්ක - 2020

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | සත්‍ය ආදායම (රු.මි) | |
|---|---|---|---|---|---|
| | | 2019 | 2020 | 2019 | 2020 |
| කාර්යක්ෂමව නිවැරදිව බදු ආදායම් රැස්කර දීම. | දෙපාර්තමේන්තු අභ්‍යන්තර ඉලක්ක ලබා දීම හා සාමූහිකව එම ඉලක්ක සපුරාලීම. | 498.50 | 496.3 | 543.40 | 614.5 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවට හිමි ආදායම් රැස් කිරීමේ කාර්යය සඳහා පිහිටුවා ඇති පළාත් අදායම් දෙපාර්තමේන්තුව මේ වන විට ප්‍රභවයන් 08ක් යටතේ ආදායම් රැස් කරනු ලබයි.2020 වර්ෂයේ දී කොරෝනා වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද ඉහත ආදායම් ප්‍රභවයන් 08 සඳහා ලබා දී තිබූ සමස්ත ඉලක්කය වන රු.මි.496.3ක ඉලක්කය ඉක්මවා රු.මි.118.2ක් රැස් කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය.මෙහි දී මත්පැන් බලපත්‍ර ගාස්තු, දේපල පැවරීම මත මුද්දර ගාස්තු, පිරිවැටුම් බද්ද, බනිජ බද්ද ආදායම් ඉලක්ක කරා ලඟා වීමට නොහැකි වූ නමුත්, අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු, උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු, ඖෂධ හා රසායන බද්ද, උසාවි දඩ ආදායම් ඉලක්ක ඉක්මවා විශාල වශයෙන් ආදායම් රැස් කිරීමට හැකි වීම සමස්ත ආදායම ඉහල යාමට හේතු විය.

## ආයතනයේ අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

ඉඩම් ඔප්පු පරීක්ෂා කිරීම හා යාවත්කාලීන කිරීම, මහජනතාව දැනුවත් භාවයෙන් යුක්තව බදු ගෙවීම, වාර්ෂිකව ආදායම් ඉලක්ක සම්පූර්ණ කරගැනීම, නිලධාරීන්ට තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ දැනුම අවබෝධය ලබා දීම, මුද්දර ආදායම ඉහළ නැංවීම, මුද්දර බදු ආදායම ඉහළ නැංවීම, නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමෙන් දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය වැඩි කිරීම තුළින් පළාතේ ආදායම ඉහළ නැංවීම, ආදායම් පරිපාලනය කිරීමේ කටයුතු නිවැරදිව හා කාර්යක්ෂමව කිරීමට හැකි වීම තුළ පළාතේ නව ආදායම් මාර්ග හඳුනා ගැනීම මඟින් ආදායම් උත්පාදනය ඉහළ නැංවීමටත් ඒ තුළින් ජාතික මට්ටම කෙරෙහි උතුරු මැද පළාතේ දායකත්වය වර්ධනය කිරීමටත් 2020-2021 වර්ෂවලදී ඉලක්කගත කෙරේ.

## ආයතනයේ අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය 2020-2021

| ඉලක්ක<br>කෙටිකාලීන | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|
| **සියළු බදු හා ගාස්තු ආදායම රැස් කිරීම, ඉහළ නැංවීම** | |
| ඉඩම් ඔප්පු පරීක්ෂා කිරීම යාවත්කාලීන කිරීම. | මුද්දර ආදායම ඉහළ නැංවීම. |
| **ස්වෙච්ඡා බදු අනුකූලතා වර්ධනය කිරීම සඳහා දේපළ පැවරීම මත මුද්දර ගාස්තු අය කිරීමේ දී මතය ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.** | |
| මහජනතාව දැනුවත් භාවයෙන් යුක්තව බදු ගෙවීම. | මුද්දර බදු ආදායම ඉහළ නැංවීම. |
| **වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම් හැකි උපරිමයෙන් රැස් කිරීම.** | |
| වාර්ෂිකව ආදායම් ඉලක්ක ඉක්මවා රැස් කර ගැනීම. | නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමෙන් දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය වැඩි කිරීම තුළින් පළාතේ ආදායම ඉහළ නැංවීම. |
| **ආදායම එකතු කිරීම, පරිපාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති පරිගණක ක්‍රමවේදය වැඩිදියුණු කිරීම.** | |
| නිලධාරීන් තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම. | ආදායම් පරිපාලනය කිරීමේ කටයුතු නිවැරදිව හා කාර්යක්ෂමව කිරීමට හැකි වීම. ඒ සඳහා නිලධාරීන් පූර්ණකාලීන ක්ෂේත්‍ර රාජකාරි (වීථි සමීක්ෂණ, ස්ථාන පරීක්ෂා) සඳහා යෙදවීමෙන් නව ආදායම් මාර්ග හඳුනා ගැනීම මඟින් පළාතේ ආදායම ඉහල නැංවීම. |

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන් පිළිබඳව අදහස් හා යෝජනා

උතුරු මැද පළාතේ සංවර්ධනයට දායක වීමෙහිලා ප්‍රශස්ත ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට 2021 වර්ෂයේ දී ඉලක්ක සපුරාලීම සඳහා නව ක්‍රමෝපායන් හඳුන්වා දී ඇත. ආදායම් රැස් කිරීමෙහිලා ස්ථාපනය කළ පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සහ ඒ සඳහා නිළධාරීන්ට වැඩිදුර පුහුණු වීම් ලබා දීම සහ දේපළ පැවරීම මත මුද්දර ගාස්තු අය කිරීමේ දී මතය ලබා ගැනීමේ ක්‍රමවේදය ජනතාව අතර ප්‍රචලිත කිරීම මගින් පළාතේ ආදායම් රැස් කිරීම ඉහල නැංවීම. තව දුරටත් 2021 වසරේ සංවර්ධන මූලාශ්‍රයන් වන දෙපාර්තමේන්තුව සඳහා රථ ගාලක් ඉදිකිරීම මඟින් සේවක තෘප්තිය ඇති කිරීම මෙහි අරමුණ වේ. දැනට අබලන් තත්වයේ පවතින පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ කැබ් රථය අලුත් වැඩියා කිරීම හා ක්ෂේත්‍ර රාජකාරි සඳහා නිළධාරීන් වැඩි වශයෙන් සහභාගී කර වීම තුළින් ආදායම් රැස් කිරීම් වේගවත් කළ හැකි වේ. ඒ අනුව දෙපාර්තමේන්තුවේ දැක්ම කරා ලඟා වීමට අපේක්ෂා කරයි.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස.

2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව ආදායම් ප්‍රභවයන් 08 ක් යටතේ රැස්කළ යුතු සමස්ත ආදායම් ඇස්තමේන්තුව රු.මි. 496.3 වූ අතර එම වර්ෂය සඳහා ආදායම් රැස් කිරීම රු. මි.614.5 කි. ඒ අනුව සමස්ත ආදායම 124% කින් සම්පූර්ණ කිරීමට හැකිවී තිබේ.

අනෙකුත් සියළු ආදායම් ප්‍රභවයන් ඇස්තමේන්තු ප්‍රමාණයන් ඉක්මවා රැස්කිරීමට හැකි වී තිබේ. එනම් අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු 108% ක්ද, උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු 109% ක්ද ඖෂධ හා රසායන බද්ද 135% ක්ද, උසාවි දඩ 165% ක්ද වශයෙන් ඇස්තමේන්තු ඉලක්ක ඉක්මවා රැස්කිරීමට හැකිවී තිබේ.

දෙපාර්තමේන්තුවේ ඉහළ තනතුරුවල පුරප්පාඩු පැවතියද කාර්ය මණ්ඩලයේ කැපවීම හා උනන්දුව මත අනෙකුත් නිළධාරීන්ගේ රාජකාරිද ආවරණය කරමින් එම ප්‍රගතිය ලබා ගැනීම සඳහා සමස්ත කාර්ය මණ්ඩලය මෙහෙයවීමට හැකි විය.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේ සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

කෝවිඩ් 19 වසංගතය නිසා 2020 වර්ෂයේ මාර්තු 18 දින සිට අප්‍රේල් 21 දක්වා ඇඳිරි නීතිය පැනවීම හා ඉන් පසු කාර්ය මණ්ඩලය 50% කැඳවීම හේතුවෙන් ආදායම් රැස් කිරීමට බාධා මතු විය. නිළධාරීන්ට ක්ෂේත්‍ර රාජකාරි වලට යාමට නොහැකි වීම හේතුවෙන් හිඟ බදු අය කිරීමට නොහැකි වීම හා නව ව්‍යාපාර හඳුනා ගැනීමට නොහැකි වීම මත එම බදු ආදායම් ඉලක්ක කරා ලගා වීමට නොහැකි විය. බැංකු කටයුතු අඩාල වීම හා ඔප්පු ලිවීමට නොහැකි වීම මුද්දර ගාස්තු ආදායම අඩු වීමට හේතු වූ අතර, හෝටල් වසා දැමීම නිසා සුරා බදු බලපත්‍ර අළුත් නොකිරීම එම ආදායම පහල යාමට හේතු විය. ඛනිජ, ව්‍යාපාරය අක්‍රීය වීම හේතුවෙන් එම ආදායම ඉලක්කයට යා නොහැකි විය. අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු දෙපාර්තමේන්තුවේ බලපෑමකින් තොරව රැස් කරන ආදායමකි. ඖෂධ හා රසායන බද්ද හා උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ආදායම් වාර්ෂික බලපත්‍ර මත අය වන බදුය. එහෙයින් කොරෝනා වසංගත තත්ත්වය එම ආදායම් කෙරෙහි බලපෑමක් ඇති නොවූ හෙයින් එය ඉලක්ක ඉක්මවීමට හැකි විය. ජනවාරි සිට අගෝස්තු දක්වා උසාවි දඩ ආදායම් කෙරෙහි කොරෝනා වසංගතය බලපෑමක් කළද ඉන් අනතුරුව අධිකරණ ක්‍රියාත්මක වීම මත උසාවි දඩ ආදායම වැඩි විය.

# 06.ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදි කිරිම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ඉටු කිරීමට පැවරී ඇති විෂයන් වශයෙන් පළාතේ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික යන විෂයන්ට අදාල කටයුතු මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහන් කළ හැකි ය. මේ යටතේ පවතින දෙපාර්තමේන්තු වන්නේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවයි. ව්‍යස්ථාපිත ආයතන වන්නේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය, පුස්තකාල සේවා මණ්ඩලය හා මුල් ළමාවිය සංවර්ධන අධිකාරියයි. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම්, මුදල්, ආයතන, අධ්‍යාපන, හා ප්‍රසම්පාදන කටයුතු යන අංශ කිහිපයකට බෙදී අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ.

## දැක්ම හා මෙහෙවර

**මෙහෙවර**

| **විකල්ප බලශක්ති -**<br>• විකල්ප විදුලිබලය යොදාගෙන කෙරෙන ක්‍රියාකාරකම් දිරිගැන්වීම.<br>• මහජන ආකර්ශනය සහිත සංචාරක ,ආගමික හා පුරාවිද්‍යා ස්ථාන ආලෝකමත් කිරීම සඳහා වීථි ලාම්පු ස්ථානගත කිරීම.<br>• පළාත් පාලන බල ප්‍රදේශ මට්ටමින් තෝරාගත් පොදු ස්ථාන සහ සංචාරක ආකර්ශණ ස්ථාන වල සූර්ය වීථි ලාම්පු ස්ථානගත කිරීම .බලශක්ති සංරක්ශණ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ පළාත් විකල්ප බලශක්ති සැලැස්මක් සකස් කිරීම. | බලශක්ති ය සඳහා වැයවන මුදල අවම කිරිම | සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර, සහ නවීන බල ශක්ති සැපයුම සහතික කිරිම |

| | | |
|---|---|---|
| **සංචාරක සංවර්ධනය**<br>• අනුරාධපුර සංචාරක තොරතුරු මධ්‍යස්ථානය නවීකරණය කිරීම.<br>කඩ 50 ඇවිදින මන්තීරු ආශ්‍රිතව ව්‍යායාම උපකරණ සවිකර සංවර්ධනය කිරීම.<br>නුවර වැව ආශ්‍රිතව සංචාරක ආකර්ශණය ඉහළ නැවීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>අනුරාධපුර, පොළොන්නරුව, හබරණ ගෘහස්ථ සංචාරක නිවාස ව්‍යාපෘති මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම .<br>• අවුකන රජමහා විහාරයේ නව සනීපාරක්ෂක පද්ධති සඳහා ජලනල පහසුකම් ලබාදීම හා පිවිසුම් මාර්ගය සකස් කිරීම.<br>• හබරණ නගරයේ සංචාරකයින් සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.<br>• ජීවිතාරක්ෂක පුහුණුව (හබරණ හා පොළොන්නරුව සංචාරක හෝටල් තුල සේවය කරන ජීවිතාරක්ෂකයින් පුහුණු කිරීම)<br>• පොළොන්නරුව නගරය ආශ්‍රිතව සංචාරකයින් සඳහා පහසුකම් ඉහල නැංවීම.<br>• සංචාරක ආකර්ෂණීය ස්ථාන සඳහා ප්‍රවර්ධන පත්‍රිකා සකස් කිරීම (රිටිගල, මිහින්තලේ, අවුකන, හබරණ, හඳගල, තන්තිරිමලේ, සෝමාවතිය, විල්පත්තුව, මැදිරිගිරිය)<br>• සංචාරක දිනය හා සංචාරක සැමරුම් උත්සව සිදුකිරීම<br>• සංචාරක කර්මාන්තයේ නියැලී සිටින පාර්ශවකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ මාර්ගෝපදේශකයන් සඳහා පුහුණු වැඩසටහන් හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම.<br>• ප්‍රදේශ වශයෙන් හුදකලා වූ සංචාරක ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. (අනුරාධපුර 08ක් සහ පොළොන්නරුව 04 ලෙස) | උතුරු මැද පළාතට පැමිනෙණ සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැපයිම. පැමිණෙන සංචාරකයින් ගේ සුව පහසුව ඇති කිරිම.<br><br>පළාත තුල සංචාරක ක්ෂේත්‍රයන්හි නියැලි සිටින නියැලෙන පිරිස් හට ධාරිතා සංවර්ධනය කර ගුණාත්මක සේවාවක් සැපයිම. | ගුණාත්මක සංචාරක කර්මාන්තයක් තුළින් දේශිය ආදායම ඉහල නැංවීම. |
| **ආගමික කටයුතු සංවර්ධනය**<br>• පළාතේ දහම් පාසල් වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>• පළාතේ ආගමික ස්ථාන සංවර්ධනය හා ආගමික උත්සව කටයුතු සිදුකිරීම | උතුරු මැද ජනතාවගේ අධ්‍යාත්මික යහ පැවැත්ම සංවර්ධනය දායකත්වය | උතුරු මැද ජනතාවගේ අධ්‍යාත්මික යහ පැවැත්ම සංවර්ධනය දායකත්වය සැපයිම. |
| **ජීවනෝපාය සංවර්ධනය**<br>• අඩුආදායම්ලාභී ස්වයංරැකියාවල නියුතු ("දිරියසහන" වැඩසටහන) ප්‍රතිලාභීන් සඳහා ධාරිතා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>• අඩුආදායම්ලාභී ස්වයංරැකියාවල නියුතු ප්‍රතිලාභීන් සඳහා 40% දායකත්ව පදනම මත උපකරණ ලබාදීම.<br>• මූලික පවුල් වල ආර්ථික ශක්තිය ඉහළ නැංවීම.<br>• වකුගඩු රෝගී පවුල් වල ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා සහය වීම.<br>• නුපුහුණු වඩු හා මේසන් කාර්මිකයන් සඳහා නිසි පුහුණුවක් ලබාදීම.<br>• වෙළඳ පොළ සංවර්ධනය. | | ස්ත්‍රී/පුරුෂ සමානාත්මතාවය ලබා කර සියලු කාන්තාවන් සහ ගැහැනු ළමුන් සවිබල ගැන්වීම. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම, සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධන, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. |

## දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන් පිළිබඳව අදහස් හා යෝජනා

යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක් ගොඩනැගීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වසර තුළ මෙම අමාත්‍යාංශය මගින් සංවර්ධන වැඩ සටහනන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක් ගොඩනැගීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා 2020 වසර තුළ කොවිඩ් වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක කිරිමට නොහැකිවු යෝජනාවන් රැසක්ම 2021 වර්ෂය තුල දි ක්‍රියාත්මක කිරීමට යෝජනා හා සැලසුම් සකස් කර ඇත.

ඒ අනුව අධ්‍යාපනික සංවර්ධනය තුලින් ගුණාත්මකභාවයෙන් යුක්තව පළාතේ දරුවන් සඳහා ඵලදායි සේවාවක් සැපයිම සඳහා යෝග්‍ය වු ආයතනයක් ලෙස නියාමනය කිරීම ප්‍රධාන අරමුණ මුල් කරගෙන ප්‍රාථමික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම, ද්විතියික අධ්‍යාපනය වැඩි දියුණු කිරිම, කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම, ගුණාත්මක සංවර්ධනය වැඩි දියුණු කිරීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයිම, මානව සම්පත් සංවර්ධනය තුලින් කෙටිකාලින ප්‍රතිඵල ලඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. දිගු කාලින ව ගුණාත්මක අධ්‍යාපනයට මුල්තැන දෙමින් එය පහසුවෙන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හා ගුණාත්මක භාවයෙන් ඉහල පළාතේ දරුවන් සඳහා ඵලදායි සේවාවක් සැපයීම සඳහා යෝග්‍යවු ආයතනයක් ලෙස ක්‍රමවත් කිරීම දිගු කාලින ප්‍රතිඵල ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා රු. මි.ලි. 300 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

උතුරු මැද පළාතේ සංචාරක ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට නොහැකි වු යොජනාවන් රැසක්ම 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර ඇත. සංචාරක ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක ආකර්ශණීය ස්ථාන වල පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක මානව සම්පත් සංවර්ධනය, උතුරු මැද පළාතේ සංචාරක ස්ථාන ප්‍රවර්ධනය, ආයතනික සම්බන්ධිකරණය යන ක්‍රියාකාරකම් ඔස්සේ ගමන් කරනු ලැබේ. උතුරු මැද පළාතට සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැපයිම, පැමිණෙන සංචාරකයින්ගේ සුව පහසුව ඇති කිරීම, පළාත තුල සංචාරක ක්ෂේත්‍රය තුල නියළි සිටිමට අපේක්ෂිත පිරිස්හට ධාරිතා සංවර්ධනය කර ගුණාත්මක සේවාවක් සැපයීම ගැටළු අවබෝධ කර පොදු අරමුණකට යෑම තුලින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක පළාත තුල ලඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම උදෙසා රු. මි.ලි 49 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

විකල්ප බල ශක්ති සංවර්ධන ප්‍රධාන අරමුණු යටතේ උතුරු මැද පළාතේ විශේෂයෙන් විදුලි පහසුකම් නොමැති ප්‍රදේශ ඉලක්ක කර සූර්ය බලශක්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් බලශක්තිය සඳහා වැය වන මුදල අවම කිරිමට හැකියාව ලැබේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම උදෙසා රු.මි. 20 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

උතුරු මැද පළාතේ ග්‍රාමීය ජනතාවගේ අදායම් තත්ත්වය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් පළාත තුල ආර්ථිකයට වග කියනු ලබන ව්‍යවසායකයින් බිහි කිරිමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා රු.මි.20 ක් වැය කිරිමට අපේක්ෂා කෙරේ.

පළාතේ ආගමික පුනර්ජීවනය සංවර්ධන කාර්යන් ඉටුකිරීම වෙනු වෙන් ආගමික කටයුතු ව්‍යාපතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ විහාරස්ථාන සංවර්ධනය හා දහම්පාසල් සංවර්ධනය සිදු කරනු ලැබේ. ඒ සඳහා රු.මි. 43 වෙන් කෙරේ.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය ඉහළ කාර්ය සාධනයක් කරා ළඟා විමට හැකි වු බව ප්‍රකාශ කළ හැකිය. විශේෂයෙන්ම පළාතේ අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා පැවැති භෞතික මෙන්ම මානව සම්පත් අවශ්‍යතා 2020 වර්ෂය තුළ දී සැලකිය යුතු මට්ටමකින් සම්පූර්ණකර ගැනීමට හැකි විය. එහිදි පාසල් ගොඩනැගිලි, පන්ති කාමර අවශ්‍යතා, විද්‍යාගාර අවශ්‍යතා, ගුරු නිවාස, කාර්යාල ගොඩනැගිලි, ගුණාත්මක යෙදුම් ආදී පාසල් පද්ධතියේ සංවර්ධනය උදෙසා භෞතික අවශ්‍යතා මෙන්ම ගුරුවරුන්ගේ පුහුණු අවශ්‍යතා වැනි මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කරගත හැකි විය.

අතිගරු ජනාධිපතිතුමාගේ ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් යහපත් සමාජයක් "සෞභාග්‍යමත් පළාතක්" යන ආයතනයේ දැක්ම කරා ළඟා වීමට පළාතේ දරුවන් සඳහා අධ්‍යාපන පහසුකම් සංවර්ධනය, ප්‍රාදේශීය මහජන අවශ්‍යතා සපුරාලීම සඳහා පළාත් පාලන සේවා දියුණු කිරීම, ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරිම, පළාතේ තරුණ තරුණියින් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබා ගත හැකි වන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරිම, යටිතල පහසුකම් පද්ධතින් විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරිම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරිම හා පළාත තුළ ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම වැනි දෑ ක්‍රියාත්මක කරන ලදී.

රටේ ජිවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරිම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවිම, පළාතේ සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳව දැනුවත් කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මෙන්ම තරුණ තරුණියින්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරිම, අධික විදුලි අවශ්‍යතාවන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වාදීම, සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරිම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංචාරක ගම්මාන ඇති කිරීම, ප්‍රවර්ධනය, මනව සම්පත් සංවර්ධනය හා දේශීය විදේශීය සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම වැනි වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් විවිධ දුෂ්කරතා හා අභියෝග වලට මුහුණ දීමට සිදුවීම හේතුවෙන් අමාත්‍යාංශයේ කාර්ය සාධනය දැඩි ලෙස මන්දගාමී වු අතර පහත සඳහන් කරුණු ඒ සඳහා හේතු විය.

01. අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පැමිණීම අඩාල වීම මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට බාධා ඇති වීම.
02. ව්‍යාපෘති ඉටු කරන කොන්ත්‍රාත්කරුවන්ට ශ්‍රමය, සම්පත්, උපකරණ, අමු ද්‍රව්‍ය සපයා ගැනීමට බාධා ඇති වීම.
03. දිවයිනේ පැවති මුල්‍ය අර්බුදය මත ප්‍රතිපාදන නොලැබීම, ප්‍රතිපාදන සීමා කිරිම වැනි තීරණ මත ව්‍යාපෘති අත්හිටු විමට සිදු වීම. උදා -: (ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය)

සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී අන්තර්ජාලය හා ආශ්‍රිත හා තාක්ෂණ, සමාජ ජාලා පහසුකම් භාවිතා කිරිම තුලින් දුරස්ථභාවය ආරක්ෂා කර ගනිමින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කරන ලදි.

# 6.1.පළාත් පාලන දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

මහජන සෞඛ්‍ය, පොදු මංමාවත්, උපයෝගිතා සේවා විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම තුළින් සුබ විහරණය හා පහසුකම් සුභසාධනය ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනය අනුව පළාත් ආයතන පිහිටුවා ඇත.

ඒ අනුව පළාත් පාලන ආයතනයක් යනු නෛතික පුද්ගලභාවයක් ඇති, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත, ආයතනය නමින් නඩු පැවරීමට හා නඩු පැවරීමකට යටත්ව දේපල අත්පත්කර ගැනීම, දැරීම බැහැර කිරීම හා ගිවිසුම්වලට එළඹීමට හැකි ආයතනයක් ලෙස ක්‍රියාත්මකව පවතී. මේ සඳහා මහනගර සභා පනතේ 34 (1) (2), නගර සභා පනතේ 31 හා ප්‍රාදේශීය සභා පනතේ (2)92) වගන්තිවලින් ප්‍රතිපාදන සැලසී ඇත. ඉහත කාර්යයන් අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා උතුරු මැද පළාතේද පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පොළොන්නරුව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය පිහිටුවා ඇත. එහි පළාත් පාලන කොමසාරිස්වරයෙකු හා සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකු පත්කර ඇති අතර එම කාර්යාල යටතේ පිහිටුවා ඇති පළාත් පාලන ආයතන 27ක් මගින් උතුරු මැද පළාතේ වෙසෙන ජනතාව වෙත සේවා සැපයීම් කරනු ලැබේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 19ක් ක්‍රියාත්මක වේ. ඒවා නම් අනුරාධපුර මහ නගරසභාව, පදවිය, කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, හොරොව්පතාන, ගලෙන්බිඳුණුවැව, මිහින්තලේ, මැදවච්චිය, රඹෑව, තලාව, නොච්චියාගම, රාජාංගනය, කැකිරාව, තිරප්පනේ, ගල්නෑව, පලාගල, ඉපලෝගම, ම.නු.ප හා නැ.නු.ප යන ප්‍රාදේශීය සභා වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් පළාත් පාලන ආයතන 08ක් පාලනය වේ. පොළොන්නරුව මහා නගර සභාව, ඇලහැර ප්‍රාදේශීය සභාව, හිඟුරක්ගොඩ, ලංකාපුර, මැදිරිගිරිය, දිඹුලාගල, වැලිකන්ද, පොළොන්නරුව ප්‍රාදේශීය සභා ලෙස මේවා ක්‍රියාත්මක වේ.

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහ නගර සභා | 1 | 1 | 2 |
| ප්‍රාදේශිය සභා | 18 | 7 | 25 |
| ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු | 401 | 173 | 574 |

## ප්‍රාදේශිය සභා - අනුරාධපුර

| | | |
|---|---|---|
| 1. මිහිතලේ | 8. ඉපලෝගම | 15. රාජාංගනය |
| 2. ගලෙන්බිඳුණුවැව | 9. කහටගස්දිගලිය | 16. නොච්චියාගම |
| 3. රඹෑව | 10. නැ.නු.ප | 17. හොරොව්පොතාන |
| 4. කැබිතිගොල්ලෑව | 11. ම.නු.ප | 18. පලාගල |
| 5. පදවිය | 12. කැකිරාව | |
| 6. ගල්නෑව | 13.තිරප්පනේ | |
| 7. මැදවච්චිය | 14. තලාව | |

## ප්‍රාදේශිය සභා - පොළොන්නරුව

| | | | |
|---|---|---|---|
| 1. ඇලහැර | 3.මැදිරිගිරිය | 5. ලංකාපුර | 7. හිගුරක්ගොඩ |
| 2. වැලිකන්ද | 4.දිඹුලාගල | 6. පොළොන්නරුව | |

## දැක්ම

"අවශ්‍යතා සපුරාගත් තෘප්තිමත් ප්‍රජාවක්".

## මෙහෙවර

පළාත් පාලන ආයතනවල මිතුරෙකු, මගපෙන්වන්නෙකු, නියාමකයෙකු සහ දාර්ශනිකයෙකු වශයෙන් විනිවිදභාවයකින් යුතුව සමාජ හා ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සේවා සැපයීම, කාර්යක්ෂම කිරීම සියළුම පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධතා ශක්තිමත් කිරීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහය වීම.

## දිගු කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතනවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය.
2. පළාත් පාලන ආයතනවල සමාජ යටිතල පහසුකම් සංවර්ධනය.
3. පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණය.
4. ආයතනික ධාරිතා සංවර්ධනය.
5. යහ පාලනය ස්ථාපිත කිරීම.

## කෙටි කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතනවල මං මාවත් වැඩි දියුණු කිරීම.
2. කාර්යක්ෂම වෙළඳ පහසුකම් ඇති කිරීම.
3. ප්‍රජා ජල පහසුකම් වැඩි දියුණු කිරීම.
4. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තිරසාර යාන්ත්‍රණයක් සැකසීම.
5. පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
6. පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම.
7. පෙර පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය.
8. කාලීනව අතුරු ව්‍යවස්ථා පැනවීම.
9. පළාත් පාලන බල ප්‍රදේශවල සුසාන භූමි සංවර්ධනය.
10. පළාත් පාලන බල ප්‍රදේශවල ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි සංවර්ධනය.
11. පළාත් පාලන ආයතනවල සඵලතාවය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.
12. පළාත් පාලන ආයතන පුද්ගලික අංශය, මධ්‍යම රජය හා පළාත් සභාව අතර මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම.
13. පළාත් පාලන ආයතනවල කාර්යක්ෂම මනා පුහුණුවකින් යුත් කාර්යය මණ්ඩල ස්ථාපිත කිරීම.
14. පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කර්මාන්ත අධීක්ෂණය.

## ප්‍රධාන කාර්යයන්

1. පළාත් පාලන ආයතනවලට තේරීපත්වූ මහජන නියෝජිතයින් පළාත් පාලන විෂය ක්ෂේත්‍රයෙහි දැනුවත් කිරීම හා මර්ගෝපදේශකත්වය ලබා දීම.
2. පළාත් පාලන ආයතනවල ශක්තීන් ගොඩනැගීම.
3. පළාත් පාලන ආයතනවල මූල්‍යම ශක්තීන් ගොඩනැගිම.
4. සම්බන්ධිකරණ කටයුතු.

## ප්‍රධාන උපාය මාර්ගය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්, පළාත් පාලන ආයතන භාර විමර්ෂණ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් පළාත් පාලන ආයතනවල කටයුතු නිරීක්ෂණය හා අධීක්ෂණය.

## අංශය සෘජුව හා වක්‍රව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




2030 වනවිට ජලය එක්රැස් කිරිම, පිරිපහදු කිරිම, ජලය කාර්යක්ෂමව භාවිතා කිරිම, අප ජලය පිරිසිදු කිරිම, ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතා කිරීම සඳහා තාක්ෂණයද ඇතුළත්ව ජලය හා සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරිම

2030 වනවිට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මගින් අඩු කිරීම.

ජලය හා සනිපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය දිරිගැන්වීම සහ සහය ලබා දීම.

යටිතල පහසුකම් නිසි ප්‍රමිතියෙන් යුතුව සංවර්ධනය කිරීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 124 ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 69 කි. පුරප්පාඩු සංඛ්‍යාව 58ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන්මඟ

### 01. පළාත් පාලන මාර්ග සංවර්ධනය

මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත අති විශාල කාර්යභාරයක් පැවරී ඇත. ඒ අනුව උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ ඇති පළාත් පාලන ආයතන 27 තුල හඳුනාගන්නා ලද මාර්ග සංවර්ධනය කිරීම අප වෙත පැවරී ඇති වගකීම් කොටසකි. ඒ අනුව 2020 වර්ෂයේ රටතුල පවතින ලද කොවිඩ් -19 වසංගත තත්වය හේතුකොට ගෙන නව ව්‍යාපෘති අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු නොවුනු අතර, 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ වශයෙන් ඉතිරි වු ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක වු බව සඳහන් කරමි.

අතිගරු ජනාධිපතිතුමාගේ " සෞභාගයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ලංකාවේ මාර්ග පද්ධතිය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් " සුවපහසු ගමනක් - පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් " යන සංකල්පය ක්‍රියාවට නැංවීම උදෙසා පහසුවෙන් ඉක්මනින් හා ආරක්ෂාකාරී ව තම ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සෑම පුරවැසියෙකුටම ඇති අයිතියක් බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් තම මූලික අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට යාමේදී ප්‍රවාහන පද්ධතියේ පවතින පසුගාමීත්වය මත එම කාර්යයන් හරියාකාරව ඉටුකර ගත නොහැකි තත්වයක් උද්ගත වී ඇත. එබැවින් පළාත් පාලන ආයතන බල ප්‍රදේශ මට්ටමින් හඳුනාගන්නා ලද මාර්ග ජනතාවට පහසුවන ආකාරයෙන් හා තම කාර්යයන් කාර්යක්ෂමව හා කඩිනමින් ඉටුකර ගැනීමට හැකිවන අයුරින් බොරළු දමා සංවර්ධනය කිරීම, කුට්ටිගල් ඇල්ලීම,කොන්ක්‍රීට් කිරීම, තාර ඇතිරීම හා කාපට් කිරීම වැනි ක්‍රියාමාර්ග වලින් ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. එසේම මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් වන පාලම්, බොක්කු හා කානු පද්ධති සංවර්ධනය කිරීම තුලින් විධිමත් පරිදි ජලය බැසයාමට කටයුතු සිදුකර ඇත.

### 02.ප්‍රජා ජල පහසුකම් සංවර්ධනය කිරීම.

උතුරු මැද පළාත් තුල ජීවත්වන බොහෝ පිරිසකගේ ප්‍රධාන ජීවනෝපායන මාර්ගය වන්නේ ගොවිතැනයි. බොහෝ ආර්ථික අපහසුතා මැද ජීවත්වන මෙම ජනතාවට බීමට සුදුසු ජලය නොමැතිකම ප්‍රධාන ගැටළුවක්ව පවතී. වර්තමානයේ පවතින කාලගුණික හා දේශගුණික විපර්යාස මත කලට වැසි නොලැබීම නිසා ජලය සුරැකිය යුතු සම්පතක් බව අතිගරු ජනාධිපතිපතිතුමාගේ සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පෙන්වා දී ඇති ප්‍රධාන කරුණකි.

මෙම පලාත තුළ බීමට සුදුසු ජලය නොමැතිකමින් පීඩා විඳින ජනතාව පිළිකා , වකුගඩු යන ප්‍රධාන රෝග වලට ගොදුරු වී සිටින අතර කුඩා ළමුන් සඳහාද මෙම රෝග ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවයක් මේ වන විට බලපා ඇති බැවින් පානීය ජලය ලබාදීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කිරීමට පළාත් පාලන අයතන මේ වන විටත් කටයුතු කරගෙන යනු ලැබේ. සැමට පිරිසිදු පානීය ජලය සැපයීම අරමුණු කර ගනිමින් දැනටමත් අප විසින් ක්‍රියාත්මක කරනු ලබන බොහෝ ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලය හා එක්ව ප්‍රජා ජල ව්‍යාපෘති යටතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සිට සියළුම ජනතාව ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ඒ අතර ජල ව්‍යාපෘති හරහා ජලය ලබාදෙන නල මාර්ග දීර්ඝ කිරීම, ජල පෙරණ පද්ධති සවිකිරීම, ජල මූලාශ්‍ර නොමැති ස්ථාන

සඳහා බීමට සුදුසු ජලය ලබාදීමට ටැංකි ස්ථාපනය කිරීම, නල ළිං ඉදිකිරීම වැනි ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇති අතර හා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**03.ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

2020 වර්ෂයේ රටතුල පැවති වසංගත රෝග තත්ත්වය නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනුමැතිය නොලැබුණි. අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අටවන කොටසින් තිරසාර පරිසර පද්ධතියක් යන සංකල්පය යටතේ කසල කළමනාකරණය කිරීම පිළිබඳ අදහස් දක්වා ඇත.

ඒ අනුව සෑම ආකාරයකම අපද්‍රව්‍ය මිනිසාගේ නිර්මාණයක් බව හඳුනාගෙන අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීමට ජනතාව පෙල ගැස්සවීම අපද්‍රව්‍ය කළමනාකරණයේ පළමු පියවර ලෙස කටයුතු කරමින් පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ප්‍රජා සංවර්ධන වැඩසටහන් යටතේ කසළ කළමනාකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් නිරන්තරයෙන් පවත්වා ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන අතර, ඒ ඔස්සේ කාබනික පොහොර භාවිතා කරමින් ගෙවතු වගා වැඩසටහන්, ශ්‍රමදාන, රුක් රෝපණ වැඩසටහන් වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති ගණනාවක් පළාත් පාලන ආයතන මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන ආකාරයෙන් කසල අංගන ඉදිකිරීම මේ වන විටත් ක්‍රියාත්මකව පවතින අතර එම කසල අංගන හා පිළිසරු මධ්‍යස්ථාන ආශ්‍රිතව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, කසල වෙන්කිරීමට අවශ්‍ය කමත් පුළුල්කිරීම හා ඒ ආශ්‍රිතව පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුලින් සේවයේ යෙදී සිටින සේවකයින්ගෙන් උපරිම සේවයක් ලබාගැනීම හා ඔවුන්ගේ සෞඛ්‍ය පහසුකම් ආරක්ෂාකාරීව පවත්වාගෙන යාමටද කටයුතු කර ඇත. ඒ අනුව සුරක්ෂිත පරිසර පද්ධතියක් තුල ජීවත්වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමේ වගකීමේ කොටසක් අපහට ද පැවරී ඇති හෙයින් තිරසාර පරිසර සංරක්ෂණය පමණක් නොව සමබර වූ සමාජ ආර්ථික පුරුදු ක්‍රියාවට නැංවීමට ද අපගේ දායකත්වය ලබා දීමට අපේක්ෂා කරයි.

**04. වෙනත් පළාත් පාලන සේවා**

වෙනත් පලාත් පාලන සේවා යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මාර්ග, ජල, ඝන අපද්‍රව්‍ය කටයුතු ද ඇතුලත්ව ජනතාව නියෝජනය කරනු ලබන සියළුම පොදු සේවාවන් සඳහා පහසුකම් සැලසීමට කටයුතු කර ඇත. ඒ අතර ජනතාවට අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා පොදු වැසිකිළි පද්ධති ඉදිකිරීම, පොදු ළිං ඉදිකිරීම වැනි පොදුවේ භාවිතා කරනු ලබන පහසුකම් සංවර්ධනය කිරීම, පුස්තකාල පහසුකම්, සති පොළවල් සංවර්ධනය කිරීම්, පොදු වෙළඳ සංකීර්ණ වන පවතින අඩුපාඩු සකස්කිරීම හා ජනතාවගේ මානසික හා කායික සුවතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් උද්‍යාන සංවර්ධනය, ඇවිදින මංතීරු ඉදිකිරීම වැනි කටයුතු සඳහා ද දායකත්වය ලබාදී ඇත. එසේම පූර්ව ළමා අධ්‍යාපනය උදෙසා පළාත් පාලන ආයතන යටතේ පවත්වාගෙන පෙර පාසල් සඳහා මෙන්ම බල ප්‍රදේශයේ පවතින වෙනත් පෙර පාසල් ආශ්‍රිතව පවතින අඩුපාඩු සකස් කිරීම ද අපගේ විෂය පථයට අයත් කරුණක් සේ සලකා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

## තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සලකා බලමින් ගොඩනගා ගත් පළාත් නිමවුම් දර්ශකය හා ඉලක්ක

| අ. | ක්‍රියාකාරකම | නිමවුම් දර්ශකය | | ප්‍රතිඵල දර්ශකය | |
|---|---|---|---|---|---|
| | | ක්‍රියාවලි නිමවුම් (process output) | නිමවුම් දර්ශකය (output index) | ප්‍රතිඵල දර්ශකය (outcome index) | බලපෑම් දර්ශකය (Impact index) |
| 01 | (i)බොරළු දමා මාර්ග අළුත්වැඩියා කිරීම | 15 කි.මී | 150000 | ගමනාගමනය පහසුවීම | කාලය අපතේ යාම |
| | (ii) කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 20 කි.මී. | 105000 | ආර්ථිකය වැඩිදියුණුවීම | මාර්ග අනතුරු |
| | (iii) කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | 1.4 කි.මී | 7500 | නඩත්තු පිරිවැය අඩුවීම | වාහන අබලන්වීම |
| | (iv) තාර දමා සංවර්ධනය කිරීම | 3 කි.මී | 15000 | අධ්‍යාපනය ඉහලයාම | දේපල වටිනාකම අඩුවීම |
| | (v) කාපට් අතුරා සංවර්ධනය කිරීම | 100 මී. | 30000 | කාලය අපතේ නොයාම | |
| | (vi) බොක්කු හා කාණු සකස් කිරීම | 146 | 15000 | භෞතික දේපලවල වටිනාකම ඉහළයාම | |
| 02 | (i) ජල පෙරණ පද්ධති සවිකිරීම | 09 | 150000 | වකුගඩු රෝගීන් අඩුවීම | වකුගඩු රෝගී මරණ |
| | (ii) ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම | 14 | 10000 | බීමට සුදුසු පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීම | බීමට සුදුසු ජලය නොමැතිවීම |
| | (iii) නල ලිං හා ටැංකි ඉදිකිරීම | 2 | 2500 | | |
| 03 | (i)පොදු වෙළඳ සංකීර්ණ සංවර්ධනය | 2 | 150000 | ජනතාවට අවශ්‍ය භාණ්ඩ එකම තැනකින් මිළදී ගැනීම.<br>ග්‍රාමීය නිෂ්පාදන අලෙවිය.<br>ආර්ථික තත්වය ඉහලයාම | ග්‍රාමීය ජනතාවට අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීම සඳහා නගර කරා යොමුවීම.<br>ජනතාවගේ කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමට නගරයටම යාම.<br>නිෂ්පාදන සඳහා තෘප්තිමත් මිළක් නොතිබීම |
| | (ii) දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෙර පාසල් සංවර්ධනය කිරීම | 2 | 750 | මූලික අධ්‍යාපන පහසුකම් සංවර්ධනය කිරීම හා සමාජගත කිරීම.<br>රැකියාවල නිරත වන දෙමාපියන්ගේ දරුවන්ගේ ආරක්ෂාව | ග්‍රාමීය දරුවන්ට අවශය මූලික අධ්‍යාපන පහසුකම් අඩුවීම.<br>පෞද්ගලික අධ්‍යාපන ආයතනවන පවතින ඉහල මිළගණන්<br>දෙමාපියන් දෙදෙනාම රැකියාවල නිරතවීම |
| | (iii) පුස්තකාල සංවර්ධනය | 2 | 2000 | දැනුමෙන් පිරිපුන් පිරිසක් බිහිවීම.<br>අන්තර්ජාල පහසුකම් ලබාදීම.<br>කියවීමට හුරුකිරීම. | අන්තර්ජාල පහසුකම් නොමැතිවීම.<br>දැනුම සොයා නගරයට පැමිනෙණ දරුවන් වෙනත් විෂමාචාර ක්‍රියාවලට යොමුවීම |
| | (iv) පොදු සංවර්ධන කටයුතු | 1 | 15000 | ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම | - |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 09 | 9.1 | 9.1.1/9.1.2 | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 216.1 | 211.4 |
| 06 | 6.1<br>6.අ.1<br>6.ආ.1 | 6.1.1<br>6.අ.1<br>6.ආ.1 | පානීය ජල පහසුකම් කළමනාකරණය කිරීම | 38.09 | 34.4 |
| 11 | 11.6<br>11.අ | 11.6.1<br>11.අ.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය කිරීම | 15.98 | 15.85 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම දර්ශකය | ඉලක්කය (ව්‍යාපෘති ගණන) | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| (i)බොරළු දමා මාර්ග අළුත්වැඩියා කිරීම | 15 කි.මී | 5000000 | 22 | 45 | 5 | 5 | 17 | 45 | 0.5 | 0.5 |
| (ii) කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 20 කි.මී. | | 154 | 22 | 35 | 10 | 134 | 33 | 45 | 25 |
| (iii) කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | 1.4 කි.මී | | 04 | 05 | 10 | 10 | 15 | 9.0 | 15 | 10 |
| (iv) තාර දමා සංවර්ධනය කිරීම | 3 කි.මී | | 13 | 0 | 10 | 15 | 6 | 0 | 5 | 3 |
| (v) කාපට් අතුරා සංවර්ධනය කිරීම | 100 මී. | | 01 | 01 | 15 | 20 | 3 | 4 | 100 | 200 |
| (vi) බොක්කු හා කාණු සකස් කිරීම | 146 | | 96 | 04 | 25 | 15 | 37 | 8 | 5 | 6 |
| | | | **290** | **77** | **100** | **85** | **212** | **99** | **170.5** | **244.5** |
| (i) ජල පෙරණ පද්ධති සවිකිරීම | 09 | 2500000 | 9 | 13 | 20 | 25 | 18 | 28 | 40 | 25 |
| (ii) ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම | 14 | | 14 | 04 | 10 | 05 | 11 | 6 | 10 | 8 |
| (iii) නල ළිං හා ටැංකි ඉදිකිරීම | 2 | | 2 | 02 | 10 | 5 | 0.27 | 4 | 12 | 8 |
| (iv) නළ මාර්ග දිගු කිරීම | 0 | | 0 | 05 | 5 | 3 | 0.98 | 13 | 15 | 9 |
| (v) අළුත්වැඩියා කිරීම | 0 | | 0 | 06 | 10 | 10 | 0 | 6 | 8 | 8 |
| (vi) ටැංකි සවිකිරීම හා වෙනත් | 0 | | 0 | 05 | 5 | 3 | 0 | 8 | 9 | 6 |
| | | | **25** | **35** | **60** | **46** | **30.25** | **65** | **94** | **64** |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| (i) කසල මධ්‍යස්ථාන ඇතිකිරීම | 0 | 1500000 | 0 | 0 | 20 | 2 | 0 | 0 | 40 | 20 |
| (ii) විද්‍යාත්මක බැහැරකිරීම් | 0 | | 0 | 0 | 5 | 5 | 0 | 0 | 10 | 10 |
| (iii) කසල වෙන්කිරීම | 0 | | 0 | 04 | 15 | 18 | 0 | 5 | 15 | 20 |
| (iv) කොම්පෝස්ට් ආශ්‍රිත ව්‍යාපෘති | 0 | | 0 | 15 | 25 | 30 | 0 | 17 | 20 | 25 |
| | | | **0** | **19** | **65** | **55** | **0** | **22** | **85** | **75** |
| (i)පොදු වෙළඳ සංකීර්ණ සංවර්ධනය | 2 | 5000000 | 02 | 0 | 03 | 02 | 6.28 | 0 | 10 | 8 |
| (ii) දිවා සුරැකුම් මධ්‍යස්ථාන , පෙර පාසල් හා උද්‍යාන සංවර්ධනය කිරීම | 2 | | 02 | 10 | 12 | 15 | 5.28 | 7 | 8 | 10 |
| (iii) පුස්තකාල සංවර්ධනය | 2 | | 02 | 14 | 20 | 15 | 0.4 | 7 | 9 | 12 |
| (iv) පොදු සංවර්ධන කටයුතු (සතිපොළ, පොදු වැසිකිළි, කාණු, මිළදීගැනීම්) | 1 | | 01 | 13 | 25 | 15 | 0.55 | 13 | 15 | 12 |
| (v) කඩකාමර අළුත්වැඩියාව | 3 | | 0 | 3 | 8 | 5 | 0 | 4 | 8 | 5 |
| | | | **07** | **40** | **58** | **52** | **12.51** | **31** | **50** | **47** |

## කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අ.අ | ප්‍රතිඵල දර්ශකය | ඉලක්කය කරා ළඟාවීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය% |
| 01 | (i)බොරළු දමා මාර්ග අළුත්වැඩියා කිරීම | 22 | 100 |
| | (ii) කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 154 | |
| | (iii) කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | 04 | |
| | (iv) තාර දමා සංවර්ධනය කිරීම | 13 | |
| | (v) කාපට් අතුරා සංවර්ධනය කිරීම | 01 | |
| | (vi) බොක්කු හා කාණු සකස් කිරීම | 96 | |
| | | | |
| 02 | (i) ජල පෙරණ පද්ධති සවිකිරීම | 9 | |
| | (ii) ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම | 14 | |
| | (iii) නල ලිං හා ටැංකි ඉදිකිරීම | 2 | |
| | (iv) නළ මාර්ග දිගු කිරීම | 1 | |
| | | | |
| 03 | (i)පොදු වෙළඳ සංකීර්ණ සංවර්ධනය | 02 | |
| | (ii) දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල් හා උද්‍යාන සංවර්ධනය කිරීම | 02 | |
| | (iii) පුස්තකාල සංවර්ධනය | 02 | |
| | (iv) පොදු සංවර්ධන කටයුතු (සතිපොළ, පොදු වැසිකිළි, කාණු, මිළදීගැනීම්) | 01 | |

## පසුගිය වසර 03ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ.අ | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකර ගැනීමට අපේක්ෂා කළ සුවිශේෂි අරමුණු | ප්‍රගතිය (ප්‍රමාණය/ප්‍රතිලාභින්) | | | | වැයකල මුදල (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 01 | පළාත් පාලන මාර්ග සංවර්ධනය | බොරළු අතුරා මාර්ග අළුත්වැඩියා කිරීම. | 75000 | 150000 | 175000 | 15000 | 54 | 42.4 | 68.38 | 17 |
| | | කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම. | | | 150000 | 25500 | | | 20.22 | 133.8 |
| | | කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම. | | | 135000 | 5500 | | | 3.36 | 15.1 |
| | | තාර දමා සංවර්ධනය කිරීම. | | | 20000 | 2500 | | | 1.17 | 5.9 |
| | | කාපට් අතුරා සංවර්ධනය කිරීම. | | | 0 | 650 | | | 0 | 2.6 |
| | | බොක්කු ඉදිකිරීම හා කාණු සකස් කිරීම | | | 15000 | 3500 | | | 1.92 | 36.9 |
| 02 | ප්‍රජා ජල පහසුකම් සංවර්ධනය කිරීම | ජල පෙරණ ස්ථාපනය කිරීම | 1500 | 150000 | 35000 | 25000 | 0.23 | 9.75 | 5.78 | 17.9 |
| | | නල මාර්ග දිගු කිරීම් | | | 7500 | 1500 | | | 0.86 | 0.98 |
| | | ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම් | | | 50000 | 35000 | | | 16.70 | 10.6 |
| | | නල ළිං ඉදිකිරීම | | | 3250 | 500 | | | 1.01 | 0.27 |
| 03 | ඝන අපද්‍රව්‍ය කළමනාක-රණය | කසල අංගන සංවර්ධනය කිරීම | 100000 | 125000 | 0 | 0 | 59 | .544 | 0 | 0 |
| | | විද්‍යාත්මක බැහැරකිරීම් පිළිබඳ සංවර්ධන කටයුතු | | | 0 | 0 | | | 0 | 0 |
| | | කසල කළමනාකරන ව්‍යාපෘති | | | 1500 | 0 | | | 1.59 | 0 |
| | | කොම්පොස්ට් ආශ්‍රිත ව්‍යාපෘති | | | 0 | 0 | | | 0 | 0 |
| | | සෞඛ්‍ය සායන පැවැත්වීම | | | 750 | 0 | | | 0.02 | 0 |
| 04 | වෙනත් පළාත් පාලන සේවා | කඩ කාමර සංවර්ධනය කිරීම | 10000 | 200000 | 15000 | | 2.19 | 11.6 | 3.16 | 0 |
| | | පුස්තකාල අළුත්වැඩියා කිරීම් | | | 25000 | 2500 | | | 7.11 | 0.4 |
| | | සතිපොල සංවර්ධනය | | | 0 | | | | 0 | 0 |
| | | පොදු සනීපරක්ෂක පහසුකම් සංවර්ධනය | | | 10000 | | | | 1.85 | 0 |
| | | වෙළඳ සංකීර්ණ ඉදිකිරීම් | | | 25000 | 50000 | | | 1.24 | 9.31 |
| | | පෙර පාසල් ,දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා නිදහස් උද්‍යාන සංවර්ධනය | | | | 500 | | | 1.05 | 5.28 |
| | | පොදු පහසුකම් සංවර්ධනය | | | 15000 | 15000 | | | 2.95 | 0.83 |

## ඉලක්ක කරා ලඟා වීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| විස්තරය | දුර (කි.මී) හා ප්‍රමාණය | ක්‍රියාකාරකම | වැයකල මුදල (රු.මී) | ප්‍රතිලාභින් සංඛ්‍යාව | ආවරණය කරන ලද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ගණන / ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් පාලන මාර්ග සංර්ධනය | 15.135 කි.මී | ගමනාගමනය සඳහා පහසුකම් සැලසීම සඳහා බොරළු අතුරා මාර්ග සංවර්ධනය කිරීම. | 15.51 | 300000 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 15 තුළ ග්‍රාම සේවා වසම් 80 ක් ආවරණය කෙරේ. |
| | 20.065 කි.මී | කුට්ටිගල් අල්ලා මාර්ග සංවර්ධනය කිරීම. | 133.89 | 350000 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 16 තුළ ග්‍රාම සේවා වසම් 95ක් ආවරණය කෙරේ. |
| | 1.436 කි.මී | කොන්ක්‍රිට් ඇතිරීම. | 13.05 | 250000 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 12 තුළ ග්‍රාම සේවා වසම් 13ක් ආවරණය කෙරේ. |
| | 3.040 කි.මී | තාර ඇතිරීම. | 5.93 | 150000 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 5 තුළ ග්‍රාම සේවා වසම් 05ක් ආවරණය කෙරේ. |
| | 146 | බෝක්කු ඉදිකිරීම හා කාණු පිළිසකර කිරීම. | 35.81 | 30000 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 20 තුළ ග්‍රාම සේවා වසම් 105 ක් ආවරණය කෙරේ. |
| පානීය ජල පහසුකම් ලබාදීම | 09 | ජල පෙරණ පද්ධති සවිකිරීම. | 17.90 | 400000 | ප්‍රා.ලේ.කො.07 ග්‍රා.සේ.ව. 5 |
| | 14 | ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම. | 15.18 | 500000 | ප්‍රා.ලේ.කො.02 ග්‍රා.සේ.ව. 2 |
| | 2 | නල ළිං හා ටැංකි ඉදිකිරීම. | 2.72 | 250000 | ප්‍රා.ලේ.කො.02 ග්‍රා.සේ.ව. 2 |
| වෙනත් පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීම | 2 | පොදු වෙළඳ සංකීර්ණ සංවර්ධනය. | 6.28 | 500000 | ප්‍රා.ලේ.කො.02 ග්‍රා.සේ.ව. 05 |
| | 2 | දිවා සුරකුම් මධ්‍යස්ථාන හා පෙර පාසල් සංවර්ධනය කිරීම. | 5.29 | 250000 | ප්‍රා.ලේ.කො.02 ග්‍රා.සේ.ව. 06 |
| | 2 | පුස්තකාල සංවර්ධනය. | 0.40 | 100000 | ප්‍රා.ලේ.කො.01 ග්‍රා.සේ.ව. 04 |
| | 1 | පොදු සංවර්ධන කටයුතු. | 0.55 | 350000 | ප්‍රා.ලේ.කො.01 ග්‍රා.සේ.ව. 10 |

## තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට කරන ලද දායකත්වය

පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් 2020 වර්ෂයේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

## පළාත් පාලන මාර්ග සංවර්ධනය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයට අදාල සංවර්ධන යෝජනා සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. නමුත් රට තුල ඇතිවී තිබූ කොවිඩ් -19 වසංගත තත්වය හේතුවෙන් තාවකාලිකව 2020 වර්ෂයේ සංවර්ධන වැඩ කටයුතු නතර කිරීමට තීරණය කරන ලදී. ඒ හේතුව නිසා 2020 වර්ෂයේ සංවර්ධන සැලැස්ම අනුමත නොවූ අතර 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන යෝජනා වල අතැති බිල්පත් නිරවුල් කිරීමේ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව පළාත් පාලන මාර්ග සංවර්ධන කටයුතු සඳහා රු. 209,023,863.00ක මුදලක් 611-03-02-2005-24(i) වැය විෂයය යටතේ වෙන්කර දෙන ලදී. එම මුදලින් රු.206,233,797.00ක් වියදම් දරා රු. 2,936,474.00 ඉතිරි විය. ඒ අනුව පළාත් පාලන මාර්ග සංවර්ධනයේ අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ නිරවුල් කිරීම 100% ක ප්‍රතිශතයක ප්‍රගතියක් පෙන්වා ඇත. එසේම අය - වැය සහන සේවා යටතේ වැය විෂයය අංක 611/03/02/2005-33(ii) යටතේ රු. 5,077,445.00 ක මුදලක් ලබාදෙන ලදී. එම මුදලින් අතැති බිල්පත් සඳහා රු. 5,077,444 වියදම් දරා රු. 1.00 මුදලක් ඉතිරි විය. ඒ අනුව ප්‍රගතිය 100%ක් වශයෙන් දැක්විය හැක. 611-03-02-2005-23(vi) වැය විෂයය යටතේ 2020 වර්ෂයේ නව ව්‍යාපෘතියක් සඳහා රු.2,000,000.00 ක් මුදලක් වෙන්කර දී තිබුණ ද පැවති අයහපත් කාළගුණික තත්වය මත එම මාර්ගයේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ අතර අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස 2021 වර්ෂය සඳහා ගෙන යාමට ඉතිරිවිය. ඒ අනුව ගෝලීය තිරසර සංවර්ධන අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති තුළින් මහ ජනතාවට අපහසුවකින් තොරව භාවිතා හැකි මාර්ග සංවර්ධනය කිරිමට හැකියාවක් ලැබුණු අතර ප්‍රතිලාභින් විශාල පිරිසක් ආවරණය වන පරිදි පළාත් පාලන ආයතන 26 තුලම ක්‍රියාත්මක කර ඇත.

## පානීය ජල පහසුකම් ලබාදීම.

611/03/02/2502(24) /(i) වැය විෂයය යටතේ ප්‍රජා ජල පහසුකම් ව්‍යාපෘති සඳහා රු. 37,998,375.00 ක මුදලක් ලබාදෙන ලදී. එම මුදලින් රු. 34,323,117.00 ක් 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද ව්‍යාපෘති සඳහා ගෙවීම් කටයුතු සිදුකර රු. 3,675,258.00ක මුදලක් ඉතිරිවිය. අය - වැය සහන සේවා යටතේ 611/03/02/2502/23(i) වැය විෂයය සඳහා රු. 98,054.00 ක මුදලක් ලබාදෙන ලදී. ඒ අනුව ප්‍රජා ජල පහසුකම් ව්‍යාපෘතිවල සියළු ගෙවීම් අවසන් කර ඇති අතර, ප්‍රගතිය 100% වශයෙන් පෙන්වා දිය හැක. මෙම සියළුම ව්‍යාපෘති සඳහා ගෝලීය තිරසර සංවර්ධන අරමුණු වන "සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම" තේමාව පාදක කර ගනිමින් සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී හා අඩු මිළකට පානීය ජලය සැපයීමේ ඉලක්ක සපුරා ගැනීමට ප්‍රතිලාභින් පනස්දහසකට (50000) ආසන්න ප්‍රමාණයකට ජල පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.

## වෙනත් පළාත් පාලන පහසුකම් ලබාදීම

වෙනත් පළාත් පාලන සේවා වැය විෂයය වන 611/03/02/2502(24)/(iii) යටතේ වෙන්කර ලබාදුන් රු.12,684,464.00 ක මුදලින් රු.12,515,850.00 ක් වියදම දරා රු.132,614.00ක මුදලක් ඉතිරි විය. ඒ අනුව වෙනත් පළාත් පාලන සේවා ව්‍යාපෘතිවල සියළු ගෙවීම් අවසන්කර 99% ක ප්‍රගතියක් පෙන්වා දිය හැකිය. 611/03/02/2202(23)/(i) යටතේ වෙන්කර ලබාදුන් රු.300,000.00 ක මුදලින් රු.299,650.00 ක් වියදම් දරා 100% ප්‍රගතියක් පෙන්වා ඇත.

එසේම 611/03/02/2106(30)/(i) වැය විෂයය යටතේ පොළොන්නරුව නව වෙළඳ සංකීර්ණයේ පිවිසුම් මාර්ගය සහ රථගාල ඉදිකිරීම සඳහා වෙන්කර දුන් මුදල වන රු. 3,039,012.00 ක මුදලින් රු.3,039,012.00 ම වියදම් දරා 100% ප්‍රගතියක් පෙන්වා දී ඇත. නගර හා ජනාවාස පරිපූර්ණ, සවිමත් හා තිරසර ලෙස සකස් කිරීම යන ගෝලීය තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට ප්‍රතිලාභින් දෙලක්ෂයක් (200000)ට පමණ ප්‍රතිලාභ සැලසීමේ ඉලක්ක සපුරා ගනිමින්, පළාත් පාලන ආයතන මට්ටමින් පහසුකම් සංවර්ධනය කරන ලද වෙළඳ සංකිර්ණ, ශ්‍රවණාගාර, වැඩි දියුණු කරන ලද පුස්තකාල, පොදු ස්ථාන සංවර්ධනය කිරීමට හැකියාව ලැබුණි.

**වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.මි) -266**




**වැය කරන ලද මුදල (රු.මි) - 258**




2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව රු.මිලියන 1200ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත වෙන්කර දී තිබුනි. ඒ අනුව පළාත් පාලන මාර්ග සංවර්ධනය සඳහා රු.මි.648ක්, ප්‍රජා ජල පහසුකම් සඳහා රු.මි.235ක්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.මි.40ක් හා වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය කිරීම සඳහා රු.මි.277කුත් වශයෙන් වෙන්කර ගන්නා ලදී.

පළාත් පාලන මාර්ග සංවර්ධනය සඳහා වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මි.53 කට ආසන්න මුදලක් 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ සඳහා වෙන්කර ඉතිරි මුදල වන රු.මි.595 කට ආසන්නව 2020 වර්ෂයේ සංවර්ධනය කල යුතු මාර්ග සඳහා ව්‍යාපෘති සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. නමුත් හදිස්සියේම රටතුළ ඇතිවූ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රජයේ ආයතන විශාල ප්‍රමාණයක් මාස 03 කට ආසන්න කාලයක් වසා දමන ලද අතර අත්‍යාවශ්‍ය සේවා යටතේ සංවර්ධන සැලැස්ම සකස් කිරීම සිදුකරන ලදී. එහෙත් වසංගත තත්වය උග්‍ර අතට පත්වීම මත රටේ සංවර්ධන කටයුතු වලට අමතරව ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳ වඩාත් අවධානයකින් කටයුතු කිරීමට සිදුවූ බැවින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය හා ප්‍රතිපාදන ලබාදීම තාවකාලිකව නතර කරන ලදී. එහෙත් 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 216 කට ආසන්න මුදලක් අප පළාත් පලාන දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී. එම මුදලින් ව්‍යාපෘති 03 ක් අවිච්ඡේද වූ අතර අනෙකුත් සියළුම බිල්පත් හා ව්‍යාපෘති අවසන් කර 99% ක ප්‍රගතියක් කරා පළාත් පාලන දෙපාර්තමේන්තුව ගමන් කරන ලද අතර ව්‍යාපෘති 03 අවිච්ඡේද වීමට ප්‍රධාන වශයෙන්ම බලපාන ලද්දේ වර්ෂ අවසාන කාලයේ පැවති අයහපත් කාළගුණික තත්වයයි. 2020 වර්ෂයේ නව වැඩ සඳහා අනුමැතිය හා ප්‍රතිපාදන ලබා නොදෙන ලදී.

ප්‍රජා ජල පහසුකම් සඳහා 2020 වර්ෂයේ රු.මි.235 ක මුදලක් වෙන්කර ගන්නා ලද අතර 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ සඳහා රු.මි.40ක් අඩුකර රු.මි.195 කට ආසන්න මුදලක් සඳහා ව්‍යාපෘති සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රටේ පැවති තත්වය බලපාන ලද බවත් අතැති බිල්පත හා අවිච්ඡේද වැඩ පළාත් භාණ්ඩාගාරයෙන් ලබාදෙන ලද රු.මි.38 ක මුදලින් රු.මි.35 කට ආසන්නව වියදම් දරා පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ක්‍රියාත්මක වූ පානීය ජල අවශ්‍යතා 100% කින් සපුරාලීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

සන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙන්කර ව්‍යාපෘති සකස් කරන ලද රු.මි.40 කට ආසන්න මුදලට ව්‍යාපෘති අනුමත නොවීම මත ක්‍රියාත්මක කිරීමක් සිදු නොවුණි. 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩද නොතිබු හෙයින් සන අපද්‍රව්‍ය සම්බන්ධ කිසිදු ව්‍යාපෘතියක් 2020 වර්ෂයේ ක්‍රියාත්මක වුයේ නැත.

වෙනත් පළාත් පාලන සේවා යටතේ 2020 වර්ෂය සඳහා රු.මි.277 ක් වෙන්කර තිබුණි. එම ප්‍රතිපාදන තුල පුස්තකාල, සතිපොළ, වෙළඳ සංකීර්ණ, පොදු වැසිකිළි, මගී ආවරණ, කඩ කාමර, පෙරපාසල් හා දිවා සුරකුම් මධ්‍යස්ථාන, උද්‍යාන සංවර්ධනය ඇතුළු සියළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් රු.මි.263 කට ආසන්නව සකස් කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනල ලදී. එහෙත් සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉහත වසංගත තත්වය බාධාවක් වු බැවින් 2020 වර්ෂයේ නව ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක නොවු බව සඳහන් කරමි. 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ සඳහා වෙන්කර දෙන ලද රු.මි.12.5 ක ප්‍රතිපාදනයෙන් සියළුම අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ අවසන් කර 100% ප්‍රගතියක් අත්පත් කර ගනිමින් විශාල ප්‍රතිලාභින් පිරිසකට ප්‍රතිලාභ අත්පත් කරදිමට කටයුතු කරන ලදී.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂයය පථයට හසුවන අරමුණ | මුදල | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | වෙන්කල (රු.මි) | වැය කළ (රු.මි) | |
| ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ප්‍රාදේශිය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතියේ(LDSP) වැඩ 2019 වර්ෂ අවසානයේ ආරම්භ කිරීමට කටයුතු කර ඇත | පළාත් පාලන මාර්ග සංවර්ධනය, ප්‍රජා ජල පහසුකම් සැපයීම, වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය කිරීම. | 197.93 | 19.17 | මේ වන විට ව්‍යාපෘතිය ආරම්භක මට්ටමේ පවතී. |

## ප්‍රාදේශීය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිය (LDSP)

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂයය පථයට හසුවන අරමුණ | මුදල | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | වෙන්කල (රු.මි) | වැය කළ (රු.මි) | |
| පදවිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වලේකඩේ මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. (ලංකා බැංකුව අසල) | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 5.93 | 0.36 | ප්‍රදේශයේ මහජනතාවට ප්‍රශස්ථ මාර්ග පද්ධතියක් හිමි වීම |
| කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියඹලාගස්වැව තම්මැන්නෑව මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | | 5.18 | 0.36 | |
| පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කහල්ල එඬේරගල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | | 6.76 | 0.36 | |
| තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෙරියකුලම මානක්කුලම ප්‍රධාන පාරට කුට්ටිගල් ඇතිරීම. | | 6.37 | 0.94 | |
| කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුඹුක්වැව -මහවැව මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | | 9.89 | 0.37 | |
| කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොහොඹගස්කඩ සිට බඹරහෙල මාර්ගයට තාර දැමීම. | | 8.50 | 0.37 | |
| හොරොව්පොතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රළපනාව මාර්ගයට තාර දැමීම. | | 9.33 | 0.41 | |
| මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මිහින්තලේ සතිපොල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | | 5.80 | 0.37 | |
| ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමූපකාර මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | | 6.01 | 0.37 | |
| නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තරියන්කුලම ප්‍රධාන මාර්ගයට තාර ඇතිරීම. | | 6.76 | 1.05 | |
| ගල්නෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කලංකුට්ටිය දිවුල්සෙවන සිට මීගලෑව මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. (ප්‍රාථමික විදුහල අසල සිට එච්.එම්.ටිකිරිබණ්ඩා මහතාගේ නිවස දක්වා) | | 8.76 | 1.51 | |

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂයය පථයට හසුවන අරමුණ | මුදල | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | වෙන්කල (රු.මි) | වැය කළ (රු.මි) | |
| ම.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යාය 03 හන්දියේ සිට බුරුතගස් හන්දිය දක්වා මාර්ගයට තාර දැමීම . | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 8.53 | 0.37 | |
| නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඹගස්වැව -කුඩාවැව කුකුල්කටුව මාර්ගයට තාර දැමීම. (අඹගස්වැව පන්සල අසල සිට) | | 7.81 | 0.37 | |
| රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තුඹුල්ලේගම - අක්කර 50 මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. (බෝක්කු 03 ක් සමහ) | | 5.48 | 0.95 | ප්‍රදේශයේ මහජනතාවට ප්‍රශස්ථ මාර්ග පද්ධතියක් හිමි වීම |
| මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රඹකුලම හන්දියේ සිට නාගදරනෑවැව මාර්ගයට තාර දැමීම. | | 7.90 | 0.37 | |
| ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ MOH කාර්යාලය සිට පාසල් හන්දිය දක්වා මාර්ගයට කුට්ටිගල් ඇතිරීම | | 6.68 | 0.37 | ප්‍රදේශයේ මහජනතාවට ප්‍රශස්ථ මාර්ග පද්ධතියක් හිමි වීම |
| අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයේ "සුනාත" නිවාඩු නිකේතනය අළුත්වැඩියා කිරීම | වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය කිරීම. | 5.11 | 0.37 | සංචාරක ජනතාවට ප්‍රශස්ථ සේවාවක් සැලසීම |
| දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අජිත් ජෝෂප් මහතාගේ නිවස අසල සිට ශ්‍රියාණි මෙන්ඩිස් මහත්මියගේ නිවස දක්වා මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 10.19 | 1.70 | ප්‍රදේශයේ මහජනතාවට ප්‍රශස්ථ මාර්ග පද්ධතියක් හිමි වීම |
| ඇලහැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියඹලාව පාසල අසල සිට අඹන්ගහ දක්වා මාර්ගයට කුට්ටිගල් ඇතිරීම | | 7.33 | 1.11 | |
| හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. (නවරත්න මහතාගේ නිවස අසල සිට ) | | 7.08 | 1.09 | |
| ලංකාපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ RB -17 ඇල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම | | 5.94 | 0.37 | |

**ප්‍රාදේශීය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිය (LDSP) ඉතිරි කොටස......**

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂයය පථයට හසුවන අරමුණ | මුදල | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | වෙන්කල (රු.මි) | වැය කළ (රු.මි) | |
| මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිවුලන්කඩවල පාසල් මාර්ගයට තාර දැමීම | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 9.85 | 0.37 | ප්‍රදේශයේ මහජනතාවට ප්‍රශස්ථ මාර්ග පද්ධතියක් හිමි වීම |
| පොළොන්නරුව මහා නගර සභා බල ප්‍රදේශයේ 4 ඇල අංක 17/3 නිවස අසල සිට අංක 26 නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | | 4.11 | 0.22 | |
| පොළොන්නරුව මහා නගර සභා බල ප්‍රදේශයේ ස්වර්ණජයන්ති මාවත කුට්ටිගල් ඇතිරීම. (සෙත්මිදේවාල මාවත) | | | | |
| පොළොන්නරුව මහා නගර සභා බල ප්‍රදේශයේ 178 නිශ්ශංක මල්ල පෙදෙසේ ජයමාවත මාර්ගයට කුට්ටිගල් ඇල්ලීම. | | | | |
| පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැවේතැන්න පිවිසීමේ මාර්ගයේ යාය 09 හන්දිය දක්වා කුට්ටිගල් අල්ලීම. | | 6.69 | 1.04 | |
| වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කන්දකඩුව සිට ගල්කන්ද ගම දක්වා මාර්ගයට කුට්ටිගල් අල්ලීම. (ගල්කන්ද හන්දියේ සිට බස් නැවතුම දක්වා) | | 7.81 | 1.33 | |
| තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තඹුත්තේගම දුම්රිය ස්ථානයට යන මාර්ගය කාණුව සමඟ තාර ඇතිරීම. | | 11.51 | 1.86 | |
| රඹෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගෝණෑව හන්දියේ සිට පණ්ඩුකාභයපුර පන්සල දක්වා තාර ඇතිරීම. | | 6.62 | 1.19 | |
| **මුළු එකතුව** | | **197.93** | **19.55** | |

## විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය

| ව්‍යාපාතිය | සංරචකය | ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැයකල මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශිය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිය | පළාත් පාලන මාර්ග සංවර්ධනය | පදවිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වලේකඩේ මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. ( ලංකා බැංකුව අසල) | පදවිය | අසීමාන්තිකයි | 0.36 |
| | | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියඹලාගස්වැව තම්මැන්නෑව මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | කැබිතිගොල්ලෑව | | 0.36 |
| | | පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කහල්ල එඬේරගල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම | පලාගල | | 0.36 |
| | | තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෙරියකුලම මානක්කුලම ප්‍රධාන පාරට කුට්ටිගල් ඇතිරීම. | තිරප්පනේ | | 0.94 |
| | | කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුඹුක්වැව -මහවැව මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | කැකිරාව | | 0.37 |
| | | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොහොඹගස්කඩ සිට බඹරහෙල මාර්ගයට තාර දැමීම | කහටගස්දිගිලිය | | 0.36 |
| | | හොරොව්පොතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රළපනාව මාර්ගයට තාර දැමීම | හොරොව්පොතාන | | 0.41 |
| | | මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මිහින්තලේ සතිපොල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | මිහින්තලේ | | 0.36 |
| | | ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමූපකාර මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | ඉපලෝගම | | 0.36 |
| | | නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තරියන්කුලම ප්‍රධාන මාර්ගයට තාර ඇතිරීම. | නැ.නු.ප | | 1.05 |
| | | ගල්නෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කලංකුට්ටිය දිවුල්සෙවන සිට මීගලෑව මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. (ප්‍රාථමික විදුහල අසල සිට එච්.එම්.ටිකිරිබණ්ඩා මහතාගේ නිවස දක්වා) | ගල්නෑව | | 1.51 |
| | | ම.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යාය 03 හන්දියේ සිට බුරුතගස් හන්දිය දක්වා මාර්ගයට තාර දැමීම . | ම.නු.ප | | 0.36 |

විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය ඉතිරි කොටස....

| ව්‍යාපාතිය | සංරචකය | ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැයකල මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශිය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිය | පළාත් පාලන මාර්ග සංවර්ධනය | නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඹගස්වැව - කුඩාවැව කුකුල්කටුව මාර්ගයට තාර දැමීම.(අඹගස්වැව පන්සල අසල සිට) | නොච්චියාගම | අසීමාන්තිකයි | 0.37 |
| | | රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තුඹුල්ලේගම - අක්කර 50 මාර්ගයට කුට්ටිගල් ඇතිරීම.(බෝක්කු 03 ක් සමඟ) | රාජාංගනය | | 0.95 |
| | | මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රඹකුලම හන්දියේ සිට නාගදරනෑවැව මාර්ගයට තාර දැමීම. | මැදවච්චිය | | 0.36 |
| | | ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ MOH කාර්යාලය සිට පාසල් හන්දිය දක්වා මාර්ගයට කුට්ටිගල් ඇතිරීම | ගලෙන්බිඳුණුවැව | | 0.36 |
| | | දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අජිත් ජෝෂප් මහතාගේ නිවස අසල සිට ශ්‍රියාණි මෙන්ඩිස් මහත්මියගේ නිවස දක්වා මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | දිඹුලාගල | | 1.70 |
| | | ඇලහැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියඹලාව පාසල අසල සිට අඹන්ගහ දක්වා මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. | ඇලහැර | | 1.11 |
| | | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම. (නවරත්න මහතාගේ නිවස අසල සිට ) | හිඟුරක්ගොඩ | | 1.09 |
| | | ලංකාපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ RB -17 ඇල මාර්ගයට කුට්ටිගල් ඇතිරීම | ලංකාපුර | | 0.36 |
| | | මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිවුලන්කඩවල පාසල් මාර්ගයට තාර දැමීම | මැදිරිගිරිය | | 0.36 |
| | | පොළොන්නරුව මහා නගර සභා බල ප්‍රදේශයේ 4 ඇල අංක 17/3 නිවස අසල සිට අංක 26 නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | තමන්කඩුව | | 0.22 |
| | | පොළොන්නරුව මහා නගර සභා බල ප්‍රදේශයේ ස්වර්ණජයන්ති මාවත කුට්ටිගල් ඇතිරීම. (සෙත්මිදේවාල මාවත) | තමන්කඩුව | | - |

විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය ඉතිරි කොටස....

| ව්‍යාපාතිය | සංරචකය | ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැයකල මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශිය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිය | පළාත් පාලන මාර්ග සංවර්ධනය | පොළොන්නරුව මහා නගර සභා බල ප්‍රදේශයේ 178 නිශ්ශංක මල්ල පෙදෙසේ ජයමාවත මාර්ගයට කුට්ටිගල් ඇල්ලීම. | තමන්කඩුව | අසීමාන්තිකයි | |
| | | පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැවේතැන්න පිවිසීමේ මාර්ගයේ යාය 09 හන්දිය දක්වා කුට්ටිගල් අල්ලීම. | තමන්කඩුව | | 1.04 |
| | | වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කන්දකඩුව සිට ගල්කන්ද ගම දක්වා මාර්ගයට කුට්ටිගල් අල්ලීම. (ගල්කන්ද හන්දියේ සිට බස් නැවතුම දක්වා) | වැලිකන්ද | | 1.33 |
| | | තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තඹුත්තේගම දුම්රිය ස්ථානයට යන මාර්ගය කාණුව සමඟ තාර ඇතිරීම. | තඹුත්තේගම | | 1.86 |
| | | රඹෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගෝණෑව හන්දියේ සිට පණ්ඩුකාභයපුර පන්සල දක්වා තාර ඇතිරීම. | රඹෑව | | 1.18 |
| ප්‍රාදේශිය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිය | වෙනත් පළාත් පාලන සේවා | අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයේ "සුනාත" නිවාඩු නිකේතනය අළුත්වැඩියා කිරීම | නැ.නු.ප | | 0.36 |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

### පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) – 2020

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණු | මුදල (රු. මි) | | ප්‍රගතිය (%) | | කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන්කල | වැයකල | භෞතික | මූල්‍ය | |
| තිරප්පනේ ප්‍රාදේශීය සභාව සතු මානක්කුලම දිවුල්වැව පිළිසරු ව්‍යාපෘති භූමියේ කොන්ක්‍රීට් ගල් වැඩපලක් ඉදිකිරීම | වෙනත් සේවා යටතේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | 1.98 | බිල්පත් ඉදිරිපත් කර නැත | 100 | | පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන වැඩිකිරීම. |
| ගල්නෑව බස් නැවතුම්පල ඉදිරිපිට ප්‍රාදේශීය සභාව සතු කඩකාමර වල පළමු මහලේ ඉදිකිරීම | | 1.99 | 1.79 | 100 | 100 | |
| බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා ශබ්ධවාහිනී උපකරණ ලබා ගැනීම | | 0.31 | 0.31 | 100 | 100 | |
| ජල පිරිපහදු ඒකකයක් ඉදිකිරීම | | 1.66 | 1.66 | 100 | 100 | |
| යාය 08 පොළ භූමියේ වන ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | | 1.97 | 1.71 | 100 | 100 | |
| කහටගස්දිගිලිය නගරයේ පොදු වැසිකිළිය ඉදිකිරීම. | | 2.00 | 1.78 | 100 | 100 | |
| කැබිතිගොල්ලෑව පෙර පාසල හා දිවා සුරකුම් මධ්‍යස්ථානයේ ආරක්ෂිත බැම්ම ඉදිකිරීම. | | 0.18 | 0.15 | 100 | 100 | |
| පිරිපහදු කල පානීය ජලය බෙදා හැරීමට සුදු යකඩ ට්‍රැක්ටර් බවුසර් 02ක් මිළදී ගැනීම හා උපාංග මිළ දී ගැනීම,පිරිපහදු මධ්‍යස්ථානයට අවශ්‍ය ජල පෙරණ මිළ දි ගැනීම හා පදවිය ප්‍රාදේශීය සභාව සතු පානීය ජලය බෙදා හරින WPLL – 7381 ජල බවුසරයේ ගියර් බොක්ස් එක ගලවා ඉවත්කර අළුත් ගියර් බොක්ස් එකක් සවි කිරීම. | | 1.99 | 1.69 | 100 | 100 | |
| දියසෙන්පුර සතිපොළ භූමියේ ගේට්ටුව, වැට, අන්තර් බන්ධිත කුට්ටිගල් ඇතිරීම සහ කොන්ක්‍රීට් කාණුව සකස් කිරීම. | | 0.97 | 0.82 | 100 | 100 | |
| ආදාහනාගාරය සඳහා ශාලාවක් ඉදිකිරීම | | 1.99 | 1.77 | 100 | 100 | |
| එකතුව | | **15.05** | **11.68** | | | |

## පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩ සටහන (පුනරාවර්තන) – 2020

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණු | මුදල (රු.මි) | | ප්‍රගතිය (%) | | කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන්කල | වැයකල | භෞතික | මූල්‍ය | |
| තඹාල සතිපොළ භූමිය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම | වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය කිරීම | 0.17 | 0.23 | 100 | 100 | පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන වැඩිකිරීම. |
| ලංකාපුර ප්‍රාදේශීය සභාව ඉදිරිපිට තාප්පය අළුත්වැඩියා කිරීම | | 0.59 | 0.56 | 100 | 100 | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |
| සභාව මඟින් ක්‍රියාත්මක ජලය බෝතල් කිරීමේ ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල වටා ආරක්ෂා සහිත දැල්වැට ඉදිකිරීම. | | 0.29 | 0.28 | 100 | 100 | |
| හිඟුරක්ගොඩ මහජන පුස්තකාලය අළුත්වැඩියා කිරීම | | 1.48 | 1.48 | 100 | 100 | |
| ජල පිරිපහදු ඒකක අළුත්වැඩියා කිරීම | | 0.06 | 0.06 | 100 | 100 | |
| වෙළඳපල කඩකාමර අළුත්වැඩියා කිරීම | | 0.24 | 0.21 | 100 | 100 | |
| ගෝණපතිරාව ආයුර්වේද බෙහෙත් ශාලාව | | 0.34 | 0.30 | 100 | 100 | |
| නැණසල මධ්‍යස්ථානය | | 0.34 | 0.30 | 100 | 100 | |
| වීරීපහන් අළුත්වැඩියාව සඳහා විදුලි උපකරණ මිළදී ගැනීම | | 0.30 | 0.30 | 100 | 100 | |
| දියබෙදුම දෙහිවත්ත කඩකාමර හා දෙහිවත්ත සතිපොළ අළුත්වැඩියා කිර | | 0.28 | 0.15 | 100 | 100 | |
| තිරප්පනේ නගරයේ කසල කළමනාකරණය සඳහා කසළ බඳුන් මිළදී ගැනීම | | 0.17 | බිල්පත් ඉදිරිපත් කර නැත | 100 | | |
| ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රවලට අවශ්‍ය ටයර් මිළදී ගැනීම | | 0.62 | | 100 | | |
| හෙරොව්පොතාන සතිපොල භූමියේ වැට සහ ගේට්ටුව අළුත්වැඩියා කිරීම | | 0.17 | 0.17 | 100 | 100 | |
| හොරොව්පොතාන ප්‍රාදේශීය සබාවේ ප්‍රධාන ගොඩනැගිල්ල හා වැසිකිළිය අළුත්වැඩියා කිරීම | | 0.30 | 0.30 | 100 | 100 | |
| මැදිරිගිරිය ප්‍රා.සභාවට අයත් නව නගරය නිල නිවස සතු වැසිකිළිය අළුත්වැඩියා කිරීම | | 0.40 | 0.38 | 100 | 100 | |
| මැදිරිගිරිය පොල භූමියේ වැට ප්‍රතිසංස්කරණය කිරීම | | 0.35 | 0.35 | 100 | 100 | |

පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩ සටහන (පුනරාවර්තන) – 2020 ඉතිරි කොටස.......

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණු | මුදල (රු.මි) | | ප්‍රගතිය( %) | | කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන්කල | වැයකල | භෞතික | මූල්‍ය | |
| 5 කණුව ත්‍රී රෝද රථගාල නවීකරණය කිරීම | | 0.17 | 0.15 | 100 | 100 | |
| ගෙවීම් කිරීමට පෙරටු කාර්යාලය නවීකරණයට අවශ්‍ය පරිගණක 02ක් ස්කෑන් යන්ත්‍රයක්, ප්‍රින්ටරයක් මිළදී ගැනීම | | 0.22 | 0.29 | 100 | 100 | |
| සභා රැස්වීම් ශාලාවේ ඇමතිමේ උපකරණ කට්ටලයක් මිළදී ගැනීම | | 0.78 | 0.69 | 100 | 100 | |
| ගල්නෑව ප්‍රාදේශීය සබාව සතු ආර්ඹි පද්ධතියේ අලෙවි කුටියේ අළුත්වැඩියා කිරීම | | 0.32 | බිල්පත් ඉදිරිපත් කර නැත | 100 | | |
| දිවා සුරකුම් මධ්‍යස්ථානයේ ඉතිරි කොටසේ වැට සකස් කිරිම | වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය | 0.30 | | 100 | | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |
| වැලිකන්ද නගරයේ දුම්රිය ස්ථානය සහ මුරපොළ අතර කොටසේ ජලනල පද්ධතිය දීර්ඝ කිරීම | | 0.29 | බිල්පත් ඉදිරිපත් කර නැත | 100 | | |
| RC -6622 දරණ ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව | | 0.03 | 0.03 | 100 | 100 | |
| HY-9437 දරණ ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව | | 0.06 | 0.05 | 100 | 100 | |
| NCP/RC/32 දරණ ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව | | 0.13 | 0.13 | 100 | 100 | |
| එකතුව | | **8.43** | **6.39** | | | |

පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වු අතර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ප්‍රාදේශීය සභාවල ස්වයං උත්පාදන ආදායම් වර්ධනය, ප්‍රාදේශිය සභාවල ආදායම් තත්වය ඉහළ නැංවීම වැනි කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිඵල කරා ළඟා වීම අපේක්ෂාව විය.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශය/ අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2021 | 2022 | කෙටිකාලීන | දිගුකාලීන |
| 1. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතන අංශය | 1.දෙපාර්තමේන්තු තනතුරු වලට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.<br>2.සියළුම පළාත් පාලන ආයතන සේවකයින්ගේ පෞද්ගලික ලිපිගොනු වල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම.<br>3. පළාත් පාලන ආයතන වල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. | 1.දෙපාර්තමේන්තු ගත තනතුරු වලට අයත් සියළුම සේවකයන් සඳහා නියමිත සේවා උසස්වීම් ලබා දීම.<br>2.දෙපාර්තමේන්තු තනතුරු වල පුරප්පාඩු සම්පූර්ණ කිරීම. | පළාත් පාලන ආයතනවල සේවකයින් ස්ථිර කිරීම, සේවා උසස්වීම් නියමිත කාලයට ලබාදීම හා නියමිත දින වලට විශ්‍රාම ගැන්වීම. | සේවක අභිප්‍රේරණය ඇති කිරීම තුළින් නිළධාරින්ගෙන් ඵලදායි හා ගුණාත්මක සේවාවක් ලබා ගැනීම. |
| 2. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය | අත්තිකාරම් බී ගිණුම, බැංකු සැසදුම් හා පොදු තැන්පත් ආදී ගිණුම් ලේඛන යාවත් කාලීන කිරීම , විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම. | 1.නිවැරදි කරන ලද ගිණුම් ක්‍රම | ගිණුම් ක්‍රම නිවැරදිව පවත්වාගෙන යාම | ලැබෙන විගණන විමසුම් අවම කර ගැනීම |
| 3.පළාත් පාලන දෙපාර්තමේන්තුවේ,<br>1. ප්‍රජා සංවර්ධන අංශය | 1.සියළුම පලාත් පාලන ආයතන වලට 2020 වර්ෂයට අදාල ප්‍රජා සංවර්ධන ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම.<br>2.එම සැලැස්මට අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය,සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන්, පරිසර සංරක්ෂණ වැඩ සටහන්, පුස්තකාල සේවාව ආදී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම, සහ මහජන පැමිණිළි හා දුක් ගැනවිලි අනුව ප්‍රජාවට ක්ෂණික පිළිතුරු සැපයීම කාර්යක්ෂම කිරීම. පෙරටු කාර්යාල ක්‍රමය ස්ථාපිත කිරීම, ප්‍රජා මණ්ඩල සවිබල ගැන්වීම | 1.ඉහත සඳහන් ඉලක්ක යාවත්කාලීන කිරීම. | 1.පළාත් පාලන ආයතන වල ජනනය වන ඝන අපද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කිරීමේ අවස්ථාවේ සිට අවසන් බැහැරලන අවස්ථාව දක්වා ප්‍රජාවගෙන් ඉටුවිය යුතු කාර්යයන් විධිමත් කිරීම.<br>2.පුස්තකාල පරිහරණය කරන පාඨක ප්‍රමාණය ඉහල නැංවීම.<br>3.යහපත් සෞඛ්‍ය පුරුදු වලින් සහ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් බෝවන රෝග සහ බෝ නොවන රෝග අඩුකිරීම.<br>4.මහජන දුක් ගැනවිලි වලට කඩිනම් විසඳුම් ලබාදිම.<br>5.ප්‍රජා මණ්ඩල සවිබලගැන්වීම මඟින් පළාත් පාලන ආයතන වල සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම | 1.උතුරු මැද පලාතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම හා ගැටළු අවම කිරීම.<br>2.සෞඛ්‍ය ගැටළු ප්‍රමාණය අවම කිරීම.<br>3.පළාත් පාලන ආයතන වල තීන්දු තීරණ ගැනීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා දායකත්වය ඉහළ ප්‍රමාණයෙන් ලබා ගැනීම. |

| | | | | |
|---|---|---|---|---|
| 02.විමර්ශන අංශය | 1.පළාත් පාලන ආයතන වල කාර්ය සාධනය ඉහල නැංවීමට නිවැරදි මඟ පෙන්වීම. | 1.පළාත් පාලන ආයතන වල කාර්ය සාධනය ඉහළ නැංවීම. | 1.ස්වයං උත්පාදන ආදායම හා හිඟ ආදායම් අයකර ගැනීම තුළින් ප්‍රදේශයේ සංවර්ධන සැලසුම් සකස් කර ප්‍රමුඛතාගත කිරීම | 1.ස්වයං උත්පාදන ආදායම් මාර්ග හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කර ආදායම් එකතු කිරීම හා හිඟ ආදායම් අවම කර සංවර්ධන සැලසුම් ප්‍රමුඛතා ලේඛනයට අනුව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන මෙහෙයවීම. |
| 03.සංවර්ධන අංශය | 1.පළාත් පාලන ආයතන තුල ඇති සංවර්ධනය කල යුතු ස්ථාන හඳුනාගෙන වැඩි පිරිසකට ප්‍රතිලාභ ලැබෙන සේ සංවර්ධන ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.<br><br>2.අධීක්ෂණය මෙහෙයවීම හා ප්‍රගතිය ඇගයීම තුළින් ප්‍රශස්ථ මට්ටමින් ව්‍යාපෘති නිම කිරීම.<br><br>3.පළාත් පාලන පනත් මඟින් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති මංමාවත්, සෞඛ්‍ය හා මහජන උපයෝගිතාවය වර්ධනය වන අයුරින් වඩ සටහන් සකස් කර ප්‍රජාවට සුභසාධන පහසුකම් සැලසීම. | 1.2020 දී ක්‍රියාත්මක කරන ලද ඉලක්කයන්ගේ ප්‍රගතිය සංවර්ධනය කිරීම. | 1.ප්‍රජාවට අවශ්‍ය පානීයජල පහසුකම් ලැබීම.<br><br>2.ග්‍රාමීය ප්‍රජාව කියවීමට හුරු කිරීම.<br><br>3.ප්‍රජාවගේ සෞඛ්‍ය පුරුදු හුරු කිරීම.<br><br>4.අධ්‍යාපනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br><br>5.මාර්ග පහසුකම් සැලසීම<br><br>6.කසල කළමනා. පිළිබඳ ප්‍රජාව දැනුවත් වීම. | 1.ස්වයං උත්පාදන අවස්ථාවන් ඇතිවීම තුළින් ජන ජීවිතය සවිමත් කිරීම.<br><br>2.අධ්‍යාපන මට්ටමින් පිරිපුන් පිරිසක් පළාත තුල සිටීම.<br><br>3.නීරෝගී සෞඛ්‍ය පුරුදු වලින් හා නීරෝගී ජන පිරිසක් පළාත තුල සිටීම.<br><br>4.පිරිසිදු පානීය ජල ලැබීම මඟින් බෝ නොවන රෝගීන් ප්‍රමාණය අවම කිරීම.<br><br>5.කෙටිකාලකින් අවශ්‍ය ස්ථානය කරා ලඟා වීමට හැකි මාර්ග පද්ධතියකින් සපිරි පළාතක් ඇති කිරීම. |

ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය ඉතිරි කොටස............

| අංශය/ අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | **2021** | **2022** | කෙටිකාලීන | දිගුකාලීන |
| 04.පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය | තාක්ෂණික අංශය වෙත නිරන්තර පුහුනුවීම්,දැනුවත් කිරීම් සහ උපදේශන සේවා සැපයීම | තාක්ෂණික අංශය වෙත නිරන්තර පුහුනුවීම්, දැනුවත් කිරීම් සහ උපදේශන සේවා සැපයීම | ඉහළ ප්‍රමිතියෙන් යුත් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම | ඉහළ ප්‍රමිතියෙන් යුත් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම |
| | ඉංජිනේරු අංශය සඳහා වඩා කාර්යක්ෂම සැලැස්මක් සකස් කිරීම | සකස් කරන ලද සැලැස්මේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට සැලසුම් කිරීම | සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන ඉතා ඵලදායි මට්ටමේ ව්‍යාපෘති සඳහා යෙදවීම සම්බන්ධයෙන් සහතික වීම | සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන ඉතා ඵලදායි මට්ටමේ ව්‍යාපෘති සඳහා යෙදවීම සම්බන්ධයෙන් සහතික වීම |
| | නවීන තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් නිරන්තරයෙන් තාක්ෂණ නිළධාරින් යොමු කිරීම | නවීන තාක්ෂණය භාවිතවය සම්බන්ධයෙන් නිරන්තරයෙන් තාක්ෂණ නිළධාරින් යොමු කිරීම | වඩා කාර්යක්ෂම, නවීන ක්‍රම මත පදනම්ව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු නිම කිරීම | වඩා කාර්යක්ෂම, නවීන ක්‍රම මත පදනම්ව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු නිම කිරීම |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම | ඝන අපද්‍රව්‍ය කළමනාකරනය පිළිබඳ වැඩ පිළිවෙල තව දුරටත් සංවර්ධනය කිරීම හා කාර්යක්ෂම කිරීම | කසල ඵලදායි අයුරින් කළමනාකරණය කර පිරිසිදු පළාත් පාලන ආයතන පරිසරයක් ගොඩනැංවීම | කසල ඵලදායි අයුරින් කළමනාකරණය කර පිරිසිදු පළාත් පාලන ආයතන පරිසරයක් ගොඩනැංවීම |
| | පළාත් පාලන ආයතන මාර්ග පද්ධතිය නවීකරණය කිරීම හා මැනවින් නඩත්තු කිරීම | පළාත් පාලන ආයතන මාර්ග පද්ධතිය වඩා උසස් මට්ටමකින් පවත්වා ගැනීම | ජනතාවට වඩා උසස් තත්වයේ මාර්ග පද්ධතියක් පරිහරණය සඳහා අවස්ථාව සලසා දීම | ජනතාවට වඩා උසස් තත්වයේ මාර්ග පද්ධති පරිහරණය සඳහා අවස්ථාව සලසා දීම |

## වියදම් සාරාංශය

| වෙන්කළ කාර්යය | වෙන් කරන ලද මුදල (රු.මි) | වැය කල මුදල (රු.මි) | අවිච්ඡේද වැඩ වටිනාකම (රු.මි) | ව්‍යාපෘති ගණන | ගෙවීම් කර අවසන් ව්‍යාපෘති ගණන | ඉතිරි වු ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික [illegible] |
| පළාත් පාලන මාර්ග සංවර්ධනය | 216.10 | 211.44 | 2.52 | 262 | 260 | 2 |
| පානීය ජල පහසුකම් සැපයීම | 37.99 | 34.32 | - | 23 | 23 | - |
| වෙනත් පළාත් පාලන සේවා | 12.65 | 12.51 | - | 9 | 9 | - |
| **එකතුව** | **266.75** | **258.28** | **2.52** | **294** | **292** | **-** |

## විදේශ ව්‍යාපෘති වෙතින් ලද ව්‍යාපෘති

| අ.අ | වෙන් කරන ලද කාර්යය | පළාත් පාලන ආයතන ගණන | ව්‍යාපෘති ගණන | වෙන්කල මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | පළාත් පාලන මාර්ග සංවර්ධනය කිරීම | 25 | 28 | 192.82 | 18.80 |
| 02 | වෙනත් පළාත් පාලන සේවා | 01 | 01 | 5.11 | 0.37 |
| **එකතුව** | | **26** | **29** | **197.93** | **19.17** |

## රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

| වෙන්කරන ලද කාර්යය | පළාත් පාලන ආයතන ගණන | ව්‍යාපෘති ගණන | වෙන්කල මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|
| ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන (ප්‍රාග්ධන) | 09 | 10 | 15.05 | 11.68 |
| ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන (පුනරාවර්තන) | 15 | 25 | 8.43 | 6.39 |
| **එකතුව** | **24** | **35** | **23.49** | **18.08** |

## කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති- 2020

### ග්‍රාමිය මාර්ග සංවර්ධන කිරිම -2020 (සපිරි ගමක්)
### නොච්චියාගම ප්‍රාදේශීය සභාව

ළිදවැව සිට වැලිවැව දක්වා මාර්ගය බොරළු අතුරා සංවර්ධනය කිරිම



ළිදවැව වැව් වානේ සිට හේන් යාය දක්වා මාර්ගය බොරළු අතුරා සංවර්ධනය කිරිම



328 තුලානයේ තිඹිරිවැව යොවුන් ගම්මාන මාර්ගය බෝක්කුවක් ඉදිකර කාණු කැපිම



කරඹෑව පන්සල අසල සිට නැලවගම දක්වා මාර්ගය සංවර්ධනය කිරිම





දංගහ මාර්ගය බෝක්කුවක් දමා සංවර්ධනය කිරිම

නිකවැව හන්දිය ඇල පාරේ එම්.බී.රලපානව මහතාගේ නිවස අසල මාර්ගයේ සිට එස්.කේ දිසානායක මහතාගේ නිවස දක්වා මාර්ගය කුට්ටිගල් ඇතිරිම



## 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

### 1. පළාත් පාලන මාර්ග සංවර්ධනය

පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් 2021 වසරේද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි තෝරා ගන්නා ලද මාර්ග සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. 2019 වර්ෂයේ සංවර්ධන සැලැස්ම මඟින් බොහෝ මාර්ග සංවර්ධනය කළ බව තහවුරු කරන අතර, 2020 වසරේ රට තුළ ඇතිවී තිබූ කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොවූ අතර 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ සඳහා වෙන්කර දෙනු ලැබූ ප්‍රතිපාදන වලින් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 100% නිමකිරීමට හැකියාව ලැබුණි. 2021 වර්ෂයේ අය -වැය මඟින් වෙන්කර දී ඇති ප්‍රතිපාදන මට්ටම පිළිබඳ සැලකිලිමත් වෙමින් හා සංවර්ධනය කල යුතු ග්‍රාමීය මාර්ග සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් සංවර්ධන කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. මෙම සංවර්ධන කටයුතු අතර බොරළු, කුට්ටිගල්, කාපට්, කොන්ක්‍රීට් හා මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් බෝක්කු හා කාණු පද්ධති ඉදිකරමින් මාර්ග සංවර්ධනය කිරීමට වැඩි අවස්ථාවක් ලබා දීමට කටයුතු කර ඇත්තේ ලැබෙන ප්‍රතිපාදන සීමාව තුල උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කාර්යය නිම කිරීම හා ග්‍රාමීය ජනතාවට තම අවශ්‍යතාවයන් අපහසුතාවයකින් තොරව ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ප්‍රවේශ පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකිරීමේ අපේක්ෂාවෙනි.

### 2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2021 වසරේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විශේෂ අවධානයක් යොමු කිරීමට කටයුතු කර ඇත. ගෝලීය තිරසර සංවර්ධන අරමුණු වල ඉලක්ක සපුරා ගැනීම හා වර්තමාන ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේදී පළාත් පාලන ආයතන සම්බන්ධ කර ගනිමින් කසල කළමනාකරණ මධ්‍යස්ථාන වල අඩුපාඩු සම්පූර්ණ කිරීම හා පිළිසරු මධ්‍යස්ථානවල කසල අංගන සංවර්ධනය කිරීම යන කරුණු ඔස්සේ සැලසුම සකස් කර ඇත.

### 3. ප්‍රජා ජල පහසුකම් සැපයීම

වර්තමානයේ සිදුවෙමින් පවතින ගෝලීය දේශගුණික විපර්යාසයන් නිසා කලට වැසි නොලැබීම නිසා වසරේ දීර්ඝ කාලයක් දැඩි නියඟය සහිත කාලගුණික තත්වයක් ඇති අප පළාතේ බොහෝ ග්‍රාමීය ජනතාව පානීය ජල හිඟයෙන් පෙළේ. එවැනි තත්වයක් යටතේ පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා ජල ව්‍යාපෘති වලින් විශාල සමාජ මෙහෙවරක් සිදු වී ඇත. කෘෂි කර්මාන්තය සඳහා වැඩි වශයෙන් රසායනික පොහොර වර්ග භාවිතා කිරීම ඒවා ගංගා ඇළ දොළ වෙත මුදාහැරීම මඟින් ජල මූලාශ්‍ර අපවිත්‍ර වීමට පටන් ගෙන ඇත. සෑම වසරකම ග්‍රාමීය ජනතාවට බීමට සුදුසු ජලය ලබාදීමේ අරමුණින් ඉටුකරනු ලබන ජල ව්‍යාපෘති ආරම්භ කලද ජල මූලාශ්‍ර සිඳී යාමේ අවධානමක්ද ද දක්නට ඇත. එසේම බීමට නුසුදුසු ජලය පානය කිරීම තුලින් වකුගඩු රෝග, පිළිකා වැනි දරුණු රෝගී තත්වයන් පැතිරීයාම අප පළාතේ විශේෂයෙන් දක්නට ඇති ප්‍රධාන සෞඛ්‍යමය ගැටළුවකි. අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ හත්වන කොටසින් පෙන්වා දෙන අකාරයට ජල සම්පත් නිසි පරිදි රැක ගැනීම හා සැමට ජලය ලබාදීමේ අරමුණ තේමා කර ගනිමින් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ප්‍රජා ජල පහසුකම් සැපයීමේ සංවර්ධන ව්‍යාපෘති තුලින් ජනතාවට සහනයක් සැලසීමට අපේක්ෂා කරනු ලබයි.

## 4. වෙනත් පළාත් පාලන සේවා

වෙනත් පළාත් පාලන සේවා යටතේ මෙම වර්ෂයේදී සති පොළ සංවර්ධනය කිරීම, සංචාරක නිකේතන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල් වැඩි දියුණු කිරීම තුළින් පළාත් පාලන ආයතන සඳහා ස්වයං උත්පාදන ආදායම් අවස්ථාවන් උත්පාදනය කරන අතර, මහජන සේවාවන් පුළුල් කිරීමට ද අපේක්ෂා කෙරේ. මහජන සුභසාධන අංශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් පොදු වැසිකිළි පද්ධති, පුස්තකාල, ළමා උද්‍යාන හා විථි ලාම්පු සවිකිරීම් වැඩි දියුණු කිරීම් හා සංවර්ධන කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ. මෙම සංවර්ධන ව්‍යාපෘති මගින් පළාත් පාලන ආයතන වල ආදායම් උත්පාදන අවස්ථාවන් වැඩි වීම හා සේවා ගුණාත්මකභාවය තුලින් ආදායම් තත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ පස්වන කොටසින් පෙන්වා දෙන ආකාරයට සංචාරක කර්මාන්තය මෙරට ප්‍රධාන ආදායම් ප්‍රභවයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ද අපගේ දායකත්වය හිමි විය යුතුය. ඒ අනුව සංචාරකයින් ශ්‍රී ලංකාව කෙරෙහි ආකර්ෂණය වන ප්‍රධාන සිද්ධස්ථාන පිහිටි පළාතක් වන බැවින්, ස්වභාව සෞන්දර්යට අමතරව සංචාරකයන්ගේ විනෝදාස්වාදය පදනම් කර ගනිමින් කෘෂි කාර්මික හා ස්වභාවික වනාන්තර පදනම් කර ගත් උද්‍යාන ඇති කිරීම, ආගමික, සංස්කෘතික, දේශිය ආයුර්වේද වැනි අංශ සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් එකී ඉලක්ක සැපිරෙන සංවර්ධන සැලසුම් සකස් කෙරේ.

එලදායී පුරවැසියෙක් හා සතුටින් ජීවත්වන පවුලක් යන තේමාව යටතේ ජව සම්පන්න තාරුණ්‍යයට ක්‍රීඩාවේ සවිබලය අරමුණු කර ගනිමින් පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ඇති ක්‍රීඩා පිටි සංවර්ධනය කිරිම ද පළාත් පාලන සංවර්ධන සැලැස්මේ වෙනත් පළාත් පාලන සේවා යටතේ ක්‍රියාත්මක කරනු ඇත. පුස්තකාල සේවා සංවර්ධනය කිරීම යටතේ අළුත් පොත් පත් ලබාදීම හා කියවීමට සුදුසු පරිසරයක් ඇතිකිරීම වැනි කටයුතු සිදුකිරීමට අපේක්ෂිතය. මේ සඳහා පළාත් පාලන ආයතන යටතේ ඇති පුස්තකාල පාඨක සමාජවල සාමාජිකයින් වැඩි කර ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසුම් කිරීම සිදු කෙරේ. ඒ අනුව පුස්තකාල ආශ්‍රිතව ස්ථාපනය කර ඇති නැණසල මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම මගින් දරුවන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම හා දරුවන් කියවීම සඳහා යොමුකිරීමේ වැඩමුළු පැවැත්වීමට ද කටයුතු සැලසුම් කර ඇත.

### කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2020 වර්ෂය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත වෙන්කර තිබූ මිලියන 1200 ක මුදලට අදාල සංවර්ධන ව්‍යාපෘති රාශියක් ඉටුකිරීම සඳහා සැලසුම් සකස් කර පළාත් සැලැසුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එහෙත් වර්ෂය ආරම්භයේදීම රට තුළ ඇතිවූ කොවිඩ් -19 වසංගත තත්වය නිසා රජයේ දෙපාර්තමේන්තු හා කාර්යාල මාස කිහිපයකට වසා දමන ලදී. එම නිසා සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදීම ප්‍රමාද වූ අතර කොවිඩ් වසංගතය නිසා දුෂ්කරතාවයන්ට මුහුණු දුන් ජනතාව සඳහා සහන සැලසීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල පිහිටි සියළුම රජයේ කාර්යාල, පාසල්, පොදු ස්ථාන, මූල්‍ය කටයුතු සිදුකරන ස්ථාන විෂබීජහරණය කිරීම දෙපාර්තමේන්තුව යටතේ සිදුකරන ලද විශාල කාර්ය භාරයකි.

එසේම පළාත් පාලන ආයතන බලප්‍රදේශවල ජනතාවට සහන සැලසීම සඳහා වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමද විශාල මුදලක් වියදම් කරමින් සිදුකර ඇත. එම නිසා 2020 වර්ෂයේ ග්‍රාමීය සංවර්ධන කටයුතු වෙන්කර තිබූ මුදල් කොවිඩ් 19 වසංගත තත්වය මත සහන සැලසීමට යොදාගැනීමට සිදුවූ බැවින් 2020 වර්ෂයේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට නොහැකි විය.

2020 වර්ෂය සඳහා වාර්ෂික විසර්ජන ගිණුමෙන් නව වැඩ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුනොවූ අතර 2019 වර්ෂයේ සියළුම අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ වටිනාකම් පියවා ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කර දෙන ලදී. ඒ අනුව සියළුම අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ අවසන් කර 100% ක ප්‍රගතියක් කරා ලගාවීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත හැකියාව ලැබුණි.

ප්‍රාදේශීය සහයෝගිතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 26 ක් ආවරණය කරමින් ව්‍යාපෘති 29 ක් ක්‍රියාත්මතක කරන ලද අතර, එක් ව්‍යාපෘතියක්වත් 100% කින් නිම කර ගැනීමට නොහැකි වූයේ රටතුල පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් ශ්‍රම දායකත්වය ලබාගැනීමට ප්‍රමාණවත් මානව සම්පත් ලබාගැනීමට නොහැකි වූ බැවිනි. එහෙත් ලැබුණු ප්‍රතිපාදන ආපසු යාමට නොදී සෑම ව්‍යාපෘතියක්ම උපරිම අයුරින් නිම කිරීමේ බලාපොරොත්තු ඇතිව සියළුම ව්‍යාපෘති ආරම්භ කරන ලදී. එහෙත් වර්ෂ අවසාන කාලයේ රටතුල පැවති අයහපත් කාලගුණය මාර්ග වැඩ කරගෙන යාමට අපහසු ආකාරයෙන්ම පැවති බැවින් අපේක්ෂිත ප්‍රතිඵල ලභාකර ගැනීමට නොහැකි විය.

# 6.2. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ආයතන

1. පාසල්
2. කලාප අධ්‍යාපන කාර්යාල
3. කොට්ඨාස අධ්‍යාපන කාර්යාල
4. අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන
5. ගුරු සංවර්ධන මධ්‍යස්ථාන
6. පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන
7. පරිගණක සම්පත් මධ්‍යස්ථාන

## උතුරුමැද පළාත් පාසල් වර්ගීකරණය - 2020

| කලාපය | ජාතික පාසල් | පළාත් පාසල් | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | 1AB | 1C | T2 | T3 | |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | | | |
| අනුරාධපුර | 3 | 12 | 30 | 45 | 53 | 140 |
| තඹුත්තේගම | 1 | 8 | 11 | 26 | 27 | 72 |
| කැකිරාව | 1 | 9 | 31 | 25 | 65 | 130 |
| ගලෙන්බිදුණුවැව | 0 | 4 | 18 | 25 | 48 | 95 |
| කැබිතිගොල්ලෑව | 1 | 6 | 12 | 41 | 68 | 127 |
| **එකතුව** | **6** | **39** | **102** | **162** | **261** | **564** |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | | | |
| පොළොන්නරුව | 3 | 9 | 9 | 15 | 21 | 54 |
| හිඟුරක්ගොඩ | 5 | 9 | 9 | 26 | 51 | 95 |
| දිඹුලාගල | 1 | 7 | 17 | 16 | 64 | 104 |
| **එකතුව** | 9 | 25 | 35 | 57 | 136 | 253 |
| **උතුරු මැද පළාත** | 15 | **64** | **137** | **219** | **397** | **817** |

1AB- අ.පො.ස(උ.පෙළ) විද්‍යා විෂය ධාරාව සහිත පාසල්
1C- අ.පො.ස(උ.පෙළ) පවතින නමුත් විද්‍යා විෂය ධාරාව නොමැති පාසල්
T2-පළමුවන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඇති පාසල්
T3- පළමුවන ශ්‍රේණියේ සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති පාසල්

## උතුරු මැද පළාතේ මූලික අධ්‍යාපන තොරතුරු

2020 වර්ෂයේදී පළාත් සභාව විවිධ මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් උතුරු මැද පළාත් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය උදෙසා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කළ හැකි විය. උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් ඒ යටතේ ක්‍රියාත්මක කලාප අධ්‍යාපන කාර්යාල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සහ සමස්ත පාසල් පද්ධතියේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය මඟින් ගුණාත්මක අධ්‍යාපනයක් කරා උතුරු මැද පළාත ගෙනයාම මුඛ්‍ය පරමාර්ථය විය. උතුරින් උතුරු පළාතටත්, නැගෙනහිරින් නැගෙනහිර පළාතටත්, බටහිරින් වයඹ පළාතටත්, දකුණින් මධ්‍යම පළාතටත් මායිම් වන රජරට නුවරකළාවිය හෙවත් වැව් බැඳි රාජධානිය ලෙස විරුදාවලිය ලද උතුරු මැද පළාත පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වේ.පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත උතුරු මැද පළාත අධ්‍යාපන කලාප 08 කින් යුක්ත වේ. අනුරාධපුර, කැකිරාව, තඹුත්තේගම, ගලෙන්බිඳුණුවැව හා කැබිතිගොල්ලෑව යන අධ්‍යාපන කලාප 05 අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් අතර පොළොන්නරුව, හිඟුරක්ගොඩ හා දිඹුලාගල යන අධ්‍යාපන කලාප 03 පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වේ.

## අධ්‍යාපන කලාප හා කොට්ඨාස පිහිටීම - උතුරු මැද පළාත




මෙම කලාප අධ්‍යාපන කාර්යාල 08 යටතේ අධ්‍යාපන කොට්ඨාස තිහක් පාලනය වන අතර උතුරු මැද පළාතට අයත් අධ්‍යාපන කලාප 08 හා අධ්‍යාපන කොට්ඨාස 30 සහ පාසල් 817 හි ව්‍යාප්තිය පහත වගුව පරිදි දැක්වේ.

## අධ්‍යාපන කලාප අනුව කොට්ඨාස සහ පාසල් සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | කලාපය | කොට්ඨාස සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | ජාතික පාසල් | පළාත් පාසල් | එකතුව |
| අනුරාධපුර | අනුරාධපුරය | 6 | 3 | 137 | 140 |
| | කැකිරාව | 5 | 1 | 129 | 130 |
| | තඹුත්තේගම | 4 | 1 | 71 | 72 |
| | ගලෙන්බිඳුණුවැව | 3 | 0 | 95 | 95 |
| | කැබිතිගොල්ලෑව | 4 | 1 | 126 | 127 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **22** | **6** | **558** | **564** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 2 | 3 | 51 | 54 |
| | හිඟුරක්ගොඩ | 3 | 5 | 90 | 95 |
| | දිඹුලාගල | 3 | 1 | 103 | 104 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **8** | **9** | **244** | **253** |
| **උතුරු මැද පළාත** | | **30** | **15** | **802** | **817** |

මෙම පාසල් අටසිය දාහතෙන් (817) 1 ඒබී පාසල් හැට හතරකින් (64 ), 1 සී පාසල් එකසිය තිස්හතක් (137), Type 2 වර්ගයේ පාසල් දෙසිය දහනමයක් (219) සහ Type 3 වර්ගයේ පාසල් තුන්සිය අනු හතකින් (397) සමන්විත වේ.

| කලාපය | 1 AB | 1 C | Type 2 | Type 3 | එකතුව |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 12 | 30 | 45 | 53 | 140 |
| කැකිරාව | 9 | 31 | 25 | 65 | 130 |
| තඹුත්තේගම | 8 | 11 | 26 | 27 | 72 |
| ගලෙන්බිඳුණුවැව | 4 | 18 | 25 | 48 | 95 |
| කැබිතිගොල්ලෑව | 6 | 12 | 41 | 68 | 127 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **39** | **102** | **162** | **261** | **564** |
| පොළොන්නරුව | 9 | 9 | 15 | 21 | 54 |
| හිඟුරක්ගොඩ | 9 | 9 | 26 | 51 | 95 |
| දිඹුලාගල | 7 | 17 | 16 | 64 | 104 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **25** | **35** | **57** | **136** | **253** |
| **උතුරු මැද පළාත** | **64** | **137** | **219** | **397** | **817** |

## පාසල් වර්ගීකරණය අනුව පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප මට්ටමින්

උතුරු මැද පළාතේ 2020 වර්ෂය අවසන් වනවිට පාසල් 817 ක් පැවති අතර එහි සිසුන් දෙලක්ෂ අනුහත්දහස් අටසිය පනහක් (297,850) ඉගෙනුම ලබා ඇත. ක්‍රියාත්මක පාසල් 817 න් 802 ක් පළාත් සභා පාසල් වන අතර පාසල් 15 ක් ජාතික පාසල් වේ.

## ගුරුවරුන් සංඛ්‍යාව සහ ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව

| දිස්ත්‍රික්කය | කලාපය | ගුරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | අනුරාධපුරය | 3543 | 67974 |
| | කැකිරාව | 2673 | 41202 |
| | තඹුත්තේගම | 1935 | 38996 |
| | ගලෙන්බිඳුණුවැව | 1898 | 26492 |
| | කැබිතිගොල්ලෑව | 2001 | 31521 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **12050** | **206185** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 1200 | 28829 |
| | හිඟුරක්ගොඩ | 1635 | 38139 |
| | දිඹුලාගල | 1468 | 24697 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **4303** | **91665** |
| **උතුරු මැද පළාත** | | **16353** | **297850** |

## දැක්ම

"අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි, නිපුණතා සපිරි දරු පිරිසක්, සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"අධ්‍යාපනයේ සම අවස්ථා සලසමින් මානව සම්පත් හා භෞතික සම්පත් මනා කළමණාකාරිත්වයකින් යුතුව භාවිතාකර උතුරු මැද පළාත සමෘද්ධිමත් කිරීම සඳහා දායකත්වය සැපයීම".

## දිගුකාලීන අරමුණු

- දරුවන් බුද්ධිමත් හා රැකියා වෙළඳපොළට සුදුසු නිපුණතා ඇති දරුවන් බවට පත් කිරීම.
- ඉපැරණි රජරට සංස්කෘතිය හා කෘෂි ජීවන රටාව මෙන්ම දේශීය හර පද්ධතිය හා සාරධර්ම අගය කරන පුරවැසි පිරිසක් පාසල් අධ්‍යාපනය තුළින් බිහි කිරීම.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාව තුළ සිටින සියලුම දරුවන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- උතුරු මැද පළාතේ පාසල්වල ඉගැන්වීම් කාර්යයයේ නියුතු ගුරුවරුන්ගේ ඉගැන්වීම් කුසලතා හා ක්‍රමවේදයන් ඉහළ තලයට ගෙන ඒමට අවශ්‍ය මග පෙන්වීම් සිදුකිරීම.
- උතුරු මැද පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ භෞතික, මානව හා මූල්‍ය සම්පත් සැපයීම.
- පළාතේ පාසල් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය සහ කුසලතා ඉහළ නැංවීම.
- ඵලදායී ඉගෙනුම් පරිසරයක් ගොඩනැඟිය හැකිවන පරිදි නිලධාරීන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ ශක්තිය ඉහළ නැංවීම.

## ප්‍රධාන කාර්යයන්

- අධ්‍යාපනයේ සමානාත්මතාවය ශක්තිමත් කිරීම: සියළුම දරුවන්ට සමාන ඉගෙනුම් අවස්ථා ඇති කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ භාරකාරත්වය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම.
- සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් වැඩි දියුණු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික ඉඩකඩ සම්පූර්ණ කිරීම.
- උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ ඉඩකඩ සම්පූර්ණ කිරීම.
- උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- මානව සම්පත් සංවර්ධනය.
- ශිෂ්‍ය සංවර්ධනය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 161ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 119 කි. පුරප්පාඩු සංඛ්‍යාව 32 ක් වන අතර අනියම් පදනමින් 06 දෙනෙකු සේවයේ යෙදේ.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු*

## අංක - 04 - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.




**Ensure inclusive and equitable quality education and promote lifelong learning**

**4.1.**2030 වනවිට ඵලදායි ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත හැකි ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික, ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණකර සිටින බව තහවරු කිරීම.

**4.2.**2030 වනවිට සියළුම ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට ,සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවරු කිරීම.

**4.3.**2030 වනවිට සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරිය හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.

**4.4.** අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.

**4.5.** අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින් ආදි වශයෙන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරිම.

**4.6.** සියලු ම තරුණයින් හා කාන්තා හා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම.

**4.7.** 2030 වනවිට තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

**4.8.** ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම.

**4.9.** වැඩි දුෂ්කරතාවයක් සහිත පාසල් වල ගුරු පුහුණුව සඳහා අධ්‍යාපන විශේෂඥ සේවා මත සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම කෙරෙහි පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | ඉලක්කගත | |
|---|---|---|---|---|
| | | | ආයෝජන රු.මි. | වියදම රු.මි. |
| **4.1. ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා යොමු කිරීම.** | | | | |
| **4.1.1 ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ, කියවීම හා ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු සහා පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙනඒම. (5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි අගයක් ගන්නා සිසු ප්‍රතිශතය) 70% ඉහල නැංවීම** | 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි අගයක් ගත් 70% සිසු ප්‍රතිශතය) | වර්ෂය සඳහා ප්‍රති ප්‍රබෝධා ශිෂ්‍ය ක්‍රියාකාරකම් අත් පොත් මුද්‍රණය කිරීම | 2.99 | 2.99 |
| **4.1.2 ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම, ගණිතමය කුසලතා හා තාර්කික හැකියාව අවම මට්ටමක සහිත පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙනඒම - (අ.පො.ස.- සා/පෙළ සිංහල සමත් ප්‍රතිශතය ඉහල නැංවීම ) 82 % ඉහල නැංවීම** | 82% වූ අ.පො.ස.- සා/පෙළ සිංහල විෂය, සමත් පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය. | කඩිනම් ඉගෙනුම් සංවර්ධන වැඩසටහන මගින් අපොස (සා.පෙ) ප්‍රතිඵල ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (2020-2021).හර විෂන්ට අදාලව සකස්කරන ලද ක්‍රියාකාරකම් පොත් මුද්‍රණය හා සිසුන් වෙත බෙදාහැරීම | 19.55 | 19.55 |
| **4.1.3 ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම අවම මට්ටමක සහිත ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය - ( අ.පො.ස. - සා.පෙළ සිංහල සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 90 %** | 90% වූ අ.පො.ස.- සා/පෙළ සිංහල විෂය සමත් ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය. | | | |
| **4.1.4 ද්විතියික ශ්‍රේණි අවසානයේගණිතමය කුසලතා අවම මට්ටමක සහිත පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය -(අ.පො.ස. - සා.පෙළගණිතවිෂයයට සාමාන්‍යසාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 60%** | 60% වූ අ.පො.ස.- සා/පෙළ ගණිතය විෂය, සමත් පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය. | | | |
| **4.1.5ද්විතියික ශ්‍රේණි අවසානයේගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු ළමුන්ගේ ප්‍රමාණය (අ.පො.ස. - සා.පෙළගණිතවිෂයයට සාමාන්‍යසාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 70%** | 70% වූ අ.පො.ස.- සා/පෙළ ගණිතය විෂය, සමත් ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය. | | | |
| **4.2. සියලු සිසුන්ගේ විෂය මට්ටමේ විවිධ කුසලතා සංවර්ධනය** | | | | |
| ක්‍රීඩා තරග සංවිධානය (සියලු කොට්ඨාස) 100% | 100% | කොට්ඨාස මට්ටමේ ක්‍රීඩා තරග පැවැත්වීම (සියලු කොට්ඨාස) 100% | 4.54 | 4.54 |
| ගණිත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | 100% | ගණිත දැනුම මිනුම තරග පැවැත්වීම - කලාප මට්ටම- 100% | 0.08 | 0.073 |

| | | | | |
|---|---|---|---|---|
| විද්‍යා විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | 100% | විද්‍යා (Olympiad ) තරග පැවැත්වීම - කලාප මට්ටම-100% | 0.28 | 0.19 |
| ගණිත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | 100% | ගණිත (Olympiad) තරග පැවැත්වීම - කලාප මට්ටම-100% | 0.16 | 0.12 |
| නැටුම් විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම<br>සංගීත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | 100% | නැටුම් තරග පැවැත්වීම කලාප මට්ටම -100% | 0.15 | 0.14 |
| | 100% | සංගීත තරග පැවැත්වීම - කලාප මට්ටම-100% | 0.15 | 0.13 |
| ක්‍රීඩා තරග සංවිධානය (සියලු කොට්ඨාස)100% | 100% | කොට්ඨාස මට්ටමේ ක්‍රීඩා තරග පැවැත්වීම (සියලු කොට්ඨාස) 100% | 4.54 | 4.54 |
| **4.3. සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරිය හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.** | | | | |
| 4.3.2 අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 30% | 30% වූ අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්ව ප්‍රතිශතය. | **පාසැල් වල අ.පො.ස. (උ. පෙ) ව්‍යාපාර අධ්‍යයනය විෂයට අදාලව 13 ශ්‍රේණියේ පලමු වාරයට ස්වයං අධ්‍යයන පත්‍රිකා මුද්‍රණය හා ලබාදීම** | 0.005 | 0.005 |
| 4.3.6 අ.පො.ස.(උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් වැඩමුලු සංවිධානය. | 100% වූ පවත්වන ලද අ.පො.ස.(උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් සම්මන්ත්‍රණ | අ.පො.ස. (උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් සම්මන්ත්‍රණ පැවැත්වීම. | 1.2 | 1.08 |
| 4.4. අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහාතාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහවැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම. | | | | |
| 4.4.1 කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුත් සිසුන්ප්‍රමාණය වර්ධනය.<br>6 – 9 ශ්‍රේණි සිසුන් - 9712<br>10-11 ශ්‍රේණි සිසුන් - 26150<br>12-13 ශ්‍රේණි සිසුන් - 9576 | වර්ධනය වූ<br>6 – 9 ශ්‍රේණි සිසුන් - 9712<br>10-11 ශ්‍රේණි සිසුන් - 26150<br>12-13 ශ්‍රේණි සිසුන් - 9576 | 2020 වර්ෂයේ 10 වන ශ්‍රේණියට හා 11 ශ්‍රේණිය සඳහා තොරතුරු තාක්ෂණ අත් පොත් මුද්‍රණය සහ බෙදා හැරීම | 2.06 | 2.06 |
| 4.5. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්වියහැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | | | | |
| 4.5.1 විශේෂ අධ්‍යාපනය සඳහා මනා පුහුණුවක් ඇති ගුරුවරුන්සංඛ්‍යාව වර්ධනය.- 93 | **93 දක්වා** වර්ධනය වූ විශේෂ අධ්‍යාපනය සඳහා මනා පුහුණුවක් ඇති ගුරුවරුන් සංඛ. | විශේෂ අධ්‍යාපන විෂයේ පුහුණු වැඩමුළුව | 0.016 | 0.016 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක/ දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු. මි.) | ඉලක්කගත වියදම (රු. මි.) |
|---|---|---|---|---|
| 4.1 | 4.1.1 | ප්‍රාථමික ගුරු/ සිසු නිපුණතා සංවර්ධන වැඩමුළු හා පුහුණු | 2.99 | 2.99 |
| | 4.1.2, 4.1.3, 4.1.4,4.1.5 | ද්විතියික ගුරු/ සිසු නිපුණතා සංවර්ධන වැඩමුළුහා පුහුණු | 19.55 | 19.55 |
| 4.2 | 4.2.1, 4.2.2, 4.2.3, 4.2.4, 4.2.5, 4.2.6 | සියලු සිසුන්ගේ විෂය මට්ටමේ විවිධ කුසලතා සංවර්ධනය | 5.36 | 5.19 |
| 4.3 | 4.3.2 | අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. | 0.005 | 0.005 |
| | 4.3.6 | අ.පො.ස.(උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් වැඩමුලු සංවිදානය | 1.2 | 1.08 |
| 4.4 | 4.4.1, | තොරතුරු තාක්ෂණ විෂය සංවර්ධන පුහුණු | 2.06 | 2.06 |
| 4.5 | 4.5.1 | විශේෂ අධ්‍යාපන වැඩසටහන | 0.016 | 0.016 |
| 4.6 | 4.6.2 | ගුරුසිසු නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම | 0.3 | 0.3 |
| 4.7 | 4.7.1, 4.7.2, 4.7.3 | ගුරු සිසු නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම | නැත | නැත |
| 4.8 | 4.8.1 | පළාත් හා කලාප මාර්ගෝපදේශ වැඩසටහන | නැත | නැත |
| 4.10 | 4.10.1 | පළාත් හා කලාප මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | නැත | නැත |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| ප්‍රාථමික අධ්‍යාපනය- ගුරු සිසු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | පවත්වන ලද ප්‍රාථමික අධ්‍යාපන ගුරු සිසු සංවර්ධන වැඩසටහන්. | පවත්වන ලද ප්‍රාථමික අධ්‍යාපන ගුරු සිසු සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වූ සංඛ්‍යාව | 3 | 17 | 20 | 25 | 2.99 | 27 | 30 | 32 |
| ප්‍රාථමික අධ්‍යාපනය- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ප්‍රාථමික අධ්‍යාපනය- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් . | පවත්වන ලද ප්‍රාථමික අධ්‍යාපනය- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යව සහ සඳහා සහභාගී වූ සංඛ්‍යාව | 0 | 7 | 10 | 15 | 0 | 1.1 | 2 | 3 |
| ද්විතීයික අධ්‍යාපනය- අභිප්‍රේරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ද්විතීයික අධ්‍යාපන අභිප්‍රේරණ වැඩසටහන්. | පවත්වන ලද ද්විතීයික අධ්‍යාපන අභිප්‍රේරණ වැඩසටහන් වලට සහභාගී වූ විදුහල්පතිවරු සහ නිළධාරින් සංඛ්‍යාව. | 0 | 19 | 25 | 32 | 0 | 6 | 8 | 10 |
| ද්විතීයික අධ්‍යාපනය - ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක ක්‍රියාත්මක කිරීම | ක්‍රියත්මක කරණ ලද ද්විතීයික අධ්‍යාපන ඉගෙනුම් සහාය සඳහා වූනියාමන දර්ශක වැඩසටහන්. | ක්‍රියත්මක කරණ ලද ද්විතීයික අධ්‍යාපන ඉගෙනුම් සහාය සඳහා වූ නියාමන දර්ශක වැඩසටහන් මගින් ආවරණය කරනලද පාසල් සංඛ්‍යාව. | 0 | 2 | 3 | 6 | 19.55 | 1.5 | 2 | 3 |
| ද්විතීයික අධ්‍යාපනය- ගුරු සිසු පුහුනු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ද්විතීයික අධ්‍යාපනය- ගුරු සිසු පුහුනු වැඩසටහන් . | පවත්වන ලද ද්විතීයික අධ්‍යාපනය- ගුරු සිසු පුහුනු වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව. | 0 | 5 | 7 | 10 | 0 | 1.5 | 2 | 3 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ද්වීතීයික අධ්‍යාපන ගුරු සිසු ඇගයීම ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන ගුරු සිසු ඇගයීම් වැඩසටහන්. | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපනෙ ගුරු සිසු ඇගයීම් වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 1 | 2 | 3 | 0 | 2.1 | 2.5 | 3 |
| ද්වීතීයික අධ්‍යාපනය- ගුරු සිසු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද. ද්වීතීයික අධ්‍යාපන ගුරු සිසු සංවර්ධන වැඩසටහන් . | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන ගුරු සිසු සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 50 | 60 | 65 | 0 | 45.3 | 50 | 55 |
| ද්වීතීයික අධ්‍යාපනය -ක්‍රිඩා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන ක්‍රිඩා සංවර්ධන වැඩසටහන්. | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන ක්‍රිඩා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 5 | 7 | 9 | 0 | 6 | 8 | 10 |
| ද්වීතීයික අධ්‍යාපනය- සැලසුම් හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන සැලසුම් හා පර්යේෂණ වැඩසටහන්. | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන සැලසුම් හා පර්යේෂණ වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව. | 0 | 4 | 6 | 9 | 0 | 0.9 | 1.5 | 2 |
| ද්වීතීයික අධ්‍යාපනය -සිසු සාධන මට්ටම ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන සිසු සාධන මට්ටම ඉහළ නැංවීමේ වැඩසටහන් | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන සිසු සාධන මට්ටම ඉහළ නැංවීමේ වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 1 | 1 | 1 | 0 | 52 | 60 | 62 |
| ද්වීතීයික අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව. | 0 | 7 | 14 | 21 | 0 | 1 | 2 | 3 |
| ද්වීතීයික අධ්‍යාපන වැඩමුළු සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන වැඩමුළු සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් | පවත්වන ලද ද්වීතීයික අධ්‍යාපන වැඩමුළු සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 0 | 10 | 20 | 0 | 0 | 10 | 20 |
| ද්වීතීයික අධ්‍යාපන පළාත්, ජාතික හා ජාත්‍යන්තර තරඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කළ ද්වීතීයික අධ්‍යාපන පළාත්, ජාතික හා ජාත්‍යන්තර තරඟ වැඩසටහන් | ක්‍රියාත්මක කළ ද්වීතීයික අධ්‍යාපන පළාත්, ජාතික හා ජාත්‍යන්තර තරඟ වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 13 | 16 | 20 | 0 | 6 | 8 | 10 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ද්වීතීයික අධ්‍යාපන ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කළ ද්වීතීයික අධ්‍යාපන ධාරිතා සංවර්ධන වැඩසටහන් . | ක්‍රියාත්මක කළ ද්වීතීයික අධ්‍යාපන ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 0 | 8 | 12 | 0 | 0 | 2 | 3 |
| විශේෂ අධ්‍යාපන ගුරු සිසු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කළ විශේෂ අධ්‍යාපන ගුරු සිසු පුහුණු වැඩසටහන් . | ක්‍රියාත්මක කළ විශේෂ අධ්‍යාපන ගුරු සිසු පුහුණු වැඩ සටහන් වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 11 | 11 | 18 | 0 | 2 | 2 | 3 |
| නොවිධිමත් අධ්‍යාපනය - ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කළ නොවිධිමත් අධ්‍යාපන ධාරිතා සංවර්ධන වැඩසටහන් . | ක්‍රියාත්මක කළ නොවිධිමත් අධ්‍යාපන ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 5 | 8 | 10 | 0 | 0.7 | 1 | 2 |
| නොවිධිමත් අධ්‍යාපනය - උපදේශණ සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කළ නොවිධිමත් අධ්‍යාපනය - උපදේශණ සේවා වැඩසටහන් | ක්‍රියාත්මක කළ නොවිධිමත් අධ්‍යාපනය උපදේශණ සේවා වැඩසටහ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 1 | 2 | 3 | 0 | 1.55 | 2 | 3 |
| -සැලසුම් හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කළ සැලසුම් හා පර්යේෂණ වැඩසටහන් | ක්‍රියාත්මක කළ සැලසුම් හා පර්යේෂණ වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 3 | 4 | 8 | 0 | 0.8 | 1 | 2 |
| අධ්‍යාපන සැලසුම් හා පර්යේෂණ - වැඩමුළු සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද සැලසුම් හා පර්යේෂණ - වැඩමුළු සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන්. | පවත්වන ලද සැලසුම් හා පර්යේෂණ -වැඩමුළු සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 0 | 4 | 6 | 0 | 0 | 2 | 3 |
| ක්‍රීඩා තරග සංවිධානය (සියලු කොට්ඨාස)100% | පවත්වන ලද ක්‍රීඩා තරග | පවත්වන ලද ක්‍රීඩා තරග සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 30 | 0 | 0 | 4.54 | 0 | 0 | 0 |
| ගණිත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | පවත්වන ලද විෂයට අදාළ තරඟ | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 8 | 0 | 0 | 0.08 | 0 | 0 | 0 |
| විද්‍යා විෂයට අදාළ තරඟ සංවිධානය - කලාප මට්ටම | පවත්වන ලද විද්‍යා විෂයට අදාළ තරඟ | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 8 | 0 | 0 | 0.28 | 0 | 0 | 0 |
| ගණිත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | පවත්වන ලද ගණිත විෂයට අදාළ තරඟ | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 8 | 0 | 0 | 0.16 | 0 | 0 | 0 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නැටුම් විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | පවත්වන ලද නැටුම් විෂයට අදාළ තරඟ | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 0 | 8 | 0 | 0 | 0.15 | 0 | 0 | 0 |
| සංගීත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | පවත්වන ලද සංගීත විෂයට අදාළ තරඟ | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 8 | 0 | 0 | 0 | 0.15 | 0 | 0 | 0 |
| පාසැල් වල අ.පො.ස. (උ.පෙ) ව්‍යාපාර අධ්‍යයනය විෂයට අදාලව 13 ශ්‍රේණියේ පලමු වාරයට ස්වයං අධ්‍යයන පත්‍රිකා මුද්‍රණය හා ලබාදීම | මුද්‍රණය සහ බෙදා හරින ලද අ.පො.ස. (උ.පෙ) ව්‍යාපාර අධ්‍යන විෂයට අදාලව 13 ශ්‍රේණියේ පලමු වාරයට ස්වයං අධ්‍යයන පත්‍රිකා. | **බෙදා හරින ලද** පාසල් සංඛ්‍යාව. | 1 | 0 | 0 | 0 | 0.005 | 0 | 0 | 0 |
| අ.පො.ස.(උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් සම්මන්ත්‍රණ පැවැත්වීම. | පවත්වන ලද අ.පො.ස.(උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් සම්මන්ත්‍රණ | පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් සම්මන්ත්‍රණ සංඛාව හා සහභාගි වූ සංඛ්‍යාව | 8 | 0 | 0 | 0 | 1.2 | 0 | 0 | 0 |
| 2020 වර්ෂයේ 10 වන ශ්‍රේණියට හා 11 ශ්‍රේණිය සඳහා තොරතුරු තාක්ෂණ අත් පොත් මුද්‍රණය සහ බෙදා හැරීම (සියලු මාධ්‍ය සිසුන් සඳහා) | මුද්‍රණය සහ බෙදා හරින ලද 10 වන ශ්‍රේණිය හා 11 ශ්‍රේණිය සඳහා තොරතුරු තාක්ෂණ අත් පොත් | බෙදා හරින ලද පාසල් සංඛ්‍යාව | 289 | 0 | 0 | 0 | 2.06 | 0 | 0 | 0 |
| විශේෂ අධ්‍යාපන විෂයේ ගුරු පුහුණු වැඩමුළුව | පවත්වන ලද විශේෂ අධ්‍යාපන විෂයේ ගුරු පුහුණු වැඩමුළු | පවත්වන ලද විශේෂ අධ්‍යාපන විෂයේ ගුරු පුහුණු වැඩමුළු සංඛ්‍යව හා සහභාගි වූ සංඛ්‍යාව | 1 | 0 | 0 | 0 | 0.016 | 0 | 0 | 0 |
| 2020 වර්ෂයේ 11 ශ්‍රේණියේ ඉංග්‍රීසි මාධ්‍ය හදාරණ සිසුන් සඳහා ගණිත විෂයයන්ට අදාළ කඩිනම් ඉගෙනුම් ආධාරක කාර්ය පත්‍රිකා මුද්‍රණය සහ බෙදා හැරීම | මුද්‍රණය කල සහ බෙදා හරිනලද ඉංග්‍රීසි මාධ්‍ය හදාරණ සිසුන් සඳහා ගණිත විෂයට අදාළ කඩිනම් ඉගෙනුම් ආධාරක කාර්ය පත්‍රිකා | මුද්‍රණය කල සහ බෙදා හරිනලද ඉංග්‍රීසි මාධ්‍ය හදාරණ සිසුන් සඳහා කඩිනම් ඉගෙනුම් ආධාරක කාර්ය පත්‍රිකා බෙදා හරින ලද පාසල් සංඛ්‍යාව. | 22 | 0 | 0 | 0 | 0.3 | 0 | 0 | 0 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| අ.අ | ප්‍රතිඵල දර්ශකය | ඉලක්කය කරා ලඟා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 1 | පවත්වන ලද ප්‍රාථමික අධ්‍යාපන ගුරු සිසු සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රාථමික අධ්‍යාපනය- ගුරු සිසු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 100% |
| 2 | ක්‍රියත්මක කරණ ලද ද්වීතීයික අධ්‍යාපන ඉගෙනුම් සහාය සඳහා වූ නියාමන දර්ශක වැඩසටහන් මඟින් ආවරණය කරනලද පාසල් සංඛ්‍යාව | ද්වීතීයික අධ්‍යාපනය -ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක ක්‍රියාත්මක කිරීම | |
| 3 | පවත්වන ලද ක්‍රීඩා තරග සඳහා සහභාගි වූ සංඛ්‍යාව. | ක්‍රීඩා තරග සංවිධානය (සියලු කොට්ඨාස) | |
| 4 | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව. | ගණිත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | |
| 5 | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | විද්‍යා විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | |
| 6 | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | ගණිත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | |
| 7 | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | නැටුම් විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | |
| 8 | පවත්වන ලද තරඟ සඳහා සහභාගි වූ සංඛ්‍යාව | සංගීත විෂයට අදාළ තරඟ සංවිධානය- කලාප මට්ටම | |
| 9 | බෙදා හරින ලද පාසල් සංඛ්‍යාව. | පාසැල් වල අ.පො.ස. (උ. පෙ) ව්‍යාපාර අධ්‍යයනය විෂයට අදාලව 13 ශ්‍රේණියේ පලමු වාරයට ස්වයං අධ්‍යයන පත්‍රිකා මුද්‍රණය හා ලබාදීම | |
| 10 | පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් සම්මන්ත්‍රණ සංඛාව හා සහභාගි වූ සංඛ්‍යාව | අ.පො.ස. (උසස් පෙළ) සිසුන් සඳහා විභාගය ඉලක්කකර ගත් සම්මන්ත්‍රණ පැවැත්වීම. | |
| 11 | බෙදා හරින ලද පාසල් සංඛ්‍යාව. | 2020 වර්ෂයේ 10 වන ශ්‍රේණියට හා 11 ශ්‍රේණිය සඳහා තොරතුරු තාක්ෂණ අත් පොත් මුද්‍රණය සහ බෙදා හැරීම(සියලු මාධ්‍ය සිසුන් සඳහා) | |
| 12 | පවත්වන ලද විශේෂ අධ්‍යාපන විෂයේ ගුරු පුහුණු වැඩමුළු සංඛ්‍යාව හා සහභාගි වූ සංඛ්‍යාව | විශේෂ අධ්‍යාපන විෂයේ ගුරු පුහුණු වැඩමුළුව | |
| 13 | මුද්‍රණය කල සහ බෙදා හරිනලද ඉංග්‍රීසි මාධ්‍ය හදාරණ සිසුන් සඳහා කඩිනම් ඉගෙනුම් ආධාරක කාර්ය පත්‍රිකා බෙදා හරින ලද පාසල් සංඛ්‍යාව. | 2020 වර්ෂයේ 11 ශ්‍රේණියේ ඉංග්‍රීසි මාධ්‍ය හදාරණ සිසුන් සඳහා ගණිත විෂයයන්ට අදාළ කඩිනම් ඉගෙනුම් ආධාරක කාර්ය පත්‍රිකා මුද්‍රණය සහ බෙදා හැරීම | |

# පසුගිය වසර 03 ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ සමාලෝචනය

| අ.අ | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකර ගැනීමට අපේක්ෂා කල සුවිශේෂී (Specific Objectives) | ප්‍රගතිය (ප්‍රතිලාභීන් ගණන) | | | | වැය කළ මුදල රු.මි. | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 01 | කණ්ඩායම් මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | පාසල් ඇගයීමට ලක් කරමින් ඒවා විශිෂ්ඨත්වය කරා ප්‍රවේශ කරවීමට අවශ්‍ය මඟ පෙන්වීම | 501 | 708 | 624 | 311 | - | - | - | - |
| 02 | ප්‍රාථමික ගුරු/ සිසු නිපුණතා සංවර්ධන වැඩමුළු හා පුහුණු | ප්‍රාථමික අධ්‍යාපනය - අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සහිත දරුවෙකු ද්විතියික අධ්‍යාපනයට ප්‍රවේශ කරවීම | 32321 | 24713 | 6375 | 334 | 17.61 | 5.8 | 6.83 | 4.58 |
| 03 | නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වෘත්තීය සංවර්ධනය හා අභිප්‍රේරණය කිරීම | 137 | 484 | 7226 | 127 | 2.63 | 1.5 | 7.85 | 0.02 |
| 04 | ගුරුවරු දැනුවත් කිරීමේ හා සිසු ප්‍රායෝගික පුහුණු වැඩසටහන් | සියළු දරුවන්ට අධ්‍යාපනය සඳහා සාධාරණ ඉගෙනුම් අවස්ථා වැඩි දියුණු කිරීම - 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | - | 140 | 1367 | 105 | - | .266 | 012 | 0.09 |
| 05 | ද්විතියික ගුරු/ සිසු නිපුණතා සංවර්ධන වැඩමුළු හා පුහුණු | ද්විතියික අධ්‍යාපනය -ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය | 22300 | 80000 | 294747 | 12861 | 46.04 | 14.77 | 46.64 | 6.88 |
| 06 | විදුහල්පතිවරු, ගුරුවරු හා සිසුන් ඇගයීම මගින් අභිප්‍රේරණය | ගුරුසිසු ඇගයීම් උත්සවය පැවැත්වීම - කලාප උත්සවය (ජාතික විභාග ප්‍රතිඵල වලින් /විෂය සමගාමී ක්‍රියාකාරකම් වලින්/ විවිධ විෂයයන්හි සමස්ත ලංකා මට්ටමේ තරගවලින් විශිෂ්ට කුසලතා දැක්වූ දරුවන් , ගුරුවරු, කොට්ඨාස හා කලාප පළාත් හා කලාප මට්ටමින් ඇගයීමේ උත්සවය සඳහා) | 30000 | 1250 | 3935 | - | 1.62 | 1.8 | 7.4 | - |
| 07 | අධ්‍යාපන පර්යේෂණ ක්‍රියාත්මක කිරීම | පර්යේෂණ තුලින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය- ප්‍රාථමික | - | 20 | 30 | - | - | 0.1 | .14 | - |
| | | පර්යේෂණ තුලින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය- ද්විතියික | - | - | - | - | - | - | - | - |
| 08 | දෙවන හා තෙවන වාර විභාග පැවැත්වීම | ගුණාත්මක බවින් ඉහළ ප්‍රශ්න පත්‍ර සැපයීම මගින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම. | 55.00 | 935 | 1107 | 46 | 55.00 | 50.0 | 48.9 | 23.62 |
| 09 | සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | පළාත තුළ සෑම පාසලක්ම සෞඛ්‍ය ප්‍රවර්ධිත පාසලක් බවට පත් කිරීම -ද්විතියික | 275 | 660 | 2101 | 35 | 0.17 | 0.19 | 1.09 | 0.13 |
| | | පළාතතුළ සෑම පාසලක්ම සෞඛ්‍ය ප්‍රවර්ධිත පාසලක් බවට පත් කිරීම - ප්‍රාථමික | - | 20 | 1268 | - | - | 0.08 | .87 | - |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | ක්‍රීඩා හා විවිධ විෂය තරඟ පැවැත්වීම | විවිධ විෂයයන් යටතේ කලාප මට්ටමින් දක්ෂතා දැක්වූ සිසුන් හට පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමට යාමට අවශ්‍ය සහාය ලබා දීම. | 35607 | 1714 | 49327 | - | 7.89 | 4.43 | 6.7 | - |
| 11 | නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පාසල් හැර ගිය සිසුන් ව්‍යවසායකයින් බවට යොමු කිරීම | 278 | 429 | 787 | 33 | 0.62 | 0.68 | .75 | 0.036 |
| 12 | විශේෂ අධ්‍යාපන වැඩසටහන | විශේෂඅවශ්‍යතා සහිත දරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම | 325 | 117 | 1004 | 25 | 0.19 | 0.09 | 0.69 | 0.00 |
| 13 | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන | ක්‍රීඩා හැකියාවන්ගෙන් පරිපූර්ණ දරුවන්ගේ දක්ෂතා එළි දැක්වීම. | - | 2636 | 30806 | 5067 | - | 3.9 | 9.93 | 4.2 |

## 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

**01. ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵලලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා යොමු කිරීම.**

මෙම අරමුණෙහි දර්ශකයවන ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ 11 ද්විතීයික ශ්‍රේණි සිසුන් අතර කියවීම හා ගණිතමය කුසලතා සඳහා වන අවම මට්ටම සහිත අයගේ ප්‍රමාණය ඉහළ දැමීම සඳහා පහත සඳහන් වැඩසටහන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ කලාප අධ්‍යාපන කාර්යාල මඟින් සිදු කර ඇත. මේ අනුව ප්‍රාථමික හා ද්විතියික ශ්‍රේණිවල ගුරුවරු සඳහා නව නිර්දේශ පිළිබඳ පුහුණු නවක පත්වීම්ලාභී ගුරුවරු පුහුණු කිරීම හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් කාමර භාවිතය පිළිබඳ ගුරු පුහුණු සිදු කර ඇත. වාර විභාග ලකුණු විශ්ලේෂණ අනුව ලකුණු 40 ට අඩු සිසුන්ට ප්‍රතිපෝෂණ වැඩසටහන්, අනාවරණ පරීක්ෂණ අනුව ප්‍රතිපෝෂණ වැඩසටහන් හා සිසුන්ට ස්වයං ඉගෙනුම සඳහා කාර්ය පත්‍රිකා සහ පෙරහුරු ප්‍රශ්න පත්‍ර ඇතුළත් පොත් ලබාදී ඇත.

**02. සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරියහැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

මෙහි දර්ශකය වන විධිමත් අධ්‍යාපනය හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ හා වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය ඉහළ නැංවීම සඳහා සිසුන්ගේ තාක්ෂණික හා වෘත්තිය නිපුණතා සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් දියත් කර ඇත.ඒ අනුව විවිධ විෂයන් යටතේ කුසලතා සංවර්ධනය සඳහා අදාළ විවිධ ආයතන හා විශ්ව විද්‍යාල ඒකාබද්ධව ගුරු සිසු සංවර්ධන වැඩසටහන් දියත් කර ඇත. ඊට අමතරව 8-9 ශ්‍රේණි, 10-11 ශ්‍රේණි සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ පිළිබඳ වැඩසටහන් පාසල් මට්ටමින් සිදු කර ඇති අතර විදුහල්පතිවරු හා ගුරුවරු දැනුවත් කිරීමේ වැඩසටහන් කලාප මට්ටමින් සිදු කර ඇත. මෙහිදී කලා විෂය ධාරාව සඳහා ශිෂ්‍ය සහභාගීත්වය අඩු කිරීමත් විද්‍යා, වාණිජ, හා තාක්ෂණ විෂයය ධාරා සඳහා සිසු සහභාගීත්වය ඉහළ දැමීමත් ඉලක්ක කර ඇත. මේ සඳහා අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීම, අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීම, අදාළ ආයතන හා ඒකාබද්ධව වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් පවත්වා ඇත.

**03. අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.**

මෙහි දර්ශකය වන කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයන්ගෙන් යුක්ත සිසුන් ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා දැනට 6 – 9 ශ්‍රේණි සඳහා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ කුසලතා විෂයය හඳුන්වා දී ඇති අතර පාසල් මට්ටමින් එම සිසුන්ට විෂය

කුසලතා ලබාදීම සිදු කරයි. ඊට අමතරව සිසුන් සඳහා ප්‍රායෝගික සිසු කඳවුරු, සිසුන් අතර අධ්‍යාපන මෘදුකාංග නිර්මාණය කිරීමේ තරග පවත්වා ඇත. පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම සිදු කර ඇත.

**04. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

මේ සඳහා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් හඳුනා විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කිරීම එම ගුරුවරු පුහුණු කිරීම, විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් දියත් කෙරේ. සියලු පාසල්වල පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක වන අතර (උදෑසන ආහාරය හා කිරි ලබා දීම) ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබාදේ. ඊට අමතරව සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සෞඛ්‍ය කඳවුරු පවත්වනු ලබයි. ඊට අමරතව වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් දියත් කරයි.

**05. සියලු ම තරුණයින් හා කාන්තා හාපිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන්කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම.**

මෙහි දර්ශකය වන්නේ යම් වයස් කාණ්ඩයකට අදාළ අවම සාක්ෂරතා හා සංඛ්‍යාමය කාර්ය කුසලතාවයක් අත්කරගෙන සිටින සංඛ්‍යාව වේ. ඒ අනුව සිංහල හා ගණිත විෂයය සංවර්ධනය සඳහා ගුරු හා සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් සිදු කර ඇත.

**06. තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.**

මේ යටතේ ගෝලය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා මානව හිමිකම් (ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා විෂය මාලා, ගුරු අධ්‍යාපනය හා ශිෂ්‍ය ඇගයීම් යන සියලු මට්ටම්වල තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම යන දර්ශකය ළඟා කර ගැනීම සඳහා සියලුම විෂයයන්වල සංවර්ධනය උදෙසා ගුරු සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් දියත් කර ඇත. ශිෂ්‍ය ඇගයීම් සඳහා පාසල් මට්ටමින් පාසල් පාදක තක්සේරුකරණය සහ වාර විභාග පැවැත්වේ මේ සඳහා ගුණාත්මක ප්‍රශ්න පත්‍ර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබයි.

**07. ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම.**

මෙහි ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩ නැඟිම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කලාප අධ්‍යාපන කාර්යාලය ඒකාබද්ධව සියලුම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හඳුන්වාදෙන ලද ප්‍රමිති පදනම් කරගෙන බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කර ප්‍රගති සමාලෝචන හා වාර්තා පාසල්වලට ලබාදී අවශ්‍ය ප්‍රතිපෝෂණ සිදුකරයි. මේ සඳහා ප්‍රතිපාදන වැය කිරීමක් නොමැති අතර සියලු පාසල්වල සිසුන් ප්‍රතිලාභීන් වේ.

**08. සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුව සඳහා ජාත්‍යාන්තර සහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.**

මෙහිදි පාසල් මට්ටමින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධන වැඩසටහන් සියලු පාසල්වල ක්‍රියාත්මක කෙරේ. මේ පිළිබඳව සියලුම විදුහල්පතිවරු, සියලුම නිලධාරින් හා ගුරුවරුන් දැනුවත් කිරීම් සිදු කර ඇත. ඒ අනුව පාසල් පාදකව ගුරුවරුන්ගේ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය ගුරු සංවර්ධනය පාසල් මට්ටමේදී සිදු කරනු ලබයි.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ. අ | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුනු කෙටි කාලීන/දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01 | අ/ගාමිණී වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරීම | .62 | .6 | 100 | 100 | පාසල්තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 02 | අ/පහල හල්මිල්ලෑව සිරි දුටු ගැමුණු වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 03 | අ/පිහිඹියගොල්ලෑව ප්‍රා.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | .6 | 100 | 100 | |
| 04 | අ/සුබෝධි ම.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | 6 | 100 | 100 | |
| 05 | අ/රාජාංගනය යාය 13/14 මහසෙන් වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | .6 | 100 | 100 | |
| 06 | අ/බස්තියන් සිල්වා ම.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 07 | අ/මරදන්කඩවල ශ්‍රී රාහුල ම.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 08 | අ/ගන්තිරියාගම ම.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 09 | අ/මිහින්තලය ම.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 10 | අ/නෑවියගම ම.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 11 | අ/මයිලගස්වැව ම.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 12 | අ/සිරිධම්ම ම.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | .6 | 100 | 100 | |
| 13 | අ/ලුම්බිණි ආ.ප්‍රා.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | .6 | 100 | 100 | |
| 14 | අ/කටුවාරගලෑව වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | .6 | 100 | 100 | |
| 15 | පො/තෝපාවැව ම.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | .6 | 100 | 100 | |
| 16 | පො/සේවාමුක්ත කඳවුර ම.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .62 | .6 | 100 | 100 | |
| 17 | පො/කලහගල ප්‍රා.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 18 | පො/ගල්ඔය හන්දිය ම.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 19 | පො/පැලටියාව ක.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 20 | පො/බකමූණ මහසෙන් ප්‍රා.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 21 | පො/ගල්මුල්ල ක.වි. ගැහැණු වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 22 | පො/සෙවනපිටිය ම.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 23 | පො/විජයපරාක්‍රම ම.වි. පිරිමි වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |

වෙනත් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස......

| අ. අ | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුනු කෙටි කාලීන/දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 24 | පො/සිරිපුර ම.වි. වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 25 | පො/බිසෝබණ්ඩාර ම.වි. වැසිකිළියක් ඉදි කිරීම | | .67 | .65 | 100 | 100 | |
| 26 | අනු/මධ්‍ය මහා විද්‍යාලය - පිරිමිනේවාසිකාගාරයේ ගොඩනැගිලි අලුත්වැඩියාව | | .58 | .58 | 100 | 100 | |
| 27 | අ/ස්වර්ණපාලි බාලිකා විද්‍යාලය, පාසල් ගොඩනැගිල්ල (9වසර) සහ වැසිකිළි පද්ධති අලුත්වැඩියා කිරිම | | 1.45 | 1.45 | 100 | 100 | |
| 28 | මැදවච්චිය මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය-විදුහල්පති නිල නිවස ඉදිකිරීම | | 1.34 | 1.34 | 100 | 100 | |
| 29 | අ/රාජාංගනය යාය 05 ම.වි - පංති කාමර 02ක් සුහුරු පන්ති කාමර ලෙස සකස් කිරිම | | 3.8 | 3.8 | 100 | 100 | |
| 30 | අ/කැදෑ රත්මලේ ම.වි- 80x20 ගොඩනැගිල්ල දීර්ඝ කර සුහුරු පංති කාමර 01ක් ලෙස සකස් කිරිම | | 1.51 | 1.51 | 100 | 100 | |
| 31 | අ/මකුලෑව ම.වි-සුහුරු පංති කාමර 03ක් සහිත 60x20 ගොඩනැගිල්ලක් ඉදි කිරිම | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරිම | .82 | .82 | 100 | 100 | පාසල්තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 32 | අ/තලාව ම.වි -සුහුරු පංති කාමර 02ක් සහිත 90x25 ගොඩනැගිල්ල (ඉතිරි වැඩ) ඉදිකිරිම | | 2.86 | 2.86 | 100 | 100 | |
| 33 | අ/ගල්නෑව ම.ම.වි -සුහුරු පංති කාමර 03ක් සහිත 60x20 ගොඩනැගිල්ලක් ඉදි කිරිම | | 3.56 | 3.56 | 100 | 100 | |
| 34 | අ/කදෑව මහා විද්‍යාලය-සුහුරු පංති කාමර 01 ක් සඳහා 80x20 ගොඩනැගිල්ල දීර්ඝ කිරීම,අලුත්වැඩියාව හා වැසිකිළි පද්ධතිය ඉදි කිරිම | | 2.39 | 2.39 | | | |
| 35 | අ/මහබුලන්කුලම මහා විද්‍යාලය- සුහුරු පන්ති කාමර 01 ක් සහිතව 90*25 දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරිම | | 1.81 | 1.81 | 100 | 100 | |
| 36 | අ/ඉකිරිගොල්ලෑව මු.විද්‍යාලයේ ඒකක 04 ක් සහිත වැසිකිළි පද්ධති 03 ක් ඉදි කිරිම | | 1.61 | 1.61 | 100 | 100 | |
| 37 | අ/ස්වර්ණපාලි බාලිකා වි. 3,4 ශ්‍රේණි වහල අලුත්වැඩියාව හා ප්‍රධාන ශාලාව සඳහා පුටු සපයා සවි කිරිම | | 4.51 | 4.51 | 100 | 100 | |

වෙනත් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස......

| අ. අ | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුනු කෙටි කාලීන/දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 38 | අ/රඹෑව ම.ම.වි 90*25 දෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරිම | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරිම | 6.88 | 6.88 | 100 | 100 | පාසල්තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 39 | අ/ශ්‍රී ධර්මාලෝක විද්‍යායතන පිරිවෙනෙහි සනීපාරක්ෂක පහසුකම් සැපයීම | | .4 | .4 | 100 | 100 | |
| 40 | පො/මිහිඳු ජයන්ති පිරිවෙනෙහි සනීපාරක්ෂක පහසුකම් සැපයිම | | .4 | .4 | 100 | 100 | |
| 41 | පො/කාශ්‍යප මූලික පිරිවෙනෙහි සනීපාරක්ෂක පහසුකම් සැපයිම | | .4 | .4 | 100 | 100 | |
| 42 | පො/ශ්‍රී ධර්මරාජ මහා පිරිවෙනෙහි සනීපාරක්ෂක පහසුකම් සැපයිම | | .4 | .4 | 100 | 100 | |
| 43 | පො/මින්නේරිය ජාතික පාසල දන්තාගාරය අලුත්වැඩියාව | | 1.87 | 1.87 | 100 | 100 | |
| 44 | පො/මින්නේරිය ජාතික පාසල ගුරු නිවාස අංක 02 අලුත්වැඩියාව | | 1.16 | 1.16 | 100 | 100 | |
| 45 | ගලෙන්බිඳුණුවැව ගුරු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අලුත්වැඩියාව | | .85 | .85 | 100 | 100 | |
| 46 | අ/කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය ගසක් කඩා වැටීම නිසා හානි වූ ප්‍රධාන ශාලාව අලුත්වැඩියා කිරීම | | 1.22 | 1.22 | 100 | 100 | |
| 47 | කලාප අධයාපන කාර්යාල හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අත් සේදුම් බේසම් හා සනීපාරක්ෂක පහසුකම්. | | .17 | .17 | 100 | 100 | |
| 48 | කලාප අධයාපන කාර්යාල වල අත් සේදුම් මේස හා සනීපාරක්ෂක පහසුකම්. | | .084 | .084 | 100 | 100 | |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ.අ | ව්‍යාපෘති | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ළඟාකර ගැනීමට අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැයකළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM) | ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහල නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරිම | 45 | 38 | 80 | - | 1.ඉලක්කගත පාසල් 500හි අවම වශයෙන් 80%ක සිසුන්ගේ ඉංග්‍රිසි භාෂා ඉගෙනීමේ ප්‍රතිශතය වැඩිදියුණු විය<br>2.ඉලක්කගත පාසල් 500හි අවම වශයෙන් 80%ක සිසුන්ගේ ගණිත ඉගෙනීමේ ප්‍රතිශතය වැඩිදියුණු කිරිම<br>3.අවම වශයෙන් 75% ක් දක්වා කලාප SBPTD ප්‍රතිශතය වැඩි දියුණු කිරිම<br>4. අතිරේක වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් 20,000ක් (අවම වශයෙන් 50%ක් කාන්තාවන් බවට පත්කිරිම) ලෙස පුහුණු කිරිම<br>5. පාසල් ප්‍රජා මූලිකත්වය හා පාසල් අධයාපන ගුණාත්මක තහවුරුව කරගත් පාසල් 3000ක් දක්වා ඉහල නැංවීම<br>6. අවම වශයෙන් 75% ක කලාප පාසල් නගාසිටුවීමේ හා බලගැන්වීමේ ප්‍රතිඵල ඉහල නැංවීම (EPSI) |

## සංරචකය තුලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති පිලිබඳ ප්‍රගතිය

| ව්‍යාපෘතිය | සංරචකය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | වැයකල මුදල (රු.මි) |
|---|---|---|---|---|
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) | 01.ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම සහ භාරකාරිත්වය ශක්තිමත් කිරිම<br>01.(1) විෂයමාලා නවීකරණය හා විවිධාංගිකරණය | | | |
| | 1.1 පාසල් නගා සිටුවීම හා බලගැන්වීමේ වැඩසටහන | 1.1.1 පාසල් 802ක් සඳහා පාසල් පාදක ඉගෙනුම් ප්‍රදාන ලබාදීම | පාසල් 802 | 28.93 |
| | | 1.1.2 කලාප මට්ටමින් විදුහල්පතිවරුන් බලගැන්වීම | පාසල් 817 | 0.40 |

## මූලධන ස්වභාවයේ පුනරාවර්තන ප්‍රතිපාදන ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුනු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01 | පාසල් ළමුන් සඳහා ඩෙස් පුටු කට්ටල මිලදී ගැනීම | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරීම | 23.9 | 23.9 | 100 | 100 | පාසල් තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 02 | පාසල් සඳහා ජල පහසුකම් සැපයීම (Covid 19 වසංගතයෙන් පසු නැවත පාසල් ආරම්භ කිරීම සඳහා පාසල් සිසුන් වෙනුවෙන් අත් සේදීමේ පහසුකම් ලබාදීමේ වැඩසටහන )- පාසල් 32) | | 12.76 | 12.76 | 100 | 100 | |
| 03 | පළාත් කාර්යාලය, අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය හා කලාප කාර්යාල සඳහා අධෝරක්ත උෂ්ණත්ව මාන උපකරණ 10ක් මිලදී ගැනීම | | .068 | .068 | 100 | 100 | |
| 04 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය සහ සැලසුම් අංශය සඳහා කාර්යාල ලිබඩු උපකරණ මිලදී ගැනීම | | .017 | .017 | 100 | 100 | |
| 05 | පාසල් සඳහා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම | | 45 | 37.81 | 80 | 80 | |
| 06 | කැකිරාව කලාප කාර්යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .48 | .48 | 100 | 100 | |
| 07 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ආයතන අංශය අලුත්වැඩියාව | | .52 | .52 | 100 | 100 | |
| 08 | හිඟුරක්ගොඩ කලාප කාර්යාලය වැසිකිළි පද්ධතිය අලුත්වැඩියාව | | .73 | .49 | 68 | 68 | |
| 09 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජල නල පද්ධතිය අලුත්වැඩියාව, වැසිකිලි පද්ධතිය අලුත්වැඩියාව, වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව සහ දැන්වීම් පුවරුව නැවත සවි කිරීමේ අලුත්වැඩියා කටයුතු | | 1.6 | 1.6 | 100 | 100 | |
| 10 | තඹුත්තේගම කලාප කාර්යාලයේ මුර කුටියේ වහලය අලුත්වැඩියාව | | .52 | .52 | 100 | 100 | |
| 11 | කැබිතිගොල්ලෑව කලාප කාර්යාලයේ නිල නිවස අලුත්වැඩියාව හා විදුලි සම්බන්ධතාවය අලුත්වැඩියාව | | .44 | .4 | 89 | 89 | |
| 12 | අ/පාඬිග්ගම ධර්මාශෝක විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | 1.6 | 1.6 | 100 | 100 | |
| 13 | අ/මහකනදරාව යාය 01 විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .038 | .38 | 100 | 100 | |

මූලධන ස්වභාවයේ පුනරාවර්තන ප්‍රතිපාදන ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස....

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුනු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 14 | පො/තඹලවැව විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .2 | .2 | 100 | 100 | |
| 15 | අ/තම්බියාව ධර්මපාල විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .13 | .13 | 100 | 100 | |
| 16 | අ/ඉහලපුලියන්කුලම මහා විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | 1.03 | 1.03 | 100 | 100 | |
| 17 | උමැප/අනු/කැබි/පද/පදවි පරාක්‍රමපුර ප්‍රාථමික විද්‍යාලයේ 100*25 හා 60*20 ගොඩනැගිලි 02 විදුලිය සැපයීම, තීන්ත ආලේපනය හා දොර සැකසීම හා 40*20 ගොඩනැගිල්ලේ සිවිලිම සකස් කිරීම හා තීන්ත ආලේපනය | | .35 | .35 | 100 | 100 | |
| 18 | උමැප/අනු/කැබි/කැබි/ වාහල්කඩ හේමමාලි විද්‍යාලයේ ගුරු නිවාස 02 ක් අලුත්වැඩියා කිරීම | | 1 | 1 | 100 | 100 | |
| 19 | උමැප/අනු/කැබි/හො/ මහපොතාන දුටුවැව විද්‍යාලයේ ගුරු නිවාසය අලුත්වැඩියාව | | .5 | .5 | 100 | 100 | |
| 20 | උමැප/අනු/කැබි/කැබි/ තිත්තගෝනෑව විද්‍යාලයේ ගුරු නිවාසය අලුත්වැඩියාව | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරීම | .5 | .5 | 100 | 100 | පාසල් තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 21 | උමැප/අනු/අනු/විල/ තන්තිරිමලේ විමලඥාන ම.වි ගුරු නිවාස 02 ක් අලුත්වැඩියාව | | .5 | .5 | 100 | 100 | |
| 22 | උමැප/අනු/ගබි/ගබි/ ගලෙන්බිදුණුවැව ප්‍රා.වි. ගුරු නිවාසය අලුත්වැඩියාව | | .5 | .5 | 100 | 100 | |
| 23 | අ/සාලියමාලා විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .7 | .7 | 100 | 100 | |
| 24 | අ/පහළ මාරගහවැව විද්‍යාර්ථ විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .46 | .46 | 100 | 100 | |
| 25 | අ/දඹුලුහල්මිල්ලෑව විද්‍යාලය 90x25ගොඩනැගිලි අලුත්වැඩියාව | | 1.42 | .65 | 46 | 46 | |
| 26 | අ/තඹුත්තේගම මධ්‍ය මහා විද්‍යාලය 90x25ගොඩනැගිලි අලුත්වැඩියාව | | 3.56 | 3.56 | 100 | 100 | |
| 27 | අ/ඇල්ලෙවැව මුස්ලිම් විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .2 | .2 | 100 | 100 | |
| 28 | අ/පදවි රුවන්පුර විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .17 | .008 | 5 | 5 | |

මූලධන ස්වභාවයේ පුනරාවර්තන ප්‍රතිපාදන ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස....

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුනු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 29 | අ/පහලගල්කන්දේගම විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .00015 | 00015 | 100 | 100 | |
| 30 | පො/ජයන්තිපුර ක. විද්‍යාලය 120x20ගොඩනැගිලි අලුත්වැඩියාව . | | .3 | .3 | 100 | 100 | |
| 31 | පො/සැගල මහා විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | .39 | .39 | 100 | 100 | |
| 32 | පො/සිංහපුර ක. විද්‍යාලය ගොඩනැගිලි අලුත්වැඩියාව | | 1.9 | 1.9 | 100 | 100 | |
| 33 | උමැප/අනු/කැකි/පලා/මානේරුව විද්‍යාලයේ 80*20 ගොඩනැගිලි අලුත්වැඩියාව | | .77 | .77 | 100 | 100 | |
| 34 | උමැප/අනු/ගබි/ගබි/ සියඹලෑව විද්‍යාලයේ 100*20 ගොඩනැගිල්ල අලුත්වැඩියාව | | .4 | .4 | 100 | 100 | |
| 35 | උමැප/අනු/කැබි/හො/ මහපොතාන දුටුවැව විද්‍යාලයේ විද්‍යාගාරයේ වහලය සහ ජනේල අලුත්වැඩියාව | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරිම | .22 | .18 | 85 | 85 | පාසල් තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 36 | උමැප/අනු/කැබි/හො/ වළහවිද්දවැව මුස්ලිම් විද්‍යාලයට විදුලිය ලබාදීම | | .15 | .15 | 100 | 100 | |
| 37 | උමැප/අනු/කැබි/පද/ පදවි ඩී 10 මෛත්‍රී විද්‍යාලයේ පංති කාමර සහිත ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියාව | | .35 | .32 | 93 | 93 | |
| 38 | උමැප/අනු/තඹු/රාජ/ රාජාංගනය යාය 15 විද්‍යාලයේ විද්‍යාගාරය වශයෙන් පවතින බහුකාර්ය ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරිම | | .075 | .075 | 100 | 100 | |
| 39 | උමැප/අනු/තඹු/ගල්/ නෑගම්පහ මහා විද්‍යාලයේ සුළු අලුත්වැඩියාව සහ 100*20 ශාලාව සඳහා විදුලිය ලබාදීම | | .22 | .22 | 100 | 100 | |
| 40 | උමැප/පො/හිඟු/ඇළ/ ඇළහැර කනිෂ්ඨ විද්‍යාලයේ 80*20 පංති කාමර ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියාව | | .5 | .5 | 100 | 100 | |
| 41 | ගලෙන්බිඳුණුවැව කලාප කාර්යාලයේ විදුලි අලුත්වැඩියාව | | .18 | .14 | 78 | 78 | |

## පුනරාවර්තන ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | ලැබුනු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | මුල්‍ය (%) | |
| 01 | ගණිත ඔලිම්පියාඩ් තරඟය | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරිම | .83 | .48 | 58 | පාසල් තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 02 | විද්‍යාව කලාප මට්ටමේ ඔලිම්පියාඩ් තරඟය | | .46 | .22 | 48 | |
| 03 | කොට්ඨාස ක්‍රීඩා තරඟ | | 3.9 | 3.81 | 97 | |
| 04 | කලාප ක්‍රිඩා | | 1.81 | .28 | | |
| 05 | සිංහල විෂයට අදාළ මඟ හැරුණු පාඩම් සඳහා ලබා දී ඇති ඉදිරිපත් කිරීම්, සංයුක්ත තැටි මඟින් ලබා දීම. ගුරු තත්ව කව පැවැත්වීම. සිංහල භාෂාව උපකාරක පොත මුද්‍රණය, සිංහල සාහිත්‍ය සංග්‍රහය මුද්‍රණය | | .38 | .18 | 48 | |
| 06 | 2020 වර්ෂයේ 5 ශ්‍රේණියේ සිසුන්ට උගන්වන ගුරු භවතුන්ට කාර්යය පත්‍රිකා බෙදා දීම. | | .13 | .0062 | 4 | |
| 07 | * ක්‍රියාකාරීව ප්‍රීතිමත් වෙමු ළමා මළල ක්‍රිඩා සැණකෙළිය | | .6 | 0 | 0 | |
| 08 | පසුගිය ශිෂ්‍යත්ව ප්‍රශ්ණ පත්‍ර වල අයිතම විශ්ලේෂණය | | .3 | .099 | 33 | |
| 09 | නව විෂය නිර්දේශය පිළිබඳව ප්‍රාථමික නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම | | .1 | .0094 | 9 | |
| 10 | * ගණිත කඳවුරු පැවැත්විම | | .03 | 0 | 0 | |
| 11 | * සුහුරු පන්ති කාමර ඵලදායීව භාවිතය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක වන පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුභවතුන් දැනුවත් කිරිම.13 වසරක අධ්‍යාපනය | | .02 | 0 | 0 | |
| 12 | විශේෂ අධ්‍යාපන කලාප ක්‍රීඩා උළෙල | | .35 | 0 | 0 | |
| 13 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පළාත් තරග සඳහා ප්‍රශ්න පත්‍ර සෑදීම - සිංහල | | .28 | .079 | 28 | |
| 14 | * මානව ශාස්ත්‍ර (දෙමළ)කලාප මට්ටමේ හා පළාත් මට්ටමේ තරග හා විෂය කටයුතු | | .45 | 0 | 0 | |
| 15 | කොට්ඨාස හා කලාප ඉංග්‍රීසි භාෂා දින තරග,11 ශ්‍රේණිය කණ්ඩ විෂය කාර්ය පත්‍රිකා මුද්‍රණය, සැලැස්ම සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | | 1.82 | .15 | 8 | |

පුනරාවර්තන ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස......

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | ලැබුනු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | මූල්‍ය (%) | |
| 16 | නර්තන තරගයේ 2020 චක්‍රලේඛ පැහැදිලි කිරීම | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරිම | .08 | .033 | 41 | පාසල් තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 17 | නර්තන කලාප තරග | | .52 | .16 | 30 | |
| 18 | * දෙමළ භාෂා දින තරග කලාප සහ පළාත් | | .49 | 0 | 0 | |
| 19 | * කලාප මට්ටමේ මීලාද් තරග පැවැත්වීම | | .37 | 0 | 0 | |
| 20 | * කෘෂි විද්‍යාව කොට්ඨාස හා කලාප තරග | | .34 | 0 | 0 | |
| 21 | සමස්ත ලංකා සංගීත තරග - කලාප | | .45 | .13 | 30 | |
| 22 | සංගීත චක්‍ර ලේඛ පිටපත් මුද්‍රණය කැබිතිගොල්ලෑව ක.අ.කා පාසල් 60 | | .06 | .003 | 5 | |
| 23 | නොවිධිමත් අධ්‍යාපන වෘත්තීය පුහුණු පාඨමාලා උපදේශන දීමනා ගෙවීම | | .72 | .036 | 5 | |
| 24 | හිඟුරක්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ සැලසුම්, ආයතන, හා ගිණුම් කටයුතු පිළිබඳ ප්‍රමිතගත කිරීමේ වැඩසටහන | | .05 | .05 | 100 | |
| 25 | කෝවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කිරීමෙන් පසු පාසල් නැවත ආරම්භ කිරීම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම හා ඉදිරි සැලසුම් සකස් කිරීම | | .046 | .046 | 100 | |
| 26 | කෘෂි විද්‍යාව හා ජෛව පද්ධති තාක්ෂණවේදය සඳහා විෂය සංවර්ධන වැඩමුළුව | | .0049 | .0049 | 100 | |
| 27 | නවක උපාධිධාරි ගුරුවරුන් දිශාභිමුඛ කිරිමේ පුහුණු වැඩසටහන | | .18 | .14 | 76 | |
| 28 | කඩිනම් ඉගෙනුම් සංවර්ධන වැඩසටහන මඟින් අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල ඉහල නැංවීමේ ව්‍යාපෘතිය | | 2.6 | 2.6 | 100 | |
| 29 | 2020 වර්ෂයේ 11 ශ්‍රේණියේ ඉංග්‍රිසි මාධ්‍ය හදාරන සිසුන් සඳහා විද්‍යාව හා ගණිතය විෂයයන්ට අදාළව කඩිනම් ඉගෙනුම් ආධාරක කාර්ය පත්‍රිකා මුද්‍රණය කිරීම වෙනුවෙන් | | .55 | .55 | 100 | |
| 30 | 2020 සිංහල විෂය සැලසුම් සකස් කිරීමේ වැඩසටහන | | .0088 | .0088 | 100 | |

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | ලැබුනු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | මූල්‍ය (%) | |
| 31 | ද්විභාෂා විෂය පිළිබඳ සහ අධ්‍යාපන ගුරු උප ගුරු සමඟ ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡාව | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරිම | .029 | .029 | 100 | පාසල් තුළ ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 32 | ගෘහ විද්‍යාව ප්‍රායෝගික වැඩසටහන් | | .033 | .033 | 100 | |
| 33 | ගණිත විෂයය නිලධාරින්ගේ විශේෂ රැස්වීම | | .0096 | .096 | 100 | |
| 34 | විද්‍යා විෂය සංවර්ධන වැඩසටහන | | .011 | .011 | 100 | |
| 35 | ඉංග්‍රිසි විෂය භාර සහකාර අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා වූ රැස්වීම | | .0093 | .0077 | 83 | |
| 36 | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ කාර්ය සාධන ඇගයීම් වාර්තාව සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරිම සඳහා වූ වැඩසටහන සඳහා | | .025 | .025 | 100 | |
| 37 | කෝවිඩ් 19 වසංගතයෙන් පසු පිරිවෙන් ගුරු උපදේශකවරුන් දැනුවත් කිරිමේ වැඩසටහන | | .041 | .041 | 100 | |
| 38 | අනුරාධපුර දිස්ත්‍රික් පරිවේණාධිපති කෘත්‍යාධිකාරි ස්වාමීන්වහන්සේලාගේ රැස්වීම | | .006 | .006 | 100 | |
| 39 | 2020 වර්ෂයේ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට අදාළ සිංහල, පාලි හා සංස්කෘත විෂයයන් සඳහා පැවරුම් පත්‍ර හා අනුමාන ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරිම වෙනුවෙන් | | .0079 | .0079 | 100 | |
| 40 | අනුරාධපුර දිස්ත්‍රික් පාසල් ක්‍රිඩා නිලධාරින් ගුරු භවතුන්ගේ වැඩසටහන | | .11 | .086 | 74 | |
| 41 | ප්‍රාථමික විෂයයේ ඉදිරි වැඩසටහන් සැලසුම් කිරීම | | .0075 | .0075 | 100 | |
| 42 | 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ නියාමන වැඩමුළුව | | .032 | .031 | 96 | |
| 43 | 2020 වර්ෂය සඳහා කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කිරීම වෙනුවෙන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් A2 ප්‍රමාණයේ පෝස්ටර් මුද්‍රණය කිරීම වෙනුවෙන් හා අසාතය පිළිබඳ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අත් පත්‍රිකා මුද්‍රණය කිරීම වෙනුවෙන් | | .13 | .13 | 100 | |

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | ලැබුනු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | මූල්‍ය (%) | |
| 44 | 2020 වර්ෂයේ උතුරු මැද පළාතේ පාසල්වල පිහිටීම සිතියම්ගත කිරිම | | .0049 | .0049 | 100 | |
| 45 | විදුහල්පතිවරු සමඟ පවත්වනු ලැබූ අධ්‍යාපනික සංවර්ධන රැස්වීම හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සමඟ පැවති අධ්‍යාපන සංවර්ධන රැස්වීම | | .0051 | .0051 | 100 | |
| 46 | 2020 වර්ෂයේ අ.පො.ස (සා.පෙළ) විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු දැනුවත් කර විෂය මට්ටමින් ඉලක්ක ලබාදීම | | .0096 | .0096 | 100 | |
| 47 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් පාසල්වල අ.පො.ස (උ.පෙළ) ව්‍යාපාර අධ්‍යාපන විෂයට අදාල 13වන ශ්‍රේණියේ පළමු වාරයට ස්වයං අධ්‍යයන පත්‍රිකා පරිගණකගත කිරීම | සියළුම සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරීම | .009 | .009 | 100 | පාසල් තුල ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම / සිසුන්ගේ සාධන මට්ටම ඉහලයාම |
| 48 | විද්‍යාව විෂයේ 8 ශ්‍රේණියේ අධ්‍යාපන කට්ටල සැකසීමේ වැඩසටහනක් සඳහා | | .003 | .003 | 100 | |
| 49 | 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ පාසල්වලට ලබා දී ඇති සුහුරු පැනල පිළිබඳ ගුරු පුහුණු වැඩමුළුව | | .012 | .012 | 100 | |
| 50 | පාසල් සඳහා ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සම්බන්ධ විදුහල්පතිවරුන් දැනුවත් කිරීහ හා ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධ රැස්වීම | | .0035 | .0035 | 100 | |
| 51 | අධ්‍යාපන සංවර්ධනය සැලසුම් සකස් කිරිම, ගරු ආණ්ඩුකාරතුමා සමඟ පවත්වනු ලැබූ අධ්‍යාපන සංවර්ධන කමිටු රැස්වීම හා අධ්‍යාපන සංවර්ධන රැස්වීම | | .11 | .11 | 100 | |

## ආයතනයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් - 2020-2021

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් පේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන්මග | |
|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන |
| මාර්ගගත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිතය ප්‍රවර්ධණය | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මගහැරෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නැවත විධිමත් වීම. | සමස්ත ක්‍රියාවලිය අඛණ්ඩව පැවතීම |
| සම්මිශ්‍රිත අධ්‍යාපන ක්‍රමය ප්‍රවර්ධනය | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මගහැරෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නැවත විධිමත් වීම. | සමස්ත ක්‍රියාවලිය අඛණ්ඩව පැවතීම |

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2020 හා 2021 වර්ෂයන් තුළදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් මගින් අධ්‍යාපන අංශයේ සංවර්ධනය කෙටිකලීන හා දිගුකාලීන ප්‍රතිඵල ළඟාකර ගැනීම ඉලක්කකර ක්‍රියාත්මක කිරීමට නියමිතය.**

## ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය - උතුරු මැද පළාතේ සිසු සාධනය පිළිබඳ තොරතුරු

පළාතේ අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය සඳහා විවිධ මූලාශ්‍ර මඟින් ලැබෙන අරමුදල් අරපිරිමැස්මකින් යුතුව ආයෝජනය කිරීම සඳහා විවිධ ක්‍රමෝපායන් ද ක්‍රියාත්මක කළ අතර ප්‍රාථමික අධ්‍යාපනය හා ද්විතියික අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම, ගුරු සංවර්ධනය, පාසල් පාදක ඇගයීම් ශක්තිමත් කිරීම, පාසල්වල භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා අධ්‍යාපන පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම ඒ යටතේ ප්‍රධාන විය.

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල සහ අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල විශ්ලේෂණ 2016 – 2020

### 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලකුණු 70 ට වැඩි 2016 - 2020

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල විශ්ලේෂණය - කලාප මට්ටමින්**

ලකුණු 70 ට වැඩි (2016 - 2020)

| ස්ථානය | කලාපය | 2016 | | | 2017 | | | 2018 | | | 2019 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය |
| 1 | අනුරාධපුර | 75 | 52 | 6 | 70 | 42 | 4 | 78 | 55 | 6 | 79 | 45 | 4 | 87 | 53 | 6 |
| 2 | ගලෙන්බිඳුණුවැව | 81 | 16 | 1 | 74 | 23 | 1 | 84 | 13 | 1 | 82 | 19 | 1 | 90 | 20 | 1 |
| 3 | පොළොන්නරුව | 76 | 44 | 4 | 69 | 47 | 6 | 80 | 44 | 4 | 79 | 38 | 3 | 88 | 38 | 4 |
| 4 | කැකිරාව | 75 | 48 | 5 | 69 | 46 | 5 | 78 | 54 | 5 | 78 | 49 | 5 | 87 | 49 | 7 |
| 5 | කැබිතිගොල්ලෑව | 73 | 61 | 8 | 67 | 58 | 7 | 76 | 68 | 7 | 76 | 64 | 7 | 85 | 60 | 8 |
| 6 | දිඹුලාගල | 80 | 27 | 2 | 73 | 27 | 2 | 84 | 14 | 2 | 80 | 34 | 2 | 88 | 36 | 3 |
| 7 | හිඟුරක්ගොඩ | 77 | 41 | 3 | 72 | 33 | 3 | 81 | 32 | 3 | 76 | 59 | 6 | 90 | 24 | 2 |
| 8 | තඹුත්තේගම | 73 | 58 | 7 | 67 | 62 | 8 | 74 | 75 | 8 | 76 | 65 | 8 | 87 | 52 | 5 |
| උතුරු මැදපළාත | | **76** | 5 | | 70 | 5 | | 79 | 5 | | 79 | | | 88 | | |
| සමස්ථ දිවයින | | **76** | | | 69 | | | 79 | | | 78 | | | 87 | | |

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵලවල ධනාත්මක වර්ධනයක්.......**

2016 වර්ෂය හා සමග සසඳා බලන විට පෙනි යන්නේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵලවල ධනාත්මක වර්ධනයක් පන්වන බවයි. විභාගය සඳහා පෙනි සිටි සිසුන් ප්‍රමාණයට සාපේක්ෂව ලකුණු 70ට වැඩියෙන් ලබාගත් සිසුන් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්වන බවයි.එසේම ප්‍රතිශතාත්මක වෙනස සලකා බලන විට 2016 හා 2017 වර්ෂ වල පහළ යාමක් පෙන්නුම් කළ ද 2018 හා 2019 වර්ෂ වල ඉහල යාමක්ද 2020 වර්ෂයේ සීඝ්‍ර වර්ධනයක් ද පෙන්වන බවයි. එය සාපේක්ෂව ලද ජයග්‍රහණයකි.

**අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල - අධ්‍යාපන කලාප මට්ටමින් (2016 -2019 )**
**(උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබු)**

| කලාපය | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2016** | | | **2017** | | | **2018** | | | **2019** | | |
| අනුරාධපුර | 4704 | 3232 | 68.71 | 4782 | 3440 | 71.94 | 4825 | 3678 | 76.23 | 5071 | 3665 | 72.27 |
| කැකිරාව | 2458 | 1660 | 67.53 | 2396 | 1578 | 65.86 | 2446 | 1717 | 70.20 | 2677 | 1872 | 69.93 |
| තඹුත්තේගම | 2559 | 1691 | 66.08 | 2552 | 1810 | 70.92 | 2614 | 1877 | 71.81 | 2653 | 1922 | 72.45 |
| ගලෙන්බිඳුණුවැව | 1582 | 1069 | 67.57 | 1709 | 1235 | 72.26 | 1672 | 1238 | 74.04 | 1778 | 1250 | 70.30 |
| කැබිතිගොල්ලෑව | 1895 | 1184 | 62.48 | 1996 | 1423 | 71.29 | 1966 | 1396 | 71.01 | 2115 | 1583 | 74.85 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | **13198** | **8836** | **66.95** | **13435** | **9486** | **70.61** | **13523** | **9906** | **73.25** | **14294** | **10292** | **72.00** |
| පොළොන්නරුව | 1841 | 1266 | 68.77 | 1923 | 1345 | 69.94 | 1920 | 1421 | 74.01 | 1978 | 1516 | 76.64 |
| හිඟුරක්ගොඩ | 2531 | 1607 | 63.49 | 2625 | 1806 | 68.80 | 2470 | 1743 | 70.57 | 2556 | 1762 | 68.94 |
| දිඹුලාගල | 1460 | 915 | 62.67 | 1472 | 988 | 67.12 | 1474 | 1043 | 70.76 | 1637 | 1120 | 68.42 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | 5832 | 3788 | 64.95 | 6020 | 4139 | 68.75 | 5864 | 4207 | 71.74 | 6171 | 4398 | 71.27 |
| **උතුරු මැද පළාත** | **19030** | **12624** | **66.34** | **19455** | **13625** | **70.03** | **19387** | **14113** | **72.80** | **20465** | **14690** | **71.78** |




**2020** වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල නිකුත් කර නොමැති අතර, 2019 වර්ෂයේ පැවති අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා සිසුන් 20465ක් පෙනී සිටි අතර සිසුන් 14690ක් අ.පො.ස (උ/පෙළ ) සඳහා සුදුසුකම් ලැබීමට සමත් විය. එය ප්‍රතිශතයක් ලෙස 71.78% කි. එමෙන්ම 2018 වර්ෂයට සාපේක්ෂව 1.02% ක පසුබෑසීමකි.

> **2019 වර්ෂයේ පැවති අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා සිසුන් 20465 ක් පෙනී සිටි අතර සිසුන් 14690 ක් අ.පො.ස (උ/පෙළ ) සඳහා සුදුසුකම් ලැබීමට සමත් විය. එය ප්‍රතිශතයක් ලෙස 71.78% කි.**

එමෙන්ම 2019 පැවති අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ජෛව විද්‍යා ප්‍රතිඵල අනුව සමත් ප්‍රතිශතය 49.2% ක් වේ. එය 2018 වර්ෂයට සාපේක්ෂව 3.4%ක වර්ධනයකි. භෞතික විද්‍යා අංශයේ සමත් ප්‍රතිශතය 48.3% ක් වේ. එය 2018 වර්ෂයට සාපේක්ෂව 0.3% ක වර්ධනයකි. ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය 68.4% ක් වු අතර, එය 2018ට සාපේක්ෂව 7.7% ක වර්ධනයක් ද, වෙනත් විෂය ධාරාව යටතේ සමත් ප්‍රතිශතය 24.30% ක් වූ අතර එය 2018ට සාපේක්ෂව 11.7% ක අඩු වීමක් ද ලබා ගෙන ඇත. වාණිජ විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය 78.7% ක් වූ අතර එය 2018ට සාපේක්ෂව 11.9% ක වැඩි වීමක් ද, කලා විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය 69.7%ක් වූ අතර එය 2018ට සාපේක්ෂව 1.3% ක අඩු වීමක් ද දැකිය හැක.

එසේම ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව යටතේ සමත් ප්‍රතිශතය 72.1% ක් වූ අතර, එය 2018 ට සාපේක්ෂව 19.1% ක වැඩි වීමක් ද, පෙන්නුම් කර ඇත. මෙය උතුරු මැද පළාතේ පමණක් නොව සමස්ත දිවයිනේම දක්නට ඇති තත්ත්වයකි.

## අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල - අධ්‍යාපන කලාප මට්ටමින් (2016 -2019 )

උතුරු මැද පළාත

අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල විශ්ලේෂණය 2016 - 2019 (උ.මැ.ප. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විභාග අංශයේ දත්ත ඇසුරිනි)

| අනු අංකය | කලාපය | 2016 පෙනී සිටි සංඛ්‍යාව | 2016 සමත් සංඛ්‍යාව | 2016 ප්‍රතිශතය (%) | 2017 පෙනී සිටි සංඛ්‍යාව | 2017 සමත් සංඛ්‍යාව | 2017 ප්‍රතිශතයක් ලෙස(%) | 2018 පෙනී සිටි සංඛ්‍යාව | 2018 සමත් සංඛ්‍යාව | 2018 ප්‍රතිශතයක් ලෙස(%) | 2019 පෙනී සිටි සංඛ්‍යාව | 2019 සමත් සංඛ්‍යාව | 2019 ප්‍රතිශතයක් ලෙස(%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අනුරාධපුර කලාපය | 4200 | 2490 | 59.29 | 3560 | 1979 | 55.59 | 4031 | 2463 | 61.10 | 4538 | 2927 | 64.50 |
| 2 | තඹුත්තේගම කලාපය | 1420 | 735 | 51.76 | 1347 | 815 | 60.50 | 1418 | 868 | 61.21 | 1662 | 991 | 59.63 |
| 3 | කැකිරාව කලාපය | 1617 | 994 | 61.47 | 1629 | 1036 | 63.60 | 1783 | 1153 | 64.67 | 1808 | 1243 | 68.75 |
| 4 | ගලෙන්බිඳුණුවැව කලාපය | 840 | 510 | 60.71 | 857 | 584 | 68.14 | 851 | 589 | 69.21 | 1037 | 713 | 68.76 |
| 5 | කැබිතිගොල්ලෑව කලාපය | 813 | 506 | 62.24 | 815 | 549 | 67.36 | 854 | 541 | 63.35 | 946 | 665 | 70.30 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | 8890 | 5235 | 58.89 | 8208 | 4963 | 60.47 | 8937 | 5614 | 62.82 | 9991 | 6539 | 65.45 |
| 6 | පොළොන්නරුව කලාපය | 1365 | 786 | 57.58 | 1357 | 833 | 61.39 | 1578 | 976 | 61.85 | 1742 | 1024 | 58.78 |
| 7 | හිඟුරක්ගොඩ කලාපය | 1306 | 726 | 55.59 | 1300 | 805 | 61.92 | 1396 | 815 | 58.38 | 1656 | 982 | 59.30 |
| 8 | දිඹුලාගල කලාපය | 715 | 422 | 59.02 | 699 | 456 | 65.24 | 670 | 424 | 63.28 | 834 | 531 | 63.67 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | 3386 | 1934 | 57.12 | 3356 | 2094 | 62.40 | 3644 | 2215 | 60.78 | 4232 | 2537 | 59.95 |
| උතුරු මැද පළාත සමස්ත ප්‍රතිඵලය | | 12276 | 7169 | 58.40 | 11564 | 7057 | 61.03 | 12581 | 7829 | 62.23 | 14223 | 9076 | 63.81 |



## ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති - 2020

මුද්‍රිත පොත් හා කාර්යසාධන පත්‍රිකා




## 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන් පිළිබඳව අදහස් හා යෝජනා

කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2021 වර්ෂයේ සිට දුරස්ථ අධ්‍යාපන ක්‍රම භාවිතයෙන් පාසල්වල අධ්‍යාපන කටයුතු කිරීම සඳහා සැලසුම් කර තිබේ. විශේෂයෙන්ම මාර්ගගත පංතිකාමර ක්‍රමයක් යෝජනා කරන අතර පරිගණක සහිත පාසල්වල ගුරුවරුන් සඳහා එම පරිඝණක භාවිතයෙන් පහසුවෙන් මෙම කටයුතු සඳහා ප්‍රවේශ විය හැකිය. එසේ නොවන අවස්තා වලදී වෙනත් මාර්ගගත ක්‍රිම භාවිතා කළ හැකි උපකරණ භාවිතයෙන් අධ්‍යයන කටයුතු කිරීමට පහසු වන ලෙස පාඩම් මාලාවන් සිසුන්ට සමීප කිරීමට අවශ්‍ය විවිධ සැලසුම් මේ සඳහා ඇතුළත් කර තිබේ.

ඊතක්ෂලාව හා ගුරු ගෙදර වැඩ සටහන් සඳහා ළමුන් යොමු කිරීම හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිර්මිත වැඩසටහන් ඉගෙනුම් ඉගැන්වීම් සඳහා යොදා ගැනීම, ගුරුවරුන් විසින් නිර්මාණය කරන ලද පාඩම් මාලාවන් අධ්‍යාපන මෙවලම් ලෙස සීඩී තැටි මගින් ළමයාට සමීප කිරීම, පුහුණු වැඩමුළු වල දී මාර්ගගත ක්‍රමයට දේශන පැවැත්වීම, සිසු සංවර්ධන වැඩසටහන් සඳහා මාර්ගගත ක්‍රම භාවිතා කිරීම. ප්‍රාදේශීය ගුවන්විදුලිය උපයෝගී කරගනිමින් ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම මීට ඇතුළත් කර තිබේ. විශේෂයෙන් මාර්ගගත ක්‍රමය මගින් පාසල්වල සියලු පන්ති සඳහා පන්ති පැවැත්වීමට ගුරුවරුන් දිරිමත් කිරීම සඳහා විශේෂ පුහුණු වැඩමුළු දැනටමත් ආරම්භ කර තිබේ.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් ඉහළ නංවමින් අධ්‍යාපනයේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක වර්ධනයක් සඳහා 2020 වර්ෂයේ දී වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රේඛීය අමාත්‍යාංශයෙන් හා අනෙකුත් ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් සියලුම පාර්ශවකරුවන් ද සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අපේක්ෂිත ප්‍රතිඵල කරා සහ ඉලක්ක කරා ළඟා වීමටත් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රමික වර්ධනයක් සිදු කරමින් අධ්‍යාපනයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකිවිය.

## Covid-19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේ දී ආයතනය සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2020 වර්ෂයේ සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක නොවීම නිසා සිසු සාධන මට්ටම ඉහල නැංවීමේ වැඩසටහන යටතේ කාර්ය පත්‍රිකා සකස් කිරීම පහත පරිදි සිදු කරන ලදි.

උතුරු මැද පළාතට අයත් අනුරාධපුර හා පොළොන්නරු යන දිස්ත්‍රික් දෙකෙහි අධයාපන කලාප 08ක් තුළ අධයාපන කොට්ඨාස 30ක පාසල් 817 ක් විසිරි පවති. මෙම පාසල් 817 අතුරින් පාසල් 419ක් අ.පො.ස (සා.පෙළ) පංති පැවැත්වේ. 2020 වර්ෂයේ උතුරු මැද පළාතේ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 20435ක් වන අතර, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සකස් කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීම අනපේක්ෂිත ලෙස සමස්ත ශ්‍රී ලංකාව මුහුණ දුන් කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ මාර්තු 12 වන දා සිට මේ දක්වා සියළු පාසල් වරින් වර වසා දමන ලදි. පාසල් වසා දමා ඇති කාලය තුළ සියළු පාසල් තුල විවිධ මට්ටමින් විෂය කරුණු ආවරණය කිරීමට වැඩසටහන් දියත් කරන ලදි. උදාහරණ ලෙස පළාත් දෙපාර්තමේන්තුව හා විවිධ පාසල් මඟින් පවත්වා ගෙන යන වෙබ් අඩවි (WEBSITES), පාසල් ගුරුවරුන් සමඟ පවත්වාගෙන යන whatsapp groups, google classroom, online පාඩම් හා පැවරුම් පත් ගොනු සිසුන්ට ලබාදීම වැනි විවිධ ක්‍රම භාවිතා කරමින් පවති. නමුත් මේ සියළු ක්‍රම මඟින් සමස්ත සිසුන් ට ප්‍රතිලාභ සමාන ලෙස ලැබි නැත. එයට හේතුව සෑම අධ්‍යාපන කලාපයකම පවතින භූගෝලීය විෂමතා හා සමාජයීය විෂමතා අනුව එක් එක් පාසල්වල භෞතික හා මානව සම්පත් විෂමතා පැවතීම මෙන්ම පාසලට ප්‍රවේශවන දරුවන්ගේ සමාජයීය හා ආර්ථික පසුබිම අනුව දරුවන් අතරද, විවිධත්වයක් පැවතීම වේ. එබැවින් නැවත පාසල් ආරම්භ කල පසු, අතපසු වූ ඉගෙනුම් කාලය කඩිනමින් ආවරණය කිරීම මඟින් අ.පො.ස (සා.පෙළ) සඳහා 2020 වර්ෂයේ ඉරිපත්වන සියළු සිසුන්හට හා ගුරුවරුන් හට පහසුවක් වන සේ සියළු හර විෂයයන් සඳහා උපකාරක ඉගෙනුම් මෙවලම් සම්පාදනය කර, මුද්‍රණය කර ලබා දෙන ලදි. ඊට අමතරව බාණ්ඩ විෂයයන් සඳහාද උපකාරක ඉගෙනුම් මෙවලම් සකස් කර සිඩි තැටි මඟින් පාසල්වලට ලබා දී ඇත. ජාතික විභාග ඉලක්ක කර ගනිමින් රජරට සේවය සමඟ අනුබද්ධ වි දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය අනුව ප්‍රතිඵල ඉහල නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .

# 6.3. පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

**පළාතේ කලායතන පිහිටීම** | **ආගමික සිද්ධස්ථාන**

| කලායතනය | සංඛ්‍යාව |
|---|---|
| නර්තන | 137 |
| සංගීත | 10 |
| නාට්‍ය | 12 |

| ආගමික සිද්ධස්ථාන | සංඛ්‍යාව |
|---|---|
| පන්සල් | 1662 |
| කෝවිල් | 42 |
| මුස්ලිම් පල්ලි | 1980 |
| කතෝලික දේවස්ථාන | 47 |
| පිරිවෙන් | 57 |
| දහම් පාසල් | 978 |

## දැක්ම

**"සංස්කෘතිකාංග ගරු කරන සාරධර්ම සපිරි සමාජයක්, සෞභාග්‍යවත් පළාතක්".**

## මෙහෙවර

**" දැහැමි කලාකාමී හා අභිමානවත් සමාජයක් බිහි කිරීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව දහම් අධ්‍යාපනය නංවාලීම, උසස් කලා නිර්මාණකරණය හා රසවින්දනය දිරිගැන්වීම, අතීත සංස්කෘතික උරුමයන් හා ශිල්ප සංරක්ෂණය සහ කලාකරුවන්ගේ කුසලතා ඔප් නැංවීම".**

## දිගු කාලීන අරමුණු

- අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්.
- දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සඳහා දායක වීම.
- පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාමට විධිමත් ක්‍රමවේදයක්.
- ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක්.
- උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම.

## කෙටි කාලීන අරමුණු

- කාර්යක්ෂම ආයතන පද්ධතියක්.
- නර්තන කලාව, ලේඛණ කලාව, සංගීත හා රංග කලාව වැනි සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනයට කටයුතු සැලසීම.
- පළාතේ කලාකරුවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඇගයීමට ලක් කිරීම.
- පළාතේ ආගමික පුනර්ජීවය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- දහම් අධ්‍යාපනය නංවාලීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සංවර්ධනය.
- උසස් රසාස්වාදය ප්‍රචලිත කිරීම.
- අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය.
- කලාකරුවන්ගේ කුසලතා නංවාලීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- ❖ කලා උළෙල හා එයට සමගාමී ක්‍රියාකාරකම්.
- ❖ සංස්කෘතිකාංග සංරක්ෂණය සිදු කිරීම.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ සංවර්ධන ආධාර (දහම් පාසල්, කලායතනාධාර, ආගමික සිද්ධස්ථාන)

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

**ලෝකයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම**
**හා**
**ආරක්ෂාකර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 19ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 16 කි. පුරප්පාඩු සංඛ්‍යාව 03 ක් වන අතර අනියම් පදනමින් 01 ක් අයකු සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

සංස්කෘතික වටිනාකම් සුරක්ෂිත කරමින් අනාගත පරපුර උදෙසා නෙබෙදු දේශයක් සාමුහික ජාතියක් ලෙසින් ලෝකය ඉදිරියේ පෙනී සිටීමට ලාංකීය ජාතියක් වශයෙන් ලෝකය ඉදිරියේ පෙනී සිටීමට ලාංකීය අභිමානය සුරක්ෂිත කරන සංස්කෘතික දායාදයන් සංරක්ෂණය කරන සුරක්ෂිත අනාගතයක් නිර්මානය කිරීමයි. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

- සාම්ප්‍රදායික සංස්කෘතික සංරක්ෂණය සඳහා වැඩ කටයුතු සිදු කිරීම.
- සංස්කෘතික උරුමයන් අනාගත පරපුර උදෙසා දායාද කිරීම.
- නිවහල් චින්තනයක් සහිත නිර්මාණශීලි පරපුරක් බිහි කිරීම.
- රස වින්දනයෙන් ඉහල පරපුරක් බිහි කිරිම සඳහා කලා ප්‍රසංග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- දේශීය මෙන්ම විදේශීය සංස්කෘතින්ගේ ආභාෂය ලබා ගනිමින් සංස්කෘතික හුවමාරුව මගින් සංහිදියාව ඇති කිරීම.
- ආගමික වටිනාකම් ආරක්ෂා කරමින් අනාගත පරපුරට එම උරුමයන් රැක ගැනීම සඳහා ආකල්ප මෙන්ම භෞතික සංවර්ධන ඇති කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | දර්ශක | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජන (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 8 | 8.6 | 8.6.1 හා 8.9.2 | නර්තන කණ්ඩායම පුහුණු කිරීම (පුනරාවර්තන වැය) | 3.76 | 3.67 |
| | | | සංගීත කණ්ඩායම පුහුණු කිරීම (පුනරාවර්තන) | 1.52 | 1.51 |
| | | | කලායතන ආධාර ලබා දීම | 3.00 | 3.00 |
| 11 | 11.4 | 11.4.1 | පළාත් කලා උළෙල | 1.00 | 1.00 |
| | | | සුභාෂණ සංස්කෘතික සඟරාව මුද්‍රණය | 0.15 | 0.15 |
| | | | ආගමික කටයුතු | 9.68 | 9.68 |
| | | | දහම් පාසල් සංවර්ධනය | 1.00 | 1.00 |

## කාර්ය සාධනය ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමවුම | නිමවුම දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| 31 වන උතුරු මැද කලා උළෙල සඳහා තරගකරුවන් දැනුවත් කර තරග පවත්වා අවසන් උත්සවය පැවැත්වීම | 31 වන උතුරු මැද කලා උළෙල පැවැත්වීම | කලා උළෙල සඳහා සම්බන්ධ වන කලා ශිල්පීන්ගෙන් හා ජනතාවගෙන් ලැබෙන යහපත් ප්‍රතිචාර | 1 | 1 | 1 | 1 | 10 | 6.3 | 6.3 | 7 |
| උතුරු මැද පළාතේ තෝරාගත් කලායතන සඳහා මූල්‍යමය ආධාර ලබා දීම | කලායතන 100ක් සඳහා ආධාර ලබා දීම | ආධාර ලබා දෙන කලායතන සංඛ්‍යාව | 100 | 100 | 100 | 100 | 3.00 | 3.5 | 4.00 | 5.00 |
| සහරාව මුද්‍රණය හා බෙදා හැරීම උතුරු මැද පළාතේ සිටින ප්‍රවීන හා ආධුණික ලේඛකයන්ගෙන්ලිපි ලබාගෙන සංස්කාරක මණ්ඩලය වෙත යොමු කරනු ලබයි. සංස්කාරක මණ්ඩලයෙන් තෝරාගනු ලබන නිර්මාණ යොදාගෙන සහරාව මුද්‍රණය කර පළාතේ රාජ්‍ය ආයතන හා පාසල් අතර නොමිලේ බෙදා හැරීම සිදු කරයි. | දසවන සුභාෂණ සහරාව මුද්‍රණයකර බෙදා හැරීම | වර්ෂය තුළ මුද්‍රණය කරනු ලබන සහරා සංඛ්‍යාව | 600 | 750 | 750 | 750 | 0.15 | 2.00 | 2.50 | 3.00 |
| අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථානවල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරිමට මූල්‍යමය ආධාර ලබා දීම සහ ප්‍රදේශයේ පවතින ආගමික හා සංස්කෘතික උත්සව සඳහා ආධාර ලබා දීම සිදු කරයි. | ආගමික සිද්ධස්ථාන වල නව ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු | අධාර ලබා දෙන ආගමික සිද්ධස්ථාන සංඛ්‍යාව | 76 | 250 | 300 | 300 | 9.865 | 25 | 30 | 30 |
| අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රිකක්යේ දහම් පාසල්වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට මුල්‍යමය ආධාර ලබා දීම | දහම් පාසල් වල නව ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු | ආධාර ලබා දෙන දහම් පාසල් සංඛ්‍යාව | 20 | 130 | 150 | 200 | 1.00 | 13.00 | 15.00 | 20.00 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2020

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය (outcome index) | ඉලක්කය කරා ළඟා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 01 | ජාතික තලයට ප්‍රවිෂ්ට වන ශිල්පීන් සංඛ්‍යාව | 3 | 100% |
| 02 | පළාත් තුළින් ජාතික තලය දක්වා ගෙන යන නිර්මාණ සංඛ්‍යාව | 5 | |
| 03 | පළාත තුළින් බිහිවන පාඨකයින් සංඛ්‍යාව | 30000 | |
| 04 | ආගමික සිද්ධස්ථානවල වාසය කරන පූජ්‍ය පක්ෂයෙන් ලැබෙන ප්‍රතිචාර | 75 | |
| 05 | අළුතින් දහම් අධ්‍යාපනයට යොමුවන සිසුන් සංඛ්‍යාව | 1000 | |

## පසුගිය වසර 03ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ. අ | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකර ගැනීමට අපේක්ෂා කළ සුවිශේෂී අරමුණු (specific objectives) | ප්‍රගතිය (ප්‍රමාණය/ප්‍රතිලාභීන් ගණන) | | | | වැය කළ මුදල (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 01 | කලා උළෙල | නව නිර්මාණ බිහි කිරීම | 3000 | 3200 | 3500 | 4000 | 5.00 | 6.30 | 6.30 | 1.00 |
| 02 | කලායතන ධාරිතා සංවර්ධනය | කලායතන 100ක් සඳහා ආධාර ලබා දීම | 100 | 0 | 100 | 100 | 2.50 | 0 | 10.00 | 3.00 |
| 03 | සුභාෂණ සඟරාව මුද්‍රණය කිරීම | සුභාෂණ සඟරාවේ පිටපත් 600ක් මුද්‍රණය කිරීම | 2500 | 3100 | 3500 | 3800 | 2.00 | 2.00 | 2.00 | 0.015 |
| 04 | ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | ආගමික සිද්ධස්ථාන සඳහා මූල්‍ය ආධාර ලබා දීම | 80 | 35 | 14 | 76 | 11.15 | 3.30 | 1.40 | 9.865 |
| 05 | දහම් පාසල් සංවර්ධනය | දහම් පාසල් සඳහා මූල්‍ය ආධාර ලබා දීම | 19 | 14 | 63 | 20 | 1.90 | 4.20 | 4.00 | 10.00 |
| 06 | කලා ප්‍රසංග පැවැත්වීම | උතුරු මැද පළාතේ තෝරාගත් ස්ථානවල සුදුසු කලා ප්‍රසංග පැවැත්වීම | 2000 | 3000 | 5000 | 0 | 0.65 | 2.00 | 1.275 | 0 |
| 07 | පාරම්පරික පූජා කර්ම පැවැත්වීම | තෝරාගත් ස්ථානවල පාරම්පරික පූජා කර්ම පැවැත්වීම | 0 | 12000 | 0 | 0 | 0 | 4.00 | 0 | 0 |
| 08 | පුහුණු වැඩමුළු පැවැත්වීම | නර්තන, සංගීත, නාට්‍ය, කෙටි චිත්‍රපටි, ඡායාරූප පුහුණු වැඩමුළු පැවැත්වීම | 800 | 4000 | 0 | 0 | 1.165 | 3.80 | 0 | 0 |

## ඉලක්ක කරා ළඟා වීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| විස්තරය | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|
| 31 වන උතුරු මැද කලා උළෙල පැවැත්වීම | උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 4000 | 1.00 |
| උතුරු මැද පළාතේ ක්‍රියාකාරී කලායතන 100ක් සඳහා මූල්‍යමය ආධාර ලබා දීම | | 100 | 3.00 |
| සුභාෂණ සඟරාවේ කලාප 600ක් මුද්‍රණය කර බෙදා හැරීම | | 3000 | 0.15 |
| ආගමික සිද්ධස්ථාන 76ක අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා මූල්‍යමය ආධාර ලබා දීම | | 76 | 9.865 |
| උතුරු මැද පළාතේ දුෂ්කර දහම් පාසල් 20ක් සඳහා අවශ්‍ය භෞතික සම්පත් හා මූලයමය ආධාර ලබා දීම | | 20 | 1 |

## 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන ව්‍යාපෘති

### පළාත් කලා උළෙල

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි 31 වන උතුරු මැද කලා උළෙල උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී. මෙහිදි සාහිත්‍ය, කෙටි චිත්‍රපට, ඡායාරූප, මූර්ති කැටයම් හා ගොක් කලා තරඟ පැවැත්විණි. මේ සඳහා තරඟකරුවන් 4000කට අධික පිරිසක් සහභාගී වූ අතර ඒ සඳහා විවිධ වයස් සීමාවන්ට අයත් තරඟකරුවන් තරඟ වැදුණි. මෙහි විනිශ්චය මණ්ඩල අදාළ කෂේත්‍රයේ ප්‍රවීණයන් හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් කටයුතු කරන ලදී.





## සුභාෂණ සගරාව සකස් කිරීම





උතුරු මැද පළාතේ ලේඛකයන්ගේ ලිපි ඇතුළත් කරමින් සුභාෂණ සඟරාවේ පිටපත් 600 ක් මුද්‍රණය කිරීම, උතුරු මැද පළාතේ සියළුම රාජ්‍ය ආයතන සඳහා ද උතුරු මැද පළාතේ පාසල් හා පුස්තකාල අතර නොමිලේ බෙදා හැරිම සිදු කරන ලද අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරන ලදී.

## කලායතන හා ආගමික ස්ථානයන්හි ධාරිතා සංවර්ධනය

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණයවන පරිදි උතුරු මැද පළාතේ ක්‍රියාකාරී කලායතන 100 ක් සඳහා මූල්‍ය ආධාර ලබා දීම සිදු කරන ලදී. කලායතන 100න් ඉගෙනුම ලබන සිසුන් සියයකට අධික ප්‍රමාණයකට මෙහි ප්‍රතිලාභ ලැබිය හැකි විය.

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පවත්වනු ලබන පෙරහැර, ආදාහන පූජෝත්සව හා අනෙකුත් ආගමික උත්සව සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම හා ප්‍රදේශයේ පවතින දුෂ්කර ආගමික සිද්ධස්ථාන 76ක් සඳහා මූල්‍යමය ආධාර ලබා දීමේ කටයුතු මෙහිදි සිදු කරන ලදි. තවද උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණයවන පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර දහම් පාසල් 20ක් සඳහා අවශ්‍ය භෞතික සම්පත් හා මූල්‍යමය අනුග්‍රහය ලබා දීමට කටයුතු කරන ලදි.













## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

ලෝකයේ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා උතුරු මැද පළාතේ පවත්වනු ලබන සාම්ප්‍රදායික උත්සව සඳහා ආධාර ලබා දීම සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙහිදී ප්‍රදේශයේ පවත්වනු ලබන සාම්ප්‍රදායික උත්සව අඛණ්ඩව පවත්වාගෙන යාම අපේක්ෂා කරයි. එසේම පෙරහැර සංස්කෘතිය ආරක්ෂාකර ගැනීම සඳහාද දායකත්වය ලබා දීම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙහි ප්‍රතිලාභය උතුරු මැද පළාතේ ජනතාවට පමණක් නොව සියළු ශ්‍රී ලාංකිකයන්ට හා විදේශීය සංචාරකයන්ට ලැබෙනු ඇත.

එසේම සාම්ප්‍රදායික සංස්කෘතික අංගයන් මතු පරපුරට දායාද කිරීම සඳහා පළාත් කලා උළෙල පැවැත්වීමද දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙහිදී සාම්ප්‍රයික නර්තන හා සංගීත අංග තරඟ සඳහා ඇතුළත් කර ඇත. මේ තුළින් වර්තමාන පරම්පරාව සාම්ප්‍රදායික නර්තන හා සංගීත අංග වෙත යොමු කරවීම අපේක්ෂා කරයි.

## තම ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අදහස් හා යෝජනා

සංස්කෘතියට ගරු කරන සාරධර්ම සපිරි සමාජයක්, සෞභාග්‍යමත් පළාතක් බිහි කිරීම ප්‍රධාන දැක්ම කර ගනිමින් එම දැක්ම කරා ලගා වීමට 2021 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

අපේ රටේ කාලාන්තරයක් තිස්සේ පැවැති සිරිත් විරිත් ආචාර ධර්ම, පාරම්පරික කලා සම්ප්‍රදායන් රැසක් ක්‍රමයෙන් සමාජයෙන් ඈත් වී යන තත්ත්වයක් උද්ගත වී ඇත. විවිධ ජන මාධ්‍ය ඔස්සේ ක්‍රියාත්මක වන විජාතික සංස්කෘතික වැඩ සටහන් නිසා ඉහත කී සංස්කෘතික ලක්ෂණ දක්නට නොලැබීම හේතුවෙන් කාලයක් ගත වන විට අපේ උරුමය අපේ සමාජය තුළ ඉතිරි නොවනු ඇත. සෞභාග්‍යමත් පළාතක් බිහි වීමට නම් පළාතේ ජනතාවගේ මානසික සංවර්ධනය ඇති කල යුතුය. ඒ සඳහා කලාව මහඟු මෙහෙයක් ඉටු කරයි. ඒ තුලින් ජනතාවගේ සිත් සතන් තුල ඊර්ෂ්‍යාව, වෛරය, ද්වේෂය වැනි අගතිගාමී සිතුවිලි ප්‍රහීනව ගොස් අධ්‍යාත්මක වර්ධනයක් ඇති වී සමාජය වඩාත් යහපත් කිරීම සඳහා අවස්ථාව සැලසේ.

ඒ අනුව පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් කලාවේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් 32 වන උතුරු මැද කලා උළෙල 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙමගින් උතුරු මැද පළාත තුල විසිරී සිටින දක්ෂ කලා කරුවන්ට ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය විදහාපාන ප්‍රධාන ඓතිහාසික පුරවරය අනුරාධපුර රාජධානියයි. දන්ත ධාතූන් වහන්සේගේ පූජෝපහාරයක් වශයෙන් වාර්ෂිකව පවත්වනු ලබන දළදා පෙරහැර 2021 වර්ෂයේදී පැවැත්වීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. ඈත අතීතයේ සිටම උතුරු මැද පළාතේ ආගමික හා සංස්කෘතික උත්සව පවත්වන අතර ඒ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. එසේම ආගමික කටයුතු ව්‍යාපෘතිය යටතේ පළාතේ දුෂ්කර ආගමික සිද්ධස්ථාන සඳහා අනුග්‍රහය දැක්වීම සිදු කරයි.

ආයතනයේ දැක්ම කරා ළඟා වීම සඳහා අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි දහම් පාසල් පද්ධතියක් සහ දැනුම ආකල්ප කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක් නිර්මාණය කරගත යුතුව ඇත. මේ සඳහා දුෂ්කර ප්‍රදේශවල පවතින දහම් පාසල්වල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව බලාපොරොත්තුවේ.

කලා නිර්මාණ වෙත ප්‍රේක්ෂකයන් වැඩි පිරිසක් සහභාගී කරමින් වින්දනීය ජනතාවක් බිහි කිරීම දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වේ. ඒ සඳහා ඉපැරණි සාම්ප්‍රදායික කලා නිර්මාණ ජනතාවට අත්

විදීමට අවස්ථාව සලසා දීම මෙන්ම උතුරු මැද පළාතේ දුෂ්කර පාසල් සිසුන්ට හා කලා කරුවන් වෙත ජාතික තලයේ නිර්මාණ වෙත ප්‍රේක්ෂකයා හුරු කිරීම හා කලා ක්ෂේත්‍රය වෙත ඔවුන් යොමු කිරීම කලා ප්‍රසංග ව්‍යාපෘතිය තුලින් 2021වසරේ අපේක්ෂා කරයි.

උතුරු මැද පළාත තුල දැනුමෙන් පිරිපුන් පාඨක පිරිසක් බිහි කිරීම සඳහා උතුරු මැද පළාතේ ලේඛකයනගේ නිර්මාණ ඇතුලත් කරමින් සුභාෂණ සඟරාවේ එකොලොස්වන කලාපය 2021 වර්ෂයේදී එළි දැක්වීමට නියමිතය.

2021 වර්ෂයේ නවතම ව්‍යාපෘතියක් ලෙස දේශීය කර්මාන්ත කරුවන් දිරි ගැන්වීම දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. සාම්ප්‍රදායික සංස්කෘතිය තුල වටිනාකම් සහිත සංස්කෘතික දායාද වශයෙන් උරුම වූ නිෂ්පාදන පවතී. උදාහරණ වශයෙන් බෙර දවුල් තම්මැට්ටම් ආදී නිෂ්පාදන ලාක්ෂා කර්මාන්තය හා පිළිම නෙලීම ආදිය දැක්විය හැක. මෙවැනි කර්මාන්තකරුවන් දිරි ගැන්වීම තුළ එම කර්මාන්තය අනාගත පරපුර වෙත දායාද කිරීමට හැකියාව ඇත.

**ආයතනයේ සහ අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.**

| අංශයේ හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන්මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගු කාලීන |
| සංස්කෘතික හුවමාරු වැඩ සටහන් (දේශීය හා විදේශීය) | සංස්කෘතිකමය අන්තර් සබඳතා ගොඩ නැගීම | වෙනත් ජාතීන් සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ඇතිවීම තුලින් සංස්කෘතික සංහිඳියාව ගොඩ නැගීම |
| සංචාරක ක්ෂේත්‍රය සඳහා සංස්කෘතික අංග හඳුන්වාදීම | සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් සංචාරකයාට ලබා දීම තුළින් සංචාරක කර්මාන්තය සඳහා කැමැත්තක් ඇතිවීම | ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ ආදායම ඉහල යාම හා ලංකාවේ සංස්කෘතිය පිළිබඳ වටිනාකමක් ලබා දිය හැකි වීම |

**කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස**

පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් රු.මි. 4.15 ක් මූලධන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට ලැබී තිබිණි. එසේම ආගමික සිද්ධස්ථාන සංවර්ධනයට රු.මි 9.685 ක ප්‍රතිපාදනයක්ද දහම් පාසල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි 1.00 ක ප්‍රතිපාදනයක් 610 වැය ශීර්ෂය යටතේ දෙපාර්තමේන්තුවට ලැබී ඇත.

දෙපාර්තමේන්තුව මඟින් 2020 වර්ෂයේ රටේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය නිසා කලා උළෙල ව්‍යාපෘතිය රුපියල් මිලියනයක මුදලින් පැවැත්වීමට දෙපාර්තමේන්තුවට සිදුවිය. එහිදී සාහිත්‍ය, ගොක් කොළ මූර්ති, කැටයම් හා කෙටි චිත්‍ර පටි හා ඡායාරූප යන තරග අංශ පමණක් පැවැත්විය. එහිදී අවසන් උත්සවය ජයග්‍රාහී තරග කරුවන්ගේ සහභාගීත්වයෙන් හා විශේෂිත ආරාධිත අමුත්තන් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයෙන් අවසන් උත්සවය 2020 දෙසැම්බර් 14 වන දින ප.ව 3.00 ට මධ්‍ය විද්‍යාලීය රංග ශාලාවේදී පැවැත්විය.

කලායතන ආධාර ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ කලායතන 100 ක් සඳහා රු. 30000.00 බැගින් මූල්‍ය ආධාර ලබා දී ඇත. මෙමගින් කලායතන සඳහා අවශ්‍ය වාද්‍ය භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ මිලදී ගැනීම කලායතන මඟින් සිදු කර ඇත. මෙම කලායතන 100 තුල ප්‍රදේශයේ සිසුන්

තුන්දහසකට අධික පිරිසක් අධ්‍යාපනය ලබයි. එම සිසුන් සියළු දෙනාටම මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ හිමිවේ. 2020 වර්ෂයේදී සුභාෂණ සංස්කෘතික සඟරාවේ දසවන කලාපයෙන් පිටපත් 600 ක් මුද්‍රණය කර ප්‍රදේශයේ පාසල් හා පුස්තකාල අතර බෙදා හරින ලදී. මෙම සඟරාවේ පාසල් අධ්‍යාපනය ලබන සිසුන්ට වැදගත් වන ලිපි රාශියක් ඇතුලත් කර ඇත. පාසල් පුස්තකාල අතර මෙම සඟරා බෙදා හරින බැවින් ප්‍රදේශයේ පාසල් සිසුන් දසදහසකට අධික පිරිසක් පාඨකයන් බවට පත් වී ඇත.

ආගමික සිද්ධස්ථාන සංවර්ධනය යටතේ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන 76 ක් සඳහා 2020 වර්ෂයේ ආධාර ලබා දී ඇත. මෙම විහාරස්ථාන වලට පැමිණෙන සැදැහැවතුන් විශාල පිරිසක් මෙම ප්‍රතිලාභය භුක්ති විඳී. එසේම එහි වාසය කරන පූජ්‍ය පක්ෂයද මෙම ප්‍රතිලාභය භුක්ති විඳ මානසික තෘප්තියක් ලබා ගනී.

දහම් පාසල් සංවර්ධනය ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ දහම් පාසල් 14 ක් සඳහා දහම් පාසල් ගොඩනැගිලි අළුත් වැඩියාව හා නැවත ඉදිකිරීම සඳහා මූල්‍යමය ආධාර ලබා දී ඇත. දහම් පාසල් හයක් සඳහා ඩෙස්පුටු ලබා දී ඇත. මෙමගින් මෙම දහම් අධ්‍යාපනය ලබන සිසුන් විශාල පිරිසක් ප්‍රතිලාභ ලබයි. ඒ අනුව පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව උතුරු මැද පළාතේ ආගමික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම තුලින් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට දායක වී ඇත.

**කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා**

සංස්කෘතික කටයුතු බොහෝවිට සාමූහික ලෙස ක්‍රියාත්මක වේ. කොවිඩ් වසංගතය හේතුවෙන් සාමූහික කාර්යයන් සිදු කිරීමේ දුෂ්කරතා මතු විය. එබැවින් 2020 වර්සයේ යෝජිත ව්‍යාපෘති කිහිපයක් අත්හිටු වීමට සිදු විය. ක්ෂේත්‍ර කටයුතුවල නියැලීමට දුෂ්කරතා ඇතිවිය. එබැවින් නියමිත කාලවකවානු තුල ව්‍යාපෘතිවල සාක්ෂාත් කරගත යුතු අගයන්වලට පැමිණීමේ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය.

එහෙත් පැවති තත්ත්වයන් කලමනාකරණය කර ගනිමින් ක්‍රියාත්මක කරන සීමිත ව්‍යාපෘතින්හී භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% ඉලක්කය දක්වා ගෙන ඒමට හැකියාව ලැබිණි. ඒ සඳහා දුරස්ථ ක්‍රමවේදයන් අනුගමනය කිරිම තුළින් ගැටළුව යම්තාක් දුරකට නිරාකරනය කර ගැනීමට හැකි වු අතර සාමූහික ක්‍රියාකාරකම් අවම කර ගැනීමට කටයුතු කරන ලදි. උදාහරණ ලෙස 31 වන උතුරු මැද කලා උළෙල පැවත්වීමේදී සාහිත්‍ය, කෙටි චිත්‍රපටි, ඡායාරූප,ගොක් කොළ මූර්ති කැටයම් තරඟ සඳහා මුලිකත්වය දුන් අතර නර්තන, නාට්‍යය සංගීත හා චිත්‍ර යන තරඟ අංශ කලා උළෙළින් ඉවත් කිරීමට සිදු විය. එහෙත් නොකඩවා කලා උළෙල පැවැත්වීමේ අරමුණ ජයග්‍රහණය සඳහා දුරස්ථභාවය රඳවාගනිමින් පැවැත්විය හැකි තරඟ කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් කටයුතු කිරීමෙන් එම අභියෝග ජයගත හැකි විය.

ආගමික සිද්ධස්ථාන සංවර්ධනය හා දහම් පාසල් සංවර්ධන ව්‍යාපෘතිවලදී එම ස්ථාන අයත් ප්‍රාදේශීය සභා වෙත ප්‍රතිපාදන ලබා දීම තුළින් අදාල සංවර්ධන කාර්යයන් ඉටු කළ හැකි විය. සුභාෂණ සඟරාව මුද්‍රණය කිරීමේදී ලිපි ලබා ගැනීමේ කටයුතුවලදී විද්‍යුත් තැපැල් මගින් ලිපි ලබා ගැනීමද සිදු විය. ඉහත සඳහන් ක්‍රම වේදයන් අනුගමනය කිරීම මගින් සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා මගහරවා ගැනීමට හැකි විය.

# 6.4. සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු :

1990 අංක 11 දරණ උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ වූ ප්‍රඥප්තියට අනුකූලව උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන්නාවූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස හැඳින්විය හැකිය. 1990 මැයි මස 01 දින එවකට හිටපු පළාත් ප්‍රධාන අමාත්‍යය පී. ඩී මහින්ද සෝම මහතා විසින් ග්‍රාමීය මාර්ග සංවර්ධන කටයුතු සඳහා මෙම ආයතනය ආරම්භ කර ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වැඩපළක් ලෙස නැවත මෙම පරිශ්‍රය පළාත් සභාව වෙත පවරා ගනිමින් අනතුරුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය නමින් ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී මෙම ආයතනය මගින් පළාතේ කෘෂිකාර්මික, වාරිමාර්ග, මහාමාර්ග ඉදිකිරීම්, ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කිරීම වාහන සහ යන්ත්‍ර/සූත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරීම මෙන්ම පළාතේ මුල් පෙලේ මුද්‍රණාලයක්ද මෙම ආයතනය සතුව ඇත. ඒ අනුව ගුණාත්මකභාවයෙන් සහ කාර්යක්ෂම ලෙස අඩු පිරිවැයක් යටතේ අවශ්‍ය මුද්‍රණ ඇණවුම් ලබාදීමේ හැකියාවක් ආයතනය සතුව ඇත.

වර්ෂ 2017 අවසාන භාගයේදී එවක පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ පේශල ජයරත්න බංඩාර මැතිතුමාගේ සංකල්පය අනුව ආරම්භ කරන ලද උතුරු මැද පළාත් සභා ආරක්ෂක ඒකකයද මෙම ආයතනය හරහා ක්‍රියාත්මක වේ. මේ වනවිට රැකියා විරහිත තරුණ තරුණියන් සියයකට ආසන්න ප්‍රමාණයක් සේවා නියුක්තව සිටි. එයද පළාතේ සේවා වියුක්තියට විසඳුමක් හා ජනතාවගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට පිටුවහලක් ලෙස හැඳින්විය හැකිය.

## දැක්ම

"උතුරු මැද පළාත් සභාවේ ඉලක්කගත අරමුණ හා අපේක්ෂාවන් සපුරා ගැනීම සඳහා සහයවන ප්‍රමුඛ ආයතනයක් බවට පත් වීම හා පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත් වීම".

## මෙහෙවර

"ඉදිකිරීම් කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ කුලි පදනම මත සැපයීම, යන්ත්‍ර වාහන අළුත්වැඩියා කටයුතු, සේවා කටයුතු සිදුකිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හී මුද්‍රණ කටයුතු සහ වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා සක්‍රියව දායකවීම සහ යම් නිර්මාණ කටයුක්තක් හෝ සේවා සැපයීමක් උපරිම ඵලදායිතාවයෙන් හා කාර්යක්ෂමව සිදුකිරීමේ අභිලාශය පෙරදැරිව උතුරු මැද පළාතේ ජනතාවගේ ආර්ථික අභිවෘද්ධිය සඳහා සක්‍රියව දායක වීම".

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

- ❖ උතුරු මැද පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත් වීම සඳහා කටයුතු කිරීම.
- ❖ පළාත් සභාවට බහුවිධ සේවාවන් සපයන ආයතනයක් බවට පත් කිරීමේ අරමුණින් මුද්‍රණ, යාන්ත්‍රික හා සේවා අංශයන්ගෙන් ලබා දෙන සේවාවන් පුළුල් කිරීම තුළින් උතුරු මැද පළාත තුළ ප්‍රමුඛතම සේවා සපයන ආයතනයට පත්වීම

- ❖ විවිධ අංශ කෙරෙහි වෙන්වෙන් වශයෙන් වූ පරිපූර්ණ දැනුම හා කුසලතාවයෙන් උසස් මානව සම්පතක් බිහි කිරීම තුළින් පළාතේ හදිසි ඕනෑම අවශ්‍යතාවයකදී දායක වීමට හැකිවන අයුරින් කටයුතු කිරීම.
- ❖ නවීන තාක්ෂණය හා කාර්යක්ෂමතාවයකින් ඉහළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහිත ආයතනයක් බවට පත්වීම තුළින් පළාත් සංවර්ධනයට දායක වීම.
- ❖ රජය විසින් ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා එමගින් රජය විසින් අපේක්ෂා කරන අරමුණු ළඟා කිරීම සඳහා සක්‍රීයව දායකවන ආයතනයක් බවට පත් වීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ යාන්ත්‍රික, මුද්‍රණ හා සේවා අංශයන් සංවර්ධනය කිරීම සඳහා නව යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීම.
- ❖ සියළුම ඉදි කිරීම් හා යාන්ත්‍රික කටයුතු නිසි ප්‍රමිතියට හා කලට වේලාවට සිදු කර ගැනීම.
- ❖ පෞද්ගලික අංශය හා තරඟ කිරීමට හැකිවන පරිදි මුද්‍රණ අංශය සංවර්ධනය කිරීම.
- ❖ යන්ත්‍ර වාහන කුලී පදනම මත ලබාදීම තුළින් ආදායම් තත්වය වර්ධනය කිරිමට කටයුතු කිරීම.
- ❖ වාහන සේවා අංශ මගින් අවම මිලට කඩිනම් සේවය.

## ප්‍රධාන කාර්යයන්

- ❖ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි මුද්‍රණ කටයුතු සිදු කිරීම.
- ❖ වාහන අළුත්වැඩියා හා සේවා කටයුතු.
- ❖ ටයර් සේවා කටයුතු සිදු කිරීම.
- ❖ උතුරු මැද පළාත තුළ විශේෂ ව්‍යාපෘති සඳහා දායක වීම.
- ❖ යන්ත්‍ර කුලී පදනම මත ලබා දිම.
- ❖ පළාත් සභාවට හා අනුයුක්ත රාජ්‍ය ආයතනයන්ට ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා සැපයීම.
- ❖ ආපදා කටයුතුවලදී ජංගම සේවාවන් පැවැත්වීම.
- ❖ ප්‍රායෝගික පුහුණු හා උපදේශන කටයුතු සපයමින් සම්පත්දායකයෙකු ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මුද්‍රණ අංශය මගින් කරනු ලබන සියළුම මුද්‍රණ කටයුතු සඳහා නිසි ප්‍රමිතියට අනුව නියමිත වේලාවට ලබා දීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර උපයෝගි කර ගැනීම.
- ❖ යන්ත්‍ර/වාහන කුලියට දීමෙන් ලැබෙන ආදායම් වැඩිකර ගැනීම සඳහා වැඩි වශයෙන් රාජ්‍ය හා පුද්ගලික අංශයන් වෙත යන්ත්‍ර/වාහන සැපයීම අරමුණකි.
- ❖ වාහන සේවා අංශය මගින් අවම මිලට කඩිනමින් සේවාවන් ලබා දීම.
- ❖ ආයතනයේ පළපුරුදු කාර්යක්ෂම කාර්මිකයින් ලවා වාහන අළුත්වැඩියා කිරීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම.
- ❖ සියළුම ඉදි කිරීම් හා වෙනත් ව්‍යාපෘති කටයුතු නිසි ප්‍රමිතියට අනුව කලට වේලාවට සිදුකර ගැනීම.
- ❖ ඉහත ප්‍රධාන කාර්යයන්වලට අදාලව දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලබා ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ සහාය ලබා ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 58ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 69 කි. පුරප්පාඩු සංඛ්‍යාව 05 ක් ද තාවකාලික පදනමින් 11 දෙනෙකුද සිටින අතර 04 දෙනෙකු පුහුණුවේ.

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති ප්‍රගතිය.

### මුද්‍රණ අංශය මගින් කරන ලද ආදායම් උත්පාදන කටයුතු - 2020

| අ. අං | ආයතනය | අරමුණ ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ඉගෙනුම් ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය නිබන්ධන මුද්‍රණය කිරීම. | උතුරුමැද පළාත් පාසල් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීමට හා විමර්ශනය කිරීම. | උ මැ ප සියලුම පාසල් ළමුන්ගේ ද්වීතික අධ්‍යාපනය ඉහළ නැංවීම. |
| 02 | ඇළහැර, දිඹුලාගල, කැකිරාව, පදවිය, තලාව, ගල්නෑව, තිරප්පනේ, කහටගස්දිගිලිය ප්‍රාදේශිය සභා | වර්ෂයට අවශ්‍ය වන්නා වූ ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම. | ගුණාත්මක හා ක්‍රමානුකූල සේවාවක් ලබා දීම. | අදාල බල ප්‍රදේශය තුල සේවාවන් ලබන පාර්ශවය |
| 03 | රජරට විශ්ව විද්‍යාලය | සහතික පත්‍ර මුද්‍රණය. | විශ්ව විද්‍යාල සිසුන්ගේ දැනුම ඇගයීම සඳහා. | වර්ෂය තුල විශ්ව විද්‍යාලය තුල ඉගෙනුම ලබන ශිෂ්‍ය ප්‍රජාව. |
| 04 | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | මගී ටිකට් පත් මුද්‍රණය. | ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් පවත්වා ගැනීම සඳහා | මගී සේවාව ලබා ගන්නාවූ ජනතාව |
| 05 | කළමණාකරන පුහුණු ඒකකය | පොත් මුද්‍රණය. | පුහුණු කාර්යයන් සැළසුම් කිරීම සඳහා | වර්ෂය තුල පුහුණු කාර්යයන් සඳහා සහභාගී වන නිලධාරීන් |
| 06 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | ආහාර කාඩ් පත් මුද්‍රණය. | අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම | බල ප්‍රදේශයතුල ජීවත් වන අඩු ආදායම්ලාභී ජනතාව |

### සේවා අංශය ආදායම් උත්පාදන කටයුතු - 2020

වර්ෂ 2020 දී සේවා අංශය ඉහළ ප්‍රගතියක් ළඟා කරගෙන තිබෙන අතර ආයතනය විසින් විශාල ආයෝජනයක්ද ඒ වෙනුවෙන් සිදු කර තිබේ.

| වර්ෂය | සේවා කළ වාහන ප්‍රමාණය | වටිනාකම (රු.මි) |
|---|---|---|
| 2019 | 182 | 4.49 |
| 2020 | 352 | 6.13 |



## ආරක්ෂක අංශය උත්පාදන කටයුතු - 2020

වර්ෂ 2020 දී රාජ්‍ය ආයතන සමග ආරක්ෂක සේවාව සැපයුම සම්බන්ධව ගිවිසුම්ගත වීමට හැකිවිය.

| අනු අංකය | ආයතනය | ආරක්ෂක නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මූලික රෝහල - පදවිය | 02 |
| 02 | මූලික රෝහල - තඹුත්තේගම | 02 |
| 03 | මූලික රෝහල - අරලගංවිල | 02 |
| **එකතුව** | | **06** |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

වෙනත් වර්ෂයන් ලෙසම 2020 වර්ෂයටද බලාපොරොත්තු සම්භාරයක් සමඟම අප ආයතනයද පිවිසියේ පෙර වර්ෂයන්ට වඩා සාර්ථක ප්‍රතිඵල අත් කර ගැනීමේ අරමුණින් යුතුවය. නමුත් 2020 වර්ෂයේ අප රටට ඇතුල් වු කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් අප රටේ ආර්ථිකය යටිකුරු කරන ලදි. කෙසේ වුවද මෙම වෛරසයේ බලපෑම පාලනය කිරිම සඳහා රට තුළ පොලිස් ඇඳිරි නීතිය පැනවීම මගින් මිනිස් ක්‍රියාකාරකම් සීමා කිරීම, 2020 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක විය. එලෙස ඇඳිරි නීතිය පනවමින් ගුවන් තොටුපොළවල් වසා දැමීම සහ විදේශයවල සිට පැමිණෙන්නන් නිරෝධායනයට ගත් ක්‍රියාමාර්ග තුළින් වෛරසයේ ව්‍යාප්තිය බොහෝ දුරට පාලනය කිරීමට උපකාරී විය. වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරිම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග එහි පැතිරීම මැඩපැවැත්වීමට උපකාරී වුවද එමගින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සැළකිය යුතු නිශේධනීය බලපෑමක් ඇති වු බව නොරහසකි.

එම කොරෝනා වෛරස් තත්ත්වය හමුවේ අප ආයතනයේ තත්ත්වයද ඉතා අහිතකර විය. 2020 වර්ෂයේ අගභාගයේ දී අප විසන් දියත් කිරිමට සැළසුම් කර කෙටුම් පත් වල පැවති ඉලක්කගත ආදායම් තතත්වයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| මුද්‍රණාල ආදායම | රු.ලක්ෂ 1000.00 |
| යන්ත්‍ර කුලි ආදායම | රු.ලක්ෂ 75.00 |
| වාහන අලුත් වැඩියා වියදම් | රු.ලක්ෂ 30.00 |
| වාහන සේවා ආදායම | රු.ලක්ෂ 40.00 |
| ආරක්ෂක සේවා ආදායම | රු.ලක්ෂ 40.00 |

එහෙත් 2020 වර්ෂයේ මෙම ආදායම් ප්‍රභවයන්හි ඉලක්කයන් අභිබවමින් ගමන් කිරිම අප ආයතනයට සිහිනයක්ම විය. ඒ මන්ද යත් අප ආයතනයේ ප්‍රධානතම ආදායම් ප්‍රභවය වන්නේ මුද්‍රණාල ආදායම වන අතර ඉන් විශාල ආදායමක් උත්පාදනය කරන්නේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මධ්‍යවාර පරීක්ෂණ හා අවසන් වාර පරීක්ෂණ ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය තුලිනි. නමුත් මෙම වර්ෂයේ හිස එසවු වෛරස් තත්ත්වය හමුවේ 2020 මාර්තු 16 දින පාසල් නිවාඩු ලබා දීම මත නිසි පරිදි වාර විභාග පැවැත්වීමට තරම් අධ්‍යාපනයක් ලැබීමට දැයේ දුවා දරුවනට නොහැකි වීම හේතුවෙන් වාර පරීක්ෂණ ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණයතුලින් ලැබීමට තිබු ප්‍රධානම ආදායම් ප්‍රභවය අහිමි විය.එම තත්ත්වය

හමුවේ අනාවරණ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය, ප්‍රතිප්‍රබෝධා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය මෙන්ම පෙර පාසල් සිසුන් සඳහා මුද්‍රණය කරමින් පැවිති ටික්කි ටිකිරි පුවත්පතද මාර්තු මාසයේ දී මුද්‍රණය වීම නතර විය. මෙම තත්ත්වය හමුවේ අප ආයතනය සඳහා අහිමි වූ මුද්‍රණාල ආදායම රුපියල් ලක්ෂ 530ක් පමණ විය. එම අහිමි වීම හමුවේ පෙර වර්ෂයට වඩා විශාල පසුබෑමක් මෙම වර්ෂයෙහි දක්නට ලැබුණි.

යන්ත්‍ර කුලී ආදායමද පෙර වර්ෂයට සාපේක්ෂව විශාල පසු බෑමක් දක්නට ලැබේ. එයටද හේතුව වී ඇත්තේ රටේ පැවති වාතාවරණය බැවින් එවකට රට තුල පෙර වර්ෂයන්ට සාපේක්ෂව සංවර්ධන කටයුතු සිදු නොවීම හේතුවෙන් අප ආයතනයට ද මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ලැබෙන්නා වූ යන්ත්‍ර කුලී ආදායම ඉලක්කගත ආදායමට වඩා බෙහෙවින් අඩු වීම ඊට ප්‍රධාන හේතුවක් විය. වාහන අලුත් වැඩියා හා සේවා අංශය මෙම තත්ත්වය හමුවේ තම වාර්ෂික ඉලක්කගත ආදායම අභිබවමින් කටයුතු කිරිමට සමත්ව ඇත. තවද අප ආයතනය යටතේ ස්ථාපනය කර ඇති උතුරු මැද පලාත් සභා ආරක්ෂක ඒකකයද 2020 වර්ෂ පුරා තම මෙහෙයුම් කටයුතු සාර්ථක අයුරින් දියත් කරමින් ආයතනයේ ඉලකක්කගත ආදායම අභිබවමින් ගමන් කර ඇත. 2020 වර්ෂය තුල අලුතින් රාජ්‍ය ආයතන 3 ක් සමග සහ සම්බන්ධ වී අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සේවා කටයුතු ව්‍යාප්ත කරන ලදි. එමගින් තරුණ තරුණියන් 100කට අධික ප්‍රමාණයකගේ රැකියා වියුක්තිය සඳහා දායකවීමට අප ආයතනයට හැකියාව ලැබී ඇත.

2020 වර්ෂ සම්බන්ධයෙන් මුල්‍ය සමාලෝචනය පිළිබඳව අර්ථ දැක්වීමේ දී වෙන් වෙන්ව අංශ වශයෙන් ගත් කළ වාහන අලුත් වැඩියා අංශය, වාහන සේවා අංශය හා ආරක්ෂක අංශය තම ඉලක්ක අභිබවමින් ගමන් කල ද මුද්‍රණ අංශය හා යන්ත්‍ර කුලියට දීමේ අංශය තම ඉලක්ක කරා ගමන් කිරිමට අපොසත්ව ඇත. ඒ හේතුවෙන් ආයතනයේ සමස්ථ ආදායම 77.53% දක්වා පහත වැටී ඇත. මෙම කරුණු සලකා බැලීමේ දි අපගේ ආයතනික දැක්ම වන පළාත් සභාවට අරමුදල් සැපයීම යන අරමුණින් 2020 වර්ෂයේ දී මදකට බැහැරව ඇති බව පෙනී යන අතර ඉදිරියේ දී මෙම අවධානම් කළමනාකරණය කර ගනිමින් ආයතනික අරමුණු කරා ගමන් කිරිමට නව කළමනාකාරීත්වය මේ වන විට කටයුතු කරමින් පවතී.

# 6.5.මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

**මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව සැකෙවින්...**

ළමා අවධිය, මානව සම්පත පසු කරනු ලබන සොඳුරුතම අවධියයි. ඒ සොඳුරු අවධිය පසු කරන කිසිවෙකුත් එම කාලය නිදහසේ භුක්ති වින්දේ ද හෝ භුක්ති විඳින්නට ඉඩ සලසා දෙන්නේ ද යන්න මහත් ගැටළුවකි. ළමා පරපුරට, වර්තමානය වනවිට අතීතයට වඩා සංකීර්ණ වුත්, හුදකලා වුත්, ජීවිතයක් ගත කිරීමට සිදු වී තිබේ. මීට දශක 5කට පෙර දෙමාපිය වැඩිහිටි ආදරය, කරුණාව, පිළිගැනීම සුරක්ෂිතතාව, ඇගයීම, ප්‍රශංසාව ඇතිව තම නිවසේ හා අවට පරිසරයේ වැඩෙමින් සුන්දර ජීවිතයක් ගත කළ දරුවාගේ සමස්ත සංවර්ධනය සඳහා සුවදායි පරිසරයක් ගොඩනැගුණේ නිතැතිනි.

වැඩිහිටි ජීවන රටාව අවිවේකි වන වර්තමානයේදී දරුවා තම සියළු අයිතිවාසිකම් අහිමි වූ හුදකලාවේ අවධිය වන අ.වු 03-05 කාලයේදී හුදකලා පවුල් පරිසරයෙන් මිදී පෙර පාසල වෙත පිවිස, සම වයස් කණ්ඩායම් සමග සමාජානුයෝජනය වී තම ජීවිතයට අලුත් අත්දැකීම් එක්කර ගනී. මෙම ජීවන රටාවට අවතීර්ණවත්ම දරුවා පෙර පාසල් ගුරුවරිය සමග සමීප වී දරුවා සොයන ආදරය, කරුණාව, පිළිගැනීම, ප්‍රශංසාව ඇයගෙන් ලබා ගැනීමට උනන්දු වේ.

දරුවාගේ කායික හා මානසික ක්‍රියාකාරීත්වය වර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ආකල්ප හා ධාරිතා සංවර්ධනය සඳහාත්, දෙමාපිය ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත් දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට භෞතික සම්පත් සංවර්ධනය සඳහාත්, මේවන විට ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ 13 වන සංශෝධනය 09 වැනි උපලේඛනයේ 01 වන ලැයිස්තුවේ 03 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභාවට බලතල පැවරීමේ විධිවිධානවලට අනුකූලව උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනය කිරීම පිණිස පෙර පාසල් පිහිටුවීම හා අනුසාංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ප්‍රඥප්තියක් පිහිටුවා ඇත. එය අංක 04 දරණ උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වන ලදී.

එය උතුරු මැද පළාත් සභාව විසින් සම්මත කර 2004 පෙබරවාරි මස 19 වන දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

උතුරු මැද පළාතේ ස්ථාපිත කර ඇති මුල් ළමාවිය ප්‍රඥප්තියට අනුව පෙර පාසල් පද්ධතිය ගොඩනැගීම සඳහා මේ වන විට උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දුන් ප්‍රතිපාදන වලින් ගුරු පුහුණු වැඩසටහන් සඳහා ද වැය කර ඇත. සැම දරුවෙකුම සුවිශේෂී වන අතර, සමාන වටිනාකමකින් යුක්ත වේ. දරුවාට ආවේණික වේගයකින් සංවර්ධනය වන අතර, හැකියාවන්ගෙන් හා දක්ෂතාවයන්ගෙන් යුක්ත වේ. උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් සමඟ එක්ව ළමා සංවර්ධනයට බලපාන පවුල, ප්‍රජාව හා සංස්කෘතිය යන සාධක හා බැඳුනු සන්දර්භයක් තුළ පෙර පාසල් දරුවන්ගේ සංවර්ධනය උදෙසා සමෝධානිත ඉගෙනුමක් ලබා දෙනු ලැබේ. දරුවන්ගේ සංවර්ධනය උදෙසා දරුවන්ට සැලසෙන රැකවරණය ප්‍රමුඛ කොට සලකන අතර, දෙමාපියන්, පෙර පාසල් ගුරුවරුන් හා ප්‍රජාව මේ පිළිබඳව වඩා සැලකිලිමත් විය යුතු ය.

පෙර පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා කායික සංවර්ධනය, සමාජීය හා චිත්තවේග සංවර්ධනය, ප්‍රජනන හැකියා සංවර්ධනය හා භාෂාව හා මුල් කාලීන සාක්ෂරතාවය ප්‍රමුඛ කොට ගත් ඉගෙනුම් ඵලවලට අදාල නිපුණතාවයන් හෙබි පුංචි දරුවන් තම දැනුම, ආකල්ප, කුසලතා, දියුණුකර ගනිමින් අනාගතය කරා පියනඟනු දැකීම මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අභිප්‍රාය වේ.





උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය මෙම පළාතේ මුල් ළමාවියෙහි පසුවන දරුවන්ගේ අනාගතය වෙනුවෙන් පෙර පාසල් නියාමනයේ යෙදෙන ආයතනයකි.

දරුවෙකුගේ ජීවිතයේ මුල් ළමාවිය අවධිය දරුවාගේ මොළයේ වර්ධනය සඳහා ඉතාමත් තීරණාත්මක අවධියයි. එම කාලය දරුවාගේ බුද්ධිමය ක්‍රියාකාරීත්වයෙන් ගුණාත්මක බව තීරණය කරන, බාහිර අත්දැකීම්වලට දරුවෙකු වඩාත් සංවේදී කරන, දරුවාගේ භාෂා සංවර්ධනය, සමාජානුයෝජනය හා පෞර්ෂය ගොඩනැඟීම ආදිය හා සම්බන්ධ ඉතා වැදගත් සංවර්ධන කාර්යයන් මේ අවධියේ දී දරුවා තුළ සිදු වේ. උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් සමඟ එක්ව ළමා සංවර්ධනයට බලපාන පවුල, ප්‍රජාව හා සංස්කෘතිය යන සාධක හා බැඳුනු සන්දර්භයක් තුළ පෙර පාසල් දරුවන්ගේ සංවර්ධනය උදෙසා සමෝධානිත ඉගෙනුමක් ලබා දෙනු ලැබේ.

මුල් ළමාවියට අදාළ සංවර්ධන කාර්යයන් ඉටු කර ගැනීමට, ඊට ශක්තිය සපයන පරිසරයක් තිබිය යුතු ය. එම පරිසරය පෙර පාසල් තුළින් ගොඩනැගෙන අතර, විධිමත් ලෙස අවුරුදු 3 – 5 අතර දරුවෙකු සංවර්ධනයකර ගැනීමට පෙර පාසල් ශක්තිමත්කර සුදුසු ගුරුවරුන් පත්කරලීම මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ අරමුණයි. අධිකාරියේ දැක්මට අනුව "සතුටින් පිරි නිපුණතාවන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කර ගැනීමට" මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් අධීක්ෂණය හා නියාමනය ඔස්සේ කටයුතු කරනු ලබයි.

**දැක්ම**

"සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම".

**මෙහෙවර**

"උතුරු මැද පළාත තුළ විවිධත්වයෙන් යුතු, මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, නිසඟ කුසලතාවයෙන් යුත්, සෞන්දර්යාත්මක හැඟීමෙන් පිරිපුන්, සාරධර්ම සපිරි, පෙර පාසල් දරු පරපුරක් බිහි කිරීම සඳහා මධ්‍යම රජයේ හා පළාත් සභාවේ මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ද සම්බන්ධ කරගනිමින් 2003 අංක 04 දරණ ප්‍රඥප්තියට අනුකූලව වැඩසටහන් සම්පාදනය, සම්බන්ධීකරණය හා ඵලදායි ලෙස මෙහෙයවීම පිළිබඳව පළාතේ කේන්ද්‍රීය ආයතනයක් ලෙස කැපවීමෙන් කටයුතු කිරීම".

## දිගුකාලීන අරමුණු

- ❖ ගුණාත්මක සේවා සපයන පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරීම.
- ❖ පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳව මනා දැනුමක් සහිත සමාජයක් ඇති කිරීම.
- ❖ සෞභාග්‍යයේ දැක්ම තුළින් ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක් බවට මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ ළමා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- ❖ ළමා ආරක්ෂණය පිළිබඳ දෙමාපියන් මනාව දැනුවත් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ උතුරු මැද පළාතේ පූර්ව ළමා අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මග පෙන්වීම.
- ❖ ගුණාත්මක, නිපුණතාවන්ගෙන් හෙබි දරු පරපුරක් බිහි කිරීම.
- ❖ පෙර පාසල් ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් නියමයන් පැනවීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන් පුහුණු කිරීම හා පුහුණුව ලැබූ අයට සහතික පත්‍ර ලබා දීම.
- ❖ පෙර පාසල් දරුවන්ගේ පෞද්ගලික ස්වස්ථතාවය හා පෝෂණය ඇති කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මානව සම්පත් සංවර්ධනයට අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- ❖ අධිකාරියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අදාළ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.
- ❖ රාජ්‍ය නොවන ආයතන හා සංවිධානවල සහාය, අනුග්‍රහය ලබා ගැනීම.

## මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අරමුණු

- ❖ උතුරු මැද පළාත තුළ පෙර පාසල් පිහිටුවීම.
- ❖ ලියාපදිංචිය, ශිෂ්‍යයින් ඇතුළත්කර ගැනීම, ගුරුවරුන් බඳවා ගැනීම සඳහා.
- ❖ නිර්ණායක සැකසීම පෙර පාසල් පිහිටුවීම හා ඒවායේ ව්‍යාපෘති පිළිබඳව කටයුතු කිරිම.
- ❖ ඉහත අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්




| තිරසර සංවර්ධන අරමුණු | ක්‍රියාකාරකම |
|---|---|
| නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරිම | පෝෂණය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම |
| | ස්වස්ථතාවය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම |
| පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනිමේ අවස්ථා සැලසිම | පෙර පාසල් පාලිකාවන් සඳහා විවිධ පුහුණු |
| | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 40ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 29 කි. පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් ද වැඩ බැලීමේ පදනම මත එක් අයෙක් ද කොන්ත්‍රාත් පදනමින් 02 දෙනෙකු හා අනුයුක්තයක් ලෙස එක් අයෙකු සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග.

1. උතුරු මැද පළාත තුළ සංවර්ධිත පෙර පාසල් පද්ධතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

2. සදාචාර සම්පන්න දරු පරපුරක් බිහි කිරීම උදෙසා කටයුතු කිරීම.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය සඳහා පරිපාලන ගොඩනැඟිල්ල සහ ශ්‍රවණාගාරය ඉදිකිරීම | භෞතික සම්පත් සංවර්ධනය තුළින් භෞතික සම්පත් වඩා ඵලදායි ලෙස පරිභෝජනය කිරීමට නවීන සුදුසු ස්ථානයක් ලෙස පරිපාලන ගොඩනැඟිල්ල හා ශ්‍රවණාගාරය ඉදිකිරීම. | පරිපාලන ගොඩනැඟිල්ල හා ශ්‍රවණාගාරය | - | 10% | 40% | 50% | පළාත් සභා අරමුදල | | | |

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන් පිළිබඳව අදහස් හා යෝජනා.

- නිපුණතාවන්ගෙන් පිරි පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරීම සඳහා සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.
- දැනුමින් යුත් කාර්ය මණ්ඩලයක් ඇති කර ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන් හා කාර්යාල නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම.
- වඩාත් දියුණු ආදර්ශ පෙර පාසල් අතර අත්දැකීම් හා දැනුම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම.
- පෙර පාසල් දරුවන්ගේ කුසලතා සංවර්ධනය ඇගයීම.
- පෙර පාසල් ගුරු උපහාර උත්සවයක් පැවැත්වීම.
- අංග සම්පූර්ණ පෙර පාසල් පද්ධතියක් පළාත තුළ ඇති කිරීම.

## 01. උතුරු මැද පළාතේ දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය උදෙසා ක්‍රමෝපායික සංවර්ධන ගමන් ම

පළාතේ දරුවන්ගේ මුල් අධ්‍යාපනය වඩාත් ඵලදායී මෙන්ම ක්‍රමානුකූල කිරීම සඳහා මෙන්ම මුල් ළමාවිය සංවර්ධනය පළාතේ අනාගත සංවර්ධනය ශක්තිමත් කිරීම උදෙසා භාවිතා කළ හැකිවන අයුරින් මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, කුසලතාවයෙන් යුත් සෞන්දර්යාත්මක මෙන්ම සාරධර්ම වලින් සපිරි අනාගත දරු පරපුරක් නිර්මාණය කිරීම සඳහා 2020 වර්ෂයේදී ශීර්ෂ 04ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවන ලදී.

01.පෙර පාසල්
**භෞතික පරිසරය සංවර්ධනය කිරීම**

**02.පෙර පාසල්**
**ගුරුවරියන්ගේ සමස්ත සංවර්ධනය**
**හා**
**දැනුම යාවත්කාලීන කිරීම**

03.මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ
දෙමාපිය ආකල්ප
වර්ධනය කිරීම

**04.**මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ
ප්‍රජාව බල ගැන්වීම

### පසුගිය වසර 03ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

2018 වර්ෂයේදි උතුරුමැද පළාතේ පෙරපාසල් දරුවන් අතර සමානාත්මතාවයෙන් යුතු පෙර පාසල් අධ්‍යාපන රටාවක් ඇති කිරීමේ අරමුණින් පෙරපාසල් 30ක් සඳහා රු.10000/- බැගින් රු.මි. 03ක් වැය කරන ලදී.

තවද උතුරුමැද පළාතේ පෙරපාසල් ගුරුවරියන් සඳහා දැනුමින් පරිපූර්ණ පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරීමේ අරමුණින් පෙරපාසල් ගුරුවරුන් සඳහා ගුරු පුහුණු, ධාරිතා සංවර්ධන වැඩසටහන්, ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් රු.මි. 2.5ක් වැය කරන ලදී. එමෙන්ම 2018 වර්ෂයේ දී පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන්, පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් පෙරපාසල් දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි. 0.5ක් වැය කරන ලදී.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන් මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| නව පරිපාලන ගොඩනැඟිල්ල ඉදි කිරීම | තෘප්තිමත් හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දීම | තෘප්තිමත් හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දීම |
| නව ගොඩනැඟිල්ල සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | තාක්ෂණයෙන් අනූන විධිමත් සේවාවක් ලබා දීම | තාක්ෂණයෙන් අනූන විධිමත් සේවාවක් ලබා දීම |
| ආදර්ශ පෙර පාසල් ඉදි කිරීම | පළාත තුළ විධිමත් පෙර පාසල් පද්ධතියක් ඇති කිරීම | පළාත තුළ විධිමත් පෙර පාසල් පද්ධතියක් ඇති කිරීම |
| සෙල්ලම් මිදුල උපකරණ ලබා දීම | අංග සම්පූර්ණ සෙල්ලම් මිදුල උපකරණ සහිත පෙර පාසල් පද්ධතියක් ඇති කිරීම | අංග සම්පූර්ණ සෙල්ලම් මිදුල උපකරණ සහිත පෙර පාසල් පද්ධතියක් ඇති කිරීම |
| පෙර පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | පෙර පාසල් දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම | පෙර පාසල් දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම |
| පෙර පාසල් ගුරුවරියන් සඳහා පාඨමාලාවන් පැවැත්වීම | වෘත්තීය සුදුසුකම් සපුරාගත් පෙර පාසල් ගුරුවරියන් ඇති කිරීම | වෘත්තීය සුදුසුකම් සපුරාගත් පෙර පාසල් ගුරුවරියන් ඇති කිරීම |
| පෙර පාසල් දරුවන් සඳහා නිල ඇඳුම් කට්ටලය ලබා දීම | ගුණාත්මකභාවයෙන් හා සාධාරණ මිලකින් යුත් නිල ඇඳුම් පළාතේ පෙර පාසල් දරුවන් අතර බෙදා දීම | ගුණාත්මකභාවයෙන් හා සාධාරණ මිලකින් යුත් නිල ඇඳුම් පළාතේ පෙර පාසල් දරුවන් අතර බෙදා දීම |
| රක්ෂණාවලියක් ක්‍රියාත්මක කිරීම | පෙර පාසල් ගුරුවරියන්ගේ සුභ සාධනය ඉහළ නැංවීම. | පෙර පාසල් ගුරුවරියන්ගේ සුභ සාධනය ඉහළ නැංවීම. |
| පෙර පාසල් ගුරුවරියන්ගේ දීමනාව ඉහළ නැංවීම | පෙර පාසල් ගුරුවරියන්ගේ සුභ සාධනය ඉහළ නැංවීම. | පෙර පාසල් ගුරුවරියන්ගේ සුභ සාධනය ඉහළ නැංවීම. |

## කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳ සමස්ත අදහස

2020 වර්ෂයේදී සමස්ත කාර්ය සාධනය ළඟාකර ගැනීමේදී Covid-19 ගෝලීය වසංගතය මෙන්ම කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉතාම අසීරු ලෙස ඉලක්ක කරා ළඟාවීමට වෙර දරා ඇත.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේ දී ආයතනය සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2020 වර්ෂය ආරම්භයේ දීම ඇති වූ Covid 19 ගෝලීය වසංගත තත්වය නිසා උතුරු මැද පළාත් තුල සියලුම පෙර පාසල් වසා දැමීමට සිදු වූ අතර, එම හේතුවෙන් ඒ වන විටත් පවත්වමින් තිබූ පෙර පාසල් ගුරුවරියන්ගේ පෙර පාසල් ගුරුපුහුණු ඩිප්ලෝමා පාඨමාලාව නවතා දැමීමට සිදු විය. එමෙන්ම පෙර පාසල් දරුවන් සඳහා ලබා දෙන මාසික සහරාව මුද්‍රණය කිරීමද නවතා දැමීම හේතුවෙන්, එම සහරාව අලෙවියෙන් ලැබෙන ආදායමෙන් ලබා දෙන පෙර පාසල් ගුරු රක්ෂණය නවතා දැමීමට ද සිදු විය. තවද 2021 වර්ෂය ආරම්භයේදී පෙර පාසල් දරුවන් සඳහා ලබා දීමට සැලසුම් කර තිබූ නිල ඇඳුම් ලබා දීමේ වැඩසටහන තාවකාලිකව නැවැත්වීමට සිදුවිය.

# 6.6. පුස්තකාල සේවා මණ්ඩලය

**ආයතනය පිළිබඳ මූලික තොරතුරු**

උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් පුස්තකාල සේවාවක් ඇති කරලීමත්, එමඟින් ජන කොටස් සඳහා දැනුම හා තොරතුරු ලබාදීමට සහය දීමත් උතුරු මැද පළාතේ සංවර්ධන කටයුතුවලට තොරතුරු සේවාව ලෙස ක්‍රියාත්මක වශයෙන් සහභාගී වීම සඳහා විධිවිධාන සැලැස්වීමට යන කාර්යයන් ඉටුකර ගැනීම පිණිස 2002 අංක 04 දරණ ප්‍රඥප්තිය, 2004 සහ 2009 වර්ෂ දෙකේ දී කරන ලද සංශෝධන දෙකකට පසුව 2011 වර්ෂයේ අගෝස්තු මාසයේදී එවකට ප්‍රධාන අමාත්‍ය ධූරය දැරූ ගරු බර්ටි ප්‍රේමලාල් දිසානායක මහතාගේ මූලිකත්වයෙන් පළමු වරට උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලදී.

**දැක්ම**

"උතුරු මැද පළාත තුළ යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වා ගෙන යෑම".

**මෙහෙවර**

"යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වාගෙන යාම තුළින් පොතපත කියවීමෙන් දැනුම, ආකල්ප, කුසලතාවලින් පිරිපුන් සංවේදී බුද්ධිමත් ජන සමාජයක් ගොඩනැගීම".

**දිගුකාලීන අරමුණු**

උතුරු මැද පළාතේ පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාල නූතන තාක්ෂණ සම්පත් ද සහිතව දියුණු පුස්තකාල සේවාවක් ලබා දෙන ආයතන ලෙස ගොඩනැගීම.

**කෙටිකාලීන අරමුණු**

පොතපත කියවීමෙන් බැහැරවන ජන සමාජයේ බාල පරපුර ඉලක්කකර ගනිමින් ඔවුන් පොතපත කියවීමට හුරු පුරුදු කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

- උතුරු මැද පළාතේ පුස්තකාල සහ තොරතුරු සේවා කටයුතු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය.
- පුස්තකාල සංවර්ධනයට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.
- පළාත්වාසී පාඨකයන් සඳහා පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීම.
- පුස්තකාල සේවා ව්‍යාපෘතියකට අවශ්‍ය වන්නා වූ සාමූහික ප්‍රතිග්‍රහණය, මධ්‍යගත සැලසුම්කරණය, ඒකාබද්ධ සුචීන් සම්පාදනය, ප්‍රාදේශීය එකතුන් සංවර්ධනය කරලීම, අන්තර් පුස්තකාල පිරුළු සේවා, ජංගම පුස්තකාල සේවා, විඥාපන ජාල පිහිටුවීම සහ අදාළ අනෙකුත් කටයුතු සිදු කිරීම.
- පොත් පත්, වාර සඟරා ඇතුළු මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සහ පරිගණකගත තොරතුරු සේවාවන් යොදා ගනිමින් පළාත තුළ උසස් මට්ටමේ තොරතුරු සේවාවක් පවත්වාගෙන යෑම.
- පොත්පත් හා ලේඛණ උතුරු මැද පළාතට විශේෂිත වූ දුර්ලභ ලිපි ලේඛණ හා ග්‍රන්ථයන්හි අත්පිටපත්, පුස්කොළ පොත් ආදිය රැස් කිරීම හා සංරක්ෂණය.
- ජාතික, ජාත්‍යන්තර හා කලාපීය තොරතුරු ජාල හා සේවාව සම්බන්ධ වීම.
- පළාත් සභාව ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය තොරතුරු සහ දත්ත සැපයීම මඟින් සහය වීම.
- පුස්තකාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා උසස් කිරීම් පටිපාටි, විභාග පටිපාටි සකස් කිරීම.

- දැනට පවත්වාගෙන යන පුස්තකාල පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් අදාළ පුස්තකාල සංවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- පළාතේ පුස්තකාල හා තොරතුරු සේවා සංවර්ධනය සඳහා සුදුසු වෙනත් පියවර ගැනීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- තඹුත්තේගම පුස්තකාලය සඳහා භෞතික සම්පත් සංවර්ධනය කිරිම
- පුස්තකාල සඳහා කියවීම් පොත්පත් ලබා දීම
- නිර්මාණ තරඟ පැවැත්වීම.
- ස්වයං නිර්මාණ දිරිගැන්වීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්.




සැමට ජීවිත කාලය පුරා පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක්

නව මහජන පුස්තකාල ඉදිකිරිම

කියවීම් කඳවුරු පැවැත්වීම

ප්‍රමිතියානුකූලව මහජන පුස්තකාල සකස් කිරිම

පාඨක සමාජ තරඟ පැවැත්වීම

නිර්මාණකරණය සඳහා ලේඛකයින් දිරිගැන්වීම

ලේඛණ කුසලතා ප්‍රවර්ධනය කිරිම සඳහා මුද්‍රණ කටයුතු කර ගැනීම
සඳහා මුද්‍රණ ආධාර ලබාදිම

පුස්තකාල සඳහා අත්‍යාවශ්‍ය භෞතික පහසුකම් සැලසිම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 09ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 06 කි. පුරප්පාඩු සංඛ්‍යාව 03 ක් වන අතර 02 දෙනෙකු පුහුණුවේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ

1. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ප්‍රඥාසම්පන්න පුරවැසියෙක් : දැනුමෙන් පිරිපුන් සමාජයක් යන තේමාව යටතේ උතුරුමැද පළාතේ දරුවන්ගේ මෙන්ම මහජනතාවගේ දැනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා උතුරුමැද පළාතේ පුස්තකාල පහසුකම් දියුණු කිරීම.

2. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය යන ප්‍රතිපත්තිය අනුව පාසල් දරුවන් පාසල් පුස්තකාලය පරිහරණය හරහා නවෝත්පාදන පදනම් කරගනිමින් දැනුම ප්‍රඥාව වැඩිදියුණු කර ගැනීමට අවකාශය සලසා දීම.

## අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්කය | දර්ශකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජන (රු.මි.) | ඉලක්කගත වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| 4 | 4.1 | 4.1.1 | පාසල් පුස්තකාල සහ මහජන පුස්තකාල සඳහා පොත් ලබාදීම | 0.37 | 30% |
| | 4.2 | 4.2.1 | | | |
| | 4.6 | 4.6.1 | නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම | - | - |
| | 4.අ | 4.අ.1(අ) | තඹුත්තේගම ආදර්ශ පුස්තකාලයේ භෞතික පහසුකම් සංවර්ධනය | 8.1 | 8.00 |

## අංශයේ සංවර්ධනය මැනීම සඳහා තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සලකා බලමින් ගොඩනගාගත් පළාත් නිමැවුම් දර්ශක හා ඉලක්ක

| ප්‍රධාන කාර්ය සාධක දර්ශක | ක්‍රියාකාරකම | නිමැවුම් දර්ශකය | | ප්‍රතිඵල දර්ශකය |
|---|---|---|---|---|
| | | ක්‍රියාවලි නිමැවුම් | වැඩසටහන් නිමැවුම් දර්ශකය | |
| පවත්වනු ලබන තරඟාවලි සංඛ්‍යාව | අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිර්මාණකරනයේ නියැලෙන පිරිස් උනන්දුවක් දැක්වීම | ඉදිරිපත් වූ නිර්මාණ සංඛ්‍යාව | 200 |
| පුස්තකාල පාඨකයින් සංඛ්‍යාව | තඹුත්තේගම ආදර්ශ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | ප්‍රදේශයේ මහජනතාවට සහ පාසල් දරුවන්ට දැනුම් සපුරාලීමට සුදුසු භෞතික සම්පත් සංවර්ධනය කිරීම | භෞතික සම්පත් සංවර්ධනය කරනු ලැබූ පුස්තකාල සංඛ්‍යාව | 01 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශක | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම | නිර්මාණකරණයේ නියැලෙන පිරිස් දිරිගැන්වීම | නිර්මාණකරණයේ නියැලෙන නව ලේඛකයින් සංඛ්‍යාව | 200 | 300 | 400 | 500 | 0.3 | 0.5 | 0.6 | 0.6 |
| තඹුත්තේගම ආදර්ශ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | පුස්තකාල පරිහරණය කරන උපයෝජක පිරිස් වැඩිකිරීම | පුස්තකාල පරිහරණය කරන උපයෝජකයින් ප්‍රමාණය | - | 200 | 300 | 500 | 1.4 | 0.9 | 1.0 | 1.5 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති-2020

| විස්තරය | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි.) |
|---|---|---|---|
| නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම | අනුරාධපුර දිස්ත්‍රික්කය සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | 5000 | - |
| තඹුත්තේගම ආදර්ශ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | තඹුත්තේගම | 1000 | 1.4 |
| තඹුත්තේගම ආදර්ශ පුස්තකාලය සඳහා ලී බඩු මිලදී ගැනීම | | 1000 | 1.7 |
| තඹුත්තේගම ආදර්ශ පුස්තකාලයේ භූමිය සකස් කිරීම | | 1000 | 5.00 |

## උතුරු මැද පළාත් සභා ප්‍රධාන යටතේ 2020 වර්ෂයේ නව ව්‍යාපෘති සඳහා රු. මිලියන 8.12 ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන්

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|
| **අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන් - 2020** | | |
| පුස්තකාලය සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාලීය භාණ්ඩ මිලදී ගැනීම | 1.70 | 1.64 |
| පුස්තකාලයේ භූමිය සකස් කිරීම | 5.00 | 4.47 |
| පුස්තකලය සඳහා පොත් මිලදී ගැනීම | 1.4 | 1.39 |
| **මුළු එකතුව** | **8.12** | **7.50** |

## උතුරු මැද පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය

තිරසර සංවර්ධන අරමුණු අතරින් ගුණාත්මක අධ්‍යාපනයක් ඇතිකිරීමේ අරමුණ පෙරදැරිව උතුරුමැද පළාතේ පාසල් දරුවන් මෙන්ම මහජනතාවගේ කියවීම් කුසලතා ඔප්නැංවීම සඳහා 2020 වර්ෂයේ වෙන් කරන ලද රු.මි. 8.1 ක ප්‍රතිපාදන ප්‍රමාණය තුළින් ක්‍රියාකාරකම් සිදු කිරීමට හැකිවිය. නිර්මාණ තරඟ ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභීන් 5000ක් පමණ සම්බන්ධ කර ගැනීමටත් තඹුත්තේගම ආදර්ශ පුස්තකාලයේ භූමිය සකස් කිරීම මෙන්ම පොත් මිලදී ගැනීම තුලින් තඹුත්තේගම ප්‍රදේශයේ මහජනතාවටද පාසල් දරුවන්ටද මහඟු පිටුබලයක් ලැබෙනු ඇත.

## තඹුත්තේගම පුස්තකාලය සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාලීය භාණ්ඩ මිලදී ගැනීම (20/610/03/02/2102/23 (ii) /N/A/01)

අලුතින් ඉදිකරන ලද තඹුත්තේගම ආදර්ශ පුස්තකාල ජනතා අයිතියට පත් කිරීම සඳහා අවශ්‍ය ලී බඩු මිලදී ගැනීම සිදුකරන ලදී.

## තඹුත්තේගම ආදර්ශ පුස්තකාලයේ භූමිය සකස් කිරීම (20/610/03/02/2102/23 (ii) /N/A/01)

අලුතින් ඉදිකරන ලද තඹුත්තේගම ආදර්ශ පුස්තකාලයේ භූමිය සකස් කිරීම සිදුකරන ලදී.





## තඹුත්තේගම ආදර්ශ පුස්තකලය සඳහා පොත් මිලදී ගැනීම

අලුතින් ඉදිකරන ලද තඹුත්තේගම ආදර්ශ පුස්තකාල ජනතා අයිතියට පත් කිරීම සඳහා අවශ්‍ය පොත් මිලදී ගැනීම සිදුකරන ලදී.





## අඳුරු පන්හිඳට කළා නෙතක් නිර්මාණ තරගය පැවැත්වීම

ගුඩ් නේබර්ස් ජාත්‍යන්තර ආයතනය හා සම්බන්ධ වෙමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරුන් හා පාසල්වල සේවය කරන අනධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධ කරගනිමින් නිර්මාණ තරගයක් පවත්වන ලදී.





## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධන සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන් මග | |
|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන |
| මහජන සහ පාසල් පුස්තකාල පාඨකයින්ට ඩිජිටල්කරණය හරහා තොරතුරු ලබාදීම | නව තාක්ෂණය තුළින් දැනුම් අවශ්‍යතා සපුරාගැනීමට උපයෝජකයින් හුරු කිරීම | ගෝලීයකරණයට මුහුණ දෙමින් සියළු දැනුම් අභියෝගවලට මුහුණ දීමට හැකි ජනකොට්ඨාශයක් උතුරුමැද පළාතේ බිහිකිරීම |
| උතුරුමැද පළාතේ සියළු මහජන පුස්තකාල ජාලගත කිරීම | මහජන පුස්තකාල හරහා උතුරුමැද පළාතේ විවිධ ප්‍රදේශවල ජනතාවට තොරතුරු හුවමාරු කර ගැනීමට හැකිවීම | |
| පිරිවෙන් පුස්තකාල, පාසල් පුස්තකාල සහ දහම් පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා වැඩි දායකත්වයක් ලබාදීම | උතුරුමැද පළාතේ දුෂ්කර ප්‍රදේශවල ඇති පිරිවෙන් පුස්තකාල, පාසල් පුස්තකාල සහ දහම් පාසල් පුස්තකාලවල භෞතික සම්පත් සංවර්ධනය කිරීම | යාවත්කාලීන තොරතුරු සේවාවක් පාඨකයින්ට ලබාදීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත තුළ ඵලදායි පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීමට ආයතනයේ මූලික අරමුණු පෙරදැරිව කොවිඩ් 19 ගෝලීය වසංගතය හමුවේ ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති සිදුකරගෙන යාමට කාර්ය මණ්ඩලය ගෙන්වා ගැනීමේදී ඇති වූ දුෂ්කරතා මෙන්ම මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම යන දුෂ්කරතා හමුවේ වුවද 2020 වර්ෂයේ වෙන්කළ ප්‍රතිපාදන සීමාව යටතේ සිදු කිරීමට සැලසුම් කළ සියලු කාර්යයන් භෞතික, මානව, මූල්‍ය සම්පත් කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කරමින් ළඟා කර ගන්නා ලදි.

# 07.පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

**පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය පිළිබඳ මූලික විග්‍රහය**

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො)

| දිස්ත්‍රික්කය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 9,650 | 12,990 | 15,760 | 12,940 | 17,840 | 21,855 |
| පොළොන්නරුව | 7,160 | 3,525 | 8,310 | 11,600 | 9,960 | 9,505 |
| **එකතුව** | **16,810** | **16,515** | **24,070** | **24,540** | **27,800** | **31,360** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය




මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ උතුරුමැද පළාතේ දායකත්වය

| විස්තරය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| ජාතික නිෂ්පදනය (මිරිදිය මත්ස්‍ය) | 67,300 | 73,930 | 82,540 | 88,100 | 90,000 | 102,220 |
| උතුරුමැද පළාතේ දායකත්වය(%) | 25.00 | 22.34 | 29.16 | 27 | 30.8 | 31 |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

ශීතාගාර පහසුකම්

| දිස්ත්‍රික්කය | ශීතාගාර පහසුකම් | ධාරිතාවය (මෙ.ටො. දිනකට) |
|---|---|---|
| අනුරාධපුර | 1 | 15 |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

මිරිදිය ධීවර යාත්‍රා

| දිස්ත්‍රික්කය | 2013 | 2014 | 2015 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 1103 | 1103 | 1153 | 1610 | 1721 | 1775 |
| පොළොන්නරුව | 1048 | 1048 | 1073 | 1047 | 1254 | 690 |
| **එකතුව** | **2151** | **2151** | **2226** | **2657** | **2975** | **2465** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන සහ සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් පළාත් ප්‍රතිපත්ති භාවිතා කරමින් උතුරු මැද පළාතේ කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු යන අංශයන්ගෙන් පළාත සංවර්ධනය කිරීම සඳහා බලධාරිත්වය දරණ රාජ්‍ය ආයතනය වේ. පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය සඳහා විශාල කාර්ය භාරයක් ඉටුකරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම, අලෙවිය හා තාක්ෂණික සංවර්ධනය, කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත වැඩිදියුණු කිරීම, කෘෂිකර්මය ආශ්‍රිත ආයතන වල කටයුතු ශක්තිමත් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සම්බන්ධ සංවර්ධන කටයුතු සිදුකරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුල පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදනය හා ඵලදායිතාව මෙන්ම සත්ත්ව සෞඛ්‍ය සංවර්ධනය, ආයතනික ධාරිතාව වැඩිදියුණු කිරීම යන සංරචක ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ. එමෙන්ම ධීවර විෂයට අදාල මෙහෙයුම් හා අධීක්ෂණ ක්‍රියාවලිය ද මෙම අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන කාර්යයක් වේ. සියළු සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනවලද සහයෝගය ලබා ගනිමින් පළාතේ කෘෂි, සත්ව නිෂ්පාදන නිෂ්පාදන සහ ධීවර අංශ පුළුල්කර ප්‍රධාන වශයෙන් ස්වයං පෝෂිත ආර්ථිකයක් තුලින් ජන දිවිය ශක්තිමත් කිරීම අරමුණයි.

## දැක්ම

" ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක් "

## මෙහෙවර

"කෘෂිකර්ම, කෘෂි හා සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු, සියලු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම"

## දිගු කාලීන අරමුණු

01.ජාතික ප්‍රතිපත්තීන්ට අනුගතව කෘෂිකාර්මික සම්ප්‍රදායන් රැක ගනිමින් නවීන තාක්ෂණයට අනුව කෘෂිකාර්මාන්තයේ ඵලදායිතාවය සහ නිෂ්පාදනය ඉහළ නැංවීම

02.පළාතේ 80 % ක් වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම

03තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගත හැකි පරිදි කෘෂි කාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

04.තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගත හැකි කෘෂිකාර්මික වැඩසටහන් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

06. මිරිදිය ධීවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනයට ඉහල දායකත්වයක් සපයන පළාත බවට පත් කිරීම

05.ධීවර කර්මාන්ත තුළ ධීවර පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධන කිරීම

## ළඟාකර ගැනිමට අපේක්ෂිත කෙටි කාලීන අරමුණු

**කෙටිකාලීන අරමුණු**

**01අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුළ නිම කිරීම.**

**02. නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද / තාක්ෂණ දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහිකර ගැනීම.**

**03. වස විස නැති ආහාර පරිභෝජනයට යොමුවන පිරිස වර්ධනය කිරීම.**

**04 සුළු පරිමාණ ව්‍යාවසායකයින්ට අවශ්‍ය සානුබල සැපයීම තුළින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම.**

**05. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් ජාතික නිෂ්පාදනයට පළාතේ දායකත්වය වර්ධනය කිරීම.**

**06.මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.**

**07.ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.**

**08. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යාවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.**

**09. අපනයනය සඳහා විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම**

## ප්‍රධාන කාර්යයන් හා ප්‍රධාන උපාය මාර්ගයන්

| ප්‍රධාන කාර්යයන් | උපාය මාර්ග |
|---|---|
| අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය.<br><br>ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.<br><br>කෘෂි ආශ්‍රිත නිශ්පාදන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.<br><br>කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය. | අධීක්ෂණය, පසුවිපරම හා ප්‍රගති සමාලෝචනය.<br><br>ආයතනයේ චක්‍රලේඛ නිකුත් කිරීම.<br><br>පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br><br>කෘෂි ව්‍යවසායකයන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br><br>මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන මගින් මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් ජලාශ සඳහා ලබාදීම.<br><br>ධීවර කාර්මිකයන් සවිබල ගැන්විම.<br><br>විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් සවිබල ගැන්වීම. |

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම මෙන්ම අමාත්‍යාංශය යටතේ පවතින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා සහසම්බන්ධව ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ අදාල ඉලක්ක සාධනයකර ගැනිම සඳහා 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 73ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 41 කි. පුරප්පාඩු සංඛ්‍යාව 32 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. භාවිතයට ගතහැකි එහෙත් භාවිතයට නොගන්නා සහ ඌන භාවිත ඉඩම්වල ගැටළු හඳුනා ගෙන එම ඉඩම් උපරිම ඵලදායිතාවයක් සහිතව කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතයට ගැනීමේ කඩිනම් ක්‍රමවේදයක් සකස් කිරීම
2. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කාබනික පොහොර භාවිතයට යොමු කිරීම
3. ධීවර කාන්තාවන් කේන්ද්‍රකරගත් ධිවර කර්මාන්තය ආශ්‍රිත ගෘහස්ත කර්මාන්ත හඳුන්වාදීමේ වැඩසටහනක් ධිවර නිෂ්පාදන සමූපකාර හරහා ක්‍රියාත්මක කිරීම.
4. ධීවර ප්‍රජාව සඳහා වඩාත් ඵලදායි රක්ෂන ක්‍රමයක් හඳුන්වාදීමට කටයුතු කිරීම.
5. ධිවර තරුණයන් ව්‍යවසායකයින් බවට පත් කිරීම සඳහා ඔවුනට නූතන තාක්ෂණික ක්‍රමවේදය භාවිතය සහ ධීවර කර්මාන්තය පිලිබඳ උසස් වෘත්තීය සහ අධ්‍යාපනික දැනුම ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජන (රු.මි.) | ඉලක්කගත වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| **2.** | 2.3 | 2.3.2. | ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් මුදා හැරීම. | 10 | 9.71 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| ධීවර කර්මාන්තය කරන ජලාශ මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදා හැරීමේ ව්‍යාපෘතිය | ජලාශ සඳහා මුදාහරින ලද මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් සංඛ්‍යාව | ජලාශ සඳහා මුදාහරින ලද මත්ස්‍ය පැටවු සංඛ්‍යාව | 4.5 | 4 | 4 | 4.5 | 10 | 13 | 37 | 45 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය (outcome index) | ඉලක්කය කරා ළඟාවීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 01 | මත්ස්‍ය නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 31,360 | 100 % |

## පසුගිය වසර 03 ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකර ගැනීමට අපේක්ෂා කළ සුවිශේෂී අරමුණු (specific objectives) | ප්‍රගතිය (ප්‍රමාණය/ ප්‍රතිලාභීන් ගණන) | | | | වැය කළ මුදල (රු. මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 01 | කෘෂි කටයුතු | කෘෂි ආශ්‍රිත නිස්පාදන ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැපයීම | 547 | 61 | 62 | | 7.975 | 2.691 | 3.99 | - |
| 02 | ධීවර කටයුතු | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම | * | * | - | 5,000 | 8.229 | 12.65 | 14.0 | 9.71 |

*2017, 2018 වර්ෂයේදි ධීවර ඔරු 17, වට දැල් 700 ක්, හා දැල් කුඩු 5 ක් ද විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් සඳහා වට දැල් 55 ක් සෙවන දැල් 5 ක් හා මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් මි. 4.58 ජලාශ සඳහා මුදා හැර ඇත.

*2018 වර්ෂයේදි විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් වෙත වට දැල් 676, උඩු දැල් 165,සෙවන දැල් 84ක්, ජී.අයි බට 947 ක් විදුලි මෝටර් 38 ක් හා ජල ගිල්වන මෝටර් 15 ක්ද මිරිදිය ධිවර කටයුතු සඳහා ඔරු 22 ක්, කරමල් දැල් 2470 ක්, දැල් කුඩු හා මත්ස්‍ය පැටවු මි.8.9 ජලාශ සඳහා මුදා හැර ඇත.

## 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| විස්තරය | ආවරණය කළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි.) |
|---|---|---|---|
| ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදාහැරීම | 27 | 5,000 | 10 |

## සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කරන ලද දායකත්වය

### තිරසර සංවර්ධන අරමුණ

2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.

### තිරසර සංවර්ධන දර්ශක හා ඉලක්ක

ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ ආදායම, ඉඩම්වල ආරක්ෂාකාරිව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා වෙළඳපොල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මගින් දෙගුණ කිරීම.

සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් අත්කරගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යන අරමුණ කරා ලඟාවීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ ධිවර කටයුතු ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී කටයුතු කරන ලදි. මේ සඳහා රු.මි.10 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. මෙහිදි විශේෂයෙන්ම ධීවර ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ධිවර කර්මාන්තයේ යෙදෙන වැව් සඳහා නොමිලේ මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් බහාලීම සිදුකල අතර මේ සඳහා රු.මි. 9.71 ක මුදලක් වියදම් කරන ලදි.

වාර්ෂිකව නිෂ්පාදනය වන මත්ස්‍ය අස්වැන්න වැඩිවීම මෙහි මූලික අරමුණ වන අතර ධීවර ජනතාවගේ ආදායම ඉහළ යාම මෙන්ම මත්ස්‍ය පරිභෝජනය ද මෙමගින් වැඩි වේ. ඒ අනුව මන්දපෝෂණ අඩු කිරීම හා යහපත් පෝෂණ තත්වයක් ලගාකරදීම යන පරමාර්ථයෙන් මත්ස්‍ය පැටවු 4,104,520 ක් ජලාශ සඳහා බහාලීම සිදුකරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 27 ක ප්‍රතිලාභින් 5,000 ක් ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී .

**මත්ස්‍ය ඇඟිල්ලන් සහ ඇසිත්තන් මුදාහැරීම - රු.මි.9.71**

## සමස්ත සම්පත් උපයෝජනය හා අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම.

2020 වර්ෂයේ ධිවර කටයුතු ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී කටයුතු කරන ලදි.

මේ සඳහා රු.මි.10 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. මෙහිදි විශේෂයෙන්ම ධීවර ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරිම සඳහා ධිවර කර්මාන්තයේ යෙදෙන වැව් සඳහා නොමිලේ මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් බහාලීම සිදුකල අතර මේ සඳහා රු.මි. 9.71 ක මුදලක් වියදම් කරන ලදි.

ධීවර කටයුතු ප්‍රවර්ධනය සඳහා 2020 වර්ෂයේ රු.මි.10

| ව්‍යාපෘතිය | මුදල (රු.මි) | ක්‍රියාකාරකම් ඇතුළත් විස්තරය |
|---|---|---|
| මත්ස්‍ය ඇඟිල්ලන් සහ ඇසිත්තන් මුදා හැරීම  | රු. මි. 9.71 | උතුරු මැද පළාත තුල ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් ලෙස මිරිදිය ධීවර කරමාන්තය වැදගත් වේ. එහි නිරත ධීවර කාර්මිකයන්ගේ ආර්ථික මට්ටම නඟා සිටුවීමටත්, ප්‍රදේශයේ ජනතාවගේ මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීමටත්, මත්ස්‍ය අස්වැන්න ඉහළ දැමිය යුතුය. ඒ වෙනුවෙන් ජලාශ වල මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මත්ස්‍ය පැටවු තැම්පත් කිරිම සිදුකළ යුතුය.<br><br>පළාතේ පවතින ජලාශ වලින් ලැබෙන මුළු ඉල්ලුම සපුරාලීම සඳහා මත්ස්‍ය පැටවු සපයා ගැනීමට නොහැකි වූ අතර, පළාතම ආවරණය වන පරිදි 2020 වර්ෂයේදි මත්ස්‍ය ඇඟිල්ලන් 3,765,720 ක් ජලාශ වල තැම්පත් කරන ලදි. තවද මත්ස්‍ය ඇඟිල්ලන් ලබාදීම සඳහා ප්‍රමාණවත් පරිදි මත්ස්‍ය ඇඟිල්ලන් සපයාගැනීම කළ නොහැකි නිසාත්, ඒ සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන නිසාත්, ඊට පිළියමක් ලෙස මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා අදාල ජලාශ තුලම දැල් කූඩුවල ඇති කර, එම ජලාශයටම මුදාහැරීමට කටයුතු කරන ලදි. ඒ අනුව දැල් කූඩු සහිත ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් 338,800 ක් දැල් කූඩු තුල තැම්පත් කර ජලාශවලට මුදා හරින ලද අතර, 2020 වර්ෂය තුලදී ජලාශ සඳහා මුදා හරින ලද මුළු මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් සංඛ්‍යාව 4,104,520 කි. මේ සඳහා වැය වූ මුළු මුදල රු.මි. 9.71 කි. |

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදි ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

2021 වර්ෂයේදි ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන වැඩසටහන් කෘෂි හා ධීවර යන අංශ දෙක යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

## 1. ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය

වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැවීම අරමුණු කරගෙන 2021 වර්ෂයේ සහනාධාර පදනම මත ධීවර ආම්පන්න ප්‍රතිලාභීන් 40,000 ට ලබාදීමටත්, තොටුපලවල් සඳහා සූර්යබල විදුලි පහන් 50 ක් සවිකිරීම හා ධීවර සමිති සඳහා අලෙවි කුටි 25 ක් හා ෆයිබර් පෙට්ටි 100 ක් ලබාදීමේ ඉලක්කයට යාමට කටයුතු කර ඇත.

## 2. මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය හා මත්ස්‍යයින් වැඩිගත කිරීම

මේ යටතේ ග්‍රාමීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ජලාශ සඳහා මත්ස්‍ය පැටවු මුදාහැරීම හා මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන නවීකරණය හා සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

## 3. විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධනය

2021 වර්ෂයේ විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධනය යටතේ මත්ස්‍ය වගාකරුවන් සඳහා උපකරණ ලබාදීම සිදු කරන අතර මෙහිදී සිමෙන්ති ටැංකි 100 ක් ලබාදීම, විසිතුරු මත්ස්‍ය වගාවේ රසායනාගාර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ සමිති 04 ක් සඳහා ලබාදීමටත්, වට ආවරණ දැල් 200 ක් ලබාදීමටත්, විසිතුරු මත්ස්‍ය නිරෝධායන මධ්‍යස්ථාන හා මත්ස්‍යයින් එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම ආදි සංවර්ධන කටයුතු සිදුකරනු ලබයි.

## 4. ධීවර කර්මාන්ත සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

ධීවර හා විසිතුරු මත්ස්‍ය වගාකරුවන්ගේ ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම හා ධීවර කාර්මිකයින් හා විසිතුරු ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ අරමුණින් පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇති අතර ධීවර හා විසිතුරු ව්‍යවසායකයින් 500 ක් බැගින් 2021 වර්ෂයේදි පුහුණු කිරීමට අපේක්ෂිතය.

## 5. කෘෂි වගා ළිං සංවර්ධනය

වර්ෂය පුරා වගා කටයුතු සඳහා ජලය ලබාදීම අරමුණු කරගෙන 2021 වර්ෂයේ කෘෂි වගා ළිං සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර, මෙමගින් වස විසෙන් තොර නැවුම් එලවළු හා පලතුරු පහසුවෙන් ජනතාවට ලබා ගැනීමට හැකිවීම මෙන්ම ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළයාම මගින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම මූලික කරගෙන පළාත තුල කෘෂි වගා ළිං 95 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

උතුරු මැද පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2015-2020

| දිස්ත්‍රික්කය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 9,650 | 12,990 | 15,760 | 12,940 | 17,840 | 21,855 |
| පොළොන්නරුව | 7,160 | 3,525 | 8,310 | 11,600 | 9,960 | 9,505 |
| **එකතුව** | **16,810** | **16,515** | **24,070** | **24,540** | **27,800** | **31,360** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | කෙටි කාලීන | දිගු කාලීන |
|---|---|---|
| ධිවර කර්මාන්තය ප්‍රවර්ධනය | ➢ පළාතේ ජනතාවගේ මත්ස්‍ය පරිභෝජනය වැඩිවීම.<br>➢ ධිවර අංශයේ සේවා නියුක්තිය වැඩිවීම | ➢ පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ යාම.<br>➢ ධීවර කාර්මිකයින්ගේ ආර්ථික මට්ටම දියුණුවීම |
| මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය හා මත්ස්‍යයින් දැමීම | ➢ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය ඉහල නැංවීම | මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම |
| විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධනය | ➢ අපනයන වෙළඳ පොළට සුදුසු ආකාරයේ විසිතුරු මසුන් නිෂ්පාදනය වැඩිවීම<br>➢ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය | ➢ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීම.<br>➢ විදේශ විණිමය ඉපයීම |
| ධීවර හා විසිතුරු කර්මාන්ත සංවර්ධනය සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම | ධීවර හා විසිතුරු කාර්මිකයන් සඳහා<br>➢ වෘත්තීය දැනුම ලබාදීම<br>➢ අත්දැකීම් හුවමාරු වැඩසටහන් | ධිවර කාර්මිකයින්ගේ හා විසිතුරු මත්ස්‍ය කාර්මිකයින්ගේ ආදායම ඉහළ යාම හා ජීවන මට්ටම ඉහල යාම |
| කෘෂි වගා ළිං සංවර්ධනය | ➢ වගාවන් සඳහා අඛණ්ඩව ජලය සපයා ගැනීම | ➢ වර්ෂය පුරා අස්වනු නෙලා ගැනීමට හැකිවීම.<br>➢ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම |

## මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො) 2015 - 2020

අමාත්‍යාංශය යටතේ පවතින ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම යන ප්‍රධාන කාර්යය යටතේ 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 17840 සිට 21855 දක්වා වර්ධනයක් පෙන්නුම් කළද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය මෙ.ටො. 9960 සිට 9505 දක්වා පසුබෑමක් පෙන්නුම් කරයි. 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනයක් පෙන්වයි. එය මෙ.ටො. 3560ක වැඩි වීමකි.




## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් ධීවර විෂයේ සංවර්ධනය උදෙසා 2020 වර්ෂයේදී අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට හැකි විය. ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් මුදා හැරීම මෙහිදි විශේෂයෙන් කැපී පෙනේ. ඉහත කාරණා වෙනුවෙන් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘතීන් සාර්ථකව සතුටුදායක අන්දමින් නිමකරන ලදී.

# 7.1. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ආයතනය පිළිබඳ මූලික තොරතුරු**

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 01 | - |
| නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම (ව්‍යාපෘති) කාර්යාලය | 01 | - |
| සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - මහඉලුප්පල්ලම | 01 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කලාප) කාර්යාල | 04 | 01 |
| කෘෂිකර්ම උපදේශක කාර්යාල | 32 | 05 |
| පළාත්බද පර්යේෂණ ආයතනය | 01 | - |
| පාංශු පරීක්ෂණාගාරය | 01 | - |

මූලාශ්‍රය:-පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**දැක්ම**

"තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් පළාතක් බිහි කිරීම".

**මෙහෙවර**

"නව යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණය හා කෘෂිකාර්මික යටිතල පහසුකම් භාවිතයෙන් ආහාර සුරක්ෂිතතාව හා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය, වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහයෝගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම".

**දිගුකාලීන අරමුණු**

- වී, අතිරේක බෝග, අල බෝග, එළවළු හා වෙනත් ආහාර බෝග සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති හා පළාත් කෘෂිකර්ම අවශ්‍යතාවයන් හා ප්‍රමුඛතාවයන් මත පිහිටා විශිෂ්ට පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ඉහළ කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් සාක්ෂාත් කර ගැනීම.
- පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් තුළින් ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම, දිළිඳුකම පිටු දැකීම හා ජාතික ආහාර සුරක්ෂිතතාව හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය මගින් ගුණාත්මක හා ආරක්ෂාකාරී ආහාර නිෂ්පාදනය, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ළඟාකර ගැනීම.
- ජලය හා පස සංරක්ෂණය කර ගනිමින්, වෙනස් වන සමාජ, ආර්ථික හා කාලගුණික ප්‍රවණතාවයකට අනුකූලවන සේ සැකසූ වැඩසටහන් තුළින් තිරසාර කෘෂිකාර්මික ක්‍රමෝපායන් ළඟාකර ගැනීම.
- උසස් ගුණත්වයෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය පළාත තුළ සුලභ කිරීම.
- දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගත් කෘෂිකර්මාන්තයට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් දියත් කිරීම තුළින් පළාතේ ගොවි ජනතාවගේ කෘෂි ව්‍යවසාය හැකියාවන් වර්ධනය කිරීම තුළින් තෘප්තිමත් ගොවි ජනතාවක් බිහි කිරීම.

## කෙටිකාලීන අරමුණු

| |
|---|
| ❖ නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුළ ප්‍රචලිත කිරිම |
| ❖ ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය |
| ❖ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිම. |
| ❖ පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය. |
| ❖ වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය. |
| ❖ කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය. |

## ප්‍රධාන කාර්යයන්

- ✓ යහපත් ව්‍යාප්ති සේවාවක් සැපයීම සඳහා ගොවිජනතාවට නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතාවයන් වර්ධනය කිරිම.
- ✓ ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සුලභතාවය ඇති කිරිම.
- ✓ පැළෑටි සංරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත, පළිබෝධනාශක පාලන පනත, බීජ පනත වැනි පනත් ක්‍රියාත්මක කිරිම.
- ✓ මහඉළුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් ක්ෂේත්‍ර පුහුණු හා ප්‍රායෝගික සේවාස්ථ පුහුණු ගොවීන් හා නිලධාරීන් වෙත ලබා දීම.
- ✓ පළාත තුළ පරිසර හිතකාමී යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයන් ප්‍රචලිත කිරිම.
- ✓ රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිම මගින් ආහාර ද්‍රව්‍ය ආනයනය අඩු කිරිම.
- ✓ පළාත තුළ කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත හා ව්‍යවසායකයින් හඳුනාගෙන වැඩි දියුණු කිරිම.
- ✓ ගොවීන්ගේ කෘෂි තාක්ෂණික ගැටළු හඳුනාගෙන පර්යේෂණ ආයතනයන් වෙත යොමු කිරිම.
- ✓ කෘෂිකර්මයට අදාල දත්ත හා තොරතුරු ජාලයක් හා තොරතුරු කේන්ද්‍රයක් පවත්වා ගැනීම තුළින් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතනයන් මෙන්ම තොරතුරු දැන ගැනිමේ අදාල අය වෙත තොරතුරු ලබා දීම.
- ✓ කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම

## ප්‍රධාන උපාය මාර්ගයන්

**01.** වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශන ක්‍රියාත්මක කිරිම.

**02.** පරිසර හිතකාමී කෘෂිකර්මය සඳහා ඒකාබද්ධ පාලන ක්‍රම හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන වැඩසටහන් කිරිම.

**03.** අස්වනු වැඩි කිරිම සඳහා බෝගවලට ඒකාබද්ධ පැළෑටි පෝෂණ ආදර්ශණ ක්‍රියාත්මක කිරිම හා වී සඳහා පැරිෂුට් තාක්ෂණය හඳුන්වා දීම වැනි නව උචිත තාක්ෂණයන් හඳුන්වා දිම.

**04.** වී සහ අතිරේක බෝගවල ගුණාත්මක බීජ සුලභ කිරිම සඳහා බීජ නිෂ්පාදන යාය පිහිටුවීම හා බීජ පනත ක්‍රියාත්මක කිරිම.

**05.** කෘෂි නිෂ්පාදන ක්‍රමවත්ව අලෙවි කිරීම සඳහා වැඩසටහන් සැකසීම

**06.** නව කෘෂි ව්‍යවසායකයින් බිහි කිරිම සඳහා ගොවි කාන්තා හා තරුණ ගොවි සමාජ පිහිටු විම හා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

**07.** පාංශු සංරක්ෂණය දිරිමත් කිරිම සඳහා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරිම.

**08.** පළිබෝධ පාලන නියාමනය සඳහා පළිබෝධ පාලන පනත ක්‍රියාත්මක කිරිම.

**09.** කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ යාන්ත්‍රීකරණය හඳුන්වා දිම තුළින් ඵලදායිතාව ඉහළ නැංවිම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු







## කාර්යය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 395ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 262 කි. පුරප්පාඩු සංඛ්‍යාව 133 ක් වන අතර 01 ක් අයකු අනියම් පදනමින් සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ

1. සෞභාග්‍ය දැක්ම අනුව වියළි මිරිස්, බඩඉරිඟු, සෝයා, මුං හා කව්පි, ලොකුළුණු බෝග කුරක්කන් වැනි දේශීයව නිෂ්පාදනය කල හැකි බෝග ආනයනය නවත්වා දේශීයව නිෂ්පාදනය කිරීම.
2. කුඩා භූමි ප්‍රදේශයක අඩු නිෂ්පාදන පිරිවැයකින් උසස් තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් වැඩි ගුණාත්මකභාවයකින් යුතු ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
3. ජලය අරපිරිමැස්මෙන් භාවිතා කළ හැකි විසුරුම් හා බිංදු ජල සම්පාදන පද්ධති ප්‍රචලිත කිරීම
4. කාබනික පොහොර නිෂ්පාදනය වේගවත් කිරීම.
5. ගෙවතු වගාව ප්‍රවර්ධනය.
6. බීජ හා පැල නිෂ්පාදනය කිරීම හා පටක රෝපණය හා බද්ධ කිරීමේ ක්‍රමවේදයන් මඟින් වැඩි පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජනය (රු.මි) | ඉලක්ක ගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 02 | 2.1 | 2.1.1 | 1. 2020 යල කන්නයේ බිත්තර වී වගා ව්‍යාපෘතිය | 0.41 | 0.41 |
| | | 2.1.2 | 2. ආහාර සුරක්ෂිතතාවය හා ස්වයංපෝෂිත ගොවි ප්‍රජාවක් ඇති කරලීම සඳහා උතුරු මැද පළාත තුළ ගෙවතු වගා සංවර්ධන ව්‍යාපෘති (යල) | 0.16 | 0.16 |
| | | | 3. උතුරු මැද පළාත තුළ කඩිනම් අතිරේක බෝග ප්‍රවර්ධන ව්‍යාපෘති (යල) | 8.5 | 8.5 |
| | | | 4. උතුරු මැද පළාත තුළ කඩිනම් එළවළු බෝග වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ කරවිල වගා ව්‍යාපෘතිය | 0.2 | 0.2 |
| | | | 5. ගුණාත්මක බිත්තර වී නිෂ්පාදන ව්‍යාපෘතිය (මහ) | 0.52 | 0.52 |
| | | | 6. ගුණාත්මක අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය (මහ) | 0.83 | 0.83 |
| | | | 7. නව කෘෂිකාර්මික තාක්ෂණය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය | 1.69 | 1.69 |
| | | | 8. බෝග විවිධාංගීකරණය හා බෝග කලාපීයකරණ ව්‍යාපෘතිය | 2.05 | 2.05 |
| | 2.3 | 2.3.2 | කෘෂි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම | 0.43 | 0.43 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟාවීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්ක ආයෝජන (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| 1 | බිත්තර වී නිෂ්පාදනය | නිපදවන ලද බිත්තර වී බුසල් | 1200 | 1500 | 1800 | 2000 | 2 | 2.5 | 3 | 3.5 |
| 2 | අතිරේක ආහාර බෝග බීජ | නිපදවන ලද අතිරේක ආහාර බෝග බීජ ප්‍රමාණය (Mt) | 1200 | 1400 | 1600 | 1800 | 4 | 4.5 | 5 | |
| 3 | ගොවි පුහුණු පැවැත්වීම | පුහුණු සඳහා සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව | 500 | 700 | 900 | 1000 | 1 | 1.5 | 1.5 | 2 |
| 4 | මෙම තාක්ෂණයට ගොවීන් අනුගත වීම | අනුගත වූ ගොවීන් සංඛ්‍යාව | 250 | 300 | 400 | 500 | 3 | 4 | 5 | 6 |
| 5 | මිරිස් වගාව පිහිටුවීම | මිරිස් නිෂ්පාදනය (Mt) | 500 | 600 | 700 | 800 | 6 | 7 | 7 | 8 |
| 6 | උඳු වගාව පිහිටුවීම | උඳු නිෂ්පාදනය (Mt) | 1172 | 1200 | 1350 | 1400 | 1 | 1.5 | 2 | 2 |
- පාසල් ආශ්‍රිත දැනුවත් කිරිමේ වැඩසටහන්
- වැව් රක්ෂිත හා පෝෂක ප්‍රදේශ සුරකීම

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

2020 සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත කිසිදු ප්‍රතිපාදන මුදලක් වෙන් කර නොතිබු බැවින් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සිදු කර නැත. නමුත් දැනට උද්ගතව ඇති කෝවිඩ් 19 රෝග පාලනය සම්න්ධව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණය අධීක්ෂණය නිරීක්ෂණය හා සැලසුම්කරණය සඳහා අවශ්‍ය සහය සැපයීම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරයි.

සෞඛ්‍ය අමාත්‍යාංශය දායකත්වය ලබා දුන් වැඩසටහන් පහත දක්වා ඇත. මීට අමතරව සියළු රෝහල් කෝඩ්ඩ් තත්වය සඳහා මුහුණ දීමට සුදුසු පරිදි නියාමනයද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සිදු කරයි.

| ව්‍යාපෘතිය | අනුමත මුදල (රු මි.) |
|---|---|
| කොවිඩ්-19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා නොච්චියාගම දිස්ත්‍රික් රෝහලේ 3 සහ 4 වාට්ටු වැඩි දියුණු කිරීම | 1.1 |
| නොච්චියාගම දිස්ත්‍රික් රෝහලේ කොවිඩ්- 19 රෝගීන් සඳහා වූ ප්‍රතිකාර ඒකකය සඳහා වැසිකිලියක් ඉදි කිරීම | 1.7 |
| කොවිඩ් -19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා කැබිතිගොල්ලෑව රෝහලේ 3, 4 සහ 6 වාට්ටු වැඩි දියුණු කිරීම | 1.1 |
| කැබිතිගොල්ලෑව රෝහලේ කොවිඩ් -19 රෝගීන් සඳහා වූ ප්‍රතිකාර ඒකකය සඳහා වැසිකිලියක් ඉදි කිරීම | 1.9 |
| කොවිඩ්- 19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා තම්මැන්නාව දිස්ත්‍රික් රෝහලේ 1 සහ 2 වාට්ටු වැඩි දියුණු කිරීම | 1.0 |
| තම්මැන්නාව දිස්ත්‍රික් රෝහලේ කොවිඩ් -19 රෝගීන් සඳහා වූ ප්‍රතිකාර ඒකකය සඳහා වැසිකිලියක් ඉදි කිරීම | 1.5 |
| කොවිඩ් -19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ගලෙන්බිදුනුවැව දිස්ත්‍රික් රෝහල වැඩි දියුණු කිරීම | 2.0 |
| කොවිඩ් -19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා තන්තිරිමලේ දිස්ත්‍රික් රෝහල වැඩි දියුණු කිරීම | 2.0 |
| කොවිඩ් -19 රෝගීන්ගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම (කාර්‍යාලය, වෛද්‍ය සහ වෙනත්) | 5.0 |

## කාර්ය සාධන ඉලක්ක 2018-2021

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2020 | 2021 |
| 1 | ගුණාත්මක භාවයෙන් ඉහළ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ඇති කිරීම තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ඇති කිරීම, සේවාලාභීන් තුළ ප්‍රචලිත දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබීම, සමාජ සුබසාධනය සවිබල ගැන්වීම තුළින් රැකවරණය ලැබිය යුත්තන් සවිබල ගැන්වීම හා ළමා රක්ෂක සේවා විධිමත් කිරීම තුළින් ළමුන්ගේ රැකවරණය ශක්තිමත් කිරීම. | පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | 20 | 12 | 12 | 12 |
| | | පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 04 | 04 | 04 | 04 |
| | | පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් ගණන | 4 | 5 | 12 | 15 |
| 2 | පරිසර විෂය යටතේ නිරෝගී දිවියක් උදෙසා යහපත් ස්වභාවික පරිසරයක් ඇතිකිරීම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම. | පවත්වන දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන | 10 | 80 | 30 | 34 |
| 3 | පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. | ආදර්ශ වන වගා ඇති කරන ලද පාසල් ගණන ගණන | 30 | 23 | 25 | 30 |
| | | ආදර්ශ වන ඇති කරන ලද සෞඛ්‍ය ආයතන ගණන | - | 16 | 25 | 30 |
| | | ආදර්ශ වන ඇති කරන ලද විහාරස්ථාන ගණන | - | 20 | 25 | 30 |
| | | ආදර්ශ වන ඇති කරන ලද වැව් ගණන | 3 | 16 | 30 | 30 |
| | | පවත්වන ලද දැනුම මිණුම වැඩසටහන් ගණන | - | 1 | 1 | 1 |
| | | සංවර්ධනය කරන ලද ස්වභා උයන් ගණන | - | 1 | 2 | 5 |

## කාර්ය සාධනය කරා ලඟා වීමේ දී මුහුණ දුන් අභියෝග හා ගැටළු

01.කාර්ය මණ්ඩලවල පවතින ඌනතාවයන්.

02.ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය වාහන පහසුකම් හිඟතාවය.

03.බාහිර ආයතන හා නිලධාරීන් කළමනාකරණය කරගැනීමේදී මතුවන ගැටළු වලට මුහුණ දීමට සිදු විය.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

මෙම අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා මූලික අරමුණු වලට අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු මෙහෙයවීමේ කාර්යයේදී අදාළ වන වැය දැරීම සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස රු.මි.34.37 ලැබී තිබූ අතර එහි සත්‍ය වියදම රු.මි.33.75 වේ. එය ප්‍රතිශතයක් ලෙස 99 % ක අගයක් ගන්නා අතර සංවර්ධන කාර්යයන්ඉටු කිරීම සඳහා මූලධන ප්‍රතිපාදන 2020 වර්ෂය සඳහා වෙන් කර නැත. නමුත් හැදෙන රටක් වැඩෙන ගසක් තේමාව යටතේ පාරිසරික සංවේදී කලාප ආශ්‍රිතව පැල රෝපනය හා රක්ෂිත සංරක්ෂණය 2020 වර්ෂයේත් සාර්ථකව ඉටු කරන ලදී. 2020 වර්ෂයේදී මුහුන පෑමට සිදුවූ කොවිඩ් වසංගතය හේතුවෙන් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ලෙස ඉතා වැදගත් කාරය භාරයක් කිරිමට සිදුවිය. කෝවිඩ් වසංගතය ජය ගැනීම උදෙසා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා එක්ව පළාතේ සියළු රෝහල් සඳහා පහසුකම් සැපයිම කළමනාකරනය, අධීක්ෂණය හා සම්බන්ධීකරණය පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සිදු කරන ලදී. මේ වන විට මෙත්සිරි සෙවන, කැබිතිගොල්ලෑව හා නොච්චියාගම රෝහල් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යන අතර එහි කටයුතු නියාමනය සඳහා අවශ්‍ය සහයද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය දෙනු ලබයි.

පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් සියලු දෙපාර්තමේන්තුවල කාර්යයන් නියාමනය, ප්‍රතිපත්ති සම්පාදනය, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය, මෙහෙයවීම හා සම්බන්ධීකරණය යන කාර්යයන් ඉටු කිරීමේදී ඉහල කාර්ය සාධනයක් අප විසින් අත්පත් කරගෙන ඇති අතර දෙපාර්තමේන්තු වල කාර්ය සාධන ඉලක්ක සාධනීය ලෙස ඉටු කර තිබීම මගින් එය තව දුරටත් තහවුරු වේ. ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකුව යන ආයතන වල මූල්‍ය ප්‍රතිපාදන මත 2020 වර්ෂයේදී ක්‍රියාත්මක වූ සහ 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හා සැලසුම් කරණයේදී මෙම අමාත්‍යාංශයේ දායකත්වය ඉතා ඉහල අගයක් ගත් අතර එම හේතුන් නිසාම එම වැඩසටහන් 2020 වර්ෂය තුලදී සාර්ථකව නිම කිරීමට අදාළ දෙපාර්තමේන්තු වලට හැකියාවක් ලැබිණි. පළාත් ආයුර්වේද, සමාජසේවා හා පරිවාස යන දෙපාර්තමේන්තු වල ඵලදායීතාවය ඉහල නංවාලීම සඳහාද මෙම අමාත්‍යාංශයේ දායකත්වය අප විසින් ලබාදුන් අතර එම දෙපාර්තමේන්තුවලද කාර්ය සාධනය ඉහල නංවාලමින් ප්‍රශස්ත මහජන සේවාවක් 2020 වර්ෂයේදී ලබා දීමට ඔවුන් හට හැකියාවක් ලැබී ඇති බව එම දෙපාර්තමේන්තුවල සංවර්ධන ඉලක්ක පරික්ෂා කර බැලීමේදී පැහැදිලි වේ. ඒ අනුව 2020 වර්ෂයේදී ලබාගත් අත්දැකීම් උපයෝගී කරගෙන 2021 වර්ෂය සඳහා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

# 8.1.පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන පද්ධතිය

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | 01 | - | 01 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 01 | 02 |
| සෞඛ්‍ය නිලධාරී කාර්යාලය | 22 | 08 | 30 |
| මූලික රෝහල් | 06 | 02 | 08 |
| ප්‍රාදේශීය රෝහල් (ඒ ශ්‍රේණිය) | 01 | 01 | 02 |
| ප්‍රාදේශීය රෝහල් (බී ශ්‍රේණිය) | 10 | 04 | 14 |
| ප්‍රාදේශීය රෝහල් (සී ශ්‍රේණිය) | 21 | 04 | 25 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක | 22 | 16 | 37 |
| ක්ෂය රෝග මර්ධන සායන මධ්‍යස්ථාන | 01 | 01 | 02 |
| ලිංගාශ්‍රිත බෝවන රෝග නිවාරණ ඒකක | 01 | 01 | 02 |
| වාහන සේවා මධ්‍යස්ථාන | 01 | - | 01 |
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු ඒකකය | 01 | - | 01 |
| **එකතුව** | **88** | 38 | **125** |

ඒ ශ්‍රේණිය - ඇඳන් 100ට අඩු බී ශ්‍රේණිය - ඇඳන් 50-100 සී ශ්‍රේණිය - ඇඳන් 50ට අඩු

මහජන සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාස - 110

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාස - 446

උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන පිළිබඳ තොරතුරු -2020

| අංකය | වාහන වර්ගය | පළාත් කාර්යාලය | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | එකතුව |
|---|---|---|---|---|---|
| | | | අනුරාධපුර | පොළොන්නරුව | |
| 01 | මෝටර් කාර් | 01 | - | - | 01 |
| 02 | ගිලන් රථ | 01 | 70 | 28 | 99 |
| 03 | කැබ් රථ | 06 | 41 | 27 | 74 |
| 04 | වෑන් | 03 | 12 | 14 | 29 |
| 05 | ජීප් රථ | 02 | 04 | 02 | 08 |
| 06 | ලොරි රථ | - | 04 | 04 | 08 |
| 07 | බවුසර් රථ | - | 02 | 01 | 03 |
| 08 | ත්‍රිවීල් රථ | 02 | 04 | 02 | 08 |
| 09 | මෝපෙඩ් මෝටර් සයිකල් | 01 | 02 | - | 03 |
| 10 | බස් රථ (ජංගම දන්ත සායන) | - | 02 | 01 | 03 |
| 11 | මෝටර් බයිසිකල් | - | 01 | 01 | 02 |
| | **එකතුව** | **16** | **142** | **80** | **238** |

## පළාතේ මහජනතාව සඳහා සපයනු ලබන සේවාවන්

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|
| බාහිර රෝගීන් | අනුරාධපුර | 2,645,417 | 2,635,718 | 2,224,028 | 2,213,126 | 2946311 | 2185465 |
| | පොළොන්නරුව | 856,179 | 880,498 | 854,620 | 893,141 | 954569 | 954569 |
| | එකතුව | 3,501,596 | 3,516,216 | 3,078,648 | 3,106,267 | 3900880 | 3140034 |
| නේවාසික රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 183,981 | 180,066 | 172,567 | 186,322 | 183156 | 164521 |
| | පොළොන්නරුව | 64,373 | 61,995 | 59,372 | 62,361 | 39706 | 39706 |
| | එකතුව | 248,354 | 242,061 | 231,939 | 248,683 | 222862 | 204227 |
| සායනික ප්‍රතිකාර සේවා රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 474,629 | 534,822 | 473,558 | 2,399,448 | 664377 | 542655 |
| | පොළොන්නරුව | 179,101 | 227,110 | 227,032 | 955,502 | 244914 | 244914 |
| එකතුව | | 653,730 | 761,932 | 700,590 | 3,354,950 | 909291 | 787569 |

## නිවාරණ සෞඛ්‍ය සේවාවන් සැපයීම

| | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ | 72 | 38 | 110 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් | 61 | 29 | 90 |
| පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාශ | 298 | 148 | 446 |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් | 236 | 128 | 364 |
| ග්‍රාමීය සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන | 194 | 107 | 301 |

## පළාතේ සෞඛ්‍ය දර්ශක 2014 – 2020

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතය (සජීවී උපත්1000 ට) | අනුරාධපුර | 10.9 | 16.7 | 16.7 | 16.7 | 7.9 | 7.9 |
| | පොළොන්නරුව | 9.2 | 11.6 | 7.5 | 7.5 | 10.1 | 10.1 |
| මාතෘ මරණ අනුපාතය (සජීවී උපත්1000 ට) | අනුරාධපුර | 28.4 | 47.7 | 32.0 | 32 | 25.8 | 33.7 |
| | පොළොන්නරුව | 27.4 | 28.4 | 28.0 | 28 | 13.3 | 13.3 |
| දළ උපත් අනුපාතය (පුද්ගලයින් 1000 ට) | අනුරාධපුර | 17.8 | 17.3 | * | - | - | - |
| | පොළොන්නරුව | 17.7 | 16.9 | * | - | - | - |
| දළ මරණ අනුපාතය ( පුද්ගලයින් 1000 ට) | අනුරාධපුර | 5.5 | 5.8 | * | - | - | - |
| | පොළොන්නරුව | 5.5 | 5.2 | * | - | - | - |
| මන්දපෝෂණ තත්වය(වයස 05ට අඩු - අඩු බර) | අනුරාධපුර | - | - | - | - | 22.2 | 15.3 |
| | පොළොන්නරුව | - | - | - | - | 16.6 | 16.6 |

## දැක්ම

" නීරෝගීමත් ජනතාවක් සමෘද්ධිමත් පළාතක් "

## මෙහෙවර

"උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාන හා සමානුපාතික ලෙස ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ප්‍රජාව වෙත සැපයීම සඳහා තම සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස යෙදවීම".

## දිගුකාලීන අරමුණු

- Covid 19 වසංගත රෝග තත්වය පාලනයට අදාළ දිගුකාලීන සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරිම.
- උතුරු මැද පළාතේ සෞඛ්‍ය ආයතනයන්හී යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- උතුරු මැද පළාතට සුවිශේෂී වු සෞඛ්‍ය ගැටළුවන වකුගඩු රෝගය, වස විෂ ශරිරගත වීම් සහ පිළිකා රෝග තත්වයන් අවම කිරීම.
- ප්‍රාදේශීය රෝහල් මගින් ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ලබා දීම සහ පළාතේ මුලික රෝහල් අංග සම්පූර්ණ පහසුකම් සහිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා දායකත්වය සහ අන්තර් පාර්ශවීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම.

## කෙටි කාලීන අරමුණු

- Covid 19 වසංගත රෝග තත්වය පාලන කටයුතු සිදුකිරිම.
- වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදනයන් කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරීම.
- ප්‍රමුඛතාවය මත හඳුනාගත් ඉලක්කගත වැඩසටහන් කාලානුරූපව ක්‍රියාත්මක කිරිම හා අධීක්ෂණය.
- වකුගඩු රෝග කළමනාකරණයේදී හඳුනාගත් රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.
- වසවිෂ ශරිරගත වීම් සහ පිළිකා තත්වයන් කළමනාකරණය ඉලක්ක සහගත ලෙස ක්‍රියාත්මක කිරිම.
- සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන් ඉලක්ක සහගත ලෙස නියාමනය කිරීම.
- හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම.
- තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කළමනාකරණය කාර්යක්ෂම කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- Covid 19 වසංගත රෝග තත්වය කළමණාකරණයට අදාල සේවා පහසුකම් සැලසීම.
- ප්‍රතිකාරක සෞඛ්‍ය සේවා සැපයීම සහ රෝග නිවාරණ සෞඛ්‍ය සේවා සැපයීම.
- පර්යේෂණ, සමීක්ෂණ හා ධාරිතා සංවර්ධනය.
- අන්තර් ආංශික සම්බන්ධතා ශක්තිමත් කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- Covid 19 වසංගත රෝග තත්වයට අදාල ජාතික මාර්ගෝපදේශයන් හා වැඩසටහන් පළාත තුල ක්‍රියාත්මක කිරීම.
- ප්‍රම්පාදන ක්‍රියාවලිය විධිමත්ව ක්‍රියාත්මක කොට අධීක්ෂණය කිරීම.
- පුහුණු වැඩසටහන් දත්ත පද්ධතියක් මගින් යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩල තොරතුරු හා පෞද්ගලික ලිපිගොනු, වැටුප් වර්ධක, පත්වීම් සම්බන්ධයෙන් ඉලක්ක සහගත ලෙස කළමනාකරණය සිදු කිරීම.

- පුහුණුකරුවන් පුහුණු කිරීම, දැනුවත් කිරීම් සහ දැනුවත් කිරීම් වැඩසටහන් ගුණාත්මක ලෙස සිදු කිරීම.
- සෞඛ්‍ය ආයතන ආයෝජනයේදී ප්‍රතිකාර සේවා සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- ප්‍රදේශයේ ඇති සෞඛ්‍ය ආයතන අදාල ශ්‍රේණියට අනුව සියළු පහසුකම් ලබා දිය හැකි සෞඛ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කිරීම.
- පළාත තුළ ක්‍රියාත්මක වන පර්යේෂණ හා සමීක්ෂණ, පළාත් පර්යේෂණ හා සමාලෝචන කමිටුව මගින් නියාමනය කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

**03**

**නිරෝගී ජීවිත සහතිකකර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම**

3 GOOD HEALTH AND WELL-BEING

- මාතෘ හා ළමා මරණ අවම කිරීම
- සරම්ප ප්‍රතිශක්තිකරණ ආවරණය වැඩිකිරීම
- දිළිඳුකම හේතුකරගෙන ළමා වියේදී ඇතිවන අයහපත් සංකූලතා අවම කිරීම
- එච්.අයි.වී සහ මැලේරියා රෝගීන්ගේ ව්‍යාප්තිය අවමකිරීම
- වකුගඩු රෝග ව්‍යාප්තිය අවම කිරීම සහ රෝගීන් කල්තබා හඳුනාගෙන ප්‍රතිකාර සිදුකිරීම,
- සියදිවි නසාගැනීම් සහ ස්වයංහානි කරගැනීමට තැත් කිරීම් අවම කිරීම
- මාතෘ හා ළමා මන්ද පෝෂණ තත්ත්වය අවම කිරීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 5155ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 3906 කි. පුරප්පාඩු සංඛ්‍යාව 1249ක් වන අතර කොන්ත්‍රාත් පදනම මත 65 දෙනෙකු ද ආදේශක ලෙස 34 දෙනෙකුද සේවයේ යෙදේ.

## අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා නිමැවුම් දර්ශක.

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය ( රු.මි ) | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් මගින් නිරෝගී දිවි පෙවතක් ස්ථාපිත කිරීම | ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමේ ප්‍රතිශතය 25 % කින් වැඩි කිරීම | මාතෘ මරණ අනු. ළදරු මරණ අනු. මන්දපෝෂණ ප්‍රතිශතය | 620 | 318 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්ක | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය ( රු.මි ) | ඉලක්කගත වියදම ( රු.මි ) |
|---|---|---|---|---|---|
| ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් මගින් නිරෝගී දිවිපෙවතක් ස්ථාපිත කිරිම | ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමේ ප්‍රතිශතය 25 % කින් වැඩි කිරිම | මාතෘ මරණ අනුපාතය ළදරු මරණ අනුපාතය මන්ද පෝෂණ ප්‍රතිශතය | PSDG සහ PSSP | 388 | 347 |

## කාර්යය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම් | නිමැවුම් දර්ශක | ඉලක්ක | | | | ඉලක්කගත ආයෝජන (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| රෝහල් සේවා වැඩිදියුණු කිරිම | ප්‍රතිකාර හා නිවාරණ අංශයනිහී ගොඩනැගිලි පුනරුත්ථාපන සම්පූර්ණ කර තිබීමේ ප්‍රතිශතය | 55% | 60% | 75% | 95% | 345 | 360 | 380 | 395 |
| නිවාරණ සේවා වැඩිදියුණු කිරිම | ප්‍රතිකාර හා නිවාරණ අංශයනිහී නව ගොඩනැගිලි ඉදිකිරීම සම්පූර්ණ කර තිබීමේ ප්‍රතිශතය | 70% | 80% | 90% | 100% | | | | |
| කළමණාකර ධාරිතා සංවර්ධනය | කළමණාකරන හා ධාරිතා සංවර්ධනය කිරිමේ ප්‍රතිශතය | 50 | 60 | 70 | 80% | | | | |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2020

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය (outcome index) | ඉලක්කය කරා ළඟා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 1 | ජල අවශ්‍යතා සැපයීම | 10 % | 6 % |
| 2 | විදුලිය සැපයීම | 7 % | 7 % |
| 3 | නව ගොඩනැගිලි ඉදි වීම | 9 % | 7 % |
| 4 | ගොඩනැගිලි අළුත්වැඩියා වීම | 37 % | 35 % |
| 5 | වාහන නැවතුම් ඉදි වීම | 1 % | 1 % |
| 6 | නේවාසික අවශ්‍යතා සම්පූර්ණ වීම | 2 % | 2 % |
| 7 | වෛද්‍ය උපකරණ සැපයීම | 11 % | 11 % |
| 8 | වෛද්‍ය නොවන උපකරණ සැපයීම | 19 % | 19 % |
| 9 | නිළධාරී පුහුණු හා ආකල්ප ප්‍රවර්ධනය වීම | 1 % | 1 % |
| 10 | ප්‍රජාව අතර බහුල බෝ නොවන රෝග නිවාරණය වීම | 3 % | 3 % |

* 2020 වර්ෂයේ දි මුහුණ දුන් කොවිඩ් 19 වසංගත රෝග තත්වය කළමණාකරනය කිරිම සඳහා විවිධ අවස්ථාවන්හි වාර්ෂික ප්‍රතිපාදන සංශෝධනයට ලක් විය.

* වර්ෂයේ අවසාන කාර්තුවේ දී අමතර ප්‍රතිපාදනයන්ද කොවිඩ් 19 වසංගත රෝග තත්වය කළමණාකරනය කිරිම සඳහා ලැබුණු අතර, සාර්ථක මුල්‍ය හා ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණි.

**ඉලක්ක කරා ළඟා වීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| විස්තරය | ආවරණය කල ප්‍රා. ලේ. කොට්ඨාශ | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|
| මැදවච්චිය ප්‍රා.රෝ.රුධිර කාන්දුකරණ ඒකකය වැඩිදියුණු කිරීම | මැදවච්චිය | ගණනය කල නොහැක | 1.04 |
| පදවිය මූලික රෝහලේ රුධිර කාන්දුකරණ සහ ඖෂධ ගබඩාවේ පහසුකම් වැඩිදියුණු කිරීම | පදවිය | | 1.99 |
| පදවිය මූලික රෝහලේ විවේක කාමරය වැඩිදියුණු කිරීම | | | 1.53 |
| පදවිය මූලික රෝහලේ ජල පිරිපහදු ඒකකය වැඩිදියුණු කිරීම | | | 0.49 |
| තඹුත්තේගම මූ. රෝ. පිරිමි වාට්ටුව නවීකරණය කිරීම | තඹුත්තේගම | | 0.25 |
| කපුගොල්ලෑව ප්‍රා.රෝ.හෙද නිළ නිවාසයේ පහසුකම් වැඩිදියුණු කිරීම | හොරොව්පොතාන | | 1.00 |
| රාජාංගනය යාය 05 ප්‍රා.රෝ.කොරිඩෝව අළුත්වැඩියාව | තඹුත්තේගම | | 0.50 |
| තලාව ප්‍රාදේශීය රෝහලේ කොරිඩෝව අළුත්වැඩියාව | තලාව | | 0.89 |
| තලාව ප්‍රාදේශීය රෝහලේ වාහන ගරාජය අළුත්වැඩියාව | | | |
| තලාව ප්‍රාදේශීය රෝහලේ හෙද වැසිකිලිය ඉදිකිරීම | | | |
| රනෝරාව ප්‍රා.රෝ.පහසුකම් වැඩිදියුණු කිරීම | හොරොව්පොතාන | | 0.17 |
| නඩත්තු ඒකකය සඳහා උපකරණ මිලදී ගැනීම | පොදු | | 5.52 |
| අමතර උපාංග මිලදී ගැනීම | | | 2.86 |
| වතුර මෝටර් මිලදී ගැනීම | | | 0.16 |
| වතුර පිල්ටර්ස් මිලදී ගැනීම | | | 0.07 |
| වෛද්‍ය නොවන උපකරණ මිලදී ගැනීම | | | 2.25 |
| මිහින්තලේ ප්‍රා.රෝ.කාර්ය මණ්ඩල වැසිකිලි අළුත්වැඩියා කිරීම | මිහින්තලේ | | 0.29 |
| ගල්කුලම ලි.වෛ.නි.නිළනිවාසය අළුත්වැඩියාව | ගල්කුලම | | 0.43 |
| කටියාව ප්‍රා.රෝ.නල ළිඳක් ඉදිකිරීම | තලාව | | 0.70 |
| **එකතුව** | | | **20.14** |

## පසුගිය වසර 03ක් තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ.අ | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටු කර ගැනිමට අපේක්ෂා කළ සුවිශේෂි අරමුණු | ප්‍රගතිය (ප්‍රමාණය/ ප්‍රතිලාභින් ගණන) | | | | ඉලක්ක ගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| i | රෝහල් සහ නිවාරණ සේවා වැඩිදියුණු කිරිම. | රෝහල් හා නිවාරණ අංශයන්හි ගොඩනැගිලි පුනරුත්තාපනය, නව ගොඩනැගිලි ඉදිකිරීම, වෛද්‍ය සහ වෛද්‍ය නොවන උපකරණ හා කාර්යාලීය උපකරණ සැපයීම සහ කළමණාකරන හා ධාරිතා සංවර්ධනය. | 1,345,231 | 1,396,452 | 1,381,478 | 1,195,463 | 260 | 270 | 290 | 345 |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරනලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම

| ව්‍යාපෘති | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල | ළඟා කර ගැනිමට අපේක්ෂිත දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | වෙන් කල (රු.මි) | භෞතික (%) | භෞතික (%) | මූල්‍ය (%) | | |
| ප්‍රාථමික සෞඛ්‍ය සේවාව සවිබල ගැන්වීමේ වැඩසටහන (PSSP) | රෝහල් ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම. | 20.69 | 86 | 95 | 85 | රෝගීන්ගේ සියළු අවශ්‍යතා ඉටු වීම | ගුණාත්මක රෝගී ප්‍රතිකාර සේවාවක් ඇති වීම |
| | නිවාරණ සේවා වැඩිදියුණු කිරිම | 2.10 | 8 | 100 | 100 | ප්‍රජාව තුළ රෝග අවම වීම | නිරෝගිමත් ජනතාවක් බිහි වීම |
| | කළමණාකරන සේවා වැඩිදියුණු කිරිම | 1.0 | 5 | 100 | 100 | නිළධාරීන් ගේ දැනුම ආකල්ප කුසලතා ප්‍රවර්ධනය වීම | කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් ජනිත වීම |

## සංරචකය තුළින් ක්‍රියාත්මක කළ ව්‍යපෘති පිළිබඳ ප්‍රගතිය

| ව්‍යාපෘති | සංරචකය | ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැය කල මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| PSSP | රෝහල් ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ රෝහල් 08ක ජෙනරේටර් කාමර ඉදිකිරීම | පොදු | ගණනය කල නොහැක | 2.89 |
| | | නල ළිං ඉදිකිරීම (තලාව, කටියාව, තන්තිරිමලේ,මහ විලච්චිය) | තලාව, මහවිලච්චිය, තන්තිරිමලේ | | 1.99 |
| | | කලා වැව ප්‍රා.රෝ.ජල ටැංකිය ඉදිකිරීම | කලාවැව | | 1.28 |
| | | විදුලි පද්ධති වැඩි දියුණු කිරීම | පොදු | | 0.80 |
| | | ගල්නෑව ප්‍රා.රෝහලේ මැලේරියා පරීක්ෂණාගාරයක් හා සෙම පටල එකතු කිරීමේ ස්ථානයක් ඉදිකිරීම | ගල්නෑව | | 0.47 |
| | | පළුගස්වැව සෞ.වෛ.නි.කාර්යාලයේ පහසුකම් වැඩිදියුණු කිරීම | පළුගස්වැව | | 1.50 |
| | | කැකිරාව දිසා රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා විවේකාගාරයක් සැකසීම | කැකිරාව | | 0.18 |
| | | රඹෑව ප්‍රා.රෝ.අප ජල පද්ධතිය ඉදිකිරීම | රඹෑව | | 0.25 |
| | | කහටගස්දිගිලිය ප්‍රාදේදේශිය රෝහලේ විශේෂඥ වෛද්‍යවර්න් සඳහා විවේකාගාරයක් සැකසීම | කහටගස්දිගිලිය | | 0.27 |
| | | කැකිරාව දිසා රෝහලේ ළමා වාට්ටුවේ රෝගීන් පරික්ෂා කිරීම සඳහා ඇළුමිණියම් ආවරණ යොදා කාමර දෙකක් සැකසීම | කැකිරාව | | 1.08 |
| | | තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම | පොදු | | 1.99 |
| | | අන්තර්ජාල ගත උපකරණ මිලදී ගැනීම | | | 1.98 |
| | | රෝහල් වල සංනිවේදන පහසුකම් ප්‍රවර්ධනය කිරීම | | | 0.10 |
| | | හදිසි අළුත්වැඩියා කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම | | | 0.73 |
| | | රත්මල්ගහවැව ජල පද්ධතිය වැඩි දියුණු කිරීම | | | 0.15 |

සංරවකය තුළින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය ඉතිරි කොටස......

| ව්‍යාපෘති | සංරවකය | ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැය කල මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| PSSP | රෝහල් ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම. | නෙළුඹැව ප්‍ර.රෝ සඳහා වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම | නැ.නු.ප | ගණනය කල නොහැක | 0.15 |
| | | කල්ලංචිය ප්‍රාදේශීය රෝහලේ වෛද්‍ය නිළ නිවාසයේ ජල අපවහන පද්ධතිය සැකසීම | හොරොව්පොතාන | | 0.38 |
| | | කල්ලංචිය ප්‍රාදේශීය රෝහලේ ජෙනරේටර් කාමරයක් ඉදිකිරීම | | | 0.36 |
| | | මුද්‍රණ කටයුතු සිදු කිරීම | පොදු | | 0.98 |
| | | මුද්‍රණ කටයුතු සිදු කිරීම | | | 0.09 |
| | | මුද්‍රණ කටයුතු සිදු කිරීම | | | 0.07 |
| | කළමණාකරන සේවා වැඩිදියුණු කිරිම | PSSP ව්‍යාපෘතියට අදාල දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම | | | 0.50 |
| | | PSSP ව්‍යාපෘතියට අදාල මෙහෙයුම් ප්‍රගති සමාලෝචන වැඩ සටහන් පැවැත්වීම | | | 0.50 |
| | නිවාරණ සේවා වැඩිදියුණු කිරිම නිවාරණ සේවා වැඩිදියුණු කිරිම | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම්, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (MCH) | | | 0.11 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම්, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (DP) | | | 0.06 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම්, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (RDS) | | | 0.14 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම්, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (MH) | | | 0.03 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම්, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (NCD) | | | 0.34 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම්, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (Rabis) | | | 0.04 |

| ව්‍යාපෘති | සංරචකය | ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | අදාල ප්‍රා.ලේ. කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැය කල මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| PSSP | නිවාරණ සේවා වැඩිදියුණු කිරිම | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (SH-MOP) | පොදු | ගණනය කල නොහැක | 0.02 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (RE) | | | 0.33 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (TB) | | | 0.20 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (Maleria-RMO) | | | 0.07 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (F&D) | | | 0.11 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (STD) | | | 0.30 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (CKD) | | | 0.07 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (MOP) | | | 0.21 |
| | | දැනුවත් කිරීම, ප්‍රගති සමාලෝචනය, පුහුණු, මුද්‍රනය කිරීම, ක්‍රියාකාරීන් සමග වැඩ සටහන් පැවැත්වීම (HEO) | | | 0.08 |
| එකතුව | | | | | **20.8** |

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබද විග්‍රහය

| අංශයේ සංවර්ධන සඳහා හදුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන් මඟ | |
|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන |
| රෝහල් ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම<br>නිවාරණසේවා වැඩිදියුණු කිරිම<br>කළමණාකරන සේවා වැඩිදියුණු කිරිම | ගුණාත්මක සෞඛ්‍ය සේවා සංවර්ධනයක් ස්ථාපිත කිරිම | නීරෝගිමත් ප්‍රජාවක් තුළින් සමෘද්ධිමත් පළාතක් බිහි කිරිම |

## 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන්

| අ.අ | ව්‍යාපෘතිය | සෞ.වෛ.නි.කා |
|---|---|---|
| 1 | මාතෘ වාට්ටුව ඉදි කිරිම | තඹුත්තේගම |
| 2 | නිළ නිවාස සංකීර්ණයන් ඉදි කිරිම | |
| 3 | සෞ.වෛ.නි.කා ඉදි කිරීම | නාච්චාදූව |
| 4 | අබිලි ද්‍රව්‍ය දැමීම සඳහා ස්ථානයක් සකස් කිරීම | ප්‍රා.සෞ.සේ.අ.කා |
| 5 | ජල නළ පද්ධතිය සකස් කිරීම | මහ විලච්චිය |
| 6 | අභ්‍යන්තර මාර්ග පද්ධති සකස් කිරීම | ඇලයාපත්තුව, තඹුත්තේගම |
| 7 | ග්‍රාමීය සුව සේවා මධ්‍යස්ථාන සකස් කිරීම | පොදු |
| 8 | සෞ.වෛ.නි කාර්යාල ඉදි කිරීම | |
| 9 | සියළුම ඒකක වලට අදාලව නිවාරණ සේවාවන් | |
| 10 | පිරිමි වාට්ටුව වැඩිදියුණු කිරිම | අරලගංවිල |
| 11 | ආපන ශාලාව වැඩිදියුණු කිරිම | මැදිරිගිරිය |
| 12 | නිළ නිවාස ඉදි කිරීම | අත්තනකඩවල |
| 13 | නිළ නිවාස වැඩිදියුණු කිරිම | ජයන්තිපුර |
| 14 | ඉන්සිනිරේටර් හා විදුලිජනක යන්ත මිළ දී ගැනිම | මැදිරිගිරිය |
| 15 | ප්‍රධාන කොරිඩෝව ඉදිකිරිම | අරලගංවිල |
| 16 | නළලිං ඉදිකිරිම | ගල්අමුණ |
| 17 | බාහිර රෝගී අංශයේ වැසිකිලි පද්ධතිය වැඩිදියුණු කිරිම | ජයන්තිපුර |
| 18 | සෞ.වෛ.නි කාර්යාලය ඉදිකිරිම | අත්තනකඩවල |
| 19 | සෞ.වෛ.නි කාර්යාලය ඉදිකිරිම | හිඟුරක්ගොඩ |
| 20 | විදුලි ජනක යන්ත්‍රය ස්තාපිත කිරිමේ කාමරය ඉදිකිරිම | මැදිරිගිරිය |

## කාර්ය සාධනය පිළිබද සමස්ත අදහස

සමස්ත කාර්ය සාධනය ඇගයීමේදී 2020 වර්ෂයේ මූලධන ප්‍රතිපාදනයන්ගේ උපයෝජනය 89%ක් වන අතර මෙය පිළිවෙළින් දේශීය අරමුදල් යොදාගැනීමේදී 81%ක් සහ විදේශ ණය ආධාර ව්‍යාපෘතීන්ට 94%ක් ලෙස විය.

ග්‍රාමීය සෞඛ්‍ය මධස්ථාන ස්ථාපිත කිරීම, මාතෘ හා ළමා සෞඛ්‍ය අංශයේ ප්‍රවර්ධනයක් ලෙස නිරීක්ෂණය වූ අතර ප්‍රජාව වෙත වඩාත් සමීප වූ සෞඛ්‍ය සේවාවක් ලබාදීම සමස්ත සෞඛ්‍ය ප්‍රවර්ධනයේ මූලික ගුණාංගයක් විය. රෝහල් රසායනාගාර ස්ථාපිත කිරීම සහ හදිසි ප්‍රතිකාර ඒකක

ස්ථාපිත කිරීම සහ තොරතුරු තාක්ෂණය සෞඛ්‍ය අංශයන්ගේ ප්‍රවර්ධනය සඳහා යොදාගැනීම කැපී පෙනෙන වර්ධනයක් සිදුවූ අංශයක් විය.

2020 වර්ෂයේ දී සිදුකරනලද ආයෝජනයන් මඟින් උතුරුමැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා භෞතික සම්පත් මෙන්ම මානව සම්පත්හි ධාරිතා සංවර්ධනය ද සිදුකෙරුණි. එමෙන්ම ප්‍රජා මූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් වඩාත් සමීප වූ සමාන හා සමානුපාතික ලෙස පළාත් ප්‍රජාව වෙත සෞඛ්‍ය සේවාවන් ලබාදීමට හැකිවිය.

උතුරු මැද පළාත් සභාවේ මෙන්ම මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අරමුදල්ද යොදා ගනිමින් පළාත් ප්‍රජාවෙහි නීරෝගීභාවය තහවුරු කිරීම තුළින් සමස්ථ දළ දේශීය නිෂ්පාදිතය ද උතුරු මැද පළාත මගින් ලබාදෙන දායකත්වය වැඩිකිරීමට හැකිවන ශ්‍රම බලකායක් සමාජගත කිරීම අරමුණු කර ගනිමින් 2020 වැඩසටහන් ක්‍රියාත්මක විය.

2019 වර්ෂයේ අගභාගයේ දී පැණනැගුණු වසංගත රෝග තත්ව කළමණාකරණය සඳහා 2020 වසරේ අනුමතව තිබූ ඇතැම් ව්‍යාපෘතීන් සංශෝධනයට ලක් කිරීමට සිදු විය. විශේෂයෙන් කොවිඩ් 19 වසංගත රෝග තත්වයට අදාළව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලබාදුන් මාර්ගෝපදේශයන් ට අනුව උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින්ද පළාත තුළ Covid-19 වසංගත රෝග තත්ත්වය කළමනාකරණය කිරීම පිණිස අවශ්‍ය වූ ඒ වෙන විට හඳුන්වා දී තිබූ නිවාරණ ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට වැඩසටහනක් සංශෝධිත ක්‍රියාත්මක කෙරිණි.

2020 වර්ෂය පළමු කාර්තුව තුළ සමස්ථ දිවයින තුළ වසංගත රෝග තත්වය තවදුරටත් ව්‍යාප්ත වූ හෙයින් නැවත සංශෝධිතව ලබා දෙන ලද මාර්ගෝපදේශයන් යටතේ Covid 19 රෝගීන් සඳහා නේවාසික පහසුකම් ලබාදීම පිණිස පළාතේ රෝහල් කීපයක් හඳුනාගත් අවශ්‍යතා සඳහා වැඩි දියුණු කිරීමට සිදුවිය.

සමස්තයක් ලෙස Covid 19 වසංගත රෝග තත්ත්වය කළමනාකරණ සේවාවේ මෙන්ම මහජන සෞඛ්‍ය සේවාවේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණු අතර, ඒ සඳහා උතුරු මැද පළාත් සභාවෙන්ද ලබා දෙන ලද අමතර ප්‍රතිපාදනයක් ද යොදා ගනිමින් සාර්ථක ලෙස වසංගත රෝග කළමනාකරණය දිවයිනේ සෙසු දිස්ත්‍රික්ක හා සමගාමීව සිදු කිරීමට හැකියාව ලැබිණි.

# 8.2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

| අනුරාධපුර දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 04 | පොළොන්නරුව දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 05 |
|---|---|
| අනුරාධපුර | මින්නේරිය |
| තඹුත්තේගම | වැලිකන්ද |
| ගාලදිවුල්වැව | මනම්පිටිය |
| පදවිය | සිරිපුර |
| | ඇලහැර |

මධ්‍යම බෙහෙත් ශාලා - 30

| අනුරාධපුර දිස්ත්‍රික්කය - 21 | පොළොන්නරුව දිස්ත්‍රික්කය - 09 |
|---|---|
| නොච්චියාගම | තමන්කඩුව |
| පලුගස්වැව | දියසෙන්පුර |
| ගල්නෑව | මැදිරිගිරිය |
| තලාව | අරලගංවිල |
| මිහින්තලය | අත්තනකඩවල |
| කැකිරාව | ගල් අමුණ |
| රාජාංගනය | ලංකාපුර |
| රඹෑව | නවසේනපුර |
| මැදවච්චිය | ජයසිරිපුර |
| ඉපලෝගම | |
| ඇඳගල | |
| තිරප්පනේ | |
| කැබිතිගොල්ලෑව | |
| තන්තිරිමලේ | |
| හොරොව්පොතාන | |
| ගලෙන්බිඳුණුවැව | |
| කහටගස්දිගිලිය | |
| නාච්චාදූව | |
| පලාගල | |
| විලච්චිය | |




ආයුර්වේද රෝහල්

| වර්ගය | අ/පුර | පො/ නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් රෝහල් | 01 | - | 01 |
| මූලික රෝහල් | - | 01 | 01 |
| ග්‍රාමීය රෝහල් | 03 | 04 | 07 |
| මධ්‍යම බෙහෙත් ශාලා | 21 | 09 | 30 |
| ආයුර්වේද මධ්‍යස්ථාන | 05 | - | 05 |
| ඖෂධ නිෂ්පාදනාගාර | 01 | - | 01 |
| **එකතුව** | **31** | **14** | **45** |

## දැක්ම

"සොබාදහමට අනුකූල වූ නිරෝගීමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්.

## මෙහෙවර

" ආයුර්වේද දර්ශනය අර්ථවත් ලෙස උපයෝගී කර ගනිමින් රෝග නිවාරණ හා ප්‍රතිකාර හා පර්යේෂණ සේවා වැඩිදියුණු කිරීම, පාරම්පරික වෛද්‍ය ක්‍රමය හා ඖෂධීය ශාක වගාව සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම, විනිවිදභාවයෙන් හා ආයුර්වේද සේවාවේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යුතුව ක්‍රියාවට නැංවීම."

## දිගුකාලීන අරමුණු

- ආයුර්වේද දර්ශනය තුළින් පළාත තුළ නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ආයුර්වේද ප්‍රතිකාර භාවිතයෙන් රෝග සුව කිරීම.
- ස්වභාවධර්මයට අනුකූලව අතුරු ආබාධවලින් තොර ප්‍රතිකාර පද්ධතියක් ඇති කිරීම.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම මඟින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ඖෂධ වගාව කිරීම තුළින් ඖෂධ හිඟය මගහරවා ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක ඖෂධ රෝගීන් වෙත ලබා දීම.
- ස්වභාවධර්මය සුරැකීම.

## කෙටි කාලීන අරමුණු

- ආයුර්වේද දර්ශනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ආයුර්වේද ජීවන දර්ශනයට ජනතාව හුරු පුරුදු කිරීම.
- අතුරු ආබාධවලින් තොරව නිට්ටාවටම රෝග සුව කිරීම.
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මධ්‍යම බෙහෙත් ශාලාවක් ඇති කිරීම.
- පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණ සභාව වෙත යොමුකර ඔවුන්ගේ දත්ත ලේඛණගත කිරීම.
- ඔසු උයන් දහයක් පළාත තුළ ඇති කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- රෝග නිවාරණ සත්කාර සංවර්ධනය.
- රෝග ප්‍රතිකාර සේවාව සංවර්ධනය.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.
- ඖෂධීය ශාක වගාව සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

### 01.රෝග නිවාරණ

ආදර්ශ ගම්මාන ඇති කිරිම, ප්‍රවර්ධන සමාජ ඇති කිරිම, පාසල් සෞඛ්‍යදාන ඒකක ඇති කිරිම, පෙර පාසල් පෝෂණ වැඩසටහන් ඇති කිරිම, රාජ්‍ය ආයතන දැනුවත් කිරිම, ජංගම සායන පැවැත්විම.

### 02. රෝග ප්‍රතිකාර

සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක්, සෑම රෝහලකම ආයුර්වේද විවිධ සායන ආරම්භ කිරිම. සෑම රෝහලක්ම හා මධ්‍යම බෙහෙත් ශාලවකම බෝ නොවන රෝග සායන පැවැත්විම.

### 03. ඖෂධ

ඔසු ගොවින් ඇති කිරිම, පළාත් ඖෂධ නිෂ්පාදනාගාරය වැඩි දියුණු කිරිම, රෝහල් ආශ්‍රිතව ඔසු උයන් 10 ක් අරම්භ කිරිම.

## තිරසර සංවර්ධන අරමුණු අංක 03

**යටතේ දක්වා ඇති නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා භාවිතා කළ ප්‍රධාන කාර්යයන්.**

පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය තුලින් එම වෛද්‍ය ක්‍රමය රැක ගැනීම.

රෝග නිවාරණය සම්බන්ධයෙන් මැදිහත් වී උතුරු මැද පළාත තුල නිරෝගී ජනතාවක් ඇති කිරීම සඳහා ඉහළම දායකත්වය සැපයීම

3 GOOD HEALTH AND WELL-BEING

රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාරවල සාර්ථකත්වය ඉහළ දමමින් සෞඛ්‍ය ක්ශේත්‍රය නගා සිටුවීම

ඖෂධ වගාව හා නිශ්පාදනය තුළින් ඖෂධ හිඟය අවම කර ප්‍රමිතියෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබාදීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 647ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 464කි. පුරප්පාඩු සංඛ්‍යාව 183 ක් වන අතර අනියම් පදනමින් 04 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනමින් 05 දෙනෙකු සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාර වල සාර්ථකත්වය ඉහල දමමින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත්වීම.
2. රෝග නිවාරණය සම්බන්ධයෙන් මැදිහත් වී උතුරු මැද පළාත තුල නිරෝගී ජනතාවක් ඇති කිරීම සඳහා ඉහළම දායකත්වය " සපයන්නන් බවට පත්වීම''.
3. ඖෂධ වගාව හා නිශ්පාදනය තුලින් ඖෂධ හිඟය අවම කර ප්‍රමිතියෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබාදීම.
4. පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය තුලින් එම වෛද්‍ය ක්‍රමය රැක ගැනීම.

## තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්ක | දර්ශක | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 03 | 3.8 | 3.8.1 | ඉදිකිරීම් මිළදී ගැනීම් පුහුණු වැඩසටහන් පැවැත්වීම | 72 | 69 |

## කාර්ය සාධන ඉලක්ක ළඟාකර ගැනීම - 2020

| ක්‍රියාකාරකම | නිමවුම | නිමවුම් දර්ශකය | ඉලක්කය | ඉලක්කගත ආයෝජනය |
|---|---|---|---|---|
| කහටගස්දිගිලිය ආ.මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිකිරිම | කහටගස්දිගිලිය ආ.මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිවිම | රෝගී ප්‍රතිකාර සේවාව සංවර්ධනය | බාහිර අංශ එකක් ඉදිකිරිම | 2.3 |
| පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිකිරිම. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට පීප්ප මිළදි ගැනිම | පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිවිම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට පීප්ප මිළදි ගැනිම. | ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය | අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිවිම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට පීප්ප මිළදි ගැනිම. | 9.5 |
| ඔසු උයන් සංවර්ධනය | ඖෂධ නිශ්පාදනයට අවශ්‍ය වියළි ඖෂධ සපයා ගැනිම | වියළි ඖෂධ හිඟය අවම විම | ඔසු උයන් සංවර්ධනය | 0.7 |
| අධෝරක්ත උෂ්ණත්ව මාපංක මිලදි ගැනිම. රෝහල් සඳහා මිළදි ගැනිම | ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය | රෝගින්ට සත්කාර කිරිම පහසුවිම | - | 0.1 |
| තෙමහල් වෛද්‍ය නිල නිවාස සංකිර්ණ දෙකක් ඉදි කිරිම, පළාත් කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව, පදවිය ආයුර්වෙද රෝහලේ නිළ නිවාසය ඉදි කිරිම අනුරාධපුර පළාත් රෝහලේ ඇතුලත මාර්ග පද්ධතිය සකස් කිරිම | වෛද්‍ය නිළ නිළ නිවාස 09 ක් ඉදිවිම. නවිකරණය කරන ලද දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල අනුරාධපුර පළාත් රෝහලේ ඇතුලත මාර්ග පද්ධතිය ඉදිවිම | රෝහලතුල සේවය කරන වෛද්‍යවරු හට නිළ නිවාස පහසුකම් සැලසිම | වෛද්‍ය නිළ නිවාස ඉදිකිරිම | 46 |

## ඉලක්ක කරා ළඟා වීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| විස්තරය | ප්‍රමාණය | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|---|
| නිළ නිවාස ඉදිකිරීම | 9 | නැ.නු.ප පදවිය | 9 | 46 |
| භාණ්ඩ මිළදී ගැනීම | පිප්ප - 10<br>මෙට්ට - 67<br>අධෝරක්ත උෂ්ණත්ව මාපංක මිලදී ගැනීම - 11 | පළාත තුළ | 15000 | 2 |
| රෝහල් සංවර්ධනය කිරීම | 1 | කහටගස්දිගිලිය | 8000 | 3.1 |
| ඖෂධ නිශ්පාදනය | 1 | තඹුත්තේගම | 20000 | 10 |
| අධීක්ෂණ සේවා සංවර්ධනය | 1 | අනුරාධපුර | 40 | 7 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය | ඉලක්කය කරා ළඟා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය (%) |
| 1 | කහටගස්දිගිලිය ආ.මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිකිරීම | කහටගස්දිගිලිය ආ.මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිවීම | 100 |
| 2 | පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිකිරීම. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට පීප්ප මිළදී ගැනීම | පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිවීම හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට පීප්ප මිළදී ගැනීම | 100 |
| 3 | ඔසු උයන් සංවර්ධනය | ඔසු උයන් සංවර්ධනය වීම | 100 |
| 4 | අධෝරක්ත උෂ්ණත්ව මාපංක මිලදී ගැනීම. රෝහල් සඳහා මිළදී ගැනීම | අධෝරක්ත උෂ්ණත්ව මාපංක මිලදී ගැනීම. රෝහල් සඳහා මිළදී ගැනීම | 100 |
| 5 | තෙමහල් වෛද්‍ය නිල නිවාස සංකීර්ණ දෙකක් ඉදි කිරීම, පළාත් කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව, පදවිය ආයුර්වෙද රෝහලේ නිළ නිවාසය ඉදි කිරීම. අනුරාධපුර පළාත් රෝහලේ ඇතුලත මාර්ග පද්ධතිය සැකසීම කිරීම | තෙමහල් වෛද්‍ය නිල නිවාස සංකීර්ණ දෙකක් ඉදිවීම, පළාත් කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව, පදවිය ආයුර්වෙද රෝහලේ නිළ නිවාසය ඉදි වීම | 100 |

## පසුගිය වසර 03 තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකර ගැනිමට අපේක්ෂා කළ සුවිශේෂී අරමුණු (specific objectives) | ප්‍රගතිය (ප්‍රමාණය/ප්‍රතිලාබින් ගණන) | | | | වැය කළ මුදල (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| රෝහල් සංවර්ධන ව්‍යාපෘති | නේවාසික හා බාහිරාංශ රෝගීන් සඳහා වඩාත් ක්‍රමවත් ප්‍රතිකාර මද්‍යස්ථාන ඇතිකිරීම | වාර්ෂිකව නේවාසික හා බාහිරාංශ රෝගීන් 15000 පමණ ප්‍රතිලාභ ලබාගන්න ලදී | වාර්ෂිකව නේවාසික හා බාහිරාංශ රෝගීන් 17000 පමණ ප්‍රතිලාභ ලබාගන්න ලදී | වාර්ෂිකව නේවාසික හා බාහිරාංශ රෝගීන් 19000 පමණ ප්‍රතිලාභ ලබාගන්න ලදී | වාර්ෂිකව නේවාසික හා බාහිරාංශ රෝගීන් 21000 පමණ ප්‍රතිලාභ ලබාගන්න ලදී | 31.5 | 100 | 72.2 | 3.1 |
| භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම | වෛද්‍ය හා රෝගී යටිතල පහසුකම් සංවර්ධනය | පළාත් පුරා රෝගීන් 560000 අධික රෝගීන් සංඛ්‍යාවක් වෛද්‍ය පරීක්ෂාවට ලක්කරන ලදී | පළාත් පුරා රෝගීන් 610000 ආසන්න රෝගීන් සංඛ්‍යාවක් වෛද්‍ය පරීක්ෂාවට ලක්කරන ලදී | පළාත් පුරා රෝගීන් 620000 ආසන්න රෝගීන් සංඛ්‍යාවක් වෛද්‍ය පරීක්ෂාවට ලක්කරන ලදී | පළාත් පුරා රෝගීන් 550000 ආසන්න රෝගීන් සංඛ්‍යාවක් වෛද්‍ය පරීක්ෂාවට ලක්කරන ලදී | 2.5 | 5 | 9.8 | 2 |
| රෝග නිවාරණ ව්‍යාපෘති | ප්‍රජාව රෝග වලින් වලකවා ගැනීම හා යහපත් සෞඛ්‍ය ජීවන රටාවකට හුරුකිරීම | වසර පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පුද්ගලයන් 20000 ආසන්න ප්‍රමාණයකට උපදෙස් ලබා දීම | වසර පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පුද්ගලයන් 31000 ආසන්න ප්‍රමාණයකට උපදෙස් ලබා දීම | වසර පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පුද්ගලයන් 43000 ආසන්න ප්‍රමාණයකට උපදෙස් ලබා දීම | වසර පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පුද්ගලයන් 15000 ආසන්න ප්‍රමාණයකට උපදෙස් ලබා දීම | 2 | 4 | 3 | 2 |
| පාරම්පරික වෙද මහතුන් සංරක්ෂණ කිරීමේ ව්‍යාපෘති | සමාජයෙන් වියැකී යමින් පවතින හෙළ වෙද ප්‍රතිකාර ක්‍රම සංරක්ෂණය කිරීම | ලියාපදිංචි පාරම්පරික වෛද්‍යවරු 280 පමණ උපහාරය පිදීම හා දිරිගැන්වීම | ලියාපදිංචි පාරම්පරික වෛද්‍යවරු 298 පමණ උපහාරය පිදීම හා දිරිගැන්වීම | ලියාපදිංචි පාරම්පරික වෛද්‍යවරු 308 පමණ උපහාරය පිදීම හා දිරිගැන්වීම | ලියාපදිංචි පාරම්පරික වෛද්‍යවරු 316 පමණ උපහාරය පිදීම හා දිරිගැන්වීම | 15 | 23 | 9.7 | 2 |
| ඖෂධ නිශ්පාදන හා සංරක්ෂණ ව්‍යාපෘති | පළාත තුල සියළු රෝහල් වල හිඟයකින් තොරව ඖෂධ ලබාදීම | නිමි ඖෂධ 30 කට ආසන්න ප්‍රමාණයක් පළාත තුලම නිපදවීම | නිමි ඖෂධ 32 කට ආසන්න ප්‍රමාණයක් පළාත තුලම නිපදවීම | නිමි ඖෂධ 35 කට ආසන්න ප්‍රමාණයක් පළාත තුලම නිපදවීම | නිමි ඖෂධ 40 කට ආසන්න ප්‍රමාණයක් පළාත තුලම නිපදවීම | 6 | 35 | 21 | 3 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට යම් ආකාරයකින් කරන ලද දායකත්වය

| ගෝලීය ඉලක්ක | විස්තරය | උප කාණ්ඩ |
|---|---|---|
| **2** | සාගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | 2.1, 2.2, 2.3,2.4 |
| **3** | නිරෝගී ජීවිතයක් සහතික කිරීම සහ සෑම වයස් කාණ්ඩයකම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9, 3a, 3b, 3c, 3d |
| **5** | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම | 5.3, 5.6 |
| **6** | සැමට ජලය සහ සනීපාරක්ෂාව ලබා ගත හැකි සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම | 6.1, 6.2, 6.3, 6.6 |
| **11** | නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත් වූ, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර පැවැත්මක් ඇතිකිරීම | 11.0, 11.7 |
| **12** | තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම | 12.2 |

## 2020 වර්ෂය තුළ සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති

- ආයුර්වේද ආදර්ශ ගම්මාන වැඩසටහන - (යහපත් දිවි පැවැත්ම, ගෙවතු වගාව, ස්වයංපෝෂිත ආර්ථිකය)
- ආයුර්වේද ප්‍රවර්ධන සමාජ වැඩසටහන - (ආයුර්වේදානුකූල ජීවන රටාවට මානව සම්පත හුරු කරවීම)
- බෝ නොවන රෝග සායනය
- පාසැල් සෞඛ්‍ය දාන ඒකක වැඩසටහන
- ජංගම සායන පැවැත්වීම
- පාරම්පරික වෛද්‍යවරුන්ගේ සංරක්ෂණ සහා පවත්වාගෙන යාම
- රාජ්‍ය ආයතන හා වෙනත් ප්‍රජා වැඩසටහන් සඳහා ආරාධිත වැඩසටහන් කිරීම
- ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන්

| වර්ෂය | වැඩසටහන් ගණන | වැයකල මුදල රු. මි |
|---|---|---|
| 2018 | 15 | 0.66 |
| 2019 | 13 | 0.65 |
| 2020 | 12 | 0.39 |

- ආයුර්වේද වෛද්‍ය ප්‍රදර්ශන යනාදිය ඇතුලත් වේ.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රමුඛ ලෙසම ඉහත දැක්වූ ගෝලීය ඉලක්කයන් අරමුණු කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පලාතේ සියළු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක කරන ලදී.

2020 වර්ෂයට අදාලව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළද භෞතික සංවර්ධනයට අදාල කටයුතු සිදු කෙරුණි.



ඔලුකරද ග්‍රාමීය ආයුර්වේද රෝහලේ බාහිරාංශය ඉදිකිරීම



පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම

පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිකිරීම - (II) පියවර





කහටගස්දිගිලියට ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිකිරීම (II) පියවර



පදවිය ග්‍රාමීය ආයුර්වේද රෝහලේ වෛද්‍ය නිල නිවාස ඉදිකිරීම. (II) පියවර



දෙමහල් A නිළ නිවස (නිවස 4 සහිත) ඉදිකිරීම (II) පියවර



දෙමහල් B නිළ නිවස (නිවස 4 සහිත) ඉදිකිරීම (II) පියවර



පළාත් ආයුර්වේද කොමසාරිස් නිල නිවස ඉදිකිරීම



පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල කිරීම

## 2021 වර්සයේදී ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යපෘති

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ | ව්‍යපෘතිය |
|---|---|
| ආයුර්වේද රෝහල් සංවර්ධනය | මනම්පිටිය ග්‍රාමීය ආයුර්වේද රෝහලේ මුළුතැන්ගෙය ඉදිකිරීම. |
| සංචාරක ප්‍රවර්ධනය සඳහා ආයුර්වේදීය පංචකර්ම මධ්‍යස්ථාන ඇතිකිරීම | දේශීය හා විදේශිකයන් සඳහා ඉදිකරන ලද මින්නේරිය පංචකර්ම මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය සකස් කිරීම |
| වෛද්‍ය හා විශේෂඥ වෛද්‍ය සේවය ලබා ගැනීම සඳහා පහසුකම් සංවර්ධනය | තෙමහල් වෛද්‍ය නිල නිවාස A හි තෙවන මහල ඉදිකිරීම (නිවාස 02 ක් සහිත) |
| | තෙමහල් වෛද්‍ය නිල නිවාස B හි තෙවන මහල ඉදිකිරීම (නිවාස 02 ක් සහිත) |
| භූමියේ සුරක්ෂිතතාවය හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, රෝහලේ හා නිලනිවාස වල ආරක්ෂාව තහවුරු කිරීම | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහල වටා තාප්පය ඉදිකිරිම |
| ආයුර්වේද දර්ශනය හා ආයුර්වේද දැනුමින් සපිරි අනාගත පරපුරක් ඇතිකිරීම | පාසැල් වැඩසටහන් |
| ආයුර්වේද දර්ශනයේ ජීවන රටාව, ආහාර හා පෝෂණ විධි, සිරිත් විරිත් වලට අනුගත වූ ප්‍රජාවක් ඇතිකිරීම. | ආදර්ශ ගම්මාන වැඩසටහන් |
| පලාතේ අර්බුදයක්ව පවතින වකුගඩු රෝග නිවාරණයට ආයුර්වේදීය දායකත්වයක් ලබාදීම. | වකුගඩු රෝග නිවාරණ වැඩසටහන් |
| ආයුර්වේද ඖෂධ නිශ්පාදනය හා සංවර්ධනය | ඔසු උයන් සංවර්ධනය |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුලත් ගමන් මග |
|---|---|
| පංචකර්ම ප්‍රතිකාර ඒකක සෑම රෝහලකම ඇති කිරීම | ආයුර්වේදයේ ප්‍රමුඛ ප්‍රතිකාර අංගයක් වූ පංචකර්ම ප්‍රතිකාරය මගින් බොහෝ අසාධ්‍ය රෝග සුව කිරීම සඳහා සියළුම රෝහල් වල විධිමත් පංචකර්ම මධ්‍යස්ථාන ඇති කිරීම. |
| තාක්ෂණික සංනිවේදන පද්ධතියක් ඇතිකිරීම | වැඩසටහන් හා සංඛ්‍යාලේඛන ලබාගැනීම සඳහා ජාලගත සන්නිවේදන පද්ධතියක ඇති කිරීම හා තොරතුරු මාසිකව විශ්ලේෂණය. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2020 වසරේ පළාත් ආයුර්වේද අංශයේ සංවර්ධනය උදෙසා අවම ප්‍රතිපාදන මගින් ලැබූ මුදල් නිසි පරිදි කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරමින් පළාතේ ජනතාවට පහසුවෙන් ළඟාවිය හැකි වන අයුරින් ආයුර්වේද සේවාව ලබා ගැනීමට මෙන්ම සැලසුම්ගත ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි කටයුතු කර ඇත.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

මූලික වශයෙන් ප්‍රතිපාදන අවම වීම නිසා ප්‍රමුඛතාවය මත ව්‍යාපෘති කිහිපයකය සංවර්ධනය සීමා කරන ලදී. එමෙන්ම එම ව්‍යාපෘතිද රටේ පැවති නිරෝධායන ඇඳිරිනීතිය මධ්‍යයේ අධීක්ෂණය කරන ලදී. කොන්ත්‍රාත්කරුවන් කාල රාමුවට අනුව සංවර්ධන කටයුතු සිදු නොකිරීමද ප්‍රධාන ගැටළුවක් විය. නමුත් වසර අවසාන කාලයේදී දැඩි අධීක්ෂණයක් හා පසු විපරම් කිරීම මගින් සංවර්ධන කටයුතු අවිච්ඡේද නොවී අවසන්කරගත හැකි විය.

එමෙන්ම ප්‍රජා මූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී Covid 19 ගෝලීය වසංගතය ජනතාව එකතුකිරීම ප්‍රධාන ගැටළුවක් විය. මේ නිසා දුරකථන සන්නිවේදන සේවාවක් පවත්වාගෙන යනු ලැබූ අතර සමාජ මාධ්‍ය ජාලයන් හා Whatsapp, Viber වැනි සන්නිවේදන මාධ්‍යන්ද භාවිතා කර විවිධ දැනුවත් කිරීම් හා ප්‍රචාරයන් සිදු කරන ලදී.

# 8.3.පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

රටක ජීවනාලිය වන ළමා පරපුරේ ක්‍රියාකාරකම සෑම කාලයකම, සෑම සමාජයකම, පැවැත්මට වැදගත් වේ. එබැවින් ළමා පරපුර හා බැදුණු යහපත් හෝ අයහපත් යම් කිසි ක්‍රියාදාමයක් වෙතොත් ඒ පිළිබඳව අවධානය යොමු කිරීම වැඩිහිටි අප කාගෙත් යුතුකමකි. පිළිගත් සාරධර්ම, සිරිත් විරිත් හා සම්මතයන් අනුවත්, පනවාගත් නීතිරීති අනුවත් කටයුතු කිරීම සියලු සමාජයන්හි අපේක්ෂාවයි. අපේක්ෂාවන් සපිරුණු සමාජයක ජීවත්වීම පුද්ගල පැතුමයි. සමාජයේ පුද්ගලයන්ගේ අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වයත් එක් එක් පුද්ගලයාගේ ක්‍රියාකාරීත්වයත් සමාජමය වශයෙන් සහ පෞද්ගලික වශයෙන් බලපෑමක් ඇති කරයි. මෙවන් බලපෑමක් ඇති කරන බැවින්, එම ක්‍රියාකාරකම්වල කළමනාකරණයක් සිදුවීම අවශ්‍ය වේ. එම නිසා සියලුම සමාජයන්හි වගකිව යුත්තෝ එම තත්ත්වයන් කළමනාකරණය කරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුවේද ළමා රක්ෂක විෂයට අදාල කාර්ය භාරය වනුයේ එයයි.

පුද්ගලයාගේ හැසිරීම ඒ ඒ සමාජ ක්‍රමයට අනුගතව ක්‍රියාත්මක නොවන අවස්ථාවන්වලදී එකී චර්යාවන් සමාජ හිතකර ආකාරයෙන් සකස් කිරීමට සහ සමාජ හිතකාමී චර්යාවන් වැඩිදියුණු කිරීම සඳහා එම විධි ක්‍රම භාවිතයට ගෙන ඇත. වරදකරුවන් ප්‍රජාව තුළම රඳවා සමාජ ප්‍රත්‍යෙක වැඩ න්‍යාය සහ භාවිතය තුළින් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් පරිවාස සේවාව ආරම්භ වී ඇත.

තීති ගරුක ප්‍රජාවක් සුරක්ෂිත ළමා පරපුරක් පළාත තුල බිහිකිරීමේ මූලික පරමාර්ථය ඇතිව පිහිටුවන ලද උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව තම අරමුණු හා කාර්ය භාර්ය තිරසර සංවර්ධන අරමුණු හා බද්ධ කොට ගනිමින් එම අරමුණු ඉටුකරගැනීම සඳහා සුවිශාල කාර්ය භාර්යක් පළාත තුළ ඉටු කරනු ලබයි.

ඉතා සංකීර්ණ මෙන්ම සංවේදී විෂය කාර්ය භාරයක් සහිත මෙම දෙපාර්තමේන්තු කාර්ය පරාසය ජනතාව තුලට සමීප කරනුවස් උතුරු මැද පළාත තුල පිහිටි අධිකරණ කලාප 06 තුල පරිවාස කාර්යාල පිහිටුවමින්, තම සේවාව පළාත පුරා ක්‍රියාත්මක කරමින්, ජනතාව වෙත ඵලදායි සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී. පළාත පුරා පිහිටුවා ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රමාණය 18 ක් වන අතර, දෙපාර්තමේන්තු කළමණාකාරීත්වය යටතේ ආයතන 08 ක් හා ස්වෙච්ඡා සංවිධාන කළමනාකාරීත්වය යටතේ ආයතන 08 වශයෙන් වේ .

පවුල තුල අනාරක්ෂිත වන දරුවාගේ සිට නීතියේ රැහැනට හසුවන බාල වයස්කාර දරුවා දක්වා වූ සියලු දරුවන් අවධානමෙන් මුදවාගෙන සමාජයට වැඩදායි යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරීම හා නිවාස ගත වීමට හේතුවන කාරනා හඳුනාගෙන එම හේතු සඳහා සාර්ථක විසඳුම් ලබාදීම මෙම දෙපාර්තමේන්තු ප්‍රමුඛ කාර්ය අතර වේ.

පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය පෙර පැවතියේ බන්ධනාගාරය හා සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේය. දිනපතා සීඝ්‍රයෙන් වර්ධනය වන පරිවාස හා ළමාරක්ෂක කටයුතු සාර්ථකව ඉටු කරලීමට වෙනමම දෙපාර්තමේන්තුවක අවශ්‍යතාවය උද්ගත විය. මෙම අඩුපාඩු පිළිබඳව එවකට පැවති සාපරාධී අධිකරණ කොමිෂමේ විශේෂ අවධානය යොමු විය. එහි නිර්දේශයන්හි බලපෑම ගැන සලකා බැලීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යාපන හා අධිකරණ යන අමාත්‍යාංශ එක්ව ඒ සඳහා වන සාකච්ඡාවක් 1951 වසර අවසානයේ පවත්වන ලදි. එහිදී ළමා ආරක්ෂක සේවාවන් ක්‍රියාත්මක කිරීමට වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට එකඟතාවයකට එළඹිණි. මෙම එකඟතාවයේ ප්‍රතිඵලයක් ලෙස ලන්ඩන් නගරයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියෙකු වන සිරිල් හැම්ලි මහතා ඉහත යොජනාව පරික්ෂා කර බැලීමට පත් කර ශ්‍රී ලංකාවට එවන ලදි. ඔහු විසින් 1952 දී ඉදිරිපත් කරන ලද ලියවිල්ලක ළමයින් සඳහා වූ දෙපාර්තමේන්තු ස්ථාපිත කිරීමට සම්බන්ධව යෝජනා සලකා බලා 1956 ඔක්තෝබර් 01 දින ජාත්‍යන්තර දිනයේදී ළමා ආරක්ෂක / සුභ සාධන දෙපාර්තමේන්තුව යනුවෙන් වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට කටයුතු කරන ලදි. ඒ අනුව පරිවාස සේවාවද බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් ඉවත් කර ළමා ආරක්ෂක / සුභ සාධන සේවා දෙපාර්මේන්තුව එකතු කර 1956 ඔක්තෝබර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදි. ළමා ආරක්ෂණ සේවාව සමඟ පරිවාස සේවාව සම්බන්ධ කිරීමට ප්‍රධාන සාධකයක් වූයේ හැමිලින් මහතාගේ යෝජනාවන්ය.

මේ අයුරින් ආරම්භ කළ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 1988 වසරේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වාම මධ්‍යම රජයේ කොමසාරිස්වරයෙකු යටතේ සහකාර කොමසාරිස් කාර්යාල බල ප්‍රදේශ මට්ටමින් පත් කරන ලද සහකාර කොමසාරිස්වරුන් යටතේ පරිවාස කාර්යාල හරහා තම සේවාවන් ජනතාව වෙත ලඟා කරවීම සිදු විය. පළාත් සභා පරිපාලනය ආරම්භ වීමත් සමඟ පූර්ණ ලෙස විමධ්‍යගත විෂයක් ලෙස පත් වූ පරිවාස හා ළමාරක්ෂක විෂය පළාත් අමාත්‍යාංශයක් යටතේ පළාත් පරිවාස කොමසාරිස්වරයෙක් හරහා සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවට අදාල සියලු කාර්යයන් ඉටු කිරීම සඳහා පහත ආඥාපනත් හා පනත් මගින් දෙපාර්තමේන්තුව වෙත බලය ලැබී ඇත.

❖ ආඥාපනත්

පරිවාස ආඥාපනත,

1939 අංක 48 දරණ ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥාපනත

1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාස භාරයට පත් කිරීමේ ආඥාපනත

නිවර්තන නිවාස, තරුණ වරදකරුවන්ගේ ආඥාපනත

1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥාපනත

1927 දරන ප්‍රකාශන ආඥාපනත

1941 අංක 22 දරණ අනාථ නිවාස ආඥාපනත

❖ පනත්

1955 දණ්ඩ නීති සංග්‍රහය - 1995 - අංක 22

1999 අංක 32 දරණ පනත

1998 අංක 27 අධිකරණ සංවිධාන පනත

1907 අංක 05 දරණ රැඳවුම් පනත

❖ ප්‍රඥප්ති

විශ්ව ළමා ප්‍රඥප්තිය

උතුරු මැද පළාත් ළමාරක්ෂක සේවා අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය

ඒ අනුව වර්තමානයේදී දෙපාර්තමේන්තුවේ සේවාවන් පළාත පුරා ක්‍රියාත්මක කිරීමට අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ දෙපාර්තමේන්තුවට අයත් පරිපාලන ආයතන විහිදී ඇති ආකාරය පහත පරිදිවේ.

## පරිපාලන ආයතන

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පරිවාස කාර්යාල | 04 | 02 | 06 |
| උපදේශන මධ්‍යස්ථාන | 01 | - | 01 |
| ළමා රැඳවුම් මධ්‍යස්ථාන | 02 | - | 02 |
| සහතික කළ පාසල් (ගැහැණු) | 01 | - | 01 |
| භාර ගැනීමේ නිවාස | 01 | - | 01 |
| ළමා නිවාස | 07 | 04 | 11 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 01 | - | 01 |
| පෙර පාසල් | 01 | - | 01 |

## පරිවාස කාර්යාල හා එම කාර්යාලවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

| අනු අංකය | පරිවාස කාර්යාලය | අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|---|
| 1 | අනුරාධපුර | නැ.නු.ප |
| | | ම.නු.ප |
| | | මහ විලච්චිය |
| | | නාච්චාදූව |
| | | මිහින්තලේ |
| | | තිරප්පනේ (අයත් පොලිස් බල ප්‍රදේශ අනුව) |
| | | ගලෙන්බිදුණු වැව |
| | | කහටගස්දිගිලිය |
| | | මැදවච්චිය |
| | | රඹෑව |
| 2 | තඹුත්තේගම | නොච්චියාගම |
| | | රාජාංගනය |
| | | තඹුත්තේගම |
| | | තලාව |
| | | ඉපලෝගම |
| 3 | කැකිරාව | ගල්නෑව |
| | | පලාගල |
| | | කැකිරාව |
| | | තිරප්පනේ (අයත් පොලිස් බල ප්‍රදේශ අනුව) |
| | | පලුගස්වැව |
| 4 | කැබිතිගොල්ලෑව | හොරොව්පොතාන |
| | | කැබිතිගොල්ලෑව |
| | | පදවිය |
| 5 | පොළොන්නරුව | තමන්කඩුව |
| | | ලංකාපුර |
| | | වැලිකන්ද |
| | | දිඹුලාගල |
| 6 | හිඟුරක්ගොඩ | හිඟුරක්ගොඩ |
| | | මැදිරිගිරිය |
| | | ඇළහැර |

## දෙපාර්තමේන්තු කළමනාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා සංවර්ධන මධ්‍යස්ථාන

01. අභය භාර ගැනීමේ ළමා නිවාසය
02. යෙහෙළි උපදේශන සේවා මධ්‍යස්ථානය
03. මඩාටුගම සහතික කළ පාසල
04. කාන්තා ළමා රැඳවුම
05. පිරිමි ළමා රැඳවුම
06. අවන්ති දේවි ළමා සංවර්ධන මධ්‍යස්ථානය
07. ධර්මපාල බෝසත් බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානය
08. ක්ෂේම සුරක්ෂා ළමා රැකවරණ මධ්‍යස්ථානය

## ස්වේච්ඡා සංවිධානවල කළමනාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා සංවර්ධන මධ්‍යස්ථාන

| අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|
| ප්‍රීති ළමා නිවාසය | පැරකුම් බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානය |
| අශෝක බාලක ළමා සංවර්ධන මධ්‍යස්ථානය | ශාන්ත ජෝශප් බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානය |
| සරණ සෙවණ ළමා සංවර්ධන මධ්‍යස්ථානය | ධර්මපාල බෝසත් බාලක ළමා සංවර්ධන මධ්‍යස්ථානය |
| මිත්‍ර ළමා සංවර්ධන මධ්‍යස්ථානය | |
| SOS ළමා සංවර්ධන මධ්‍යස්ථානය | |

## දැක්ම

"නීතිගරුක ප්‍රජාවක්, සුරක්ෂිත ළමා පරපුරක්".

## මෙහෙවර

"සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන්, විශෝධනය සහ ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකිමින් සියළු පාර්ශවයන්ගේ මනා සහභාගීත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම".

## දිගුකාලීන අරමුණු

01. දරුවාගේ පෝෂණය හා මානසිකව ඔහුට හෝ ඇයට විය හැකි යැයි හඳුනාගත් සියලු මානසික හා අහිතකර බලපෑම්වලින් මුදවා ගැනීම තුලින්, කායික හා මානසික නිරෝගී දරුපරපුරක් බිහිකිරීම හා ඒ හා සම්බන්ධයෙන් වන තිරසර සංවර්ධන අරමුණු හා අභිමතාර්ථ ඉටු කරගැනීම.

02. පරිවාස කාලයකට යටත්ව දෙපාර්තමේන්තු භාරයට පත්වන ළමා වැඩිහිටි ප්‍රජාව පුනුරුත්ථාපනය සඳහා නිසි ක්‍රමවේද හඳුනාගැනීම හා ක්ෂේත්‍රය තුල සිදුවිය හැකි යැයි හඳුනාගත් අවධානම් සහගත තත්ත්වයන් සඳහා ස්ථිර විසඳුම් ලබාදීම.

03. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම හා ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සමාජය තුල පෙළඹවීමක් ඇති කිරීම.

04. දරුවන් නිවාස ගත වීමට බලපානු ලබන හේතු හඳුනාගැනීම හා ඒවාට සාර්ථක විසඳුම් ලබාදීම.

05. නිරෝගී අධ්‍යාපනයකට දරුවන් යොමුකිරීම.

06. පූර්ණ පෞරුෂයන් සතු විනය පද්ධතියක් දරුවා තුල ගොඩනැගෙන පරිදි දරුවන් කළමනාකරණය සඳහා දෙමාපියන් යොමුකිරීමට අවශ්‍ය උපදේශනය ලබාදීම.

07. දරුවන් අතර වන හානිකර මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහා යොමුකිරීම තුලින් දරුවන් අතර මත් ද්‍රව්‍ය භාවිතය පළාත තුලින් තුරන් කිරීම.

08. නිසි උපදේශනය හා මග පෙන්වීම තුලින් පවුල් ඒකකය ශක්තිමත් කිරීම හා දරුවා පවුල තුල සුරක්ෂිත කිරීම.

09. දරුවන් අතර ව්‍යාප්ත වන තාක්ෂණ අවභාවිතය වැලැක්වීම හා නවීන මාධ්‍ය හා තාක්ෂණය නිසි අයුරින් භාවිතයට යොමුකිරීම සඳහා දැනුවත් කිරීම.

10. විෂය ක්ෂේත්‍රයට අදාලව ක්ෂේත්‍රය තුල නිසි පරියේෂණ ක්‍රමවේද හරහා සාර්ථක විසඳුම් හඳුනා ගැනීම හා ක්‍රියාත්මත කිරීම තුලින් සමාජය වඩාත් විනය ගරුක හා නීතිගරුක ස්ථානයක් බවට පත් කිරීම.

11. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන දරුවන් සුරක්ෂිත කරගත හැකි ක්‍රමවේද කෙරෙහි යොමු වීම.

## කෙටිකාලීන අරමුණු

01.පරිවාස පරිලෝචනය හා පසුභාර යන විෂය ක්ෂේත්‍රවලට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.

02.භාරය හා ආරක්ෂාව අහිමි වූ දරුවන් සඳහා රැකවරණය සැපයීම.

03.අධිකරණය මඟින් වරදකරුවන් වූ බාල වැඩිහිටි ප්‍රජාව විවෘත පරිසරයේ තබා විශෝධනය කිරීම.

04.අධිකරණයට තීන්දු ගැනීමට සහය වීම.

05.සුදුසු ක්‍රමවේදයක් යටතේ නිවාස ගත දරුවන් සමාජ ගත කිරීම.

06.අනාරක්ෂිත අවධානම් සහිත දරුවන් නිවාස ගත කිරීම.

07.සියලු දරුවන්ට සම අයිතීන් ලබාදීමට කටයුතු කිරීම.

08.ළමා අපයෝජනය හා අපචාරය අවම කිරීමට සමාජය දැනුවත් කිරීම.

09.අඩු ආදායම්ලාභී දරුවන් සහිත පවුල් සඳහා නිවාස ආධාර ස්වයං රැකියා ආධාර, පාසල් උපකරණ වෛද්‍ය ආධාර සැපයීම වැනි සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

10.බාල වයස්කාර ළමා මව්වරු සඳහා රැකවරණය සැලසීම.

11.දරුවන් සඳහා ඇති අධ්‍යාපනයේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

12.අවශ්‍ය අවස්ථාවලදී විවිධ පාර්ශව සඳහා උපදේශන සේවය ලබාදීම.

## ප්‍රධාන කාර්යයන්

01.පරිවාස, පරිලෝචන හා පසුභාර යන විෂය ක්ෂේත්‍රවලට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.

02.ළමා අයිතිවාසිකම් පිළිබඳව සමාජය දැනුවත් කිරීම උදෙසා ආරක්ෂාව හා රැකවරණය පිළිබඳව වැඩසටහන් පැවැත්වීම, ළමා අයිතිවාසිකම් විෂිදී පවතින පරාසය, කඩ වූ විට එහි නීතිමය පැතකඩ පිළිබඳව සමාජය දැනුවත් කිරීම.

03.අපයෝජනය වලින් දරුවන් ආරක්ෂා කිරීම උදෙසා අපයෝජනය පිළිබඳව සමාජය දැනුවත් කිරීම, අනාරක්ෂිත දරුවන් එම අවධානමින් මුදවාගැනීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ගයක් ලෙස ආයතන ගත කිරීම හා සුදුසු පුද්ගල භාරකාරීත්වයට පත් කිරීම.

04.නිවාස ආනාරක්ෂිත වීම හේතු කොටගෙන අවධානමට ලක්වීම වැලැක්වීම සඳහා නිවාස ආධාර ලබාදීම.

05.අඩු ආදායම්ලාභී දරුවන් සහිත පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම.

06.ළමාරක්ෂක කමිටු බලගැන්වීම

07.දරුවන් අතර ව්‍යාප්ත වන හානිකර දායක මත් ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීම, මත් ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවීම මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ දරුවන් සඳහා පුනුරුත්ථාපන හා උපදේශනය ලබාදීම.

08.සියලුම දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍රයේ සිටින අඩු ආදායම්ලාභී දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම, නිවාසගත වන දරුවන් සඳහා ප්‍රාථමික, ද්විතීක හා තෘතීක අධ්‍යාපනයට අවස්ථාව ලබා දීම.

09. පාසල් අධ්‍යාපනය නිම කල නිවාස ගත දරුවන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම හා වෘත්තීය අධ්‍යාපනයෙන් පසු රැකියා සඳහා යොමු කිරීම.

10.දරුවන් ආයතන ගත වීමට වඩා පවුලතුල සුරක්ෂිත වීම ඔහුගේ හෝ ඇයගේ මානසික සුවතාවයට හේතු වන බැවින්ද, නිවාස ගත වීම වැලැක්වීම සඳහා ද, අදාල පාර්ශව සඳහා සුදුසු උපදේශනය හා ආධාර ක්‍රම ක්‍රියාවට නැංවීම තුල දරුවා පවුල තුල සුරක්ෂිත කිරීමට පියවර ගැනීම.

11.අධිකරණ නියෝග මත පරිවාස භාරයට පත්වන ළමුන් හා වැඩිහිටියන්ගේ පසු විපරම් කටයුතු සිදුකිරීම හා අවශ්‍ය අවස්ථාවලදී, ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතතාවය සඳහා නිවාස ආධාර හා ස්වයං රැකියා ආධාර වැනි සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

12.දරුවන් කුලවද්දා දීමට අදාල කටයුතු සිදුකිරීම.

13.නීතියේ රැහැනට හසු වූ බාල වයස්කාර දරුවන් රැඳවුම් මධ්‍යස්ථානවලට යොමුකිරීම හා පුනුරුත්ථාපනය කාර්ය සිදු කිරීම.

14. නිවාස ගත දරුවන් සමාජගත කිරීම සඳහා සුදුසු ක්‍රමවේද හඳුනාගැනීම හා එම ක්‍රමවේද හරහා සාර්ථක ලෙස සමාජ ගත කිරීම.

15.නිවාස ගත වන දරුවන් සම්බන්ධයෙන් දෙමාපිය පාර්ශව නියෝජනය කරමින්, දරුවන් සම්බන්ධ සියලු කටයුතු ඉටුකිරීම. (ගැහැණු දරුවන් වැඩිහිටි දරුවන් බවට පත් වූ පසු හා විවාහ කටයුතු සිදු කර දීම)

16.දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පෝෂණ සහනාධාර ලබාදීම හා පවුල් ඒකකය දැනුවත් කිරීම.

17. දිවා සුරකුම් මධ්‍යස්ථානය අධීක්ෂණය හා පහසුකම් සැපයීම.

18.දරුවන්ගේ හැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (කලා හැකියා ප්‍රදර්ශනය හා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් වැනි වැඩසටහන් පැවැත්වීම)

19.ඉහත සියලු කාරණා සඳහා අවශ්‍ය වන මානව සම්පත දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදේශනය, පුහුණු අවස්ථා ඇති කිරීම, ආයතන අතර නිසි සම්බන්ධීකරණය හා කළමනාකරණය තුලින් සාර්ථක සේවයක් සැපයීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ළමා අපචාරවලට ලක් වුවන් සඳහා නීතියේ රැකවරණය ලබා දිම සඳහා ඉදිරිපත් වීම.
- ළමා අපචාරවලට ලක් වු දරුවන් සඳහා රැකවරණය ලබා දිම.
- ළමා අපචාර සම්බන්ධයෙන් පාසල් ළමුන් ප්‍රජාව දැනුවත් කිරිම.
- අඩු ආදායම්ලාභි දරුවන් සිටින පවුල්වල ආර්ථික මට්ටම නගා සිටුවීමට කටයුතු කිරිම.
- කායික හා මානසික වශයෙන් නිරෝගි ළමා ප්‍රජාවක් බිහි කිරීම.
- නිතියේ රැහැනට හසු වු බාල වයස්කාර දරුවන් හා වැඩිහිටි පිරිස පුනරුත්ථාපනය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය.
- කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනයට අවශ්‍ය පියවර ගැනීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




1 සියලුතැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.




3 නිරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම

- ඉහළ ගුණාත්මක ළමා සුභසාධනයක්
- ළමා රැකවරණය හා සුභසාධනය ඉහළ යාම




4 පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථාව සැලසීම

- සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය
- පරිවාසගත ළමුන් අධ්‍යාපනයට යොමු කිරීම
- පරිවාසගත ළමුන් වෘත්තිය අධ්‍යාපනයට යොමු කිරීම




5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම

- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම
- ළමා අපයෝජන හා අපචාර අවම කිරීම




16 තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම යුක්තිය සඳහා සෑමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකදීම පරිපූර්ණ ආයතන ගොඩනැගීම.

## දෙපාර්තමේන්තුව මගින් සලසනු ලබන සේවාවන්

**01.** විශෝධන සේවාව

අධිකරණයට යොමුවන නොයෙකුත් වැරදිවලට යොමුවන ළමුන් හා තරුණ, වැඩිහිටි වරදකරුවන්ගේ චරිත හැඩගස්වා පුනරුත්ථාපනය කිරීම මෙම සේවාව මගින් සිදු වේ. මෙය ආයතනගතව සපයන සේවාවන් හා ආයතනගත නොවන සේවාවන් ලෙස සපයනු ලබයි.

**02.** වෙනත් සේවාවන්

අනාථ, අසරණ, අත්හළ, කෲරකම්වලට හා නොයෙකුත් ආපදාවලට මුහුණ පා සිටින ළමුන් රැකබලා ගැනීම, අධ්‍යාපනය, පෝෂණය හා අනෙකුත් සියළු සංවර්ධන අවශ්‍යතා සපුරාලීම මේ යටතේ සිදු කරනු ලබයි. මෙය ආයතනගතව සපයන සේවාවන් හා ආයතනගත නොවන සේවාවන් ලෙස සපයනු ලබයි.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 186ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 113 කි. පුරප්පාඩු සංඛ්‍යාව 73ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

- ❖ පළාතේ සියලු දරුවන්ට ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය අනුව හිමි විය යුතු වරප්‍රසාද හා අයිතිවාසිකම්වලට ඇති හිමිකම් ලබාදීම.
- ❖ පළාතේ වෙසෙන සියලුම දරුවන්ගේ මන්ද පෝෂණය ඉදිරි වසර 05 තුළ නිමා කිරීම සඳහා විශේෂ ළමා පෝෂණ වැඩසටහන් හඳුන්වා දීම.
- ❖ ළමා දරිද්‍රතාවය නිමා කිරීම සඳහා පළාත තුල විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ පළාත තුල දරුවන් කායික දණ්ඩනයට,මානසික පීඩනයට ලිංගික සහ වෙනත් ආකාරයේ අපයෝජනයට, නීති විරෝධී වාණිජ කටයුතු සඳහා ළමයින් යොදා ගැනීමට ළමා ශ්‍රමිකයින් ලෙස භාවිතා කිරීම හා නොසලකා හැරීමට බඳුන් වීම මුළුමනින්ම තුරන් කිරීම.
- ❖ දිගින් දිගටම පමා වෙමින් පවතින දරුවන් සම්බන්ධ පළාතේ සියලු නඩු විසඳීමට කටයුතු කිරීම.
- ❖ කුමන හේතුවක් නිසා හෝ පළාතේ ළදරුවන් මහ මඟ දමා යාම, මරා දැමීම වැලැක්වීමට පියවර ගන්නා අතර දරුවන් දරුකමට හදාවඩා දීම සඳහා වූ සංකීර්ණ ක්‍රමවේදය සරල කිරීම.
- ❖ පළාතේ අඩු ආදායම්ලාභී සියලුම දරුවන්ට කැපකාර පවුල හඳුන්වාදීමේ පළාත් වැඩ පිළිවලක් සකස් කිරීම.

## තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟාවීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත දායකත්වය

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **01. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.** | | | |
| නිවාස අනාරක්ෂිත වීම හේතුකොට ගෙන දරුවන්ට සිදුවිය හැකි අවධානම වැලැක්වීම | නිවාස ආධාර ලැබීම හේතුවෙන් නිවාස සුරක්ෂිත කර ගන්නා ලද පවුල්සංඛ්‍යාව -01 | 0.45 | 0.45 |
| **03.නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.** | | | |
| ලිංගික අපයෝජනය,ස්ත්‍රී දූෂණය, නීත්‍යානුකූල භාරකාරීත්වයෙන් අපහරණය කර ස්ත්‍රී දූෂණය කිරීම, කෘරත්වයට පත්කිරීම, භාරය හා ආරක්ෂාව, සොරකම, මත් ද්‍රව්‍ය භාවිතය හා විකිණීම, පහර දීම, ව්‍යාභිචාරය, පවුල් ආරවුල්, අඩු වයස් ගැබ් ගැනීම්, කුට්ටනය, කුලවැද්දුම යන කාරණා සම්බන්ධව මැදිහත්වීම හා අවශ්‍යය සේවාවන් ලබාදීම. | මැදිහත්වූ සිද්ධීන් ප්‍රමාණය ලිංගික අපයෝජනය - 164<br>ස්ත්‍රී දූෂණය -137 නීත්‍යානුකූල භාරකාරීත්වයෙන් අපහරණය කර ස්ත්‍රී දූෂණය කිරීම - 141<br>කෘරත්වයට පත් කිරීම -11<br>භාරය හා ආරක්ෂාව - 306<br>සොරකම - 16<br>මත්ද්‍රව්‍ය භාවිතය හා විකිණීම -30<br>පහර දීම - 25<br>පවුල් ආරවුල් - 75<br>අඩු වයස් ගැබ්ගැනීම් -කුලවද්දා දීම් - 126 | - | - |
| **04.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමටජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථා සැලසීම.** | | | |
| නිවාස ගත දරුවන් සඳහා වාර්ෂික අධ්‍යාපන චාරිකාව, විෂයන් සඳහා උපකාරක පංති පැවැත්වීම, වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම, හැකියා ප්‍රදර්ශන වැඩසටහන් පැවැත්වීම, පළාතේ අනෙකුත් දරුවන් සඳහා පාසල් උපකරණ බෙදාදීම, පාසල් ගමන් පහසුව සඳහා උපකාර ලෙස පාපැදි ලබාදීම, ළමා රක්ෂක අරමුදල මගින් අධ්‍යාපන ආධාර ලබාදීම | ප්‍රතිලාභ ලබා ගත් නිවාස ගත දරුවන් - 467<br>ප්‍රතිලාභ ලැබූ පළාතේ දරුවන් - 793 | 5.18 | 5.18 |
| **05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.** | | | |
| ගැහැණු දරුවන් විවාහය තුලින් සමාජ ගත කිරීම සඳහා කටයුතු කිරීම හා ගැහැණු දරුවන් වැඩිහිටි දරුවන් වූ පසු දෙමාපිය පාර්ෂවය නියෝජනය කරමින් අවශ්‍ය කටයුතු ඉටු කිරීම | සමාජ ගත වූ දරුවන් සංඛ්‍යාව 01 | 0.212 | 0.212 |
| **16.තිරසර සංවර්ධනය සඳහා සාමකාමී හා පරිපූර්ණ සමාජයන් ඇති කිරීම යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකදීම පරිපූර්ණ ආයතන ගොඩනැගීම.** | | | |
| හොඳම ළමා රැකවරණ මධ්‍යස්ථානය තේරීම | සම්බන්ධ වූ ළමා රැකවරණ මධ්‍යස්ථාන ප්‍රමාණය 15 | 0.045 | 0.045 |

පළාත තුළ දරුවන්ගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කරන ප්‍රමුඛ පෙළේ ආයතනයක් වන පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිමට දෙපාර්තමේන්තුව මෙහෙයවන ලදී.

ඒ සඳහා 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තු සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදි සියළු සංවර්ධන ව්‍යාපෘති සෘජුව හෝ වක්‍රව දෙපාර්තමේන්තුවට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගත හැකි වන පරිදි ඒ කෙරෙහි අවධානය යොමු කරමින් පළාත් මට්ටමින් එම අරමුණු ඉටුකර ගැනීමට විවිධ ව්‍යාපෘති සකස් කිරිමටත් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගන්නා ලදී.

## තිරසර සංවර්ධන අරමුණු ලගාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරනලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්ක | දර්ශක | ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 4 | 4.5 | 4.5.1 | අධ්‍යාපන හා විනෝද චාරිකාව | 0.6 | 0.6 |
| 4 | 4.5 | 4.5.1 | නිවාසගත දරුවන්ගේ හැකියා ප්‍රදර්ශනය | 0.29 | 0.29 |
| 1 | 1.3 | 1.3.1 | නිවාසගත දරුවන් සමාජ ගත කිරීම යටතේ නිවාස ගත දරුවන් විවාහය තුලින් සමාජගත කිරීම | 0.212 | 0.212 |
| 1 | 1.3 | 1.3.1 | අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල්උපකරණ බෙදාදීම | 1.46 | 1.46 |
| 1 | 1.3 | 1.3.1 | ළමා රක්ෂක අරමුදල මගින් අධ්‍යාපන ආධාරයක් ලෙස පාසල් ගමන් පහසුව සඳහා පාපැදි ලබාදීම | 0.052 | 0.052 |
| 1 | 1.2 | 1.2.2 | ළමා රක්ෂක අරමුදල මගින් නිවාස ආධාර | 0.453 | 0.453 |
| 1 | 1.3 | 1.3.1 | ළමා රක්ෂක අරමුදල මගින් අධ්‍යාපන ආධාර ලබාදීම | 0.84 | 0.89 |
| 4 | 4.3<br>4.4 | 4.3.1<br>4.4.1 | නිවාසගත දරුවන් සඳහා වෘත්තීය පහුණුව ලබා දීම | 1.2 | 1.2 |
| 4 | 4.1 | 4.1.1 | නිවාසගත දරුවන්උපකාරක පංති සඳහා යොමු කිරීම | 0.74 | 0.74 |
| 16 | 16.6 | 16.6.1 | හොඳම ළමා රැකවරණ මධ්‍යස්ථානය තේරීම | 0.045 | 0.045 |

පළාත තුළ දරුවන්ගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කරන ප්‍රමුඛ පෙළේ ආයතනයක්වන පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිමට දෙපාර්තමේන්තුව මෙහෙයවන ලදී.

ඒ සඳහා 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තු සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදි සියළු සංවර්ධන ව්‍යාපෘති සෘජුව හෝ වක්‍රව දෙපාර්තමේන්තුවට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගත හැකි වන පරිදි ඒ කෙරෙහි අවධානය යොමු කරමින් පළාත් මට්ටමින් එම අරමුණු ඉටුකර ගැනීමට විවිධ ව්‍යාපෘති සකස් කිරිමටත් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගන්නා ලදී.

## 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

### 01. වැඩිහිටි සත්කාරක වැඩසටහන





දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා අධීක්ෂණය වන උතුරු මැද පළාත තුල පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථාන 18 ක් වන අතර, මේවායේ රැකවරණය ලබන දරු දැරියන් සංඛ්‍යාව 450 ක් පමණ වේ. දරුවකු හැදී වැඩීමට උචිත පරිසරය වනුයේ තමා ජීවත්වන ගෘහාශ්‍රිත පරිසරය වුවද, වර්තමානය වන විට පවුල් පරිසරය තුල සිදුවන්නාවූ නොයෙක් ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් හා සමාජයේ ඇතැම් පුද්ගලයන් වෙතින් දරුවන්ට සිදුවන යම් යම් අකටයුතුකම් හා අසාධාරණයන් හේතුවෙන් අනාථ, අත්හල, අසරණ දරුවන් ලෙස ආයතන ගත වන්නට සිදු වී ඇත. එවිට ඔවුන් හැදී වැඩෙන පරිසරය මෙන්ම ළමා කාලයද ගෙවී යන්නේ ළමා නිවාස තුලය. මෙලෙස ආයතන ගතව හැදී වැඩෙන දරුවන් තුල පවත්නා මානසික බිඳවැටීම්, මුරණ්ඩුගති පැවතුම්, ප්‍රචණ්ඩකාරීබව, නොමනා හැසිරීම් රටාවන්, හුදකලා බව ආදිය ඔවුන් තම ගෘහස්ත ජීවිතය තුලදී මුහුණ දුන් ගැටළු හා ජීවත් වූ සමාජ වටපිටාවෙන් ලැබූ අත්දැකීම් පාදක කොටගෙන සිදු වූ සිදුවීම්ය. එම නිසා දරුවන් තුල වැඩිහිටියන්ට ගරු කිරීම, වැඩිහිටියන්ට සැලකීම, ආදරය, සෙනෙහස ලබාදීම සමාජය තුල ජීවත්වන විටදී අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවත්වීම වැනි යහපත් ගුණාංග ඔවුන්ගෙන් යම් දුරකට ඈත් වී ඇත. ළමා සංවර්ධන මධ්‍යස්ථානවල හැදී වැඩෙන දරුවන් යහපත් දරුවන් ලෙස සමාජගත කිරීම දෙපාර්තමේන්තුව සතු කාර්යයි. ඒ සඳහා අනුරාධපුර සාලියපුර ශාන්ති වැඩිහිටි නිවාසයේ දරුවන් නොසලකා හැරීම හා විවිධ හේතූන් මත තනි වූ දෙමාපියන් මෙන්ම නිවාසගතව සිටින වැඩිහිටියන් හා දරුවන් අතර හමුවේදී, දරුවන්ට එම වැඩිහිටියන් සඳහා විවිධ අයුරින් සත්කාර කිරීමට දරුවන්ට අවස්ථාව ලබාදීම සිදුවේ. ඒ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථානගත දරුවන් 200කගේ පමණ සහභාගීත්වයෙන් සංවිධානය කෙරෙණු මෙම වැඩසටහන සඳහා රු.මි 0.43 ප්‍රතිපාදනයක් වැය කරන ලදි.

### 02. අධ්‍යාපන හා විනෝද චාරිකාව



දරුවා යනු නිරන්තර කුතුහලය, ගවේෂණය හා සරළ සහ සැහැල්ලුභාවය එකට එක්ව ගෙන සිටීමට කැමත්තක් දක්වන පිරිසකි. මවගේ හා පියාගේ ආදරය හා රැකවරණය මෙන්ම පවුලේ සෙසු සමාජිකයන්ගේ රැකවරණය ලබන දරුවාගේ සිට විවිධ කරුණු කාරණා හේතුකොටගෙන නිවාස ගත වන දරුවාද මෙබඳු අයෙකි. පවුල තුල හැදී වැඩෙන දරුවාට විනෝදය හා අධ්‍යනය සඳහා පිටතට යාම පහසු කාර්යයක් වුවත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන ගත වන දරුවාට එය එක්තරා අභියෝගකි.

කුමන කාරණාවක් නිසා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හැදී වැඩෙන්නට සිදු වුවත්, ජීවිතය ප්‍රීතිමත් ලෙස ගත කිරීමට දරුවාට අයිතියක් ඇත. එය ලබාදීම අප කාගේත් යුතුකමකි. කෙදිනක හෝ සමාජ ගත වන තුරු දරුවාගේ නිවස, ළමා සංවර්ධන මධ්‍යස්ථානය වන බැවින්, සමාන්‍ය ජීවිතයේදී දරුවකු ලබන අත්දැකීම් දරුවාට

ලබාදීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම දෙපාර්තමේන්තුවක් ලෙස අප සතු යුතුකමකි. එම කාර්ය ඉටු කිරීම සඳහා 2020 ඔක්තෝබර් 01 විශ්ව ළමා දිනයට සමගාමීව ළමා නිවාස දරුවන්ගේ අධ්‍යාපනය හා විනෝද චාරිකාව සංවිධානය කෙරිණි. ඒ අනුව ළමා නිවාස ගත දරුවන් 450 කගේ පමණ සහභාගීත්වයෙන් සංවිධානය කරන ලද අධ්‍යාපන හා විනෝද චාරිකාව සඳහා රු.මි 0.6 වැයවිය.

## 03.හැකියා ප්‍රදර්ශන වැඩසටහන

අනාථ, අත්හල, අසරණ දරුවන්, භාරය හා ආරක්ෂාව අවැසි දරුවන්, සමාජයේ විවිධ පුද්ගලයන්ගේ අකටයුතුකම් හා අසාධාරනයන් හේතුවෙන් නිවාස ගත වීම සහ නීතියේ රැහැනට හසු වූ දරුවන් ලෙසින් සමාජයේ විවිධ දරුවන්ට ආයතනගත රැකවරනයට යොමු වීමට සිදුවේ. දෙමාපිය රැකවරණය අහිමි වූ විට දරුවන් තුල ඇති වන ව්‍යාකූල මානසික මට්ටම මෙන්ම, නව යොවුන් වියේදී ඇති වන ප්‍රචණ්ඩකාරීත්වයන් හා නොමනා හැසිරීම් තත්ත්වයන් එක්තරා දුරකට සමනය කළ හැකි සාර්ථක මාර්ගයක් ලෙස කලාව හදුන්වා දිය හැකිය. එමෙන්ම කලා හැකියාවන් වර්ධනය කරගැනීම අධ්‍යාපනයයේද එක්තරා අංගයකි. ඒ සඳහා අවස්ථාව ලබාදීමෙන් එය ඇයගේ හෝ ඔහුගේ කායික හා මානසික සමතුලිතතාවය සඳහා හේතුවක් වනු ඇත.

නිවාසගත දරුවන් අධ්‍යාපන මෙන්ම විවිධ කලා කුසලතාවයන්ගෙන්ද යුක්ත දරුවන් බව විවිධ අවස්ථාවලදී තහවුරු කර ඇත. ඔවුන්ගේ හැකියාවන් සඳහා වෙදිකාවක් තනා දීම අපගේ යුතුකමකි. වර්ෂ කීපයක් අඛණ්ඩව සංවිධාන කෙරුණු නිවාස ගත දරුවන්ගේ හැකියා ප්‍රදර්ශන වැඩසටහන මෙම වසර තුලද සාර්ථක අන්දමින් පැවැත්විණි. එහිදී එම දරුවන් දැක්වූ නිර්මාණශීලී දක්ෂතාවයන් ඔවුන්ගේ ආත්ම ශක්තිය හා ආත්ම අභිමානය වර්ධනය සඳහා හේතුවක් වූ බව කිව යුතුය. දරුවන් 450 ක පමණ සහභාගීත්වයෙන් පැවැත් වූ මෙම වැඩසටහන් සඳහා රු.මි 0.29 වැය විය.





## 04. නිවාස ගත දරුවන් විවාහය තුලින් සමාජ ගත කිරීම

විවිධ ගැටළුවලට මැදි වූ දරුවන්, වින්දිත දරුවන්, භාරය හා ආරක්ෂාව අවැසි දරුවන් වශයෙන් ආයතනගත රැකවරණය සඳහා යොමුවන දරුවන් නැවත හැකි ඉක්මනින් සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ සමාජගත කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය අතර වේ.

එසේ සිදු කළ හැකිවනුයේ අදාළ දරුවා බාරගෙන ඔහුගේ, ඇයගේ ආරක්ෂාව රැකවරණය සැලසිය හැකි ඔහුට ඇයට ආදරය, කරුණාව, සෙනෙහස දක්වා රැකබලාගත හැකි හා ඔහුට ඇයට අධ්‍යාපනය පෝෂණය ලබාදෙමින් අනාගත සුභසිද්ධිය සැලසිය හැකි බවට අපහට සෑහීමකට පත්විය හැකි වැඩිහිටියෙක් දරුවා බාර ගැනීමට ඉදිරිපත් වන්නේ නම් පමණි. නමුත් ආයතනගත වන ළමුන් අතර ඇතමුන් හට මෙවැනි වූ පරිසරයක් සහිත වැඩිහිටියෙක් සොයාගත නොහැකි වන අවස්ථාද පවතී. එවැනි අවස්ථාවලදී දරුවන් සංවර්ධන මධ්‍යස්ථානතුලම වැඩිහිටි දරුවන් බවට පත්වේ.

එවැනි විටකදී වයස අවුරුදු 18 ඉක්මවන ගැහැණු දරුවන් සමාජ ගත කිරීමේ සාර්ථක ක්‍රම වේදයක් ලෙස හඳුනාගෙන ඇත්තේ සුදුසු සහකරුවකු සොයා විවාහ කර දීමේ ක්‍රමවේදයයි. මෙම කාර්යයේදී දෙපාර්තමේන්තුව දෙමාපිය පාර්ෂවය නියෝජනය කරමින් ඒ හා වන සියලු කාර්ය ඉටුකිරීමට කටයුතු කරයි. 2020 වර්ෂයේ මඩාටුගම සහතික කළ පාසලේ වෘත්තීය පුහුණුව ලැබූ දැරියක් විවාහය තුලින් සමාජ ගත කිරීමට කටයුතු කරන ලදි. එම කාර්යය සඳහා රු.මි 0.212 වැය විය.

## 05.අධ්‍යාපන හා වෘත්තීය කුසලතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

නිවාස ගත වන දරුවන් සඳහා අධ්‍යාපන අයිතිය ලබා දීමට අවශ්‍යය පහසුකම් සැපයීම දෙපාර්තමේන්තුව සතු ප්‍රමුඛ කාර්යයකි. පවතින තරඟකාරී අධ්‍යාපන ක්‍රමය තුල පාසල් කාලයේදී විෂයන් සඳහා දරුවා ලබන දැනුමට අමතරව උපකාරක පංති පැවැත්වීම මඟින් තවදුරටත් විෂයානු බද්ධ දැනුම වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍යය පහසුකම් සපයනු ලැබේ. ඒ සඳහා තෝරාගත් සුදුසුකම්ලත් පාසල් ගුරුවරු යොදවන ලදි. පාසල් අධ්‍යාපනය අවසන් කල දරුවන් සඳහා අංශ කීපයක් යටතේ වෘත්තීය අධ්‍යාපනය ලබාදීමට කටයුතු කරනු ලැබේ. මැහුම් පාඨමාලා, පරිගනක පාඨමාලා, පේෂකර්ම පාඨමාලා,රූප ලාවන්‍ය පාඨමාලා ක්‍රියාත්මක කිරීම තුලින් දරුවන්ට සුදුසු වෘත්තීය පුහුණුවක් ලබාදීම, ඔවුන් පසු කලෙක සමාජ ගත වූ පසු එම අධ්‍යාපනය අදායම් මාර්ගයක් සකස් කරගැනීම සඳහා පිටිවහලක් වනු ඇත. 2020 වර්ෂයේ අධ්‍යාපන කුසලතා සඳහා රු.මි 0.89 වැය වූ අතර වෘත්තීය පුහුණුව සඳහා වැය වූ මුදල රු.මි 1.2 කි.

## 06. හොඳම ළමා රැකවරණ මධ්‍යස්ථානය තේරීම

ආයතනයේ ඉඩකඩ කළමනාකරණය, ආයතනයේ පිරිසිදු බව, ආයතනයේ ක්‍රමවත්භාවය, ලේඛණ විධිමත්ව පවත්වාගෙන යාම, දරුවන්ගේ අධ්‍යාපන ප්‍රගතිය හා බාහිර ක්‍රියාකාරකම් සම්බන්ධ නිපුණතාවය යන නිර්ණායකයන් පාදක කරගනිමින් හොඳම ළමා රැකවරණ මධ්‍යස්ථානය තේරීම සඳහා 2020 වර්ෂයේදී කටයුතු කරන ලදි. තමා හැදී වැඩෙන ළමා සංවර්ධන මධ්‍යස්ථානය හා එහි තමාගේ ක්‍රියාකාරකම් කෙසේ විය යුතුද හා ආයතනික මට්ටමින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කර ගැනීම කෙරෙහි යම් නැඹුරුවක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරවීම මෙහි මූලික අරමුණ විය. ඒ සඳහා රු.මි 0.045 වැය විය.

## 07. ළමා රක්ෂක අරමුදල ක්‍රියාත්මක කිරීම

කායික මානසික හා සදාචාරාත්මක වර්ධනයට අවශ්‍යය මූලික පහසුකම් නොමැති උතුරු මැද පළාතේ ළමුන්ගේ ආරක්ෂාව සහ සුභ සාධනය සඳහා යම් මුදලක් ලබාදීම සහ වෙනත් අයුරින් ආධාර කිරීම සඳහා 1995 දී පිහිටු වන ලද ළමා රක්ෂකසේවා අරමුදල මඟින් පළාතේ පිහිටුවා ඇති පරිවාස කාර්යාල මඟින් හඳුනාගනු ලැබූ අඩු ආදායම්ලාභී දරුවන් සඳහා ශිෂ්‍යාධාර, නිවාස ආධාර, පාසල් ගමන් පහසුව සඳහා පා පැදි අධ්‍යාපන ආධාර සැපයීම සිදු කරනු ලබයි. ඒ සඳහා 2020 වර්ෂයේ මුලු වැය රු.මි 1.34 කි.

## 08. පළාතේ අඩු ආදායම් ලාභී දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම.

පළාතේ පිහිටුවා ඇති පරිවාස කාර්යාල මගින් හඳුනාගත් අඩු ආදායම්ලාභී දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම සෑම වසරකම පාහේ අඛණ්ඩව සිදුකරයි. පරිවාස නිලධාරීන් විසින් සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂාවන්හිදී හඳුනාගත් දරුවන් 650 ක පමණ පිරිසකට මෙලෙස අධ්‍යාපන ආධාර ලබාදීම සිදු කරනු ලබයි. 2020 වර්ෂයේදී ඒ සඳහා මුලු වැය 1.48 කි.

## 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන කාලසීමාව (දින/ මාස/ අවු) | නිමවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|
| 01.අන්තර් ජාල පුහුණු කළමණාකරණ පද්ධතිය | 01 | දින 01 | අන්තර්ජාලය මගින් පුහුණු කළමනාකරණ පද්ධතිය හා සම්බන්ධ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා ඉල්ලුම් කිරීම. |

| | | | |
|---|---|---|---|
| 02.වාහන ලිපිගොනු නඩත්තුව | 02 | දින 02 | වාහන විෂයට අදාල ගොණුවක් ක්‍රමවත් පරිදි පවත්වාගෙන යාම පිළිබඳවදැනුම ලබා ගැනීම. |
| 03.වැටුප් පරිවර්ථන පුහුණු වැඩ සටහන | 02 | දින 02 | නියමිත චක්‍ර ලේඛණවලට අනුව වැටුප් පරිවර්ථන සිදු කිරීම. |
| 04.ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව පුහුණු වැඩසටහන | 01 | දින 01 | ක්ෂේත්‍රයට අදාලව සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක කළහැකි ව්‍යාපෘති හදුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවශ්‍ය පුහුණුව ලබාගැනීම. |
| 05.සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳව පුහුණු වැඩසටහන | 01 | දින 02 | කාර්යාලයක ක්‍රියා කළ යුතු විනය පද්ධිතිය පිළිබඳව හා සාමාන්‍ය පුද්ගල හැසිරීම පිළිබඳව අවබෝධයක් ලබාගැනීම. |
| 06. විගණන විමසුම් පුහුණු වැඩසටහන | 01 | දින 02 | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම පිළිබඳව අවශ්‍යය පුහුණුව ලබාගැනීම. |
| 07.අත්තිකාරම් B ගිණුම පිළිබඳව පුහුණු වැඩසටහන | 02 | දින 01 | පාලන ගිණුම්, ණයගැති/ණයහිමිලේඛණ නිවැරදිව නඩත්තු කිරීමේ නිවැරදි ක්‍රමවේදය හඳුනාගැනීම. |
| 08.කාර්යමණ්ඩල තොරතුරු කළමනාකරණ පද්ධතිය | 01 | දින 01 | කාර්යාල කාර්ය මණ්ඩලය පිළිබඳව තොරතුරු යාවත් කාලීන කිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම. |
| 09.භාෂා ප්‍රවීනතා පුහුණුව (දෙමළ) | 01 | දින 12 | දෙමළ භාෂාව භාවිතය පිළිබඳව මූලික දැනුම ලබාගැනිම. |
| 10 තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ පුහුණුව | 01 | දින 01 | නිවැරදි ලෙස තොරතුරු නිකුත් කිරිම සඳහා අවශ්‍ය දැනුම ලබාගැනීම. |
| 11. නව සිගාස් පුහුණු වැඩ මුළුව | 05 | දින 03 | මුදල් පොත පරිසනක වැඩසටහන හරහා ක්‍රියාත්මක කිරීම ගිණුම් සාරාංශ බැංකු සැසඳුම් සකස් කිරීම පිළිබඳව නිවැරදි ක්‍රමවේද හඳුනාගැනීම. |
| 12.ඉඩම් කළමණාකරන පරිගණක පුහුණු වැඩ සටහන | 01 | දින 02 | පළාත් සභාව සතු ඉඩම් පිළිබඳව වන පරිගණක කළමනාකරණ පද්ධතිය යාවත් කාලීන කිරීම පිළිබඳව තොරතුරු ඇතුලත් කිරීම. |

දෙපාර්තමේන්තුව ඇතුලු පරිවාස කාර්යාල පද්ධතිය හා ළමා නිවාස පද්ධතිය අතර නිසි කළමනාකරණයක් මගින් සාර්ථක සේවයක් පළාත තුලට සැපයීමට නම් මෙම දෙපිරිස අතර නිසි සම්බන්ධීකරණයක් තිබිය යුතුය. එම සම්බන්ධීකරණය පවත්වාගෙන යාම සඳහා නිසි ක්‍රමවේදයක් ඇත. එම ක්‍රමවේදය සඳහා අවශ්‍ය දැනුම ලැබෙනුයේ නිවැරදි පුහුණුව මඟිනි.

දෙපාර්තමේන්තු නිළධාරීන්ට ළමා සංවර්ධනය මධ්‍යස්ථාන කළමනාකාරණ කටයුතු පිළිබඳව පුහුණුවක් තිබීම අවශ්‍ය වනවා සේම, ළමා සංවර්ධන මධ්‍යස්ථාන නිළධාරීන්ටද ආයතන කටයුතු පිළිබඳව නිවැරදි පුහුණුවක් තිබිය යුතුය. එම අංශයන් කෙරෙහි අවධානය යොමුකරමින් ඉදිරියේදී මෙම දෙපිරිස අතර නිවැරදි සම්බන්ධීකරණයක් ඇතිවන පරිදි නිළධාරීන් පුහුණු කිරීම තුලින් කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට පියවර ගත යුතුව ඇත.

එසේම ළමා සංවර්ධන මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයට දරුවන්ගේ පාසල් අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය, කායික හා මානසික සෞඛ්‍ය වැනි වැදගත් අංශ පිළිබඳව අවශ්‍ය දැනුම ලබාදීමට අවශ්‍ය පුහුණු ලබාදීම කෙරෙහි යොමුවීම වැදගත් වේ.

එසේම සියලු කාර්ය මණ්ඩලය වැඩිදුර අධ්‍යාපනය සඳහා පුහුණු පාඨමාලා සඳහා යොමුකිරීම මගින් දැනුවත් කාර්ය මණ්ඩලයක් බිහිකිරගැනීම ආයතනයේ ඵලදායිතාවය වැඩි කිරීමට හේතුවක් වේ.

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණ | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| | **2021** | **2022** | |
| 01.වාර්තා වන ළමා අපයෝජන සිදුවීම් අවම කිරීම | 20% | 20% | පළාත තුල සියලු දරුවන් කායිකව මෙන්ම මානසිකව නිරෝගී දරුවන් බවට පත්කිරීම |
| 02.දරුවන් නිවාස ගත වීම අවම කිරීම | 20% | 20% | |
| 03.පළාතේ දරුවන්ගේ මන්ද පෝෂණය අවම කිරීම | 20% | 20% | |
| 04.පළාතේ දරුවන් අතරින් වාර්තා වන මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම | 20% | 20% | |
| 05.ආයතන ගත දරුවන් නිවාස ගත කිරීමේ ප්‍රතිශතය | 20% | 20% | |
| 06.වාර්තාවන අඩු වයස් විවාහ හා ගැබ් ගැනීම් අවමකිරීම | 50% | 50% | |
| 07.පළාත තුල මව්වරු විදෙස් ගත වීම වැලැක්වීම | 20% | 20% | |
| 08.පළාත තුල මව්වරු විදෙස් ගත වීම වැලැක්වීම | 20% | 20% | |
| 09. පළාත තුල නියමිත ප්‍රමිතියෙන් යුක්ත ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම. | 2 | 2 | |
| 10.පරිවාස භාරයට පත්වන ළමා හා වැඩිහිටියන් අතරින් සාර්ථක ලෙස පුනුරුත්ථාපනය වූ ප්‍රමාණය | 50% | 50% | සුරක්ෂිත සමාජයක් බිහිකිරීම |
| 11.දරුවන් රැඳවුම් නිවාසවලට යොමු වීම අවම කිරීම | 20% | 20% | |
| 12. පවුල් ආරවුල් විසඳීම තුලින් පවුල් ඒකකය ශක්තිමත් කිරීම | 50% | 50% | |
| 13. සුරක්ෂිත නිවාස හිමි දරුවන් සංඛ්‍යාව (නිවාස අනාරක්ෂිත දරුවන් අතරින් ලබාදුන් ප්‍රතිශතය) | 20% | 20% | |
| 14.දරුවන් අතර සිදුවන තාක්ෂණ අවභාවිතය නිසා වාර්තාවන සිදුවීම් අවම කිරීම | 30% | 30% | |

ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය ඉතිරි කොටස.......

| අරමුණ | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| | 2021 | 2022 | |
| 15.දරුවන් පාසල් හැරයාමේ ප්‍රතිශතය අවම කිරීම | 50% | 50% | පළාතේ දරුවන් අධ්‍යාපනයෙන් පරිපූර්ණ දරුවන් බවට පත්කිරීම |
| 16.නිවාස ගත දරුවන්ගේ අධ්‍යාපන ප්‍රගතිය වැඩිදියුණු කිරීම | 20% | 20% | |
| 17.ආදායම් මාර්ග ශක්තිමත් කරන ලද දරුවන් සිටින පවුල් සංඛ්‍යාව | 20% | 20% | දරුවන් සිටින අඩුආදායම් ලාභී පවුල්වල ආර්ථික මට්ටම ශක්තිමත් කිරීම |
| 18.කුලවද්දාදීම් ප්‍රමාණය (ඒ සඳහා සුදුසු දරුවන්අ තරින්) | 20% | 20% | දරුවන් සඳහා සුරක්ෂිත පවුල් පරිසරයක් උරුම කර දීම |
| 19. කැපකරු මාපිය ක්‍රමය හදුන්වා දුන් පළාතේ දරුවන් | 30% | 30% | අඩු ආදායම්ලාභී දරුවන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම |
| 20.නිවාස ගත දරුවන් වෘත්තීය සුදුසුකම් තුලින් රැකියාකට යොමු කිරීම | 20 | 20 | නිවාස ගත දරුවන් සමාජ ගත වූ පසු ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම |

## ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | අබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1 | 1 | - |
| ද්විතියික | 34 | 33 | 1 |
| තෘතියික | 76 | 36 | 40 |
| ප්‍රාථමික | 75 | 43 | 32 |

දෙපාර්තමේන්තුවක් ලෙස අප අරමුණු කරා යාමේදී හදුනාගත් විශාල අභියෝගයක් ලෙස කාර්ය මණ්ඩල හිඟතාවය හදුන්වා දිය හැකිය. අනුමත සේවක සංඛ්‍යාව හා ගලපා බලන විට තෘතික හා ප්‍රාථමික යන අංශවල පවතින දැඩි කාර්ය මණ්ඩල හිඟතාවය දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය කෙරෙහි විශාල ලෙස බලපෑම් ඇති කොට ඇත. තෘතික කාර්ය මණ්ඩලය කෙසේ හෝ කළමනාකරණය කරගනිමින් ආයතන කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කලද, දැනට පවතින ප්‍රාථමික කාර්ය මණ්ඩලය කළමණාකරණය කර ගැනීමට නොහැකි වීම තුල විශාල අර්බුදයන්ට මුහුණ දීමට සිදුව ඇත.එයට හේතුව වන්නේ සීමිත තෘතීක කාර්ය මණ්ඩලයක් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල කාර්යන් ඉටු කිරීමයි. සේවක සංඛ්‍යාවේ පවතින හිඟතාවය හේතු කොටගෙන දරුවන් වෙනුවෙන් ඉටු කිරීමට ඇති එදිනෙදා කටයුතු (අධිකරණයට රැගෙන යාම, රෝහලට රැගෙනයාම, පාසලට රැගෙන යාම ආදී කටයුතු වලදී) ප්‍රමාණය වැඩි වීම මත නිළධාරියාට අදාල සේවා චක්‍රයට වඩා වැඩි පැය ගණනක් දරුවන් සඳහා යෙදවීම මත ඇති වන මානසික පීඩනය දරුවන්ගේ කටයුතු නිසි අයුරින් ඉටුකිරීමට බාදාවක් වී ඇත. එසේම දරුවන් විශාල ප්‍රමාණයකගේ එදිනෙදා කටයුතු සීමිත

පිරිසක් මගින් සිදු කිරීමේදී එක් එක් දරුවා කෙරෙහි දිය යුතු අවධානය ප්‍රමාණවත් නොවීම තුල දරුවාගේ අධ්‍යාපන, සෞඛ්‍ය වැනි වැදගත් දේ පිළිබඳව වැඩි වශයෙන් අවධානය යොමු කිරීමට නොහැකි වී ඇත. දරුවාගේ ආරක්ෂාව හා රැකවරණය පිළිබඳව කාරණා වලදී ද එය එසේමය.

එසේම අදාල කාර්යයන් සඳහා සුදුසුකම්ලත් සේවයකයන් නොමැතිවීම මත, අවශ්‍යතාවය මත, නියමිත තනතුරේ සේවකයන් වෙනුවට වෙනත් තනතුරක සේවකයන් වෙනත් කාර්යන් ඉටු කිරීම සඳහා යෙදවීමෙදී හා වෙනත් භාහිර පුද්ගලයන් සම්බන්ධ කරගැනීමේදී, දරුවන් සඳහා නිසි සේවාවක් සැපයීමට නොහැකි වීම හා නිසි වගකීමක් නොමැතිවීම මත ඇතිවන ගැටළුද වේ. එවැනි කටයුතු දරුවන්ගේ ආරක්ෂාවටද යම් අවස්ථාවලදී තර්ජනයක් බවට පත්ව ඇත.

එසේම තම විෂයට අදාල දැනුම වර්ධනය කරගැනීම සඳහා පුහුණු අවස්ථා සඳහා යොමුවීමට හා වැඩිදුර අධ්‍යාපනයට යොමුවීමට කාර්ය මණ්ඩල හිඟකම හේතු කොටගෙන කාලය නොලැබීමද ඔවුන්ගෙන් ඵලදායී සේවාවක් ලබාගැනීම සඳහා බාධාවක් වී ඇත.

දරුවන් වෙනුවෙන් ඉටුකරන කාර්යයන් වලදී නිසි සුදුසුකම් ලත්, ප්‍රමාණවත් පිරිසක් යෙදවීම, දරුවන් වෙනුවෙන් ඉටුකරන කාර්යන් සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වන බැවින්, ඉදිරි වර්ෂවලදී ඒ සඳහා අවධානය යොමුකරමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඇත.

බඳවා ගැනීමේ කටයුතු සඳහා අදාල අංශ මේ වන විට දැනුවත් කර ඇත. කෙසේ වුවද එම කටයුත්ත කාර්යක්ෂමතාවයකින් සිදුවීම, දෙපාර්තමේන්තුවට අදාල අරමුණු අභිමතාර්ථ ඉටුකරගැනීමට විශාල පිටිවහලක් වනු ඇත.

## සමස්ත කාර්ය සාධනය පිළිබඳ අදහස

දරුවාගේ රැකවරණය සිය පවුලේ ප්‍රධානම මගකීම බවට පත්ව තිබූ අතීත සමාජයේ සිට වර්තමාන සමාජය දක්වා අප පැමිණෙන විටදී, එම වගකීම අද වන විට රාජ්‍යය ආයතන හා රාජ්‍ය නොවන ආයතන රැසකට බෙදී ගොස් ඇත.

නීති ගරුක ප්‍රජාවක් සුරක්ෂිත ළමා පරපුරක් දැක්ම කොටගනිමින් ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව 2020 වර්ෂය තුල තම සියලු අරමුණු හා අභිමතාර්ථ ඉටුකරගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පුනරාවර්ථන වියදම් මත යැපීමට සිදුවීම මුහුණ දුන් විශාලම අභියෝගය විය.

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුකොටගෙන රට තුල උත්ගත වූ ආර්ථික හා සමාජීය තත්ත්වය හේතුවෙන් පළාත් සභා තුලට ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත වෙන් කෙරුණු මූලධන ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන්, ආයතනගත දරුවන් වෙනුවෙන් මෙන්ම ක්ෂේත්‍රය තුල දරුවන් සඳහා ද සැළසුම් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම ගැටළුවක් වුවත් දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙන්වූ පුනරාවර්ථන වියදම් හැකි පමණ කළමනාකරණය කරමින් දරුවන්ගේ සුභ සිද්ධිය සඳහා වන අත්‍යවශ්‍ය වැඩසටහන් කීපයක් සිදු කරන

ලදි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත රු.මි 113.95 ලබාදුන් අතර, උපයෝජනය රු.මි 110.74 විය. ඉතිරිය රු.මි 3.20 ඒ අනුව සමස්ථ උපයෝජනය 97.71% කි.

සමාජ සංකීර්ණතාවය හේතුකොටගෙන, පවුල තුල ඇතිවන යම් යම් ගැටළුකාරී තත්ත්වයන් හේතුකොටගෙන, දරුවන් නිවාස ගත කිරීමට සිදුවීම මත ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට යොමුවන දරුවන් වැඩිවීම මත එම ආයතන දරුවන් සඳහා ආකර්ෂණීය, ප්‍රිය මනාප ප්‍රසන්න ස්ථාන බවට පත්කිරීම සඳහා ප්‍රමිතගත අයුරින් එම ස්ථාන වැඩිදියුණු කිරීම කළ යුතුව ඇත.

2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද කිරිකෙටු වැව සහතික කළ පාසල සඳහා අවශ්‍ය තනතුරු බඳවාගෙන එම ආයතනය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුව ඇත.

නිවාසගත වන දරුවන් නඩු කටයුතු සඳහා පළාතෙන් පිටතට රැගෙන යාම, වෙනත් විශේෂ රැකවරණ මධ්‍යස්ථාන වලට යොමුකිරීම ආදී විවිධ අවස්ථාවලදී අවශ්‍යතාවයන් සඳහා දරුවන් නිවාසයෙන් පිටතට රැගෙන යාමේදී, නිශ්චිත පිරිසක් සම්බන්ධ කරගත් වාහන ඒකකයක් පවත්වා ගැනීම වඩා ආරක්ෂිත බැවින්, ඒ සඳහා ඉදිරියේදී අවධානය යොමුකර කටයුතු කිරීම වැදගත්වේ. එමෙන්ම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල නඩත්තු කටයුතු සඳහා නිශ්චිත නඩත්තු ඒකකයක අවශ්‍යතාවයද ඉදිරියේදී සපුරා ගත යුතුය.

තෘතීක හා ප්‍රාථමික කාර්ය මණ්ඩයේ දැඩි හිඟතාවය දරුවන්ගේ කටයුතු ක්‍රමවත් පරිදි ඉටු කිරීමට බාදාවක් වන බැවින්, ඉදිරියේදී ඒ පිළිබඳව තවදුරටත් අවධානය යොමුකර එම බඳවාගැනීම් සඳහා ක්ෂණික ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

කෙසේ වුවද 2020 වර්ෂයේදී පවතින මානව හා භෞතික සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පුනරාවර්ථන ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය සඳහා කටයුතු කළ බව කිව යුතුය.

## කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේ සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණදුන් ගැටළු

2020 වර්ෂය ගෝලීය වශයෙන් මුහුණ දුන් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටතුල උද්ගත වූ ආර්ථික හා සමාජීය තත්ත්වයන් හේතුකොටගෙන පළාත් සභාව සතු කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා මූලධන ප්‍රතිපාදන නොලැබීම මත දෙපාර්තමේන්තුව මඟින් සැළසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම දෙපාර්තමේන්තුවක් ලෙස අප මුහුණ දුන් විශාල අභියෝගයකි.

එහෙත් දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පුනරාවර්ථන වියදම් නිසි ලෙස කළමානාකරණය කර ගනිමින් දෙපාර්තමේන්තු විෂය ක්ෂේත්‍රයට අදාලව දරුවන් සඳහා වන අරමුණු හා අභිමතාර්ථ හැකි පමණ ඉටු කරගැනීම කටයුතු කළ බව කිව යුතුය.

දෙපාර්තමේන්තු විෂය ක්ෂේත්‍රයට අදාල සියලුම තිරසර සංවර්ධන අරමුණු ඉටු කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2020 වර්ෂය තුල වෙන් කිරීමට නොහැකි වුවත්, දරුවන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් වන අත්‍යවශ්‍ය කරුණු කාරණා කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා වන අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කරන ලදි.

# 8.4. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ප්‍රතිපාදනයන්ට අනුව 1988.05.12 වන දින උතුරු මැද පළාත් සභාව ස්ථාපිත කිරීමෙන් අනතුරුව 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ පැවරුණු විධි විධානයන්ට යටත්ව පළාත් සභාවට පැවරුණු සමාජ සේවා විෂයට අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත. මුලිකවම සාලියපුර රජයේ වැඩිහිටි නිවාසයේ කටයුතු මෙන්ම මහජනාධාර ගෙවීමෙන් ආරම්භ වන මෙම ආයතනයේ කටයුතු වර්තමානය වනවිට ඉතා පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වී ඇත.

උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය අනුරාධපුරයේ පිහිටා ඇති අතර, ඒ යටතේ සෘජුව පාලනය වන ආයතන 03කි. එනම්, සාලියපුර ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය, බුල්නෑව සුපසන් විශ්‍රාමික වැඩිහිටි නිවාසය හා ගිරිතලේ අත්වැළ පුහුණු මධ්‍යස්ථාන යි.

එසේම ප්‍රාදේශීයව කටයුතු කිරීම සඳහා සමාජ සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ම ආවරණය වන පරිදි යොදවා ඇත. තවද අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව මධ්‍යම රජයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, ආබාධ සහිත තැනැත්තන්ගේ මහ ලේකම් කාර්යාලය, සමාජ සේවා අමාත්‍යාංශය යන ආයතන සමඟ සමීපව කටයුතු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවට අයත් නමුත් රාජ්‍ය නොවන ආයතන මඟින් පවත්වාගෙන යන ආයතන පවතින අතර, එම ආයතන සඳහා යථායෝග්‍යාධාර හා වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර ලබාදීම සහ අධීක්ෂණය දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ. සාලියපුර සතුටු ළමා නිවාසය, නොච්චියාගම බුද්ධි ඌණතා සහිත ළමුන්ගේ විශේෂ පුහුණු පාසල, ඇලගමුව ආබාධ සහිත ළමුන් සඳහා වෘත්තීය පුහුණු ආයතනය, සේවාගම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ වෘත්තීය පුහුණු ආයතනය, තලාව අක්ශි ආබාධ සහිත කාන්තාවන්ගේ ආයතනය, ඔළුකරද විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ රැකවරණ මධ්‍යස්ථානය ඒ අතර වේ.

තවද රාජ්‍ය නොවන ආයතන හෝ පාලක මණ්ඩලයකින් පාලනය වන පහත ආයතනද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් කරන අතර, යථායෝග්‍යාධාරද ගෙවනු ලැබේ.

I. හිඟුරක්ගොඩ මිණිහිරි කාන්තා සුරැකුම් මධ්‍යස්ථානය.
II. අනුරාධපුර රියෙන්සි අලගියවන්න අඳ බිහිරි විදුහල.
III. පොළොන්නරුව පැරකුම් වැඩිහිටි නිවාසය.

## දෙපාර්තමේන්තුව සතු ආයතන

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | උ.මැ.ප |
|---|---|---|---|
| වැඩිහිටි නිවාස | 01 | 01 | 02 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ පුහුණු පාසැල් | 03 | 01 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථාන | 01 | - | 01 |
| සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන | - | 01 | 01 |

## නේවාසික පහසුකම් ලබාදිය හැකි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

| ආයතනය | නේවාසික පහසුකම් දිය හැකි සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| වැඩිහිටි නිවාස | | ගැහැණු | පිරිමි | එකතුව |
| ශාන්ති සෙවණ වැඩිහිටි නිවාසය - සාලියපුර | 302 | 151 | 151 | 302 |
| සැදෑ සෙවණ විශ්‍රාමික වැඩිහිටි නිවාසය - බුල්නෑව | 05 | 02 | 12 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ පුහුණු පාසැල් | | | | |
| සතුට ළමා නිවාසය - සාලියපුර | 30 | 28 | - | 28 |
| ඇලගමුව වෘත්තීය පුහුණු ආයතනය | 30 | 11 | 11 | 22 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - සේවාගම | 50 | - | 38 | 38 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - නොච්චියාගම | 25 | - | 13 | 13 |
| **අනෙකුත් ආයතන** | | | | |
| ඔළුකරද රැකවරණ මධ්‍යස්ථානය | - | - | - | - |
| අත්වැල සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | 12 | - | - | - |

## ආධාර ගෙවීම් පිළිබඳ විස්තර

| විස්තරය | අනුරාධපුර | | පොළොන්නරුව | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** |
| මහජන ආධාරලාභීන් | 23,750 | 23,338 | 4,876 | 28,626 | 28,626 | 27,958 |
| විශේෂ මහජනාධාර | 2,767 | 3,116 | 335 | 3,059 | 3,059 | 3,451 |
| රෝගාධාර | 1,688 | 419 | 113 | 2,306 | 2,306 | 532 |
| නිවුන්දරු ආධාර | 151 | 332 | 60 | 218 | 218 | 392 |
| විවිධ රෝග ආධාර | 3,322 | 2,949 | 168 | 3,520 | 3,520 | 3,117 |
| පූර්ණ ආබාධ ආධාර | 630 | 743 | 162 | 770 | 770 | 905 |
| පාසැල් ශිෂ්‍යාධාර | 3,507 | 4,286 | 1,172 | 4,598 | 4,598 | 5,458 |
| **එකතුව** | **35,815** | **35,183** | **6,630** | **43,086** | **43,086** | **41,813** |

## වැඩිහිටි ජනගහනය

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය | - | 2,650,000 |
| උතුරුමැද පළාතේ වැඩිහිටි ජනගහනය | - | 124,685 (4.7%) |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | - | 82,889 (3.13%) |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | - | 41,796 (1.58%) |

## දැක්ම

"සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක්"

## මෙහෙවර

"පළාතේ ජීවත්වන දිළිඳු, ආබාධ සහිත, වැන්දඹුභාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම්, අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින් ,ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජයේ පිළිගත් පිරිසක් බවට පත් කිරීම."

## දිගුකාලීන අරමුණු

- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් හෝ පවුල් ඒකක සඳහා සාමාජයීය වටිනාකමක් ගොඩනැගීම.
- රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සුරක්ෂිත කිරීම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ සමාජ සුභසාධනය ඉහළ මට්ටමක් දක්වා ළඟාකර ගැනීම.
- අයහපත් චර්යාවන්ගෙන් යුත් තරුණයින් යහපත් පුරවැසියන් බවට පත්කර රටේ සංවර්ධනයට දායකවන තරුණ ප්‍රජාවක් බිහි කරලීම.
- ප්‍රජාව ආපදා තත්වයෙන් සුරක්ෂිත කර ගැනීම.
- ප්‍රශස්ත මහජන සේවයක් ලබාදෙන රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

## කෙටි කාලීන අරමුණු

- අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය වීම.
- අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකවල ජීවනෝපාය සංවර්ධනය දිරිමත් කිරීම.
- රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සැලසීම.
- වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ඉහළ නැංවීම පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහි කිරීම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා සංවිධාන ව්‍යුහය ශක්තිමත්ව පවත්වා ගෙන යාම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ දැනුම,කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම හා ඇගයීම.
- සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නිරත හා දුරාචාරයන්වලට ඇබ්බැහි වූවන් එම චර්යාවන්ගෙන් වළක්වා ගැනීම සහ ඒ සඳහා යොමුවීම වැළක්වීම.
- ආපදා තත්වයන්ට පෙර සූදානම හා හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහිකිරීම.
- නවීන තාක්ෂණය හා පිළිගත් ක්‍රමවේද අනුගමනය කර දෙපාර්තමෙන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය ඉහළ නැංවීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ආකල්ප හා ධාරිතාවය සංවර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- අඩු ආදායම්ලාභීන් සඳහා ක්ෂේත්‍ර රාශියක් යටතේ මූල්‍යාධාර ලබා දීම.
- අඩු ආදායම්ලාභීන් සඳහා උපකරණ ආධාර ලබා දීම.
- හඳුනාගත් විශේෂ අවස්ථාවලදී අවශ්‍ය මූල්‍යාධාර හා උපකරණ ලබා දීම.
- වැඩිහිටි නිවාස පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන හා රැකවරණ ආයතන පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- පළාතේ මහජනතාවට සහනයක් ලබාදිය හැකි වෙනත් ආයතන පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත, ගෘහමූලික කාන්තා හා අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමේ හා ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා නව සංවිධාන ආරම්භ කිරීම, රැස්වීම් කැඳවීම හා යටිතල පහසුකම් සැපයීම.
- මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
- වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත පුද්ගලයන් හා ගෘහමූලික කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සුභසාධනය ඉහළ නැංවීමට ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ ආයතනික පරිපාලනය හා කළමණාකරණය.

## ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත සියළුම ග්‍රාම නිලධාරි තුලාන්වල ජීවත්වන අඩු ආදායම්ලාභී, අන්ත අසරණ බවට පත්ව සිටින රෝගී පුද්ගලයින් සහ එම පවුල්, ආර්ථික හා වෙනත් හේතූන් මත විවිධ තර්ජනයන්ට, මානසික, කායික රැකවරණය අහිමිව සිටින වැඩිහිටි තැනැත්තන් පිළිබඳව, ආබාධ සහිත තත්ත්වය මත සාමාජයීය වරප්‍රසාද අහිමි වී සිටින පුද්ගලයින් පිළිබඳව දත්ත රැස් කරමින් එම පුද්ගල අවශ්‍යතාවයන් ඉටුකරලීම සඳහා සෘජු මැදිහත්වීම, අවශ්‍ය පරිදි මාසික සහනයන් සැලසීම සිදුකෙරේ.

- රැකවරණය අහිමිව විවිධ ස්ථානයන්වල අනාරක්ෂිතව සිටින සහ නිවෙස් තුළ අසරණව අනාරක්ෂිතව සිටින වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා රැකවරණය සපයමින් නිවාසගත කිරීමට හෝ පවුල තුළ මානසික, කායික ආරක්ෂාව සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාදීමට මැදිහත් වීම.
- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා අවශ්‍ය කරන ආධාරක, උපකරණ ලබා දීම.
- එම පුද්ගලයින්ගේ සහ එම පවුල්වල ආර්ථික ගැටළු අවම කරමින් ජීවන උත්පාදනයන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අවශ්‍ය පුහුණු සමඟ ස්වයං රැකියා අවස්ථා වෙත යොමු කරමින් එමගින් ආර්ථික වාසි ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කිරීම.

- ස්වාමියා අහිමිවීම නිසා වැන්දඹුභාවයට හා අසරණභාවයට පත්වෙමින් තම දූ දරුවන් සමග ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව වෙහෙසෙමින් ඔවුන්ගේ අධ්‍යාපනයන් සඳහා වෙහෙස වෙමින්, තම ආර්ථිකය ද ශක්තිමත් කරගැනීමට වෙර වීරිය දරන කාන්තාවන්ගේ අනාරක්ෂිත නිවාස සහ ආබාධිත, වැඩිහිටි තැනැත්තන්ගේ අනාරක්ෂිත නිවාස සකස් කරගැනීමට සුවසේ ජීවත්වීම සඳහා නිවාස ආධාර ලබාදීම.
- රෝගී පවුල්, වැන්දඹු සහ ආබාධ සහිත තත්ත්වයට පත්ව සිටින පවුල්වල මහත් දුෂ්කරතාවයෙන් යුතුව අධ්‍යාපනය ලබා දීමට වෙහෙසෙන මෙන්ම මහත් උනන්දුවෙන් අධ්‍යාපනය ලැබීමට වෙහෙසෙන දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මාසිකව ශිෂ්‍යාධාර ලබාදෙමින් රටට ඵලදායී දරු පිරිසක් නිර්මාණය කිරීමට මැදිහත්වීම.
- විවිධ ඇබ්බැහිවීම් සහ සමාජ විරෝධී පුද්ගලයින් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගනිමින් ඔවුන් සඳහා කඳවුරුගත නේවාසික වැඩසටහන් පවත්වා පසුවිපරම් කරමින් ඔවුන් යහමාර්ගයට ගැනීම.
- පළාතේ ජීවත්වන මහජනතාව ප්‍රමුඛම සම්පත වශයෙන් සළකමින් පළාත සංවර්ධනය සඳහා කෙමෙන් ගමන් කිරීමේදී ඔවුන්ගේ දැනුම, කුසළතා හා ආකල්ප වැඩිදියුණු කිරිම අවශ්‍යම කරුණක් වශයෙන් සළකා විවිධ ක්ෂේත්‍රගත වැඩසටහන් පැවැත්වීමද තවත් එක් උපාය මාර්ගයකි.
- මහජන සේවාවන් සැපයීමේදී තවදුරටත් කාර්යක්ෂම රාජ්‍ය ආයතනයක් බවට දෙපාර්තමේන්තුව පත්කිරිමද උපාය මාර්ගයකි.

**අංශය සෘජුව හා වක්‍රව නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්**

| අංකය | තිරසර සංවර්ධන අරමුණ | අංකය | තිරසර සංවර්ධන අරමුණ |
|---|---|---|---|
| 1 NO POVERTY | සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම (1.1,1.3,1.4,1.5,1 අ) | 2 ZERO HUNGER | සාගින්න නැති කර,ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම(2.2.) |
| 4 QUALITY EDUCATION | පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථාව සැලසීම.(4.5,4 අ) | 6 CLEAN WATER AND SANITATION | සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම(6.2) |
| 8 DECENT WORK AND ECONOMIC GROWTH | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම(8.5,8.6) | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම(9.අ) |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 173ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 118 කි. පුරප්පාඩු සංඛ්‍යාව 55 ක් වන අතර 01 ක් අයකු පුහුණුවේ.

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන්මග

I 2016 වර්ෂයේ සිට වසරක් පාසා අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වශයෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සඳහා දිරියට අත්වැලක් සමඟ සමාජ සවිබල ගැන්වීමේ තෙදිනක නේවාසික වැඩසටහන්ද පසුවිපරම් වැඩසටහන්ද එම වැඩසටහන්වලට සම්බන්ධ වූවන් ඒකරාශී කරමින් 2019 වර්ෂයේ දිස්ත්‍රික් සංවිධානද ආරම්භ කර ඇත.

| වර්ෂය | දිස්ත්‍රික් නේවාසික වැඩසටහන්වලට සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව | | පසුවිපරම් වැඩසටහන්වලට සම්බන්ධ වූ පුද්ගල සංඛ්‍යාව | | දිරියට අත්වැලක් සංචිතය සංවිධානය සඳහා සම්බන්ධ වූ පුද්ගල සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | අනුරාධපුර | පොළොන්නරුව | අනුරාධපුර | පොළොන්නරුව | අනුරාධපුර | පොළොන්නරුව |
| 2016 | 112 | - | 33 | - | - | - |
| 2017 | 107 | 71 | 50 | 44 | - | - |
| 2018 | 96 | 41 | 61 | 22 | - | - |
| 2019 | 128 | 49 | 66 | 28 | 242 | 190 |
| 2020 | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක නොකරන ලදි. | | | | | |

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව මත්ද්‍රව්‍ය උවදුරෙන් ප්‍රජාව ගලවා ගැනීම සඳහා තවදුරටත් ඉහත වැඩසටහන්වලින් යහමගට ප්‍රවේශ වී සිටින පුද්ගලයන් සඳහා ජීවනෝපාය සංවර්ධනයට ස්වයං රැකියා ආධාර ලබා දීමද එම පවුල්වල දරුවන්ට පාසල් උපකරණ ලබා දීම සිදුකර ඇත.

| වර්ෂය | ප්‍රතිලාභීන් ගණන | ලබා දී ඇති ස්වයං රැකියා ආධාර මුදල (රු.මි.) |
|---|---|---|
| 2016 | 57 | 1.14 |
| 2017 | 52 | 1.04 |
| 2018 | 48 | 0.96 |
| 2019 | - | - |
| 2020 | 29 | 0.58 |

| වර්ෂය | ක්‍රියාත්මක කළ වැඩසටහන් ගණන | සංචිතය සංවිධානයට සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පාසල් උපකරණ ලබාදුන් දරුවන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | අනුරාධපුර | පොළොන්නරුව |
| 2019 | 02 | 242 | 69 | 50 |

II සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ විශේෂ අවශ්‍යතා සහිත වූවන් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කර ඇත. විවිධ ආබාධ වලින් පෙළෙන පුද්ගලයන් සඳහා මෙම දෙපාර්තමේන්තුවෙන් 2020 වර්ෂයේ ලබා දුන් මූල්‍යාධාර පිළිබඳ තොරතුරු මාසික මූල්‍යාධාර ගෙවීම් යටතේ මෙම වාර්තාව දක්වා ඇති අතර ඔවුන්ට සහන සැලසීම සඳහා ලබා දුන් උපකරණ ආධාර පිළිබඳ තොරතුරු උපකරණ ආධාර ලබා දීම යටතේ දක්වා ඇත. එමෙන්ම විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා පිහිටුවා ඇති ආයතන වෙත කාර්තු වශයෙන් ලබා දෙන යථායෝග්‍යාධාර පිළිබඳව තොරතුරු “වැඩිහිටි නිවාස ,විශේෂ අවස්ථා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන හා රැකවරණ ආයතන පවත්වා ගැනීම හා අධීක්ෂණය“ යටතේ දක්වා

ඇත.තවද මෙම ආයතනවල නේවාසිකයන් සඳහා සිංහල හා හින්දු අලුත් අවුරුද්දට ඇඳුම් මිල දී ගෙන ලබා දීම සඳහා රු. 95,000/- ක පමණ මුදලක් 2020 වර්ෂයේ වැය කර ඇත.

III ගෞරවාන්විත ජ්‍යෝෂ්ඨ පුරවැසි සමාජයක් බිහි කිරීම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ සුවිශේෂී අවධානයක් යොමු කර සඳහන් කර ඇත. විශේෂයෙන් මෙම දෙපාර්තමේන්තුව සතුව සාලියපුර වැඩිහිටි නිවාසය හා බුල්නෑව විශ්‍රාමික වැඩිහිටි නිවාසය ක්‍රියාත්මක වන අතර හවුහරණක් නොමැති වැඩිහිටියන් එම නිවාස තුළ නේවාසිකව සිටියි.

| වැඩිහිටි නිවාසය | නේවාසික සංඛ්‍යාව | 2020 වර්ෂයේ නඩත්තු සඳහා දරණ ලද වියදම (රු.මි.) | |
|---|---|---|---|
| | | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| සාලියපුර වැඩිහිටි නිවාසය | 302 | 26.54 | 0.47 |
| බුල්නෑව විශ්‍රාමික වැඩිහිටි නිවාසය | 14 | 1.64 | - |

එමෙන්ම උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල ක්‍රියාත්මක වන අතර ඔවුන්ගේ සුභසාධනය තහවුරු කිරීම සඳහා 2019 හා 2020 වසර දෙකේ සිදු කරන ලද කාර්යයන්වල තොරතුරු පහතින් දැක්වේ. 2020 වසරේ කොවිඩ් වසංගත තත්ත්වය මත වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම තුළ එම කාර්යයන් බොහෝ දුරට සීමා කිරීම සිදු විය.

| වර්ෂය | වැඩිහිටි දින සැමරුම් වැඩසටහනට ලබා දෙන මුදල (රු.මි.) | වාර්ෂිකව වැඩිහිටි වන්දනා වාරිකාවලට ලබා දෙන ලද මුදල (රු.මි.) | වැඩිහිටි අවුරුදු උත්සව සඳහා ලබා දෙන මුදල (රු.මි.) | වැඩිහිටි චාරිකා සඳහා බස් රථ වෙන්කිරීම (රු.මි.) |
|---|---|---|---|---|
| **2019** | 1.02 | 2.90 | 1.23 | 0.43 |
| **2020** | 0.21 | 0.30 | - | 0.19 |

IV සමාජ ආරක්ෂණ හා සුභසාධනය පිළිබඳව සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඇතුළත් කර ඇත. අඩු ආදායම්ලාභීන්ට සෙත සැලසීම සඳහා ලබා දෙන ලද මාසික හා මාසික නොවන මූල්‍යාධාරවල තොරතුරු, ජීවත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සහිත නිවාස අලුත්වැඩියාව සඳහා ලබා දෙන නිවාසාධාරවල තොරතුරුද, අඩු ආදායම්ලාභීන් වැඩි ආදායම්ලාභීන් බවට පත් කිරීමට ජීවනෝපාය සංවර්ධනය ලබා දෙන ලද ස්වයං රැකියා ආධාර පිළිබඳ තොරතුරුද මෙම වාර්තාවට මතු ඇතුලත් කර ඇත.

## තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය (රු.මි.) | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| 01 | 1.3.1 | මාසික මූල්‍යාධාර සඳහා වියදම | 336.25 | 336.25 |
| | | මාසික නොවන මූල්‍යාධාර සඳහා වියදම | 44.30 | 44.30 |
| | | ආබාධිත උපකරණ ලබාදීම සඳහා වියදම | 10.00 | 9.88 |
| | 1.අ.2 | දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම | 480.94 | 478.70 |
| | | දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම | 0.48 | 0.47 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | 3.3.2 | ක්ෂය රෝග ආධාර සඳහා වැයකරන මුදල | 2.75 | 2.72 |
| | 3.5.2 | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා වැය කරන මුදල | 0.50 | 0.51 |
| 04 | 4.5.1 | ශිෂ්‍යාධාර සඳහා වැය කරන මුදල | 56.50 | 56.45 |
| | | සිසු දිරිය සඳහා වැය කරන මුදල | 5.50 | 5.45 |
| | | යථායෝග්‍යාධාර ගෙවීම සඳහා වැය කරන මුදල | 2.75 | 2.74 |
| | 4.අ.1 | ආබාධිත වෘත්තීය පුහුණු ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනයට සඳහා වැය කරන මුදල | 0.50 | 0.55 |
| | | ආබාධිත දරුවන් සඳහා විශේෂ උපකරණ ලබාදීමට වැය කරන මුදල | 0.50 | 0.49 |
| 08 | 8.5.1 | ස්වයං රැකියා ආධාර වශයෙන් වැය කරන මුදල | 16.00 | 16.62 |
| | 8.5.2 | ස්වයං රැකියා පුහුණු වැඩසටහන් සඳහා වැය කරන මුදල | 0.30 | 0.28 |
| 10 | 10.2.1 | මුල්‍යාධාර වශයෙන් වැයකරන මුදල | 380.00 | 380.55 |
| | | ආබාධිත උපකරණ ආධාර ලබාදීමට වැයකරන මුදල | 10.00 | 9.88 |
| | | දැනුම,කුසලතා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් සඳහා වැයකරන මුදල | 0.10 | 0.07 |
| 11 | 11.1.1 | නිවාස ආධාර සඳහා වැයකරන මුදල | 18.50 | 18.48 |
| 16 | 16.6.1 | දෙපාර්තමේන්තුවේ එදිනෙදා පුනරාවර්තන වියදම් සඳහා වැයකරන මුදල | 480.94 | 478.70 |
| | | දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් සඳහා වැයකරන මුදල | 0.48 | 0.47 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම

❖ **පුනරාවර්තන වියදම්**

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| මහජනාධාර ගෙවීම | 28438 | මහජනාධාර ලාභීන් සංඛ්‍යාව | 28438 | 28000 | 28000 | 28000 | 124.79 | 124.00 | 124.00 | 124.00 |
| විශේෂ මහජනාධාර ගෙවීම | 2792 | විශේෂ මහජනාධාර ලාභීන් සංඛ්‍යාව | 2792 | 27000 | 27000 | 27000 | 27.23 | 27.00 | 27.00 | 27.00 |
| නිවුන් දරු ආධාර ගෙවීම | 274 | නිවුන් දරු ආධාර ලබාදුන් පවුල් සංඛ්‍යාව | 274 | 275 | 275 | 275 | 6.64 | 6.75 | 6.75 | 6.75 |
| පූර්ණ ආබාධිත ආධාර ගෙවීම | 1500 | පූර්ණ ආබාධිත ආධාර ගෙවූ පුද්ගල සංඛ්‍යාව | 1500 | 1500 | 1500 | 1500 | 33.18 | 33.00 | 33.00 | 33.00 |
| ශිෂ්‍යාධාර ගෙවීම | 6319 | ශිෂ්‍යාධාර ගෙවූ ශිෂ්‍ය සංඛ්‍යාව | 6319 | 6300 | 6300 | 6300 | 56.45 | 56.00 | 56.00 | 56.00 |

කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම පුනරාවර්තන වියදම් ඉතිරි කොටස...............

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| "සිසු දිරිය" ආධාර ගෙවීම | 151 | ආධාර ගෙවූ ශිෂ්‍ය සංඛ්‍යාව | 151 | 150 | 150 | 150 | 5.45 | 5.45 | 5.45 | 5.45 |
| පිළිකා ආධාර ගෙවීම | 2885 | පිළිකා ආධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 2885 | 2900 | 2900 | 2900 | 51.93 | 55.00 | 55.00 | 55.00 |
| තැලසීමියා ආධාර | 395 | තැලසීමියා ආධාර | 395 | 395 | 395 | 395 | 14.23 | 14.50 | 14.50 | 14.50 |
| ක්ෂය රෝග ආධාර | 75 | ක්ෂය රෝග ආධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 75 | 75 | 75 | 75 | 2.72 | 2.75 | 2.75 | 2.75 |
| බරවා රෝගාධාර | 15 | බරවා රෝගාධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 15 | 15 | 15 | 15 | 0.54 | 0.55 | 0.55 | 0.55 |
| ලාදුරු රෝගාධාර | 89 | ලාදුරු රෝගාධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 89 | 90 | 90 | 90 | 3.19 | 3.20 | 3.20 | 3.20 |
| ඇටමිදුළු බද්ධ කිරීම් ආධාර | 03 | ඇටමිදුළු බද්ධ කිරීම් ආධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 03 | 03 | 03 | 03 | 1.5 | 1.5 | 1.5 | 1.5 |
| වකුගඩු බද්ධ කිරීමෙන් පසු ප්‍රතිකාර සඳහා ආධාර ලබාදීම | 09 | වකුගඩු බද්ධ කිරීමෙන් පසු ප්‍රතිකාර ලද ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 09 | 15 | 15 | 15 | 0.39 | 0.50 | 0.50 | 0.50 |
| ශල්‍ය කර්ම ආධාර | 10 | ශල්‍ය කර්ම ආධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 10 | 10 | 10 | 10 | 0.17 | 0.20 | 0.20 | 0.20 |
| සුවිශේෂී ශල්‍ය කර්ම සඳහා ආධාර | 01 | සුවිශේෂී ශල්‍ය කර්ම ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 01 | 02 | 02 | 02 | 0.5 | 1.00 | 1.00 | 1.00 |
| වකුගඩු රෝගීන් සඳහා ආහාර මුද්දර | 106 | ආහාර මුද්දර ලබාදුන් ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 106 | 100 | 100 | 100 | 1.83 | 1.75 | 1.75 | 1.75 |

කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම පුනරාවර්තන වියදම් ඉතිරි කොටස...............

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| වකුගඩු රෝගීන් සඳහා ගමන් වියදම් | 119 | ගමන් වියදම් ගෙවූ රෝගීන් සංඛ්‍යාව | 119 | 115 | 115 | 115 | 3.72 | 3.70 | 3.70 | 3.70 |
| සුවෝදය වියදම් (නඩත්තු, ආහාර) | 20 | සුවෝදය මධ්‍යස්ථාන යේ දිනකට නවාතැන් ගන්නා රෝගීන් සංඛ්‍යාව | 20 | 15 | 15 | 15 | 0.072 | 2.00 | 2.00 | 2.00 |
| නිවාස ආධාර | 739 | ආධාර ලබාදුන් නිවාස ගණන | 739 | 500 | 500 | 500 | 18.48 | 15.00 | 15.00 | 15.00 |
| විස්තීරණ ආපදා ආධාර | 07 | ආපදා ආධාර නිවාස ගණන | 07 | 10 | 10 | 10 | 0.14 | 0.30 | 0.30 | 0.30 |
| විවිධ ආධාර (වියළි සලාක) | 300 | වියළි සලාක ලබාදුන් පවුල් සංඛ්‍යාව | 300 | - | - | - | 0.60 | - | - | - |
| ස්වයං රැකියා ආධාර | 863 | ස්වයං රැකියාලාභී සංඛ්‍යාව | 863 | 750 | 750 | 750 | 16.62 | 15.00 | 15.00 | 15.00 |
| ස්වයං රැකියා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 39 | ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ගණන | 39 | 40 | 40 | 40 | 0.28 | 0.30 | 0.30 | 0.30 |
| රෝදපුටු ලබාදීම | 254 | රෝදපුටු ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 254 | 250 | 250 | 250 | 3.28 | 3.50 | 3.50 | 3.50 |
| කොමඩ් රෝද පුටු ලබාදීම | 236 | කොමඩ් රෝද පුටු ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 236 | 200 | 200 | 200 | 3.29 | 3.50 | 3.50 | 3.50 |
| ළමා රෝදපුටු ලබාදීම | 05 | ළමා රෝදපුටු ලබාදීම ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 05 | 05 | 05 | 05 | 0.07 | 0.80 | 0.80 | 0.80 |
| වතුර මෙට්ට ලබාදීම | 70 | වතුර මෙට්ට ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 70 | 70 | 70 | 70 | 0.53 | 0.60 | 0.60 | 0.60 |

කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම පුනරාවර්තන වියදම් ඉතිරි කොටස................

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| අත්වාරු ලබාදීම | 311 | අත්වාරු ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 311 | 300 | 300 | 300 | 0.53 | 0.60 | 0.60 | 0.60 |
| වෝකර් ලබාදීම | 184 | වෝකර් ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 184 | 180 | 180 | 180 | 0.63 | 0.70 | 0.70 | 0.70 |
| කිහිලිකරු ලබාදීම | 150 | කිහිලිකරු ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 150 | 150 | 150 | 150 | 0.26 | 0.30 | 0.30 | 0.30 |
| සුදු සැරයටි | 05 | කිහිලිකරු ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 05 | 10 | 10 | 10 | 0.003 | 0.01 | 0.01 | 0.01 |
| හැරමිටි ලබාදීම | 74 | හැරමිටි ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 74 | 75 | 75 | 75 | 0.07 | 0.08 | 0.08 | 0.08 |
| ඇස් කන්ණාඩි | 230 | ඇස් කන්ණාඩි ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 230 | 2000 | 2000 | 2000 | 0.45 | 5.00 | 5.00 | 5.00 |
| වායු මෙට්ට ලබාදීම ලබාදීම | 82 | වායු මෙට්ට ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 82 | 85 | 85 | 85 | 0.59 | 0.60 | 0.60 | 0.60 |
| විශේෂ (ළමා) උපකරණ ලබාදීම | 01 | විශේෂ (ළමා) උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 01 | 05 | 05 | 05 | 0.09 | 0.10 | 0.10 | 0.10 |
| විශේෂ (වැඩිහිටි) උපකරණ | 03 | විශේෂ (වැඩිහිටි) උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 03 | 05 | 05 | 05 | 0.09 | 0.10 | 0.10 | 0.10 |
| ජංගම සේවා වැඩසටහන් | 01 | පවත්වන ලද ජංගම සේවා වැඩසටහන් | 01 | 10 | 20 | 20 | 0.001 | 0.50 | 1.00 | 1.00 |
| ශාන්ති සෙවන වැඩිහිටි නිවාසයේ නඩත්තු කිරීම | 302 | නේවාසික වැඩිහිටියන් සංඛ්‍යාව | 302 | 300 | 300 | 300 | 26.54 | 27.00 | 28.00 | 29.00 |

කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම පුනරාවර්තන වියදම් ඉතිරි කොටස...............

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ නඩත්තු කිරීම | 14 | නේවාසික වැඩිහිටියන් සංඛ්‍යාව | 14 | 15 | 20 | 50 | 1.62 | 1.75 | 2.00 | 4.00 |
| වැඩිහිටි නිවාස යථායෝග්‍යා ධාර ගෙවීම | 23 | නේවාසික වැඩිහිටියන් සංඛ්‍යාව | 23 | 25 | 25 | 25 | 0.41 | 0.5 | 0.5 | 0.5 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන සඳහා යථායෝග්‍යා ධාර ගෙවීම | 158 | නේවාසික අවශ්‍යතා සහිත පුද්ගලයන් සංඛ්‍යාව | 158 | 160 | 170 | 180 | 2.74 | 2.75 | 3.00 | 3.00 |
| වැඩිහිටි සංවිධාන සඳහා බස්රථ වෙන්කිරීම් | 18 | බස්රථ වෙනකරන ලද වැඩිහිටි සංවිධාන සංඛ්‍යාව | 18 | 75 | 100 | 100 | 0.19 | 0.50 | 0.75 | 0.75 |
| බලමණ්ඩල චාරිකා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් | 03 | ප්‍රතිපාදන වෙන් කරන ලද චාරිකා ගණන | 03 | 29 | 29 | 29 | 0.3 | 1.5 | 1.5 | 1.5 |
| වැඩිහිටි නිවාස සඳහා වූ වැඩසටහන් (චාරිකා, උත්සව, අත්දැකීම්) | 04 | වැඩසටහන් සංඛ්‍යාව | 04 | 05 | 05 | 05 | 0.33 | 0.40 | 0.50 | 0.60 |
| බල මණ්ඩල සඳහා ජාතික, පළාත්, බෞද්ධ කොඩි මිළදී ගැනීම | බල මණ්ඩල 29 | වැඩිහිටි බල මණ්ඩල සංඛ්‍යාව | 29 | - | - | - | 0.11 | - | - | - |
| දිස්ත්‍රික් ආබාධිත සංවිධානය | 04 | රැස්වීම් වාර සංඛ්‍යාව | 04 | 05 | 05 | 05 | 0.031 | 0.03 | 0.04 | 0.05 |
| විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ බලමණ්ඩල චාරිකා | 27 | ප්‍රතිපාදන වෙන් කරන ලද චාරිකා ගණන | 27 | 29 | 29 | 29 | - . | 1.20 | 1.25 | 1.30 |

කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම පුනරාවර්තන වියදම් ඉතිරි කොටස................

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| දිස්ත්‍රික් ගෘහ මූලික කාන්තා බල මණ්ඩල රැස්වීම් පැවැත්වීම | 04 | දිස්ත්‍රික් ගෘහ මූලික කාන්තා සංවිධාන බල මණ්ඩල රැස්වීම් වාර සංඛ්‍යාව | 04 | 05 | 05 | 05 | 0.032 | 0.03 | 0.04 | 0.05 |
| ගෘහ මූලික කාන්තා බලමණ්ඩල චාරිකා | 01 | ගෘහ මූලික කාන්තා චාරිකා ගණන | 01 | 29 | 29 | 29 | 0.03 | 1.20 | 1.25 | 1.30 |
| ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සව | 06 | වැඩසටහන් සංඛ්‍යාව | 06 | 10 | 15 | 15 | 0.21 | 0.40 | 0.75 | 0.75 |
| ජාත්‍යන්තර ආබාධිත දින සැමරුම් උත්සව | 26 | ප්‍රතිපාදන වෙන්කළ වැඩසටහන් සංඛ්‍යාව | 26 | 29 | 29 | 29 | - . | 1.5 | 1.6 | 1.7 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගල පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීම | 03 | වැඩසටහන් සංඛ්‍යාව | 03 | - | - | | 0.49 | - | - | - |
| ජන මන පොබයන නැණස සහ වෙනත් වැඩසටහන් | 02 | වැඩසටහන් සංඛ්‍යාව | 02 | 10 | 15 | 15 | 0.073 | 0.30 | 0.50 | 0.50 |
| දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුර වැඩසටහනට සහභාගී වූවන් සඳහා ස්වයං රැකියා ආධාර දීම | 29 | ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 29 | 50 | 75 | 75 | 0.51 | 1.00 | 1.25 | 1.25 |

❖ **ප්‍රාග්ධන වියදම්**

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| වැඩිහිටි නිවාස නවීකරණය | 02 | භාවිතා කරන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 302 | 300 | 300 | 300 | 0.26 | 20 | 25 | 25 |
| වැඩිහිටි නිවාස ගොඩනැගිලි ඉදිකිරීම | 01 | භාවිතා කරන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 302 | 300 | 300 | 300 | 0.22 | 15 | 25 | 25 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය | ඉලක්ක කරා ළඟාවීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 01 | අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය ලබාදුන් පුද්ගල /පවුල් ඒකක සංඛ්‍යාව | 45,000 | 45,915 |
| 02 | අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකවල ජීවනෝපාය සංවර්ධනය දිරිමත් කළ පවුල් සංඛ්‍යාව | 800 | 863 |
| 03 | රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සලසා දුන් පුද්ගල සංඛ්‍යාව | 475 | 497 |
| 04 | වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ඉහල නැංවීම පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහිකිරීමට සිදුකරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | 15 | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් වැඩසටහන් 02ක් පමණක් පවත්වන ලදී |
| 05 | වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා සංවිධාන ව්‍යුහය ශක්තිමත්ව පවත්වා ගෙන යාම සඳහා පවත්වන ලද රැස්වීම් හා වැඩසටහන් සංඛ්‍යාව | 142 | 46 |
| 06 | වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ දැනුම, කුසළතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම හා ඇගයීම සඳහා පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 25 | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් වැඩසටහන් 02ක් පමණක් පවත්වන ලදී |
| 07 | සමාජ විරෝධී ක්‍රියාකාරකම් වල නිරත හා දුරාචාරයන් වලට ඇබ්බැහි වූවන් එම චර්යාවන්ගෙන් වළක්වා ගැනීම සහ ඒ සඳහා යොමුවීම වැළක්වීම සඳහා ජීවනෝපාය සවිමත් කළ පවුල් සංඛ්‍යාව | 40 | 29 |
| 08 | ආපදා තත්වයන්ට පෙර සූදානම හා හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහිකිරීම සඳහා සංවිධානය කළ වැඩසටහන් සංඛ්‍යාව | 15 | 02 |
| 09 | නවීන තාක්ෂණය හා පිළිගත් ක්‍රමවේද අනුගමනය කර දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා නඩත්තු කළ මෙම දෙපාර්තමේන්තුවේ ආයතන සංඛ්‍යාව | 09 | 09 |
| 10 | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ආකල්ප හා ධාරිතාවය සංවර්ධනය කිරීමට සිදුකළ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | 02 | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් වැඩසටහන් නොපවත්වන ලදී. |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2020

2020 වසරේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හෝ පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ නව වැඩ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් වී නොමැති බැවින් අදාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි විය. නමුත් අවිච්ඡේද ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර දීමක් සිදුකල බැවින් ඊට අදාල තොරතුරු පහතින් දැක්වේ.

| විස්තරය | ප්‍රමාණය | ආවරණය කළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|---|
| වැඩිහිටි නිවාස නවීකරණය | 02 | ම.නුප | 302 | 0.26 |
| වැඩිහිටි නිවාස ගොඩනැගිලි ඉදිකිරීම | 01 | ම.නුප | 302 | 0.18 |

## දැක්ම කරා ලඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන් පිළිබඳව අදහස් හා යෝජනා

"සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක්" ළඟා කර ගැනීම මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම වේ.

එහිදි අසරණ වු වැඩිහිටියන් හා ආබාධිත තැනැත්තන් සඳහා පිහිටුවා ඇති ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිමද අවශ්‍ය උපකරණ හා යන්ත්‍ර සැපයීමද ප්‍රමුඛ කාර්යයන් වේ. එහිදි සාලියපුර වැඩිහිටි නිවාසයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මි.28.05ක්ද බුල්නෑව වැඩිහිටි නිවාසයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මි. 0.2 ක මුදලක්ද 2021 වර්ෂය සඳහා වෙන්කිරිමට අපේක්ෂා කෙරේ. එමෙන්ම එදිනෙදා කටයුතු පහසු කිරිම සඳහා උපකරණ මිල දී ගැනීමට සාලියපුර වැඩිහිටි නිවාසයට රු.මි.02ක මුදලකුත් යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීමට රු.මි. 0.75 ක මුදලකුත් ගෙවත්ත නඩත්තු කිරීම සඳහා ට්‍රැක්ටරයක් මිලදී ගැනීමට රු.මි. 0.75 ක මුදලකුත් බුල්නෑව වැඩිහිටි නිවාසය සඳහා උපකරණ මිල දී ගැනීමට රු.මි 0.25ක මුදලකුත් වෙන් කිරිමට සැලසුම් කර ඇත. එමෙන්ම ආබාධිත ආයතනවල යටිතල පහසුකම් සංවර්ධය සඳහා රු.මි 2.25ක මුදලකුත් උපකරණ මිල දී ගැනීමට රු.මි.0.25ක මුදලකුත් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ. තවද ප්‍රතිලාභීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පිහිටුවා ඇති ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනයට රු.මි. 0.75 ක මුදලක් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවනු ලබන මාසික මහජනාධාර වැඩසටහන විධිමත් කිරීම සඳහා මාසික මහජනාධාර ජාලගත කිරීමට රු.මි. 02කුත් වැඩිහිටියන්ගේ සුභසාධන තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරිමට රු.මි. 01කුත් ආබාධිත, ගෘහ මූලික කාන්තා හා වැඩිහිටියන්ගේ ජීවනෝපාය සංවර්ධනයට ස්වයං රැකියා වැඩසටහන සඳහා රු.මි. 02කුත් සෞභාග්‍යයේ දැක්ම අනුව යමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා රු.මි. 01කුත් රුධිර කාන්දුකරණ රෝගීන්, ආබාධිත හා වයෝවෘද්ධ පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතා වැඩිදියුණු කිරීමට රු.මි. 02කුත් ප්‍රාදේශීය මට්ටමෙන් සේවා සපයන සමාජ සේවා අංශ වැඩිදියුණු කිරිම සඳහා රු.මි. 01කුත් දෙපාර්තමේන්තුවේ සමස්ත සේවාව සපයන මානව සම්පත් ධාරිතා සංවර්ධනයට රු.මි. 01කුත් වෙන් කිරීමට අපේක්ෂා කෙරේ. ඉහත සියලු සංවර්ධන කාර්යයන් සිදු කිරිමට අපේක්ෂා කර ඇත්තේ සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා වේ.

## අංශයේ සංවර්ධනය සම්බන්ධයෙන් වන අනාගත අපේක්ෂාවන්

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුලත් ගමන්මඟ | |
|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන |
| සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් හෝ පවුල් ඒකක සඳහා සාමාජයීය වටිනාකමක් ගොඩනැගීම | අඩු ආදායම්ලාභි 45,000 සඳහා මාසික මූල්‍යාධාර නිකුත් කිරීම. | අඩු ආදායම්ලාභීන්ගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම |
| | පුද්ගලයන් 1314 කට මාසික නොවන මූල්‍යාධාර නිකුත් කිරීම. | |
| | අඩු ආදායම්ලාභි පුද්ගලයන් 500 දෙනෙකු සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම | ජීවනෝපාය සංවර්ධනය |
| රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සුරක්ෂිත කිරීම. | වැඩිහිටි නිවාස දෙකක් පවත්වා ගැනීම. | වැඩිහිටියන් සුරක්ෂිත කිරීම |
| | අවම වශයෙන් එක් වැඩිහිටි නිවාසයක් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම හා අනෙකුත් වැඩිහිටි නිවාස අධීක්ෂණය | නේවාසික වැඩිහිටියන්ගේ අවම පහසුකම් සංවර්ධනය |
| | ආබාධිත ආයතන 05 ක් සඳහා අවශ්‍ය සහන සැලසීම හා අධීක්ෂණය කිරීම. | ආබාධිත නේවාසිකයින් සුරක්ෂිත කිරීම හා අවම පහසුකම් සැලසීම. |
| වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ සමාජ සුභසාධනය ඉහල මට්ටමක් දක්වා ලඟා කරගැනීම. | වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සුභ සාධනය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් 200ක් පැවැත්වීම. | ප්‍රතිලාභීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වැඩිදියුණු කිරීම |
| | දිස්ත්‍රික් රැස්වීම් 06ක් පැවැත්වීම. | වැඩිහිටි, ආබාධිත හා ගෘහ මූලික කාන්තා සංවිධාන ශක්තිමත් කිරීම |
| අයහපත් චර්යාවන්ගෙන් යුත් තරුණයින් යහපත් පුරවැසියන් බවට පත්කර රටේ සංවර්ධනයට දායක වන තරුණ ප්‍රජාවක් බිහිකරලීම. | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් අවම වශයෙන් 10 ක් පැවැත්වීම | සමාජ විරෝධි ක්‍රියාකාරකම් තුරන් කර සාමකාමී සමාජයක් ඇති කිරීම. |
| ප්‍රජාව ආපදා තත්වයෙන් සුරක්ෂිත කර ගැනීම. | දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පැවැත්වීම | ආපදා තත්ත්වයන්ගෙන් ප්‍රජාව සුරක්ෂිත කිරීම |
| ප්‍රශස්ත මහජන සේවයක් ලබාදෙන රාජ්‍ය ආයතනයක් බවට පත්වීම. | දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | සේවා කාර්යක්ෂමතාව වැඩිකිරීම |
| | දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ ධාරිතාවය සංවර්ධනය කිරීම. | සේවා ගුණාත්මකභාවය වැඩි කිරීම. |

## කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේ සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණදුන් ගැටළු

1. කොවිඩ් 19 ගෝලීය වසංගතය තුළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් තැපැල් කාර්යාල හරහා ප්‍රතිලාභීන්ට ලබා දෙන මූල්‍යාධාර ගෙවීම් 2020 ආරම්භයේ පැවැති ඇඳිරි නීති තත්ත්වය හා අවධානම් තත්ත්වය තුළ සිදු කිරීමට බාධාවක් ඇති විය. එහිදි සමාජ සේවා නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් මඟින් අදාළ ප්‍රතිලාභීන්ට මූල්‍යාධාර ගෙවීම සිදු කිරීම හරහා එම අභියෝගය ජයගත හැකි විය.
2. දෙපාර්තමේන්තුව මඟින් සෘජුවම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් මහජනතාව වෙත ගොස් සිදු කරන දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමේ වැඩසටහන්, ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා පාසල් වැඩසටහන් හා වන්දනා චාරිකා සඳහා බස් රථ වෙන්කිරීම්, ජංගම සේවා වැඩසටහන් මුළු මුනින්ම පාහේ සෞඛ්‍ය උපදෙස් මත අත්හිටුවීමට සිදු විය. නමුත් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කුඩා කණ්ඩායම් වශයෙන් එම වැඩසටහන් කිහිපයක් සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් ක්‍රියාත්මක කිරීමට හැකිවිය.
3. පැවති අවධානම් තත්ත්වය හා ප්‍රවාහන දුෂ්කරතාවය මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සේවයට කැඳවීමට නොහැකි වීම තුළ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු සිදු කිරීමට බාධා පැමිණියත් කණ්ඩායම් වශයෙන් සේවයට කැඳවමින් අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට හැකි විය.
4. සාලියපුර වැඩිහිටි නිවාසය ඇතුළු අනිකුත් වැඩිහිටි නිවාස හා ආබාධිත ආයතනවල නේවාසිකයින් මෙම උවදුරෙන් ගලවා ගැනීම ප්‍රමුඛ කාර්යභාරයක් විය. සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් පිළිපදිමින්ද සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින්ද මෙම වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයිමෙන්ද අවධානම් පුද්ගලයින් හා සම්මුඛ වීම වැළැක්වීමෙන්ද නේවාසිකයන් හා කාර්ය මණ්ඩලය දැනුවත් කිරිමෙන්ද මෙම උවදුරෙන් ඔවුන් හැකිතාක් ආරක්ෂා කිරිමට හැකි විය.
5. යටත් ආයතනවල සැපයුම් ලබා ගැනීමේදි දුෂ්කරතා ඇති වුවත් සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය සැපයුම් ලබා ගැනීමට හැකි වූ අතර අමතර තොග පවත්වා ගැනීමෙන් වැඩිහිටි නිවාසවලට අවශ්‍ය සැපයුම් බාධාවකින් තොරව ලබා ගැනීමට හැකි විය.
6. නිවාසාධාර හා ස්වයං රැකියා ආධාර වැනි ක්ෂේත්‍ර නිරීක්ෂණය කර ලබා දෙන ආධාර නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් සන්නිවේදන කිරීම නිසාද සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් ක්ෂේත්‍ර පරික්ෂාවන් සිදු කිරීම මඟින්ද එම අභියෝග ජයගත හැකි විය.

# 09. ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

## ආයතන පිළිබඳ මූලික තොරතුරු

ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය පළාත් සභා පිහිටුවීමට පෙර මධ්‍යම රජයේ සමුපකාර අමාත්‍යාංශය යටතේ සමුපකාර අමාත්‍යවරයා යටතේ ප්‍රාදේශීය කාර්යාලයක් වශයෙන් පැවති අතර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව පළාත් සභා ආරම්භ කිරීමත් සමඟ උතුරු මැද පළාතේ සමුපකාර අමාත්‍යංශය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවන ලදී.

මෙම අමාත්‍යංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වන්නේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවයි.

## පළාත් ව්‍යවස්ථාපිත ආයතන

ව්‍යවස්ථාපිත ආයතන ලෙස පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, සමුපකාර සේවක කොමිෂන් සභාව යන ආයතන ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ වේ.

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

පළාත් සභා පිහිටුවීමට පෙර මධ්‍යම රජයේ සමුපකාර අමාත්‍යංශය යටතේ සමුපකාර කොමසාරිස්වරයා යටතේ ප්‍රාදේශීය කාර්යාලයක් වශයෙන් පැවති අතර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව පළාත් සභා ආරම්භ කිරීමත් සමග උතුරු මැද පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව ආරම්භකර අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක සඳහා සහකාර කොමසාරිස් කාර්යාල දෙකක් ද ආරම්භකර පාලන කටයුතු සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුව මගින් සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට හා ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම.

## පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වෙනි පරිච්ඡේදය අනුව කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත.ඒ හා සමාන බලතල අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවද පිහිටුවා ඇත. තවද, 1987 ට පෙර මධ්‍යම රජය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තු දෙක පළාත් සභා පිහිටුවීමෙන් පසුව පළාත් සභාව යටතට බලය පවරන ලදී. එසේ පළාත් සභා පිහිටුවීමෙන් පසුව 2003 වර්ෂයේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තු හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව එක්කොට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් මෙම දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත.

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02 න් සමන්විත වේ. මෙම දෙපාර්තමේන්තුව 1987 අංක 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තිය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. කෘෂිකර්ම හා සත්ත්ව පාලන අමාත්‍යාංශය වෙනම ඒකකයක් වශයෙන් පිහිටුවා තිබුණි.

මෙම දෙපාර්තමේන්තුව 1987 වර්ෂයේ සිට අනුරාධපුර කච්චේරි භූමිය සහ පොළොන්නරුව දිස්ත්‍රික් කච්චේරි භූමිය තුළ ආරම්භ වී අනුරාධපුර පළාත් කාර්යාලය වශයෙන් ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයක් වශයෙන් ද පිහිටුවිය.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 29 ක් ආවරණය වන පරිදි බල ප්‍රදේශය විශාල වීමත්, කාර්යය බහුල විමත් නිසා 1989 ජූනි 01 වන දින වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. පළාතේ ක්‍රීඩා පරිපාලනය හා සංවර්ධන කටයුතුවලට ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සල්ගාදු ක්‍රීඩාංගන භූමියේ 2004 අප්‍රේල් 27 වන දින සිට නව පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කරන ලදි. එතැන් සිට අද දක්වා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව එම භූමියේ පිහිටා තිබේ.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වනුයේ උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හා සහජ දක්ෂතාවලින් හෙබි ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගනිමින් ඔවුනට මනා ක්‍රීඩා පුහුණුවක් ලබාදීම,හඳුනා ගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ජාතික හා ජාත්‍යන්තරය ජය ගත හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් බිහි කිරිමයි.

## පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ ලියාපදිංචිකර ඇති වාහන සඳහා පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් හෝ පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ආදායම් බලපත්‍රය ලබා ගැනීමට e-RL -1 වැඩ සටහන යටතේ කටයුතු කර ඇත. මෙය තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ලංකාවේ ඕනෑම පළාතකින් තම වාහනය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හැකිවන පරිදි, වාහන ආදායම් බලපත්‍ර ලබාදීමේ මෘදුකාංගය වැඩිදියුණු කර ඇත.

2020 වසරේදී e-RL -11 අදියර ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය වසර හතරක ව්‍යාපෘතියක් ලෙස සැලසුම් කර ඇති අතර, දැනටමත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.

## සමූපකාර සේවක කොමිෂන් සභාව.

1994 අංක 09 දරණ ප්‍රඥප්තිය අනුව (NCP/PC/FC/4/4/ප්‍රඥප්තිය /2 හා 1996.01.19 දිනැති ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි) උතුරු මැද පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. එම ප්‍රඥප්තියට අනුව රෙගුලාසි සකස් කර ගැසට් පත්‍රයේ පළ කරන තෙක් ,1972 අංක 12 දරණ සමූපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි අනුව කටයුතු කිරිමට උතුරු මැද පළාත් සමූපකාර අමාත්‍යාංශ ලේකම්ගේ 1994.10.03 දිනැති ලිපියෙන් ලබාදී ඇති අනුමැතිය අනුව මෙහි කටයුතු අරඹා ඇත. 1994 අංක 09 දරණ උතුරු මැද පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ වූ රෙගුලාසි 1273/8 – 2003/01/27 දින දරන විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත.

## කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

2003 දෙසැම්බර් මස 11 වන දින 2003 අංක 2 දරණ උතුරු මැද පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය මගින් ආරම්භ කරන ලදි. ඒ අනුව පළාතේ සියළුම නව කර්මාන්ත බිහි කිරිම සහ පවත්නා කර්මාන්තවල ප්‍රවර්ධනයක් ඇති කිරිම, මෙම අධිකාරියේ අරමුණ වේ.

## මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභාවලට ලැබී ඇති බලතල මත පළාත තුළ පොදු ප්‍රවාහන කටයුතු නියාමනය කිරීම සඳහා උතුරු මැද පළාත් සභාව මගින් 1994 අංක 8 දරණ ප්‍රඥප්තිය සම්පාදනය කර අනුමත කර ඇත. එසේ අනුමත කරන ලද ප්‍රඥප්තිය මගින් ලැබී ඇති බලය මත 2000.01.01 දින සිට උතුරු මැද පළාත් මගී ප්‍රවාහන අධිකාරිය ස්ථාපිත කර ඇත.එතැන් සිට ඉහත ප්‍රඥප්තියට අනුව පොදු මගී ප්‍රවාහන කටයුතු නියාමනය කරන ලදී. ඉහත ප්‍රඥප්තියේ යම් යම් අඩුපාඩුකම් පැවති හෙයින් 2014 පෙබරවාරි මස අංක 1850 දරණ අංක 03 දරණ සංශෝධිත ප්‍රඥප්තියක් ඇති කර ඒ තුළින් අධිකාරියේ, පාලන අධිකාරියේ පාලන ව්‍යුහයද මගී ප්‍රවාහනය යන්න වෙනස්කර භාණ්ඩ හා වෙනත් ප්‍රවාහන යනුවෙන් සංශෝධනය කර මේ දක්වා ක්‍රියාත්මක වේ.

මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය අරමුණ වනුයේ බස් රථ, ත්‍රී රෝද රථ ඇතුළු මගී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය, ආරක්ෂිත හා ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම, බස්නැවතුම්පල කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය ආදී කරුණු ප්‍රධාන වන අතර එමගින් ජාතික ආර්ථිකයට මනා දායකත්වයක් ලබා දෙයි.

### ආදායම් බලපත්‍ර නිකුත් කරන ලද වාහන සංඛ්‍යාව

| වාහන | 2015 | 2016 | 2018 |
|---|---|---|---|
| යතුරු පැදි | 193,774 | 211,301 | 221618 |
| ත්‍රීවිල් | 56,413 | 58,961 | 55096 |
| බස් | 924 | 878 | 722 |
| ලොරි | 120,610 | 11,941 | 11343 |
| ද්වි කාර්ය වාහන | 21,174 | 23,602 | 23335 |
| විශේෂ කාර්ය වාහන | 18 | 62 | 02 |
| අවමංගල / ගිලන් රථ | 17 | 12 | 10 |
| කාර් | 16,181 | 18,454 | 19450 |
| මෝටර් කෝච් | 809 | 915 | 1030 |
| ඉඩම් වාහන | 9,443 | 10,871 | 8450 |
| ටේලර් | - | 329 | 2189 |
| **එකතුව** | **419,363** | **337,326** | **343245** |

### ප්‍රවාහන තොරතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොලවල් (14) | සංසරණය වන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණය වන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| අනුරාධපුර (පැරණි) | 90 | 2,700 |
| අනුරාධපුර (නව) | 65 | 1,950 |
| අනුරාධපුර (දුර සේවා) | 175 | 5,250 |
| කැකිරාව | 50 | 1,500 |
| තඹුත්තේගම | 50 | 1,500 |
| ගල්නෑව | 30 | 900 |
| ගල්කිරියාගම | 9 | 200 |
| හොරොව්පොතාන | 30 | 900 |
| කහටගස්දිගිලිය | 19 | 570 |
| මිහින්තලේ | 70 | 1300 |
| මැදවච්චිය | 12 | 360 |
| කැබිතිගොල්ලෑව | 50 | 1,000 |
| නොච්චියාගම | 35 | 1,050 |
| ගලෙන්බිඳුණුවැව | 35 | 1,050 |
| **එකතුව** | **720** | **20,230** |

උප බස් නැවතුම්පොළවල් - 13

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ප්‍රධාන<br>බස් නැවතුම්පොළවල් (8) | සංසරණයවන<br>බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණයවන මගීන් ප්‍රමාණය<br>(දිනකට) |
|---|---|---|
| හිඟුරක්ගොඩ | 69 | 2,700 |
| කදුරුවෙල | 220 | 6,600 |
| මැදිරිගිරිය | 16 | 480 |
| බකමූණ | 18 | 540 |
| වැලිකන්ද | 09 | 270 |
| සිරිපුර | 40 | 500 |
| මින්නේරිය | 105 | 950 |
| **එකතුව** | **477** | **12,040** |

උප බස් නැවතුම්පොළවල් - 09

## ලියාපදිංචි ප්‍රවාහන සේවා පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 1 | මගී ප්‍රවාහන බස් රථ | 770 |
| 2 | පාසැල් ප්‍රවාහන බස් රථ | 14 |
| 3 | සිසු සැරිය බස් රථ | 98 |
| 4 | භාණ්ඩ ප්‍රවාහන රථ | 56 |
| 5 | ත්‍රී රෝද රථ | 1800 |
| 6 | කාර්යාල සේවා බස් රථ | 02 |

## දැක්ම

"අභිමානවත් සමාජයක්, ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත අංශ සඳහා සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරිමේ ආයතන නිසි පරිදි නියාමනය කිරිම".

## දිගුකාලීන අරමුණු

- මහජන සේවාවන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ ආයතන පද්ධතියක් ඇති කිරිම.
- තෘප්තිමත් පාරිභෝගික හා වෙළඳ ප්‍රජාවක් ඇති කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීමය රැකියා අවස්ථා ළඟා කර දීම හා ඔවුන්ගේ යහගුණ ආකල්ප සංවර්ධනය කිරීම.
- පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය තුළින් කර්මාන්තකරුවන්ගේ ආර්ථිකමය හැකියාවන් වර්ධනය හා ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධනය කිරිම.

## කෙටිකාලීන අරමුණු

- ආහාර භාවිතයේ වැදගත්කම පිළිබඳ ජනතාව තුළ නිවැරදි මතයක් නිර්මාණය කිරිම.
- රැකියා විරහිතව සිටින තරුණ ප්‍රජාව සඳහා රැකියා ඉලක්ක කර ගනිමින් පළාතේ තරුණ ප්‍රජාව තුළ ගුණාත්මක ආකල්ප සංවර්ධනය කිරිම.
- ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම හා අභිප්‍රේරණය කිරිම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

වෙළඳ ආහාර සහ යෞවන කටයුතු විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පළාත තුල සිදු කරනු ලබන ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම.

ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ආයතනික කටයුතු මෙහෙය වීමෙන් සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම මගින් පළාතේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




## කාර්යය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 37ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 32 කි. පුරප්පාඩු සංඛ්‍යාව 05 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. ගුණ ගරුක විනයගරුක නීතිගරුක සමාජයක් -සමාජ ආරක්ෂණය සහ සුභසාධනය- සංවර්ධන ක්‍රියාවලියේ අතුරුඵලයක් ලෙස ඇතිවන සමාජ අසමානතාව හැදින්විය හැක්කේ පුද්ගල අනුබද්ධ ගැටළුවකට වඩා සමාජීය ගැටළුවක් ලෙසයි. ආර්ථික වශයෙන් රටක් කොතරම් සංවර්ධනයක් අත්පත් කර ගත්ත ද සමාජ අසමානතාව ඉහළ මට්ටමක පවතින්නේ නම් එහි අර්ථය එම රටේ විශාල පිරිසක් අසරණභාවයට සහ අනාරක්ෂිත තත්වයට පත් වී ඇති බවය. රජයක වගකීම ඒ සියළු දෙනා ආරක්ෂා කිරීමයි.
2. ජනතා කේන්ද්‍රීය ආර්ථිකය - පොදු ජන ජීවන සහන දිළිඳු බව තුරන් කිරීම ඉලක්ක කර ගත් වැඩ පිළිවෙළක් ග්‍රාමීය හා නාගරික ආර්ථිකයන් තුළ ක්‍රියාත්මක වන විවධ ආර්ථික ක්ෂේත්‍රයන් සීඝ්‍රයෙන් දියුණු කිරීම මගින් ජීවනෝපාය මාර්ග බහුල කෙරේ.

## තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

❖ සමුපකාර අමාත්‍යාංශය ලේකම්ගේ නිල නිවස අළුත්වැඩියාව කිරීම සඳහා 2020 වර්ෂය සඳහා ඉලක්ක ගත ආයෝජනය රු.3,157,293.54 හා ඉලක්ක ගත වියදම රු.3,102,878.80 වන අතර භෞතික සහ මූල්‍ය ප්‍රගතිය 100% ක් වේ.

## ඉලක්ක කරා ළඟා වීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2020

| ව්‍යාපෘතිය | ප්‍රමාණය (ඒකක) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන /ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1.අමාත්‍යාංශ ලේකම් නිල නිවස අලුත්වැඩියා කිරීම | 01 | 01 | 01 |

## ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් පුහුණු පාඨමාලාව



2019 වර්ෂයේ ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි පාඨමාලාව සඳහා උතුරු මැද පළාතේ අවුරුදු 18 හා 35 අතර තරුණයන්ගෙන් අයදුම්පත් කැඳවා සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් 20 දෙනෙකු පාඨමාලාව සඳහා ගල්කුලම ඉදිකිරීම් හා යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විද්‍යාල වෙත යොමු කරන ලදී.ඒ අනුව ඔවුන් රැකියාගත වීම පිළිබඳව 2020 වර්ෂයේ සිදු කරනු ලැබූ පසු විපරම් කාර්යේ දි ස්වයං රැකියාවක නිරත වන තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පුහුණුව සඳහා යොමු වූ ඩී.එම්.ජයරත්න මධුසංක යන අය හමු වූ අවස්ථාව ඡායාරූපයෙන් දැක්වේ.

## බර වාහන රියදුරු පුහුණු පාඨමාලා පැවැත්වීම



2019 වර්ෂයේ පළාතේ විරැකියාවෙන් පෙළෙන තරුණයන් රැකියාගත කිරිමේ වැඩසටහන යටතේ බර වාහන පාඨමාලාව හැදෑරූ පුහුණුලාභින් රැකියාගත විම පිළිබඳව සිදු කළ පසුවිපරමේ දි තිරප්පනය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ආර්.මධුෂාන් මහතා හමු වී විස්තර ලබා ගත් අවස්ථාව ඡායාරූපයෙන් දැක්වේ.

## මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන් සඳහා නවින උපකරන ලබා දීම



2019 වර්ෂයේ පළාතේ දේශිය කර්මාන්ත කරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් යටතේ මැටි ආශ්‍රිත නිෂ්පාදන සිදුකෙරෙන තිරප්පනය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පණ්ඩිත රඹෑව ගම්මානයට ලබාදුන් විදුලි සකපෝරු හා මැටි පහන් අච්චු, ඵලදායි ලෙස නිෂ්පාදන කාර්යය සඳහා යොදවනවා ද යන්න 2020 වර්ෂයේ සිදු කළ පසු විපරමේ දි ගත් ඡායාරූපයක් දැක්වේ.

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රථිපල ඇතුලත් ගමන් මඟ | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| 01.පළාතේ තරුණ පිරිස වෘත්තිමය ක්ශේත්‍ර වෙත යොමු කිරිම | බරවාහන වෘත්තිය පුහුණුව ලැබූ තරුණයින් බිහි කිරිම.<br><br>ඉදිකිරීම් යන්ත්‍ර පුහුණුව ලැබූ තරුයින් බිහි කිරිම සහ ඔවුන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් NVQ3 සහතිකයක් ලබා දීම. | 1.රැකියා විරහිත තරුණ පිරිස් වෙත බර වාහන රියදුරු බලපත්‍ර ලබා ගැනිමට සහය වීම මගින් බරවාහන ක්ශේත්‍ර යේ රැකියා වෙත යොමු කර විමෙන් පළාතේ තරුණ විරැකියාව අවම විම.<br>2.ඉදිකිරිම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී පුහුණුව ලබා දිම තුලින්, රැකියා විරහිත තරුණ පිරිස් ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ක්ශේත්‍රයේ රැකියා වෙත යොමු කිරීම මගින් පළාතේ තරුණ විරැකියාව අවම කිරීම. |
| 02.මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන් සවිබල ගැන්වීම | වර්ෂය තුල මැටි ආශ්‍රිත කර්මාන්තයේ නියැලෙන පාරම්පරික කර්මාන්තකරුවන් සඳහා උපකරන ලබා දීම | අභාවයට යමින් පවතින මැටි ආශ්‍රිත කර්මාන්තය ප්‍රවර්ධනය කිරිම තුලින් කර්මාන්ත කරුවන්ගේ ආදායම් මට්ටම ඉහල දැමීම තුලින් දිලිදු බව තුරන් කිරිමට දායක වීම සහ ජනතාව තුල යහපත් සෞඛ්‍ය,යහ පැවැත්ම ඇති කරවිම . |
| 03.කාර්යාලයේ නිලධාරින්ට රාජකාරි කටයුතු ඵලදායිව කාර්යක්ෂමව සිදු කිරිම සඳහා කාර්යාල පහසුකම් සැලසීම | කාර්යාල පහසුකම් සැලසීම | කාර්යක්ෂම මහජන සේවයක් ලබා දිම |
| 04.විද්‍යුත් ආදායම් බලපත්‍ර ලබාදීම | වසර තුල ලබා දිය හැකි බලපත්‍ර සංඛ්‍යාව | කාර්යක්ෂම මහජන සේවයක් ලබා දිම |
| 05. NVQ3 මට්ටමේ වෘත්තිය පුහුණුව ලැබූ තරුණයින් සඳහා උපකරණ කට්ටලයක් ලබා දීම | උපකරණ කට්ටල ලබා දීම | තරුණ පිරිස් ස්වයං රැකියා සඳහා යොමු කිරීම මගින් ඔවුන්ගේ විරැකියාව අවම කිරීම. |

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන විභවතාවයන් පිළිබඳව අදහස් හා යෝජනාවන්

- මැටි කර්මාන්තයේ යෙදි සිටින්නන්ට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා නිෂ්පාදනයේ සිට නිමි භාණ්ඩ ගබඩා කරණය සඳහා අවශ්‍ය ගබඩා ඉදිකිරීමට අවශ්‍ය ආධාර ලබා දීම.
- අද ලොවට ගැලපෙන පරිදි මැටි නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම. එමෙන්ම ඉතා පහසුවෙන් හා කාර්යක්ෂමව නව නිර්මාණ කිරීමට හඳුන්වා දී ඇති නවීන යන්ත්‍ර සූත්‍ර ලබා දීම.
- නිෂ්පාදිත භාණ්ඩ අලෙවිය සඳහා නව වෙළෙඳ පොළ අවස්ථා සොයාගැනීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම.
- නව වෙළෙඳපොලට ගැලපෙන වෘත්තිය පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
- එක් එක් වෘත්තිය අනුව සුදුසුකම් සපුරා ඇති තරුණ තරුණියින් හඳුනා ගැනීම හා තෝරා ගැනීම.
- කණ්ඩායම් වශයෙන් පුහුණුව සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම.
- පාඨමාලා සම්පූර්ණ කර NVQ 3 සහතික ලත් පුහුණුලාභීන් අදාල වෘත්තීය ක්ෂේත්‍ර අනුව උපකරණ කට්ටල ලබා දීම.

## Covid 19 ගෝලීය වසංගත නිසා 2020 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

ක්‍රියාත්මක කිරීමට තෝරාගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණි.

# 9.1.සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සේවා ජාලය

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| විවිධ සේවා | 17 | 09 | 26 |
| පාරිභෝගික සමිති | 02 | - | 02 |
| සමුපකාර බැංකු | 3 | - | 3 |
| කෘෂිකාර්මික | 1 | - | 1 |
| සත්ත්ව නිෂ්පාදන - කිරි | 3 | 1 | 4 |
| ධීවර | 2 | 4 | 6 |
| කර්මාන්ත | 1 | 1 | 2 |
| කම්කරු | - | 1 | 1 |
| තරුණ සේවා | - | 1 | 1 |
| සුභසාධන | - | 1 | 1 |
| වෙනත් ප්‍රාථමික | - | 1 | 1 |
| සේවක සංඛ්‍යාව | 711 | 606 | 1,317 |
| සාමාජික සංඛ්‍යාව | 166,706 | 130,773 | 297,479 |
| ඉන්ධනහල් | 7 | 11 | 18 |
| කෝප් සිටි | 14 | 13 | 27 |
| මිනි කෝප් සිටි | 49 | 38 | 87 |
| මෙගා කෝප් සිටි | 03 | 01 | 04 |
| ග්‍රාමීය බැංකු | 106 | 40 | 146 |
| සණස සංගම් | 70 | 43 | 113 |

## දෙපාර්තමේන්තු නියාමනය යටතේ පවතින ආයතන

| ආයතනය | ප්‍රමාණය |
|---|---|
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල | 02 |
| මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය | 01 |
| සමුපකාර ශ්‍රවණාගාරය | 01 |
| සී/ස විවිධ සේවා සමුපකාර සමිති | 26 |
| සී/ස කෘෂිකාර්මික සමුපකාර සමිති | 01 |
| සී/ස කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති | 05 |
| සී/ස ධීවර සමුපකාර සමිති | 02 |
| සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති | 111 |
| සී/ස පේෂ කර්මාන්ත සමුපකාර සමිති | 01 |
| සී/ස කර්මාන්ත සමුපකාර සමිති | 02 |
| දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල | 02 |
| පළාත් සමුපකාර සමිති සංගම් | 02 |
| ස.ණ.ස සංගම් | 01 |
| පාසල් සමුපකාර සමිති | 04 |

1930 වසරේ ආරම්භ වූ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 1988 පළාත් සභා විෂයක් වශයෙන් විමධ්‍ය ගත වී තිබුණි. උතුරු මැද පළාතේ අනුරාධපුර සහ පොළොන්නරුව වශයෙන් පරිපාලන දිස්ත්‍රික්ක 02 යටතේ සහකාර කොමසාරිස් කාර්යාල 02ක්ද, අංක 352, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර යන ස්ථානයේ උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටා ඇත. සමුපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 02 කි.

| ව්‍යවස්ථාපිත කටයුතු | කළමනාකරණ කාර්යන් |
|---|---|
| • සමිති ලියාපදිංචිය, ඒකාබද්ධ හා විබද්ධ කිරීම අතුරු ව්‍යවස්ථා සංශෝධනය, ප්‍රාදේශික කාරක සභා ඇතුළු නිළවරණ, මහ සභා, කාරක සභා කැඳවීම ලියාපදිංචි අවලංගු කිරීම, තීරක කටයුතු හා උසාවි බල ගැන්වීම, සමුපකාර සමිති විගණනය | • පාලක මණ්ඩල පත් කිරීම්, දේපල පිළිබඳ අනුමැතිය, ණය ආයෝජන අනුමැතිය, උපරිම ණය සීමා තීරණය, අයවැය ගිණුම්කරණ අධීක්ෂණය සාමාන්‍ය හා විශේෂ විභාග පැවැත්වීම, කළමනාකරණ උපදෙස් හා අධ්‍යාපනය ලබා දීම. |

විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දිමට පෙර සමුපකාර ග්‍රාමිය ජනතාවගේ මුලික අවශ්‍යතා සඳහා මැදිහත්කරුවකු වශයෙන් විශාල කර්යභාරයක් ඉටුකරමින් ජනතාවට සමීප වෙමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කරගෙන සිටි අතර, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දිමෙන් පසු විවෘත වූ වෙළඳ ලෝකය තුළ එම ව්‍යාපාරයන් සමඟ තරඟ කිරිමට සිදුවීමෙන් වර්තමානයේ යම් තරමකින් පසුබෑමකට ලක්ව ඇත. එදා මෙදාතුර සමුපකාර ජාලය තුළ ලියාපදිංචි සමුපකාර සමිති සියල්ල අධීක්ෂණය හා නියාමනය මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලැබේ. වර්තමානයේ විවෘත වෙළඳපළ සමග තරඟ කරමින්, පාරිභෝගික ජනතාවට සහන සැලසිමටත් ගොවි ජනතාවට සහන සැලසීමේ අරමුණින් රජයේ මැදිහත් විම මත කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම, ගබඩා කිරිම හා නිමි ආහාර සැකසීමේ කාර්යයන්වල නියලෙමින් සිටින අතර, ඒ තුළින් නැවත සමුපකාර ව්‍යාපාර ශක්තිමත් කිරීමේ කර්තව්‍ය සඳහා සමුපකාර දෙපාර්තමේන්තුව දායකත්වය හා මඟපෙන්වීම සිදු කරනු ලැබේ.

## දැක්ම

"තිරසර සමුපකාර ව්‍යවසායක්, සෞභාග්‍යමත් සමාජයක්"

## මෙහෙවර

"සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම සියළු පාර්ශවකරුවන් මනා සහභාගීත්වයෙන්, විනිවිදභාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට, ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම."

## අරමුණු

**සමාජය තුළ සමුපකාර දර්ශනය පදනම් කරගත් ව්‍යවසායකත්ව ප්‍රචලිත කිරීම.**

- උතුරු මැද පළාතේ ජනතාව වෙත සමුපකාර දර්ශනය පදනම් කරගත් ව්‍යාවසාය ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා සානුබල සැපයීම පළාත් සභාව පිළිගත් සමුපකාර ප්‍රතිපත්ති හා සාරධර්ම ආරක්ෂා වන ආකාරයට පළාත තුල ලියාපදිංචි සමුපකාර සමිති සංවිධාන සංවර්ධන කාර්ය සඳහා දායක කර ගැනීම. සමාජයේ පොදු ආර්ථික සමාජීය සංස්කෘතික අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීම සඳහා යොදා ගත හැකි හොඳම විකල්පය ලෙස සමුපකාර ව්‍යාවසාය ක්‍රමය ප්‍රචලිත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

**සමුපකාර ජාලය ශක්තිමත් කිරීම**

- පළාතේ සමුපකාර සමිති සතු ග්‍රාමීය බැංකු ශාඛා ජාලය විධිමත් කර ජනතාව වඩාත් සිත් ගන්නා සුළු ආකාරයට, විනිවිද භාවයකින් යුක්තව සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායයකින් දිරි ගැන්වීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට අපේක්ෂා කරන අතර 2020 වර්ෂය වන විට සියළු ග්‍රාමීය බැංකු පරිගණක ගත කිරීම අවසන් කිරීමට කටයුතු කිරීම හා එමඟින් පළාතේ සමුපකාර ව්‍යවසාය ක්‍රමය ප්‍රචලිත කිරීමට හා විශ්වාසනීය බව තහවුරු කිරීමට මහෝපකාරී වනවා ඇත.

**යහපාලන කටයුතු සංවර්ධනය.**

- උතුරු මැද පළාතේ සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථාව වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම.
- සමුපකාර සමිතිවල අධ්‍යක්ෂවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම.
- සමුපකාර අරමුදල වියදම් කිරීම සඳහා රෙගුලාසි මාලාවක් යාවත්කාලීන කිරීම.
- කොමසාරිස්වරයා විසින් පත් කරන අධ්‍යක්ෂවරුන් සඳහා සුදුසුකම් නියම කිරීම.
- සමුපකාර සමිතිවල තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා සෑම විවිධ සේවා සමුපකාර සමිතියක් සඳහාම තොරතුරු නිළධාරියෙකු පත්කිරීම.

## දිගුකාලීන අරමුණු

**දිගුකාලීන අරමුණු** → උතුරු මැද පළාත් සමුපකාර ව්‍යාපාර තුළින් පොදු මහජනතාවට ඵලදායීතාවයක් සපයමින් තිරසර සංවර්ධනයට දායකත්වය සැපයීම.

## කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාත් සමුපකාර ව්‍යාපාර තුලින් පොදු මහජනතාවට ඵලදායීතාවයක් සපයමින් තිරසාර සංවර්ධනයට දායකත්වය සැපයීම.

## ප්‍රධාන කාර්යයන්

- නව සමුපකාර සමිති පිහිටුවීම.
- සමුපකාර සමිති ප්‍රති සංවිධානය කිරීම.
- ග්‍රාමීය බැංකු පරිගණක ගත කිරීම.
- නවීන අලෙවිකරණ ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- සමුපකාර සමිති විගණනය කිරීම.
- සමුපකාර සමිති ප්‍රඥප්තිය සංශෝධනය කිරීම.
- ආරවුල් බේරුම්කරණය.
- යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

01. පළාතේ පාරිභෝගික ජනතාවට සහන මිලට ද්‍රව්‍ය සැපයීම.

02. පළාතේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් ඇති කිරීම මගින් ගොවීන්ට සහන සැලසීම.

03. පළාතේ ජනතාවට සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

1 උතුරු මැද පළාතේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා අත්වැලක් වීම.

2 කුසගින්න තුරන් කිරීම.

3 කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම් සැපයීම




## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 178ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 106 කි. පුරප්පාඩු සංඛ්‍යාව 72 ක් වේ.

## කාර්ය සාධන ඉලක්ක - 2020

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 | 2020 |
| සමුපකාර ක්‍රමය ප්‍රවර්ධනය කිරීම. | ආරම්භ කරන ලද නව ව්‍යාපාර සංඛ්‍යාව (ස.ණ.ස, ශ්‍රම ඵලදායීතා සමිති) | 10 | 12 | 06 | 1 |
| | ලාභ ලබන සමිති සංඛ්‍යාව | 24 | 18 | 27 | 27 |
| | සමිති ප්‍රතිසංවිධානය (ස.ණ.ස සමිති) | - | - | 01 | 01 |
| | වර්ෂයේ නිම කළ විගණන ගණන (වි.සේ.ස සමිති, ස.ණ.ස සමිති, පාසල් සමුපකාර සමිති, වෙනත් සමිති, බැංකු සමිති) | - | - | 193 | 217 |
| සමුපකාර ජාලය ශක්තිමත් කිරීම. | පරිගණකගත කර ඇති ග්‍රාමීය බැංකු ශාඛා ප්‍රමාණය | 107 | 120 | 123 | 123 |
| | පළාත තුළ සිටින සමුපකාර සාමාජිකයින් සංඛ්‍යාව. | 269981 | 295479 | 319864 | 332469 |
| මානව සම්පත් වැඩි දියුණු කිරීම. | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව. | 03 | 03 | 04 | - |

## 6.1. සමුපකාර දෙපාර්තමේන්තු නියාමනය යටතේ සමුපකාර සමිති විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

### ග්‍රාමීය බැංකු අංශයේ තැන්පත් ප්‍රවර්ධනය

උතුරු මැද පළාත තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති 17 ක ග්‍රාමීය බැංකු ශාඛා 111ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති 09 ක ග්‍රාමීය බැංකු ශාඛා 45ක් ද පවත්වා ගෙන යනු ලබයි. මෙම ශාඛා 156 මඟින් සිංහල අළුත් අවුරුදු උත්සවය ඉලක්ක කර ගනිමින් සිදු කළ තැන්පත් ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගිණුම් 61354ක් අළුත්කළ අතර තැන්පත්වල මුල්‍යමය වටිනාකම රු.මි.439,33කි.**

### ග්‍රාමීය බැංකු නවීකරණය හා නව ග්‍රාමීය බැංකු ආරම්භ කිරීම.

වර්තමාන බැංකු ක්ෂේත්‍ර තුළ රාජ්‍ය හා වාණිජ බැංකු හා තරඟකාරී ලෙස කටයුතු කිරීමේ අරමුණින් තම ගනුදෙනුකරුවන් ආකර්ශණය දිනා ගැනීමට හා බැංකු කටයුතු පුළුල් කිරීමේ අරමුණින් නව බැංකු ආරම්භ කිරීම හා ග්‍රාමීය බැංකු නවීකරණය කිරීම සිදු කරයි. ග්‍රාමීය බැංකු ශාඛා 6 ක නවීකරණ කටයුතු සිදු කරනු ලැබිය. මේ සඳහා වැය වු මුදල රු.මි 0.99 කි.

### නවීකරණය කරන ලද ග්‍රාමීය බැංකු

| සමිතියේ නම | බැංකු ශාඛාවේ නම | වැය වූ මුදල |
|---|---|---|
| අනුරාධපුර වි.සේ.ස. | මයිලගස් හන්දිය ග්‍රාමීය බැංකුව | 0.12 |
| | කඩ 12 ග්‍රාමීය බැංකුව | 0.05 |
| | නුවරවැව ග්‍රාමීය බැංකුව | 0.19 |
| එප්පාවල වි.සේ.ස. | කටියාව යාය 01 ග්‍රාමීය බැංකුව | 0.02 |
| ගල්නෑව වි.සේ.ස. | කරුවලගස්වැව ග්‍රාමීය බැංකුව | 0.04 |
| පොළොන්නරුව වි.සේ.ස. | පරාක්‍රම සමුද්‍රය | 0.56 |

### පාරිභෝගික අංශය

| නවිකරණය කරන ලද සමුපකාර අලෙවි සැල් | |
|---|---|
| **සමිතිය** | **නවිකරණය කරන ලද සමුපකාර අලෙවි සැල්** |
| 01. දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතිය. | • බෝ අත්ත මිණිකෝප්සිටිය<br>• සිරිපුර මිණිකෝප්සිටිය<br>• දිඹුලාගල මිණිකෝප්සිටිය<br>• පැලටියාව මිණිකෝප්සිටිය |
| 02. පොළොන්නරුව විවිධ සේවා සමුපකාර සමිතිය. | • පරාක්‍රම සමුද්‍රය මිණිකෝප්සිටිය<br>• තඹලවැව මිණිකෝප්සිටිය<br>• අලුත්වැව මිණිකෝප්සිටිය<br>• පොලොන්නරුව තොග ගබඩාව |

### ඉන්ධන අංශය - නවීකරණය කරන ලද ඉන්ධනහල්

| අ.අ | සමිතිය | ඉන්ධනහලෙහි නම | වියදම (රු.මි) | ප්‍රතිපාදන ලබා ගත් අකාරය |
|---|---|---|---|---|
| 1 | සී/ස පොළොන්නරුව වි.සේ.ස සමිතිය | කදුරුවෙල ඉන්ධනහල | 20.17 | ඛනිජතෙල් සංස්ථාවේ අධාර යටතේ |
| 2 | සී/ස ගල්නෑව වි.සේ.ස සමිතිය | ගල්නෑව ඉන්ධනහල | 33.00 | ඛනිජතෙල් සංස්ථාවේ අධාර යටතේ |

## වෙනත් ව්‍යාපාරික අංශ - නවීකරණය කළ

| අ.අ | සමිතිය | වෙළඳසැලහි නම | වියදම (රු.මි) |
|---|---|---|---|
| 1 | සී/ස ගල්නෑව වි.සේ.ස සමිතිය | සෝයා පැකට් අංශය | 0.1 |

## 6.2 සමූපකාර සමිතීන් හි ධාරිතා සංවර්ධන වැඩසටහන්

සමිති සේවකයන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා සමිති විසින් ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලබයි. ඒ සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධිකරනය හා සම්පත් දායකත්වය මෙන්ම බාහිර සම්පත්දායකයන්ගේද සහභාගීත්වය ලබා ගනි. එලෙස 2020 වර්ෂයේ සිදු කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

| අ.අ | සමිතියේ නම | වැඩසටහන සංවිධානය කළ ආයතනය | වැඩසටහන | ප්‍රතිලාභය |
|---|---|---|---|---|
| 01 | සී/ස දිඹුලාගල විවිධ සේවා සමූපකාර සමිතිය | ජාතික සමූපකාර මණ්ඩලය | සමූපකාර උසස් පෙළ සඳහා සේවකයන් යොමු කිරීම | සේවකයන්ගෙ දැනුම ආකල්ප වර්ධනය කිරීම |
| | | දිඹුලාගල සේවක සණස | ග්‍රාමීය බැංකු ණය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම | සේවකයන්ගෙ දැනුම ආකල්ප වර්ධනය කිරීම හා කාර්යක්ෂමතාව වර්ධනය |
| 02 | සී/ස අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය | සී/ස අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය | පිරිත් දේශනයක් පැවැත්වීම | සේවක එකමුතුව වර්ධනය |
| | | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | ග්‍රාමීය බැංකු ගිණුම් පිලියෙල කිරීම පිළිබඳ දැනුවත් කිරීම | සේවක දැනුම වර්ධනය |
| | | සී/ස අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය | සේවක ත්‍යාග ලබා දීම | සේවක තෘප්තිය වර්ධනය |
| 03 | සී/ස පොලොන්නරුව විවිධ සේවා සමූපකාර සමිතිය | සී/ස පොලොන්නරුව විවිධ සේවා සමූපකාර සමිතිය | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන | සේවක දැනුම වර්ධනය |
| 04 | සී/ස ගල්නෑව විවිධ සේවා සමූපකාර සමිතිය | සී/ස අනුරාධපුර දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය | ඵලදායිතා සංකල්ප පුහුණු වැඩසටහන | සේවක තෘප්තිය වර්ධනය |
| 05 | සී/ස විජිත විවිධ සේවා සමූපකාර සමිතිය | ජාතික සමූපකාර මණ්ඩලය | සමූපකාර උසස් පෙළ සඳහා සේවකයන් යොමු කිරීම | සේවකයන්ගේ දැනුම ආකල්ප වර්ධනය කිරීම |
| 06 | සී/ස එප්පාවල විවිධ සේවා සමූපකාර සමිතිය | ජාතික සමූපකාර මණ්ඩලය | සමූපකාර උසස් පෙළ සඳහා සේවකයන් යොමු කිරීම | සේවකයන්ගේ දැනුම ආකල්ප වර්ධනය කිරීම |



අනුරාධපුර වි.සේ.ස. සමිතිය - පිරිත් දේශන පැවැත්ම

අනුරාධපුර වි.සේ.ස. සමිතිය - ග්‍රාමීය බැංකු අංශයේ ගිණුම් පිළියෙල කිරීම් පිළිබඳ වැඩසටහන





අනුරාධපුර වි.සේ.ස. සමිතිය - සේවක ත්‍යාග ලබා දීමේ වැඩසටහන් සිදු කිරීම

## කොවිඩ් 19 වසංගත තත්වය යටතේ ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන්

1. පලාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති විසින් එක් වී සමිති බල ප්‍රදේශය තුල සහනදායී මිලකට නිවසටම ගොස් භාණඩ අලෙවි කිරීම.

2. සී/ස මැදවච්චිය විවිධ සේවා සමූපකාර සමිතිය විසින් සමිති බල ප්‍රදේශය තුල සහනදායී මිලකට නිවසටම ගොස් භාණඩ අලෙවි කිරීම, අසරණ පවුල් සඳහා රු 1000.00 බඩු මල්ලක් නොමිලේ ලබා දීම, දුරකථනයෙන් භාණ්ඩ ඇණවුම් සඳහා භාණ්ඩ ලබා දීම හා රාජ්‍ය සේවකයන් වෙනුවෙන් භාණ්ඩ ලබා දීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

3. අනුරාධපුර වි.සේ.ස. සමිතිය මඟින් ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන් කොවිඩ් 19 රෝගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරිම.



4. අනුරාධපුර වි.සේ.ස. සමිතිය විසින් රටෙහි පැවති කොවිඩ් 19 තත්වය හමුවේ ඇදිරිනීතිය පවතින අවස්ථාවලදි අත්‍යවශ්‍ය සේවා ලෙස ක්‍රියාත්මක වී ජනතාව වෙත ගෙයින් ගෙට ගොස් භාණ්ඩ අලවි කිරීම.





5. අනුරාධපුර වි.සේ.ස . සමිතිය විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල (ම.නු.ප, නැ.නු.ප, මිහින්තලය) හා නගර සභාව හා එක්ව නිරෝධානය වන පවුල් සඳහා භාණ්ඩ මලු ලබා දීම





## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා එහි නිගමනය යටතේ පවතින සමිති මඟින් සමූපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය ඉටු කිරිම සඳහා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් 2020 වසරේ දි ක්‍රියාත්මක කරනු ලැබිය. ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ළඟා කර ගත් භෞතික ප්‍රගතිය 100% ලෙස සැලකිය හැකිය. එසේම රාජ්‍ය අරමුදල් යටතේ මෙන්ම සමිති අරමුදල් හා බාහිර ආයතනවල මූල්‍ය දායකත්වයෙන් ද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. එහි දි උපරිම මූල්‍ය කාර්යක්ෂමතාවය ඇති වන පරිදි කටයුතු කරන ලදි.

දෙපාර්තමේන්තුවේ අරමුණ හා ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු යම් ප්‍රමාණයක් පැවතීම ප්‍රධාන ගැටළු වශයෙන් පැවතුන ද සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල මනා කාර්ය සාධනයෙන් යුක්තව, සමූපකාර සේවකයින්ගේ හා පළාතේ පාරිභෝගික ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කැප වීමෙන් කටයුතු කළ අතර ආයතනික විනය හා මූල්‍ය විනය විධිමත්ව පවත්වා ගනිමින් 2020 වර්ෂය තුළදී මහජන ප්‍රසාදය ලබා ගැනීමටත් ඉහළ කාර්ය සාධනයක් කරා ළඟා විමටත් හැකි විය.

# 9.2.පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

## කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පසුබිම.

උතුරු මැද පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයට දායකත්වය සැපයීමට උතුරු මැද පළාත සතුව 2003 වර්ෂයට පෙර පේෂකර්ම දෙපාර්තමේන්තුව හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යනුවෙන් ආයතන 02ක් පැවති අතර 2003 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව විසින් ගත් තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් දෙපාර්තමේන්තු 02 ඒකාබද්ධ කොට පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබී ය. ඉන් පසු එකී එක් එක් දෙපාර්තමේන්තු යටතේ පාලනය වූ සියලුම අංශයන්හී පාලනය, අධීක්ෂණය සහ විවිධ අංශයන් සඳහා පහසුකම් සැපයීම යනාදි කාර්යයන් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. නව ආයතනයේ ප්‍රධාන පරමාර්ථයන් කිහිපයකි.

එක් එක් ආයතනයේ නිෂ්පාදන අංශ කළමනාකරණය කිරීම මගින් උතුරු මැද පළාත් සභාවට සැලකිය යුතු ආදායමක් එකතු කිරීම හා එම ආයතනවල එක් එක් අංශ මගින් උතුරු මැද පළාතේ වෙසෙන තරුණ තරුණියන්හට වෘත්තීය පුහුණුව ලබාදීම ඒ අතර ප්‍රමුඛ පරමාර්ථයක් බවට පත්ව ඇත.

උතුරු මැද පළාත තුළ අපතේ යන ශ්‍රමය ඵලදායීව යොදවා ගනිමින් නිර්මාණශීලීව ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් සංවර්ධනය කරලීම, ස්වයං රැකියා අවස්ථා උදා කරලීම, දැනට ක්ෂත්‍රයේ සිටින කණ්ඩායම්වල තාක්ෂණික සහ ව්‍යවසායකත්ව හැකියාවන් ප්‍රවර්ධනය කිරිම නව ස්වයං රැකියා අවස්ථා සඳහා ඔවුන්ව යොමු කිරිමට අවශ්‍ය මූලික පදනම සැකසීම සහ සමාජීය සංවර්ධනය ඇති කරලීම සහ ඊට අවශ්‍ය සේවා සපයන්නෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. එමගින් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත වඩු කර්මාන්ත යන ප්‍රධාන අංශ 03ක් යටතේ දේශීය දළ ජාතික නිෂ්පාදන කාර්යට උර දෙමින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා විවිධ කාර්යයන් රැසක් මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි.

මෙකී අරමුණු ඉටුකර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 41ක් සහ වඩු කර්මාන්ත මධ්‍යස්ථාන 10ක් පළාත පුරා ස්ථාපනය කර ඇත. මීට අමතරව ග්‍රාමීය මට්ටමේ කර්මාන්ත සහ හස්ත කර්මාන්ත අංශය නගාසිටුවීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් සහ නිෂ්පාදනයේ ගුණාත්මක බව වර්ධනය කිරිම සඳහා අවශ්‍ය තාක්ෂණ කුසලතා හා ප්‍රාග්ධන උපකරණ ලබා දීමෙන් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මහගු කාර්ය භාරයක් ඉටු කරයි.

මෙම දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය පුරවැසියන්ට අමතරව රාජ්‍ය ආයතන හා ව්‍යාපාරික ප්‍රජාව සඳහා ද පහත සඳහන් සේවාවන් සපයමින් සිය කාර්යභාරය තව දුරටත් පුළුල් කර ඇත.

- ව්‍යාපාරිකයින්ට සිය නිෂ්පාදන කාර්යන් සඳහා අවශ්‍යවන වඩු කාර්මික නිෂ්පාදන ලබා දීම සහ වෘත්තීය පුහුණුවක් සහිත වඩු කාර්මිකයින් තම ව්‍යාපාර කටයුතු සඳහා නිෂ්පාදකයින් ලෙස යොදා ගැනීමට හැකි වන අවස්ථා විවර කරදීම.

- නව නිෂ්පාදන සඳහා පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කිරිමෙහිලා වාර්ෂිකව පවත්වනු ලබන ප්‍රදර්ශනවලදි ව්‍යාපාරික ප්‍රජාවට සහභාගි වීමේ අවස්ථා ලබා දීම.

## දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ආයතන

| | | |
|---|---|---|
| අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන | - | 27 |
| පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන | - | 14 |
| අනුරාධපුර අලෙවි මධ්‍යස්ථාන | - | 03 |
| පොළොන්නරුව අලෙවි මධ්‍යස්ථාන | - | 01 |

### අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන - 27

| | |
|---|---|
| නොච්චියාගම | පල්ලේකාගම |
| මුදිතාගම | වලච්චේගම |
| රළපනාව | මානැව |
| පණ්ඩුලගම | කලාකරඹෑව |
| පෙරිමියන්කුලම | හිරිපිටියාගම |
| කටුකැලියාව | නෙළුඹෑව |
| රුවන්ගම | කල්පේ |
| පුබ්බෝගම | 21 ජනපදය |
| මානේරුව | ගෝමරන්කල්ල |
| නෙළුම්පත්ගම | හුරුළු නිකවැව |
| රාජාංගනය | තිරප්පනේ |
| රඹෑව | මාමිනියාව |
| දෙමටගල | හුරිගස්වැව |
| නාමල්පුර | |

### පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන - 14

| | |
|---|---|
| පත්තිනි පෙදෙසගම | බුද්ධයාය |
| නෙළුම්විල | අතරගල්ලෑව |
| කඩවලවැව | අත්තනකඩවලවැව |
| බෝ අත්ත | අරලගන්විල |
| හිඟුරක්දමන | පැරකුම් |
| රජඇලගම | බැදිවැව |
| පුලතිසිගම | තල්පොත |

### අලෙවි මධ්‍යස්ථාන - 04

| | |
|---|---|
| කඩ පනහ | - අනුරාධපුර |
| කච්චේරිය | - අනුරාධපුර |
| තිරප්පනේ | - අනුරාධපුර |
| රජ ඇලගම | - පොළොන්නරුව |

## අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේ පිහිටි වඩු පාසල්

| අ.අ | වඩු පාසල | ස්ථානය |
|---|---|---|
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | |
| 1 | සෙලෙස්තිමඩුව යාන්ත්‍රික වඩු පාසල | නාච්චාදූව |
| 2 | කලාවැව යාන්ත්‍රික වඩු පාසල | ඉපලෝගම |
| 3 | නොච්චියාගම යාන්ත්‍රික වඩු පාසල | නොච්චියාගම |
| 4 | කැකිරාව යාන්ත්‍රික වඩු පාසල | කැකිරාව |
| 5 | ගලෙන්බිඳුණුවැව යාන්ත්‍රික වඩු පාසල | ගලෙන්බිඳුණුවැව |
| 6 | මානිංගමුව යාන්ත්‍රික වඩු පාසල | මානිංගමුව |
| 7 | ඒරියාගම දැව තාක්ෂණ උසස් පුහුණු ආයතනය | තලාව |
| | පොළොන්නරුව දිස්ත්‍රික්කය | |
| 8 | ඔරුබැදිසියඹලාව යාන්ත්‍රික වඩු පාසල | ඇලහැර |
| 9 | ගිරිපොකුණ යාන්ත්‍රික වඩු පාසල | දිඹුලාගල |
| 10 | මැදිරිගිරිය යාන්ත්‍රික වඩු පාසල | මැදිරිගිරිය |

## දැක්ම

"නිර්මාණශීලි කර්මාන්ත ප්‍රජාවක්, අභිමානවත් පළාතක්".

## මෙහෙවර

"කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත්, ආයෝජන, නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන, සියළු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රවර්ධනය කිරීම.

## දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් ජාතික නිෂ්පාදනයට කරනු ලබන්නා වූ දායකත්වය ඉහළ නංවාලීම හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම.

## කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ශිල්පීන්හට රැකියා අවස්ථා සලසා දීම හා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ජාතික ප්‍රමිති තත්ත්වයට නංවාලීම හා පවත්නා නිෂ්පාදන අලෙවි ආදායම් මට්ටම ඉහළ නැංවීම හා වැඩිකිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ කර්මාන්ත අංශයේ ආයෝජන ප්‍රවර්ධනය.
- ❖ නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා සංවර්ධනය.
- ❖ පර්යේෂණ හා සංවර්ධනය.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ යහපාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ හස්ත කර්මාන්තය, පේෂ කර්මාන්ත හා වඩු කර්මාන්ත යන අංශවල කර්මාන්තකරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගුණාත්මක නිර්මාණ හා නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කිරීම.
- ❖ ස්වයං රැකියාවන්ට යොමු කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආධාර ලබා දී අලෙවි පහසුකම් ද සලසා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම.

## කාර්ය මණ්ඩල තොරතුරු - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 155ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 115 කි. පුරප්පාඩු සංඛ්‍යාව 40 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ

1. පේෂකර්මාන්ත අංශය හා වඩු කර්මාන්ත අංශය සඳහා පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීම තුළින් ඵලදායී පුරවැසියෙක් - කුසලතා පූර්ණ මානව සම්පතක් රටට බිහි කිරීම.
2. ග්‍රාමීය වශයෙන් ස්වයං රැකියා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් රැකියා වෙළඳපොළ තුළ කාන්තා දායකත්වය ඉහළ නැංවීම.
3. රටෙහි තිරසාර පැවැත්ම උදෙසා ද්විතීක අධ්‍යාපනය අවසන් කරන සිසුන් වඩු කර්මාන්තයට යොමු කිරීම උදෙසා අදාල මූලික දැනුම හා උපකරණ කට්ටල ලබාදීම.
4. දේශිය ආර්ථිකය නංවාලිම උදෙසා දේශිය නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය.
5. පරිසර හිතකාමී නිෂ්පාදන බිහි කිරීම හා ඒවා භාවිතයට මහජනයා දිරි ගැන්වීම.

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 9 | 9.2<br>9 ආ | 9.2.1<br>9.ආ.1 | මිළ පත්‍රිකා ඇමුණුම් යන්ත්‍ර 42ක් හා ඉලෙක්ට්‍රොනික තරාදි 09ක් පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා ලබාදීම | 0.20 | 0.19 |
| | | | 60"අත්යන්ත්‍ර 18ක් හා මෝටර් වෛන්ඩින් යන්ත්‍ර 7ක් මිලදී ගැනීම | 1.25 | 1.25 |
| 9 | 9.2 | 9.2.2 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම යටතේ අධෝරක්ත උෂ්ණත්ව මාපකයක් මිලදී ගැනීම | 0.009 | 0.006 |

## ඉලක්ක කරා ලගාවීම කෙරෙහි 2020 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යපෘති

| ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | වෙන් කළ (රු.මි) | වැයකළ (රු.මි) | ප්‍රගතිය ( %) |
|---|---|---|---|---|
| මිළ පත්‍රිකා ඇමුණුම් යන්ත්‍ර 42ක් හා ඉලෙක්ට්‍රොනික තරාදි 09ක් පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා ලබාදීම | 1000 වැඩි | 0.20 | 0.19 | 95 |
| 60"අත්යන්ත්‍ර 18ක් හා මෝටර් වෛන්ඩින් යන්ත්‍ර 7ක් මිලදී ගැනීම | 250 වැඩි | 1.25 | 1.25 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම යටතේ අධෝරක්ත උෂ්ණත්ව මාපකයක් මිලදී ගැනීම | 1000 වැඩි | 0.009 | 0.007 | 78 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය (Outcome Index) | ඉලක්කය කරා ළඟාවීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 01 | මිළ පත්‍රිකා ඇමුණුම් යන්ත්‍ර 42ක් හා ඉලෙක්ට්‍රොනික තරාදි 09ක් මිලදී ගැනිම | 100% | 100% |
| 02 | 60"අත්යන්ත්‍ර 18ක් හා මෝටර් වෛන්ඩින් යන්ත්‍ර 7ක් මිලදී | 100% | 100% |
| 03 | අධෝරක්ත උෂ්ණත්ව මාපකයක් මිලදී ගැනීම | 100% | 100% |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා විමට කරන ලද දායකත්වය

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමෙහිලා මෙම දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 1.49 කට ආසන්න මුදලක් 2020 වර්ෂය වෙනුවෙන් ආයෝජනය කර ඇති අතර එහිදි රුපියල් මිලියන 1.46කට ආසන්න මුදලක් වැය කර ඇත. එහිදි උතුරු මැද පළාත තුළ කුඩා කර්මාන්ත කරුවන් හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් මෙන්ම ව්‍යවසායකයින්ටත් පාසල් හැර යන ළමුන්ද ඇතුළුව විශාල පිරිසක් මෙම ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් මගින් ප්‍රතිලාභ ලබා ඇත. මෙම දෙපාර්තමේන්තුව විසින් දේශීය නිෂ්පාදන භාවිතය දිරිගැන්වීම උදෙසා නිෂ්පාදන වල ගුණාත්වය ඉහළ නැංවීම හා පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණු | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කල (රු.මි) | වැය කල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1 | අත්යන්ත්‍ර හා මෝටර් වෛන්ඩින් යන්ත්‍ර මිලදී ගැනීම | නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම | 1.25 | 1.25 | 100% | 100% | • නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම<br>• සැපයුම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම<br>• නාස්තිය අවම කිරීම<br>• අලෙවි ආදායම ඉහළ නැංවීම<br>• පුහුණුලාභීන් වර්ධනය<br>• පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම<br>• අලෙවි ආදායම හා ලාභය උපරිම කිරීම |

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදි ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අදහස් හා යෝජනා

අප දෙපාර්තමේන්තුවේ දැක්ම කරා ලගා වීම උදෙසා 2021 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව යටතේ පවත්නා පේෂකර්ම මධ්‍යස්ථාන මෙන්ම වඩු පුහුණු පාසල් නවීකරණය, යටිතල පහසුකම් සංවර්ධනය, නව තාක්ෂණය උපයෝජනය මෙන්ම කාර්යාල නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව හා කාර්යාලයේ ධාරිතාව සංවර්ධනය සඳහාද විශේෂ අවධානයක් යොමු කරමින් 2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සැලසුම් කර ඇත. අප දෙපාර්තමේන්තුව යටතේ ඇති පේෂකර්ම මධ්‍යස්ථාන හා වඩු පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය තුලින් නිෂ්පාදන කාර්යක්ෂමතාව වර්ධනය, නිෂ්පාදන ධාරිතාව වර්ධනය, පුහුණුලාභීන් වර්ධනය තුලින් රැකියා වියුක්තිය අඩු කරලීම, දරිද්‍රතාවය අඩු කරලීම, දේශීය නිෂ්පාදන භාවිතය වර්ධනය, පරිසර හිතකාමී නිෂ්පාදන බිහිකිරීම, ග්‍රාමීය කර්මාන්ත වර්ධනය යන අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරමි.

තවද කාර්යාලයේ ධාරිතාව වර්ධනය කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම තුලින් නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සැපයීම, පාරිභෝගික ආකර්ෂණය, ආදායම් උත්පාදනය වර්ධනය වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

## අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුලත් ගමන් මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| නව තාක්ෂණික පේෂකර්ම අත්යන්ත්‍ර හා වඩු කර්මාන්ත අංශය සඳහා යන්ත්‍ර නිෂ්පාදනය සඳහා එක් කිරීම | නිෂ්පාදනය ඉහළ නැංවීම | ආදායම් උත්පාදනය වර්ධනය කිරීම |
| අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | නිෂ්පාදන අලෙවිය ඉහල නැංවීම | ආදායම් උත්පාදනය වර්ධනය හා දේශිය නිෂ්පාදන ජනතාව අතර ප්‍රවර්ධනය<br>රාජ්‍ය සේවකයින් මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා අවම කාලයකින් නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව සැපයීම හා ඔවුන්ගේ අවශ්‍යතා පරිදි නිෂ්පාදන සැපයීම හා විශේෂ ගෙවීම් ක්‍රම යටතේ ණය පදනම මත රෙදි අලෙවිය |
| නූල් වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | අමුද්‍රව්‍ය පිරිවැය අවම කර ගැනීම හා ගුණාත්මක භාවය ඉහළ නැංවීම | පාරිභෝගික ආකර්ෂණය ඉහල නැංවීම තුලින් ආදායම් වර්ධනය කර ගැනීම<br>නිෂ්පාදන සඳහා ඉහළ වටිනාකමක් ලබාදීම<br>පාරිභෝගිකයින්ගේ ඉල්ලුම පරිදි නිෂ්පාදන සැපයීම |
| නව අලෙවි මධ්‍යස්ථාන හා ප්‍රදර්ශනාගාර ඉදි කිරීම | නිෂ්පාදන අලෙවිය ඉහළ නැංවීම | දේශිය මෙන්ම විදේශිය පාරිභෝගිකයන්ගේ ආකර්ෂණය ඉහළ නැංවීම<br>රාජ්‍ය සේවකයින් මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා අවම කාලයකින් නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව සැපයීම හා ඔවුන්ගේ අවශ්‍යතා පරිදි නිෂ්පාදන සැපයීම |
| පවතින පේෂකර්ම මධ්‍යස්ථාන හා වඩු පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියාව හා යටිතල පහසුකම් සංවර්ධනය | සේවක සුභසාධනය ඉහල නැංවීම | සේවක කාර්යක්ෂමතාවය හා තෘප්තිය ඉහල නැංවීම තුලින් නිෂ්පාදන ධාරිතාවය වැඩි කර ගැනීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

මෙම දෙපාර්තමේන්තුව සඳහා 2020 වර්ෂයට ලැබුණු ප්‍රතිපාදන මගින් මිළ පත්‍රිකා ඇමුණුම් යන්ත්‍ර 42ක් හා ඉලෙක්ට්‍රොනික තරාදි 09ක් පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා ලබාදීම, 60"අත්යන්ත්‍ර 18ක් හා මෝටර් වෛන්ඩින් යන්ත්‍ර 7ක් මිලදී ගැනීම හා පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා වූ යටිතල පහසුකම් දියුණු කිරීම් සිදු කරන ලදී. මෙහිදි ඌන උපයෝජනයකින් තොරව සියළුම ව්‍යාපෘතීන් 100%කින් නිම කිරීමට මෙම වර්ෂයේදී හැකි විය.

## කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

01. සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ප්‍රමාදවී ලැබීම.

02. ඉදි කිරීම් හා අළුත්වැඩියා සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ලබා ගැනීමට ප්‍රමාද වීම.

03. ප්‍රතිපාදන සීමා වීම නිසා ඇස්තමේන්තු සකස් කිරීමට අසීරු වීම.

04. රජයේ කාර්යාල වසා තැබීම හා සේවක සංඛ්‍යාව සීමා කිරීම, සැලසුම් අනුමත කිරීමේදී හා හැකියා සහතික ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදු වීම.

05. පාරිභෝගිකයන්ගේ පැමිණීම අඩුවීම හේතුවෙන් අලෙවි ආදායම පහල යාම.

06. කාර්මිකාවන් මෙන්ම නිලධාරීන්ගේ සේවයට වාර්තා කිරීම අඩුවීම.

07. අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා හා ප්‍රමාදවීම.

08. වඩු පාසල්හි පාඨමාලා කඩින්කඩ පැවැත්වීම හේතුවෙන් සිසුන් පාඨමාලා හැර යාම.

09. වඩු පාසල් අධ්‍යාපනය සඳහා සිසුන්ගේ පැමිණීම දුර්වල වීම.

10. නියමිත කාල පරාසය තුලදී පාඨමාලා අවසන් කිරීමට නොහැකිවීමෙන් විභාග ආදිය නියමිත දිනයන්ට පැවැත්වීමට නොහැකි වීම.

11. වාර්ෂිකව පවත්වනු ලබන කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් අලෙවි ප්‍රවර්ධන කටයුතු අඩාලවීම.

ගෝලීය වසංගත තත්ත්වය යටතේ 2020 වර්ෂයේදී පසුගිය වර්ෂ මෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන අප දෙපාර්තමේන්තුව සඳහා වෙන් නොවූ අතර සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් බොහොමයක් අත්හිටුවීමට කටයුතු කරන ලදී. එබැවින් අප දෙපාර්තමේන්තුව සඳහා වෙන් වූ ප්‍රතිපාදන මගින් දෙපාර්තමේන්තුව සඳහා අත්‍යාවශ්‍ය සංවර්ධන වැඩසටහන් කිහිපයක් පමණක් සිදු කරන ලදී.

රටෙහි පැවැති වසංගත තත්ත්වය යටතේ පාරිභෝගිකයන්ගේ පැමිණීම විශාල වශයෙන් අඩුවක් පැවැති අතර විවිධ ජංගම අලෙවි වැඩසටහන් ඔස්සේ පාරිභෝගිකයන් සඳහා නිෂ්පාදන අලෙවි කරන ලදී. රාජ්‍ය ආයතන සඳහා නිලධාරින් ගෙන්වීම සීමා සහිතව සිදු කල අතර එහිදී පැමිණෙන නිලධාරීන් උපරිම කාර්යක්ෂමතාවයෙන් තම සේවය සිදු කිරීමට පෙළඹිණි. ඔවුන්ගේ සෞඛ්‍යාරක්ෂාව උදෙසා දුරස්ථභාවය ආරක්ෂා කර ගනිමින්, දෙපාර්තමේන්තුවේ ඉලක්ක වෙත ඔවුන් මෙහෙයවා අදාල රාජකාරී ප්‍රමාදයකින් තොරව සිදු කරන ලදී.

# 9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

2003 අංක 2 දරණ උතුරු මැද පළාත් ප්‍රඥප්ති ප්‍රකාරව මෙම ආයතනය ආරම්භ කර ඇත.

## දැක්ම

"උතුරු මැද පළාතේ හොඳම කර්මාන්ත ප්‍රවර්ධකයා වෙමින් තිරසාර සංවර්ධනයේ ප්‍රධානතම පහසුකම් සලසන්නා වීම".

## මෙහෙවර

"උතුරු මැද පළාතේ සම්පත් ඵලදායි ලෙස යොදා ගනිමින් වෙළඳපොළ අභිමුඛ කාර්මීකරණයක් තුළින් අදාළ පාර්ශවකරුවන් සමඟ උතුරු මැද පළාතේ නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම".

## දිගුකාලීන අරමුණු

- පළාතේ කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම.
- පළාතේ කර්මාන්ත ව්‍යාප්තිය හා නවීකරණය කිරීම.
- පළාතේ කර්මාන්ත විවිධාංගීකරණය හා දිරි ගැන්වීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් සොයා දීමට මැදිහත්වීම.

## කෙටිකාලීන අරමුණු

- පළාතේ නව කර්මාන්ත බිහි කිරීම සහ පවත්නා කර්මාන්තවල ප්‍රවර්ධනයක් ඇති කිරීම.
- පළාතේ නව සහ දැනට පවත්වාගෙන යනු ලබන කර්මාන්ත අධිකාරිය යටතේ ගාස්තු ප්‍රමාණයක් යටතේ ලියාපදිංචි කිරීම.
- පවතින සහ නව කර්මාන්ත සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන හා තාක්ෂණික පුහුණු පාඨමාලා පැවැත්වීම.
- පළාතේ කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා සහන මිලකට උපකරණ ලබා දීම.
- පුහුණු කිරීම හා උපදේශන සේවා මගින් පළාතේ කර්මාන්ත ඒකකවල කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- තාක්ෂණික පැවරීම, තාක්ෂණික තොරතුරු ලබා ගැනීම සහ බෙදා හැරීම යාවත්කාලීන කරන ලද තාක්ෂණය සහ නව තාක්ෂණය යනාදි සේවාවන් ව්‍යවසායකයින් වෙත ලබා දීම.
- කර්මාන්ත නිෂ්පාදනවල අලෙවිය පහසු කරනු වස් සම්මන්ත්‍රණ වැඩමුළු, දේශීය හා විදේශීය අලෙවි පොළවල් හා ප්‍රදර්ශන පැවැත්වීම.

## ප්‍රධාන කාර්යයන්

- ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික, ව්‍යවසායක පුහුණු හා මූල්‍ය පහසුකම්, තාක්ෂණික උපකරණ ලබාදීම.
- ව්‍යවසායක සංගම් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.
- පළාතේ කර්මාන්තකරුවන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිකර ගැනීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම.
- සුළු පරිමාණ කර්මාන්තකරුවන් සඳහා සහන පොලී අනුපාතයක් යටතේ ණය ලබා දීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- යටිතල පහසුකම් සැලසීම.
- මූල්‍ය පහසුකම් සලසා දීම.
- ආකල්ප වර්ධනයට හා කුසලතා වර්ධනයට සුදුසු දේශකයන් යොදා ගැනීම.
- වෙළෙඳපොල අවස්ථා සලසා දීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 12ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 04 කි. පුරප්පාඩු සංඛ්‍යාව 08 ක් ද අනියම් පදනමින් 03 දෙනෙකු තාවකාලික පදනමින් 02 දෙනෙක් කොන්ත්‍රාත් පදනමින් 01 අයෙකු ද පුහුණු ලෙස 01 අයෙකු ද සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග.

01. උතුරු මැද පළාතේ ක්ෂුද්‍ර හා සුළුපරිමාණ ව්‍යවසායකයන් කේෂ්ත්‍රයේ රඳවා තැබීම සඳහා යටිතල පහසුකම් ලබාදීම.

02. ජාතික ආදායමට උතුරු මැද පළාත් කර්මාන්තකරුවන්ගේ දායකත්වය පවතින අවමභාවය වැඩිකිරීමට ප්‍රයන්තයන් දැරීම.

## තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජන (රු.මි) (සුළුපරිමාණ ණය නිකුත් කිරීම) |
|---|---|---|---|---|
| 01 | 1.3 | 1.1 | සුළු පරිමාණ ව්‍යවසායකත්ව ණය වැඩසටහන් | 11.30 |
| 05 | 5.1 | 5.1.1 | | |
| 09 | 9.2 | 9.2.1<br>9.2.2 | | |
| | 9.3 | 9.31<br>9.3.2 | | |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා විම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| ණයලබාදීම | ව්‍යවසායකයින් ගණන | 46 | 46 | 60 | 80 | 100 | 4.42 | 6.0 | 8.0 | 10.0 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළගා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියන්හි ප්‍රගතිය

| අනු.අංක | ප්‍රතිඵල දර්ශකය | ඉලක්කය කරා ළඟාවීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 01. | ව්‍යවසායකයින් ගණන | 46 | *85% |

*** ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම.**

## පසුගිය වසර 03 ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

කර්මාන්ත වැඩිදියුණු කරගැනීමේ අරමුණින් සුළු පරිමාණ ණය වැඩසටහන යටතේ ණය ලබාදීම සඳහා 2017, 2018, 2019, 2020 යන වර්ෂ වලදී පිළිවෙළින් රු. මි. 6.6ක් 3.9 ක් 8.5 ක් හා 4.4 ක් වැයකරන ලදී. එමඟින් පුද්ගලයන් 69 ක් 39 ක් 87 ක් හා 46 ක් සඳහා ප්‍රතිලාභ හිමිවන ලදී.

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

තිරසාර අරමුණු, දර්ශක හා ඉලක්ක සපුරා ගනිමින් 2020 සුළුපරිමාණ ණයකරුවන් 46 දෙනෙකු සඳහා රු.මි.4.42 ක් ලබාදෙමින් සුළුපරිමාණ කර්මාන්තකරුවන් දිරිගන්වන ලදී.

## තම ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

### 1.සොයමු . lk (soyamu.lk) නිෂ්පාදන හා පාරිභෝගික වෙබ් අඩවියක් සකස් කිරිම

නිෂ්පාදන/සේවා සපයන පිරිස හා පාරිභෝගිකයින් සම්බන්ධ විය හැකි මාර්ගගත වේදිකාව(Online Flat form) සකස් කිරීම තුලින් නිෂ්පාදනයන් වෙළඳපොලට හඳුන්වා දීම, නිෂ්පාදකයන් සඳහා වෙළඳ පොලක් සොයාගැනීම, නිෂ්පාදකයන් අදාළ ක්ෂේත්‍රයේ රඳවා තැබීම මේ යටතේ අදහස් කෙරේ. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි.0.7 කි.

### 2.අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය

ධාන්‍ය පිරිකිරීම, සැකසීම, ඇසුරුම්කරණය, තත්ත්වය හා ගුණාත්මකබව ආරක්ෂාකිරීම, සන්නාමකරණය පිළිබඳ පුහුණු අවස්ථා ලබාදීම තුලින් අමුද්‍රව්‍ය නිෂ්පාදනයට හුරුවී සිටින ව්‍යවසායකයන් නිමිද්‍රව්‍ය නිෂ්පාදකයන් බවට පත් කිරීමට අදහස් කෙරේ. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි. 2.0 කි.

### 3.ආනයන ආදේශන දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය

ආනයනය නවතා ඇති ඉදල් කොසු හා ආශ්‍රිත නිෂ්පාදන සඳහා තාක්ෂණික සහාය අලෙවිකරණය හා පුහුණු අවස්තා ලබාදීම තුලින් විදේශගතවන විදේශ විනිමය රටතුල රඳවා ගැනීමට උත්සහ කිරීම සහ රටේ නිෂ්පාදිත අමුද්‍රව්‍ය කර්මාන්ත සඳහා යොදාගැනීමට දිරිදීම. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි. 0.5 කි.

### 4.අපනයන අභිමුක කර්මාන්ත ඉලක්ක කරගත් කර්මාන්ත ප්‍රවර්ධනය

විසිතුරු ශාක පත්‍ර අපනයනය කිරීම තුලින් සුළු නිෂ්පාදකයන් සම්ප්‍රදායික ගොවිතැනින් බැහැර කිරීමට උත්සහ කිරීම. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි. 1.5 කි.

### 5.ජීවනෝපාය සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

අධිකාරිය මගින් කර්මාන්තකරුවන් දැනටමත් ඉල්ලා ඇති පුහුණු අවස්තා ලබාදී ඔවුන්ගේ හැකියාවන් ජාත්‍යන්තර තලයට ඔසවා තැබීමට කටයුතු සම්පාදනය කරයි. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි. 0.5

### 6.ව්‍යවසායකයින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරිම.

මූලික ව්‍යාපාර දැනුම, ව්‍යාපාර ගිණුම් හා පොත්පත් පවත්වාගෙන යාම පිළිබඳ මූලික දැනුම ලබාදී කර්මාන්තකරුවන්ගේ ව්‍යවසායකත්වය දියුණු කිරීම. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි. 0.3 කි.

### 7.කාර්යාල උපකරණ මිලදී ගැනිම

වඩාත් කාර්යක්ෂම පළාත් රාජ්‍ය සේවාවන් උදෙසා සහය ලබා දීම. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි. 0.5 කි.

### 8.කාර්යාලය අලුත් වැඩියා කිරිම.

වඩාත් කාර්යක්ෂම පළාත් රාජ්‍ය සේවාවන් උදෙසා සහය ලබා දීම. මේ සඳහා ඇස්තමේන්තු මුදල රු.මි. 1.0 කි.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුලත්ගමන් මඟ | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| සොයමු. lk (soyamu.lk) නිෂ්පාදන හා පාරිභෝගික වෙබ් අඩවියක් සකස් කිරිම. | නව කර්මාන්තකරුවන් පහසුවෙන් හඳුනාගැනීම. | කර්මාන්තකරුවන් සඳහා අලෙවි කිරීමේ අවස්ථා වැඩිවීම. |
| අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය. | අදායම් තත්වය ඉහළ නැංවීම. | අමුද්‍රව්‍ය නිෂ්පාදනයෙන් නිමි ද්‍රව්‍ය නිෂ්පාදනයට යොමු වීම. |
| ආනයන ආදේශන දේශිය කර්මාන්ත ප්‍රවර්ධනය. | නිෂ්පාදකයන්ගේ ආදායම වර්ධනය කිරීම. | අපනයන ආදායම ඉහළ නැංවීම. |
| අපනයන අභිමුඛ කර්මාන්ත ඉලක්ක කරගත් කර්මාන්ත ප්‍රවර්ධනය. | සුළුපරිමාණ කර්මාන්තකරුවන් සම්ප්‍රදායක කර්මාන්ත වලින් ඉවත් කිරීම. | ආදායම ඉහළ නැංවීම. |
| ජිවනෝපාය සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්විම. | දැනුම යාවත්කාලීන කිරීම. | නිෂ්පාදනය වැඩිදියුණු කිරීම. |
| ව්‍යවසායකයින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරිම. | කුසලතා පූර්ණ ව්‍යවසායකයන් බිහිවීම. | නව නිෂ්පාදන කරා යොමු වීම. |
| කාර්යාල උපකරණ මිලදී ගැනිම. | කාර්යක්ෂම පළාත් රාජ්‍ය සේවයක් සඳහා මඟ පෑදීම. | |
| කාර්යාලය අලුත් වැඩියා කිරිම. | | |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2020 වර්ෂයේ විශේෂයෙන් සුළුපරිමාණ කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත නගාසිටුවීමේ අරමුණින් සහන පොලී අනුපාතයක් මත සුළුපරිමාණ ණය ලබාදීමට කටයුතු කරන ලදී. එහෙත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ දැක්ම හා මෙහෙවර අනුව යමින් පළාතේ කර්මාන්ත නගාසිටුවීම සඳහා කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.









## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී ආයතනය සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

මෙම ආයතනයේ කටයුතු ඍජුවම මහජනතාව ඉලක්ක කරගෙන මෙහෙයවන ඒවා වන අතර, කොවිඩ් 19 වසංගතය නිසා පෙර වසර මෙන් මහජනතාව සමඟ උරෙන් උර ගැටෙමින් කටයුතු කළ නොහැකි විය. එහෙයින් ඔවුන් සමූහ වශයෙන් රැස්කරගැනීම වළක්වමින් එක් අවස්ථාවකින් අවසන් කිරීමට තිබූ කාර්යයන් වෙනුවෙන් කිහිපවරක් සංවිධානය කිරීමට සිදුවූ අතර, මහජනතාවද මෙම වැඩසටහන් සඳහා පෙර පරිදි උද්යෝගයෙන් සහභාගි නොවූ හෙයින් ඉලක්කගත කාර්යයන් වලින් 70% ක් පමණ සාර්ථක කරගැනීම හැකිවුනි.

# 9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය ආරම්භ වීමෙන් පසු මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක කරන ලද පොදු ප්‍රවාහන සේවාවන් පළාත් සභා විෂයපථය යටතට ඇතුළත් කොට ඇත. ඒ අනුව ඒ ඒ පළාත් සභා විසින් ප්‍රඥප්ති අනුමත කරවා " පළාත ඇතුළත මෝටර් වාහන මගින් මාර්ග ඔස්සේ මගීන් ගෙන යෑමේ සේවා සහ භාණ්ඩ ගෙනයාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම" යන ව්‍යවස්ථාමය බලතල ක්‍රියාත්මක කරනුවස් 1994 අංක 08 දරණ ප්‍රඥප්තිය මගින් උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවන ලදී. වර්තමානය වනවිට උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් මහඟු කාර්යභාරයක් ඉටු කරයි. බස් රථ ඇතුළු මගී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය, ආරක්ෂිත හා ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම, බස්නැවතුම්පළ කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය ආදී කරුණු ප්‍රධාන වන අතර එමගින් ජාතික ආර්ථිකයට සපයන දායකත්වය සුළුපටු නොවේ. නිදසුනක් ලෙස 2020 වර්ෂය අවසන් වන විට උතුරු මැද පළාත් මර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පමණක් බස් රථ 780ක් ද, ත්‍රී රෝද රථ 2350 ක් ද, පාසැල් ප්‍රවාහන රථ 40 ක් ද, සිසු සැරි බස් රථ 120 ක් ද අධිකාරියේ ලියාපදිංචි කොට පළාත් ප්‍රවාහන පද්ධතියට එකතුකොට ඇත. එමෙන්ම උතුරු මැද පලාතේ බස්නැවතුම්පළ පර්යන්ත පහසුකම් ලබාදෙන බස්රථ සංඛ්‍යාව 480ක් වන අතර බස්රථ 290ක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ බස්නැවතුම් ද බස්රථ 190ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බස්නැවතුම්පළ පර්යන්ත පහසුකම් ලබාදීම උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය මඟින් සිදු කරයි. උතුරු මැද පළාත තුළ සංසරණයවන බස් රථ නියාමනය කිරීම සඳහා දිස්ත්‍රික්ක දෙකෙහි කාර්යාල දෙකක් පිහිටුවා ඇත. උතුරු මැද පළාතේ මාර්ග 193ක් පිහිටා ඇත. ඉන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාර්ග 150 ක් ද පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මාර්ග 43 ක් ද පිහිටා ඇත.පළාත තුළ ප්‍රධාන බස් නැවතුම්පළ 20 ක් හා උප බස් නැවතුම්පළ 21ක් ස්ථාපිතකර ඇති අතර එහි නියුක්ත සේවක සංඛ්‍යාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ 50ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 22ක්ද අනුරාධපුර ප්‍රධාන කාර්යාලයේ සේවක සංඛ්‍යාව 46ක්ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ සේවක සංඛ්‍යාව 06කි.

දෛනිකව ධාවනය වන ගමන් වාර සංඛ්‍යාව 2475ක් පමණ වන අතර ඉන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගමන් වාර සංඛ්‍යාව 1734 ක් ද පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගමන් වාර සංඛ්‍යාව 741 ක් ද වේ. මෙම පළාත තුළ ධාවනය වන බස් රථවල සේවයේ නියුක්ත මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ලියාපදිංචි කොන්දොස්තර සංඛ්‍යාව 1400 ක් හා ලියාපදිංචි රියදුරු සංඛ්‍යාව 1200 ක් වේ.

එමෙන්ම සියළුම ධාවන මාර්ග ආවරණය වන පරිදි බස්මගී ආවරණ අනුරාධපුර දිස්ත්‍රික්කයේ 620ක්ද පොළොන්නරුව දිස්ත්‍රික්යේ 250ක් ද පුද්ගලික අංශයේ 70%ක දායකත්වයෙන් ඉදිකිරීම් සිදුකර මගී ජනතාවගේ සුවපහසුව සහ ආරක්ෂාව උදෙසා ජනතා අයිතියට පවරා දී ඇත.

## දැක්ම

“කාර්යක්ෂම ජනතාවාදී ප්‍රවාහන සේවාවක්”.

## මෙහෙවර

“මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා හා යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම හා නියාමනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

ජාතික ප්‍රතිපත්තීන්ට අනුගතවෙමින් පළාත් සභාව විසින් පළාතේ ජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික පරිපාලනමය හා සමාජ සුභසාධනමය කටයුතු අරමුණු කරගෙන සැලසුම් කරනු ලබන ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රවාහන සේවා පද්ධතිය කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමත් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## කෙටිකාලීන අරමුණු

- පළාත් අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කරනු ලබන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ, පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ සහ වෑන්රථ, මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවයේ යෙදෙන සියළුම රථ වාහන, කාර්යාල සහ ඇඟළුම් සේවයේ යෙදෙන සියළුම රථ වාහන නියාමනය කිරීම සහ එකී සේවාවන්හී ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවනු වස් නව තාක්ෂණය පදනම් කරගත් කාර්යයන් කිරීම.

- කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ කටයුතුවල සේවයේ නියැලී සිටින කාර්ය මණ්ඩලවල මෙන්ම අධිකාරිය මගින් නියාමනය කරනු ලබන විවිධ අංශවල ප්‍රවාහන සේවා සපයන කාර්ය මණ්ඩලයන්හී කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වර්ධනය කරනු වස් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- මෙහෙයුම් හා නියාමන කටයුතු විධිමත් කරනුවස් නවීන තාක්ෂණය හඳුන්වා දීම.

- ආයතනයේ ආදායම් තත්වය ඉහළ නංවනුවස් නව ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දීම හා පවත්නා ආදායම් මාර්ග පුළුල් කිරීම සහ විධිමත් කිරීම.

## ප්‍රධාන කාර්යයන් හා උපාය මාර්ග

### 01.මගී ඉල්ලුම අනුව මගී ප්‍රවාහන බස්රථ සඳහා නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)

♣ මගී ප්‍රවාහන බස් රථ සේවය සඳහා නව බලපත්‍ර නිකුත් කිරීමේදී මගී ඉල්ලුම හඳුනා ගැනීම, නියමිත ක්‍රමවේද අනුගමනය කොට නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සහ ධාවනයට සුදුසු බස්රථ ධාවනයට එකතු කිරීම.

♣ මගී සහ භාණ්ඩ සංසරණය සඳහා ප්‍රධාන මාර්ගයන්හි ප්‍රවාහන පහසුකම් යම් ඉහළ මට්ටමකට පවත්වන නිසා ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් ඉහළ නැංවීම සඳහා වැඩි අවධානය යොමු කිරීම සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම.

♣ නිත්‍ය නව බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම අත්හදා බැලීමේ පදනම මත තාවකාලික බලපත්‍ර නිකුත් කොට ව්‍යවසායක ආකර්ශනය ලබා ගැනීම හා ධාවන ගැටළු හඳුනා ගැනීම.

♣ අත්හදා බැලීමේ කාලසීමාව තුළ හෝ නිත්‍ය බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ග්‍රාමීය මාර්ග පද්ධතියේ පවතින ගැටළු මගී ජනතාව මගින් ලබා ගැනීම

**02.මගි ඉල්ලුම අනුව පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා සිසු සැරි සහ පාසල් ප්‍රවාහන බස්රථ සඳහා මාර්ග බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ සිසු ඉල්ලුම අනුව (සමීක්ෂණය මගින් හා කේවල ඉල්ලීම් අනුව) නියමිත ක්‍රමවේද අනුගමනය කොට ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත සිසු සැරිය සේවාව සඳහා නිර්දේශ ඉදිරිපත් කොට සිසු සැරිය බස්රථ සේවයට එකතු කිරීම.

♣. බස්රථ අවශ්‍යතා ඇති මාර්ගයන්හි සිසු ප්‍රවාහන බස්රථ සේවයට එක් කිරීම (නියමිත ක්‍රමවේද අනුගමනය කොට බලපත්‍ර ලබා දීමෙන්)

**03. භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලොරි රථ හා වෙනත් රථ සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ පළාත තුළ සංසරණය වන භාණ්ඩ ප්‍රවාහන රථ (විවිධ ආර්ථික කටයුතු පදනම් කරගෙන) පිළිබඳ සමීක්ෂණයක් කොට නියමිත අවශ්‍යතා පෙන්වා දෙමින් බලපත්‍ර නිකුත් කිරීම.
♣ භාණ්ඩ ප්‍රවාහන රථ සඳහා නැවතුම් ස්ථාන ලකුණුකර දිම.(අදාල පාර්ශවයන්ගේ නිර්දේශ ලබාගෙන)
♣ ශ්‍රී ලංකා පොලිසියේ සහය ලබාගෙන බලපත්‍ර ලබාගනුවස් භාණ්ඩ ප්‍රවාහන කුලී රථකරුවන් අධිකාරිය වෙත පොළඹවා ගැනීම.
♣ විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් පවත්වා ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**04. මගී ආවරණ ඉදිකිරීම සහ අබලන්වූ ස්ථාන ප්‍රතිසංස්කරණය.**

♣ පළාත පුරා සමීක්ෂණ කොට මගී ආවරණ ඉදි කිරීම සඳහා විවිධ ආයතන හා පුද්ගලයින් නැඹුරු කරවා ගැනීම.
♣ අබලන් මගී ආවරණ සුදුසු පරිදි නවීකරනය කිරීම.
♣ මගී ආවරණ ඉදි කිරීම මගින් මගී පහසුව සහ ආරක්ෂාව උපරිම අයුරින් සැලකිල්ලට ගැනීම.

**05. භාණ්ඩ හා මගි ප්‍රවාහනය සඳහා ත්‍රි රෝද රථ සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරිම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ බලපත්‍ර රහිතව මගි ප්‍රවාහනයේ යෙදෙන ත්‍රි රෝද රථ හඳුනාගෙන අධිකාරියේ ලියාපදිංචි කරවාගෙන බලපත්‍ර නිකුත් කිරිම.
♣ නිශ්චිත ත්‍රිරෝද රථගාල් ස්ථාපිත කර දී ප්‍රවාහනයේ යෙදිමට අවසර ලබා දීම.
♣ ශ්‍රී ලංකා පොලිසියේ සහය ලබාගෙන බලපත්‍ර ලබා ගැනීමට පෙළඹවීම.
♣ අනවසර ත්‍රි රෝද රථකරුවන් නිතියේ රැහැනට හසුකරගෙන (ලියාපදිංචිය මගහරිමින් සිටින ලියාපදිංචියට නැඹුරු කරවා ගැනීම.
♣ ලියාපදිංචි ත්‍රි රෝද රථවල පමණක් ගමන් ගන්නා ලෙස මගි ජනතාව දැනුවත් කිරීම තුළින් නව ලියාපදිංචිය වැඩිකර ගැනීම.
♣ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන කේන්ද්‍ර කරගෙන ත්‍රි රෝද රථ ගාල් පිහිටුවා නව බලපත්‍ර ලබා ගැනීම සඳහා ත්‍රි රෝද රථකරුවන් ආකර්ශනය කර ගැනීම.
♣ ත්‍රි රෝද රථ පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය හා ඒකාබද්ධ වි කටයුතු කිරීම.
♣විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් කොට ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**06. කාර්යාල සහ ඇඟළුම් සේවක ප්‍රවාහනය සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම.**

**(ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ ඇඟළුම් කර්මාන්ත සම්බන්ධව සමීක්ෂණයක් කොට ඒවායේ සේවකයින් ප්‍රවාහනය සඳහා යොමු වී ඇති බස්රථ හෝ වෑන් රථ හඳුනා ගැනීම, ලියාපදිංචි කිරීම.

♣ නියාමන අවශ්‍යතා හඳුන්වා දෙමින් ඇඟළුම් කර්මාන්ත සේවක ප්‍රවාහනයේ යෙදී සිටින්නන් දැනුවත් කිරීම.

♣ කාර්යාල සේවක ප්‍රවාහනයේ යෙදී සිටින්නන් ආයතනයේ ලියාපදිංචි කරවා ගැනීමට කටයුතු කිරීම.

♣ ලියාපදිංචි බස් රථයක හෝ වෑන් රථයක පමණක් ප්‍රවාහන පහසුකම් සලසා ගන්නා ලෙස කාර්යාල සේවයේ නියුත් වූවන් දැනුවත් කිරීම.

♣ කාර්යාල සේවකයින් හා ඇඟළුම් සේවකයින් ප්‍රවාහනය කරන රථ සඳහා නැවතුම් ස්ථාන ස්ථාපිත කරදීම.

♣ විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් පවත්වා ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**07. සිසු ප්‍රවාහන බස්රථ සහ වෑන් රථ නියාමනය කාර්යක්ෂම කිරීම විධිමත් කිරීම සහ ගුණත්වය ඉහළ දැමීම.**

♣ සිසු ඉල්ලුමට සරිලන පරිදි මාර්ග හඳුනා ගැනීම හා ප්‍රමාණවත් බස්රථ යෙදවීම.

♣ විධිමත් ආරක්ෂිත ගුණාත්මක සේවාවක් ඇති කිරීම සඳහා බස් රථ හා වෑන් රථ, සේවක මණ්ඩලය, දෙමව්පියන් හා පාසැල් දරුවන් දැනුවත් කිරීම.

♣ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම, මාර්ග සමීක්ෂණ කිරීම, සිසුන්ගෙන් හා දෙමාපියන්ගෙන් අදහස් ලබා ගැනීම,පරීක්ෂා කිරීම.

♣ මාර්ග පරීක්ෂක නිලධාරීන් යොදවා පරීක්ෂා කිරීම.

**08. කොන්දොස්තර, රියදුරු මහතුන් හා බස්රථ හිමියන්ගේ දැනුම ආකල්ප වර්ධනය තුළින් ගුණාත්මක බව වැඩිදියුණු කිරීම.**

♣ බස්රථ සේවා ගනයන්හී සේවයේ නියුක්ත වූවන් සහ ත්‍රි රෝද රථ රියදුරන්ගේ ආකල්ප වර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම.

## 09. ඒකාබද්ධ කාලසටහන් අනුව ධාවනය වන බස්රථවල කාර්යක්ෂමතාවය ගුණාත්මක අගය වැඩි කිරීම හා ආයතනගත කිරීම.

♣ නව බලපත්‍ර නිකුත් කරන හා දැනටමත බලපත්‍ර නිකුත්කර ඇති මගී ප්‍රවාහන සිසු ප්‍රවාහන, භාණ්ඩ ප්‍රවාහන සහ වෙනත් ප්‍රවාහන සේවා නියාමනය කිරිම.
♣ මගි ප්‍රවාහන බස්රථ ඒකාබද්ධ කාල සටහනක් අනුව ධාවනයේ යෙදවීම
♣ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා 40%ක්ද ප්‍රවාහන අධිකාරියේ බලපත්‍ර ලබන බස්රථ සඳහා 60%ක්ද වන පරිදි පළාතේ සියවම මාර්ග සඳහා කාලසටහන් සකස් කිරීම
♣ කාලසටහන් අනුව බස්රථ ධාවනයේ යෙදවීමේදි මාසිකව නිකුත් කරනු ලබන ලොග්පත්‍ර පිවිසුම්පත්‍ර සහ අතුරු ගමන්වාර අවසර පත්‍ර බස් නැවතුම්පලවල් තුලින් දෛනිකව අත්සන් කිරීමට යොමු කිරීම තුළින් බස්රථ අධීක්ෂණය කිරීම
♣ මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවලට ගැලපෙන පරිදි හා බස්රථ සන අතර පවතින්නා වූ ගැටළු හඳුනාගෙන මාර්ග සාකච්ඡා පැවැත්වීම.
♣ බස් රථ කාර්ය මණ්ඩලය විසින් නියාමන කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හීදී දඩුවම්වලට යටත් කිරීම.
♣ මාර්ග පරීක්ෂකවරුන් මාර්ගයෙන් නියාමන කොන්දේසි නිරන්තර පරීක්ෂාවට ලක් කිරීම.
♣ සිසු ප්‍රවාහන බස්රථවල තත්වය, සේවය හා අනෙකුත් නියාමන අවශ්‍යතා වරින්වර පරීක්ෂාවට ලක් කිරීම.(මීට අමතරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ද පරික්ෂා කරනු ලබයි)
♣ සිසු සැරිය බස්රථ සඳහා රජය විසින් ගෙවන ජනතාවගේ මුදල් අධිකාරියේ නිර්දේශ තුළින් පමණක් ගෙවීම.
♣ මගි ප්‍රවාහන ත්‍රි රෝද රථ,භාණ්ඩ ප්‍රවාහන රථ ලියාපදිංචි කළ පසු ස්ටිකර් අලවා එය අධිකාරියේ ලියාපදිංචි කළ වාහනයක් බව මහජනතාව මෙන්ම නිතිය ක්‍රියාත්මක කරන ආයතනවලට දන්වා සිටීම.
♣ සියළු ආකාරයේ බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ කිරීමට ලක්කොට නියාමනය තහවුරු කිරීම.

## 10. භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය කාර්යක්ෂම කිරීම, විධිමත් කිරීම සහ ගුණත්වය ඉහළ දැමීම.

♣ පනතේ බලතල ප්‍රකාරව අධිකාරියේ ලියාපදිංචි කරවීම.
♣ විධිමත් රථගාල් ස්ථාපිත කරදීම.
♣ පොලීසිය හා එක්ව ආරක්ෂක වැඩසටහන් සංවිධානය කිරීම.
♣ මාර්ග පරීක්ෂක නිලධාරින් යොදවා පරීක්ෂා කිරීම.
♣ සමීක්ෂණ කිරීම.

## 11. මගි ගැටළු හඳුනා ගැනීම හා විසඳුම් ලබා දීම.

♣ පොදු ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා මහජනතාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සඳහා සෑම බස්නැවතුම්පල ස්ථානයක්ම පැමිණිලි පෙට්ටි සවිකිරීම.
♣ මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා දුරකථන අංක ප්‍රසිද්ධ කිරීම.
♣ ජංගම පරීක්ෂණ වලදි මගි ජනතාවගෙන් ගැටළු ලබා ගැනීම.
♣ සියළු ගැටළු සඳහා කඩිනමින් විසඳුම් ලබා දී ගුණාත්මක මගි ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීම.

## 12. බස්නැවතුම්පල ඉදිකිරීම, නවීකරණය සහ අළුත්වැඩියා කිරීම.

♣ හඳුනාගත් ස්ථානවල සියළු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පල ඉදි කිරීම
♣ බස්නැවතුම්පල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
♣ පැරණි බස්නැවතුම්පලවල් නවීකරණය කිරීම හා අළුත්වැඩියා කිරීම.
♣ අලුතින් ඉදිකරන සහ දැනටමත් ඉදිකර ඇති බස්නැවතුම්පලවල් සඳහා තාක්ෂණය හඳුන්වා දීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




01. මගී ප්‍රවාහන සේවා සපයන්නන් ලෙස කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරීම.

02. මගී ප්‍රවාහන සේවාවට අදාළව යටිතල පහසුකම් වර්ධනය කිරීම.

03. ආදායම් උත්පාදනය වර්ධනය කිරීම හා ආයතනික ස්ථාවරත්වය ගොඩ නැගීම.

**04. මගී ජනතාවගේ ආරක්ෂාව ඉහළ නැංවීම උදෙසා මහජන හිතෛෂී තොරතුරු සන්නිවේදන ක්‍රම ඇති කිරීම.**

**05. ශ්‍රී ලංකාව තුළ පළාත් ප්‍රවාහන අධිකාරී අතරින් ආදර්ශ අධිකාරිය බවට පත්කිරීම.**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 121 ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 126 කි. අනියම් පදනමින් 02 දෙනෙකු ද කොන්ත්‍රාත් පදනමින් 01 ක් අයෙකු ද පුහුණු ලෙස 03 දෙනෙකු ද සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග.

1. සෞභාග්‍යයේ දැක්ම තුළින් "සුවපහසු ගමනක් පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක්" යන්න සාක්සාත් කරනු වස් උතුරු මැද පළාත තුළ පෞද්ගලික බස්රථ මගින් පොදු මගී ප්‍රවාහන සේවාව ගුණාත්මකව හා කාර්යක්ෂමව මගී ජනතාව වෙත ලබා දීමේ කටයුතු ක්‍රියාවට නැංවීම.
2. සෞභාග්‍යයේ දැක්ම තුළින් "යස ඉසුරින් පිරි රටක්" ගොඩනැගීමේ අරමුණින් යුතුව ග්‍රාමීය හඳුනාගත් ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම් සැලසීමට ප්‍රමුඛතාවය සකස් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
3. සෞභාග්‍යයේ දැක්ම තුළ ප්‍රවාහන සේවාව විධිමත් කිරීමේ කටයුත්තට උර දෙමින් මාර්ගවල පවතින දුර්වලතා හඳුනාගෙන වෙනත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධව කටයුතු කිරීම.
4. සෞභාග්‍යයේ දැක්ම තුළ "කඩිනම් නගර අලංකරණ හා කඩිනම් ප්‍රවාහන සේවාවක් සැපයීමේ අරමුණින් විශේෂයෙන්ම මාර්ග තදබදය අවම කිරීම සඳහා (විශේෂයෙන්ම පාසල් වේලාවන් සහ කාර්යාල වේලාවන් පෙ.ව. 6 සිට 8 දක්වා, මධ්‍යහන 12 සිට ප.ව. 3 දක්වා, ප.ව. 4.30 සිට ප.ව.6 දක්වා කාලය තුළ)පෞද්ගලික වාහන මගින් නගරයට පැමිණීම වෙනුවට විශේෂ ප්‍රවාහන සේවාවක් එම කාලය තුළ නගර සේවාවක් ලෙස (City Service) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සිදු කිරීම.
5. භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය හුවමාරු වන ට්‍රාන්ස්පීඩ් නමින් භාණ්ඩ හුවමාරු සේවාවක් පළාත් සහ අන්තර් පළාත් පෞද්ගලික බස්රථ කේන්ද්‍ර කරගනිමින් සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි පළාත් 9 ම ප්‍රවාහන සේවා අධිකාරිවල එකඟත්වයෙන් යෝජනා සම්මතව ආරම්භ කිරීමට සැලසුම් කර තිබීම.
6. පළාත තුළ විනයගරුක හා සංවරශීලී රියදුරු පිරිසක් බිහිකරලීමේ අරමුණින් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන රියදුරු පුහුණු පාසලක් ආරම්භ කිරීමට සැලසුම් කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය.

**ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රතිපාදන**

| දර්ශකය | ක්‍රියාකාරකම | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|
| **ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් උදෙසා මගී ප්‍රවාහන සේවාවට අදාලව යටිතල පහසුකම් සංවර්ධනය** | | | |
| ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් උදෙසා මගී ප්‍රවාහන සේවාවට අදාලව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහල නැංවීම, මගී ශික්ෂණ ආකල්ප වර්ධනය කිරීම | 1. පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය ස්ථාපිත කිරීම. | - | 0.25 |
| | 2. කැකිරාව බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම. | 2.12 | 1.73 |
| | 3. තඹුත්තේගම බස්නැවතුම්පළ කාර්යාලය විවෘත කිරීම. | - | 0.02 |
| | 4. වැළිකන්ද බස්නැවතුම්පළ අලුත්වැඩියා කිරීම. | - | - |
| | 5. අනුරාධපුර නව බස්නැවතුම්පල පැරණි බස් මගී පර්යන්තය ගලවා ඉවත් කිරීම. | - | 0.19 |

**බ**ස්නැවතුම්පල යටිතල පහසුකම් සංවර්ධනය හා ආයතන ධාරිතා සංවර්ධනය ව්‍යාපෘති යටතේ 2020 වර්ෂය තුළ සංවර්ධන කටයුතු රාශියක් ක්‍රියාත්මක කරන ලදි. මෙහි ප්‍රතිලාභ විශාල පිරිසකට හිමි විය. කැකිරාව, පොළොන්නරුව, තඹුත්තේගම, වැළිකන්ද, අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමැවුම | නිමැවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| මගී පහසුකම් සංවර්ධනය කිරීම | බස් මගී ආවරණ ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම. | ඉහළ යන මගී අවශ්‍යතාවයට සාපේක්ෂව බස් මගී ආවරණ ඉදිකිරීම සහ අලුත්වැඩියාකිරීම. | 50 | 22 | 05 | 06 | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රතිපාදන නොලැබීම | 12 | 17 | 20 |
| | බස් නැවතුම්පල සංවර්ධනය කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | සේවාව ලබාගැනීමේ ප්‍රතිශතය ඉහළ යෑම. යටිතල පහසුකම් සංවර්ධනය තුළින් මගී ජනතාවට විධිමත් හා ක්‍රමවත් ප්‍රවාහන පහසුකම් ලබාදීම. දෛනිකව ප්‍රවාහන පහසුකම් ලබාගන්නා මගී ජනතාවගේ පහසුව සැලසීම හා ක්‍රමවත් නගර සැලසුමක් සඳහා දායක වීම. | 12 | 09 | 09 | 05 | | 13 | 60 | 20 |
| ගුණාත්මක මගී ප්‍රවාහන සේවා සැපයීම. | බස්රථ හිමිකරුවන්ගේ සහ සේවකයින්ගේ ආකල්ප වර්ධනය කිරීම. | දැනුම, ආකල්ප වර්ධනය කිරීම සහ ඒ තුළින් මගියා වෙත ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීමට හැකි වීම. | 05 | ප්‍රතිපාදන වෙන්වී නැත | 05 | 02 | | ප්‍රතිපාදන වෙන්වී නැත | 01 | 01 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය (Outcome index) | ඉලක්කය කරා ළඟා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 1. | විධිමත් බස්නැවතුම්පළක් ඉදිවීම තුළින් පොදු මගී ජනතාවට ප්‍රියමනාප සංවිධිත පරිසරයක් නිර්මාණය වීම තුළින් රජය හා ආයතනය කෙරෙහි ජනතා ප්‍රසාදය ඉහළ යාම. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති කිසිවක් නැත. | 50% |
| 2. | මගී ජනතාවට ආරක්ෂාකාරී සුවපහසු මගී ප්‍රවාහන සේවාවක් සැපයීම. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති කිසිවක් නැත. | 50% |

## පසුගිය වසර 03ක් තුළ ක්‍රියාත්මක කරනලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘති | ඉටුකර ගැනීමට අපේක්ෂා කළ සුවිශේෂී අරමුණු (specific objectives) | ප්‍රගතිය (ප්‍රමාණය/ප්‍රතිලාභීන් ගණන) | | | | වැයකළ මුදල (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 01 | බස්නැවතුම්පළ නඩත්තුව හා සංවර්ධනය. | විධිමත් බස් නැවතුම්පළක් ඉදිවීම තුළින් මගී ජනතාවට ප්‍රියමනාප සංවිධිත පරිසරයක් ලබා දීම. | 15000 | 8000 | 10000 | 10000 | 12 | 13 | 3.97 | ප්‍රතිපාදන ලැබී නැත |
| 02 | මගී ආවරණ ඉදිකිරීම හා නඩත්තුව | මගී ජනතාවට ආරක්ෂාකාරී සුවපහසු සේවාවක් ලබා දීම. | 500 | 500 | 1000 | 1000 | 7 | 2 | - | |
| 03 | ආයතන ධාරිතා සංවර්ධනය | ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබා දීම. | 150 | 130 | 120 | 75 | 1 | 1 | 1 | |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට ආයතනය මගින් කරන ලද දායකත්වය.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2020 වර්ෂයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 185 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රතිපාදන වලට අනුව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කර අනුමැතිය ලබා ගත්තද එසේ සැලසුම් කරන ලද ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කිරීමට 2020 වර්ෂය සඳහා නියමිත ප්‍රතිපාදන නොලැබුණි. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සංවර්ධන ව්‍යාපෘති සඳහා නොලැබුණද ලෝක වසංගතයක් වන කොරෝනා වසංගත තත්ත්වය පවතින සමයේ වුවද උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ උපයාගත් ආදායමින් කැකිරාව බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය නවීන අංගෝපාංග සහිතව ඉදිකර ජනතා අයිතියට පත්කිරීමට හැකි විය.

කාර්යක්ෂම හා ගුණාත්මක පොදු මගී ප්‍රවාහන සේවාවක සේවාව ලබන පොදු මගී ජනතාව මෙන්ම විශේෂයෙන් සමාජයේ අවධානමට ලක්විය හැකි කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයන් සහ වයස්ගත පුද්ගලයන් හට මගී ප්‍රවාහන සේවාව භාවිතයේදී සිදුවන අපහසුතා අවම කිරීම සහ බස්රථ

වලින් මාර්ගයේදී සිදුවිය හැකි අනතුරු අවම කිරීම සහ මාර්ගයේදී ආරක්ෂාව ලබාදීම මෙන්ම සියලුම මගී ජනතාවට අඩු මිළට ප්‍රවාහන පහසුකම් සැපයීම යනාදී කාරනා තුළින් 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීමට හැකිවන පරිදි 2020 වර්ෂයේ දී අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

විධිමත් හා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ක්‍රියාවට නැංවෙන ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා සේවා සපයන්නන්ගේ ආකල්ප වර්ධනය හා පුහුණුව මගින් කළමනාකරන ක්‍රියාවලිය තුළ සිවිල් සමාජය සඳහා ඍජුව දායක විය හැකි පොදු මගී ප්‍රවාහන සේවා සැපයීම හා ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ස්ත්‍රීපුරුෂභාවය, වයස සහ ආබාධ සහිත අය යන සාධක මත පදනම්ව පහසුවෙන් ලබාගත හැකි පොදු ප්‍රවාහන පහසුකම් ලබා දීමේ තිරසර සංවර්ධන දර්ශක පාදක කර ගනිමින් 2020 වර්ෂය තුළ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම සඳහා ලෝක වසංගතයක් වන කොවිඩ් වසංගත සමයේ දැඩි ආර්ථික පහසුකම් මධ්‍යයේ වුවද අදාල ඉලක්ක කරා ලඟාවීමට උත්සහ කිරීම තුළින් ඉලක්ක සපුරාගත හැකි වී ඇත. එනම් රුපියල් 1727055.15ක වියදමකින් කැකිරාව බස්නැවතුම්පළ පොදු වැසිකිළි පද්ධතිය නවීන අංගෝපාංග සහිතව නවීකරණය කර ජනතා අයිතියට පත් කිරීමට හැකි විය. මෙම වැසිකිළි පද්ධතිය මගින් ප්‍රමිතිගත සනීපාරක්ෂක පහසුකම් ලබන මගී ජනතාව දෛනිකව 1500 කට අධිකය. මෙය ප්‍රවාහන සේවා අධිකාරිය මගින් 2020 වර්ෂය තුළ මගී ජනතාව වෙත ලබා දීමට හැකිවීම විශාල ප්‍රතිලාභයකි. එසේම නියමිත ටෙන්ඩර් පරිපාටියට අනුව මෙම වැසිකිළි පද්ධතිය බදු දීම තුළින් ආයතනයට අමතර ආදායමක් ලැබීමද ප්‍රතිලාභයකි. අබාධිත පුද්ගලයන්ට තම ශරීර කෘත්‍ය පහසුවෙන් ඉටුකර ගැනීමට ලැබීම, කාන්තාවන්ට ආරක්ෂිතව තම අවශ්‍යතාවය ඉටුකර ගැනීමට හැකි වීම, බස්රථ කාර්ය මණ්ඩල, ව්‍යාපාරික ප්‍රජාව, පාසල් දරුවන් හා බස්නැවතුම්පළ වෙත පැමිණෙන මගී ජනතාවට මෙම ව්‍යාපෘතිය මගින් ලැබෙන ප්‍රතිලාභයන්ය.

## දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන වීහවතාවයන්

උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය මගින් 2021 වර්ෂයේ මගී පහසුකම් සංවර්ධනය කිරීම මගින් මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීමේ අරමුණින් බස් නැවතුම්පළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් බස්නැවතුම්පළ වැසිකිළි පද්ධති අලුත්වැඩියා කිරීම, බස්නැවතුම්පළ භූමි කාපට් ඇතිරීම හා තාර යොදා පිළිසකර කිරීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් පොදු මගී ප්‍රවාහන සේවාවේ සේවය ලබා ගැනීමේ ජනතා ප්‍රතිශතය වැඩි කිරීම, දෛනිකව ප්‍රවාහන පහසුකම් ලබාගන්නා මගී ජනතාවගේ පහසුව සැලසීම හා ක්‍රමවත් නගර සැලසුමක් සඳහා දායක වීමට හැකි වීම, ඉහළ යන මගී අවශ්‍යතාවයට සාපේක්ෂව බස් මගී ආවරණ ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම මගින් මගී ජනතාව පොදු මගී ප්‍රවාහන සේවාව ලබා ගැනීමේ ප්‍රවනතාවය වැඩි කිරීම, බස්නැවතුම්පලවල් ඉදිවීම සහ යටිතල පහසුකම් සංවර්ධනය තුළින් මගී ජනතාවට විධිමත් හා ක්‍රමවත් ප්‍රවාහන පහසුකම් ලබාදීමට හැකි වීම. බස්නැවතුම්පළවල් තුලට බස්රථ ඇතුලත් කිරීමට නොහැකි වන පරිදි වලවල් හැරී ඇති බැවින් මගී ජනතාවට බස් පහසුකම් ලබා ගැනීමේදී මහත් අපහසුතාවයන්ට ලක්වන බැවින් එම බස්නැවතුම්පළ භූමි කාපට් ඇතිරීම සහ තාර යොදා අලුත්වැඩියා කිරීම මගින් මගී ජනතාවට විධිමත් හා ක්‍රමවත් ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා සෞභාග්‍යයේ දැක්ම තුළින් “සුවපහසු ගමනක් පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ” යන්න සාක්ෂාත් කිරීම සඳහා වන පොදු මගී ප්‍රවාහන සේවයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා 2021 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කර ඇත.

## ආයතනයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

<table>
<tr><th rowspan="2">අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන්</th><th colspan="2">නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන් මග</th></tr>
<tr><th>කෙටිකාලීන</th><th>දිගුකාලීන</th></tr>
<tr><td>1.මගී පහසුකම් සංවර්ධනය කිරීම<br>• උප නගරවල සහ ප්‍රධාන නගරවල සියලු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පලවල් ඉදි කිරීම .<br>• බස්නැවතුම්පල භූමි කාපට් කිරීම.<br>• මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල නව මගී ආවරණ ඉදි කිරීම සහ අලුත්වැඩියා කිරීම.<br>• සියලු යටිතල පහසුකම් වලින් සමන්විත ආපනශාලා පහසුකම් සහිත දුර ගමන්සේවා බස් රථ නතරකරන ස්ථාන ස්ථාපනය කිරීම<br>• විධිමත් ත්‍රී රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ස්ථාපිත කිරීම</td>
<td rowspan="2">1.අධිකාරිය විසින් නියාමනය කරනු ලබන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ, පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ සහ වෑන්රථ, මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන ත්‍රි රෝද රථ, භාණ්ඩ ප්‍රවාහන සේවයේ යෙදෙන සියලුම රථ වාහන, කාර්යාල සහ ඇහලුම් සේවයේ යෙදෙන සියලුම රථ වාහන සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.<br><br>2.කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ නියැලි සිටින කාර්ය මණ්ඩලවල සමාජ සදාචාරය හා දේශීය අනන්‍යතාවය ආරක්ෂා කිරීම හා සංස්කෘතික වටිනාකම ආරක්ෂා කිරීම හා සංස්කෘතික වටිනාකම ආරක්ෂාකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br><br>3.මෙහෙයුම් හා නියාමන කටයුතු විධිමත් කරනුවස් නවීන තාක්ෂණය හඳුන්වා දීම.</td>
<td rowspan="2">ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් පළාතේ ජනතාවගේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික පරිපාලනමය හා සමාජ සුභසාධනමය කටයුතු අරමුණු කරගෙන සැලසුම් කරනු ලබන ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රවාහන සේවා පද්ධතිය කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමත් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය.</td></tr>
<tr><td>2.මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම<br>• වැසිකිලි පහසුකම් රහිත බස්නැවතුම්පලවල්හි වැසිකිලි පද්ධති ස්ථාපිත කිරීම සහ ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඇති වැසිකිලි පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම.<br>• ප්‍රධාන බස්නැවතුම්පලවල්හි CCTV කැමරා පද්ධති සවිකිරීම හා බස්රථවල CCTV කැමරා සහ GPS යන්ත්‍ර සවිකිරීම.<br>• බස්රථ නිරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික මෙහෙයුම් මැදිරි ස්ථාපිත කිරීම සහ තාක්ෂණික උපකරණ හඳුන්වා දීම.<br>• ප්‍රධාන බස්නැවතුම්පලවල ඩිජිටල් කාලසටහන් පුවරු සවිකිරීම.<br>• බස්නැවතුම්පලවල්හි මහජන ඇමතුම් පද්ධති සිථාපිත කිරීම.<br>• වේලා සටහන්කුට් සඳහා තාක්ෂණික උපකරන හඳුන්වා දීම.<br>• මාර්ග සමීක්ෂණ පැවැත්වීම.<br>• ටිකට් මැෂින් ක්‍රමය හඳුන්වා දීම.<br>• මගී ආරක්ෂාව උදෙසා වන දැන්වීම්, ප්‍රචාරක පුවරු ස්ථාපිත කිරීම.<br>• සිසුසැරිය බස්රථ සේවාව පුළුල් කිරීම.<br>• සිසු ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම.<br>• මගී ප්‍රවාහන ත්‍රි රෝද රථ සේවාව පුළුල් කිරීම.<br>• කාර්යාලීය සේවක ප්‍රවාහන රථ ලියාපදිංචිය පුළුල් කිරීම.<br>• භාණ්ඩ ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම.<br>• ප්‍රධාන බස්නැවතුම්පළ බස්රථ කාර්යමණ්ඩල සඳහා විවේකාගාර පහසුකම් ස්ථාපිත කිරීම<br>• පළාත පුරා බස්නැවතුම් ස්ථාන පුවරු ස්ථාපිත කිරීම.<br>• ටිකට් බුකින් ක්‍රමය හඳුන්වා දීමට අදාල තාක්ෂණික උපකරණ මිලදී ගැනීම.</td></tr>
</table>

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන් මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| **3.බස්රථ සහ අතර මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම.**<br>• කොන්දොස්තර / රියදුරු/ බස්රථ හිමියන් / පාසල් ප්‍රවාහන සේවකයින් / කාර්යාල/ඇඟලුම්/ භාණ්ඩ ප්‍රවාහන සේවාවේ යෙදෙන්නන්/ ත්‍රී රෝද රථ හිමියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුලු පැවැත්වීම.<br>• හොඳම කොන්දොස්තරවරයා, හොඳම රියදුරු සහ හොඳම බස්රථ හිමියා තේරීම සඳහා වූ වාර්ෂික සම්මාන උළෙලක් පැවැත්වීම.<br>• පුහුණු රියදුරු/ කොන්දොස්තරවරු සංචිතයක් පිහිටුවීම. | - | ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් පළාතේ ජනතාවගේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික පරිපාලනමය හා සමාජ සුභසාධනමය කටයුතු අරමුණු කරගෙන සැලසුම් කරනු ලබන ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රවාහන සේවා පද්ධතිය කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමත් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය. |
| **4.නව මාර්ග හඳුන්වා දීම**<br>• මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හැකි ග්‍රාමීය මාර්ග හඳුන්වා දීම.<br>• සිසු ඉල්ලුම අනුව නව සිසුසැරිය බස්රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම.<br>• සිසු ඉල්ලුම අනුව නව පාසල් ප්‍රවාහන සේවා රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම.<br>• කාර්යාල සේවක ඉල්ලුම අනුව නව කාර්යාල සේවක ප්‍රවාහන රථ යෙදවිය හැකි මාර්ග හඳන්වා දීම. | | |
| **5.ආයතන ධාරිතා සංවර්ධනය**<br>• සේවකයින්ගේ ආකල්ප වර්ධනය සඳහා දේශන හා වැඩමුළු පැවැත්වීම.<br>• පළාග් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරුකර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම.<br>• කාර්යමණ්ඩලයට සේවාස්ථ පුහුණු ලබාදීම.<br>• ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• සේවක ප්‍රණාම උළෙලවල් පැවැත්වීම.<br>• සේවකයින් අධ්‍යාපනයට යොමුකරනුවස් අර්ධ/පූර්ණ ශිෂ්‍යත්ව පිරිනැමීම. | - | |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂයට සාපේක්ෂව ගත්කල 2020 වර්ෂයේදී ඉහළ සාපේක්ෂ ඵලදායීතාවයක් ළඟාකරගෙන ඇත. එය 100% ක ප්‍රතිශතයක් බව දැක්විය හැක. උතුරු මැද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන 2020 වර්ෂයේ වෙන් වුවද එම ප්‍රතිපාදන නොලැබුණු අතර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මූල්‍ය ප්‍රතිපාදන අධිකාරිය වෙත නොලැබුනද අධිකාරිය මගින් ගරු සභාපතිතුමාගේ සහ සාමාන්‍යාධිකාරීතුමාගේ නොමසුරු උත්සාහයෙන් හා කැපවීමෙන් ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක ළඟාකරගෙන ඇත. එය සතුටුදායක තත්ත්වයකි.

මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ විශේෂ ජයග්‍රහනයක් ලෙස වසර 10කට අධික කාලයක් තුලී පදනම මත අවම පහසුකම් යටතේ පවත්වාගෙන ගිය පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ගරු සභාපතිතුමාගේ පූර්ණ කැපවීම හා උත්සාහය මත සියළු පහසුකම්වලින් සමන්විත මහවැලි අධිකාරියට අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර මගී ජනතාවගේ සේවය උපරිම අයුරින් ලබා දීම උදෙසා ජනතා අයිතියට පත් කිරීමට ලැබීම අධිකාරිය ලැබූ සුවිශේෂී ජයග්‍රහනයකි.

එසේම ප්‍රවාහන සේවා අධිකාරියේ ගරු සභාපතිතුමාගේ සහ සාමාන්‍යාධිකාරීතුමාගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් අතුරින් ලෝක වසංගතයක් වන කොරෝනා වසංගත තත්ත්වය පවතින සමයේ වුවද ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව සැලසීමේ අරමුණ පෙරදැරිව කැකිරාව බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය නවීන අංගෝපාංග යොදා නවීකරණය කර මාස දෙකක් වැනි කෙටි කාලයකින් ජනතා අයිතියට පත්කිරීම තුලින් සමස්ත මගී ජනතාවට සිදුකල මෙහෙය අති විශාලය. එය ද විශේෂයෙන් ප්‍රවාහන සේවා අධිකාරියේ ලැබූ ජයග්‍රහනයක් ලෙස දැකිවිය හැක. වසර කීපයක් තිස්සේ අනුරාධපුර නව බස්නැවතුම්පළ පැරණි බස් මගී පර්යන්තය කඩා ඉවත් කිරීම, තලාව බස්නැවතුම්පළ භූමිය තාර යොදා අලුත්වැඩියා කිරීම, තඹුත්තේගම බස්නැවතුම්පළ කාර්යාලය විවෘත කිරීම, වැලිකන්ද බස්නැවතුම්පළ අලුත්වැඩියා කිරීම, ප්‍රවාහන සේවා අධිකාරිය මගින් නියාමනය කරනු ලබන බස්නැවතුම්පළ අයිතිය පවරා ගැනීමට කටයුතු කිරීම, කාර්යාල සේවක පුහුණු වැඩසටහන් පැවැත්වීම, බස්රථ රියදුරු කොන්දොස්තර පුහුණු වැඩමුළු පැවැත්වීම, වසර ගණනාවක් තිස්සේ ආයතනයට අයවිය යුතු බස්නැවතුම්පළ භූමිය තුළ පිහිටා ඇති කඩකාමර බදු මුදල් අධිකාරිය වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම ආදි කටයුතු කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද සාර්ථකව ඉටු කර ලබාදීමට හැකිවීම මගින් සමස්ථ මගී ජනතාවට ඉටුවන සේවය අති විශාලය. එමෙන්ම උතුරු මැද පළ තුළ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය මගින් නියාමනය කරණු ලබන සියළුම බස්නැවතුම්පළවල් 2020 වර්ෂය තුල ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව හා සුරක්ෂිතභාවය ආරක්ෂාවන පරිදි සියලුම බස්නැවතුම්පළවල් පිරිසිදු හා අලංකරණයෙන් යුතු බස්නැවතුම්පළවල් බවට පත් කිරීමට කටයුතු කිරීම විශේෂයෙන් සඳහන්කල යුතුය. එසේම ප්‍රධාන මාර්ග සහ අතුරු මාර්ගවල බස්රථ ධාවනය කිරීම මගින් ලෝක වසංගතයක් වූ කොරෝනා වසංගත තත්ත්වය අභිමුව වුවද මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා බොහෝමයක් ඉටුකර ගැනීමට හැකි විය. 2020 වර්ෂයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක තත්වයක පවතී.

## Covid 19 ගෝලීය වසංගතය නිසා සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

නූතන ලෝකයේ ජීවත් වන මිනිසාට නැතිවම බැරි සේවාවක් බවට ප්‍රවාහනය පත්ව තිබේ. එයිනුත් පෞද්ගලික බස්රථ සේවාවට විශේෂිත වූ තැනක් හිමිව ඇත. නූතන ලෝකයේ මේ වන විට කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් බරපතල ගැටලු රැසකට මුහුණ දී සිටී. මගී ජනතාවට ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම, ඒ සඳහා වන ප්‍රවාහන වියදම් අධික වීම, මාර්ගවල තදබදය, දිනපතා ඉහළ යන පොදුමගී ප්‍රවාහන සේවා බස්රථ අනතුරු ආදිය නිදසුන් ලෙස දැක්විය හැක. නූතන ලෝකයේ විශාලතම අභියෝගයද ප්‍රවාහන අර්බුදයට විසඳුම් සෙවීමය. ඒ අනුව පෞද්ගලික බස්රථ සේවාව නියාමනය කරණු ලබන උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියද ලෝක වසංගතයක් වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ දැඩි දුෂ්කරතාවයන්ට ලක්වුවද එම දුෂ්කරතාවයන්ට අභියෝග කරමින් 2021 වර්ෂය තුළ අධිකාරියේ ඉලක්කගත අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

2020 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 185 ක ප්‍රතිපාදන වෙන් වුවද එම වෙන්වූ ප්‍රතිපාදන 2020 වර්ෂයේ සංවර්ධන වැඩ සඳහා නොලැබුණි. මෙම ප්‍රාග්ධන ඌනතාවය නිසා අත්හැරීමට සිදු වූ 2020 වර්ෂයේ යෝජිත සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවද එම ව්‍යාපෘති අතරින් මහජනතාවට උපරිම ආකාරයෙන් ගුණාත්මක හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා දීමටත්, තත්කාලීනව මතුවන ගැටළු මත පදනම්ව අධිකාරියේ උපයාගත් ප්‍රතිපාදන මගින් අත්‍යවශ්‍යම ව්‍යාපෘති අවම පිරිවැයකින් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට හැකි විය. 2020 වර්ෂය තුළ ආයතනයේ ප්‍රධානතම අඩුපාඩුවක් වූ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය සියලු පහසුකම් සහිතව ජනතා සේවය සඳහා ස්ථාපිත කිරීම විශේෂ කොට දැක්විය හැක.

එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදුවූ අභියෝග සහ ගැටළු ලෙස සංවර්ධන කටයුතු සාක්ෂාත් කරගැනීමට යාමේදී ආයතනයට ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් නොමැතිකම, බස්නැවතුම්පළ සංවර්ධනයේදී ව්‍යාපාරික ප්‍රජාවගේ සහ මහජනතාවගේ අවහිරතා මෙන්ම කලින් කලට සිදුවන දේශපාලනික වෙනස්වීම් මත සභාපති, සාමාන්‍යාධිකාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස්වීම සහ දේශපාලන පාර්ශ්වයන්ගේ විවිධ මතවාද හේතුවෙන් ආයතනයේ කටයුතු කිරීමේදී ඇතිවන ගැටළු සහ අභියෝග ආයතනයේ කාර්යමණ්ඩලයට මෙන්ම ඉදිරි ගමනටද බාදාවක්ව පවතී.

2020 වර්ෂයේ අපේක්ෂිත ආදායම (මෙහෙයුම් ආදායම) රුපියල් මිලියන 121 ක් වුවත්, කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ 2020 වර්ෂයේ අමාත්‍යාංශයෙන් වැටුප් වශයෙන් ලැබුන ප්‍රතිපාදන ද සමග ළඟාවීමට හැකි වූ ආදායම රුපියල් මිලියන 72කි.

# 9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය හා මූලික තොරතුරු

උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02න් සමන්විත වේ. මෙම දෙපාර්තමේන්තුව 1987 අංක 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තිය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. කෘෂිකර්ම හා සත්ත්ව පාලන අමාත්‍යාංශය වෙනම ඒකකයක් වශයෙන් පිහිටුවා තිබුණි. මෙම දෙපාර්තමේන්තුව 1987 වර්ෂයේ සිට අනුරාධපුර කච්චේරි භූමිය සහ පොළොන්නරුව දිස්ත්‍රික් කච්චේරි භූමිය තුළ ආරම්භ වී අනුරාධපුර පළාත් කාර්යාලය වශයෙන් ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයක් වශයෙන් ද පිහිටු විය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් ආවරණය වන පරිදි බල ප්‍රදේශය විශාල වීමත්, කාර්යය බහුල වීමත් නිසා 1989 ජුනි 01 වන දින වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. පළාතේ ක්‍රීඩා පරිපාලනය හා සංවර්ධන කටයුතුවලට ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සල්ගාදු ක්‍රීඩාංගන භූමියේ 2004 අප්‍රේල් 27 වන දින සිට නව පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කරන ලදී. එතැන් සිට අද දක්වා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව එම භූමියේ පිහිටා තිබේ.

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතු භෞතික සහ අනෙකුත් සම්පත්

- දැනට පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු කාර්යාලය පවත්වාගෙන යන දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල.
- උතුරු මැද පළාත් ක්‍රීඩා සංකීර්ණය- අනුරාධපුර.
- අනුරාධපුර පිහිණුම් තටාකය.
- අනුරාධපුර ගෘහස්ත ක්‍රීඩාගාරය.
- අනුරාධපුර හා පොළොන්නරුව බර ඉසිලීමේ පුහුණු මධ්‍යස්ථාන.
- පොළොන්නරුව දිස්ත්‍රික් උප කාර්යාලය.
- කැබ් රථ 02.
- වෑන් රථ 01.

## ක්‍රීඩකයන්ට පුහුණු පහසුකම් සැපයෙන ක්‍රීඩාංගන

- ❖ අනුරාධපුර ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ අනුරාධපුර පිහිනුම් සංකීර්ණය
- ❖ පොළොන්නරුව ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ පොළොන්නරුව ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණය

## ක්‍රීඩා පුහුණු සංචිත

| | | |
|---|---|---|
| ජිම්නාස්ටික් | වොලිබෝල් | කරාතේ දෝ |
| බැඩ්මින්ටන් | මල්ලව පොර | පාපන්දු |
| ජූඩෝ | බර ඉසිලීම | පිහිනුම් |
| මලල ක්‍රීඩා | කායවර්ධන | |

## දැක්ම

"ජාතික හා ජාත්‍යන්තර කෙළිබිම ජයගන්නා නීරෝගීමත් හා ක්‍රියාශීලී ජනතාවක්, සංවර්ධිත පළාතක්".

## මෙහෙවර

"උතුරු මැද පළාතේ ජනතාව නීරෝගීමත් හා ක්‍රියාශීලී කිරීම සඳහාත් ක්‍රීඩකයින් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ වෙත යොමු කිරීම සඳහාත් ක්‍රීඩා පුහුණු කටයුතු, හඳුනා ගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම, යටිතල පහසුකම් හා ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.
- උතුරු මැද පළාත තුළ අභිමානවත් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම.
- ක්‍රීඩිකාවන් හඳුනා ගැනීම.
- පළාත තුළ සිටින සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ජාතික ක්‍රීඩා උළලේ පදක්කම් වැඩිපුර ලබා ගැනිම.
- ජාතික ක්‍රීඩා උළලේදී පළාත ඉහළ මට්ටමේ තැබිම.
- ග්‍රාමීය මට්ටමේ දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉදිරියට ගෙන ඒම.
- පුහුණු මධ්‍යස්ථාන, ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්




## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 95ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 74 කි. පුරප්පාඩු සංඛ්‍යාව 18 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

සෞභාග්‍යයේ දැක්ම මගින් එළිදක්වා ඇති ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත් වන පවුලක්, ගුණගරුක විනයගරුක සාධාරණ සමාජයක්, සෞභාග්‍යවත් දේශයක් යන චතුර්විධ අරමුණු ජය ගැනීම සඳහා එළි දක්වා ඇති දස ප්‍රතිපදාවන් අනුව දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය මග වේ.

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්ක | දර්ශක | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | සත්‍ය වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 9 | 9.1 | 9.1.1 | කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම (අවිච්ඡේද ) | 7.29 | 8.82 |
| 3 | 3.4 | 3.4.1/3.4.2/3.5.1 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.05 | 0.004 |
| 3<br>5 | 3.4<br>5.1 | 3.4.1/3.4.2/3.5.1<br>5.1.1 | ජගත් කෙලිබිමට රන් අරුණැල්ල, කුසලතා ඇගයීම/පෝෂණ දීමනා දිරි දීමනා ලබා දීම | 7.82 | 7.36 |
| 3<br>5 | 3.4<br>5.1 | 3.4.1/3.4.2/3.5.1<br>5.1.1 | ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම(අවිච්ඡේද) | 6.50 | 6.47 |
| 3<br>5 | 3.4<br>5.1 | .4.1/3.4.2/3.5.1<br>5.1.1 | අන්තර් ක්‍රීඩා සමාජ/ දිස්ත්‍රික්/පළාත් හා ජාතික තරගාවලි | 10.00 | 3.34 |
| 3 | 3.4 | 3.4.1/3.4.2/3.5.1<br>5.1.1 | ක්‍රීඩා තරු වැඩසටහන | 0.12 | 0.12 |
| 9 | 9.1 | 9.1.1 | කාර්යාල කාර්යයන් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම | 0.15 | 0.15 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2020

| ක්‍රියාකාරකම | නිමවුම | නිමවුම් දර්ශකය | ඉලක්කය | | | | ඉලක්ක ගත ආයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | අංග සම්පූර්ණ කාර්යාල ගොඩනැගිල්ල | | - | | | | 7.29 | 0 | 25.0 | 10.0 |
| ක්‍රීඩා උපහාර උළෙල | 1.ජයග්‍රාහී ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය<br>11.අන්තර් ජාතික ජයග්‍රහන ප්‍රමාණය | ජයග්‍රහකයින් ප්‍රමාණය රන් පදක්කම් -17 | 17 | 25 | 30 | 35 | 7.8 | 9.5 | 10.5 | 11.0 |
| | | රිදී පදක්කම් -20 | 20 | 35 | 40 | 50 | | | | |
| | | ලෝකඩ පදක්කම්- 41 | 4 | 3 | 4 | 5 | | | | |
| | | උපහාර ලාභී පුහුණු කරුවන් ජාතික 48/ ජාත්‍යන්තර 21 | 50 | 50 | 75 | 75 | | | | |
| | | සම්පූර්ණ උපහාරලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන් 121 | 121 | 130 | 135 | 140 | | | | |
| | | දිරි දීමනා ලාභීන් 08 | 0 | 2 | 3 | 4 | | | | |
| ක්‍රීඩා සමාජ සඳහා භාණ්ඩ ලබා ගැනීම | ක්‍රියාකාරි ක්‍රීඩා සමාජ ප්‍රමාණය | ලියාපදිංචි ක්‍රීඩා සමාජ ප්‍රමාණය | 702 | 720 | 730 | 750 | 6.5 | 7.0 | 7.5 | 8.0 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය | ඉලක්ක කරා ළඟා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 01 | ජාතික තරග නියෝජනයෙන් ලබා ගන්නා ජයග්‍රහණ ප්‍රමාණය 20% කින් වැඩිකර ගැනීම | 2020 තරග පැවැත්වුයේ නැත | 100% (2019 ) |
| 02 | ජාත්‍යන්තරය නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය 10% කින් වැඩිකිරිම | ජාත්‍යන්තර තරග සඳහා 2020 වර්ෂයේ කොරොනා වසංගතය හේතුවෙන් සහභාගි නොවුණි | 50% |
| 03 | පෝෂණ දීමනා ලබා දෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය 20% කින් වැඩිකිරිම | ක්‍රීඩක ක්‍රීඩිකාවන් 121 සඳහා පෝෂණ දීමනා ලබා දෙන ලදි | 100% |
| 04 | දිරි දීමනා ලබා දෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය 10% කින් වැඩි කිරිම | 2019 ජාත්‍යන්තරය නියෝජනය කල සියලු ක්‍රීඩකයින් සඳහා දිරි දීමනා ලබා දෙන ලදි | 100% |
| 05 | ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාකාරි ක්‍රීඩා සමාජ ප්‍රමාණය 700 සිට 730 දක්වා වැඩිකිරිම | ක්‍රීඩා සමාජ 700 | 100% |
| 06 | අන්තර් ක්‍රීඩා සමාජ තරග සඳහා සහභාගිවන ප්‍රමාණය 30% කින් වැඩිකර ගැනීම | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩා ඉසව් සඳහා සහභාගිත්වය 75% ක් පමණ | 75% |
| 07 | බෝනොවන රෝග සඳහා ගොදුරුවන ප්‍රමාණය 20% කින් අවම කර ගැනීම | ඉලක්ක ළඟා කර ගැනීමට දායකවිය හැකි විය | 80% |
| 08 | මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වන තරුණ පිරිස 20% කින් වැඩි කිරිම | | 10% |

## ඉලක්ක කරා ලගා වීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ආවරණය කල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | මුදල |
|---|---|---|---|---|
| අන්තර් ක්‍රීඩා සමාජ තරග | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් තරග පැවැත්වීම | සියලුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය වන ලෙස | ක්‍රීඩක ක්‍රීඩිකාවන් 5000 අධික | 3.3 |
| ක්‍රීඩා උපහාර දිරි දීමනා/පෝෂණ දීමනා ලබා දීම | 2019 වර්ෂයේ ජාතික හා ජාත්‍යන්තරය නියෝජනයෙන් ජයගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඊට උර දුන් පුහුණුකරුවන් ඇගයීම | සියලුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය වන ලෙස | 250 පමණ | 5.8 |
| ක්‍රීඩා සමාජ සඳහා භාණ්ඩ ලබා දීම | වාර්ෂිකව ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා කටයුතු වෙනුවෙන් අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම | සියලුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය වන ලෙස | ක්‍රීඩා සමාජ 700 ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 6.4 |

## පසුගිය වසර 03 තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපාති.

| අ.අ | සංවර්ධන ව්‍යාපෘතිය | ප්‍රගතිය (ප්‍රමාණය/ප්‍රතිලාභීන් ගණන) | | | | වැය කළ මුදල (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 01 | ක්‍රීඩා පිටිය සංවර්ධනය | 1000 | 1200 | 500 | - | 2.9 | 2.2 | 0.98 | 0 |
| 02 | උපහාර උළෙල (ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකරු) | ජාතික -56<br>ජාත්‍යන්තර -10 | ජාතික -80<br>ජාත්‍යන්තර -12 | ජාතික -48 | - | 5.0 | 0.52 | 8.4 | 5.8 |
| 05 | දිරිදීමනා ලබා දීම | - | 40 | 43 | 7 | | 1.0 | 0.8 | 0.11 |
| 06 | පෝෂණ දීමනා ලබා දීම | - | 144 | 142 | 121 | | 1.85 | 1.77 | 1.52 |

## වර්ෂය තුළදී ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2020

### ක්‍රීඩා උපහාර ලබා දීම



2019 වර්ෂයේ ජාතික මහා ක්‍රීඩා උළෙළ නියෝජනය කර ජයග්‍රාහනය ලබා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඊට උරදුන් පුහුණුකරුවන් සඳහා කුසලතා ඇගයීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කළ අතර ජාතික මට්ටමේ තරග නියෝජනයෙන් ජයගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 122 ක් සඳහා ද ඒ සඳහා උරදුන් පුහුණුකරුවන් ජාතික 48 දෙනෙකුද ඇගයීමට ලක්කල හැකි විය. 2019 වර්ෂයේ ජාත්‍යාන්තර තරග නියෝජනය කල ක්‍රීඩක ක්‍රීඩිකාවන් 43 දෙනෙකු වූ අතර ඉන් ක්‍රීඩක ක්‍රිඩක ක්‍රීඩිකාවන් 35 දෙනෙකු සඳහා 2019 වර්ෂයේ දිරි දීමනා ලබා දුන් අතර 2020 වර්ෂයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 08 ක් සඳහා දිරි දීමනා හා ත්‍යාග සමඟ උපහාර ලබා දුන් අතර, එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට පුහුණුව සඳහා උරදුන් උපහාරලාභි ජාත්‍යන්තර පුහුණු කරුවන් 21 ක් සඳහා ඇගයීම් සිදු කළ අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 122 දෙනෙකු වෙනුවෙන් පෝෂණ දීමනා ලබා දීමට ද හැකි විය. මේ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු මි 7.8ක් වන අතර ඒ සඳහා වැය වූ මුදල රු.මි. 5.8 කි.

තිරසර සංවර්ධන අරමුණු වලට දක්වන ලද දායකත්වය ලෙස නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සහජීවනය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සියදිවි නසා ගැනීම්/මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම කිරීම යන තිරසර සංවර්ධන අරමුණ මෙන්ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම යන තිරසර සංවර්ධන අරමුණ ලගා කර ගැනීම සඳහා දායකත්වය දැක්වීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත.

## ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා භාණ්ඩ හා උපකරණ ලබා දීම





## ක්‍රීඩා සමාජ සඳහා භාණ්ඩ බෙදා දීම




## ප්‍රාදේශීය තරග පැවැත්වීම (අන්තර් ක්‍රීඩා සමාජ තරග)

රාජාංගනය




කහටගස්දිගිලිය




මැදවච්චිය




## පුහුණු වැඩසටහන් පැවැත්වීම

නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සහජීවනය ප්‍රවර්ධනය කිරීම. 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරිම සියදිවි නසා ගැනීම්/ මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම කිරිම යන තිරසර සංවර්ධන අරමුණ මෙන්ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම යන තිරසර සංවර්ධන අරමුණ ලගා කර ගැනීම සඳහා දායකත්වය දැක්විම ද මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත.




පුහුණු අවස්ථාවට පෙර

පුහුණු අවස්ථාවට පසු




## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

2020 වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් මූලධන වියදම් සඳහා ප්‍රතිපාදන නොලැබුණු අතර පුනරාවර්ථන වියදම් හා අව්ච්ඡේද වැඩසටහන් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද අතර එම ව්‍යාපෘති මගින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු 17 න් අරමුණු 03 ක් කරා ලගා විමට අවශ්‍ය දායකත්වය ලබා දීමට පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවට හැකියාව ලැබි ඇත.

නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සෞඛ්‍යවනය ප්‍රවර්ධනය කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම යන තිරසර සංවර්ධන අරමුණ 02 ලගා කර ගැනීම හා දර්ශක කෙරේ යොමු විමට හැකි වි ඇත. එම තිරසර සංවර්ධන අරමුණ කරා යාමට හැකි වන ආකාරයේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරිමට හැකියාව ලැබුණි. ඒ අතර දෙස් විදෙස් තරග සඳහා සහභාගි වී ජයග්‍රහණය කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් 08 දෙනෙකු ඇගයීමට ලක්කිරිම ඒ සඳහා උරදුන් නිලධාරීන් 21 ඇගයීමට ලක්කිරිම ජාතික තරග ජයග්‍රහකයන් 122 දෙනෙකුට දිරි දීමනා ලබා දීමට හා පෝෂණ දීමනා 122 දෙනෙකුට ලබා දීමට ද හැකිවිය. ඒ තුලින් තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීමට අවශ්‍ය දායකත්වය ලබා දීමට හැකිවිය. එනම් 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරිම සියදිවි නසා ගැනීම්/මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම කිරිම යන දර්ශකයන් කෙරේ යොමු විය හැකි විම සතුටට කරුණකි. විවේක කාලය නිකරුනේ ගත කිරිමට යොමු වන තරුණ කරුණියන් වැඩි දෙනෙකු මත්ද්‍රව්‍ය මත් පැන් භාවිතයට විවධ විෂමාචාර වලට යොමු වේ. නමුත් ඒ අය ක්‍රීඩාව කෙරේ යොමුවීමෙන් හා ක්‍රීඩාව කෙරේ යොමු වීමට පෙළඹවීම තුලින් තිරසර සංවර්ධන අරමුණ ලගා කර ගැනීමට දායක විය හැකිය. ක්‍රීඩා කටයුතු කෙරේ යොමු විමට පෙළඹවීමක් ඇති කල හැකි වැඩසටහන් රාශියක් අප දෙපාර්තමේන්තුව වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි. ක්‍රීඩා සමාජ බල ගැන්විම තුලින් ක්‍රීඩාවට යොමු වන පිරිස වැඩි කර ගැනීම/විවිධ ඉසව් ජයග්‍රහණ කල දරු දැරියන් විවිධ ආකාරයෙන් ඇගයීම/ක්‍රීඩක ඇඳුම් උපකරණ ලබා දීම/පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම වැනි ව්‍යාපෘති තුලින් තිරසර සංවර්ධන අරමුණු කෙරේ යොමු විමට හැකියාව ලැබි ඇත.

ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරිම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසිමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරිම යන තිරසර සංවර්ධන අරමුණ කරා ගමන් ගන්නා ආකාරයේ ව්‍යාපෘති කිහිපයක්ද ක්‍රියාත්මක කිරිමට හැකිවිය. ඒ අතර කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය /වාර්ෂිකව ක්‍රීඩා පිටි සංවර්ධනය/ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ලබා දීම සිදු කර ඇත. ඉහත විග්‍රහ කල ආකාරයට තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම කෙරේ දායක වීමෙන් උතුරු මැද පළාත තුල බොනොවන රෝග සඳහා ගොදුරුවීමේ ප්‍රවනතාවය අඩු කිරිම/ මත්පැන් ද්‍රව්‍ය භාවිතයට යොමුවන ප්‍රමාණය අවම කිරිම /මානසික ව්‍යාකූලතා අවම කිරිම/ සියදිවි හානි අවම කිරිම යන ඉලක්ක කරා යොමු විම අපගේ අරමුණයි.

## 2021 දී ක්‍රියාත්මක කිරිම සඳහා යෝජිත නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අදහස් හා යොජනා

දැක්ම කරා ලගා විමට හැකිවන ආකාරයේ සංවර්ධන ව්‍යාපෘති කිපයක් 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කිරිමට යෝජනා දැනටමත් සකස් කර ඉදිරිපත් කර ඇත. ඒ අතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සියල්ල ආවරණය වන පරිදි ක්‍රීඩා සමාජ 700 කට අධික ප්‍රමාණයක් අප දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අතර ඔවුන් මුහුණ දෙන ප්‍රධන ගැටලුවක් ලෙස පුහුණු කටයුතු සඳහා ප්‍රමාණවත්

ක්‍රීඩා භාණ්ඩ නොමැත විම හදුනා ගෙන ඇත. මේ නිසා වාර්ෂිකව ඔවුන්ගේ අවශ්‍යතා හදුනා ගෙන ඒ සදහා අවශ්‍ය භාණ්ඩ ලා දීමට රුපියල් මිලියන 7.0 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර ඇත.

එමෙන්ම අප දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සිටින ක්‍රීඩා නිලදාරින් මෙතෙක් කල් පුහුණු කටයුතු සදහා තම තමන් විසින් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් සපයා ගන්නා ලද භාණ්ඩ හා උපකරණ පමණක් යොදාගනිමින් පුහුණු විම් සුදු කරන ලදි. එහිද නිලධාරින් ගැටලු සහගත තත්වයන්ට මුහුණ දෙන බව නිරන්තරයෙන් වාර්තා වේ. එම ගැටලුවට විසදුමක් ලෙස 2021 වර්ෂයේ එම නිලධාරින් සියලු දෙනාට තම තමන්ගේ පුහුණු කටයුතු සදහා අවශ්‍ය අවශ්‍යතා හදුනා ගෙන එම අවශ්‍යතා සම්පූර්ණ කිරිම සදහා මෙවර අයවැයෙන් රුපියල් මිලියන 3.0 ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත.

තවද අප දෙපාර්තමේන්තුවේ දැනට විවිධ තරග ඉසව් පුහුණු කරනු ලබන පුහුණුකරුවන්ද ඔවුන්ගේ පුහුණු කටයුතු සදහා ද ප්‍රමාණවත් උපකරණ හා පහසුකම් නොමැති වීමෙන් ගැටලු සහගත තත්වයන්ට මුහුණ දී ඇත නව පුහුණු උපකරණ ඒ පිළිබද තාක්ෂණික දැනුම මදකම මෙන්ම උතුරු මැද පළාතේ එළිමහන් ක්‍රීඩා කටයුතු සදහා ප්‍රමාණවත් පහසුකම් නොමැති බවටද විවිධ අංශ වලින් වාර්තා වී ඇත. එම පහසුකම් සංවර්ධනය සදහා රුපියල් මිලියන 3.0 ක මුදලක් වෙන් කර ඇත. උතුරු මැද පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වර්ධනය කිරිම සදහා පුහුණු අවස්ථා අනෙක් පළාත් වලට සාපේක්ෂව නොමැති වීම නිසා ක්‍රීඩක ක්‍රීඩාකාවන්ගේ කුසලතා වර්ධනය සම්බන්ධ ගැටලු පවතින බව නිරික්ෂණය විය. එම නිසා 2021 වර්ෂයේ හා පුහුණු කදවුරු පැවැත්විම සදහාද රුපියල් මිලියන 4.0 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර ඇත. එමෙන්ම ක්‍රීඩා පිටි සංවර්ධනය පුහුණු වැඩ සටහන් පැවැත්විම වැනි වැඩසටහන් ද පැවැත්විමට කටයුතු දරා ඇති අතර මේ තුලින් අපගේ දැක්ම කරා ලගා වීම අප දෙපාර්තමේන්තුවේ අරමුණයි.

## දෙපාර්තමේන්තුවේ අනාගත අපේක්ෂාවන්

| සංවර්ධනය සදහා හදුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිඵලය ඇතුලත් ගමන් මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| ක්‍රීඩා නිලධාරි/ පුහුණු කරුවන් හට ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරිම සදහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ලබා දීම | 1.පුහුණු කටයුතු පහසු වීම<br>11.විවිධ ඉසව් සදහා යොමුවන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ සහභාගිත්වය වැඩි විම<br>111.ලබා ගන්නා ජයග්‍රහන වැඩිවීම<br>1V.නිලධාරින්ගේ මනසික යහපත් ව වර්ධනය විම | 1.පුහුණු අවස්ථා වැඩි වීම තුලින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ඉහළ ස්ථානයක් උතුරු මැද පළාතට ලබා ගැනීම<br>11.පළාත තුල නිරෝගි සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහිකිරිම |
| පුහුණු කදවුරු පැවැත්විම | 1.ජාතික හා ජාත්‍යන්තර තරග සදහා දක්ෂතා මට්ටම වැඩි දියුණු කිරිම<br>11.ක්‍රීඩාවට උචිත මානසික සංවර්ධනය | 1.ක්‍රීඩක සංචිතයක් ගොඩනැගීම<br>11.ජාතික හා ජාත්‍යන්තර තරග නියෝජන හා ල ගන්නා ජයග්‍රහණ වැඩි කර ගැනීම |
| ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම තුලින් අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම | 1.සහභාගිත්වය වැඩි විම<br>11.ලබන ජයග්‍රහණ වැඩි විම | පළාත තුල නිරෝගි සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහිකිරිම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2020 වර්ෂයේදී ලද ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරමින් උතුරු මැද පළාත් ක්‍රීඩා අංශය නංවාලීම සඳහා කටයුතු කරන ලදී. එහිදී ක්‍රීඩා උපහාර ලබා දීම, ක්‍රීඩා උපකරණ ලබා දීම, අන්තර් ක්‍රීඩා සමාජ තරඟ පැවැත්වීම, පුහුණු වැඩසටහන් හා පුහුණු කඳවුරු පැවැත්වීම සිදු කරන ලදී.

## කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු

කොවිඩ් 19 වෛරසය හේතුවෙන් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට යෝජනා කරන ලද කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමට නොහැකි විය. මූලධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නොලැබුණු අතර 2019 වර්ෂයේ අඛණ්ඩ වූ ව්‍යාපෘති කිහිපයක් සඳහා ප්‍රතිපාදන ලැබීම හා පුනරාවර්තන වියදම් යටතේ ලැබුණු ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් උපරිම වශයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ අවශ්‍යතා සපුරාලීමට හැකියාව ලැබුණි.

ඒ අතර වසර ගණනාවක් තිස්සේ ජාතික හා ජාත්‍යන්තර තරග නියෝජනයෙන් ජයග්‍රහණය ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඒ සඳහා උර දුන් පුහුණුකරුවන් ඇගයීම වෙනුවෙන් පවත්වනු ලබන ජගත් කෙළිබිමට රන් අරුණැල්ලක් ක්‍රීඩා උපහාර උත්සවය සෞඛ්‍ය නීති රීති වලට අනුව පැවැත්වීමට නොහැකි විය. නමුත් එය අභියෝගයක් කර නොගත් අප දෙපාර්තමේන්තුව සියලුම ජයග්‍රාහකයන් ඇගයීමට පෝෂණ දීමනා හා දිරි දීමනා ලබා දීමට කටයුතු කරන ලද අතර ඔවුන්ට ඒම ජයග්‍රහණ සඳහා උරදුන් පුහුණුකරුවන් ද ඇගයුමට ලක් කරන ලදි.

එමෙන්ම අන්තර් ක්‍රීඩා සමාජ තරග පැවැත්වීමද අභියොගයක් වුවත් ප්‍රාදේශිය වශයෙන් හැකි ආකාරයට තරග පවත්වා අවසන් කරන ලදි. ඒ අතර විශාල ලෙස ජනතාව එක් වන ක්‍රීයා කිරිමට අවස්ථාව නොලැබිම හේතුවෙන් මලල ක්‍රීඩා සියල්ල පැවැත්විමට නොහැකි විය. අඛණ්ඩ ව්‍යාපෘති යටතේ ලැබුණු ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් ක්‍රීඩා සමාජ සඳහා ලබා ගත් භාණ්ඩ ක්‍රීඩා සමජ 700ක් වෙනුවන් ලබා දීමට හැකියාව ලැබුණි.

හැකි හැම ආකාරයෙන්ම ක්‍රීයාත්මක වී ගෝලීය වසංගත තත්වය හමුවේ උතුරු මැද පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ගොඩනගාගත් අරමුණු වලින් 80% ක් පමණ ඉටු කිරිමට හැකි විය.

# 10. පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා යන විෂයන් මෙම අමාත්‍යාංශ විෂය පථයට අයත් වන අතර ප්‍රධාන වශයෙන් නිවාස හා කාන්තා යන විෂයන් දෙකෙහි සංවර්ධන වැඩසටහන් හා ආයතන කටයුතු සෘජුව අමාත්‍යාංශය විසින් මෙහෙය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරෙන සංවර්ධන වැඩසටහන් හා ආයතන කටයුතු ද, ඉඩම් හා ග්‍රාම සංවර්ධන විෂය පථයට ගැනෙන සංවර්ධන වැඩසටහන් හා ආයතන කටයුතු ද, ව්‍යාවස්ථාපිත ආයතනයක් වන පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන ලබන මාර්ග සංවර්ධන කටයුතු හා ආයතන කටයුතු අධීක්ෂණය හා මෙහෙය වීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

## උතුරු මැද පළාතේ මාර්ග සංයුතිය

විධායක ඉංජිනේරු කාර්යාල

| අනුරාධපුර දිස්ත්‍රික්කය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව(කි.මී.) |
|---|---|---|---|
| මරදන්කඩවල | 184.55 | 190.40 | 374.95 |
| හොරොව්පොතාන | 146.66 | 226.58 | 373.24 |
| නොච්චියාගම | 212.03 | 107.45 | 319.48 |
| අනුරාධපුර | 197.35 | 173.17 | 370.52 |
| එකතුව | **740.59** | **697.60** | **1438.19** |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව(කි.මී.) |
|---|---|---|---|
| මින්නේරිය | 153.45 | - | 153.45 |
| මනම්පිටිය | 225.62 | 12.56 | 238.18 |
| සේවාගම | 116.65 | 0.85 | 117.50 |
| එකතුව | **495.72** | **13.41** | **509.19** |

## දැක්ම

"තෘප්තිමත් ජනතාවක් ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු සම්බන්ධ සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව නියාමනය කිරීම මඟින් සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු

ජාතික සාර්ව ප්‍රතිපත්තිවලට අනුකූලව ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස කටයුතු හා කාන්තා කටයුතු පිළිබඳ උතුරු මැද පළාතේ ප්‍රතිපත්ති සකස් කිරීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම මෙන්ම නිවාස හා කාන්තා කටයුතු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් පළාතේ ජනතාවගේ ජීවන තත්වය වර්ධනය කිරීමට දායක වීම.

## කෙටිකාලීන අරමුණු

- පළාත් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම.
- තෝරාගත් අඩු ආදායම්ලාභීන් වෙත නිවාස ඉදි කිරීම හා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම.
- තෝරාගත් වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම.
- තෝරාගත් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම හා ජන ජීවිතය උසස් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් (සජීවිකරණ) පැවැත්වීම.
- තෝරාගත් අඩු ආදායම්ලාභී කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ස්වයංරැකියා උපකරණ ලබා දීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- අඩු ආදායම්ලාභී පවුල් හා වැන්දඹු කාන්තාවන් ඉලක්ක කොට සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ නිවාස හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම.
- ක්ෂේත්‍ර අධීක්ෂණය.
- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- නිවාස ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.




## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 65ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 31 කි. පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. සෑම පවුලකටම සුව පහසු නිවාසයක් ලබා දීමේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුරූපීව පළාතේ අඩු ආදායම්ලාභී නිවාස නොමැති පවුල් සඳහා නව නිවාස ඉදිකිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2.සෘජුව ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක් ගොඩ නැගීමේ වැඩසටහන යටතේ මෙම අමාත්‍යාංශය විසින් දිරිය කාන්තා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

3.සුව පහසු ගමනක් පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක්.ජාතික ප්‍රතිපත්තියට අනුව සුවපහසුවෙන් හා ඉක්මනින්, ආරක්ෂාකාරීව තම ගමනාන්තය කරා ලඟා වීමේ උතුරු මැද පළාතේ ජනතවගේ අයිතිය සුරක්ෂා කිරීම සඳහා පළාතේ පවතින මාර්ග ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීමේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

4.සෞභග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුව වාරි සෞභාග්‍යා වැඩසටහන සඳහා උතුරු මැද පළාතේ ගොවි ජනතාව පරිහරණය කරනු ලබන ජලාශ, කුඩා වැව් හා ඇල වේලි ඉදිකිරීම හා නඩත්තු කටයුතු සඳහා වන සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කොට පෙළ ගැස්සවීම.

5.ඵලදායී පුරවැසියෙක් හා සතුටින් ජීවත් වන පවුලක් ජාතික ප්‍රතිපත්තියට අනුරූපීව උතුරු මැද පළාතේ ග්‍රාමීය ජන ජීවිතය නඟා සිටුවීමේ වැඩසටහන් පැවැත්වීම.

## තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනිම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | දුර (කි.මී.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රා. ලේ කො.ගණන | මුදල (රු.මී.) |
|---|---|---|---|---|
| 311 තුලානේ සිට බුද්ධන්නේගම අඩුකැටියාව දක්වා වූ මාර්ගය බෝක්කු 07 ක් යොදා කාපට් අතුරා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 6+800) | 6.8 | 1994 | ම.නු.ප. | 46.2 |
| අංක 313 ග්‍රාම සේවා කොට්ඨාසයේ ගැටලාව මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීම (කි.මී. 0+000 – 1+000) | 1 | 2677 | ම.නු.ප. | 2.9 |
| අලියාවැටුණුවැව පිවිසුම් මාර්ගය බෝක්කු 03 ක් යොදා ඒ.බී.සී. පාදකය සහිතව සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 1+700) | 1.7 | 724 | කැකිරාව | 25.4 |
| බඳනාගල මාර්ගය ඒ.බී.සී. යොදා සංවර්ධනය කිරීම (කි.මී.0+626 – 1+382) | 0.75 | 1325 | දිඹුලාගල | 28.7 |
| මරදන්කඩවල-මිදිවත්ත මාර්ගය මැකඩම් ක්‍රමයට තාර යොදා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 0+590) | 0.5 | 3041 | කැකිරාව | 6.1 |
| පැල්බැදියාව-කටුගහකරඹෑව කෘෂි මාර්ගය බෝක්කු 03 ක් සහිතව බොරළු දමා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 1+500) | 1.5 | 826 | පලාගල | 8.4 |
| අංක 315 ජයන්ති ග්‍රාමය (ළමා නිවාස ඉදිරිපිට) මාර්ගය ඒ.බී.සී. පාදකය සහිතව කාපට් අතුරා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 0+400) | 0.4 | 526 | ම.නු.ප. | 6.3 |
| මැදගම 104 තුලාන කෝලිබැන්දෑව ප්‍රධාන මාර්ගය කාපට් කිරීම (කි.මී.1+000 – 0+850) | 0.8 | 1377 | ම.නු.ප. | 20.9 |
| කඳුපාගම -උඩිඩියන්කුලම මාර්ගය බෝක්කු 08 ක් සහිතව ඒ.බී.සී. පාදකය සහිතව කාපට් අතුරා සංවර්ධනය කිරීම (කි.මී. 0+000 – 2+000) | 2 | 967 | තිරප්පනේ | 45.1 |
| ධම්මශීලාරාමයට යන මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම (0+000 -0+670) | 0.6 | 1026 | ඉපලෝගම | 12.6 |
| පරසන්ගස්වැව-මැදගම-කෝලිබැදිවැව මාර්ගය සංවර්ධනය කිරීම (1+000-2+250) | 2.25 | 1377 | ම.නු.ප. | 27.78 |
| සූරියගම මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම (0+750-1+750,0+000-0+650) | 1.7 | 2077 | කැකිරාව | 16.1 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට යම් ආකාරයකින් කරන ලද දායකත්වය

තිරසර සංවර්ධන අරමුණු 05 ඔස්සේ උතුරු මැද පළාතේ ජනතාවගේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියළු කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය මගින් කාන්තා දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩසටහන් සැලසුම් කරන ලදි. ඒ යටතේ කාන්තාවන්ගේ ආර්ථික අභිවෘද්ධිය සඳහා ඔවුන් ස්වයං රැකියාගත කිරීම තුළ ආර්ථිකය සවිමත් කර කාන්තාවන් ජාතික ආර්ථිකයේ කොටසක් බවට පත් කිරීම සඳහා මෙම අමාත්‍යාංශය වාර්ෂිකව වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කරනු ලැබේ. 2020 වසර සඳහා සැලසුම් කල පරිදි ඉලක්ක වෙත ලඟා වීමට ප්‍රතිපාදන වෙන් නොවුණි. එමෙන්ම තිරසර සංවර්ධන අරමුණු 11 ඔස්සේ නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් හා තිරසර ලෙස සකස් කිරීමේ අරමුණු තුළ පළාතේ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම සඳහා අඩු ආදායම්ලාභීන් වෙත ස්ථිර නව නිවාස ඉදි කිරීම හා සුරක්ෂිත සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සඳහා වැඩසටහන් සැලැසුම් කරන ලදි. වාර්ෂිකව අමාත්‍යාංශ තුළින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළද 2020 වසර තුළ ඒ සඳහා ප්‍රතිපාදන අනුමත නොවීම හේතුවෙන් ඉලක්ක කරා ලඟා වීමට නොහැකි විය.

## පසුගිය වසර 03 ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ.අ | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකර ගැනීමඅපේක්ෂා කළ සුවිශේෂී අරමුණු (Specific objectives) | ප්‍රගතිය (ප්‍රමාණය/ප්‍රතිලාභීන් ගණන ) | | | වැය කළ මුදල (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2017 | 2018 | 2019 |
| 01 | කාන්තා සවිබල ගැන්වීම. | 01.ස්වයං රැකියා ඉලක්ක කොට පුහුණු පාඨමාලා පැවැත්වීම. | 2700 | 1000 | 1500 | 3.01 | 1.27 | 1.30 |
| 02 | දිරිය කාන්තා වැඩසටහන | 50% දායකත්වය මත මහණ මැෂින් ලබාදීම. | 161 | 150 | 74 | 2.89 | 2.83 | 1.50 |
| 03 | වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස අලුත්වැඩියා කරදීම. | නිවාස අලුත්වැඩියා කරගැනීම සඳහා මූල්‍ය / ද්‍රව්‍යාධාර ලබාදීම. | 335 | 175 | - | 6.70 | 3.50 | - |
| 04 | අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ආධාර ලබාදීම. | නිවාස ආධාර ලබාදීම. | 915 | 1139 | - | 7.87 | 14.99 | - |

## 2020 වසරේදී ක්‍රියාත්මක කළ සියළුම ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | |
|---|---|
| මල්වතු ඔය ශ්‍රී භාරතීන්ද්‍ර මාවත පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය |     |
| ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ඉදිවෙන පොළොන්නරුව අසේලපුර මාර්ගය |  |
| ඉහළ ඇළහැර ව්‍යාපෘතිය යටතේ මොරගහ කන්ද ජලාශයේ සිට අනුරාධපුරය දක්වා ජලය රැගෙන එන ඇළ මාර්ගයේ ඉදිකිරීම් |   |
| වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය |   |
| දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය තුළ නිෂ්පාදන පෙළගැස්ම |   |

| | |
|---|---|
| උතුරු පළාත් මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි වූ මාර්ග |   |
| නිවාස සංවර්ධන ව්‍යාපෘති තුළින් ඉදි කරනු ලැබූ  නව නිවාස |   |
| වැන්දඹු කාන්තාවන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ 50% දායකත්වය මත අධිවේගී මහන මැෂින් ලබාදීම |  |

## තම ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

තෘප්තිමත් ජනතාවක් ඉසුරුමත් පළාතක් ගොඩනැගීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වසර තුළ මෙම ආමාත්‍යාංශය මඟින් සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ යටතේ පළාතේ ජනතාවගේ නිවාස ගැටළුව විසඳීම සඳහා අඩු ආදායම්ලාභී නිවාස නොමැති පවුල් වෙත නව නිවාස 110 ක් ඉදි කිරීමට සැලසුම් සකස් කර ඇති අතර ඒ සඳහා රු.මි.33 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ. මෙමඟින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක පළාත තුල ලඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

උතුරු මැද පළාතේ වැසිකිළි පහසුකම් නොමැති පවුල් 12127 ක ප්‍රමාණයක් සිටින අතර මෙය සෘජුව සෞඛ්‍ය කෙරෙහිද යම් බලපෑමක් සිදු කරනු ලබයි. මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා පළාත තුළ සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් සඳහා වැසිකිළි 150 ක් ඉදි කිරීම වෙනුවෙන් රු.මි. 06 ක් වැය කිරීමට සැලසුම් කොට ඇත.  පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

පළාත තුළ කාන්තා සජීවීකරණය හා බල ගැන්වීම යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා දිරිය කාන්තා වැඩසටහන යටතේ 50% දායකත්වය මත අධිවේගී මහන මැෂින් ලබා දීම මඟින් සෘජුව ආර්ථිකයට වග කියනු ලබන ව්‍යවසායකයන් බිහිකිරීමට අපේක්ෂා කෙරේ. එසේම අඩු ආදායම්ලාභී කාන්තා මූලික පවුල්වල නිවාස අලුත්වැඩියා කොට දී කාන්තා සුරක්ෂණය අපේක්ෂා කරමු . ඒ සඳහා රු.මි. 08 ක් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

තිරසර සංවර්ධන අරමුණු 09 ඔස්සේ සවිමත් යටිතල පහසුකම් ගොඩ නැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මිකත්වය ප්‍රවර්ධනය කර දිරි ගැන්වීමේ අරමුණ පළාත තුළ යථාර්තයක් කිරීම සඳහා මාර්ග සංවර්ධන විෂය තුළ පළාත් මාර්ග සංවර්ධනය හා පුනරුත්ථාපනය, නවීකරණය වෙනුවෙන් අමාත්‍යාංශ විසින් ප්‍රතිපාදන වැය කර ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ රු.මි. 350 ක් පමණ ඇස්තමේන්තු වටිනාකමක් සහිත මාර්ග සංවර්ධන ව්‍යාපෘති 22 ක් පළාත ආවරණය පරිදි 2021 වසර තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතය. විශේෂයෙන්ම පළාතේ ග්‍රාමීය හා නාගරික ජනතාවගේ ගමනාගමන පහසුකම් හා ගොවි නිෂ්පාදන අඩු කාල පරිච්ඡේදයකින් වෙළඳපොළ වෙත රැගෙන යාම හා ගබඩා පර්යන්ත වෙත රැගෙන යාමේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කෙරේ. එසේම ග්‍රාමීයව හා නාගරිකව අන්තර් සම්බන්ධතාවයන් වැඩි දියුණු වන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායකත්ව සැපයීමට අපේක්ෂා කෙරේ.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් ගමන්මඟ | |
|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන |
| 01.කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ආකල්ප වර්ධනය කිරීමට වැඩසටහන් පැවැත්වීම. | 01.දැනුම හා කුසලතා වර්ධන වීම. | 01.කාන්තාවන්ගේ ජීවන තත්වය උසස් කිරීම. |
| 02. කාන්තා මුලික පවුල් සඳහා ස්වයං රැකියා හඳුන්වා දීම. | 02.කාන්තාවන්ගේ ආදායම් උත්පාදනය වැඩි කිරීම. | 02 කාන්තාවන්ගේ ජීවන තත්වය උසස් කිරීම. |
| 03. අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරිම . | 03 ස්ථිර හා සෞඛ්‍ය ආරක්ෂිත වාසස්ථාන ලබාදීම. | 03. ආර්ථික අධ්‍යාපනික හා සාමාජීය වශයෙන් ජීවන තත්වය උසස් කරවීම. |
| 04.අඩු ආදායම්ලාභීන්ගේ නිවාස අලුත්වැඩියාව හා වැඩි දියුණු කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම. | 04. ස්ථිර හා සෞඛ්‍ය ආරක්ෂිත වාසස්ථාන ලබාදීම. | 04. ස්ථිර හා සෞඛ්‍ය ආරක්ෂිත වාසස්ථාන ලබාදීම. |
| 05. පළාතේ අඩු ආදායම්ලාභී පවුල් වල සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම. | 05. සනීපාරක්ෂක කටයුතු ක්‍රමවත් වීම. | 05. සෞඛ්‍ය තත්වය උසස් කිරිම. |

## විදේශාධාරා මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය

| ව්‍යාපෘතිය | අරමුණ | මුදල (රු.මි.) | | ප්‍රගතිය (%) | | කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ | වැය කළ | භෞතික (%) | මූල්‍ය | | |
| වැව්ගම පුබුදුව | වැව් ප්‍රතිසංස්කරණය | 1322.00 | 521.00 | 78% | 39% | ප්‍රමාණවත් පරිදි වාරි ජලය සැපයීම | කෘෂි ආර්ථිකය වැඩි දියුණු කිරීම |
| දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | කෘෂිකර්මාන්තය සඳහා ජලය සැපයීම | 28.8 | 14.6 | 87% | 75% | ගොවීන්ගේ වගාවන් සඳහා ජලය ලැබීම | ගොවීන්ගේ ජීවන තත්වය උසස් කිරීම. |
| මල්වතුඔය ශ්‍රී භාරතීන්ද්‍ර මාවත පාලම ඉදිකිරීම | මාර්ග පහසුකම් වැඩි දියුණු කිරීම | 216.32 | 135.00 | 62% | 62% | යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | ප්‍රදේශයේ ජනතාවගේ ගමනා ගමන පහසුකම් වැඩි දියුණු වීම. |
| ඉහළ ඇලහැර ව්‍යාපෘතිය | පළාතේ ජනතාවට කෘෂිකර්මාන්තය සඳහා ජල පහසුකම් සලසා දීම | 11472.00 | 4455.00 | 38% | 39% | ගොවීන්ගේ වගාවන් සඳහා ජලය ලැබීම | ගොවීන්ගේ ජීවන තත්වය උසස් කිරීම. |
| ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | පළාතේ මාර්ග සංවර්ධනය | 1492.00 | 1.37 | 6% | 1% | මාර්ග පද්ධතිය නවීකරණය වීම. | පළාතේ ආර්ථිකය වැඩි දියුණු වීම හා ආරක්ෂාකාරී ගමනාන්තයක් කරා ගමන් කිරීමට හැකි වීම |
| ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන | පළාතේ මාර්ග සංවර්ධනය | - | 71.67 | 54% | - | මාර්ග පද්ධතිය නවීකරණය වීම. | පළාතේ ආර්ථිකය වැඩි දියුණු වීම හා ආරක්ෂාකාරී ගමනාන්තයක් කරා ගමන් කිරීමට හැකි වීම |
| උතුරු පළාත් මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය | පළාතේ මාර්ග සංවර්ධනය | 429.14 | 526.39 | 100% | 100% | ගමනාගමන පහසුකම් වැඩි දියුණු වීම | අන්තර් පළාත් ආර්ථිකය වැඩි දියුණු වීම |

## සමස්ත කාර්ය සාධනය පිළිබඳ අදහස

මෙම අමාත්‍යාංශය මඟින් 2020 වර්ෂයේ නිවාස හා කාන්තා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද 2020 වර්ෂයට ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් කාන්තා හා නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර එම යෝජනා 2021 වර්ෂයේ පළමු කාර්තුවේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මාර්ග පුනරුත්ථාපනය සඳහා 2020 වසර අවසන් කාර්තුව තුළ රු.මි. 246 ක පමණ ප්‍රතිපාදනයක් වෙන් කල අතර ඒ යටතේ ව්‍යාපෘති 12 ක් අනුමත කරන ලදි. වර්ෂ අවසානයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කොට කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කරන ලදි. එහෙත් වර්ෂ අවසානයේ පැවති අධික වර්ෂා තත්වය හේතුවෙන් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය ඉලක්කගත පරිදි ලඟා කර ගැනීමට නොහැකි විය. මෙම ව්‍යාපෘති 2021 වසර මුල් කාර්තුවේ නිම කිරීමට සැලසුම් කර ඇත.

විදේශාධාරා මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ලෙස මල්වතු ඔය ශ්‍රී භාරතීන්ද්‍ර මාවත පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ඉදිවෙන පොළොන්නරුව අසේලපුර මාර්ගය, ඉහළ ඇළහැර ව්‍යාපෘතිය යටතේ මොරගහ කන්ද ජලාශයේ සිට අනුරාධපුරය දක්වා ජලය රැගෙන එන ඇළ මාර්ගයේ ඉදිකිරීම්, වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය තුළ නිෂ්පාදන පෙළගැස්ම හා උතුරු පළාත් මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි වූ මාර්ග යන ව්‍යාපෘති මෙම වසර තුල සිදු කරන ලද ව්‍යාපෘතීන්ය.

## Covid 19 ගෝලීය වසංගතය නිසා සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

අමාත්‍යාංශය වෙත පැවරි ඇති ප්‍රධාන කාර්යයන් වනුයේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතන වල අධීක්ෂණය නියාමනය හා සම්බන්ධීකරණය පවත්වාගෙන යාම වේ. අමාත්‍යාංශය වෙත පැවරී ඇති සෘජු විෂයක් වනුයේ කාන්තා සංවර්ධන කටයුතු හා නිවාස සංවර්ධන කටයුතු වේ. එහි දී ඉඩම්, ග්‍රාම සංවර්ධන, වාරිමාර්ග හා මාර්ග සංවර්ධන යන විෂයන් වලින් ක්‍රියාත්මක කළ අඛණ්ඩ ව්‍යාපෘති වල ප්‍රගතිය 100 % ලෙස සටහන් වූ අතර වාරිමාර්ග හා මාර්ග සංවර්ධන විෂයන් වල ක්‍රියාත්මක කළ නව ව්‍යාපෘති කිහිපයෙහි පහළ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සිදු විය. කොවිඩ් 19 වසංගත තත්වය තුළ කාර්යය මණ්ඩලයේ පැමිණීම සීමා කිරීමට සිදු වුවද සිටින මානව සම්පත උපයෝගී කරගෙන අඛණ්ඩ ව්‍යාපෘති 100% ක් සාර්ථකව නිම කළ අතර නව ව්‍යාපෘතිවලට ප්‍රතිපාදන අවසන් කාර්තුව තුළද නොලැබීම හේතුවෙන් හා වැසි සහිත කාලගුණ තත්වය නිසා අපේක්ෂිත ඉලක්ක සාධනය කර ගැනීමට නොහැකි විය. එසේම කොවිඩ් 19 වසංගත තත්වය නිසා යම් ආකාරයක බලපෑමක් සිදු කරනු ලැබුවද සිටින මානව සම්පත ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම නිසා තරමක් දුරට ඉලක්ක කරා ලඟා වීමට හැකි විය.

අමාත්‍යාංශය වෙත පැවරී ඇති සෘජු විෂයන් අතරින් ප්‍රධානතම විෂයන් වනුයේ නිවාස හා කාන්තා සංවර්ධනයයි. **තිරසර සංවර්ධන අරමුණු යටතේ අංක 01 හි සඳහන් "සෑම දෙසකට සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිම කිරීම" සහ තිරසර සංවර්ධන අරමුණු අංක 11 හි සඳහන් නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම** යන තේමාවන් යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ආධාර ලබා දීම සඳහා යෝජනා සැලසුම් කොට තිබුණි. නමුත් කොවිඩ් ව්‍යසන තත්වය හේතුවෙන් එම **සංවර්ධන** යෝජනා ඉදිරි වර්ෂය වෙත රැගෙන යාමට සිදුවිය. එසේම කාන්තා සවිබල ගැන්වීම සඳහා ඔවුන් පුහුණු කොට ඔවුනගේ දායකත්වය සමඟ ස්වයං රැකියා බිහි කිරීම සඳහා දිරිය කාන්තා වැඩසටහන ද සැලසුම් කොට තිබුණි. තවද පළාතේ අඩු පහසුකම් සහිත ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා යෝජනාද අන්තර්ගත කොට තිබුණි. එසේම අඩු ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස ඉදිකිරීමේ සංවර්ධන යොජනා හා වැන්දඹු කාන්තා මූලික පවුල්වල නිවාස අලුත්වැඩියාව සඳහා ව්‍යාපෘති අනුමත කොට තිබුණද 2020 වසරේ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අපේක්ෂා කළ ඉලක්ක කරා ලඟා වීමට නොහැකි විය.

# 10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාත තුළ පවතින කෘෂිකාර්මික ජීවන රටාව ගොඩනැගීම සඳහා හා කුඩා වාරිමාර්ග පද්ධතියේ සංවර්ධනය සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන මෙහෙයක් සිදු කරමින් පවතී. එහිදී ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුළ පවතින සුළු වාරිමාර්ග තුන්දහස් දෙසිය විසි හයක (3226) ගොවිබිම් අක්කර එක්ලක්ෂ තිස්නව දහසකට (139,000) ආසන්න ප්‍රමාණයක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යය හා බැදේ. එම වැව් පද්ධතිය තව දුරටත් සංවර්ධනය කරමින් හා ප්‍රශස්ත මට්ටමකින් නඩත්තු කර පවත්වාගෙන යමින් පළාතේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. එහිලා පළමු ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය කහටගස්දිගිලිය කැකිරාව හන්දිය අසල පිහිටුවන ලදී. දෙවන ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය කැකිරාව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය අසල පිහිටුවන ලදී. වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු යටතේ මෙම ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල පාලනය වේ. කහටගස්දිගිලිය ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය යටතේ හොරොව්පොතාන, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, මැදවච්චිය, මිහින්තලේ, පදවිය, හා රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ. කැකිරාව උප කාර්යාලය යටතේ කැකිරාව, ගලෙන්බිඳුණුවැව, පලුගස්වැව, තිරප්පනේ, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ සිදු කරනු ලැබේ.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ දැනට පිහිටුවා ඇති අනුරාධපුර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය යටතේ ගල්නෑව, ඉපලෝගම, මහ විලච්චිය, නොච්චියාගම, පලාගල, මධ්‍යම නුවරගම් පළාත, තලාව, නැගෙනහිර නුවරගම් පළාත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරන ලැබේ.දෙපාර්තමේන්තුව සතුව පවතින තත්ත්ව පාලන ඒකකය මගින් මුළු පළාතම ආවරණය වන පරදී සියලුම වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල තත්ත්ව පාලන කටයුතු සිදු කරනු ලැබේ. ආයතන අංශය, සැලසුම් අංශය හා ගිණුම් අංශය ද දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ පිහිටුවා ඇත.

## පළාත් වාරිමාර්ග පද්ධති

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| වාරිමාර්ග වැව් ප්‍රමාණය | 2991 | 235 | 3,226 |
| වැව් මගින් වගා කරන ලද කුඹුරු අක්කර ප්‍රමාණය | 128,608 | 19,881 | 138,877 |
| ගොවි පවුල් සංඛ්‍යාව | 83,885 | 5,779 | 89,664 |

## ප්‍රධාන කෘෂිකාර්මික ජලාශ

| අනුරාධපුර දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්) |
| පදවිය | 85,000 | 83,200 | 6,000 |
| වාහල්කඩ | 43,000 | 12,600 | 2,500 |
| නාච්චාදූව | 45,150 | 94,400 | 3,000 |
| තුරුවිල වැව | 5,190 | 12,200 | 500 |
| නුවර වැව | 36,050 | 13,000 | 2,500 |
| මහකනදරා වැව | 36,250 | 50,400 | 3,200 |
| මහවිලච්චිය වැව | 31,500 | 56,560 | 2,500 |
| තිසා වැව | 3,500 | 800 | 350 |
| බසවක්කුලම වැව | 1,910 | 1,440 | 200 |
| රාජාංගනය වැව | 81,603 | 1,188,000 | 4,000 |
| අංගමුව වැව | 14,400 | 5,000 | 1,200 |
| හුරුළු වැව | 55,000 | 308,000 | 3,500 |
| මානන්කට්ටිය වැව | 7,600 | 9,520 | 750 |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්කර) |
| පරාක්‍රම සමුද්‍රය | 110,000 | 17,920 | 6,275 |
| මින්නේරි වැව | 110,000 | 59,264 | 6,300 |
| ගිරිතලේ වැව | 18,800 | 6,016 | 775 |
| රොට වැව | 1,028 | 4,800 | - |
| කවුඩුළු වැව | 104,000 | 22,400 | 6,400 |
| බෙබියා වැට | 938 | 1,856 | 261 |
| අඹගස් වැව | 4,000 | 12,512 | 318 |
| මහහල්මිල්ල වැව | 900 | 1,575 | 260 |
| ඇල්ලේ වැව | 1,100 | 330 | - |
| පේස්කුලම වැව | 1,750 | 439 | 535 |

**අස්වද්දා ඇති බිම් ප්‍රමාණය අක්කර 200ට වැඩි (විශාල වාරි මාර්ග) කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය ලබාගන්නා ජලාශ**

## දැක්ම

“ප්‍රශස්ත වාරි කළමනාකරණයක්, සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක්.”

## මෙහෙවර

“අතීත උරුමයන් ආරක්ෂාකර ගනිමින්, තාක්ෂණික හා උපදේශන සේවා සැපයීමෙන් සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සුළු හා මධ්‍ය වාරි කර්මාන්තයන්හී ගුණාත්මක සංවර්ධනය, නඩත්තුව, පරිසර ආරක්ෂණය සහ ජල සම්පත ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම මගින් පළාතේ තිරසාර සංවර්ධනයේ ප්‍රමුඛ හවුල්කරු වීම.”

## දිගුකාලීන අරමුණු

- සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම.
- ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ත දැනුමක් සහ අවබෝධයක් ලබා දීම.
- සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම.
- වර්ධනය වූ ආයතනික ධාරිතාවයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ඇළ මාර්ග පද්ධතීන් මනා ලෙස සංවර්ධනය කරමින් නිසි පරිදි නඩත්තු වැඩපිළිවෙළක් පවත්වාගෙන යාම.
- ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අවදානම් තත්වයේ පවතින වැව් සංවර්ධනය කිරීම.
- වාරිමාර්ග රක්ෂිත සලකුණු කිරීම මගින් අනවසර ක්‍රියා අවම කිරීම.
- රොන්මඩ හා ජලජ ශාක ඉවත් කිරීම තුළින් ජල ධාරිතාවය සංවර්ධනය.
- දැනුමෙන් හා හැකියාවෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම.
- පසු අස්වනු හානිය අවම කිරීම, යාන්ත්‍රික කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම.
- වාරි පද්ධති නඩත්තු කිරීම.
- වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම.
- ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම.
- ජල ගැලීම් හා හානි කළමනාකරණය කිරීම.
- පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.
- අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම.
- කාර්යාල පද්ධති ධාරිතාවය ඉහළ නැංවීම.

## උපාය මාර්ගයන්

| අ.අ | කාර්යය | උපායමාර්ග (ය) |
|---|---|---|
| 01 | වාරි පද්ධති පුනරුත්ථාපනය කිරිම | • මුලස්ථායි වැඩ කොටස් පුනරුත්ථාපනය |
| | | • ඇල වේලි පුනරුත්ථාපනය |
| | | • කෘෂි මාර්ග පුනරුතථාපනය |
| | | • පෝෂක ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | • පෝෂක ප්‍රදේශ පුනරුත්ථාපනය |
| | | • අපවහන ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | • එල්ලංගා පද්ධති පුනරුත්ථාපනය |
| 02 | වාරි පද්ධති නඩත්තු කිරිම | • මුලස්ථායි වැඩ කොටස් නඩත්තු කිරිම |
| | | • ඇල වේලි නඩත්තු කිරිම |
| | | • කෘෂි මාර්ග නඩත්තු කිරිම |
| | | • පෝෂක ඇල නඩත්තු කිරිම |
| | | • අපවහන ඇල නඩත්තු කිරිම |
| | | • පෝෂක ප්‍රදේශ නඩත්තු කිරිම |
| | | • එල්ලංගා පද්ධති නඩත්තු කිරිම |
| 03 | වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම | • අමුණු ඉදිකිරිම |
| | | • ඇල වේලි ඉදිකිරිම |
| | | • කෘෂි මාර්ග ඉදිකිරිම |
| | | • පෝෂක ඇල ඉදිකිරිම |
| | | • මුලස්ථායි වැඩ කොටස් ඉදිකිරිම |
| | | • අපවහන ඇල මාර්ග ඉදිකිරිම |
| | | • පවතින ඇල මාර්ග කොන්ක්‍රීට් කිරිම |
| 04 | ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරිම | • ජල කළමනාකරණටය අදාල නිර්මිත ඉදිකිරිම |
| | | • ගොවි සංවිධාන (වාරි කළමණාකරණ කමිටු) බල ගැන්විම |
| | | • දැනුවත් කිරිමේ වැඩසටහන් |
| | | • තාක්ෂණික පුහුණුව |
| | | • ගොවි උපකරණ ලබා දිම |

| | | |
|---|---|---|
| 05 | ජල ගැලීම සහ හානි කළමනාකරණය කිරිම | ● දත්ත රැස් කිරිම හා ගවේෂණය<br>● ආපදා හඳුනා ගැනීම හා පිළියම් යෙදීම<br>● දෙපාර්තමේන්තුවේ ආපදා කළමනාකරණ කමිටුව සක්‍රියව පවත්වාගෙන යාම හා ධාරිතා වර්ධනය |
| 06 | පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරිම | ● සුදුසු ගස් වර්ග සිටුවීම හා නඩත්තුව<br>● ප්‍රදේශ නිර්ණය කිරිම හා මැනුම් කිරිම<br>● ගොවීන් දැනුවත් කිරිමේ වැඩසටහන්<br>● සීමා මායිම් ලකුණු කිරිම<br>● නෛතික රාමුව බලාත්මක කිරිම |
| 07 | අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම | ● දත්ත පද්ධතිය ස්ථාපනය කිරිම<br>● දත්ත පද්ධතිය වාර්ෂිකව යාවත්කාලීන කිරිම<br>● තොරතුරු කළමනාකරණ ඒකකයේ ධාරිතාවය ඉහළ නැංවීම |
| 08 | තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම | ● මානව හා භෞතික සම්පත් ඉහළ නැංවීම |
| 09 | කාර්යාල ධාරිතාවය ඉහළ නැංවිම | ● මානව හා භෞතික සම්පත් වැඩිදියුණු කිරීම |

## අංශය නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු



## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 105ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 83 කි. පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් වන අතර තාවකාලික පදනමින් 02 දෙනෙකු සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග.

1. වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් හා වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත මූළ පළාතම ආවරණය වන පරිදි කඩිනමින් පුනරුත්ථාපනය කිරිම.

2. 2021 වර්ෂයේ වෙන් වී ඇති ප්‍රතිපාදන අනුව ගංවතුර හානි වී ඇති අබලන් වැව් 60ක් පමණ ප්‍රතිසංස්කරණය කිරිමට සැලසුම් කර ඇත.

## තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශක | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | ඉලක්කගත වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | 1.5. | 1.5.1.<br>1.5.2. | හඳුනාගත් අත්‍යාවශ්‍ය සුළු වාරිමාර්ග නඩත්තු වැඩසටහන | 10 | 9.53 |
| 2 | 2.4. | 2.4.1 | සුළු වාරිමාර්ග නඩත්තු යටතේ වාරි පද්දති ප්‍රතිසංස්කරණය කිරීම | 149.9 | 89.36 |
| 6 | 6.4 | 6.4.2 | | | |
| 13 | 13.1 | 13.1.1 | | | |
| 15 | 15.3 | 15.3.1 | වාරිමාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | 23.9 | 23.9 |

## කාර්ය සාධන ඉලක්ක - 2020

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | | | ආයෝජනය (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| ප්‍රතිසංස්කරණය කරන වාරි පද්ධති ගණන | 20 | 21 | 30 | 40 | 250 | 300 | 350 | 400 |
| වගා තීව්‍රතාවය වැඩි කරන කුඹුරු අක්කර ගණන | 160 | 200 | 400 | 600 | | | | |
| ගංවතුර හානිය අවම කරන ලද ගොවි පවුල් ගණන | 400 | 500 | 700 | 900 | | | | |
| අලුතින් අස්වද්දන ලද කුඹුරු අක්කර ගණන | 20 | 30 | 40 | 60 | 100 | 150 | 200 | 250 |
| ජල ධාරිතාවය වැඩි කරන ලද වැව් ගණන | 5 | 6 | 10 | 15 | | | | |
| වැඩි දියුණු කරන ලද වාරි පද්ධති ගණන | 6 | 10 | 12 | 15 | | | | |
| ප්‍රතිසංස්කරණය කරන ලද ගොඩනැගිලි ගණන | - | | | | - | 23 | 25 | 27 |
| නව ගොඩනැගිලි ගණන | - | | | | | | | |
| පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | - | | | | | | | |
| යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතිය | - | | | | - | 500 | 1500 | 2000 |

## ප්‍රධාන අංශයන්හි කාර්යසාධනය ළගාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය.

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය (Outcome Index) | ඉලක්කය කරා ලගා වීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය (%) |
| 1 | ප්‍රතිසංස්කරණය කරන වාරි පද්ධති ගණන | 34 | 20 |
| 2 | වාරි තීව්‍රතාවය වැඩි කරන කුඹුරු අක්කර ගණන | 1132 | * |
| 3 | ගංවතුර හානිය අවම කරන ලද ගොවි පවුල් ගණන | 5888 | 100 |
| 4 | අලුතින් අස්වද්දන ලද කුඹුරු අක්කර ගණන | 0 | 0 |
| 5 | ජල ධාරිතාවය වැඩි කරන ලද වැව් ගණන | 0 | 0 |
| 6 | වැඩි දියුණු කරන ලද වාරි පද්ධති ගණන (නඩත්තු කරන ලද) | 38 | 100 |

* 2020 වර්ෂයේ සාමූහික ප්‍රදාන, සුළු වාරිමාර්ග නඩත්තු යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 34 ක් 2021 වර්ෂයට අවිච්ඡේද විය.

## පසුගිය වසර 03ක් තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකර ගැනීමට අපේක්ෂා කළ සුවිශේෂී අරමුණු (Specific Objectives) | ප්‍රගතිය (ප්‍රතිලාභීන් ගණන) | | | | වැය කළ මුදල (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 01 | වාරිමාර්ග නඩත්තු හා වැඩිදියුණු කිරීම | 01. අවදානම් තත්ත්වයේ පවතින වැව් සංවර්ධනය කිරීම.<br>02. ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.<br>03.ඇළ මාර්ග පද්ධතීන් මනා ලෙස සංවර්ධනය කරමින් නිස පරිදි නඩත්තු වැඩ පිළිවෙලක් පවත්වාගෙන යාම.<br>04. වගා බිම් කරා පහසුවෙන් ළඟා වීමට හැකි මනා කෘෂි මාර්ග පද්ධතියක් ඇති කිරීම. | 1000 | 1100 | 1275 | - | 95.1 | 101 | 168 | - |
| 02 | ගොවි බිම් ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම | | 80 | 90 | 108 | - | 4.7 | 4.5 | 3.2 | - |
| 03 | වෙනත් සුළු වාරිමාර්ග නඩත්තු | | 800 | 2500 | 3120 | 4163 | 3.6 | 95.2 | 166.9 | 85.45 |

## 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල (රු.මි.) | වාරි ව්‍යාපෘති ගණන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන/ ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සුළු වාරිමාර්ග නඩත්තු | 404 | 34 | 1848 | 17 |
| හඳුනාගත් අත්‍යාවශ්‍ය සුළු වාරිමාර්ග නඩත්තු වැඩසටහන | 100 | 38 | 3888 | 14 |
| සුළු වාරිමාර්ග නඩත්තු වැඩ ගොවි සංවිධාන මගින් | 6.8 | 04 | 125 | 04 |

උතුරු මැද පළාත තුළ සෞභාග්‍යමත් ගොවි පරපුරක් බිහි කිරීමේ දැක්ම සඵල කර ගැනීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු 6කින් දායකත්වය ලබා දෙයි. අතීතයේ දී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කරන ලද වැවයි දාගැබයි ගමයි පන්සලයි යන සංකල්පය වර්තමානයේදී තිරසර සංවර්ධන සංකල්පයට ඇතුළත් වී තිබේ.

ඒ අනුව සුළු හා මධ්‍යම වාරි පද්ධති 4000 කට ආසන්න ප්‍රමාණයකින් බල ප්‍රදේශය තුළ වගා කළ හැකි කුඹුරු අක්කර ආසන්න වශයෙන් 139,000 ක පමණ ප්‍රමාණයක් පවතියි. නමුත් ගංවතුර හා නියං ආපදා තත්ත්වයන් හේතුවෙන් ඉන් වර්ෂාපතනය ලැබෙන මහ කන්නයේ දී 75%කට වැඩි ප්‍රමාණයක් වගා කළ ද අඩු වර්ෂාපතනය හේතුවෙන් වගා ප්‍රතිශතය යල කන්නයේ දී 30%කට අඩු ප්‍රමාණයක් දක්වා පහළ මට්ටමකට අඩු වේ.

එබැවින් ජල හානිය අවම කොට වගා තීව්‍රතාවය වැඩි කිරීම සඳහා සුළු වාරිමාර්ග නඩත්තු යටතේ මිලියන 510.8ක් වැය කරන ලදි. එමගින් ගොවි පවුල් 5861 කට ආසන්න ප්‍රමාණයක සෘජුව හා වක්‍රව ප්‍රතිලාභ සැකසීමට හැකි විය. 2020 වසරේ සුළු වාරිමාර්ග නඩත්තු යටතේ වැවේ අංග සහ ඇල වේලි පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘති 76ක් ක්‍රියාත්මක කර ඇත.

ආහාර සුරක්ෂිතතාවය ඇති කරමින් තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය සඳහා දායකත්වය සැපයීමට හැකි විය. එමෙන් ම වගා තීව්‍රතාවය වැඩි වීම තුළින් කෘෂි නිෂ්පාදන ප්‍රමාණය වැඩිකරගැනීම තුළින් දේශීය නිෂ්පාදන දායකත්වය ලබා දෙන අතර ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය නංවාලීමට පිටිවහලක් ද වේ. ජල හානිය අවම කරමින් ජල කාර්යක්ෂමතාවය වැඩි කොට සැමට ජලය සහ තිරසර කළමනාකරණය සහතික කිරීම සහ අරමුණ සාර්ථක කර ගැනීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකි විය. ගොවිබිම් ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් අස්වැන්න ප්‍රවාහනය කිරීමේ පහසුකම් සැලසීම මෙන් ම ඔවුන්ගේ එදිනෙදා කටයුතු කරගෙන යාමට මහත් අස්වැසිල්ලක් වේ.

තවද අතීත උරුමයෙන් පැවත එන වැව් හා සම්බන්ධ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම අපගේ එක් අරමුණකි. එබැවින් වර්තමානයේ පවතින කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හේතුවෙන් කෘෂි කර්මාන්තයට සහ සුළු හා මධ්‍යම වාරි පද්ධති වලට අහිතකර බලපෑම් එල්ල වී ඇත.

**පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැක්ම කරා ළඟා වීමට 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අදහස් හා යෝජනා.**

උතුරු මැද පළාත තුළ සෞභාග්‍යමත් ගොවි පරපුරක් බිහිකිරීම උදෙසා 2021 වර්ෂයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූලික අපේක්ෂාව වේ. 2021 වසර සඳහා මූලධන වියදම් යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන මිලියන 375ක් පුනරාවර්තන වියදම් යටතේ මිලියන 300ක ප්‍රතිපාදන ලැබී ඇත.

වැව යනු හුදෙක් කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය සපයා ගැනීම සඳහා වූ අංගයක් පමණක් ම නොවේ. ඊට එහා ගිය සංස්කෘතියක් වැව හා බද්ධ ව ඇත. මෙම වාපි සංස්කෘතිය තුළ වැව හා බැඳුන පරිසර පද්ධතියේ වූ විශේෂ අංග රැසකි. ඒ අතර වැව් ඉස්මත්ත නැතිනම් ඉහත්තාව, ගස් ගොම්මන, ඉස්වැටිය, කට්ටකඩුව වැනි සුවිශේෂී මෙහෙයක් ඉටු කරනු ලබන අංග මේ වන විට විනාශ වී අතුරුදහන් වී යමින් පවතී. වැව හා බැඳුන සංස්කෘතික පරිසරය සංරක්ෂණය කිරීමේ අරමුණ පෙර දැරිව 2019 වසරේ දී සෑම ව්‍යාපෘතියක් හරහා ම පැල සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර එය මෙම වර්ෂයේ දී ද ගොවි සංවිධාන හරහා ගිවිසුම්ගත වී සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

පුනරුත්ථාපන හා වැඩිදියුණු කළයුතු වැව් හා වාරි පද්ධති හඳුනා ගැනීම හා ප්‍රමුඛතාවය මත ඒවා සකස් කිරීම දෙපාර්තමේන්තුවට වූ ප්‍රධාන අභියෝගයකි. මේ සම්බන්ධයෙන් වාර්ෂිකව ප්‍රාදේශිය කෘෂිකර්ම හා සංවර්ධන කමිටු මගින් ලැබෙන පුනරුත්ථාපනය කළ යුතු වැව් පිළිබඳ ඉල්ලීම් සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් මගිනුත් ගොවි සංවිධාන මගින්, ගරු ආණ්ඩුකාරතුමා මගින්, අමාත්‍යවරුන් හා මහජන නියෝජිත මහතුන් මගින්, ක්ෂේත්‍ර රාජකාරියේ දී නිලධාරීන් විසින් හඳුනාගන්නා ඉල්ලීම් ආදිය ලබා ගැනේ. මීට අමතරව 2021 වර්ෂයේ දී ඉල්ලීම් 2000කට ආසන්න ප්‍රමාණයක තොරතුරු වාරි සෞභාග්‍යා වැඩ සටහන යටතේ ද අප වෙත ලැබී ඇත.

එසේ ලැබුණ සියලු ව්‍යාපෘති ක්ෂේත්‍ර පරීක්ෂා කර වාරිමාර්ග ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරීන් ගෙන් සැදුම්ලත් තේරීම් කමිටුවක් වශයෙන් එකතු වී සාකච්ඡා කර ප්‍රමුඛතා ලැයිස්තුගත කර ඒ අනුව තෝරාගත් ව්‍යාපෘති සඳහා මූලික විමර්ශන වාර්තා (PIR) සකස් කිරීමට සැලසුම් කර ඇත. මූලික විමර්ශන වාර්තා (PIR) සකස් කළ පසු එම වාර්තා අනුව නැවතත් ප්‍රමුඛතාගත කිරීමක් සිදු කෙරේ. එහිදී සැලකිල්ලට භාජනය කරන නිර්නායක කිහිපයකි. ආසන්න පෙර වර්ෂයේ සිදුවූ ගංවතුර නිසා හානියට පත්, හානි වීමේ අවදානමට ලක්වූ වැව් සඳහා මෙම වර්ෂයේ ප්‍රමුඛතාවය ලබා දීමට සැලසුම් කර ඇත. තවද වාරි පද්ධතිය යටතේ වගා කරන කුඹුරු අක්කර ගණන, ගොවි පවුල් ගණන, දැනට වගා නොකර අත්හැර දමන ලද වැව සහ ඇවේලි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු වගා කළ හැකි වාරි කුඹුරු අක්කර ගණන, වැව් බැම්ම, වාන කැඩීයාමේ අවදානමක් පවතින වැව්, වැනි නිර්ණායක සැලකිල්ලට භාජනය කෙරේ. ඒ අනුව තෝරාගන්නා ලද ව්‍යාපෘති වල ඇස්තමේන්තු සැකසීම සිදු කෙරේ. ඇස්තමේන්තු කටයුතු අවසන් වූ පසු වර්ෂයේ ප්‍රතිපාදන සීමාව තුළ ව්‍යාපෘති සංවර්ධන කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

මෙසේ විශාල කාලයක් ශ්‍රමයක් ධනයක් වැය කර කොතෙක් වාරි පද්ධති පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම් සිදු කළ ද එසේ පුනරුත්ථාපනය හෝ වැඩිදියුණු කිරීම් සිදු කළ වාරි ව්‍යාපෘති නිසි පරිදී නඩත්තු කිරීම බොහෝ විට සිදු නොවේ. ඒ නිසා ම ඉතාමත් කෙටි කාලයක් තුළ රටේ සියල්ල විනාශ මුඛයට පාත්‍ර වීම වැලැක්විය නොහැක. එබැවින් සංවර්ධනය කරන ව්‍යාපෘති නිසි ලෙස නඩත්තු කිරීම සිදු කළ යුතු ය. ඒ බව දෙපාර්තමේන්තුවක් වශයෙන් අප හඳුනාගෙන ඇති අතර 2019 වසරේ නියමු ව්‍යාපෘතිය ලෙස කුඹුරු අක්කර 100ට වැඩි තෝරාගත් වැව් සඳහා පවතින සුළු නඩත්තු කටයුතු සිදු කිරීමේ වැඩ සටහනක් ආරම්භ කරන ලදි. එය ඉතාමත් සාර්ථකව නිම කරන ලදි. ඉන් බොහොමයක් වාරිමාර්ග

පද්ධති වල පවතින සුළු ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට හැකි විය. මෙම වසරේ දී ද එම වැඩසටහන සඳහා ප්‍රතිපාදන මුදල් වැඩි කොට පසුගිය වසර පහ තුළ ප්‍රතිසංස්කරණය කරන ලද හා කුඹුරු අක්කර 100 කට වැඩි වැව් 50ක් පමණ එම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

වාරි පද්ධති ප්රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් ක්‍රියාවලියේ දී තිරසර පැවැත්ම සඳහා ඒවා හොඳ තත්ත්වයෙන් යුතුව ඉටු කිරීම සිදු කළ යුතු ය. ඒ සඳහා සංවර්ධන කටයුතු කෙරෙන අතර වාරයේ දී ඒවායේ තත්ත්ව පරීක්ෂා කිරීම් සිදු කිරීම ඉතාමත් අත්‍යවශ්‍ය කටයුත්තකි. එබැවින් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තමේන්තුවේ තත්ත්ව පාලන ඒකකයක් ස්ථාපනය කරන ලදි. ඒ සඳහා වෙනම ම ගිණුමක් ද ආරම්භ කර විධිමත්ව ඒකකයේ කටයුතු ඉතාමත් සාර්ථක අයුරින් සිදු කරගෙන යයි. 2020 තත්ත්ව පාලන ඒකකය සැලකිය යුතු වැඩ කොටස් සිදු කරන ලදි. අපේක්ෂිත ඉලක්කය ලඟා කර ගනිමින් 2021 වර්ෂයේ දී පවතින පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැඩි ඉඩකඩක් ලබා දීමට අපේක්ෂා කෙරේ. 2021 වර්ෂයේ දී තව දුරටත් දෙපාර්තමෙන්තුවක් වශයෙන් අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් කැපවී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම.

පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම ව්‍යාපෘතිය හා වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් ආධාර යටතේ ද කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) ලෝක බැංකු ආධාර යටතේ ද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම ව්‍යාපෘතියේ හැර අනෙක් සියලු ව්‍යාපෘති සඳහා තාක්ෂණ දායකත්වය පමණක් ලබා දෙමින් සිදු කරන ලදි.

| විෂය පථයට අසුවන අරමුණ | මුදල (රු .මි) | | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|
| | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය |
| **පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය හා පරිසර පද්ධති සේවා නඩත්තුව** | | | | |
| සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම, ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම, සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම | 2 | 1.5 | 70 | 70 |
| **වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය** | | | | |
| මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම, ජල කළමනාකරණය පිළිබද ප්‍රශස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම, සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම | 501 | * | 98 | * |
| **කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP)** | | | | |
| සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම, ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 19.9 | * | 100 | * |

| දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | | | | |
|---|---|---|---|---|
| සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම, ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම | 69 | * | 65 | * |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දි පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මැදිහත් විම - 2020

- පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව ව්‍යාපෘතිය යටතේ අධීක්ෂණය, බිල්පත් පරික්ෂාව, තත්ත්ව පාලන කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණ .
- වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ සියලු ව්‍යාපෘතින්හි නිර්මාණ පරික්ෂාව රැස්වීම් සඳහා සහභාගි වීම, ඉදිකිරීම්හි තත්වය අධික්ෂණය හා අවසාන වූ ව්‍යාපෘති බාර ගැනීම දෙපාර්තමේන්තුව මගින් සිදු කරමින් පවති. මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂය ආරම්භ වූ අතර 2024 වර්ෂයදී අවසන් වීමට නියමිතය.
- කෘෂිකර්ම නව්‍යකරණ ව්‍යාපෘතිය (ASMP) යටතේ සියලු ව්‍යාපෘති හඳුනා ගැනීම හා මූලික විමර්ශන වාර්තා සකස් කිරීම, මැනුම් කරණය, නිර්මාණ සකස් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම, අධික්ෂණය, තත්ත්ව පාලන කටයුතු, බිල්පත් පරික්ෂාව යන සියලුම කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදි.

## එකිනෙක සංරවකය තුළින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය

| ව්‍යාපෘතිය | සංරවකය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අදාළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | ප්‍රතිලාභීන් ගණන (පවුල්) | වැය කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම නව්‍යකරණ ව්‍යාපෘතිය | වාරිමාර්ග පුනරුත්ථාපන | වාරි ව්‍යාපෘති 2 | නැ.නු.ප මැදිරිගිරිය | 65 | 19.94 |
| වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය | | වාරි ව්‍යාපෘති 52 | මැදවච්චිය මිහින්තලේ | 4580 | 501 |
| පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව | | වාරි ව්‍යාපෘති 3 | ගල්නෑව | 75 | 1.4 |
| දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | | වාරි ව්‍යාපෘති 8 | නොච්චියාගම | 1500 | 69.19 |

## වෙනත් රේඛීය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති | විෂයපථයට අසුවන අරමුණ | මුදල (රු .මි) | | ප්‍රගතිය (%) | | කෙටි කාලීන හා දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය | |
| වැව්ගම් පුබුදුව (CRIWMP) ඇලවෙලි සංවර්ධන වැඩසටහන | සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීමට දායක වීම. සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීමට දායක වීම | 22 | 18.4 | 90 | 84 | අවධානම් තත්ත්වයේ පැවති වැව් සංවර්ධනය කිරීම. ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. ඇළ මාර්ග පද්ධතින් මනා ලෙස සංවර්ධනය කිරීම. වාරිමාර්ග රක්ෂිත සලකුණු කිරීම මගින් අනවසර ක්‍රියා අවම වීම. රොන්මඩ හා ජලජ ශාක ඉවත් කිරීම තුළින් ජල ධාරිතාවය සංවර්ධනය වීම. |
| සපිරි ගමක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | | - | - | 98 | * | |
| පිබිදෙමු පොලොන්නරුව දිසිත්‍රික් සංවර්ධන වැඩසටහන | | 9.9 | 9.6 | 100 | 100 | |

* සපිරිගමක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ගෙවීම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කරයි.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

2021 වර්ෂයේ ලැබේ යැයි අපේක්ෂිත ප්‍රතිපාදන සඳහා මේ වනවිට (2020 නොවැම්බර් මස සිට) ව්‍යාපෘති හඳුනා ගැනීමේ කටයුතු කරමින් පවතී. ව්‍යාපෘති හඳුනා ගැනීම 2021 මුල් මාසය තුළ සිදුකිරීමට සැලසුම් කර ඇත.එමෙන්ම පෙබරවාරි මාසය ඇතුළත එම ව්‍යාපෘතිවල මූලික විමර්ශන වාර්තා ද , මාර්තු මස අවසානයට පෙර ඇස්තමේන්තු කටයුතු ද නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව අප්‍රේල් මස මුල් සතිය ඇතුළත ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමටත් මැයි මාසයදී ව්‍යාපෘති ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වේ. එමගින් 2021 වර්ෂයේ අපේක්ෂිත කාර්යය සාධනය ළඟාකර ගැනීමටත් අදහස් කර ඇත. මෙහිදී මූලධන වියදම් යටතේ ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මුල් කාර්තුව තුළ දැන ගැනීමට නොහැකිව යම් ගැටළුකාරී තත්ත්වයක් පැන නගින අතර පුනරාවර්තන වියදම් යටතේ පවතින ප්‍රදාන නිශ්චිත බැවින් ඒ සඳහා සැලසුම් සකස් කොට ඇත.

මිලදී ගැනීම් හා පුහුණු වැඩසටහන් මේ වනවිට හඳුනා ගෙන ඇති අතර ඒවා නිශ්චිත කිරීමේ කටයුතු මුල් මාස 2, 3 අතර සිදු කර වර්ෂය මැද භාගයේදී නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා උතුරු මැද පළාත් සභාව නියෝජනය කරමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිත වේ. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන දේශගුණික සුහුරු කෘෂිකාර්මික ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘතිවල ඇස්තමේන්තු කටයුතු සිදු කිරීමට නියමිත අතර ඒ සඳහා ද අවශ්‍ය තාක්ෂණික හා මග පෙන්වීම ලබා දෙමින් අනාගත අපේක්ෂාවන් ළඟාකර ගැනීමට සැලසුම් කරමින් ඇත.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2020 වර්ෂයේ දී නව ව්‍යාපෘති සඳහා මූලධන ප්‍රතිපාදන නොලැබුණ අතර අවසන් කාර්තුවේ දී පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ මිලියන 280ක ප්‍රතිපාදන ලබා දෙන ලදි. ඒ අනුව 2020 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව වෙත ලැබුණ ඉල්ලීම් (360ක් පමණ) මූලික විමර්ශන වාර්තා වලට අනුව ප්‍රමුඛතා ලැයිස්තුගත කිරීමේ දී මූලික අදියර යටතේ ඇස්තමේන්තු කිරීම සඳහා ව්‍යාපෘති 36 ක් පෙබරවාරි මාසයේ මුල් සතිය වන විට දී තෝරාගන්නා ලදි.

නමුත් 2020 මාර්තු 16 දින සිට කොරෝනා වසංගත රෝග ව්‍යාප්තිය හේතුවෙන් රාජ්‍ය නිලධාරීන්ට නිවසේ සිට රාජකාරී කිරීමට නියම වූ අතර 2020 මාර්තු 20 දින සිට රට තුළ ඇඳිරිනීතිය පනවන ලදි. 2020 අප්‍රේල් 21 දිනසිට රාජ්‍ය ආයතන වෙත 50% රාජ්‍ය නිලධාරීන් කැඳවීමට අවසර හිමි විය. ඒ අනුව 50%ක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් බෝහෝ දුෂ්කරතා මධ්‍යයේ වුව ව්‍යාපෘති වල ඇස්තමේන්තු කටයුතු 2020 මැයි මාසයේ අවසාන සතිය වන විට නිම කරන ලදි. මෙහිදී ඇස්තමේන්තු කිරීම සඳහා ක්ෂේත්‍රයේ යෙදීම කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ (ඉතාමත් අපහසු කාර්යයක් වුවද) හඳුන්වා දෙන ලද සෞඛ්‍ය පුරුදු වන මුව ආවරණ පැළඳීම, දෑත් සේදීම හා මීටරයේ දුර පවත්වා ගනිමින් ක්ෂේත්‍රෙය් මිනුම් ලබා ගැනීම සිදු කරන ලදි. මෙහිදී කාර්ය මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සීමා කර තිබූ බැවින් WhatsApp හා Zoom මෘදුකාංග ඔස්සේ සිදු කරන කාර්යයන් අධීක්ෂණය හා අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කරන ලදි.

පැවති දුෂ්කරතා හමුවේ වුවද ඉතාමත් කෙටි කාලයක් තුළ දී සියලු ම ඇස්තමේන්තු කිරීම් අවසන් කර 2020.06.09 වන විටදී අදාළ ව්‍යාපෘති සඳහා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. 2020.07.08 දින ඇස්තමේන්තු කරන ලද සියලු වැව් වල ගොවි සංවිධාන සමග ගරු ආණ්ඩුකාරතුමා පෞද්ගලිකව සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් වලට ද අවධානය යොමු කරන ලදි. කෙසේ වෙතත් පවතින ලද ප්‍රතිපාදන සීමාව තුළ 2020-09-02 ව්‍යාපෘති 23කට අනුමැතිය ලැබෙන ලදි. ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදී ගොවි සංවිධාන සමග සාකච්චා කරන ලද අනෙකුත් ව්‍යාපෘති සඳහා ද 2020-09-07 වන දින අනුමැතිය ලබා දෙන ලදි. ඒ අනුව ව්‍යාපෘති 42ක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන, අමාත්‍යාංශ ප්‍රසම්පාදන හා ගරු ආණ්ඩුකාරතුමන් පත්කරන ලද ප්‍රසම්පාදන යන ප්‍රසම්පාදන මණ්ඩල 03කින් ව්‍යාපෘති 34ක් 2020 නොවැම්බර් මස මුල භාගය කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදි. නමුත් ඒ වන විට පැවති වර්ෂාව සහිත කාලගුණ තත්ත්වය සහ ගොවීන් මහකන්නයේ කෘෂිකාර්මික කටයුතු ආරම්භ කර තිබූ බැවින් බොහොමයක් ව්‍යාපෘති වල වැඩ ආරම්භ කිරීමට නොහැකි විය.

මීට අමතරව හදිසි නඩත්තු කාර්යයන් හා හඳුනාගත් සුළු වාරිමාර්ග නඩත්තු සඳහා රුපියල් මිලියන 10කට අනුමැතිය ලැබුණ අතර එමගින් ව්‍යාපෘති 38ක් සාර්ථකව නිම කරන ලදි. තවද අත්‍යාවශ්‍ය සුළු වාරිමාර්ග නඩත්තු ව්‍යාපෘති 4ක් ගොවි සංවිධාන හරහා සාර්ථකව නිම කරන ලදි.

කෙසේ වෙතත් 2020 වර්ෂයේ උද්ගත කොරොනා වසංගත රෝග තත්ත්වය හා දෙපාර්තමේන්තුවට ලැබුණු ප්‍රතිපාදන සීමාව තුළ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හැකි උපරිම අයුරින් උතුරු මැද පළාතේ ගොවි ජනතාව වෙනුවෙන් අපේක්ෂා ඉටු කිරීමට කැප වෙන ලදි.

# 10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

13 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ යටතේ ස්ථාපිත පළාත් සභා නම් නෛතික සංවිධාන ව්‍යුහයේ තවත් එක් විෂයයක් ලෙස ඉඩම් විෂයය හඳුන්වා දිය හැකිය. ඒ අනුව යමින් 1989 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පළාත් ඉඩම් කාර්යාලය නමින් මෙම දෙපාර්තමේන්තුව ආරම්භ විය. ආරම්භයේදී ඉඩම් අධ්‍යක්ෂක යන තනතුර යටතේ ආරම්භ වී වසරක් ඇවෑමෙන් එනම් 1990 වර්ෂයේදී දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදී. ඒ අනුව ඉඩම් කොමසාරිස්වරයෙකුගෙන් සමන්විතව උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ලෙස මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත විය. මේ වන විට නිළධාරින් සහ සෙසු කාර්ය මණ්ඩලය 91 දෙනෙකුගෙන් සමන්විත වේ. පළාත් සභාවේ ආදායම් රැස් කරන්නන් අතර ප්‍රමුඛ ස්ථානයෙහිලා සිටින මෙම දෙපාර්තමේන්තුව ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන ඉඩමක හිමිකම ලබාදීමේ කාර්යය සඳහා නිරන්තරව කැපවී සිටී. පළාත් සභා පරිපාලනය යටතේ ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24හි ජීවත්වන මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදේ. ඒ අනුව රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව රජයේ ඉඩම් බැහැර කිරීම, අධීක්ෂණය, සංවර්ධනය හා සංරක්ෂණය යන කාර්යයන් ඉටු කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව කැපවී කටයුතු කරයි.

**ඉඩම් පරිහරණය**

| | අනුරාධපුර(හෙක්.) | පොළොන්නරුව(හෙක්.) | උතුරු මැද පළාත (හෙක්.) |
|---|---|---|---|
| ගෙවතු | 96,424 | 48,926.14 | 145,350.14 |
| කුඹුරු | 131,222 | 83,453.56 | 214,675.56 |
| පොල් | 1,865 | 873.24 | 2,738.24 |
| වෙනත් වගාවන් | 8,577 | 3374.99 | 11,951.99 |
| වනාන්තර | | | |
| ● ඝණ | 199,428 | 163163.05 | 362,591.05 |
| ● විවෘත | 15,922 | 4445.64 | 20,367.64 |
| ● වගා කළ | 5,477 | 1718.68 | 7,195. 68 |
| ● ලඳු කැලෑ | 191,100 | 11473.13 | 202,573.13 |
| වගුරු බිම් | 2,542 | 4156.45 | 6,698.45 |
| ජලාශ | 55,241 | 16240.86 | 71,481.86 |
| ඉදිකිරීම් | 1,585 | 1229.44 | 2,814.44 |
| ගල්පර | 2,949 | 5576.66 | 8,525.66 |
| මුඩු බිම් | 82 | 2006.03 | 2088.03 |
| වෙනත්/සුසාන භූමි/මාර්ග | 5,486 | 0 | 5,486 |
| එකතුව | 717,900 | 346,637.86 | 1,064,537.87 |

## දැක්ම

"නීත්‍යානුකූල ඉඩමක් - සමෘද්ධිමත් ජනතාවක්"

## මෙහෙවර

"නෛතික රාමුවට අනුකූලව යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම් සහිත ප්‍රජාවට විධිමත්ව ලබාදීම, ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය, රජයේ ඉඩම්වල සුරක්ෂිතභාවය සුරැකීම සහ සංවර්ධනය තුලින් ආදායම ජනනය කර ගැනීම, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙවන් හා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම."

## දිගුකාලීන අරමුණු

- නීත්‍යානුකූල ඉඩම් හිමිකම් සහිත ප්‍රජාවක් බිහිකිරීම.
- ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීම.
- ඉඩම් සම්පත ආරක්ෂා කිරීම හා එම ඉඩම් සංවර්ධන කාර්යයට දායක කර ගැනීම.
- අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම.
- පළාත් සභා ආදායම ඉහළ නැංවීම.

## කෙටිකාලීන අරමුණු

- වර්ෂයකදී දළ වශයෙන් හිමිකම් පත්‍ර 15000කට ආසන්න සංඛ්‍යාවක් ලබා දීම.
- සෑම වර්ෂයකමදීම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- දිස්ත්‍රික්ක දෙකම ආවරණය වන පරිදි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක හෝ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියා කිරීම.
- අනවසර අල්ලා ගැනීම් පෙර වර්ෂයට සාපේක්ෂව අවම කිරීම.
- වසරින් වසර විවිධාංගිකරණය කරන ලද පුහුණු වැඩසටහන් සැලසුම් කර විවිධ අංශයන්ගෙන් දැනුම ලබා දීම.
- ඵලදායිතා සංකල්ප හඳුන්වා දෙමින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- පෙර වසරට වඩා ඉහළ හා හිඟ අවම වු බදු ආදායමක් එකතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම.
- මහජන මිත්‍රශීලී කාර්යක්ෂම සේවා සපයන ආයතනයක් බිහිකිරීම සඳහා විධිමත් ආයතනික හා මූල්‍ය පරිපාලනයක් පවත්වාගෙන යාම.
- ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය.
- ආයතනික යහපාලන කටයුතු සංවර්ධනය.
- ඉඩම් වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල යටිතල පහසුකම් සංවර්ධනය.
- විධිමත් ඉඩම් පරිහරණ රටාවක් මඟින් රජයේ ඉඩම් වල ආරක්ෂාව තහවුරු කිරීම.
- ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.
- රජයේ බදු ආදායම විධිමත්ව රැස්කිරීම හා ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම.
- නව සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනා ගැනීම සහ ඒ සඳහා සුදුසු ආයෝජකයින් යෙදවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ✓ ඉඩම් හිමිකම තහවුරු කිරීම.
- ✓ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අවශ්‍ය භෞතික හා මූල්‍ය සම්පත් සැපයීම.
- ✓ රජයේ ඉඩම් ප්‍රශස්ත මට්ටමින් සංවර්ධනය කිරීම.
- ✓ රජයේ ඉඩම් වල ආරක්ෂාව තහවුරු කිරීම.
- ✓ මානව සම්පත් සංවර්ධනය කිරීම.
- ✓ මූල්‍ය සම්පත් විධිමත්ව කළමනාකරණය කිරීම.
- ✓ ඉඩම් ආදායම් හා කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

**1.4.** විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වනවිට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන් ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

**9.1.** ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියළු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම්ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**15.1 2020** වනවිට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.

**17.1** බදු හා වෙනත් ආදායම් එක් රැස් කිරීම වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර් ජාතික සහයෝගය ලබාදීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 112ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 91 කි. පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් වන අතර 01 ක් අයෙකු පරිසනක පුහුණු ලෙස සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන්මග

රජයේ ඉඩම් රාජකාරී කටයුතු ග්‍රාම නිලධාරී, ඉඩම් නිලධාරී, ප්‍රාදේශීය ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්), ඉඩම් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් විෂය භාර අමාත්‍යාංශ ලේකම්, ජනාධිපති දක්වා වූ ජාලයක් ඔස්සේ ක්‍රියාත්මක වේ. මෙය ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. රජයේ ඉඩම් වල පරම අයිතිය අතිගරු ජනාධිපතිවරයා සතු වන අතර එම බලතල වලින් කොටසක් ඉඩම් විෂය භාර අමාත්‍යවරයා සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇත. රජයේ ඉඩම් කළමනාකරණය ඉඩම් කොමසාරිස් ජනරාල්ට පැවරෙන අතර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවෙන් දිවයින පුරා සියළු රජයේ ඉඩම් ආරක්ෂා කරමින් එහි භාරකාරත්වය ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් දරන ලබයි. නිරවුල් බිමක හිමිකම තහවුරු කිරීම වෙනුවෙන් පළාත් සභාවේ පරිපාලනය යටතේ පවතින ඉඩම් වලට අදාළ කටයුතු සඳහා පළාත් ඉඩම් කොමසාරිස් විසින් පහත ක්‍රියාකාරකම් යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අදාල නිර්දේශයන් ලබාදේ.

1. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බැහැර කිරීමේ ක්‍රියාවලිය.
2. රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම.
3. දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබා දීම.
4. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් නිදහස් කිරීම.
5. රජයේ ඉඩම් ආඥා පනත යටතේ පූජා ඔප්පු ලබාදීම.
6. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබාදීම.
7. රජයේ ඉඩම් ආඥා පනත යටතේ පැවරීම් නියෝග.
8. රජයේ ඉඩම් ආඥා පනත යටතේ විශේෂ දීමනා පත් ලබාදීම.

එසේම රජයේ ඉඩම් කළමණාකරණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම හා ඊට සම්බන්ධ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් ඉඩම් කලමණාකරන කටයුතු විධිමත් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ඒ අතර

1. ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබාදීම හා ඉඩම් කලමණාකරනය සඳහා අදාළ නිලධාරීන් සමඟ සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
2. ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ ඉඩම් කටයුතු වලට අදාළ ගැටළු සාකච්ඡා කිරීම.
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලගත ඉඩම් රාජකාරී කටයුතු කරන නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම හා ඉඩම් අංශයන්හි භෞතික හා මානව සම්පත් සංවර්ධනය විශේෂිත කාර්යයන් වේ.

## තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්කය | තිරසර සංවර්ධන දර්ශක | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජනය (රු.මි) | ඉලක්ක ගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | 1.4 | 1.4.2 | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම. | 2 | 1.31 |
| 08 | 8.2 | 8.2.1 | නිල නිවාස ඉදිකිරීම. | 8.25 | 7.07 |
| | | | ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම. | 0.19 | 0.19 |
| | | | නිල නිවාස වටා වැට ඉදිකිරීම. | 0.58 | 0.58 |

## කාර්ය සාධන ඉලක්ක - 2020

| නිමැවුම | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | | | වියදම/ආයෝජනය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| **ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම** | | | | | | | | | |
| පවත්වන ලද වැඩසටහන් ගණන | පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන | 150 | 175 | 175 | 150 | 2 | 2.65 | 2.78 | 2.91 |
| පුහුණු වූ නිලධාරීන් ගණන | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | 14 | 13 | 15 | 15 | | | | |
| නිරවුල් කරන ලද ඉඩම් ගැටළු ගණන | පවත්වන ලද ජංගම සේවා වැඩසටහන් ගණන | 21 | 24 | 24 | 24 | | | | |
| **ආයතනික මානව හා භෞතික සම්පත් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම** | | | | | | | | | |
| යාවත්කාලීන කල බදු ගොනු ගණන | වාර්ෂික ඇස්තමේන්තුවෙන් අයකල බදු මුදල | 112 | 192 | 201 | 211 | 8.8 | 8.2 | 20 | 15 |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හී ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය | ඉලක්ක කරා ළඟාවීම | |
|---|---|---|---|
| | | 2020 | ප්‍රගතිය |
| 1 | මහජනතාව වෙත ලබාදුන් ඉඩම් හිමිකම්පත් ගණන | 4928 | 50% |
| 2 | පළාත් සභා ඉඩම් වලින් උපයන ලද වාර්ෂික බදු ආදායම | රු.මි.169.78 | 151.58% |

## ඉලක්ක කරා ළඟාවීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| විස්තරය | ඉටු කරන ලද සංඛ්‍යාව | ආවරණය කරන ලද ප්‍රා.ලේ.කො | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|---|
| නිරවුල් බිමක හිමිකම ලබාදීම සඳහා ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම | ජංගම සේවා වැඩසටහන් 21 | ප්‍රා.ලේ.කො. 20 | 28467 | 1.31 |
| | ඉඩම් කච්චේරි 151 | ප්‍රා.ලේ.කො. 23 | 9250 | |
| | පුහුණු වැඩසටහන් 04 | ප්‍රා.ලේ.කො. 24 | 264 | |
| ආයතනික පහසුකම් සැපයීම | නිල නිවාස 02 හා වැට | ප්‍රා.ලේ.කො. 01 | 02 | 7.65 |
| | යන්ත්‍රෝපකරණ 3 | ප්‍රා.ලේ.කො. 02 | - | 0.192 |

## කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති- 2020

### 01.ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම



අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් සභා පරිපාලනය යටතේ ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20 හි ජංගම සේවා වැඩසටහන් 21ක් පවත්වා ඇත. මේ සඳහා මහජනතාව 28467ක් සහභාගි වී ඇති අතර ඉඩම් ගැටළු 4088ක් සඳහා විසඳුම් ලබා දී ඇත.මේ සඳහා රු.205,000/-ක් වැයකර ඇත. ආවරණය වූ ග්‍රාම නිලධාරී තුලාන් ගණන 592කි.

### 02.ඉඩම් කච්චේරි පැවැත්වීම



සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම සඳහා ග්‍රාම නිලධාරී තුලාන් 204ක් ආවරණය කරමින් ඉඩම් කච්චේරි 151ක් පවත්වා ඇත.මේ සඳහා ලියාපදිංචි වූ පුද්ගලයන් ගණන 9250ක් වන අතර ඉන් නිරවුල් බිමක හිමිකම ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබුවන් ගණන 3845කි. මේ සඳහා රු.872,230/-ක් වැයකර ඇත.

### 03.නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම



ඉඩම් රාජකාරී ගත්විට දීර්ඝ ක්‍රියාවලියක් හා අණ පනත් රාශියක් සමග බැඳුණු විෂයන් වන බැවින් මහජනයා වෙත ඉඩම් හිමිකමක් ලබා ගැනීමට අයදුම්පත්‍රය නිකුත් කරන අවස්ථාවේ සිට හිමිකම් පත්‍රයක් ඔවුන්ගේ අතට ලැබෙන අවස්ථාව දක්වාම සම්බන්ධ වන නිලධාරීන් දැනුමෙන් සන්නද්ධ වී සිටීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව මඟින් නිරන්තරයෙන් නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පවත්වන අතර මෙම වසරේදී පුහුණු වැඩසටහන් 4 ක් පවත්වා නිලධාරීන් 264ක් පුහුණු කර ඇත.වැය කරන ලද මුදල රු.209,715/-කි.

- ඉඩම් ඵලදායිතා සංකල්පය (ඉඩම්) පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන පැවැත්වීම.
- ඉඩම් බදු මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධව ක්‍රියාකලයුතු ආකාරය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම.
- රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (E-Slims) ඔස්සේ දීර්ඝකාලීන නිර්දේශ සකස් කිරීමට අදාල පුහුණු වැඩසටහන.
- ආයතනය සඳහා කාර්ය සාධන දර්ශක සකස් කිරීමේ වැඩමුළුව.

### 04.ආයතනික පහසුකම් සැපයීම





පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා ඔවුනට අවශ්‍ය පහසුකම් ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තුව සඳහා නිල නිවාස 02ක් ඉදි කිරීමේ කටයුතු සිදු කරන ලද අතර ඉන් එක් නිල නිවාසයක වැඩ අවසන් කර ඇත. එසේම මෙම නිල නිවාස දෙක ඉදිකරන ඉඩම වටා ආරක්ෂිත වැටක්ද ඉදිකර ඇත.

## දීර්සකාලීන බදු බලපත්‍රවලින් එකතු කරන ලද බදු ආදායම (රු.මි) 2014-2020

| වර්ෂය | බදු ආදායම (රු.මි) |
|---|---|
| 2014 | 64.3 |
| 2015 | 67.9 |
| 2016 | 111.1 |
| 2017 | 151.9 |
| 2018 | 186.95 |
| 2019 | 187.07 |
| 2020 | 169.78 |




## පසුගිය වසර 3ක් තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ. අං | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකරගැනීමට අපේක්ෂා කල සුවිශේෂී අරමුණු | ප්‍රගතිය (ප්‍රමාණය/ ප්‍රතිලාභීන් ගණන) | | | වැය කල මුදල (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 |
| 01 | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම. | ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම මඟින් මහජනතාවගේ ඉඩම් ගැටළු විසඳීම කඩිනම් කිරීම. | 1171 | 1047 | 28467 | 3.18 | 2.78 | 1.31 |
| | | ඉඩම් කච්චේරි පැවැත්වීම මඟින් මහජනතාව වෙත නීත්‍යානුකූල ඉඩම් හිමිකම ලබාදීම. | 22855 | 11617 | 9250 | | | |
| | | නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 822 | 2034 | 114 | | | |
| | | බදු අයකර ගැනීම සම්බන්ධව නිලධාරීන් හා බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | - | 463 | 150 | | | |
| 02. | ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 297 | 443 | - | 0.71 | 0.31 | - |
| 03. | අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග ඇති කිරීම හා ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය. | විධිමත් පරිදි බැහැර කරන ලද ඉඩම් වෙත නව ප්‍රවේශ මාර්ග ඇති කිරීම හා පවතින ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම. | මාර්ග 4 | මාර්ග 5 | - | 0.69 | 1.89 | - |
| 04 | රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම. | අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවන් රජයේ රක්ෂිත මැන මායිම් සළකුණු කිරීම. | රක්ෂිත 2 | රක්ෂිත 2 | - | 0.49 | 0.72 | - |

| අ. අං | සංවර්ධන ව්‍යාපෘතිය | ඉටුකරගැනීමට අපේක්ෂා කල සුවිශේෂී අරමුණු | ප්‍රගතිය (ප්‍රමාණය/ ප්‍රතිලාභීන් ගණන) | | | වැය කල මුදල (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 |
| 05. | අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ.කර්යාල වල ඉඩම් අංශ අළුත්වැඩියා කිරිම. | අඩු පහසුකම් සහිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉඩම් අංශවල අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සිදු කිරිම. | ඉඩම් අංශ 2 | ඉඩම් අංශ 4 | - | 0.94 | 1.49 | - |
| 06. | ඉඩම් වලින් බදු ආදායම් ඉපැයීම සඳහා වානිජ ඉඩම්, නේවාසික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් හා කෘෂිකාර්මික ඉඩම් මැනුම් කිරිම. | බදු ඉඩම් මැනීම කඩිනම් කිරිම . | ඉඩම් කට්ටි 13 | ඉඩම් කට්ටි 8 | - | 0.82 | 0.39 | - |
| 07. | අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය භෞතික සම්පත් සැපයීම | අඩු පහසුකම් සහිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉඩම් අංශ සඳහා කාර්යාලයීය උපකරණ, භාණ්ඩ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම. | ප්‍රා.ලේ.කාර්යාල 22 | ප්‍රා.ලේ.කාර්යාල 23 | - | 4.71 | 2.7 | 0.192 |
| 08. | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව සඳහා නිල නිවාස ඉදි කිරීම. | නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. | - | නිල නිවාස 02 | නිල නිවාස 02 | - | 2.25 | 7.07 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

තිරසර සංවර්ධන අරමුණු 01 හි සඳහන් 1.4 ඉලක්කයට අනුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ඉඩම් හිමිකාරීත්වය සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ඊට සම්බන්ධිත ආයතන කටයුතු කරමින් සිටී. ඒ සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අංක 2008/4 හා 2018/3 චක්‍රලේඛ අනුව ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනාගෙන ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරන ලදි. එසේ ලියාපදිංචි වූ පුද්ගලයින් ගණන 9250ක් වන අතර ඔවුන්ගෙන් බහුතරයක් කාලයක් තිස්සේ රජයේ ඉඩම් වල අනවසරයෙන් පදිංචිව සිටින අතර, එහෙත් ඉඩම් අයිතියක් නොතිබූ පුද්ගලයන්ය. ඒ අනුව අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් සහ බෙදා දීමට සුදුසු ඉඩම් හඳුනාගෙන ඇත. මෙහිදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීමට හඳුනාගත් ඉඩම් කට්ටි සංඛ්‍යාව 11155ක් වන අතර රජයේ ඉඩම් ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීමට හඳුනාගත් ඉඩම් කට්ටි සංඛ්‍යාව 1223කි. ඉඩම් බෙදාදීම ඉඩම් සංවර්ධන අඥා පනත යටතේ අඩු ආදායම්ලාභී ගොවි පන්තියේ අයට ප්‍රමුඛත්වය ලැබෙන පරිදි නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික, කෘෂිකාර්මික, වානිජ හා කාර්මික අවශ්‍යතාවයන් සඳහා වැඩි ආදායම්ලාභීන් හා නාගරික ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් සහ ආයතන වලට ඉඩම් ලබාදීම සිදුකරයි. ඒ අනුව මෙම වසරේදී බලපත්‍ර 3260ක් හා දීමනා පත්‍ර 202ක් පුද්ගලයන් වෙත බෙදා දී ඇති අතර බලපත්‍ර 2674ක් හා දීමනාපත්‍ර 1297ක් පුද්ගලයන් වෙත ලබාදීම සඳහා සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එසේම ඉඩම්ලාභීන්ගේ ඉඩම් ආශ්‍රිතව පැන නැගී ඇති

ගැටළු රාජ්‍ය නිලධාරීන් මැදිහත්වී ප්‍රාදේශීය මට්ටමන් විසඳීම හා උපදෙස් සැපයීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක ජංගම සේවා වැඩසටහන් 21ක් පවත්වා ඉඩම් ගැටළු 4088ක් විසඳමින් පුද්ගලයන් වෙත නිරවුල් බිමක හිමිකාරිත්වය ලබාදීම සඳහා කටයුතු කර ඇත.

පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත කෘෂිකාර්මික, නේවාසික, කාර්මික, වානිජමය අවශ්‍යතාවයන් සඳහා රජයේ හා පුද්ගලික අංශයේ ආයතන වලට සහ පුද්ගලයින්ට මෙන්ම විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයොජනවල නියැලීමට අපේක්ෂා කරන ආයෝජකයන් හට රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් ලබාදීම සිදු කරයි. මූලික වශයෙන් දීර්ඝකාලීන බදු, වාර්ෂික අවසර පත්‍ර බදු, එලදා බදු හා ගැනුම් මිල අයකිරීම් දෙපාර්තමේන්තුව මඟින් රැස්කරන බදු ආදායමට ගැනේ. රජයේ ඉඩම් සම්පත ප්‍රශස්ත කළමනාකරණය තුලින් රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමේ විශේෂ ක්‍රියාවලියක් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක්ව ඉටුකරනු ලබයි. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කළ යුතු බදු ආදායම පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද ඇස්තමේන්තු ඉලක්කයට වඩා වැඩි වී ඇත. ඉඩම් නව බදු දීම් ප්‍රමාණාත්මකව ඉහල යාම, ඉඩම් වල තක්සේරු වටිනාකම ඉහල යාම හා බදු එකතු කිරීම විධිමත් කිරීම මෙසේ බදු ආදායම වැඩිවීම සඳහා බලපෑ හේතු ලෙස පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙම වසරේද උපයන ලද බදු ආදායම 151.5%ක වැඩිවීමක් පෙන්වා ඇත. මෙමඟින් තිරසර සංවර්ධන ඉලක්ක 17.1 ට අනුව බදු සහ වෙනත් ආදායම් එක් රැස් කිරීම් වර්ධනය කිරීම යටතේ තිරසර සංවර්ධන අරමුණ කරා ළඟා වීමට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සුවිශේෂී දායකත්වයක් සපයා ඇත.

ඉඩම් රාජකාරී ගත්විට දීර්ඝ ක්‍රියාවලියක් හා අණ පනත් රාශියක් සමග බැඳුණු කාර්යයක් බැවින් නිලධාරීන් දැනුමෙන් සන්නද්ධ වී සිටීම අත්‍යවශ්‍ය කරුණකි. විවිධ අවස්ථාවන් වලදී නිලධාරීන් පුහුණු කළද නව නිලධාරීන් බඳවා ගැනීම්, ස්ථානමාරු යනාදි කරුණු නිසා සියලුම නිලධාරීන් හට මේ පිළිබඳව පරිපූර්ණ දැනුමක් පවතීද යන්න පිළිබඳව ගැටළුවක් පවතී. එම හේතුව නිසා සෑම වසරකම ඉඩම් රාජකාරී කටයුතු ඉටු කරන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර මෙම වසර්දී පුහුණු වැඩසටහන් 4ක් පවත්වා නිලධාරීන් 264ක් පුහුණු කර ඇත. එසේම නිලධාරීන්ගේ සේවා පහසුව සඳහා නිල නිවාස දෙකක් ඉදිකිරීම සිදු කරන අතර මෙම වසරේදී එක් නිල නිවාසයක වැඩ අවසන් කරන ඇත. ඒ අනුව ආයතනික භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම තුලින් මහජනතාව වෙත කාර්යක්ෂම සේවා සපයන ආයතකයක් ඇති කිරීම සඳහා කටයුතු කර ඇති අතර එමඟින් තිරසර සංවර්ධන අරමුණු ( 8 ) කරා ලඟා වීමට හැකියාව ලැබී ඇත.

## ආයතනයේ ගුණාත්මක අංශයේ සංවර්ධනය සඳහා සිදු කරන ලද දායකත්වය

පළාත් ඉඩම් කොමසාරිස්තුමාගේ මග පෙන්වීම හා මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව පළාත් සභා පරිපාලනයට අයත් ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24ක් තුළ ඉඩම් රාජකාරි කටයුතු සිදුකරනු ලබයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24 ආවරණය වන පරිදි ඉඩම් රාජකාරි සඳහා එක් කොට්ඨාසයකට ඉඩම් නිලධාරියෙකු සහ සංවර්ධන නිලධාරියෙකු බැගින් යොදවා ඇත. එසේ වුවද දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සහකාර ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තු) වරයකු, මිනින්දෝරුවරයෙකු, සංවර්ධන නිලධාරීන් 8, හා ඉඩම් නිලධාරීන් 7, රියදුරු1, කාර්යාල කාර්ය සහායක 1 හා මැනුම් සහයකයකු යන තනතුරු ඇතුළත් වන පරිදි පුරප්පාඩු 21ක් පමණ පවතී.

මෙවැනි සේවක පුරප්පාඩු පැවතියත් විධිමත් කළමනාකරණයක් යටතේ ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2020 වර්ෂයේ විවිධ අංශයන් යටතේ ක්‍රියාකාරකම් සිදුකර ගුණාත්මකව ඉහළ ප්‍රගතියක් ආයතනය වෙත ළඟාකර ගැනීමට හැකිවී ඇත. පසුගිය වසරට සාපේක්ෂව එක් එක් වැය විෂයන් යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි වී ඇත. ඒ අනුව පහත දක්වා ඇති අංශයන් යටතේ වියදම් දරා ඇති අතර ඒ සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හී භෞතික ප්‍රගතිය 100%ක ප්‍රශස්ත මට්ටමක ඇත.

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම සඳහා ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම. (ඉඩම් කච්චේරි/නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්/ජංගම සේවාවන්)
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය භෞතික සම්පත් සැපයීම හා යටිතල පහසුකම් සංවර්ධනය.
- කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය හා ඇගයීම.
- රජයේ ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.

ඉඩම් විෂය තාක්ෂණික විෂයක් බැවින් සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය රජයේ ඉඩම් කළමනාකරණය ප්‍රශස්ත අයුරින් සිදුකිරීම බැවින් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් රාජකාරී ඉටු කරන නිලධාරීන් පුහුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමුකර ඇත. විවිධ ක්ෂේත්‍රයන් හා ක්‍රමවේදයන් ඔස්සේ ප්‍රවීණ සම්පත්දායකයින් යොදාගනිමින් පුහුණු වැඩසටහන් 4ක් ක්‍රියාත්මක කළ අතර එමඟින් ඉඩම් රාජකාරී කටයුතුවල ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමට අවකාශ සැලසුන අතර ඒ අනුව මහජනතාව වෙත තෘප්තිමත් සේවාවක් ලබාදීමට අවශ්‍ය පසුබිම නිර්මාණය වී ඇත.

## ආයතනයේ දැක්ම කරා ළඟාවීමට 2021 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) මඟින් දීමනාපත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇති අතර එම කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 24හිම දීමනාපත්‍ර සකස් කිරීමේ කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් සිදුකිරීමට අපේක්ෂිතය.
- රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) මඟින් ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ඒ අනුව ඉඩම් කච්චේරි පැවැත්වීමට අදාලව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් වැඩි ප්‍රමාණයක් පැවැත්වීමට හා ප්‍රායෝගිකව එම තාක්ෂණය භාවිතා කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉඩම් කච්චේරි ඉදිරියේදී පැවැත්වීමටත් සැලසුම් කර ඇත.
- බදු ආදායම රැස්කිරීම විධිමත්ව කිරීම සඳහා අවශ්‍ය නිලධාරී පුහුණු කිරීමේ වැඩසටහන් හා බදු ගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ. බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නියමිත පරිදි බදු ගෙවීමේ වැදගත්කම පහදාදීම හා බදුකරුවන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම මඟින් දැනට පවතින හිඟ බදු ආදායම එක්රැස් කිරීමටත් ඉදිරියේදී බදු ගෙවීම පැහැර හරින්නන් සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමටත් අපේක්ෂිතය.
- බදු ආදායම් නිවැරදිව පුරෝකථනය නොවීම තුල ලැබිය යුතු බදු ආදායම සහ වාර්ෂිකව රැස්කරගනු ලබන බදු ආදායම අතර නොගැලපීමක් පෙන්නුම් කරන බැවින් මෙම තත්වය මගහරවා ගැනීම සඳහා නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් සකස්කරන ලද විධිමත් වැඩසටහනක් වන රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) උපයෝගී කර ගනිමින් බදු අදායම් රැස් කිරීම ක්‍රමවත් කිරීමට 2021 වසරේදී අපේක්ෂා කෙරේ.මේ සඳහා 2020 වසරේදී රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-Slims) ඔස්සේ දීර්ඝකාලීන බදු නිර්දේශ සකස් කිරීමට අදාල පුහුණු වැඩසටහනක් නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ නිලධාරීන් සඳහා පවත්වන ලද අතර ඒ අනුව 2021 වසරේ සිට එම ප්‍රාදේශීය ලේකම් කාර්යය වෙත ලැබෙන නව බදුගොනු e-Slims පද්ධතිය ඔස්සේ පමණක් සකස් කිරීමට යෝජිතය.
- රජයේ ඉඩම් ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ටඨාස වල පිහිටි රක්ෂිත මැන වෙන් කිරීම හා එම ඉඩම් වල පැළ සිටුවීම ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත. එසේම පාංශු ඛාදනයට ලක්වන රජයේ ඉඩම් වල වටිනාකම ඉහළ දැමීම සඳහා එකී ඉඩම් ඵලදායීව සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. තවද පළාතේ පවතින ස්වාභාවික ජල උල්පත් සංවර්ධනය කිරීමට සැළසුම් කර ඇති අතර එමඟින් මහජනතාවට අවශ්‍ය භෞතික පහසුකම් වැඩි දියුණු කිරීමට යෝජිතය.

- ඉඩම් අයිතිය නීත්‍යානුකූලව ලබාගැනීමේ වැදගත්කම හා ඒ සඳහා මහජනතාව සතු වගකීම පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඉදිරි වර්ෂයේදී අපේක්ෂිතය.
- ඉඩම් රාජකාරී ඉටු කිරීමේදී ඉඩම් විෂය පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීම හා වෙනස්වන රාජ්‍ය ප්‍රතිපත්ති හා චක්‍රලේඛ විධි විධාන අනුව පවතින දැනුම යාවත්කාලීන වීමද ඉතා වැදගත්වේ. එමෙන්ම යහපත් මහජන සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය හා කාර්යක්ෂම සඵලදායී සේවාවක් ලබාදීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කර ගැනීමටද අවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය සඳහා 2021 වර්ෂයේදී ද නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඇතුලත් ගමන් මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන |
| බලපත්‍ර හා දීමනාපත්‍ර සහිත සංවර්ධනය නොකරන ලද ඉඩම් හඳුනාගෙන එම ඉඩම් රජයට පවරා ගැනීම හා එකී ඉඩම් දේශීය ආහාර බෝග නිෂ්පාදනය සඳහා යොදා ගැනීම. | අදාල ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගැනීම. | පළාතේ ඉඩම් උපයෝජනය විධිමත් වීම. |
| රජයේ ඉඩම් කළමනාකරණය කිරීමේ කඩිනම් වැඩසටහන යටතේ දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී ඇති රජයේ ඉඩම් සඳහා බදු සහන ලබාදීම සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2020/06 චක්‍රලේඛය හා 2020/05 චක්‍රලේඛය අනුව කටයුතු කිරීම කඩිනම් කිරීම හා ඉඩම් බදු අයකිරීම විධිමත් කිරීම. | • බදුකරුවන් සඳහා බදු ගෙවීමේ සහන ලබාදීම.<br>• හිඟ බදු අය කර ගැනීම හා ඉඩම් බදු අයකිරීම විධිමත් කිරීම. | පළාත් සභා ආදායම ඉහල නැංවීම. |
| අනුග්‍රාහක පදනමින් කෘෂිකාර්මික, වානිජ හා කාර්මික කටයුතු සඳහා ඉඩම් බදු දීම ඉහළ දැමීම. | පළාතේ ඉඩම් ආයොජන කටයුතු සඳහා යොදා ගැනීම. | පළාත් සභා ආදායම ඉහල නැංවීම හා පළාතේ යටිතල පහසුකම් සංවර්ධනය වීම. |
| පුද්ගලයන් වෙත බෙදාදීම සඳහා පවතින රජයේ ඉඩම් හඳුනා ගැනීම හා ඉඩම් බෙදාදීම කඩිනම් කිරීම. | වාර්ෂික ඉලක්කගත ඉඩම් කච්චේරි සංඛ්‍යාව පැවැත්වීම. | අනවසර අල්ලාගැනීම් පාලනය. |
| රජයේ රක්ෂිත මැන වෙන් කිර, ජාලගත කිරීම හා එම ඉඩම් සංවර්ධනය කිරීම. | රක්ෂිත ඉඩම් හඳුනාගැනීම. | පළාතේ ඉඩම් පරිහරණය විධිමත්වීම හා අනවසර අල්ලාගැනීම් පාලනය. |
| රජයේ ඉඩම් තොරතුරු පිළිබඳව දත්ත පද්ධතියක් සකස්කිරීම. | අදාල ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගැනීම. | පළාතේ ඉඩම් පරිහරණය විධිමත්වීම. |

## සමස්ත කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳ අදහස

පළාත් සභා පරිපාලනය යටතේ පවතින ඉඩම් අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24හි ඉඩම් රාජකාරී හා පළාත තුල ඉඩම් රාජකාරී ආශ්‍රිත සම්බන්ධීකරණ කටයුතු කාර්යක්ෂමව ඉටු කරමින් තෘප්තිමත් මහජන සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මඟපෙන්වීම මෙන්ම අවශ්‍ය සම්පත් ලබාදීමද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. ඒ අනුව රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව ඉටු කරනු ලැබේ. මෙහිදී රජයේ ඉඩම් බැහැර කිරීම, සංවර්ධනය හා සංරක්ෂණය යන ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි. ඒ අනුව 2020 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගනිමින් දැක්ම

සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ අතර ඒවා මගින් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට සුවිශේෂී දායකත්වයක් සපයා ඇත.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් මූලික ඉඩම් සමීක්ෂණ පැවැත්වීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, බදු ආදායම් රැස්කිරීම හා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම පෙන්වාදිය හැකි අතර මෙම ක්‍රියාකාරකම් අතරින් ඉඩම් කච්චේරි 151ක් පැවැත්වීමෙන්ද බදු ආදායම් රැස්කිරීම 151% කින්ද වශයෙන් වාර්ෂික ඉලක්කයන් අභිබවා ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් විශේෂ ව්‍යාපෘති දෙකක් මේ වන විට ක්‍රියාත්මක කරන අතර ඒවා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ සිදුවේ. ඒ අනුව ඉඩම් මිලියන එකයි දශම එකක් (මිලියන 1.1) මැන දීමනා පත්‍ර නිකුත් කිරීමේ රජයේ ඉලක්කගත වැඩසටහන සහ රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය (e-slim) මගින් දීමනා පත්‍ර සකස්කිරීම හා ඉඩම් කච්චේරි පැවැත්වීම යන වැඩසටහන් ක්‍රියාත්මන වන අතර එමගින් දීමනා පත්‍ර සකස් කිරීම කඩිනම් වී ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සුවිශේෂී සහයෝගයද සහිතව පළාත් ඉඩම් කොමසාරිස් දෙපර්තමේන්තුවේ සමස්ත අරමුණු ඉටුකර ගැනීම තුළින් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය දායකත්වයද සපයමින් 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය ප්‍රශස්ත මට්ටමින් අත්කර ගැනීමට හැකි වී ඇත.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

පළාත් සභා පරිපාලනය යටතේ පවතින රජයේ ඉඩම් කළමනාකරණය කිරීම හා පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට විශාල කාර්යභාරයක් පැවරී ඇත. මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ලබාදෙයි. දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට අදාලව විවිධ ක්‍රියාකාරකම් 2020 වර්ෂයේ ඉටු කිරීම සඳහා සැළසුම් කර තිබුනද පැවති කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් ඉලක්ක කරන ලද ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින් ඉඩම් කච්චේරි 150ක් පැවැත්වීම සඳහා 2020 වර්ෂයේ ඉලක්ක කල අතර මුල් කාර්තුවේ හා අවසන් කාර්තු දෙකේදී එකී ඉලක්කය සපුරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් පැවති ගැටළු හමුවේ වුවද උනන්දු වී කටයුතු ඇත. ඒ අනුව 2020 වසරේදී ග්‍රාම නිලධාරී වසම් 204ක් ආවරණය කරමින් ඉඩම් කච්චේරි 151ක් පවත්වා ඇත. එසේම මෙම වසරේදී බදු ආදායම් රැස් කිරීම විධිමත් කිරීම හේතුවෙන් පෙර වසරවලට වඩා ඉහළ හා හිග අවම වූ බදු ආදායමක් එකතු කර ගත හැකි වී ඇත. එය 151%ක වැඩි වීමකි. 2020 වසරේදී හිමිකම්පත් 9943ක් පුද්ගලයන් වෙත බෙදාදීම සඳහා ඉලක්ක කර තිබුනද කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් කාර්යාලගත රාජකාරී කටයුතු නිසි වේලාවට ඉටුකරගත නොහැකිවීම මත 50%ක ප්‍රමාණයක් පමණක් මහජනතාව වෙත ලබාදීමට හැකි විය. එසේම 2020 වර්ෂය සඳහා යෝජනා කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් සඳහා මුදල් ප්‍රතිපාදන නොලැබීම මත එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. පැවති කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ වුවද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන් විශාල සහයෝගයක් ලබාදී ඇති අතර ඒ හේතුවෙන් 2020 වර්ෂයේ සමස්ථ කාර්ය සාධනය ඉහළ මට්ටමකට පවත්වාගෙන යාමට හැකිවූ බැව් පෙන්වා දිය හැකිය.

# 10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

සාරධර්ම සුරකින පරිසර හිතකාමී විනයගරුක නිරෝගී අභිමානවත් සමාජයක් ගම තුළ නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට දායකත්වය සපයන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 තුළ විවිධ වැඩසටහන් පවත්වමින් ප්‍රජාව සමග ඍජුව සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සාම්ප්‍රදායික තත්වයන්ගෙන් මිදී තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගත හැකි පරිදි පළාත් සභා ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රජා දායකත්වය ප්‍රමුඛ කොටගෙන 2018 වර්ෂයේ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සිදු කොට ඇත. ඒ සඳහා බිම් මට්ටමින් අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල පවතින ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් සහ දිස්ත්‍රික් සංගම් සඳහා ක්‍රියාත්මක සැලසුම් සකස්කර ඇත.2019 වර්ෂයේ උතුරු මැද පළාත් සභාව මගින් ලබාදුන් ප්‍රතිපාදන යොදා ගනිමින් 2011 අංක 03 දරණ උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සහ පළාත් සභා මුල්‍ය නීති සංග්‍රහය, භාණ්ඩාගාර චක්‍රලේඛන, රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛන, පළාත් සභා සැලසුම් අංශයේ චක්‍රලේඛන හා ආකෘතිවලට අනුව විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීම සිදුවේ.උතුරු මැද පළාත් සභාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම ග්‍රාම සංවර්ධන නිලධාරීන් එක් අයෙක් බැගින් අනුයුක්තකර ඇති අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම පවත්වාගෙන යනු ලබන තිරසර සංවර්ධන ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන (ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන) සඳහා මැහුම් උපදේශිකාවන් එක් අයෙකු බැගින් පත්කර ඇත. අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ක්ෂේත්‍ර රාජකාරී අධීක්ෂණය කිරීමට ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් දෙදෙනෙක් සහ ජ්‍යෙෂ්ඨ මැහුම් උපදේශිකාවන් දෙදෙනෙක් පත්කර ඇත.

1947න් පසු බිහිවූ නිදහස් ශ්‍රී ලංකාවෙහි ප්‍රථම රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දෙපාර්තමේන්තු විෂය ලැයිස්තුවෙහි දක්නට ලැබෙන ග්‍රාම සංවර්ධන විෂය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා 1987.11.14 දින සම්මත කරන ලද 13 වන සංශෝධනයෙන් පළාත් සභා මඟින් ක්‍රියාත්මක කළ යුතු පළාත් සභා විෂයක් ලෙස ලැයිස්තු ගත කර තිබේ. ඒ අනුව මධ්‍යම රජයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරය පළාත් සභාව තුළ ආරම්භ වූ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය වෙත පැවරී ඇත. මධ්‍යම රජය යටතේ ග්‍රාම සංවර්ධන විෂය තුළ කටයුතු කළ ග්‍රාම සංවර්ධන නිලධාරීන් (RDO) පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර තිබේ.පසු කාලීනව ග්‍රාම සංවර්ධන විෂය ක්ෂේත්‍රය තුළ අත්කරගත් ප්‍රගතියත් සමඟ අදාල කාර්යය සංවිධිත ලෙස ඉටුකිරීම සඳහා 1990.01.01 දින සිට උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

අදාල විෂයපථයෙහි පරිපාලනමය හා සංවර්ධන කටයුතු විමධ්‍යගත කරමින් පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 හි ප්‍රාදේශීය ලේකම්වරුන් ග්‍රාම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස පත් කිරීම තුළින් ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන කාර්යභාරය ඵලදායී හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. වර්තමානය වනවිට 2011 අංක 3 දරන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය මඟින් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල සියලු කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය බලය ප්‍රදානය කර ඇත.

## ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන -11

| |
|---|
| හොරොව්පතාන |
| මැදවච්චිය |
| රඹෑව |
| පදවිය |
| කැබිතිගොල්ලෑව |
| මිහින්තලේ |
| කැකිරාව |
| ඉපලෝගම |
| නොච්චියාගම |
| නාච්චාදූව |
| පලුගස්දමන |

## ලියසවිය මධ්‍යස්ථානය - 14

| | |
|---|---|
| තිරප්පනේ | වැලිකන්ද |
| හිඟුරක්ගොඩ | මැදිරිගිරිය |
| මධ්‍යම නුවරගම් පළාත | රඹෑව |
| කහටගස්දිගිලිය | කැබිතිගොල්ලෑව |
| ගල්නෑව | තලාව |
| පලුගස්වැව | රාජාංගනය |
| ඉපලෝගම | පදවිය |

## ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ තොරතුරු

| අංකය | ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන කාර්යාලය | ග්‍රාම සං. සමිති සංඛ්‍යාව | මූල්‍ය වත්කම (රු) | තුලාන සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | නැ.නු.ප | 54 | 22,632,659 | 29 | 72 | 16,382 |
| 2 | ම.නු.ප | 32 | 2,159,575 | 40 | 181 | 15,721 |
| 3 | මහ විලච්චිය | 21 | 2,300,000 | 17 | 102 | 6,817 |
| 4 | නොච්චියාගම | 36 | 4,618,870 | 36 | 110 | 16,355 |
| 5 | රාජාංගනය | 21 | 870,000 | 21 | 53 | 10,521 |
| 6 | තඹුත්තේගම | 26 | 1,000,000 | 26 | 63 | 13,843 |
| 7 | ගල්නෑව | 35 | 2,425,259 | 30 | 71 | 11,374 |
| 8 | පලාගල | 35 | 907,402 | 35 | 98 | 11,124 |
| 9 | නාච්චාදූව | 37 | 4,389,525 | 19 | 49 | 7,995 |
| 10 | තලාව | 52 | 3,595,376 | 39 | 120 | 19,433 |
| 11 | ඉපලෝගම | 36 | 1,600,000 | 32 | 106 | 10,225 |
| 12 | කැකිරාව | 59 | 1,744,174 | 53 | 118 | 18,873 |
| 13 | මිහින්තලේ | 45 | 3,688,365 | 25 | 82 | 9,890 |
| 14 | තිරප්පනේ | 42 | 1,100,000 | 41 | 81 | 8,031 |
| 15 | පලුගස්වැව | 19 | 1,487,806 | 16 | 38 | 5,419 |
| 16 | හොරොව්පොතාන | 19 | 16,000,000 | 37 | 112 | 11,400 |
| 17 | ගලෙන්බිඳුනුවැව | 38 | 875,000 | 41 | 115 | 15,951 |
| 18 | කහටගස්දිගිලිය | 31 | 815,000 | 40 | 127 | 11,346 |
| 19 | කැබිතිගොල්ලෑව | 38 | 1,222,000 | 26 | 103 | 8,118 |
| 20 | පදවිය | 45 | 3,850,000 | 15 | 45 | 6,520 |
| 21 | මැදවච්චිය | 44 | 15,060,101 | 37 | 112 | 16,309 |
| 22 | රඹෑව | 38 | 2,675,000 | 38 | 104 | 11,853 |
| 23 | තමන්කඩුව | 53 | 6,400,000 | 56 | 117 | 23,259 |
| 24 | හිඟුරක්ගොඩ | 54 | 4,060,998 | 53 | 140 | 19,211 |
| 25 | මැදිරිගිරිය | 87 | 9,064,158 | 45 | 111 | 20,195 |
| 26 | ලංකාපුර | 31 | 10,002,000 | 28 | 51 | 11,381 |
| 27 | වැලිකන්ද | 34 | 4,500,000 | 29 | 48 | 12,120 |
| 28 | දිඹුලාගල | 49◌්6 | 9,500,000 | 56 | 90 | 24,745 |
| 29 | ඇළහැර | 33 | 9,893,398 | 28 | 89 | 10,797 |
| | මුළු එකතුව | **1141** | **148,436,666** | **988** | **2,708** | **385,208** |

## තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන 10

- මැදවච්චිය NVQ ලියාපදිංචිය ලද තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- කැකිරාව තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- පලුගස්දමන තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- මිහින්තලේ තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- රඹෑව තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- පදවිය තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- හොරොව්පොතාන තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- නොච්චියාගම තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- නාච්චාදූව තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- ඉපලෝගම තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය

## දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

- ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් සංගම් 02
- ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් 29
- ග්‍රාම සංවර්ධන ව්‍යවසායකත්ව සංගම්
- ග්‍රාම සංවර්ධන තරුණ සංගම්
- ග්‍රාම සංවර්ධන සමිති 675
- ග්‍රාම සංවර්ධන කුඩා කණ්ඩායම්

| | |
|---|---|
| මුළු ග්‍රාම සංවර්ධන සමිති සංඛ්‍යාව | 1141 |
| අනුරාධපුර | 803 |
| පොළොන්නරුව | 338 |

## දැක්ම

"උරුමය සුරකින පිරිපුන් ගමක්, සෞභාග්‍යමත් පළාතක්."

## මෙහෙවර

"උරුමය සුරකින පිරිපුන් ගමක් බිහි කිරීම සඳහා ප්‍රජාව සංවිධානගත කිරීම, ආයතනගත කිරීම හා දැනුම ආකල්ප හා කුසලතාවලින් සන්නද්ධ කිරීම සහ ග්‍රාම සංවර්ධනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සියලු පාර්ශවකරුන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයකින් යුක්තව සංවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු

1. පුද්ගල සංවර්ධනය, කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාලව තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම.
2. සාරධර්ම සුරකින, විනයගරුක, අභිමානවත් හා දැනුමැති ප්‍රජාවක් බිහිකිරීම.
3. දැනුම, කුසලතා, ආකල්ප, පුරුදු හා සෞඛ්‍යය යන අංශවලින් යහපත් වූත්, පරිපූර්ණ වූත් දැහැමි පවුල් ඒකක ගොඩනැංවීම.
4. සමිති ගිණුම් ක්‍රියාවලිය මඟින් මූල්‍ය සාක්ෂරතාව, රක්ෂණය, අලෙවිකරණය සහ ක්ෂුද්‍ර මූල්‍යකරණය, බැංකු සංගම්කරණය පිළිබඳ ග්‍රාමීය ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම සහ එම දැනුම ක්‍රියාවට නැංවීම.
5. නායකත්වය, කළමනාකරණය, ඵලදායීතාව වෘත්තීය හා අධ්‍යාපනික සුදුසුකම් වැඩිදියුණුව මූලික කරගත් පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
6. නව නිෂ්පාදන හා සේවා ආරම්භ කිරීම පවත්වාගෙනයාම හා වැඩිදියුණු කිරීම සඳහා ස්වයංරැකියා බිහිකිරීම තුළින්

ග්‍රාමීය ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම.

7. න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව නවීන තාක්ෂණය හා නිර්මාණකරණයට අදාල දැනුම පවුල් ඒකක වෙත හා ග්‍රාමීය සංවිධාන වෙත ප්‍රවේශ කරවීම.

8. ළමා, කාන්තා, ආබාධිත හා තරුණ ප්‍රජාව විෂයෙහි ග්‍රාමීය සංවර්ධනයට අදාලව සුවිශේෂී ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

9. "ගමට දැනුම" සංකල්පය ඔස්සේ ග්‍රාමීය දැනුම් කේන්ද්‍රස්ථාන බිහිකිරීම තුළින් දැනුමැති ප්‍රජාවක් බිහි කිරීම.

10. මත්ද්‍රව්‍ය උවදුර වැලැක්වීම, වකුගඩු රෝග නිවාරණය, පාරම්පරික ගොවිතැන, සාම්ප්‍රදායි ක සංස්කෘතිකාංග සංරක්ෂණය හා රජරට ප්‍රෞඪ සංස්කෘතිය ආරක්ෂා කරගැනීම ආදී පළාතේ අනන්‍යතාවට හා අභිවෘද්ධියට පාදකවන සුවිශේෂී කාර්යයන් කෙරෙහි ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම.

## කෙටිකාලීන අරමුණු

1. පුද්ගල සංවර්ධනය, කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.

2. සමිති ගිණුම්කරණ වැඩසටහන් ඔස්සේ විධිමත් ගිණුම්කරණ හා විගණන ක්‍රියාවලියක් ස්ථාපිත කොට සමිතිවල ප්‍රගතිය ඉහළ මට්ටමකට ගෙන ඒම දක්වා ගිණුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

3. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය මඟින් කුඩා කණ්ඩායම් ක්‍රමය ශක්තිමත් කිරීම, සමිති වර්ගීකරණය හා ශ්‍රේණිගත කිරීම තුළින් ග්‍රාම සංවර්ධන සමිති හා සංගම්වල කාර්යභාරය හා ප්‍රගතිය වැඩි දියුණු කිරීම.

4. ග්‍රාම සංවර්ධන ව්‍යවසායකත්ව සංගමය ස්ථාපිතකර පළාත පුරා විසිරී සිටින සුළු හා මධ්‍යම පරිමාණ ග්‍රාමීය ව්‍යවසායකයින්ට නිෂ්පාදන හා සේවා අලෙවි කටයුතුවලට අවශ්‍ය පුහුණුව, අරමුදල්, අමුද්‍රව්‍ය, වෙළඳපොළ යන ක්ෂේත්‍රවලට අදාලව පහසුකම් සැපයීම.

5. ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලිය ශක්තිමත් කොට ග්‍රාමීය ප්‍රජාව සඳහා ග්‍රාමීය බැංකු සංගම්කරණය ඔස්සේ ණය ලබාදීම ක්‍රමවත් කිරීම හා වැඩි දියුණු කිරීම.

6. ග්‍රාමීය ප්‍රජාවගේ මූලික අවශ්‍යතා සැපිරීම හා නාගරික පරිසරයේ පවතින යටිතල පහසුකම් ග්‍රාමීය ප්‍රජාව වෙත ප්‍රවේශ කරවීම යන කාර්යය ද්විත්වය සඳහා තිරසර ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

7. ග්‍රාමීය දැනුම් කේන්ද්‍රස්ථාන ලෙස පුස්තකාල හා තාක්ෂණික, අධ්‍යාපනික පහසුකම් සහිත මධ්‍යස්ථාන ගොඩනැංවීමට ග්‍රාමීය ප්‍රජාව සංවිධානගත කිරීම.

8. ග්‍රාමීය ස්වේච්ඡා නායකත්වය වැඩිදියුණු කිරීම සඳහා තරුණ ප්‍රජාව සම්බන්ධ කිරීමට ග්‍රාමීය තරුණ සංගමය ස්ථාපිතකර තරුණ ප්‍රජාව සවිබලගැන්වීම.

9. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල ක්‍රියාත්මක පාඨමාලා ඔස්සේ ග්‍රාමීය ප්‍රජාව තුළ කාන්තාවන් ඇතුළු ඉලක්කගත කණ්ඩායම්හි වෘත්තීය නිපුණතා හා කුසලතා වැඩිදියුණු කිරීම.

10. ග්‍රාමීය පරිසරය සුරක්ෂිත මෙන්ම ප්‍රියමනාප පරිසරයක් ලෙස ගොඩනැංවීම උදෙසා හරිත ඵලදායිතා සංකල්පය ක්‍රියාවට නැංවීම.

11. ග්‍රාම සංවර්ධන විෂය ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට කටයුතු කළ විශිෂ්ට ක්‍රියාකාරිකයින් හා ස්වේච්ඡා සංවිධාන ඇගයීම.

12. පවුල් ඒකක දියුණු කිරීම තුළින් ''දැහැමි නිවහනක් ''ගොඩනැංවීම

සඳහා ගෘහස්ථ ඵලදායීතාවය පදනම් කරගත් ස්වයං ඇගයීම් හා කණ්ඩායම් ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

13. රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන සමඟ අත්දැකීම්, දැනුම හා සම්පත් හුවමාරුව මඟින් බාහිරදාම කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම.

## ප්‍රධාන කාර්යයන්

1. පුද්ගල සංවර්ධනය, කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාළව තිරසර සංවර්ධන දර්ශක ක්‍රියාවට නැංවීම.
2. කුඩා කණ්ඩායම් පිහිටු වීම, ග්‍රාම සංවර්ධන සමිති පිහිටු වීම, ලියාපදිංචි කිරීම, සමිති සක්‍රියව පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු කාර්යයන් ඉටු කිරීම.
3. සමිති ගිණුම් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමිති මූල්‍ය කටයුතු විගණනය හා විමර්ශනය කිරීමට අදාල ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. සමිති වර්ගීකරණය හා සමිති ඇගයීම.
5. ග්‍රාමීය ස්වේච්ඡා නායකයින් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන්, අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම හා ජ්‍යෙෂ්ඨ සමිති ක්‍රියාකාරීන් ඇගයීම හා සම්මාන ප්‍රදානය කිරීම.
6. ග්‍රාමීය ව්‍යවසායකයින් බිහිකිරීම, ජාලගත කිරීම, පුහුණු කිරීම, මූල්‍ය හා භෞතික පහසුකම් සැපයීම, ඇගයීම හා පසුවිපරම් කිරීම.
7. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය ප්‍රජාව ඉතිරිකිරීම්වලට පෙළඹවීම හා ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ගොඩනැගීම මගින් බැංකු සංගම් බිහිකිරීම.
8. අඩු ආදායම්ලාභීන් වෙත මූලික අවශ්‍යතා සපුරාගැනීමට අදාලව නිවාස ඉදිකිරීම පානීය ජල අවශ්‍යතා සැපිරීම වැනි විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
9. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිත NVQ පුහුණු පාඨමාලා පැවැත්වීම පුහුණුලාභීන් වෙත ද්‍රව්‍ය හා මූල්‍යාධාර පිරිනැමීම, පුහුණුලාභීන්ගේ නිපුණතා, කුසලතා ඇගයීම හා සම්මාන ප්‍රදානය කිරීම.
10. ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය ඇතුළු පළාත් සභාවේ සමගාමී විෂයන් සහිත ආයතන මඟින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සඳහා දායකත්වය සැපයීම.
11. ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය වෙත තරුණ ප්‍රජාව සම්බන්ධ කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප ප්‍රවර්ධනය සඳහා විශේෂ පාඨමාලා සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.
13. ග්‍රාමීය පරිසරය තුළ සුරැකි රජරටට සුවිශේෂී වූ සංස්කෘතිකාංග හා කලාකෘති ආරක්ෂිත කිරීම, පෝෂණය කිරීම හා ඇගයීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
14. ග්‍රාමීය ස්වයංපෝෂිතභාවය කෙරෙහි බලපාන ජල ශක්තිය, බලශක්තිය, දැනුම් ශක්තිය, ශ්‍රම ශක්තිය හා ආරක්ෂාව (සෞඛ්‍යය) යන පංච ශක්තීන් වැඩිදියුණු කිරීමට අදාල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

1. සහභාගීත්ව ගැමි විමසුම තුළින් අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට හා තීරණ ගැනීමට ජනතාවට අවස්ථාව සලසා දීම.
2. ගමේ සම්පත් අධ්‍යයනයකර ඒවායින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කිරීම.
3. නිෂ්පාදනයේදී හා අළෙවියේදී මතුවන ගැටළු හඳුනාගෙන හා ඒවා විසඳා

ගැනීමට සංවිධාන ශක්තිය ගොඩනැඟීම.

4. ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ව්‍යවසායකයන් තුළ දැනුම කුසලතා ආකල්ප වැඩිදියුණු කිරීම.

5. සාමාජිකයන් ඉතිරිකිරීම්වලට පෙළඹවීම හා ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුදල් ගොඩනැගීම.

6. කුඩා කණ්ඩායම් ගොනු කිරීම.

7. කාන්තාවන්ට ක්‍රියාකාරී ලෙස සංවර්ධන කටයුතුවලට හවුල්වීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

8. ග්‍රාමීය ස්වයං පෝෂිතභාවය උදෙසා ජල, බල, දැනුම්, ශ්‍රම හා ආරක්ෂක යන පංච ශක්තීන් වැඩිදියුණු කිරීම් සඳහා ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9. ආගමික හා සංස්කෘතික කටයුතු වැඩිදියුණු කිරීම.

10. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.

11. තරුණයින් සංවිධානගත කිරීම

12. සුභසාධන සේවා සංවිධානය කිරීම හා වැඩිදියුණු කිරීම.

13. ළමා සමාජ පිහිටුවීම හා ළමා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.

පළාත් සභාව විසින් සපයනු ලබන පළාත් සභා සංවර්ධන ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා ග්‍රාම සංවර්ධන සමිති සතු අරමුදල් උපයෝගී කරගනිමින් හා ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ගේ සහ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් මැහුම් උපදේශිකාවන්ගේ උපදෙස් හා මගපෙන්වීම අනුව කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානවල පුහුණුලාභින්ගේ හැකියාවන් ප්‍රවර්ධනය.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

1 NO POVERTY

01.සියළු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

02.සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය නව්‍යකරණය දිරිගැන්වීම.

3 GOOD HEALTH AND WELL-BEING

03.නිරෝගීමත් ජීවිතයක් සහතිකකර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම.

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

04. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියළු කාන්තාවන් සහ ගැහැණු දැරියන් සවිබල ගැන්වීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 91ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 65 කි. පුරප්පාඩු සංඛ්‍යාව 26 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ

| සෞභාග්‍යයේ දැක්ම සාක්ෂාත් කරන දර්ශක (RPI= A+B+C ) | ක්‍රියාත්මක ව්‍යාපෘති |
|---|---|
| 1.දළ දේශීය නිෂ්පාදනයේ/ ඒක පුද්ගල ආදායමේ වර්ධනයක් ඇති කිරීම (A) | 1. ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන<br>2. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන (NVQ මධ්‍යස්ථාන) ආරම්භ කිරීම.<br>3. ශ්‍රමාභිමානී නිවාස වැඩසටහන |
| 2.දුප්පත්කමේ දර්ශකයට/ දරිද්‍රතා රේඛාවට පහලින් ජීවත්වන ජනතාවගේ ජීවිතවල ගුණාත්මක භාවය වර්ධනය කිරීම (B ) | 1. සරු ගෙවත්ත ගෙවතු වගා වැඩසටහන<br>2. සමිති කුඩා කණ්ඩායම් වැඩසටහන<br>3. ශිල්පීකරණ පුහුණු වැඩසටහන<br>4. විමර්ශන නිලධාරී පුහුණුව |
| 3.ලංකාවට අද්විතීය වන සැම තරාතිරමකටම අයත් ජනජිවිතයේ දක්නට ලැබෙන අපගේ ශිෂ්ටාචාර උරුමය තුළින් බිහිවී තිබෙන ඇගයීම් ක්‍රමයක් භාවිතා කිරීම. (C) | 1. කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල ඉදිකිරීම<br>2. ක්ෂේත්‍ර සහ ආයතන නිලධාරීන් පුහුණු කිරීම (මානව සම්පත් සංවර්ධන සැලස්ම ක්‍රියාවට නැංවීම) |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි පළාත් දායකත්වය

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | ඉලක්කගත (රු.මි) | |
|---|---|---|---|
| | | ආයෝජනය | වියදම |
| **8.සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** | | | |
| සියලු වයස් කාණ්ඩවලට අයත් ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කුඩා කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ස්වයං රැකියා තුළින් සංවර්ධනය කිරීම, චක්‍රිය ණය යෝජනා ක්‍රමය මගින් කුඩා කණ්ඩායම් තුළ මූලධන පහසුකම් ඇති කරලීම, ආර්ථික සංවර්ධනයේදී බලපවත්වන මිත්‍යා මත නැති කිරීම සඳහා ග්‍රාමීය ජනතාව දැනුමින් සන්නද්ධ කිරීම. | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල ඉදි කිරීම 3වන අදියර | 13.7 | 5.5 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිඵල දර්ශකය | ඉලක්ක කරා ළඟාවීම | |
|---|---|---|---|
| | | **2020** | ප්‍රගතිය |
| **1** | ඉදිකළ ගොඩනැඟිලි ප්‍රමාණය | **01** | **100%** |

## ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| විස්තරය | ප්‍රමාණය | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | ප්‍රතිලාභීන් ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|---|
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම | ගොඩනැගිලි 01 | නැ.නු.ප | - | 5.5 |
| ගෙවතුවගා වැඩසටහන | ගෙවතු 3300 | සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | පවුල් 3300 | 0.1 (පුනරාවර්තන) |
| ගිණුම් පුහුණු වැඩසටහන | වැඩසටහන් 01 | සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | නිලධාරීන් 25 | 1.66 |
| විමර්ශන නිලධාරී පුහුණුව | වැඩසටහන් 05 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 | 336 | 0.1 (සමිති අරමුදලින්) |
| ඉඩම් නීතිය පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම | වැඩසටහන් 01 | පොදු | නිලධාරීන් 40 | 0.013 (පුනරාවර්තන) |

## සංවර්ධන ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

### 1.කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම





දැනුම මත පදනම්ව ගොඩනැගෙන ව්‍යවසායක සංගම්කරණ ව්‍යාපෘතියෙහි ප්‍රධාන අවශ්‍යතාවයට අනුව අදාළ සංකල්පය පදනම්ව මානව සම්පත තුළ භෞතිකව හා මානසිකව ගොඩනැගීමට මෙහෙයුම් කළ හැකි මධ්‍යස්ථානයකි. (Operational hub) එහිදී දිස්ත්‍රික් වෙළඳ නිෂ්පාදන හා සේවා මෙහෙයුම් මධ්‍යස්ථානය එම කාර්යය ඉටුකරයි. එතුළින් ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රධාන අවශ්‍යතා 4 වන දැනුම හා පුහුණුව, අරමුදල්, අමුද්‍රව්‍ය හා වෙළඳපොළ මෙන්ම විධිමත් නායකත්වය සඳහා පහත අංශ ගොඩනැගීම මෙහෙයුම් මධ්‍යස්ථානයක් ලෙස අවශ්‍යවනු ඇත.

1. අවශ්‍ය දැනුම බෙදාහැරීම සඳහා පුහුණු ඒකකයක්
2. අරමුදල් මෙහෙයුම් කිරීම සඳහා බැංකු හා මුල්‍ය සංගම් කාර්යාලයක්
3. අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳ තොරතුරු මෙහෙයුම්කිරීම සඳහා SMART වෙළඳ කුටි ක්‍රමයක්
4. නායකත්වයට අදාළව පරිපාලනය හා අධීක්ෂණය සඳහා වන සංගම් කාර්යාලයක්

ඒ අනුව මෙම ව්‍යාපෘතියේ තීරණාත්මක අවශ්‍යතාවක් ලෙස දිස්ත්‍රික් වෙළඳ නිෂ්පාදන හා සේවා මෙහෙයුම් මධ්‍යස්ථානය හඳුනාගත හැක. ඉහත 1,2, 4 යන අංශ තුනටම අතිරේකව දිස්ත්‍රික් ප්‍රාදේශීය සංගම් 22 සඳහා අලෙවි ආදර්ශ මෙන්ම අමුද්‍රව්‍ය හා වෙළඳපොළ තොරතුරු මෙහෙයුම් කිරීම සඳහා SMART කුටි ගොඩනැගීමට අනුරාධපුර ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව අභියස ගොඩ නැගෙන නව බහුකාර්ය ගොඩනැගිල්ල යොදාගැනීම අපේක්ෂා කෙරේ.

## 2."සරු ගෙවත්ත" ගෙවතු වගා වැඩසටහන

මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගන්නා ලද ගම්මාන හා සමිති මඟින් ගෙවතු වගාවට උපයෝගි වන තොරතුරු සකස් කිරීම සිදු කෙරේ. එමෙන්ම දැහැමි නිවහන සරු ගෙවත්ත නමින් ගෙවතු 3000ක් පළාත තුළ සකස් කර ඇති අතර පහත නිර්ණායක ඔස්සේ ගෙවත්ත සකස් කිරීමට උපදෙස් දෙන ලදී.



| | |
|---|---|
| ජල කළමනාකරණය | •ජල ප්‍රභවයක් සාදාගෙන තිබීම<br>•එම ජල ප්‍රභවය විධිමත්ව පාවිච්චි කර තිබීම<br>•ජල බිංදු තාක්ෂණය භාවිත කිරීම<br>•පාවිච්චියෙන් ඉවතලන ජලය වගාවට යොමු කර තිබීම<br>•අවම ජල භාවිතයකින් වගාව පෝෂණය කිරීම. |
| භෝග කළමනාකරණය | •සමබල ආහාර වේලකට සරිලන භෝග වගාකර තිබීම<br>•ආර්ථික වටිනාකමින් වැඩි භෝග වගාකර තිබීම (ගම්මිරිස්,මිරිස් කහ....)<br>•ක්‍රමවත්ව භෝග ස්ථාන ගත කර තිබීම, ප්‍රවේශය පහසු වීම, ස්වභාවික රසායන භාවිතය, වගාව ආරක්ෂා කිරීමට කෙම් ක්‍රම හා පරිසර හිතකාමී උපක්‍රම භාවිත කිරීම. |
| කසල කළමනාකරණය | •කසල වර්ග කර බැහැර කිරීම හා දිරාපත්වන දෑ කොම්පෝස්ට් සඳහාත් ප්ලාස්ටික් වැනි දෑ වගා බඳුන් ලෙසත් යොදා ගැනීම<br>•කසල මඟින් ජීව වායු නිපදවීම<br>•කොම්පෝස්ට් වළවල් කිහිපයක් පවත්වාගෙන යාම (තිරසර භාවය ඇතිවන පරිදි)<br>•කොම්පෝස්ට් හේතුවෙන් වගාව සාර්ථක වී තිබීම |
| ශ්‍රම කළමනාකරණය | •පවුලේ සියලු දෙනා වගාවේ නිරත වීම විනෝදාංශයක් ලෙස,වෘත්තීමය ලෙස ක්‍රියාකිරීම.<br>•රූපවාහිනිය නැරඹීම වැනි දෑ වලින් ඉවත්ව එම කාලය වගාව සඳහා යෙදවීමට දරුවන් පුරුදු කර තිබීම.<br>•වගාව පිළිබඳ දරුවන් දැනුවත් කර තිබීම |

## 3.ජංගම දුරකථනය මඟින් අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන



කොවිඩ් -19 වෛරසය පවතින කාලය අතරතුර සාමාන්‍ය දෛනික කටයුතු නැවත ආරම්භ කිරීමට අදාළ ජනාධිපති ලේකම්තුමා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක PS/GPA/ චක්‍රලේඛ/20/2020 ට අදාළව "work from home" හෙවත් "නිවසේ සිට රාජකාරි" නම් වූ වැඩපිළිවෙලට අනුගතව ක්‍රියාකිරීමට සිදුව තිබේ. ඒ අනුව පළාත පුරා විසිරී සිටින ග්‍රාම සංවර්ධන නිලධාරින් හා කාර්යාලගත නිලධාරින් උදෙසා මෙම පුහුණුව ක්‍රියාත්මක කරන ලදී. මෙම පුහුණු වැඩසටහන සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ වියදම් කළමනාකරණය සිදුකරන ලදී. මෙමඟින් නිවසේ සිට රාජකාරි ඉටුකිරීම හා ක්ෂේත්‍ර නිලධාරින් මඟින් තොරතුරු ලබා ගැනීමේදී බාධාවකින් තොරව රාජකාරි ඉටු කර ගැනීමට අවස්ථාව උදාවිය.

## 4.තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන වල මැහුම් පාඨමාලා පැවැත්වීම

දරිද්‍රතාවයේ සියලු පැතිකඩ අහෝසි කෙරෙන තිරසර සංවර්ධනයක් උදෙසා ස්වයං රැකියා ක්‍රමය හා ජාතික, ජාත්‍යන්තර වෙළෙඳපල ජය ගැනීම පාදක කොට ගෙන කාන්තාවන්, පාසල් හැර ගිය සිසුන්, රැකියා විරහිත තරුණ තරුණියන් ඉලක්ක කර ගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණයි. මෙමඟින් ස්වයං රැකියාකරුවන්ගේ සංගම් බිහිකොට දිස්ත්‍රික් නිෂ්පාදන හා සේවා මෙහෙයුම් මධ්‍යස්ථාන සඳහා සැපයුම්කරුවන් බිහිකර ගැනීම මෙහි පදනම වේ. 2020 වසරේදී මීට සමගාමීව ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් නිර්මාන ඇගයීම සිදු නොකළ අතර සියලුම කොට්ඨාස වල මධ්‍යස්ථානයන්හි මැහුම් පුහුණු පාඨමාලාව පුහුණුලාභීන් 372 කු සඳහා පුහුණු පවත්වාගෙන යන ලදී.





## 5.විමර්ශන නිලධාරී ගිණුම්කරණ පුහුණු වැඩසටහන (පළාතේ ස්වෙච්ඡා සංවිධාන සම්බන්ධ නව වැඩසටහනකි)



2020 වසරේ කොට්ඨාස මට්ටමින් ආරම්භ කළ විමර්ශන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව සෑම කොට්ඨාසයකම ග්‍රාම සංවර්ධන සමිති නියෝජනය වන පරිදි ස්වෙච්ඡා විමර්ශන නිලධාරීන් 55 දෙනෙකු සඳහා තෙදින ගිණුම් පුහුණුවක් (TOT) මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පවත්වන ලදී.

ග්‍රාම සංවර්ධන සමිතියක දිගුකාලීන මනා පැවැත්ම සඳහා විනිවිද පෙනෙන සමිති ගිණුම් ක්‍රියාවලියක් ඇති බවට ප්‍රජාව වෙත වටිනා සාක්ෂියක් සපයන වැදගත්ම කටයුත්තක් ලෙස විමර්ශන නිලධාරී පුහුණුව දැක්විය හැක. සාමාජිකයාගේ සිට සභාපතිවරයා දක්වා සියලු දෙනාගේ සහය උපරිම අන්දමින් විමර්ශන ක්‍රියාවලියට ලැබිය යුතුය. ආයතනයේ ව්‍යවස්ථාව කාරක නියෝග මෙහෙයුම් සහ මූල්‍ය කටයුතු පිළිබඳ චක්‍රලේඛ හා උපදෙස් පත්‍රිකා වලින් පනවා ඇති නිති රීති වලට අනුකූලව යම් සමිතියක් ක්‍රියාත්මක වී ඇත් ද යන්න පරීක්ෂා කිරීම මෙම විමර්ශන ක්‍රියාවලියේදී සිදු කරන අතර එහි ප්‍රධාන අරමුණු පහත පරිදි පෙන්වාදිය හැකිය.

1. වැරදි වංචා වැලැක්වීම.
2. වැරදි වංචා හෙළිදරව් කිරීම.
3.සමිතියේ ගිණුම් නිවැරදිව කර ගැනීමට සහය වීම.

4අභ්‍යන්තර පාලන ක්‍රම නිවැරදිව ඉටු කර ගැනීම.

5.ආයතනයේ විශ්වාසනීයත්වය ශක්තිමත් කිරිම.

ඒ අනුව ජාතික විගණන පනත, තොරතුරු දැනගැනීමේ පනත තුළ ග්‍රාම සංවර්ධන සමිති වාර්ෂිකව විගණනය කිරීමද මෙම පුහුණුව ලබාදීමේ ප්‍රධාන අරමුණකි.

## 6.ගිණුම්කරණ පුහුණු වැඩසටහන





''එකම ක්‍රමයකට ගිණුම් තබමු'' යන සංකල්පය පදනම් කරගෙන තිරසර සංවර්ධන සංකල්පය මූලික කරගත් ග්‍රාම සංවර්ධන ගිණුම්කරණ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට 2019 වසරේදීද කටයුතු කරනු ලැබීය. මෙහිදී සෑම සමිතියකටම එකම ක්‍රමයකට ගිණුම් සැකසීම හා පොත් තැබීම සඳහා විධිමත් ගිණුම්කරණ පුහුණුවක් අදියර දෙකකින් සිදුකරන ලදී.

මෙයින් පලමු අදියර ග්‍රාම සංවර්ධන නිලධාරීන් සියලු දෙනාට ම ගිණුම් සැකසීම පිළිබඳව දින 04ක පුහුණුවක් ලබාදුන් අතර දෙවන අදියර ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල සමිති නිලධාරීන් සඳහා මෙම පුහුණුව ලබාදීමට සැලසුම් කර තිබිණි. එහෙත් කොවිඩ් වසංගත තත්වය මත එම පුහුණු වැඩසටහන් රාජාංගනය, රඹෑව, වැලිකන්ද, ඇලහැර, හිඟුරක්ගොඩ යන කොට්ඨාශවල සමිති නිලධාරීන් සඳහා පමණක් පවත්වන ලද අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල තාවකාලිකව අත්හිටුවන ලදී. මෙම ගිණුම්කරණ පුහුණු වැඩසටහන පහත අදියරයන් යටතේ ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරන ලදී.

I. එකම ක්‍රමයට ගිණුම් තබමු වැඩසටහන
II. සෑම සමිතියකටම කබඩ් එකක් වැඩසටහන
III. සෑම සාමාජිකයකුටම ලිපිගොනුවක් වැඩසටහන
IV. විමර්ශනය තුළින් ශක්තිමත් සමිතියක් වැඩසටහන
V. විගණනය අනිවාර්යයි - ප්‍රගතිය පැහැදිලිය වැඩසටහන
VI. සෑම සමිතියකටම පරිගණකයක් වැඩසටහන
VII. තිරසර ග්‍රාම සංවර්ධන ඉතුරුම් හා අයෝජන සංවිධාන ( බැංකු සංගම්) බවට ග්‍රාම සංවර්ධන සමිති පත්කිරීමේ වැඩසටහන

සෑම සමිතියකටම කබඩ් එකක් යන සංකල්පය ඔස්සේ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සූදානම





සෑම සමිතියකටම කබඩ් එකක් සංකල්පය යටතේ සියලු සමිති වල තොරතුරු පද්ධති යාවත්කාලීන කිරීම පසුගිය වර්ෂයේ ආරම්භ විය. ඒ අනුව සෑම සමිතියකම හා ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියකම තොරතුරු සහිත කබඩ් එකක් සමිති නිලධාරින්ගේ භාරයට පත්කිරීම මෙම වැඩසටහනේ පදනම් කාරණය වේ. මේ තුළින් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කිරීමද අපේක්ෂිතය.

## 7.NVQ මට්ටම තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම

ග්‍රාමීය සංවර්ධනය අරමුණු කොට ගෙන තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන විෂය යටතේ මැහුම් පාඨමාලාවන් ආරම්භ කරන ලදී. මධ්‍යම රජය යටතේ ආරම්භ කළ මෙම පාඨමාලාව දැනට වසර 40 ට එහා අතීතයක් පවතී. 1989 පළාත් සභා ක්‍රමය ආරම්භ වීමත් සමඟම ග්‍රාම සංවර්ධනය පළාත් විෂයක් ලෙස නම් කෙරුණු අතර එහි ක්‍රියාත්මක වූ සම්ප්‍රදායික වැඩසටහනක් වූ මෙම පාඨමාලාව NVQ මට්ටම දක්වා ගෙන ඒමට කටයුතු සකස් කරමින් පවතී. පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මේවා ක්‍රියාත්මක වේ. යම් වෘත්තියක් වෙනුවෙන් නිශ්චිත සුදුසුකම් රාමුවක් තුළ ලබා ඇති නිපුණතාවය මැන බැලීම NVQ පාඨමාලාවල අරමුණයි. මෙය මට්ටම් (level ) ලෙස වෙන් කර දක්වනු ලැබේ. NVQ LEVEL 3 සිට ඇඳුම් කැපීමේ හා මැසීමේ වෘත්තියට අදාල වේ.





සියලුම වෘත්තිය පුහුණු ආයතන හා එහි පාඨමාලාවන් එකී වෘත්තියට අදාළ ජාතික නිපුණතා සම්මතයට අනුව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාවේ නිර්ණායක වලට ඇතුළත්ව ලියාපදිංචි ආයතන විය යුතුය. මේ අනුව ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන සියල්ල එම මට්ටමට ගෙන ඒම අපේක්ෂා කරන අතර ප්‍රථම එන්වීකිව් මට්ටමේ සහතික පිරිනැමීමේ පාඨමාලාව මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආරම්භ කර හා පවත්වාගෙන යාම 2020 වසරේදී සිදුකරන ලදී. එම ආයතනයේ ප්‍රථම NVQ පාඨමාලා ලාභීන් කණ්ඩායම 2020පුහුණුව හා OJT ආරම්භ කළ අතර එම ආයතනය සඳහා වසර 03ක ලියාපදිංචියක් TVEC වෙතින් පිරිනමා ඇත. මෙය උතුරුමැද පළාත් සභාව සතුවන පළමු NVQ මධ්‍යස්ථානය වේ.

## 8.ශ්‍රමාභිමාණී නිවාස ව්‍යාපෘතිය





තිරසර සංවර්ධන අරමුණු වලින් 01 වන අරමුණ යටතේ 2030 වන විට පැල්පත් වාසීන් දසලක්ෂ 100 කගේ ජීවන මට්ටම සැලකිය යුතු ලෙස ඉහල නැංවීම අපේක්ෂා කර ඇත. මේ අනුව සියලු දෙනාටම ස්ථිර නිවාසයක් ලබා දීමේ අරමුණක් ශ්‍රී ලංකාවට ඇත. එයට සමගාමීව උතුරු මැද පළාත තුළ ස්ථිර නිවසක්, නොමැති පවුල් සඳහා ස්ථිර නිවසක් ලබා දීම අරමුණ සාක්ෂාත් කරනු වස් උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව තම ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයින් අතුරින් තෝරා ගත් නිවාස නොමැති හෝ තාවකාලික නිවාස වල ජීවත් වන සාමාජිකයින්ට ස්ථිර නිවසක් ලබා දීම මෙහි අරමුණයි. 2020 වසරේ ජනවාරි හා පෙබරවාරි මාස වලදී මේ සඳහා සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරන ලද අතර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් නිවසක් ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් අරමුදලින් ඉදිකර අවසන් කරන ලදී.

## 9.කාර්ය සාධන දර්ශක සකස් කිරීමේ පුහුණු වැඩසටහන



රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 2/2018 අනුව කාර්ය සාදන විගණනය, මූල්‍ය විගණනය, පරිසර විගණනය පදනම් කරගත් කාර්ය සාධන දර්ශක ක්‍රමය හා ගිණුම් ක්‍රමය අනිවාර්යය විය. ඒ අනුව හඳුන්වාදී පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව කාර්ය සාධන දර්ශක සැකසීම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ දෙදින වැඩසටහනක් ඉතා සාර්ථකව පවත්වන ලදී.

## 10.ඉඩම් නීතිය පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන



වත්කම් කලමනාකරණය තුළ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සතුව පැරණි ඉඩම් පවතී. එම වත්කම් ක්‍රමානුකූල හා නීත්‍යානුකූල කරගැනීම සඳහා ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට ඉඩම් නීතිය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීම පෙරදැරිව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව පුහුනු වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

## 11.කුඩා කණ්ඩායම් ක්‍රියාකාරකම්





උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 තුළ අඩු ආර්ථික ශක්තියකින් හෙබි හුදකලාව සිටින සමිති සාමාජිකයන් ඒකරාශී කර ඔවුන්ගේ හැකියාවන්, දැනුම, සම්පත් හා ඔවුන් තුල ඇති විභව ශක්තීන් අවධිකර සමාන ජීවනෝපායන් සහිත කණ්ඩායම් ඒකරාශිකර දැනුමෙන් සවිබල ගන්වා ඔවුන්ගේ ආර්ථික තත්වයන් නඟා සිටුවීමත් තම නිෂ්පාදන සඳහා කේවල් කිරීමේ බලයක් සහිත ශක්තිමත් තිරසර කුඩා කණ්ඩායම් අවම වශයෙන් 150ක් වසර අවසානයේ බිහිකිරීම සිදු කෙරේ. සෞභාග්‍ය දැක්මේ නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ගම සමග පිලිසඳර යන කොටසෙහි එන ග්‍රාමීය ස්වයං රැකියාකරුවන් ව්‍යවසායකයින් බිහි කිරීම හා සවිබල ගැන්විමේ අරමුණු පෙරදැරිව මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ ග්‍රාම සංවර්ධනයේ පදනම කුඩා කණ්ඩායම්ය යන තේමාව සාක්ෂාත් කර ගනිමින් අනෙක් ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයන් කුඩා කණ්ඩායම් වලට ගොණු කිරීමත් එමඟින් කඩා නොවැටෙන ශක්තිමත් ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරයක් උතුරු මැද පළාත තුල ස්ථාපිත කිරීම යටතේ සෑම වර්ෂයකටම ස්වයංරැකියා පදනම් කරගත් කුඩා කණ්ඩාම් සඳහා සමිති සාමාජිකයන් පුහුණු කරනු ලබන අතර තෝරාගත් කොට්ඨාශ වල පුහුණු කටයුතු සිදු විය. කොවිඩ් වසංගත තත්වය මත සීමා කිරීම් සහිතව වුවද සිදු කරන ලදී.

## 12.ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්



සෞභාග්‍ය දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක් නම් දෙවන මාතෘකාව යටතේ රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ ප්‍රතිපත්තිය නම් පරිච්ඡේදයේ ව්‍යවසායකයින් නගා සිටුවීම පිළිබද සඳහන් කොට ඇත. දහවන කොටසේ ගම සමඟ පිළිසදර නම් පරිච්ඡේදයේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ඉදිරිපත් වීමට කැමති ග්‍රාමීය කාන්තා ව්‍යවසායිකාවන් සඳහා රාජ්‍ය අනුග්‍රහය සහ අධීක්ෂණය යටතේ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කරන බව සඳහන් වේ. ඒ අනුව ග්‍රාම සංවර්ධන ස්වයං රැකියාකරුවන්ගේ සංගමය ස්ථාපිත කිරිම මඟින් පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.



ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම, මන්දපෝෂණයෙන් තොර පළාතක් බිහිකිරීම, රැකියා උත්පාදනය, දළ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් දීම හා කර්මාන්ත බිහිකිරීම පිළිබඳව පළාත් අතරින් උතුරු මැද පළාත ඉහළ තලයකට රැගෙන ඒම යන ඉලක්ක සපුරාගැනීම සඳහා සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ස්වයංරැකියා කරුවන්ගේ සංගමයේ ශාඛා පිහිටුවා ඇති අතර එම ස්වයංරැකියාකරුවන්ට ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2020 වසරේදී කොවිඩ් වසංගත තත්වය මත සීමා කිරීම් සහිතව වුවද සිදු කරන ලදී.

## 13.මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන

මෘදු කුසලතාවලින් පෝෂිත සහ ප්‍රායෝගිකව කණ්ඩායම් හැඟීමෙන් යුතුව ආයතනික ඉලක්කයන් ජය ගැනීමට හැකි ශ්‍රමික පිරිසක් බිහිකිරීම මූලික අරමුණ කරගෙන මානව සම්පත් සංවර්ධන සැලැස්මෙහි සියලුම නිලධාරීන් වෙත අවම පැය 12ක පුහුණුව යන තේමාව සාක්ෂාත් කිරීමද මෙහි අපේක්ෂාව විය.







## 14.බෝ වන හා බෝ නොවන රෝග වලින් වැළකීම පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන



කොවිඩ් වසංගත තත්වය ද සළකා බලමින් ඒ සඳහා මුහුණදීමට නිලධාරීන් දැනුවත් කිරීම හා ප්‍රතිශක්තීකරණය සහිත දේශීය ආහාර රටාවට යොමුවීමේ වැදගත්කම පිලිබඳ දැනුම ලබාදීම ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන් විසින් සිදුකළ අතර ග්‍රාමීය ජනතාව වෙත එම දැනුම ළඟාකරවීම අපේක්ෂාව විය.

## දැක්ම කරා ළඟාවීමට 2021 වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරන නව සංවර්ධන විභවතාවයන් පිළිබඳ අදහස් හා යෝජනා

2021 වර්ෂය සඳහා නව සංවර්ධන විභවයක් ලෙස ,දැහැමි නිවහන ව්‍යාපෘතියේ සරු ගෙවත්ත තුළින් ක්ෂුද්‍ර කෘෂිකර්මය, (micro Agriculture) ව්‍යවසායක සංගම් බලගැන්වීම, සපිරි සමිති බිහිවීම, ඉතුරුම් හා අයෝජන මධ්‍යස්ථාන පිහිටුවීම, ණය සුරැකුම් අරමුදල පිහිටුවීම, ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා ඇගයීම් වැඩසටහන යන ඒවා ගත හැක.

- ගෝලීයකරණය වෙනුවට ග්‍රාමීයකරණය සංකල්පය ඔස්සේ නැවත ග්‍රාමීය ස්වයංපෝෂිත කෘෂි ආර්ථික වැඩ සටහන් ලෙස පණගැන්වීම දැහැමි නිවහන ගෙවතු වගාව තුලින් සාක්ෂාත් කර ගැනීමට හැකිවනු ඇත. එවිට නිවසේ අවශ්‍යතාවයක් මෙන්ම, පැල නිෂ්පාදන ඒකක පිහිටුවාගැනීම තුල අඛණ්ඩ එනම් තිරසර වගා රටාවන් ගම තුල සකසා ගත හැක.
- 2021 වර්ෂය සඳහාම අලුතින් හඳුන්වාදෙන ණය සුරැකුම් අරමුදල ව්‍යපෘතිය තුල එනම් ණය රක්ෂණයක් බිහිවීම තුල නව ව්‍යවසායකයින් බිහිවීම හා ඔවුන්ට හා ඇපකරුවන්ට අවදානමක් නොමැති, සාර්ථක ණය ක්‍රමයක් ඇති වීම තුල ව්‍යවසායකයින් අතර මග කඩානොවැටෙන තිරසර ව්‍යවසායකයින් බිහිවනු ඇත.
- තවද අලුතින් හඳුන්වාදෙන සපිරි සමිති බිහිකිරීම ව්‍යාපෘතිය තුල, ඉතුරුම් වැඩියෙන් සිදුකරන, සාර්ථකම වක්‍රිය ණය වැඩසටහන් සිදුකරන, ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන් වැඩියෙන් සිදුකරන ප්‍රජාවත් සහිත, ග්‍රාම සංවර්ධන සමිති බිහිකිරීම තුලින් ග්‍රාම සංවර්ධනයට වැඩි දායකත්වයකුත් එතුලින් රටේ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබා දෙන වැඩි පිරිසක් බිහිවේ.
- එසේම මෙම වර්ෂය තුලදී නව ඉතුරුම් හා ආයෝජන මධ්‍යස්ථාන බිහිවීම තුලින්, වැඩි ඉතුරුම් තුලින් වැඩි ආයෝජන කිරීමට ඇති අවස්ථා වැඩි වීම හා අරමුදල් නොමැති සමිති සඳහා ද ණය පහසුකම් ලැබීම තුලින් වැඩි ව්‍යවසායකයින් බිහිවීම තුලින් රටේ සංවර්ධන ක්‍රියාවලියට සක්‍රිය දායකත්වයක් දක්වන පිරිස වැඩිවනු ඇත.
- ව්‍යවසායක සංගම්, ගැමි පියස, දිස්ත්‍රික් නිෂ්පාදන හා මෙහෙයුම් මධ්‍යස්ථාන එක් ව්‍යාපෘතියක් වේ. එය හරහා නව සංවර්ධන ප්‍රවේශයන් ගනනාවකට පිවිසීමට හැකි වනු ඇත. එනම් ව්‍යවසායකයින් මුහුණදෙන වෙළඳපොල ගැටලුවට විසඳුම්, ඔවුන් ඒකරාශි වී සංගම්කරණය තුලින් අමුද්‍රව්‍ය, අරමුදල් සපයාගැනීමට හැකි වීම, නව තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ එනම් අන්තර්ජාල සම්බන්ධ අලෙවි ක්‍රම, සුහුරු වෙළඳ ප්‍රදර්ශනාගාර පහසුකම් තුල නව සංවර්ධන ප්‍රවේශයන්ට පහසුවෙන් ලගාවීමට හැකිවනු ඇත. තවද මේ හරහා ව්‍යවසායකයින් ඒකරාශි වීම තුල, ව්‍යවසායකයින් වර්ගීකරණය කර ගැනීමත් එතුලින් කණ්ඩායම් රක්ෂණ ක්‍රම (ඉන්දියාව තුල දැනට ක්‍රියාත්මක වන) ආදිය හඳුන්වාදීම තුල තිරසර වූ ව්‍යවසායකයින් බිහිකිරීමට හැකි වනු ඇත.
- මේ සියලු නව සංවර්ධන විභවයන් තුල, තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම මෙන්ම නව රාජ්‍ය ප්‍රතිපත්තිය වන සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්තියේ අන්තර්ගත කරුණුද සාක්ෂාත් කර ගැනීමට වඩාත් පිටුවහලක් වනු ඇත.

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ නම් ග්‍රාම සංවර්ධන සමිති ඒ හා බැඳුනු ග්‍රාම සංවර්ධන නිලධාරින්, තිරසාර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන හා බැඳුනු මැහුම් උපදේශිකාවන් හා කාර්යාල අංශයයි. මෙහිදී ග්‍රාම සංවර්ධන සමිති මෙන්ම තිරසර ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන වල පැහැදිලි ප්‍රගතියක් දැකීමට ඒවායේ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම ප්‍රධාන අපේක්ෂාවකි. එනම් සමිති වල සාමාජිකත්වය, ඔවුන්ගේ තොරතුරු පවුල් තත්වය, සමිතිවල මූල්‍ය තත්වය, යැපුම් ක්‍රියාවලිය යන සියලු අංශ වලින් මෙම දත්ත පද්ධතිය සැකසීම සිදුවිය යුතුය. එමගින් ඒවායේ දැනට තත්වයත්, අප ලගා කරගත යුතු තත්වයන් පිලිබඳවත් මනා විග්‍රහයක් ලබා ගත හැක. එවිට අනාගතයේ ලගාවන තත්වයන්ට සැලසුම් සකස් කරගත හැකි වනු ඇත. තවද තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන සියල්ලම ක්‍රමයෙන් NVQ Level 4 මට්ටම දක්වා පරිවර්ථනය කර ගැනීම අප දෙපාර්තමේන්තු ප්‍රධාන සංවර්ධන අපේක්ෂාවකි.

2020 වර්ෂයේ එක් මධ්‍යස්ථානයක් ආරම්භ කල අතර 2021 වර්ෂයේ මධ්‍යස්ථාන 3 ක් ස්ථාපිත කිරිමට සැලසුම් කර ඇත. මෙසේ ක්‍රමයෙන් සියලු මධ්‍යස්ථාන NVQ Level 4 මට්ටම දක්වා කිරිම මගින් දේශියව පමනක් නොව ජාත්‍යන්තර වශයෙන් අවශ්‍ය පුහුණුකරුවන් නිර්මාණය කිරිම අපගේ අනාගත අපේක්ෂාවයි. එමෙන්ම දැනට ග්‍රාම සංවර්ධන සමිති වල පවත්වාගෙන යන ගිණුම් ක්‍රියාවලිය විධිමත් කර සෑම සමිතියක්ම එයට අනුගත වීම තුල ස්ථාවර සමිති ව්‍යාපාරයක් බිහි වේ. තවද ගැමි පියස දිස්ත්‍රික් නිෂ්පාදන හා සේවා මෙහෙයුම් මධ්‍යස්ථාන තුල ක්‍රියාකාරකම් ආරම්භ කිරිම තුල පළාතේ සාර්ථක ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකර ගැනිම අනාගත අපේක්ෂාවයි.මෙම දෙපාර්තමේන්තුව තුල අංශ තුනේම මානව සම්පත් සංවර්ධනය උදෙසා ඒ ඒ අංශ වලට අදාලව පුහුණුවීම් ලබාදිම තුලින් දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය වු මානව සම්පත සියලුම ආකාරයේ සංවර්ධනයට මහත් පිටුවහලක් වනු ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සාරධර්ම සුරකින නිරෝගි පරිසර හිතකාමි සමාජයක් ගම තුළ නිර්මාණය කිරිමේ ක්‍රියාවලියට දායකත්වය සපයන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ජනතාව සවිබල ගැන්විමේ අරමුණින් විවිධ ව්‍යාපෘති ග්‍රාම සංවර්ධන සමිති මුලිකත්වයෙන් පවත්වාගෙන යයි. ගම තුළ ඇති මානව හා භෞතික සම්පත් සංවර්ධනයේ මැදිහත්කරුවන් ලෙස ක්‍රියාකිරීමයි. විවිධ ජීවනෝපාය ක්‍රියාකරකම් මගින් ජන ජිවිතයේ යහපත් වෙනසක් අපේක්ෂා කරන හා ඊට අදාල විවිධ ව්‍යාපෘතින් ග්‍රාම සංවර්ධන සමිති මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම්, කොවිඩ් වසංගතයත් සමග ගෙදර සිට වැඩ කිරිමට සිදු වීම හේතුවෙන් ජංගම දුරකථනය මඟින් අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම, විමර්ශන නිලධාරීන් සඳහා ප්‍රථම වරට විමර්ශන නිලධාරී ගිණුම්කරණ පුහුණු වැඩසටහනක් පැවැත්වීම, අඩු ආදායම්ලාභීන්ට රු.100,000.00ක වටිනාකමක් සහිත ශ්‍රමාභිමාණි නිවසක් ලබාදීම, "එකම ක්‍රමයකට ගිණුම් තබමු" වැඩසටහන යටතේ වසර 70ක් වන ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය සඳහා නිශ්චිත ඒකීය විධිමත් ගිණුම්කරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම, ග්‍රාම සංවර්ධන මැහුම් පුහුණු පාඨමාලාව NVQ ක්‍රමවේදයට අනුගත කිරීම සඳහා ප්‍රථම NVQ මධ්‍යස්ථානය බිහිකිරිම මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් විශේෂ ජයග්‍රණය ලෙස ස්මරණය කළ යුතු වේ. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේනතුව නව්‍යකරණ වැඩසටහන් ඔස්සේ යම් වර්ධනයක් ළඟාකරගනු ලැබූ වර්ෂයක් ලෙස 2020 වර්ෂය හඳුන්වා දිය හැකිය.

## කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2020 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2020 වර්ෂය තුලදී ද ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති 22 යටතේ සැලසුම් කර තිබුනි. නමුත් ඇතිවු covid 19 වසංගත තත්වය තුල ඇති වු ආර්ථික අර්බුදය හමුවේ ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්වීමක් සිදු නොවිණි. නමුත් 2020 වර්ෂයේ පෙබරවාරි සිටම ව්‍යාපෘති ආරම්භ කර කිහිපයක්ම ක්‍රියාවට නැංවීය. ග්‍රාම සංවර්ධන සමිති වලින් වියදම් කර ප්‍රතිපූර්ණය කර දීම සාමාන්‍යයෙන් සෑම වර්ෂයකම සිදු වේ. මෙම වර්ෂයේ ක්‍රියාත්මක ගිණුම් පුහුණු වැඩසටහන් කිහිපයක් සඳහා එවැනි ප්‍රතිපූර්ණය කිරීම් කර සමිති වලට ලබාදිමට නොහැකි විම ගැටළු සහගත විය. සෑම කොට්ඨාශවලම මෙම පුහුණු විම ක්‍රියාවට නැංවීමට නොහැකි වීම තුල නිවැරදි යැපුම් ක්‍රමය ස්ථාපිත කිරීම ඉලක්කය සපුරා ගැනිම ගැටළුවක් විය. ඒ තුල ඉලක්ක ගත ඉතුරුම් හා ආයෝජන මධ්‍යස්ථාන පිහිටුවිම එමෙන්ම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොවිම නිසා එම සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනිමට නොහැකි විය. නමුත් දෙපාර්තමේන්තුව මගින් සැලසුම් කල දැහැමි නිවහනයි සරු ගෙවත්ත ව්‍යාපෘතිය කොවිඩ් තත්වය තුල ඇති අහාර අර්බුදයට යම් තරමක (1%) දායකත්වයක් ලබා ගැනීමට හැකිවිය. මෙය පළාත තුලම සාර්ථකව ක්‍රියාත්මක විය.

# 10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1159/37 හා 2000/11/24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ එළ කරන ලද නිවේදනයක් මගින් 1998 අංක 01 දරණ උතුරු මැද පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම අදාල ප්‍රඥප්තිය මගින් ස්ථාපිත කර ඇත. ප්‍රඥප්තියේ 26(2) ප්‍රකාරව සකස් කර අනුමත කර ඇති අධිකාරියේ පරිපාලන හා විනය කාර්ය පරිපාටිය මගින් අධිකාරියේ කටයුතු පාලනය කරනු ලබයි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව සමගාමී ලැයිස්තුවට ගැනෙන මාර්ග විෂය ක්‍රියාත්මක කිරීම උතුරු මැද පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යාංශය යටතේ උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක වේ.

සභාපති ඇතුලු අධ්‍යක්ෂක මණ්ඩලකින් අධිකාරිය සමන්විත වන අතර සාමාන්‍යාධිකාරි ප්‍රමුඛ විධායක කාර්ය මණ්ඩලයකින් පරිපාලනය වේ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාස 04 කින්ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාස 03 කින් ද සමන්විත වේ. අනුරාධපුර දිස්ත්‍රික්කය අනුරාධපුර, හොරොව්පතාන, මරදන්කඩවල හා නොච්චියාගම විධායක ඉංජිනේරු කොට්ඨාස වශයෙන්ද පොළොන්නරුව දිස්ත්‍රික්කය මනම්පිටිය, මින්නේරිය හා සේවාගම විධායක ඉංජිනේරු කොට්ඨාස වශයෙන්ද පිහිටා ඇත.

## දැක්ම

"ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ඒකාබද්ධ මාර්ග පද්ධතියක්, සමෘද්ධිමත් ප්‍රජාවක්."

## මෙහෙවර

"මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, නඩත්තුව ඇතුළු අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිදභාවයකින් යුක්තව ඉටු කිරීම."

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත තුළ ගුණාත්මක පළාත් මාර්ග පද්ධතියක් ඇති කිරීම.
- මාර්ගයන්හි වැඩිවන රථවාහන සංඛ්‍යාවට (Traffic volume) අනුරූපීව අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- ආරක්ෂිත ප්‍රාදේශීය මාර්ග පද්ධතියක් ඇති කිරීම මගින් මාර්ග අනතුරු අවම කිරීම.
- මාර්ග වත්කම් කළමනාකරණය
- ආයතනික ධාරිතා සංවර්ධනය

## කෙටිකාලීන අරමුණු

- ➢ දෛනික හා කාලීන නඩත්තු ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම මගින් මාර්ග බාධා හා අවහිරතා අවම කර ගමනා ගමනය විධිමත්ව පවත්වා ගැනීම.
- ➢ විධිමත් කාණු සහ ජල අපවහන පද්ධතියක් පවත්වා ගැනීම සහ මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම සහ සහයෝගය ලබා ගැනීම.

## ප්‍රධාන කාර්යයන්

**01. මාර්ග සැලසුම්, සංවර්ධන කටයුතු සහ සේවාවන් සම්බන්ධිත වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම.**

- ❖ මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම.
- ❖ මාර්ග ප්‍රවේශයන්, පරිශ්‍රයන් ඇතුළු යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ❖ මාර්ගවල යටිතල පහසුකම් සංවර්ධනය (පාලම්, බෝක්කු ඇතුළු නිර්මිතයන්)
- ❖ මාර්ග සංඥා සහ සළකුණු ස්ථාපිත කිරීම.

**02. මාර්ග නඩත්තු කිරීම.**

- ❖ දෛනික නඩත්තුව
- ❖ කාලීන නඩත්තුව
- ❖ හදිසි අවස්ථා නඩත්තුව

**03. අධ්‍යයන සහ පර්යේෂණ සිදු කිරිම**

**I. ශක්‍යතා අධ්‍යයනය**

- ❖ අධිබර වාහන ගමනාගමනය පිළිබඳ අධ්‍යයනයන්.
- ❖ මාර්ගයන්හි රථවාහන ප්‍රමාණයන් සහ එහි ප්‍රවර්ධනයන් (Traffic Volume) අධ්‍යයනය.
- ❖ අනවසර සහ මාර්ග රක්ෂිතවලට සිදුවී ඇති බලපෑම් පිළිබඳ අධ්‍යයනයන්
- ❖ විශේෂිත මාර්ග අවශ්‍යතා සහ සිද්ධි සහිත මාර්ගයන් හඳුනා ගැනීම.

**ii. සමාජ සහ පාරිසරික අධ්‍යයනයන්, කාණු සහ ජලප්‍රවාහන පද්ධතින් පිළිබඳව අධ්‍යයනයන්.**

- ❖ කාණු සහ ජලප්‍රවාහන පද්ධතීන් පිළිබඳව අධ්‍යයනයන්

**iii. නව තාක්ෂණික ඉදි කිරීම් සහ රසායනාගාර පරීක්ෂණයන්.**

**04. තිරසර සංවර්ධනය මූලික කරගත් කාර්යාල පරිශ්‍රයක් ගොඩනැගීම**

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මාර්ග රක්ෂිත අත්පත් කර ගැනීමට අදාල නීතිමය පසුබිමක් (පළාත් සභා නීති අංශයේ සහයෙන්) සකසා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.
- ❖ අධිබර වාහන ගමනාගමනය සහ එය හේතුකොට මාර්ගයන්ට සිදුවන හානි, ආශ්‍රිත ගැටළු සහ එය වලකාලීම සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම.

- ❖ මාර්ග රක්ෂිතය උපයෝගි කොට සේවා සලසනු ලබන ආයතන (ජලසම්පාදන, විදුලි බල හා ටෙලිකොම් ආදි) සමග අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇති කිරීම සහ එම කටයුතු හේතු කොට මාර්ගයන්ට වන හානි අවම කිරිමට පියවර ගැනීම.
- ❖ මාර්ග සංවර්ධන, නඩත්තු කාර්යයන් කළමණාකරණය සහ කාර්යක්ෂම සිදු කිරිමට නව තාක්ෂණය සහ මෘදුකාංග උපයෝගි කර ගැනීම.
- ❖ සෞභාගයේ දැක්ම මාර්ගෝපදේශයේ සඳහන් හරිත මෙන්ම සුහුරු කලාපයක් යන සංකල්පය පෙරදැරි කර, තෝරාගත් මාර්ගයන් හි රුක්රෝපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

**සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම.**

17 PARTNERSHIPS FOR THE GOALS

**නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.**

## කාර්ය මණ්ඩල තොරතුරු - 2020

ආයතතයේ අනුමත සේවක සංඛ්‍යාව 171ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 164 කි. පුරප්පාඩු සංඛ්‍යාව 15 ක් ද අනියම් පදනමින් 02 දෙනෙකු ද කොන්ත්‍රාත් පදනමින් 04 දෙනෙකු ද සේවයේ යෙදේ.

## ජාතික ප්‍රතිපත්ති තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

01. මාර්ග ලක්ෂයේ සංවර්ධනය කිරීමේ ජාතික ව්‍යාපෘතියට සමගාමීව ප්‍රාදේශියව සහ ග්‍රාමීයව පවතින පළාත් සභා මාර්ග කි.මී. 800ක් කාපට්අතුරා නව්‍ය කරනය කිරීම.
02. රථවාහන තදබදය අවම කිරීම සහ රථවාහන අනතුරු අවම කිරීම පිණිස ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව සහතික කරනු ලබන පරිදි ඉහත මාර්ගයන් හි (කි.මී. 800) මතුපිට අලුතින් සැකසීම.
03. ඉහත සංවර්ධන කටයුතු සිදු කරන තෙක් පවතින මාර්ගයන් නිසි පරිදි නඩත්තු කර ගමනාගමනයට සරිලන පරිදි පරිසාධන මට්ටමින් පවත්වා ගැනීම.

## තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජනය (රු.මි.) | ඉලක්ක ගත වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **09.** සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම | | | | |
| 9.1 ආර්ථික සංවර්ධන සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | 9.1.1 වසර පුරා භාවිත කළ හැකි මාර්ගයක සිට කි. මී. 2 ක දුර ප්‍රමාණයක් තුළ ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය<br>9.1.2 මගීන් සහ භාණ්ඩ ප්‍රමාණය, ප්‍රවාහන මාධ්‍යය අනුව. | මාර්ග පුනරුථාපනය, මාර්ග වැඩිදියුණු කිරීම හා මාර්ග නඩත්තු කිරීම | 686.79 | 497.73 |
| **11.** නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | | | | |
| 11.2 විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මඟින් 2030 වන විට සියලුමදෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසාර ප්‍රවාහන පද්ධති ලබාදීම. | 11.2.1. ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත අය යන සාධක මත පොදු ප්‍රවාහන පහසුකම් පහසුවෙන් ලබාගත හැකි ජනගහනයේ ප්‍රමාණය | | | |

## කාර්ය සාධන ඉලක්ක - 2020

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | | | වියදම/ආයෝජනය (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2020 | 2021 | 2022 | 2023 |
| **මාර්ග සංඥා සලකුණු සහිතව කාපට් අතුරා සංවර්ධනය කිරීම (පුනරුත්ථාපනය)** | | | | | | | | |
| කාපට් අතුරා සංවර්ධනය කරන ලද මාර්ගයන් දුර ප්‍රමාණය | 3.8 | 4.27 | 5.0 | 6.0 | 36.1 | 50.0 | 110.0 | 138.0 |
| **පුළුල් කිරීම් සහිතව සහ මාර්ග සංඥා සහිතව කාපට් අතුරා සංවර්ධනය කිරීම (වැඩිදියුණු කිරීම)** | | | | | | | | |
| කාපට් අතුරා සංවර්ධය කරන ලද මාර්ගයන් දුර ප්‍රමාණය | 4.43 | 3.75 | 5.00 | 6.00 | 73.40 | 73.17 | 125.00 | 150.00 |
| **නිර්මිතයන් වැඩිදියුණුව/ ඉදි කිරීම (බෝක්කු, පාලම්, පැතිබැම් වැනි)** | | | | | | | | |
| බෝක්කු, පාලම්, පැතිබැම් | - | 4.00 | 5.00 | 5.00 | - | 45.00 | 100.00 | 100.00 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනු අංකය | ප්‍රතිපල දර්ශකය | ප්‍රගතිය% |
|---|---|---|
| 1 | ගමන් පහසුව ඇතිකරලීම හා ධාවන කාලය අඩුවීම | 25 |
| 2 | ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ / ප්‍රධාන මාර්ගයන් අතර මනා සම්බන්ධතාවයක් ඇති කර ලීම. | 30 |
| 3 | ගංවතුර ඇතුළු හානිවලින් සිදුවන බලපෑම් අවම කර ගැනීම | 25 |
| 4 | රථවාහන ගමනාගමනය පහසුකර ලීම සහ තදබදය අඩුකරලීම | 25 |
| 5 | ජනතාවගේ ආර්ථික හා සමාජීය තත්වයන් ඉහල නැංවීම | 40 |

## පසුගිය වසර 03 තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ. අ | සංවර්ධන ව්‍යාපෘති | ඉටුකර ගැනීමට අපේක්ෂා කළ සුවිශේෂී අරමුණු | ප්‍රගතිය (ප්‍රමාණය) | | | | වැයකල මුදල (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| 1 | මාර්ග පුනරුත්ථාපනය | සංවර්ධිත පළාත් මාර්ග පද්ධතියක් ඇති කිරීම | 7.1 | 6.7 | 1.6 | 3.8 | 37.00 | 48.00 | 52.00 | 36.00 |
| 2 | මාර්ග අළුත්වැඩියාව | | 2.8 | 5.6 | 6.43 | 4.43 | 16.00 | 40.00 | 114.00 | 73.00 |
| 3 | මාර්ග නඩත්තුව | | 1240 | 1667 | 1459 | 1500 | 144 | 177 | 225 | 322 |
| 4 | කැඩීබිඳී ඇති නිර්මිතයන් සංවර්ධනය කිරිම | | - | 1 | 1 | - | - | 3.6 | 10 | - |

## 2020 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති | දුර (කි.මී.) | ආවරණය කරන ලද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | මුදල (රු.මි.) |
|---|---|---|---|
| **අවිච්ඡේද** | | | |
| පුලස්තිගම අභ්‍යන්තර මාර්ග | | හිගුරක්ගොඩ | 2.86 |
| දියසෙන්පුර-කහබිලියාව-පන්සල්ගොඩැල්ල මාර්ගය (7+750-8+400) | 0.650 | ලංකාපුර | 3.19 |
| හිරිපිටියාගම -කළාඔය -කලාමැදවච්චිය මාර්ගය (7+300-10+000) | 1.700 | මරදන්කඩවල | 2.36 |
| බටුකොටුව සන්සුන්ගම මාර්ගය(0+000-1+000) | 1.00 | හිගුරක්ගොඩ | 20.81 |
| මහඋල්පත බිම්පොකුණ මාර්ගය(1+700-2+530) | 0.830 | දිඹුලාගල | 12.04 |
| ගල්කුලම සිරිපුර මාර්ගය (0+000-1+600) | 1.600 | පදවිය | 12.68 |
| මරදන්කඩවල කුංචිකුලම (6+000-7+000) හා ආත්තිකුලම මාර්ගය (0+000-1+000) | 1.00 | මරදන්කඩවල/නැනුප | 19.91 |
| තිරප්පනේ - දෙමටවැව පාර (0+000 -1+000) | 1.00 | තිරප්පනය | 0.73 |
| මිස්සක මාවත 2 වන පටුමග මිහින්තලය මාර්ගය (0+000-1+255) | 1.255 | මිහින්තලය | 9.05 |
| මිහිදුපුර පන්සල මාර්ගය (0+000-0+560) | 0.560 | මිහින්තලය | 3.89 |
| **නව ව්‍යාපෘති** | | | |
| අංක 313 ග්‍රාම සේවා කොට්ඨාසයේ ගැටලාව මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීම (කි.මී. 0+000 – 1+000) | 1.00 | මනුප | 0.43 |
| මරදන්කඩවල-මිදිවත්ත මාර්ගය මැකඩම් ක්‍රමයට තාර යොදා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 0+590) | 0.590 | කැකිරාව | 1.20 |
| පැල්බැඳියාව-කටුගහකරඹෑව කෘෂි මාර්ගය බෝක්කු 03 ක් සහිතව බොරළු දමා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 1+500) | 1.500 | තිරප්පනය | 1.46 |
| අංක 315 ජයන්ති ග්‍රාමය (ළමා නිවාස ඉදිරිපිට) මාර්ගය ඒ.බී.සී. පාදකය සහිතව කාපට් අතුරා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 0+400) | 0.400 | මනුප | 1.35 |
| මැදගම 104 තුලාන කෝලිබැන්දෑව ප්‍රධාන මාර්ගය කාපට් කිරීම (කි.මී.0+000 – 1+000) | 1.00 | මනුප | 4.69 |

| ව්‍යාපෘති | දුර (කි.මී.) | ආවරණය කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | මුදල (රු.මි.) |
|---|---|---|---|
| කඳුපාගම -උඩ්ඩියන්කුලම මාර්ගය බෝක්කු 08 ක් සහිතව ඒ.බී.සී. පාදකය සහිතව කාපට් අතුරා සංවර්ධනය කිරීම (කි.මී. 0+000 – 2+000) | 2.00 | කැකිරාව | 10.67 |
| 311 තුලානේ සිට බුද්ධන්නේගම අඩුකැටියාව දක්වා වූ මාර්ගය බෝක්කු 07 ක් යොදා කාපට් අතුරා සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 6+800) | 6.800 | මනුප | 11.98 |
| අලියාවැටුණුවැව පිවිසුම් මාර්ගය බෝක්කු 03 ක් යොදා ඒ.බී.සී. පාදකය සහිතව සංවර්ධනය කිරීම (කි.මී.0+000 – 1+700) | 1.700 | කැකිරාව | 5.75 |
| බඳනාගල මාර්ගය සංවර්ධනය කිරීම (කි.මී.0+626 – 1+382) | 0.756 | දිඹුලාගල | 7.78 |
| පරසන්ගස්වැව මැදගම කෝලිබැන්දෑව මාර්ගය කාපට් කිරීම (කි.මී.1+000 – 2+250) | 1.250 | මනුප | 7.72 |
| ධම්මශිලාරාමයට යන මාර්ගය කැට ගල් අල්ලා සංවර්ධනය කිරීම (0+000-0+670) | 0.670 | ඉපලෝගම | 3.39 |
| සුරියගම මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම (0+750-1+750)(0+000-0+650) | 1.650 | කැකිරාව | 4.58 |

## 2020 වර්ෂය තුල සිදුකරන ලද ව්‍යාපෘති

බටුකොටුව සංසුන්ගම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම





හිරිපිටියාගම-කළාඔය-මැදවච්චිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

මහඋල්පොත බිම්පොකුන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම



ගල්කුළම සිරිපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම





මරදන්කඩවල කුංචිකුළම මාර්ගය ප්‍රතිසංස්කරණය

මිහිඳුපුර පන්සල් මාර්ගය කාපට් කිරීම



## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ (ලෝක බැංකු ආධාර)

| ව්‍යාපෘතිය/ මාර්ගය | තම විෂය පථයට හසුවන අරමුණු | මුදල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි.) බදු රහිත | වැය කළ (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) |
| නොච්චියාගම - ගාලේදිවුල්වැව මාර්ගය (0+000-5+000) | සංවර්ධිත පළාත් මාර්ග පද්ධතියක් ඇති කිරීම | 375.39 | 60.32 | 16.06 | 16.00 |
| ඔයාමඩුව-පේමඩුව මාර්ගය (0+000-11+200) | | | | | |
| NCP – 02 පැකේජය (පොලොන්නරු දිස්ත්‍රික්කය) | | | | | |
| ඩී 2 ප්‍රධාන ඇල බැම්මමාර්ගය (1+608-4+400) | | 507.77 | 0 | 0.9 | 0 |
| කොතලාවල මාර්ගය (0+000-5+000) | | | | | |
| මැදිරිගිරිය නව නගරය- අඹගස්වැව මාර්ගය (0+000-3+500) හා (12+000-15+000) | | | | | |
| අසේලපුර කුරුළු බැද්ද මාර්ගය (0+000-8+000) | | | | | |
| NCP – 03 පැකේජය (අනුරාධපුර දිස්ත්‍රික්කය) | | | | | |
| දඹුලු හල්මිල්ලෑව -ගල්කිරියාගම මාර්ගය (0+000-11+000) | | 498.35 | 0 | 0 | 0 |
| නෑගම-හල්මිල්ලෑව මාර්ගය (0+000-5+000) | | | | | |
| රත්මලේ - නාච්චාදූව මාර්ගය (0+000-5+000) | | | | | |
| අලිස්ථාන - තුරුවිල මාර්ගය (10+700-14+400) | | | | | |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2020

<table>
<tr><th rowspan="2">ව්‍යාපෘතිය</th><th rowspan="2">තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ</th><th colspan="2">මුදල (රු.මි)</th><th colspan="2">ප්‍රගතිය (%)</th><th rowspan="2">ලැබුණු කෙටිකාලීන / දිගුකාලීන ප්‍රතිඵල</th></tr>
<tr><th>වෙන් කළ</th><th>වැය කළ</th><th>භෞතික</th><th>මූල්‍ය</th></tr>
<tr><td>මින්නේරිය මූලික ආයුර්වේද රෝහලේ පංචකර්ම මධ්‍යස්ථානය වෙත පිවිසුම් මාර්ගය(0+000-0+212)</td><td rowspan="6">සංවර්ධිත පළාත් මාර්ග පද්ධතියක් ඇති කිරීම</td><td>0.99</td><td>0.85</td><td>100</td><td>100</td><td rowspan="6">නඩත්තු පිරිවැය අවම කර ගැනීමට හැකි වීම<br><br>ප්‍රවාහන පහසුව<br><br>ප්‍රවාහන කාලය හා වියදම අඩුවීම<br><br>මහජන තෘප්තිය</td></tr>
<tr><td>මින්නේරිය මූලික ආයුර්වේද රෝහලේ පංචකර්ම මධ්‍යස්ථානය වෙත පිවිසුම් මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම (0+000-0+212)</td><td>1.05</td><td>0.85</td><td>100</td><td>100</td></tr>
<tr><td>මින්නේරිය මූලික අයුර්වේද රෝහලේ පංචකර්ම මධ්‍යස්ථානය වෙත පිවිසුම් මාර්ගයේ සපත්තු පාලම (0+177)</td><td>1.83</td><td>1.65</td><td>100</td><td>100</td></tr>
<tr><td>අනුරාධපුර ආයුර්වේද රෝහලේ අභයන්තර මාර්ග (0+000-0+265)</td><td>4.11</td><td>-</td><td>30</td><td>0</td></tr>
<tr><td>ජාතික ජල සම්පාදන ජලප්‍රවාහන මණ්ඩලයේ ගොඩගේමාවත කාර්යාල පරිශ්‍රයේ කාපට් ඇතිරීම.</td><td>2.08</td><td>0.53</td><td>100</td><td>0</td></tr>
<tr><td>ඇටවීරගොල්ලෑව ඉදිගොල්ලෑව මාර්ගය කාපට් අතුරා සංවර්ධනය (0+000-5+600)</td><td>ප්‍රතිපාදන වෙන්කිරීම සම්බන්ධයෙන් කටයුතු කරයි</td><td>-</td><td>30</td><td>0</td></tr>
</table>

## ආයතනයේ දැක්ම කරා ලගාවීමට 2021 වසරේදී කිරීමට යෝජිත නව සංවර්ධන විභවතාවයන්

1. 2021 වසරේ ව්‍යාපෘති 4 ක් අධිකාරියේ සම්පත් හා ඍජු ශ්‍රමය මගින් සිදු කිරීම මත පිරිවැය අඩු වීම, ආයතනයේ ආදායම් තත්වය ඉහල යෑම සහ ඒ සම්බන්ධ නිපුනතාව ඇති වීම.
2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු නොවීම මත ව්‍යාපෘති නිම කිරීම සඳහා ගතවන කාලය අඩුවීම.
3. රැකියා අපේක්ෂා උත්පාදනය වීම.
4. කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට (බොරළු, ගල් වැනි සැපයුම්කරුවන්) අවස්ථාව සැලසීම.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශයේ සංවර්ධනය සඳහා හඳුනාගත් නව ප්‍රවේශයන් | නව ප්‍රවේශයන් මගින් අපේක්ෂිත ප්‍රතිපල ඇතුළත් ගමන් මග | |
|---|---|---|
| | කෙටිකාලීන | දිගු කාලීන |
| ඇස්පෝල්ට් නිශ්පාදනාගාරයක් ඉදි කිරීම | නඩත්තු කාර්යන් කාර්යක්ෂමව සිදු කිරීම මගින් මාර්ග අවහිරතා අවම කර ගමනාගමනය විධිමත්ව පවත්වා ගැනීම | අයතනික ධාරිතා සංවර්ධනය |
| සෘජු ශ්‍රම පදනම මත මාර්ග සංවර්ධනය කිරීම | ග්‍රාමීය ජනතාවට රැකියා අවස්ථා උත්පාදනය හා නව ව්‍යවසායකයින් බිහිවීම | අයතනික ධාරිතා සංවර්ධනය |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2020 සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන, මාර්ග සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතීන්ට අමතරව බාහිර ආයතනවල ප්‍රතිපාදන යොදවා කෙරෙන ව්‍යාපෘතීන්ද, මහජන ඉල්ලීම් හා දේශපාලනාධිකාරිය විසින් කරන ලද ඉල්ලීම්වලට අනුව සිදුකරන ව්‍යාපෘතීන් ද වේ.

මෙම වර්ෂය තුළදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පළාත් මාර්ග කි.මී. 4කට ආසන්න ප්‍රමාණයක් පුනරුත්ථාපනය කරන ලද අතර, කි.මී. 5කට ආසන්න ප්‍රමාණයක් වැඩිදියුණු කරන ලදි. මීට අමතරව මාර්ග හා සම්බන්ධ යටිතල පහසුකම් පුනරුත්ථාපනය සහ වෙනත් අදාල නවීකරණයන් සහිතව අඛණ්ඩව මාර්ග නඩත්තු කිරීම සිදු විය. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගමන් පහසුව ඇතිකරලීම හා ධාවන කාලය අඩුවීම 25% කින්ද, ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ / ප්‍රධාන මාර්ගයන් අතර මනා සම්බන්ධතාවයක් ඇති කරලීම 30% කින්ද, ගංවතුර ඇතුළු හානිවලින් සිදුවන බලපෑම් අවම කර ගැනීම 25% කින්ද, රථවාහන ගමනාගමනය පහසුකරලීම සහ තදබදය අඩුකරලීම 25% කින්ද, ජනතාවගේ ආර්ථික හා සමාජීය තත්වයන් ඉහල නැංවීම 40% කින්ද ඉහල නැංවීමට අායතනයට හැකි වි ඇත. තවද ප්‍රදේශයේ මාර්ග සංවර්ධන හා අදාල තාක්ෂණික සේවාවන් අවශ්‍ය වේලාවන්වලදී අවශ්‍ය ආයතනවලට ලබාදීම මෙම අධිකාරියෙන් සිදු වූ සුවිශාල සේවාවකි.

පළාතේ මාර්ග සංවර්ධන ක්‍රියාවලිය උදෙසා අනෙකුත් ආයතන හා මනා සම්බන්ධිකරණයක් පවත්වා ගනිමින් තිරසර සංවර්ධනය මූලික කරගත් නිසා අපේක්ෂිත ප්‍රතිඵල කරා උපරිම අයුරින් ළඟා වීමටත් ආයතනයේ කාර්යය සාධනය පසුගිය වසරට වඩා ඉහළ නංවා ගැනීමටත් හැකි විය. අධිකාරියේ මෙහෙවර සමාජයට දායාද කරනු පිණිස ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් ගුණාත්මක ලෙස සිදු කිරීමට හා තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට ආයතනයේ භෞතික, මූල්‍ය හා මානව සම්පත් උපරිම අයුරින් උපයෝගී කර ගන්නා ලදි.

## COVID-19 ගෝලිය වසංගතය නිසා 2020 වර්ෂයේ දී ඔබ ආයතනය සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

1. ව්‍යාපාතීන් සඳහා වූ සේවක පිරිස් සීමා කිරීමට සිදු වීම සහ ඉන් සිදුව ඇති බලපෑම් හා අවධානම.
2. ව්‍යාපෘතීන් සිදු වූ පසුගාමීත්වය සහ නිත්‍ය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සිදු වූ දුෂ්කරතා.
3. අයවැය පමාවීම, ප්‍රතිපාදන වෙන් කිරීම පමාවීම හේතුවෙන් ව්‍යාපෘති ආරම්භය අවසාන කාර්තුව තෙක් දීර්ඝ වීම.
4. සංවර්ධන කටයුතු සඳහා අමු ද්‍රව්‍ය සපයාගැනීමේ අපහසුතා හා මිළ ඉහල යාමේ ප්‍රවනතාවය.

# ඇමුණුම්

## පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2020

### 01. පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ /නව (රු.මි.) | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.ප්‍රධාන අමාත්‍යාංශය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 280,078,832.00 | අඛණ්ඩ (රු.මි.) | 135,651,688.60 | 53 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | 144,427,143.50 | 25 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 30,834,060.00 | අඛණ්ඩ (රු.මි.) | 15,158,228.00 | 5 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | 15,675,832.00 | 11 |
| 02.පළාත් පාලන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 261,413,515.00 | අඛණ්ඩ (රු.මි.) | 251,536,355.30 | 319 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | 4,735,976.79 | 4 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,808,054.00 | නව (රු.මි.) | 2,807,802.23 | 4 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | | | |
| 03. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 23,900,000.00 | අඛණ්ඩ (රු.මි.) | 23,900,000.00 | 2 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | | | |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 12,850,995.55 | නව (රු.මි.) | 12,849,798.00 | 3 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | | | |
| 04. පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 4,150,000.00 | අඛණ්ඩ (රු.මි.) | 4,150,000.00 | 4 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | | | |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 02. පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ /නව (රු.මි.) | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. කෘෂිකර්ම අමාත්‍යාංශය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 12,400,082.00 | අඛණ්ඩ (රු.මි.) | 2,400,082.40 | 2 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | 10,000,000.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 259,200.00 | නව (රු.මි.) | 259,200.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | | | |
| 02.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 45,242,072.00 | අඛණ්ඩ (රු.මි.) | 24,783,945.00 | 1 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | 20,458,127.50 | 19 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 740,000.00 | නව (රු.මි.) | 740,000.00 | 2 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | | | |
| 03. සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 15,755,235.00 | අඛණ්ඩ (රු.මි.) | 9,755,235.00 | 5 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | 6,000,000.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 6,760,800.00 | අඛණ්ඩ (රු.මි.) | 552,800.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | 6,208,000.00 | 2 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### 03. පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූලාා ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි) | අඛණ්ඩ / නව (රු.මි) | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 171,860,061.76 | අඛණ්ඩ | 96,310,105.00 | 24 |
| | | | නව | 50,540,927.00 | 43 |
| | ලෝක බැංකු / ශ්‍රී ලංකා රජය | 240,905,242.42 | අඛණ්ඩ | 89,681,323.00 | 10 |
| | | | නව | 150,153,177.00 | 80 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 25,241,000.00 | නව | 25,241,000.00 | 16 |
| 02.ආයුර්වේද දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,067,157.00 | අඛණ්ඩ | 652,156.00 | 1 |
| | | | නව | 415,000.00 | 2 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 71,565,000.00 | අඛණ්ඩ | - | - |
| | | | නව | 71,150,000.00 | 8 |
| 03.පරිවාස දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 6,060,163.00 | අඛණ්ඩ | 6,060,161.00 | 6 |
| 04.සමාජ සේවා දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 481,442.00 | අඛණ්ඩ | 481,440.00 | 3 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 04.පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද /නව (රු.මි.) | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 209,000.00 | නව (රු.මි.) | 209,000.00 | 2 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | | | |
| 02. ක්‍රීඩා දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 15,136,164.00 | අවිච්ඡේද (රු.මි.) | 15,136,164.00 | 6 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | | | |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 200,500.00 | අවිච්ඡේද (රු.මි.) | 200,500.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | | | |
| 03. සමුපකාර අමාත්‍යාංශය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 4,728,516.00 | අවිච්ඡේද (රු.මි.) | 825,222.27 | 2 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | 3,157,293.00 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 05. පළාත් ඉඩම්, වාරිමාර්ග, නිවාස, ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි) | අඛණ්ඩ / නව (රු.මි.) | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. ඉඩම් | ප.නි.සං.ප්‍ර.(PSDG) | 8,450,870.00 | නව | 3,833,100.00 | 2 |
| | | | අඛණ්ඩ | 4,450,869.15 | 3 |
| | ප.ස.සං.ප්‍ර(PCDG) | 584,995.00 | අඛණ්ඩ | 584,994.48 | 2 |
| 02. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 24,274,979.00 | අඛණ්ඩ | 14,436,607.03 | 15 |
| | BG | 548,891,977.48 | අඛණ්ඩ | 24,274,978.48 | 8 |
| | | | නව | 524,617,000.00 | 84 |
| 03. පළාත් මාර්ග | ප.නි.සං.ප්‍ර.(PSDG) | 318,548,980.00 | නව | 230,526,202.00 | 12 |
| | ප.ස.සං.ප්‍ර(PCDG) | 16,087,345.00 | අඛණ්ඩ | 88,022,779.00 | 9 |
| | | | නව | 16,087,346.00 | 1 |
| 04. ග්‍රාම සංවර්ධන | ප.නි.සං.ප්‍ර.(PSDG) | 13,756,917.00 | නව | 2,000,000.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර(PCDG) | 595,000.00 | අඛණ්ඩ | 7,091,092.57 | 1 |
| | | | අඛණ්ඩ | 595,000.00 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය | PCDG | 24,481,818.00 | නව | 24,481,818.00 | 14 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | PCDG | 425,000.00 | නව | 425,000.00 | 5 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## ප්‍රධාන ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලය | PCDG | 27,273,500.00 | නව | 12,599,571.77 | 6 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | PCDG | 27,273,500.00 | අඛණ්ඩ | 14,000,000.00 | 1 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | වෙනත් ලැබීම් | 50,000,000.00 | අඛණ්ඩ | 20,000,000.00 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | PCDG | 364,005.00 | නව | 364,005.00 | 2 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| සංරචකය | මූලාශ්‍ර ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව | PCDG | 191,979.00 | අඛණ්ඩ | 191,979.00 | 1 |
| | PSDG | 2,713,559.00 | අඛණ්ඩ | 2,416,578.46 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් භාණ්ඩාගාරය

| සංරචකය | මූලාශ්‍ර ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් භාණ්ඩාගාරය | PCDG | 86,173,304.00 | නව | 13,900,000.00 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

| සංරචකය | මූලාශ්‍ර ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | PCDG | 7,620,044.00 | නව | 7,440,041.99 | 8 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව

| සංරචකය | මූලාශ්‍ර ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2020 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | PCDG | 85,000.00 | නව | 85,000.00 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය 2020.12.31 දිනට

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2020.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 1 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project) | World Bank (ලෝක බැංකුව) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව / ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව./කෘෂි කර්ම අමාත්‍යාංශය | ඇ.ඩො.මි.140 | 2018-2024 | 155.30 |
| 2 | නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය(RIDEP) | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය JICA - ජපානය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය. | 32,000.00 | 2018 - 2021 | 196.5 |
| 3 | පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) | ආසියානු සංවර්ධන බැංකුව (ADB) - පිලිපීනය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 2,630.00 | 2017-2020 | 1377 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2020.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 4 | පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (ESA) | UNDP (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන) | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය/<br>පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2,626,690 (ඇ.ඩො.මි.) | 2015 | 10.0 |
| 5 | ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන අයි මාර්ග ව්‍යාපෘතිය (i- Roads) | ADB | මාර්ග සංවර්ධන අධිකාරිය | 10,154 | 2016.08.01 - 2021.07.31 | 5.00 |
| 6 | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | සංවර්ධනය සඳහා වූ ප්‍රංශ ආයතනය (AFD)/ ප්‍රංශය සහ ශ්‍රීලංකා රජයේ මූල්‍ය ප්‍රතිපාදන | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) (උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන/ මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය) | 10125.00 (ඇ.ඩො.මි.) | 2016-2021 | 342.30 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2020.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 7 | වැව්ගම් පුබුදුව (CRIWMP) | GEF (හරිත දේශගුණ අරමුදල) | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව /පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය/ආපදා කළමණාකරණ අමාත්‍යාංශය / කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව. | ඇ.ඩො.මි.52.04 (රු.මි.9400) | 2017-2024 | 714.9 |
| 8 | කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) | World Bank (ලෝක බැංකුව) | පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. /පළාත් සහ රේඛීය වාරි මාර්ග දෙපාර්තමේන්තු, පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව. | ඇ.ඩො.මි.58.63 | 2016-2021 | 523.4 |
| 9 | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | - | - | 2260.44 | - | 93.07 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2020.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 10 | ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | මහවැලි අමාත්‍යාංශය | රු.මි.65,000 | වසර 06 2025 දක්වා | 4936 |
| 11 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | එක්සත් රාජධානිය- අදියර i, ii<br>නෙදර්ලන්තය - iii | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රු.මි. 5570 | 2013 සිට මේ දක්වා | 5427.30 |
| 12 | ප්‍රාදේශිය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP) | World Bank (ලෝක බැංකුව)<br>European Union (යුරෝපියානු සංගමය)<br>ශ්‍රී ලංකා රජය | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 1583 | 2019-2022 | 0.3 |

මුලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව